


Scanned by CamScanner

# මාර්කෝ පෝලෝ

# THE TRAVELS OF MARCO POLO

සරත්චන්ද්‍ර ජයකොඩි

Scanned by CamScanner

# මාර්කෝ පෝලෝ

## THE TRAVELS OF MARCO POLO

සම්පූර්ණ හා අසංක්ෂිප්ත
සිංහල පරිවර්තනය

**සරත්චන්ද්‍ර ජයකොඩි**

ප්‍රකාශනය

දයාවංශ ජයකොඩි සහ සමාගම

Scanned by CamScanner

# හැඳින්වීම

වසර විසිහයකට පසු මාර්කෝ පෝලෝ සිය පියා වූ නිකොලෝ පෝලෝ ද සුළු පියා වූ මෆියෝ පෝලෝ ද සමග චීනයේ කුබ්ලායි ඛාන් අධිරාජ මාලිගයේ සිට වැනිසියේ පිහිටි සිය පාරම්පරික නිවසට ළඟා වූයේ ය. ඔවුන්ගේ ගොරෝසු ඇඳුම් පැළඳුම් වැරහැලි වී තිබිණි. ඔව්හු පෙරදිග සළුපිළි තොගයක් රැගෙන ආ හ. ඔවුන් ගේ මුහුණු දුඹුරු පැහැ ගැනී තිබිණි. බලවත් දුෂ්කර ක්‍රියාවක යෙදී විඩාපත් වූ සලකුණු ඔවුන් කෙරෙන් පිළිබිඹු වූයේ ය. එපමණක් නොව ඔවුන් ගේ සුපුරුදු මවු බස ද අමතක වී ගොසිනි. ඒ වෙනුවට ටාටර්වරුන්ගේ භාෂාවෙහි උච්චාරණ ශෛලිය දක්නට ලැබිණි. ඉකුත් සවිසි වසර පුරා වැනිසියේ පරිසරය විවිධ විපර්යාසයනට භාජන විය. එහෙයින් මේ සංචාරකයන් තිදෙනාට සිය පුරුදු පාරම්පරික නිවහන සොයා ගැනීම පහසු වූයේ නොවේ. කෙසේ නමුදු ගෙවුයනට පිවිසි ඉක්බිති සුපුරුදු නිවසට පිවිසුණාහ. පර්සියාවේ කාන්තාර, පාමීර් හි ගැඹුරු ආගාධ, අද්භූත ටිබැට් දේශය, කුබ්ලායි ඛාන්ගේ බබලන අධිරාජ මාලිගය, චීනය, මොංගෝලියාව, බුරුමය, සියම, සුමාත්‍රා ජාවා, ලංකාව, ආදම්ගේ සුසානය ඉන්දියාව ඔස්සේ ආපසු සිය නිවසට පැමිණි ඔවුන් දොරට තට්ටු කරන විට වැනිසියේ බල්ලෝ බුරන්නට පටන් ගත්හ.

බොහෝ දෙනා සිතුයේ පෝලෝවරුන් පරලොව ගොස් ඇති බව ය. නිවසෙහි පදිංචි වී සිටි දුර නෑසියන් වැරහැලි කිලිටි ඇඳුමින් පැළඳුමින් යුත් මේ සැක සහිත පුද්ගලයන් තිදෙනාට නිවෙසට ඇතුළු වීමට ඉඩ දුන්නේ නැත. පසුව විවිධාකාර ප්‍රශ්න නැඟීමෙන් පසු හඳුනා ගැනීම නිවෙසට අකාල අකුණු පහරක් කඩා වැටුණා සේ හැඟිණ. ඔවුනොවුන් හඳුනා ගත් පසු චීනයෙන් ගෙනා රෙදි සළු පිළි තොග නිවසට ඇදගෙන ආහ.

Scanned by CamScanner

වැනිසියේ නොයෙක් පළාත්වල වසන නෑසියෝ පෝලෝවරුන් තිදෙනා ආපසු පැමිණි බව සැලවීමෙන් මවිතයට පත්වූහ. මෙතෙක් කාලයක් ඔවුන් සිතා සිටියේ පෝලෝවරුන් තිදෙනා මළවුන් අතරට ගොස් ඇතැයි කියා ය. පෝලෝවරුන්ගේ පුනරාගමනය නිසා ඔවුහු මවිතය දනවන මේ ආරංචිය තුඩින් තුඩට පතළ කළෝ ය.

දින දෙක තුනකට පසු පෝලෝවරුන් තිදෙනා සිය නෑ සිය හිත මිතුරන් උදෙසා ප්‍රිය සම්භාෂණයක් පැවැත්වූහ. මේ උත්සවය අරම්භක අවස්ථාවේ පෝලෝවරුන් සැරසී සිටියේ රක්ත වර්ණ කසී පට පිළියෙන් මැසූ දිග කබායක් වැනි ඇඳුම් වලිනි. භෝජන සංග්‍රහයේ දී ඔවුන් හැඳ සිටියේ ලෝහිත වර්ණ දමස්කස් හි තැනූ විල්ලුද ඇඳුම් පැළඳුම් වලිනි. භෝජන සංග්‍රහයෙන් පසු ලෝහිත කසී සළු පිළි කොටස් කර සේවකයනට තෑගි කළහ. භෝජන සංග්‍රහය අවසාන වීමෙන් පසු පෝලෝවරුන් තිදෙනා සාමාන්‍ය ඇඳුමෙන් යළිත් පෙනී සිටියහ. එහි පැමිණි නෑ හිත මිතුරනට ලෝහිත විල්ලුද ඇඳුම් තෑගි කෙළේ මොංගෝලියාවේ චාරිත්‍රය අනුගමනය කරමිනි.

මේ අවස්ථාව මවිතය දනවන සුළු ය. ඉන්පසු කෑම මේසය පිරිසිදු කර සේවකයන් බැහැරට පිටත් කැර යවන ලදී. ඉන්පසු සංචාරය කෙළවර කරමින් පැමිණෙද්දී සැරසී සිටි දළ ගොරෝසු ඇඳුම් තියුණු පිහියක් ගෙන පළා ඒ තුළ වූ රතු මැණික්, නිල් මැණික්, දියමන්ති, පුෂ්පරාග, ගෝමේද, වෛරෝඩි, මුතු, වෙනත් මහාඝ ස්වර්ණාභරණ රාශියක් මේසය මතට හැළුවේ ය. මේ දර්ශනයෙන් නෑසිය මිතුරන් ඇතුළු ආරාධිතයෝ මවිතයට පත්වූහ. මේ වන තුරු ම පෝලෝවරුන් පිළිබඳ සැකයක සෙවණැලි නෑසිය මිතුරන්ගේ සිත් රැඳී පැවතුණ ද එය සහමුලින් ම පහව ගියේ ය. ඔවුන් මේ පවුලේ සාමාජිකයන් බව ඒ දර්ශනයෙන් පැහැදිලි විණි. මේ 1295 වර්ෂයයි.

මාර්කෝ පෝලෝ සිය පියා සහ සුළු පියා සමග චීනයේ සහ පෙරදිග ඈත පිහිටි වෙනත් රටවල සංචාරය කොට ආපසු සිය රට පැමිණීමේ භ්‍රමණ වෘත්තාන්තය පළමුවෙන් ලේඛනාරූඪ කොට පළ කෙළේ ජෝන් බැප්ටිස්ට් රැමුසියෝ ය. දේශාටන, සහසංචර සංග්‍රහය (Collection of voyages and Travels) නමැති කෘතියෙහි

Scanned by CamScanner

හේ මෙසේ සඳහන් කරයි. "මා කුඩා කාලයේ මේ කතන්දරය ඉතා අලංකාර ලෙස අසා දැනගත්තේ හැස්පැරෝමල් මහතාගෙනි. ඉතා වයෝවෘධ වියේ සිටි ඒ මහතා උත්තර මණ්ඩලයේ කටයුතු කළ කෙනෙකි. සැන්ටා මැරිනා ඇල අද්දර එතුමාගේ නිවස පිහිටියේ ය. ඒ මහතා ඒ කතාව අසාගෙන ඇත්තේ සිය පියාගෙන්, මුත්තනුවන් ගෙන් හා අසල්වැසි වැඩිහිටියන් ගෙනි."

ක්‍රි. ව. 1254 දී මාර්කෝ පොලෝ වැනීසියෙහි ජන්ම ලාභය ලැබී ය. ඔහුගේ පියා වූ නිකොලෝ පෝලෝ සහ මෆියෝ පෝලෝ වැනිසියේ ගෞරවණීය පුරවැසියන් වූවා සේ ම වාණිජ මණ්ඩලයේ ආසන හෙබවූහ.

මාර්කෝ ගේ පියාගේ තවත් සහෝදරයෙක් කොන්ස්තන්ති නෝපලයෙහි ජීවත් වූ අතර හෙතෙම සිය රටෙහි ද, ක්‍රිමියාවෙහි ද වාණිජ කටයුතුවල නිරත වූයේ ය. නිකොලෝ සහ මෆියෝ ඔවුන්ගේ පළමුවන ශ්‍රේෂ්ඨ පෙරදිග සංචාරය ආරම්භ කළේ ක්‍රි. ව. 1260 දී ය. නිකොලෝ පෝලෝ සිය සහෝදර මෆියො පෝලෝ ද සමග කොන්ස්තන්තිනෝපලයට ගොස් එතැනින් ක්‍රිමියාවට සැපත් විය. වාණිජ කටයුතු සඳහා ය. වැඩි දුරටත් ආදායම් ඉපැයීමේ අභිලාෂයෙන් ඈත උතුරේ වොල්ගා නදිය ඔස්සේ නැගෙනහිර දිසාවේ පිහිටි බුකාරා වෙත ගියහ. අනතුරුව කුබ්ලායි ඛාන් ගේ ආධිපත්‍යය පවත්නා ටාටර් වරුන්ගේ දේශයට ඇතුළු වූවෝ ය. මෙහි දී ඔවුන්ට කුබ්ලායි ඛාන් අධිරාජයා වෙත යන තානාපති පිරිසක් මුණ ගැසිණ. ඔව්හු වෙළෙඳ දෙබෑයනට ආරාධනා කෙළේ කුබ්ලායි ඛාන් අධිරාජයා මුණ ගැසීම සඳහා ඔවුන් සමග එක්වන ලෙසටයි. ඔව්හු තානාපති පිරිස සමග ගොස් මාලිගයේ දී කුබ්ලායි ඛාන් අධිරාජයා බැහැ දුටහ. යුරෝපයෙන් පැමිණි ආගන්තුකයන් පිරිස දුටු අධිරාජයා මහත් සේ ප්‍රමෝදයට පත් ව පිළිගත්තේ හරසරිනි.

අධිරාජයා වෙළෙඳුන්ගෙන් දැනගත් පරිදි ක්‍රිස්තු ධර්මය යුරෝපා රටවල ප්‍රචාරයට පැමිණ ඇති බැවින් නිකොලෝ සහ මෆියෝ දෙසොහොවුරන් තානාපතිවරුන් ලෙස පාප් වහන්ස් වෙත යැවීමට කල්පනා කෙළේ ය. ශාස්ත්‍රධාරී උගත් බුද්ධිමතුන් සියයක් ක්‍රිස්තු ධර්ම ප්‍රචාරය පිණිස චීනයට එවන ලෙස දන්වමිනි. එසේම ආපසු

Scanned by CamScanner

එන ගමනේ දී ක්‍රිස්තුන් වහන්සේගේ සොහොන අසල නිරතුරු දැල්වෙන ශුද්ධ ප්‍රදීපයෙන් තෙල් ස්වල්පයක් රැගෙන එන ලෙසට ද දැන්වීය. මේ ගමන සඳහා අවශ්‍ය සියලු පහසුකම් ඛාන් අධිරාජයා විසින් සලසන ලදී. ඔව්හු 1269 දී IV ක්ලෙමන්ට් පාප්තුමා හමුවට ගමන් ගත්හ. එහෙත් ඔවුන් එහි ළඟාවන විට පාප්තුමා ස්වර්ගස්ථ වූ බව දැනගන්නට ලැබිණි. එහෙයින් අලුත් පාප්වරයකු පත් වන තුරු කාලය ගත කිරීම සඳහා වෙළෙඳ දෙබෑයෝ වැනිසියට ගියහ. ඔවුන් එහි යන විට නිකොලෝ පෝලෝ ගේ බිරිඳ මිය ගොසිනි. ඇය බිහි කළ පිරිමි දරුවා වසර පහළොහක කදිම කොලු ගැටයෙකි. ඒ දරුවා නම් මාර්කෝ ය.

වෙළඳ දෙබෑයන් දෙවසරක් පුරා වැනිසියේ රැඳී සිටියහ. අනතුරුව නව පාප් වහන්සේ ලෙස X ග්‍රෙගරි පත් වූයෙන් අධිරාජයාගේ සංදේශය එතුමාට භාරදුනි. චීනයට යෑම සඳහා ඩොමිනකන් පූජකවරුන් දෙදෙනෙකු පමණක් සපයා දීමට කැමැත්ත පළ කැරිණ. අධිරාජයාගේ දූත මෙහෙවර අනුව නැවත පොලෝවරුන් තිදෙනා පර්සියාවේ කාන්තාර ඔස්සේ ඉදිරියට ගමන් කළහ. මේ ගමනේ දී මාර්කෝ හට දරුණු උණ රෝගයක් වැළඳුණි. ඉන්පසු බාල්ක් හරහා උතුරු ඇෆ්ගනිස්ථානයට ළඟා වීමට හැකි විණ. පර්සියාවේ දී ඔහුගේ රෝගාතුර භාවය කෙමෙන් පහව ගියේ ය. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් ඒ ප්‍රදේශයේ භාෂාවන් ද උගත්හ. අනතුරුව මේ වනතුරු යුරෝපීයයන්ට අප්‍රකටව පැවැති පාමීර් සානුව පිළිබඳව ප්‍රථම වරට කරුණු හෙළි කළේ මාර්කෝ ය. පාමීර් හරහා ගමන් කොට කාශ්ගර් සහ යාර්කන්ඩ් ද පසු කළහ. මේ වන තුරුම මේ ප්‍රදේශ ගැන කිසිවෙකුත් දැන සිටියේ නැත.

ගෝබි කාන්තාරය ඔස්සේ කුබ්ලායි ඛාන් හමුවීමට ගිය ආකාරය විස්තර කරන්නේ ත්‍රාසයත් භීතියත් දැනවෙන අන්දමිනි. එහි මායිම් වල වාසය කරන ගෝත්‍රික ජනයා ගැන බිහිසුණු කොල්ලකරුවන් ගැන ද සඳහන් කරනුයේ ගමනේ දී ද භයානක අත්දැකීම් විස්තර කරමිනි. ගෝබි කාන්තාරය ගැන මෙයට වසර හයසියයකට පෙර චීන වන්දනා කරුවන් විසින් පමණක් ඇතැම් කරුණු සඳහන් කරන ලදී.

Scanned by CamScanner

කුබ්ලායි ඛාන් අධිරාජයා හට වැනිසියන් වෙළෙඳුන් තිදෙනා පැමිණෙන බව කල්තබා ම දැනගන්නට ලැබිණි. එසේ දැනගන්නට ලැබුණේ මාර්කෝ විසින් ම පසුව විස්තර කරනු ලබන පණිවිඩ සේවා මගිනි. වහා ම ඔවුනට ආහාරපාන සහ සෙසු අත්‍යවශ්‍ය සියලු පහසුකම් සලසන ලෙස විධාන කෙළේ ය. වසර තුනහමාරකට පසු වැනිසියානු වෙළෙඳුන් තිදෙනා රාජ සභාවට සම්ප්‍රාප්ත වී අධිරාජයා බැහැ දුටහ. පඬිවරුන් සිය දෙනෙකු වෙනුවට පාප්තුමා විසින් ලබා දුන් ලිපි ලේඛන ද ක්‍රිස්තුස් වහන්සේගේ සොහොන අසල දැල්වෙන පහනේ තෙල් ද අධිරාජයාට භාර දෙන ලදී. මේ ක්‍රි. ව. 1275 දී ය. ඒ වන විට මාර්කෝ ගේ වයස අවුරුදු විසි එකකි.

කුබ්ලායි ඛාන් අධිරාජයා ජන්ම ලාභය ලැබූයේ ක්‍රි. ව. 1216 දී ය. මාර්කෝ පෝලෝ චීනයට ළඟා වන විට කුබ්ලායි ඛාන්ගේ වයස අවුරුදු පනස් නවයකි. ඔහුගේ තරුණ විය ගෙවී ගියේ සංග්‍රාම භූමියෙහි ය. මැදිවිය කැප වූයේ වෙනත් රාජ්‍යයන් යටත් කැර ගැන්ම සඳහා සැලසුම් සකස් කිරීමටයි. චීනය සුරක්ෂිත කිරීමෙන් පසු අධිරාජ්‍ය පදවියට පත්විණ. අධිරාජ්‍ය සිහසුනට පත්වන විට ඔහුගේ වයස අවරුදු හතළිස් හතරකි. කුබ්ලායි ඛාන් ගේ හමුදා චීනය අක්‍රමණය කිරීමෙන් පසු ඔහුගේ රාජ සභාව පිහිටුවන අගනුවර වශයෙන් තෝරාගත්තේ වර්තමානයේ පීකිං නමින් හඳුන්වන නගරයයි. වසර දහයකට හෝ දොළහකට හෝ පෙර මාර්කෝ පෝලෝ පැමිණියේ මේ අලංකාර නගරයටයි. එහි පිහිටි රාජ සභාවටයි.

සුං රාජ වංශයේ පරිහානියෙන් පසු මොංගෝලියන්වරු පෙරදිග අධිපතියන් බවට පත්වූයේ අඩසිය වසක යුද්ධයෙන් ජය ගැනීමෙනි. යුද්ධය හමාර වීමෙන් වසරකට පසුවය මාර්කෝ පෝලේ චීනයට ළඟා වූයේ! චීනය සියලු ගංගාවන්හි ගලාබස්නා සයුරකි! කුබ්ලායි ඛාන් ප්‍රත්‍යන්ත රාජ්‍යයන් රාශියක් තමන් යටතට ගත්තේ ය. බටහිරින් යුරෝපය දෙසට ද පෙරදිගින් ආක්ටික් ප්‍රදේශයේ සිට ඉන්දියාව දක්වා ද බුරුමය සහ සියම කොටසින් කොටස තම බලයට නතු කැර ගැන්මට චීන අධිරාජයා සමත්විණි. සිංහාසනාරූඪ වීමෙන් පසු කුබ්ලායි ඛාන් ලෝකයේ අන් කිසිදු රජෙකුට නොදෙවැනි මහාධිරාජයකු සේ බැබැළිණි. ශ්‍රී විභූතියෙන්

Scanned by CamScanner

විරාජමාන වූ කුබ්ලායි ඛාන් දිග්විජය පිළිබඳ නිරතුරු සිහින මැවී ය.

කුබ්ලායි ඛාන් මෙබඳු ශ්‍රේෂ්ඨත්වයකට පත්වීමට බලපෑ පසුබිම කවරේදැයි විමසා බැලීම ප්‍රයෝජනවත් ය. මොංගෝලිය පරපුර ආරම්භ වූයේ කුඩා ගෝත්‍රයක් ලෙසිනි. ඔවුන්ගේ රාජ වංශය ආරම්භ වූයේ 1162 දී ජන්ම ලාභය ලද කුබ්ලායි ඛාන්ගේ මුත්තනුවන්ගෙනි. මොවුන්ගේ බලයට පැමිණවූයේ කුබ්ලායි ඛාන් නොව ඉහත කී මුත්තනුවන් ය. කුබ්ලායි ඛාන්ට පෙර ජෙන්ගීස් ඛාන් ආසියාවේ බලය පැතිරවී ය. නීපර් නදිය දක්වා ඔහුගේ ආධිපත්‍යය පැතිර ගොස් තිබිණ. එහෙත් ඔහුට යුරෝපය ආක්‍රමණය කිරීමට හැකි වූයේ නැත.

තෙළෙස් හැවිරිදි වියෙහි දී ජෙන්ගීස් ඛාන් සංග්‍රාම භූමියට අවතීර්ණ වූයේ ය. ජෙංගීස් ඛාන්ට සිය පියාගේ අභාවයෙන් පසු ස්වකීය ගෝත්‍රයේ අධිපතිභාවය පැවරුණි. ජෙන්ගීස් ඛාන් තමන් සමග එකවන සේ ටාටර්වරුන්ට අරාධනා කෙළේ ය. එහෙත් ඔවුන් ජෙන්ගීස් ඛාන්ගේ අදහසට අවනත වූයේ නොවේ.

"ඉතා ගැඹුරු ජලාශ පවා ඇතැම් විටක වියළී සිඳී යයි. ඝන කලුගල් පර්වත පවා කලකදී සුණු විසුණු වී යයි. එහෙයින් අප ඔබ සමග එක්විය යුත්තේ කවර හේතුවක් නිසාදැ"යි ටාටර්වරු ප්‍රශ්න කළහ. එහෙත් ජෙන්ගීස් ඛාන් සිය මවගේ ද ආධාර උපකාර ලැබ ජය මාවතෙහි ඉදිරියට ම ගමන් ගත්තේ ය. අසල්වැසි සියලු ගෝත්‍රයන් පරාජය කළ ජෙන්ගීස් ඛාන් වයස අවුරුදු හතළිස් හතර වන විට සෑහෙන තරම් බලසම්පන්න අධිපතියකු බවට පත්වූයේ ය. මොංගෝලියාවේ තැනිතලාවේ අවසන් සතුරා ද පරාජය කිරීමෙන් පසු උතුරු චීනයේ ටාටර්වරුන් දෙසට හැරුණි. මනා ලෙස සැලසුම් සහගතව කරන ලද සටන් කිහිපයකින් පසු වාසල් දොරටු ආරක්ෂකයන්ට අල්ලස් දී ජෙන්ගීස් ඛාන් චීන මහා ප්‍රාකාරයෙන් ඇතුළතට පිවිසුණි. එහි රැඳී සිය හමුදාව ප්‍රධාන කොටස් තුනකට බෙදී ය.

ජෙන්ගීස් ඛාන් බාල පුතා ටියුලේ (කුබ්ලායි ඛාන්ගේ පියා) සමග යුද්ධය ආරම්භ කළේ ය. මහාද්වීපය හරහා ගමන් කොට ගිරිදුර්ග තරණය කළ ඔව්හු ටිබැටයට ළඟා වූහ.

Scanned by CamScanner

ටෂ්කන්ට් යටත් විය. බුඛාර ඇද වැටුණි. මහමුද් පසු පස හඹා ගොස් ඔහු හාත්පසින් වටකැර වනසා දැමී ය. නගර විනාශ කෙළේ ය. ඇතැම් ප්‍රදේශ ගිනිබත් කරන ලදී. එහි වැසියන් සමූලඝාතනය කළහ. ලෝක ඉතිහාසයේ නොවූ විරූ අයුරින් ජෙන්ගීස් ඛාන් යුද යාන්ත්‍රණය මෙහෙයැවීය. සියලු ගංගා ඔවුන්ගේ අවශ්‍යතාව දෙසට හරවන ලදී. හෙරාක් නගරය මාස හයක් මුළුල්ලේ සෙබළුන් අසූ දහසක් වට ලා සිටියහ. සැතපුම් දහස් ගණනක ප්‍රදේශයේ යුද්ධය ව්‍යාප්ත වී තිබිණි. මිලියන එක හමාරක් පමණ ජනයා ජෙන්ගීස් ඛාන්ගේ සෙබළුන් විසින් මරා දමන ලදී. එදිරි පිරිමැසීම පළිගැනීම සමාප්ත වූයෙන් ජෙන්ගීස් ඛාන් තෘප්තියට පත්විය. හෙතෙම නැවත මොංගෝලියාවට පැමිණියේ ය.

මෙයින් පසු ඔටෝමන් තුර්කිවරුන් සමූහයක් යුරෝපයට පිටත් කැර යැවූ අතර ඔව්හු පරාජයට පත් වූහ. ක්‍රි. ව. 1222 දී මොංගෝලියානුවෝ ජෝර්ජියාවට ඇතුළු වූවෝ ය. මේ අවස්ථාවේ රුසියානුවෝ මොංගෝලියාවෙන් පැමිණි දූතයන් පිරිසක් මරා දැමූහ. "අප ඔබට වරදක් කැර නැත. යුද්ධය අවශ්‍ය නම් අප සූදානම්" යයි මොංගෝලියාව එයට පිළිතුරු දුන්නේ ය. තවත් වරක් ආක්‍රමණිකයන් අතුගා දමන ලදී. මේ අවස්ථාවේ මහා බල්ගේරියාව දක්වා ඉදිරියට ගමන් කළහ. සිය බලය පතුරුවමින් ඉදිරියට ගමන් කළ ජෙන්ගීස් ඛාන් පෝලන්තයේ දේශ සීමාව තෙක් සිය බලය පතුරුවාලීය.

අනතුරුව වසර දහයකට පසු යුරෝපය යටත් කැර ගැනීමේ නව මාර්ගයක් සොයා බැලූ නමුදු ජෙන්ගීස් ඛාන් අභාවයට පත්විය. කුබ්ලායි ඛාන් අධිරාජ්‍ය පදවියට පත් විණි. IV පාප් වහන්සේ මේ නස්පැත්තියෙන් යුරෝපයේ ක්‍රිස්තු ලබ්ධිකයින් ආරක්ෂා කැර ගත යුතු බව කියා සිටියහ. කයිෆ් ආදිපාදවරුන් සහ මේ ශ්‍රේෂ්ඨ නගරයේ වැසියන් ඝාතනයට ලක්විණි. ඔස්ත්‍රියාවේ ආදිපදවරු ද කැරින්තියාවේ වංශාධිපතිහු ද බොහිමියාවේ රජු ද ඔවුන්ගේ හමුදා රැස් කොට මේ පිළිබඳව අවධානය යොමු කළහ. ජෙන්ගීස් ඛාන්ගේ පුත්‍රයා අධිරාජයාගේ ගොදුරක් බවට තමන් පත්වන බව ඔවුනට හැඟිණි. මොංගෝලියානු හමුදා ආපසු පැමිණියේ හංගේරියාව පෝලන්තය හා කයිව් මගහැර නීපර් නදී බඩ කඳවුරු බැඳගත්හ.

Scanned by CamScanner

නැගෙනහිර දිසාවෙන් වචනයක් පිටවන තුරු ඔව්හු එහි රැඳී සිටියෝ ය. යුරෝපය අනතුරින් ගැලවුණි.

පාප් වහන්සේ මේ ජයග්‍රහණයෙන් සන්තුෂ්ටියට පත්ව පූජකවරුන් පිරිසක් තානාපතිවරුන් වශයෙන් මොංගෝලියාවට යැවූහ. ඔවුන් ක්‍රිස්තු ලබ්ධිකයන් බවට පත්කැර ගැනීමේ අභිලාෂයෙනි. පාප් වහන්සේ විසින් එවන ලද සංදේශයට සහ තානාපතිවරුන්ට පිළිතුරු දෙමින් ජෙංගීස් ඛාන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා පිළිතුරු දුන්නේ

"බටහිර රටවල වෙසෙන ඔබේ ජනයා පමණක් ක්‍රිස්තු ලබ්ධිකයින් බව සිතා සෙස්සන් පහත් කොට ඔබ සලකන්නෙහි ය. එහෙත් දෙවියන් වහන්සේගේ ආශිර්වාද පිරිනැමීම සඳහා කවුරුන් යෝග්‍ය දැයි තෝරාගන්නේ දැයි ඔබ දැනගන්නේ කෙසේද? නැගෙනහිර සිට බටහිර දක්වා පැතිර පවත්නා මහිමයට අපි ගරු කරමු. එහෙත් දෙවියන් වහන්සේ නිසා අපි බලසම්පන්න නොවූයෙමු. එහෙයින් කළ යුත්තේ කුමක් ද?" යනුවෙනි.

අභිනව ඛාන්වරයා තෝරාගැනුණේ නොයෙක් ප්‍රදේශ අධිපතීන් හා හමුදා බලධාරීන් මැදිහත් වීමෙනි. ඔව්හු කඩිනමින් නැගෙනහිර ආසියාව බලා පිටත් වූහ. මේ සඳහා මාස ගණනක් ගතවිණ. මොංගෝලියානු හමුදා පසු බැසීමට මේ කරුණු හේතුවිය. යුරෝපය බේරුණේ නොසිතූ පරිදි ඇති වූ මේ සිද්ධියෙනි.

වසර කිහිපයකට පසු යළිත් පාප් වහන්සේගේ දූතයන් වශයෙන් පූජකයන් පිරිසක් පැමිණ එක්තරා මොංගෝලියානු කුමාරයකු මුණ ගැසුණහ. ඔවුන් කියා සිටියේ අතීත නපුරු ක්‍රියාදාමය අත්හැර දමා ක්‍රිස්තුලබ්ධිකයන් මරා දැමීම අත්හැරීම යෝග්‍ය බව ය. දෙවියන්ගේ නාමයෙන් මිනිසුන්ගේ ආරක්ෂාව සලසන ලෙස කියා සිටියහ. එහෙත් ඔවුන් වැඩි කලක් ආසියාවේ රැඳී සිටියේ නොවේ.

නැවත වරක් ක්‍රි. ව. 1253 දී විලියම් ඩි රුබ්රොකුයිස් පූජක තුමා පාප් වහන්සේගේ තානාපතියකු වශයෙන් පෙරදිගට පැමිණියේ අධිරාජයා සහ රටවැසියන් ක්‍රිස්තුලබ්ධියට නතු කිරීමේ ප්‍රාර්ථනාවෙනි. ඔහු එක් එක් ප්‍රදේශයේ කුමාරවරුන් මුණ ගැසුණි.

Scanned by CamScanner

"මෝසසියන් කියන්නේ ලෝකයේ සිටිනුයේ එකම දෙවියකු බව ය. එහෙත් දෙවිවරුන් බොහෝ යයි ප්‍රාඥයෝ කියති."

මේ එහි දී පූජකයාට ලැබුණු පිළිතුරයි.

මෙසමයෙහි අධිරාජ්‍ය පදවිය දැරූයේ ජෙන්ගීස් ඛාන් ගේ වැඩුමල් පුත්‍රයා වූ මොන්ගු ඛාන් ය. කුබ්ලායි ඛාන්ගේ වැඩුමල් සහෝදරයා ය. රුබ්රොකුයිස් පූජකයා පැමිණියේ ප්‍රංශයෙනි. එරට ධනවත් භාවය ගැන ද රටේ ස්වභාවය ගැන ද ඔහුගෙන් විමසන ලදී. සමස්ත යුරෝපය ආක්‍රමණය කිරීමට මොවුන් අදහස් කරන බව හැඟීමෙන් ඔහු බියට පත්විය.

1259 දී මොන්ගුඛාන් මිය ගියේ ය. ඔහුගේ ඇවෑමෙන් කුබ්ලායි සිහසුනට නැගුණි. මොංගෝලීය රාජ වංශයේ ආරම්භකයා බව කුබ්ලායි ඛාන් තමන් පිළිබඳව අභිමානයෙන් කියා සිටියේ ය. සුං රාජවංශය ඔහු සහමුලින් විනාශ කැර දැමී ය. උතුරේ වනචාරි ගෝත්‍රිකයෝ දකුණේ ඔහුගේ කණ්ඩායම් ද සමග එක්වී කැරලි ගැසූහ. ජපානයට එරෙහි සටන සාර්ථක කැර ගැන්මට නොහැකි වූයේ මේ හේතුවෙනි. මේ නිසා අසහනකාරී ස්වභාවයට පත්වූ කුබ්ලායි ඛාන් තමන් යටපත් කැරගත් සුවිශාල භූමිය අධ්‍යාපනය, බුද්ධිය, දැනුම මගින් සන්සුන් කර ගත හැකි යයි කල්පනා කෙළේ ය. එමගින් සාමකාමී ජනතාවක් බිහිකළ හැකි බව සිතා එයට අදාළ පියවර ගත්තේ ය.

වැනිසියේ වෙළෙඳුන් දෙදෙනා පළමුවරට තමන් වෙත පැමිණි කල්හි කුබ්ලායි ඛාන් ඔවුන් පිළිගත්තේ මහත් ගෞරවයෙනි. ඔවුන් ලවා පාප් වහන්සේ වෙත සංදේශයක් යවමින් කියා සිටියේ උගත් බුද්ධිමත් පඬිවරුන් සියයක් තමන් වෙත එවන ලෙසට ය. එසේ කීව ද ඔහුගේ යටි සිතෙහි බල පැවත්වූයේ වෙනත් හැඟීමකි. පාප් වහන්සේට මේ ආයාචනය මග හැරිය නොහේ. එයට හේතුව අධිරාජයා ඉල්ලා සිටිනුයේ 'ප්‍රඥාව' නිසා ය. එහෙත් පඬිවරුන් සියයක් නොව දහසක් එවුවත් මේසා විශාල අධිරාජ්‍යයක ක්‍රිස්තු ධර්ම ප්‍රචාරය අතිදුෂ්කර ක්‍රියාවකි. චීනයේ පැතිර පවත්නේ බුද්ධාගම බැවින් කිතුදහම මිත්‍යාදෘෂ්ටියක් සේ සලකන්නට ඉඩ තිබිණ.

Scanned by CamScanner

පස්වන සියවසෙහි සිරියාවෙන් නෙරපනු ලැබූ නෙස්ටෝරියානු ක්‍රිස්තියානින්ගේ තත්ත්වයට මොවුන් ඇද වැටෙන්නට ඉඩ ඇතැයි ද පාප්වහන්සේ සිතන්නට ඇත. එසේ ම ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය සඳහා පූජකවරුන් උගතුන් මෙසා විශාල ඈත ප්‍රදේශයකට අනතුරු ගමනක් යැමදබරපතල ගැටලුවකි. නෙස්ටෝරියානු කතෝලිකයන් චීනයේ ඇතැම් ප්‍රදේශවලින් මුණගැසුණු බව මාර්කෝ පෝලෝ සඳහන් කරයි. ඒ වන විට ද චීනයේ විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයෝ ප්‍රාඥයෝ බුද්ධිමත්හු බිහිවී සිටියහ. ඔවුන් ජනජීවිතය යහපත් අන්දමින් වෙනෙස් කිරීමට නන් අයුරින් දායක වී ඇත. යුරෝපය ශිෂ්ට සම්පන්න වූයේ මෑතක දී ය. එහෙත් චීනය දීර්ඝකාලීන ශිෂ්ටාචාරයකට නෑකම් කියන්නේ ය. මාර්කෝ පෝලෝ චීනයට ගියේ වෙළඳ භාණ්ඩ හුවමාරුව සඳහා ය. එහෙත් සිය ගණන් ප්‍රාඥයෝ බුද්ධිය දැනුම හුවමාරු කැරගැන්ම සඳහා චීනයේ සංචාරය කළහ.

මාර්කෝ පෝලෝ චීනයට ළඟා වන විට එහි පැවැති ශිෂ්ටාචාරය කෙබඳු වී දැයි විමසා බැලීම වටී. එසේ ම යුරෝපය කෙබඳු ස්වභාවයක පැවැතිණි ද? රූබ්රොකුයිස් පියතුමා චීනයට ගියේ මාර්කෝ පෝලෝගේ සංචාරයට පෙරාතුව ය. පාප් වහන්සේගේ තානාපතිවරයකු වශයෙනි. මේ සංචාරයෙන් පසු රූබෙරුකුයිස් පියතුමා මෙසේ වාර්තා කළේ ය.

"මහ සංස්කෘතියකින් හෙබි ඔවුන්ගේ ගෘහ ජීවිතය ගෞරවාන්විත ය. සමාජ සම්බන්ධතා මනා සේ පවත්වා ගෙන යති. අරගල, අලාභ, විපත්, සටන්, ඝාතන යුරොපයේ වරින් වර දක්නට ලැබෙතදු මෙහි එසේ නොවේ. අවංකභාවය හාත්පස දක්නට ලැබේ. ඔවුන්ගේ භාණ්ඩ ප්‍රවාහනය කැරෙන වාහන ගබඩා ආදිය යතුරු දමා නැත. එහි මුරකරුවන් යොදා නැත. ඔවුන්ගේ ගවයන් සොරකම් නොකරේ. පරිත්‍යාගශීලීය. අසරණයනට උදවු උපකාර කරති."

මාර්කෝ පෝලෝ ද මේ හා සමාන තොරතුරු සිය චාරිකා සටහන්හි ඇතුළත් කැර තිබේ. යුදෙව්වන් සහ ක්‍රිස්තියානින් ආසියාවේ ජීවත් වන්නේ ආගමික නිදහසින් යුක්තව ය.

Scanned by CamScanner

ඔවුන්ගේ කාර්මික ඥානය දීර්ඝ කාලයක් තිස්සේ මනා සේ සංවර්ධනය විණි. මාර්කෝ පෝලෝ චීනයට ළඟා වීමට පෙර අරුම පුදුම නිර්මාණ චීනයේ දක්නට ලැබිණි. චීන මහා ප්‍රාකාරය එයින් එකකි. චීනයේ යෝධ ඇල දිගින් සැතපුම් හයසියයකි. ඒ නිර්මාණ සම්පූර්ණ කෙළේ කුබ්ලායි ඛාන්ගේ පාලන සමයේ දී ය. මේ ඇල මාර්ගය පීකිං සිට කැන්ටන් දක්වා ඉදිකැර තිබේ. අද දක්වාම මෙය මිනිස් ශ්‍රමයෙන් තැනූ දීර්ඝතම ඇල මාර්ගය වාරිමාර්ගය ලෙස සම්භාවනාවට පත් වේ. ගොඩබිම් මාර්ග සේවාවන්හි තැපැල හා සන්නිවේදනය කාර්යක්‍ෂම බව මාර්කෝ පොලෝ ද සඳහන් කැර තිබේ.

බොහෝ කලා ශිල්ප චීනයේ මුහුකුරා ගොසිනි. චිත්‍ර, කැටයම්, මූර්ති, ලෝහ භාණ්ඩ පිඟන් භාණ්ඩ හා ගෘහ නිර්මාණ ශිල්ප අති විශිෂ්ට ය. සාහිත්‍ය කෙරෙහි දක්වන්නෙ ඉමහත් ගෞරවයකි. ක්‍රි. ව. 105 මුල් භාගයේ කඩදාසි නිෂ්පාදනය ආරම්භ කැරිණ. ක්‍රි. ව. 932 දී ග්‍රන්ථ මුද්‍රණය පටන් ගැනිණ. එයින් අඩ සියවසකට පසු කාණ්ඩ දහසකින් සමන්විත විවිධ විෂයයන් අන්තර්ගත විශ්ව කෝෂය අධිරාජයාගේ පෞද්ගලික අධීක්‍ෂණය දායකත්වය සහිතව ලේඛනාරූඪ කැරිණ. ආර්ථික විද්‍යාව, දර්ශනය, ආගම, යුද්ධ ශිල්පය, කෘෂිකර්මාන්තය, චිත්‍රකලාව සහ වෙනත් විද්‍යා හා කලා විෂයනට අදාළ ග්‍රන්ථ මාර්කෝ පෝලෝට දක්නට ලැබිණ. මේ කෘතීන් බහුල ප්‍රචාරයට පත්වී තිබුණේ ය. ක්‍රි. ව. 1043 ට පෙර පිළිස්සූ මැටි පුවරු මුදල් වශයෙන් භාවිතා කළ ද මාර්කෝ පෝලෝ චීනයේ සිටිය දී මුදල් නොට්ටු පරිහරණය පටන් ගැනුණි. මේ මුදල් නෝට්ටු අධිරාජයාගේ පාලනය යටතේ පැවැති බොහෝ ප්‍රදේශවල සංසරණය විය.

එසේම මේ යුගයේ කාර්මික ඥානය ද වර්ධනය වෙමින් පැවැතිණි. ජලයෙන් ක්‍රියා කරන ඔරලෝසු පාලම්වල සවිකැර තිබිණි. ලෝහ කර්මාන්ත ද ගල් අඟුරු නිෂ්පාදනය ද මේ යුගයේ දක්නට ලැබුණේ ය.

වයස අවුරුදු විසි එකේ තරුණයකු හැටියට මාර්කෝ පෝලෝට චීනයේදීත් සංචාරයන්හි දීත් අරුම පුදුම දෑ දක්නට ලැබිණ. මේ තරුණයා කුබ්ලායි ඛාන් භාරගත්තේ මහත් විශ්වාසවන්ත ලෙසිනි.

Scanned by CamScanner

ඔහුට චීනයේ භාෂාවන් ලිවීමට හා කතා කිරීමට මනා දක්ෂතාවක් තිබිණ. ඔහු බුද්ධිමත් ය. උපායශීලී ය. කාර්යක්‍ෂම ය. එහෙයින් පොදු දූත මෙහෙවර සඳහා යොදවනු ලැබී ය. අධිරාජ්‍ය කවුන්සලයේ කොමසාරිස්වරයකු වශයෙන් ක්‍රි. ව. 1277 දී පත්කළ බව චීන ඓතිහාසික වාර්තා පවසයි.

මාර්කෝ පෝලෝට පෙර අධිරාජයා වෙනුවෙන් දූත මෙහෙවරෙහි යෙදුණු කොමසාරිස්වරුන් විසින් සපයන ලද වාර්තා එතරම් සරුසාර නොවී ය. එහෙත් මාර්කෝ පෝලෝ නොයෙක් ප්‍රදේශයන්හි සංචාරය කරද්දී කුඩා සටහන් පොතක සියලු තොරතුරු සටහන් කැර ගත්තේ ය. මේ සටහන් කියවූ අධිරාජයා මහත් ප්‍රසාදයට පත්විය. සියලු වාර්තා තමන් වෙත සැපයීම නිසා අධිරාජයාට ද මාර්කෝ පෝලෝ ගේ බුද්ධිමත් ක්‍රියා ශූරත්වය නිසා අධිරාජයා ඔහු කෙරෙහි වඩ වඩාත් පැහැදී ප්‍රධාන කොමසාරිස් තනතුරට පත් කරන ලදී. ඒ හැරුණු විට වෙනත් ප්‍රධාන තනතුරු කිහිපයකට ද පත් කැරිණි. එසේ ම එක්තරා යුද්ධයක දී රාත්තල් තුන් සියයක් බරැති ගල් ඈත ඉලක්කයට විදීමට හැකි කාලතුවක්කු අධිරාජයාට තනා දුනි.

කුබ්ලායි ඛාන්ගේ දඩකෙළි සවාරි පිළිබඳව සත්‍යය පදනම් කොටගත් දීසි වර්ධනාත්මක විස්තර මාර්කෝ පෝලෝ සඳහන් කරයි. එවැනි විස්තරාත්මක වර්ණනා ඉදිරිපත් කළ හැක්කේ අධිරාජයා සමීපයෙන් ම සිටි අධිරාජයා සමග ගමන් කළ පුද්ගලයකුට පමණි. එසේ ම දඩකෙළි සවාරියෙහි දී යම් කිසිවකුගේ කිසියම් භාණ්ඩයක් අහුලා ගතහොත් එය අදාළ නිලධාරියාට භාර දිය යුතු ය. අන් සන්තක භාණ්ඩයක් ළඟ තබා ගතහොත් ඔහුට දඬුවම් කැරේ. සොරකම් කළ හොත් සොරාට දැඩි දඬුවම් කරනු ලැබේ. එහෙයින් කිසිවෙක් කිසිවක් සොරකම් නොකරති. මාර්කෝ පෝලෝ මෙබඳු විස්තර කරනුයේ ඔහු අධිරාජයා සමග සමීප ඇසුරක් පැවැත්වූ බැවිනි.

අධිරාජයා සමග මාර්කෝ පෝලෝ ද යුද්ධ අවස්ථාවන්හි දී රණපිටියට ගියේ ය. සේනා සංවිධානය කරන ආකාරය, අශ්වාරෝහකයන් , ඇත් සේනා, යුද භටයන් ගමන් ගන්නා ස්වභාවය, යුද බෙර වයන ආකාරය, සංග්‍රාම සංගීතය, යුද්ධය පටන් ගන්නා

Scanned by CamScanner

ආකාරය, සටනේ දී සෙබළුන් මැරී වැටෙන ආකාරය යනාදී වශයෙන් ඔහු ටාටර්වරුන්ගේ යුද්ධ ශිල්පය විවිධාකාරයෙන් විස්තර කරයි.

එපමණක් නොව රාජ සභාවේ සියලු විස්තර මාර්කෝ සඳහන් කරන්නේ. දීර්ඝ කාලයක් එහි රැඳී සිටිමින් ලත් අත්දැකීම් පාදක කැර ගනිමිනි. එසේ ම සංචාරය කළ රට රාජ්‍යයන් ගැන තොරතුරු සඳහන් කරනුයේ ද ස්වභාවික සත්‍ය අත්දැකීම් හේතුකොට ගෙන ය. මාර්කෝ පෝලෝ පුරා විසි වසරක් අධිරාජයාගේ සේවයට කැප වී සිටියේ ය. ඔවුන් චීනයට ළඟාවූයේ අධිරාජයා මැදිවියෙහි සිටිය දී ය. මාර්කෝ පෝලෝ ඔහුගෙන් සමුගන්නා අවස්ථාව වන විට සිටියේ මහලු වියෙහි ය. සතුරන්ගේ අතින් මරුමුවට පත්වෙතැයි බියෙන් සිටියේ ය. පෝලෝ ආපසු සියරට යෑමට අවසර ඉල්ලා සිටි අවස්ථාවේ අධිරාජයා එයට කැමැති වූයේ නොවේ.

පර්සියාවේ ඛාන්වරයා වශයෙන් පත්වී සිටි කුබ්ලායි ඛාන් ගේ සහෝදරයාගේ භාර්යාව මියගිය අවස්ථාවේ වෙනත් කුමරියක මොංගෝලීය ගෝත්‍රයෙන් කැඳවා ගැන්මට සිදුවිණ. ගොඩබිම් මාර්ගයෙන් මේ අලුත් මනාලිය කැන්දා ගෙන යෑම අනතුරුදායක වූයෙන් ඇය පර්සියාවට යැවූයේ මාර්කෝපෝලෝ හා ඔහුගේ පියා සහ බාප්පා සමග ය. දක්ෂ නාවිකයන් වූයෙන් ඇය මුහුදු මාර්ගයෙන් කැන්දාගෙන යෑමට කුබ්ලායි ඛාන් අවසර දුනි. මේ මනාලිය කැඳවාගෙන යන්නා වූ දූත පිරිස සමග ම පෝලෝවරුන්ට ද අධිරාජයා සමුදුන්නේ ය. එසේම ප්‍රංශය, ස්පාඤ්ඤය, එංගලන්තය යනාදි රටවල රජුන්ට ද පාප් වහන්සේට ද සිය සුහද මිත්‍රශීලී සුබපැතුම් ඔවුන් මගින් යැවූයේ ය.

පෝලෝවරුන් චීනයේ දී ඔවුනට ලැබුණු මුතුමැණික් ස්වර්ණාභරණ ආදී මහාඝ භාණ්ඩ රැගෙන ගියේ ඇඳුම්වල සඟවා ගෙන ය. ඔවුන්ගේ ගමන අනතුරුදායක විය. පර්සියාවට ළඟා වූයේ අවුරුදු දෙකක් ගමන් කිරීමෙන් අනතුරුව ය. සුමාත්‍රා ජාවා ලංකාව ඉන්දියාව ඔස්සේ මුහුදේ යාත්‍රා කළහ. පර්සියාවට ළඟා වන විට මනාලිය අපේක්ෂා කළ රජු මිය ගොසිනි. එහෙයින් ඔව්හු මනාලිය රජුගේ පුත්‍රයාට භාර දුන්හ.

මේ සංචාරක - දේශාටන වර්තාව ලියැවුණේ මාර්කෝ පෝලෝ වැනීසියට ළඟාවීමෙන් ඉක්බිතිව ය. පොලෝවරුන් වෙළෙඳුන් ය. ඔව්හු වැනීසියේ සිට ඈත පෙරදිගට වාණිජ භාණ්ඩ රැගෙන ගියහ.

Scanned by CamScanner

ජිනීවා සහ පීසාහි වෙළෙන්දෝ වැනිසියේ වෙළඳුන් හා තරග කළහ. මේ තුන් පිරිස අතර වෙළෙඳ තරගය පැවති අතරම ඉතාලිය ද මේ තරගයට මැදිහත් විණ. වැනිසිය කොන්ස්තන්තිනෝපලය යටත් කැර ගන්මෙන් පසු ඔවුන්ගේ වෙළෙඳම සරුසාර වූයේ ය. මේ අවස්ථාවේ ජිනීවා එක් අතකින් ද, අක්‍රේ සහ සිරියාව අනෙක් පසින් ද බාධා පැමිණවීමට පටන් ගති. 1298 මුල් භාගයේ ජිනීවා යාත්‍රා ග්‍රීසිය අවට මුහුදේ සැරිසරන්නට පටන් ගති. මෙහිදී වැනිසිය හ ජිනීවා අතර අරගලයක් පටන ගැනුණි. මෙහි දී වැනිසියේ යාත්‍රා මෙහෙයවූයේ මාර්කෝ පෝලෝ බව සඳහන් කැර ඇත. "Gentleman Commander" යන නමින් මේ නාවික යාත්‍රා සමූහයෙහි ප්‍රධානියා මාර්කෝ පෝලෝ විය.

මේ නාවික යාත්‍රා නඩත්තු කළෝ ඉතා ධනවත් වෙළෙන්දෝ ය. මේ නැව් සාදා තිබුණේ දැවයෙනි. දෙසිය පනහක පමණ නාවිකයන් පිරිසක් එක් නැවක සිටි අතර හතළිහක පමණ පිරිසක් යාන්ත්‍රික දුනු රැගෙන ගියෝ ය. වඩුවෝ ද, නැව් පිළිසකර කරන්නෝ ද, අරක්කැමියෝ ද, නැවේ ප්‍රධානියා සහ ඔහුගේ සේවක පිරිස ද මේ එක් එක් නැවේ ගමන් ගත්හ. මේ නැව් මෙහෙයැවීමේ ප්‍රධානියා ලෙස කටයුතු කළේ මාර්කෝ පෝලෝ ය. නැව් හැටකට වැඩි සංඛ්‍යාවක් මෙසේ ගමන් ගන්නා ලදී. වෛද්‍යවරුන්, ශල්‍ය වෛද්‍යවරුන් යුද අවි භාරකරුවන් හරස් දුනු තනන්නන් සෙබළුන්, සංගීතඥයන් ආදි පිරිස් මේ නැව්වල සිටියහ. 1298 සැප්තැම්බර් 7 වැනිදා ජිනීවා නැව් හා සමග සටන් ඇරැඹුණි. මේ වූ කලී මාර්කෝ පෝලෝ චීනයේ සිට වැනිසියට පැමිණ වසර තුනක් පිරුණු කාල සීමාවයි. මේ යුද්ධයේ දී වැනිසියානු නාවික යාත්‍රා අල්ලා ගන්නා ලදී. මාර්කෝ පෝලෝ ඇතුළු 7000 ක් මේ අවස්ථාවේ දී සිරභාරයට ගැනිණ. ඔවුන්ගේ නැව් වරායට ඇදගෙන ගොස් දමන ලදී. පරාජය නිසා වැනිසියානු නැව් හමුදාවේ ප්‍රධානියා සිය හිස අසුනෙහි ගසා ගත්තේ ය.

මාර්කෝ පෝලෝ ගේ පියා සහ සුළු පියා ඔහු බේරා ගැනීමට හැකි හැම උත්සාහයක් ම දැරී ය. සිරභාරයේ සිටි සමහර වැනිසියේ වැසියන් කිහිප දෙනෙකුන් විවිධ ඉල්ලීම් හේතුකොට නිදහස් කළ ද මාර්කෝ පෝලෝ හට නිදහස ලබා ගැන්මට හැකි වූයේ නැත.

Scanned by CamScanner

මාර්කෝ පෝලෝ පෙරදිග සංචාරය හමාර කොට සිය මව්බිමට පැමිණ ගත කළ තුන් වසරක කාලයෙහි දේශාටනය පිළිබඳ කථාන්තරය බොහෝ අවස්ථාවන්හි බොහෝ දෙනාට කීවේ ය. ඒ කතාව ඇසීමෙන් හිත මිතුරෝ ද අසල්වැසියෝ ද මවිතයට පත්වූහ. ඔහු සංචාරය කළ දේශ දේශාන්තරයන් පිළිබඳ කථා ඇසීමෙන් පසු Court of millions යන නාමය පටබැඳිණි. සිය චාරිකා වාර්තා සටහන් හි ද මාර්කෝ පෝලෝ "Marco Polo of the millions" යනුවෙන් තමා හඳුන්වා ගත්තේ ය. එහෙත් මාර්කෝ පෝලෝ ගේ අද්භූත විශ්මජනක කතාන්තරය ලේඛනාරූඪ කිරීමට කිසිවකුත් උත්සුක වූයේ නොවේ.

එහෙත් බන්ධනාගාර ගත වූ අවස්ථාවේදී මේ දේශාටන වෘත්තාන්තය ලේඛනාරූඪ කිරීමට කදිම වරමක් ලැබිණ. කුබ්ලායි ඛාන් අධිරාජයා වෙනුවෙන් සේවය කළ කාල පරිච්ඡේදයෙහි දී භාවිත කළ සටහන් පොත් ඇසුරු කරමින් සිරමැදිරයේ දී ඔහුගේ දේශාටන වාර්තාව එහි සිටි පීසා වැසියකු වූ රස්ටිසින් ලේඛනාරූඪ කළේ ය. මෙය ඉතා ඉක්මනින් ලියා අවසන් වූ බව පැවැසේ. මාර්කෝ පෝලෝ වැනිසිය සහ ජීනීවා අතර සමගි සම්මුතිය අත්සන් කිරීමෙන් පසු සිරභාරයෙන් නිදහස් වූයේ ය.

යළිත් සිය පාරම්පරික නිවසට පැමිණි මාර්කෝ පෝලෝ ඩොනාටා නමැති කාන්තාවක සමග යුග ජීවිතය ඇරැඹී ය. ඒ විවාහයෙන් පැන්ටිනා, බෙල්ලාලා, මොරිටා යන දූවරුන් තිදෙනෙක් බිහි වූහ. ඔහුගේ යුග ජීවිතය පිළිබඳ විස්තර එතරම් ප්‍රකට නොවේ. හෙතෙම නැවැත වෙළෙඳ සංචාරයන්හි නියුක්ත වූයේ ය. චීනයේ සිට මවුරටට පැමිණ දොළොස් වසරකට පසු 1307 දී සිය දේශ සංචාරය පිළිබඳ කෘතිය ප්‍රංශයේ වංශාධිපතියකුට පිළිගැන්වීය. මේ පිළිබඳ දත්ත සහ මාර්කෝ පෝලෝ ගේ කෘතියේ අත් පිටපතක් පැරිසියේ පුස්තකාලයේ තැන්පත් කැර තිබේ.

"....මාර්කෝ පෝලෝ උසස් චරිත ලක්ෂණ ගුණාංග සහිත පුද්ගලයෙකි. බොහෝ රවල දී ඔහුට ගරු සම්මාන බුහුමන් දක්වා ඇත. ලෝකයේ බොහෝ රටවල දී ඇසින් දුටු විස්තර තොරතුරු සත්‍ය ලෙස ලේඛනාරූඪ කෙළේ ය...."

යනුවෙන් මාර්කෝ පෝලෝ පිළිබඳව සඳහන් වේ.

Scanned by CamScanner

මාර්කෝ පෝලෝ ගේ මේ කෘති විනෝදාස්වාදය ගෙන දෙන බැවින් ප්‍රංශයට ගෙන යන ලදී.

පෙරදිග ලෝකයේ සංචාරය කොට නැවත මවුබිමෙහි සිය නිවසට පැමිණෙද්දී මාර්කෝ පෝලෝ වාණිජ භාණ්ඩ හා තවත් අගනා මහාඝී වස්තු රාශියක් රැගෙන ආවේ ය. වසර දහසයකට පසුව ද ඔහු සතුව මෙකී භාණ්ඩ සුරැකී තිබිණ. ඉතා මධුර සුවඳ විහිදෙන කස්තුරි ඔහුට ලැබුණේ ටිබැට් දේශයෙනි. ඔහු එයින් රතු දුඹුරු කස්තුරි අරික්කාලක් වෙළෙඳුන්ට නොමිලේ දුන් අතර තවත් රාතතල් භාගයක් වෙළෙඳමට දුන් නමුදු එයට මුදල් ලැබුණේ නැත. විනිශ්චයකරු ඒ සඳහා මාර්කෝ ගේ මුදල් ගෙවන ලෙස නියෝග කෙළේ ය. නැතහොත් වාණිජ කොමසාරිස් බන්ධනාගාර කළ යුතු බවට දැනුම් දුනි.

මේ කෘතියෙහි පරිසමාප්ත පිටපත සාන්ත මාර්ක් ගේ පුස්තකාලයේ තැන්පත් කැර තිබේ. එහි ක්‍රි. ව. 1324 දිනය සඳහන් ය. ඒ වන විට මාර්කෝ පෝලෝ ගේ වයස අවුරුදු හැත්තෑවකි. විවිධ රෝගාබාධයන්ට ගොදුරු වෙමින් සිටි අවදියකි. දුබල ස්වභාවයකින් පසුවිය. නොතාරිස්වරයකු හා පූජකවරයකු කැඳවා සිය දේපළ වස්තුව පිළිබඳ අන්තිම කැමැති පත්‍රය ලියැවිය. සිය බිරිඳට හා දූවරුන් තිදෙනාට එ මගින් බලය පැවැරිණි. ඒ වන විට ඔහුගේ දූවරුන් තිදෙනාගෙන් දෙදෙනෙක් විවාහකව සිටියහ.

මරණ මඤ්චකයෙහි වැතිර සිටිය දී නෑසිය මිතුරෝ ඔහු පිරිවරා ගත්හ. ඔහුගේ ආත්මය සුවපත් කිරීමේ අභිලාෂයෙනි. ඒ අවස්ථාවේ දී ඔහුගේ කෘතිය හා සංචාර ගැන ද නෑසිය මිතුරෝ කතාබහ කළහ.

"මා දුටු ආසියා රටවලින් බාගයකවත් තොරතුරු ඔය පොතේ නෑ. තව කිව යුතු දේ අනන්තයි! අප්‍රමාණයි!"

සාන්ත ලොරෙන්සෝ දේවස්ථාන භූමියේ ඔහුගේ නිසල දේහය මිහිදන් කැරිණ!

මාර්කෝ පෝලෝ ගේ අභාවයෙන් පසු වැනිසියේ විනෝද වේලාවන්හි ද උත්සවයන්හි දී ද මාර්කෝ පෝලෝගේ රූකඩයක් වැනි රුවක් ප්‍රදර්ශනය කිරීම චාරිත්‍රයක් විය. ප්‍රචණ්ඩ පෙනුමක්

Scanned by CamScanner

ඇතිවන ලෙස විකට රුවක් වශයෙන් තැනුනු මාර්කෝ පෝලෝ ප්‍රතිරූපය හැඳින්වූයේ "Marco of the millions" යනුවෙනි. මේ රුවෙහි ඇඳුම් සැරසිලි නරඹන්නන්ගේ මවිතයට හේතුවෙමින් හා ආකර්ෂණීය දර්ශනයක් බවට පත්විණි. මේ සමගම මාර්කෝ පෝලෝ කෘතිය පාඨක ලෝකයා අතර බෙහෙවින් ජනප්‍රිය වන්නට පටන් ගැනිණි. ඉතා රසවත් ප්‍රබන්ධයක් ලෙස කියවූයේ අභිරුචියෙනි. අන්තර්ගතයෙහි 'සත්‍යය' පිළිබඳව විවාද නොකොට වසර සිය ගණනක් මුළුල්ලේ යුගයෙන් යුගයට මේ කෘතිය පාඨක ජනප්‍රියත්වයේ හිණිපෙත්තට නැගිණ. සියවස් දෙකකට පසු සිදු වූ කොලොම්බස් ගේ දේශගවේෂණය නිසා මාර්කෝ පෝලෝ ගේ කෘතියෙහි සඳහන් තොරතුරු සත්‍යයට සමීප බව සමස්ත ලෝකයාටම හැඟී ගියේ ය. එංගලන්තයේ පාසල් ශිෂ්‍යයන් කවුරුන් හෝ කියන්නා වූ ව්‍යාජ විස්තරයක් අසන්නට ලැබුණ හොත් එය හැඳින්වූයේ "It is a Marco Polo" යනුවෙනි.

මේ කෘතිය ව්‍යාජ වර්ණනාවක් සේ සලකා බැහැර කිරීමට වඩා අනුක්‍රමයෙන් සත්‍යයට වඩාත් සමීප කෘතියක් ලෙස යුගයෙන් යුයට සලකන්නට පටන් ගැනිණ.

මැගයිලන්ස් නමැති උගත් පූජකවරයකු පෙරදිග සංචාරය කොට ආපසු පැමිණි අවස්ථාවේ පැවසූයේ කඩදාසි මුදල් නෝට්ටු චීනය භාවිතයේ නොපැවැති බව ය. එහෙත් මිං රාජවංශ යුගයේ දී භාවිත කළ කඩදාසි මුදල් නෝට්ටු සුරක්ෂිතව තබා ඇති බැවින් පූජකවරයාගේ අදහස ප්‍රතික්ෂේප විය. චීනයේ ගල් අඟුරු නිපදවීම දුරාතීතයේ පටන් පැවැති බව මාර්කෝ පෝලෝ කියයි. එහෙත් යුරෝපීයයන් ගල්කුට්ටි පොඩි කර දහනයට යොදාගත් ආකාරය මාර්කෝ පෝලෝ විස්තර කැර ඇත. ඉන්දියාවේ ගස් වර්ගයක මිනිස් හිසක් තරම් විශාල ගෙඩි වර්ගයක් ඇතැයි මාර්කෝ පෝලෝ ලියා තැබී ය. ඒ පොල් ගැන කළ විස්තරයකි. පාමීර් හි ජීවත්වන යෝධ බැටලුවන් ගැන ද මාර්කෝ පෝලෝ විස්තර කරයි. ඔහුට පසුව එහි සංචාරය කළ ඕවිස් පෝලි ඒ බැටලුවන් දුටු බව කියයි. මේ අයුරින් මාර්කෝ පෝලෝ කෘතියෙහි ඇතුළත් පසුව සත්‍ය බවට සනාථ වූ කරුණු රාශියක් ඇතුත් නාමාවලියක් සකස් කළ හැකි වෙයි. මධ්‍යම ආසියාවේ අතිවිශාල භූමි ප්‍රදේශයක දීර්ඝ

Scanned by CamScanner

කාලයක් සංචාරය කිරීමෙන් ඉක්බිති මාර්කෝ පෝලෝ ලියූ දේශාටන වාර්තාව සත්‍යයක් බව වර්තමාන දේශ සංචාරකයෝ සනාථ කරති.

සමස්ත ආසියාවෙහි ම ප්‍රථම වරට සංචාරය කළ එකම පුද්ගලයා මාර්කෝ පෝලෝ ය. ඔහු පිළිවෙළින් තමා සංචාරය කළ දේශයන් රාජ්‍යයන් හා දූපත් ගැන නිවැරැදිව සටහන් කැර ඇත. දුරාතීතයේ මාර්කෝ පෝලෝ ගේ කෘතියෙහි සඳහන් කරුණු නිවැරැදි සේ පිළිනොගැනුන ද පසුව අනුක්‍රමයෙන් සත්‍ය තොරතුරු බව සනාථ වූයේ ය. අනතුරුව සිතියම් නිර්මාණය කළ විද්වතුන් ද මාර්කෝ පෝලෝ ගේ සටහන් අනුව බොහෝ ස්ථාන නැවත නිවැරැදි කිරීමට උත්සුක වූ බව පෙනේ. ඇමෙරිකාවේ සිතියම් නිර්මාපකයෝ ද චීනය හා අවට ප්‍රදේශ පිළිබඳ සිතියම් නිර්මාණය කිරීමේ දී මාර්කෝ පෝලෝගේ දේශාටන වාර්තාව උපයෝගී කැර ගත්හ. පසුගිය සියවසෙහි සංචාරකයන් ද, දේශ ගවේෂකයන් ද පෙරදිග රට රාජ්‍යයන් කරා ගමන් ගත්තේ මාර්කෝ පෝලෝ ගේ පියවර සටහන් ඔස්සේ ය. එසේම මෑත දී යුරෝපයේ සිට පෙරදිගට ගමන් ගත් දේශ ගවේෂකයන් හා සංචාරකයන් පැවසූයේ මාර්කෝ පෝලෝ සිය වාර්තා සටහන් ලියා ඇත්තේ සත්‍යය පදනම් කැරගෙන නිරවද්‍ය ආකාරයෙන් බවයි.

වසර හය සියයකට පෙර මාර්කෝ පෝලෝ ගමන් ගත් මාර්ගය ඔස්සේ යුරෝපීය දේශ ගවේෂණකයන් හා සංචාරකයන් වන ස්වෙන් හෙඩින්, සර් අව්රල් ස්ටෙයින්, කර්නල් හෙන්රි යුලේ, ආචාර්ය පෝල් පැලියට්, කර්නල් කොස්ලොව් විලියම් රොක්හිල්, සහ මේජර් සයිකිස් යනාදීහු මෑත දී ගමන් ගත්හ. පළමු වරට වැනිසියානු වෙළෙඳ පිරිස පෙරදිගට ගමන් ගත්තේ මේ මාර්ගයේ බව ඔව්හු සනාථ කළහ.

මාර්කෝ පෝලෝ ගේ කීර්තිය රඳා පැවැතීමට ඒ තොරතුරු පමණක් වුවද ප්‍රමාණවත් වේ. එහෙත් තවද එයට ඌන පූරණ වශයෙන් සඳහන් කළ යුතු කරුණු බොහෝ ය. පර්සියාවේ බිහිසුණු අනතුරුදායක කාන්තාර ඔස්සේ ගමන් ගත් පළමුවන යුරෝපීය සංචාරකයා මාර්කෝ ය. බෝටානයේ පළිඟු මතුවන ජලධාරා දුටු පළමුවන යුරෝපීයයා ඔහු යයි ස්වෙන් හෙඩින් කියයි. චීනයේ ජනයාගේ ජීවන තොරතුරු ද ටිබැටය, බුරුමය, සියම,

Scanned by CamScanner

ලංකාව, ඉන්දියාව ඇතුළු තවත් සියයකට අධික රටවල තොරතුරු ද ඔහු ඇසූ දුටු ආකාරයන් විස්තර කැර තිබේ. සයිබීරියාවේ අඳුරු ලෝකය, සැන්සිබාරයේ කලු ජාතිකයන් සහ ඇත්දළ, ක්‍රිස්තියානි ඇබිසීනියාව සහ මිනීමස් කන සුමාත්‍රාව ගැන ද බටහිර ලෝකයට පළමු වරට හෙළි කෙළේ මාර්කෝ පෝලෝ ය. ආක්ටික් සමුද්‍රය ආශ්‍රිත ප්‍රදේශයේ හිම වලසුන්, බල්ලන් විසින් ඇදගෙන යනු ලබන කරත්ත, ඉන්දියාවේ දරුණු උෂ්ණත්වය, එහි දියුණු දියමන්ති ආකර, මුතුපර හා අරුම පුදුම යන්ත්‍ර මන්ත්‍ර, ඉන්ද්‍රජාල ආදිය ගැන සියැසින් දුටු විස්තර මාර්කෝ පෝලෝ ඉතා පැහැදිලිව සඳහන් කරයි. කුබ්ලායි ඛාන්ගේ අත්‍යාලංකාර මාලිගය, මොංගෝලීය හමුදා සංවිධානය සමස්ත ලෝකය ජයගැනීම සඳහා යුද්ධ ආරම්භ කළ ආකාරය, අරුම පුදුම පක්ෂීන් සිවුපාවන්, ස්වර්ණ ඡදන සහිත විහාරාරාම, ගුප්ත චාරිත්‍ර, අරුම පුදුම දර්ශන, ඓතිහාසික සහ දෘෂ්ටාන්ත කථා සහ තවත් සිත් ගන්නා විසිතුරු විස්තර රාශියක් මාර්කෝ පෝලෝ ලියා තැබී ය. එවැනි තොරතුරු සංග්‍රහ කැරුණු ඓතිහාසික කෘතියක් මේ දක්වා දක්නට නොලැබේ.

මාර්කෝ පෝලෝ ජීනීවා සිරමැදිරියේදී සිය සුමිතුරු සිරකරුලවා මේ පොත ලියැවූයේ මුද්‍රණ ශිල්පය දියුණු වීමට ඉහත කාලයක ය. අතින් ලියූ පිටපතෙහි සඳහන් වචන පිළිබඳ වෙනස්කම් වරින් වර සිදුවූ බව පැහැදිලි ය. මේ අත් පිටපතෙහි පිටපත් බොහෝ ගණනක් ලෝකයේ නොයෙක් රටවල පුස්තකාලයන්හි තැන්පත් කැර තිබේ. මේ පිටපත් සිය ගණන එකකට එකක් සමාන නොවේ. සමහර පිටපත් ලියැවී ඇත්තේ ඉතාලි භාෂාවෙනි. ඇතැම් පිටපත් ලතින් භාෂාවෙන් හෝ ප්‍රංශ භාෂාවෙන් ලියැවී තිබේ.

පළමුවන වරට මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කළ මාර්කෝ පෝලෝ කෘතියෙහි සංස්කාරක වූයේ රැමුසියෝ ය. 1559 දී මෙය මුද්‍රණද්වාරයෙන් නිකුත් විණි. මාර්ස්ඩෙන් ගේ ශාස්ත්‍රීය විග්‍රහාත්මක ඉංග්‍රීසි කෘතිය පළවූයේ ඉතාලි භාෂාවෙන් කැරුණු පරිවර්තනයක් ලෙසිනි. ඒ ක්‍රි. ව. 1818 දී ය. 1854 දී නැවැත මේ කෘතියෙහි සංශෝධිත මුද්‍රණයක් ප්‍රකාශයට පත්විය. තෝමස් රයිට් මේ සංස්කරණය කෙළේ බොන් නුවර පුස්තකාලය වෙනුවෙනි. එසේ ම අමතර පරිච්ඡේද කිහිපයක් ද මූලික සටහන් අරහයා සංක්ෂේප ලුහුඬු විස්තර ද එහි

Scanned by CamScanner

ඇතුළත් විය. එසේම Everyman's පුස්තකාලය වෙනුවෙන් අංග සම්පූර්ණ ලෙස ඉංග්‍රීසි පාඨකයන් වෙනුවෙන් මැනුවෙල් කොමරොෆ් විසින් මෑත භාගයේ තවත් කෘතියක් පළ කෙළේ ය. ඒ 1926 දී ය.

ප්‍රංශයේ භූගෝල විද්‍යා සංගමය මගින් 1824 දී ඉතා වැදගත් සංස්කරණයක් සහිතව මාර්කෝ පෝලෝ කෘතිය ප්‍රකාශයට පත් කැරීන. පැරණි ප්‍රංශ භාෂාවෙන් ලියැවුණු ත් පිටපත ප්‍රාඥයන් පිරිසකගේ සාකච්ඡාවට හා අධීක්ෂණයට ලක් කැරෙමින් මේ සංස්කරණය බිහිවූයේ ය. මාර්කෝ පෝලෝගේ ප්‍රථම අත් පිටපත ලියැවුණේ සමකාලීන ප්‍රංශ වෙළෙඳුන්ගේ ව්‍යවහාර භාෂාවෙන් යයි සමහරු විශ්වාස කරති. පසුව ඒ අත් පිටපත ප්‍රංශ ශාස්ත්‍රධරයකු වන එම්. පවුතියර් විසින් සංස්කරණය කරන ලදුව 1865 දී ප්‍රංශයේ ප්‍රකාශයට පත්විණ.

කීර්තිමත් ඉංග්‍රීසි පඬිවරයකු වන හෙන්රි යූලේ ප්‍රංශ භාෂාවෙන් පළ වූ කෘති ආශ්‍රය කොට ගෙන ඉංග්‍රීසියට පරිවර්තනය කෙළේ සියලු භාෂාවලින් ලියැවුණු කෘතීන් හා මුල් අත් පිටපත හා සසඳ බලමිනි. සියලු අඩුලුහුඩුකම් සපුරාලමිනි.

හෙන්රි යූලේ ඉන්දියාවේ දිගු කලක් රැඳී සිටිමින් 1863 දී මාර්කෝ පෝලෝ යුගය දක්වා දේශ සංචාර අරභයා වැදගත් කෘතීන් කිහිපයක් පළ කෙළේ ය. 1866 දී Cathay and the way Thither නමැති කෘතිය පළකොට අනතුරුව එංගලන්තයට පැමිණ මාර්කෝ පෝලෝ කෘතිය පිළිබඳ පර්යේෂණ ඇරැඹී ය. මේ සඳහා ඔහුගේ ජීවිත කාලයේ සෑහෙන කොටසක් කැප විය. 1875 නිකුත් වූ එකී කෘතිය හාත්පසින් නිරවුල් නිවැරැදි පර්යේෂණාත්මක ග්‍රන්ථයක් සේ සැලැකේ. මාර්කෝ පෝලෝ පිළිබඳ තවත් විස්තර සහි කෘතියක් පිළියෙළ කරමින් සිටියදී හෙන්රි යූලේ 1889 දී මෙලොවින් සමුගති. අනතුරුව හෙන්රි කෝඩියර් නමැති ප්‍රංශ පඬිවරයා 1902 දී පළවූ කෘතිය සඳහා අතිශයින් දායක විය.

හෙන්රි කෝඩියර් 1920 දී පළ කළ මාර්කෝ පෝලෝ සංස්කරණයට හෙන්රි යූලේගේ පර්යේෂණ සමුදායට තවත් වැදගත් කරුණු රැසක් එකතු කැරිණ.

1818 දී පළ කැරුණු "මාර්ස්ඩෙන්ස්" මාර්කෝ පෝලෝ ශාස්ත්‍රිය කෘතිය සංචාරකයා පර්යේෂණ මධ්‍යකාලීන ඉතිහාසය, භූ විද්‍යා

Scanned by CamScanner

සම්භාරයකින් යුක්ත ය. එය මාර්කෝ පෝලෝ සංචාර පිළිබඳ පරිසමාප්ත කෘතියකි. මාර්ස්ඩෙන්ස් ගේ ඉංග්‍රීසි පරිවර්තනය ලියැවුණේ රමණීය භාෂා ශෛලියකිනි. පැරණි භාෂා සම්ප්‍රදායය නවීකරණය කැරිණි. ප්‍රංශ අත් පිටපතෙහි වූ සදොස් තැන් නිදොස් කරන ලදී. යූලේ ගේ පරිවර්තනයෙහි වූ දීර්ඝ වාක්‍ය පාඨකයාගේ සුඛාවබෝධය සඳහා සරල බවට පැමිණවීය. මාර්කෝ පෝලෝ සඳහන් කළ ස්ථාන නාම එලෙසම මේ කෘතියෙහි ද සඳහන් වූ අතර ඇතැම් ස්ථාන නාම පමණක් කන්බලු (පීකිං) යනාදී ආකාරයෙන් වෙනස් කැරිණ. දීර්ඝ පරිච්ඡේද යළිත් කුඩා පරිච්ඡේද වශයෙන් සකස් කරන ලදී. විශාල වෙළුම් තුනකින් සමන්විත කෘතියක් ලෙසින් අවසානයේ මාර්කෝ පෝලෝ ප්‍රකාශයට පත් කැරිණ.

මාර්කෝ පෝලෝ සංචාරකයෙකි. වෙළෙඳ පවුලක සාමාජිකයෙකි. ඔහුගේ චරිතය කෙබඳු වී ද? ඔහුගේ පියා ද, සුළු පියා ද සමග පෙරදිග සංචාරය කෙළේ වෙළෙඳාම මුදල් අරමුණු කොටගෙන ය. එහෙත් ඔහු විවිධ අවදානම් අනතුරුදායක අවස්ථාවනට මුහුණ දෙමින් පෙරදිග ලෝකය හා ලෝකයා විමර්ශනය කෙළේ ය. සොබා දහම කෙරෙහි මාර්කෝ පෝලෝ යොමු කෙළේ තියුණු ඇසකි.

ස්වකීය සංචාරයෙහි දී දුටු පක්ෂීන් පිළිබඳව පළමු කාණ්ඩයෙහි සඳහන් කරයි. පක්ෂි වර්ග විස්සක් ගැන විශේෂ සටහන් ඇතුළත් ය. අනතුරුව සිවුපාවන් වෘක්ෂලතා පළතුරු ගඩාගෙඩි ආදිය ගැන සඳහන් කරන්නේ ස්වභාව ධර්මයේ ආශ්චර්යජනක සම්පත් පිළිබඳව කුල්මත් සිතිනි. ඔහු ධන සම්පත් මුතුමැණික් මෙන්ම ටිබැටයේ කස්තුරි සිය රටට ගෙනාවේ ය. බ්‍රසීලයේ ඇට සහ පැල වර්ග ද රැගෙන ආයේ තම ගෙවුයන්හි රෝපණය කිරීමේ අභිලාෂයෙනි. එහෙත් එරට මුදල් නෝට්ටු හෝ කලාත්මක නිර්මාණ රැගෙන ආ බවක් සඳහන් නොකරයි.

චීන මහා ප්‍රාකාරය ගැන හෝ චීනයේ ස්ත්‍රීන් ගැන විස්තර ඔහු සඳහන් කර නැත. එහෙත් පාදවල රිදී මුදු දැමූ පක්ෂීන් ගැන කියයි. කාව්‍යමය ශෛලියකින් නොලියවුණු මේ කෘතිය වාර්තාමය ස්වරූපයක් දරයි.

Scanned by CamScanner

කුබ්ලායි ඛාන් අධිරාජයාට ඉතා පක්ෂපාතව සේවය කළ මාර්කෝ පෝලෝ ඔහුගේ තේජස් රූප ස්වභාවය, රණශූරත්වය, පරිත්‍යාගශීලීතාවය, විචක්ෂණ බුද්ධි ප්‍රභාව සඳහන් කරයි. එහෙත් ඔහුගේ අන්තඃපුර කුමරියන් පිළිබඳ විස්තර ඇතුළත් කරුණු ලියා නැත.

කුබ්ලායි ඛාන්ගේ පාලන සමයේ චීනයේ සහ සමකාලීන රාජ්‍යයන් පිළිබඳ ප්‍රාමාණික විස්තර මේ කෘතියෙහි අන්තර්ගත ය. ජිනෝවා සහ වැනිසිය අතර පැවැති යුද්ධයේ දී නෞකා පෙරමුණේ ගමන් ගත් මාර්කෝ පෝලෝ සිරභාරයට ගැනිණ. ජිනෝවා සිර කඳවුරක සිරකරුවකු වශයෙන් සිත් තැවුලට පත්ව සිටියදී ලියැවුණු මෙහි කාව්‍යමය ගුණ මහිමයක් ඇතුළත් නොවීම පුදුමයක් නොවේ. සහෝදර සිරකරුවකු ලවා චාරිකා විස්තරය සටහන් කැරවූ බැවින් මාර්කෝ පෝලෝ අතින් ලියැවෙන රටාවට වඩා වෙනසක් මෙහි සිදුවන්නට ඇත. එහෙත් මාර්කෝ පෝලෝ ගේ පරිපූර්ණ දේශාටන වාර්තාව මෙහි අන්තර්ගත ය.

වසර ගණනාවක් මුළුල්ලේ THE TRAVELS OF MARCO POLO කෘතිය කියවමින් පරිවර්තනය කෙළෙමි. R. E. Latham ගේ ඉංග්‍රීසි පරිවර්තනය ඇසුරෙනි. අනතුරුව දුලිප් මහතන්තිල මහතා Manuel Komroff ගේ නව සංස්කරණය සපයා දුන්නේ ය. චීනයේ ලියැවුණු කෘතීන් ද විශ්වකෝෂ කිහිපයක් ද ඇසුරු කරමින් කරුණු සසඳ බලා මේ සිංහල පරිවර්තනය සාර්ථක ලෙස සමාප්ත කිරීමට හැකි විය.

රුසියාවේ ලුමුම්බා මිත්‍රත්ව සරසවියේ ශාස්ත්‍රපති උපාධිධාරී රුසියානු භාෂාව හා ඉතිහාසය පිළිබඳ විශේෂඥයකු වූ සිංහල විශ්වකෝෂය කර්තෘ මණ්ඩලයේ රත්ජන දේවමිත්‍ර සේනාසිංහ මහතා දිවා රෑ වෙහෙස නොතකා විවිධ පිටපත් සපයා දීමෙන් මගේ වෑයම සාර්ථක කෙළේ ය. හොරණ විද්‍යාරත්න විද්‍යා පීඨයේ ආචාර්ය චන්ද්‍රත ප්‍රනාන්දු මහතා ද මෙහිදී බොහෝ උපකාර කළ බව සඳහන් කරනුයේ කෘතඥතා පූර්වක දයාබර හැඟීමෙනි. මාගේ දයාබර බිරිඳ චන්ද්‍රා පද්මිනී මාන්නප්පෙරුම මෙහි අත් පිටපත කියවා උපදෙස් දුන්නා ය. කීර්තිමත් ග්‍රන්ථ ප්‍රකාශයකු වූ දයාවංශ ජයකොඩි මැතිතුමා මාර්කෝ පෝලෝ මුද්‍රණයෙන්

Scanned by CamScanner

ප්‍රකාශයට පැමිණවීමේ කාර්ය භාරය හෘදයංගම හැඟීමෙන් භාර ගැනීම මට මහත් ධෛර්‍යයකි. මාර්කෝ පෝලෝ දයාවංශ ජයකොඩි ග්‍රන්ථාවලියට ආභරණයක් වේවා යයි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

නවකථාවක් මෙන් එක හුස්මට කියවා රසවිඳිය හැකි මේ කෘතිය කල්පිතයක් සේ පෙනෙන සත්‍යයකි. ත්‍රාසය භීතිය, කුතුහලය වඩමින් පාඨකයා ආනන්දයෙන් ප්‍රඥාව කරා ගෙන යෑමට මාර්කෝ පෝලෝ සමත් ය. බටහිර ලෝකයේ මෙන් ම පෙරදිග ලෝකයේ ද පාඨකයන් අතර මාර්කෝ පෝලෝ චිර ප්‍රසිද්ධ ය. යුරෝපයේ පාසල් ශිෂ්‍යයෝ වීර කාව්‍යයක් සේ මාර්කෝ පෝලෝ කියවා රස විඳිති. පරම්පරා භේදයෙන් තොර මාර්කෝ පෝලෝ යුගයෙන් යුගයට නවීන කෘතියක් සේ සම්භාවනාවට පාත්‍ර වේ. අප රටේ පවත්නා කියැවීමේ රුචිය පිළිබඳ ගැටලුවට මාර්කෝ පෝලෝ සාර්ථක විසඳුමකි.

එබැවින් දයාවංශ ජයකොඩි මහතාට ද, දයාවංශ ජයකොඩි සමාගමයෙහි කාර්ය මණ්ඩලයට ද, පිටකවරය නිර්මාණය කළ කුමුදු තාරක මහතාට ද මේ දුෂ්කර කාර්‍යය සඳහා උදව් උපකාර කළ හිත මිතුරන් සියලු දෙනාට ද මගේ ගෞරවය පුද කරමි.

**සරත්චන්ද්‍ර ජයකොඩි**

2077 - 11 - 22

හඳපාන්ගොඩ දී ය.

Scanned by CamScanner




G - මහා ඛාන්, L - ලෙවන්ට් ඛාන්, T - තුර්කිස්ථාන් ඛාන්, W - බටහිර ඛාන් (ස්වර්ණ පරපුර)
වරහන් තුළ දැක්වෙන්නේ මියගිය වර්ෂයයි.

Scanned by CamScanner

# නමෝ විත්තිය

අධිරාජයෙනි! රජවරුනි! ආදිපාදවරුනි! රදල වරුනි! අදිකාරම් වරුනි! වංශාධිපතිවරුනි! මහාජනතාවෙනි!

නැගෙනහිර ලෝකයේ පිහිටි රාජ්‍යයන් රාජධානි, ප්‍රදේශ, පළාත් සහ එහි වාසය කරන්නා වූ මනුෂ්‍ය වර්ගයාට අයත් වන නානාප්‍රකාර ජාති කුලගෝත්‍ර පිළිබඳ සවිස්තර තොරතුරු දැන ගැන්මට කැමත්තේ නම් ඔබ මෙම පෙත කියවා බැලිය යුතු ය. එසේ කියවා බැලීමේ දී ආර්මේනියාව, පර්සියාව සහ ඉන්දියාවේ ද ටාටර්වරුන්ගේ පාලනය පවත්නා ප්‍රදේශයන්හි ද තවත් ප්‍රදේශයන්හි සහ දූපත්වල ද වෙසෙන මිනිසුන්ගේ අරුම පුදුම ගති ගුණ සහ ජීවන චර්යාවන් දැනගත හැකි වේ. වැනිසියේ වැසියකු වූ උගත් බුද්ධිමත් විචක්ෂණ ප්‍රඥාවන්ත මාර්කෝ පෝලෝ විසින් මේ ග්‍රන්ථය ලියන ලදී. ඇසින් දුටු දෑ මෙන් ම බොහෝ දෙනාගෙන් අසා දැනගත් තොරතුරු මෙහි සඳහන් කැර ඇත. එබැවින් මෙහි ඇතුළත් කරුණු සත්‍ය තොරතුරු බව පිළිගත යුතු ය.

එපමණක් නොව ආදම් ගේ මැවීමෙන් බිහි වූ මනුෂ්‍යයාගේ පටන් මේ දක්වා කිසිදු මිසදිටුවකු මහමදිකයකු ක්‍රිස්තුලබ්ධිකයකු හෝ අනෙකුත් කිසියම් වාර්ගිකයකු විසින් හෝ මාර්කෝ පෝලෝ විසින් දුටු දැනගත් ඉතා වැදගත් තොරතුරු විමසුමට ලක් කැර නැත. මේ ස්ථාන මෙයට පෙර කිසිවකුගේ ඇසට හසුවී නොමැත. මෙහි සඳහන් ප්‍රදේශයන්හි මෙයට පෙර ඔවුන් සංචාරයෙහි යෙදී නොමැත. එබැවින් මාර්කෝ පෝලෝ විසින් ඇසූ දුටු අරුම පුදුම තොරතුරු සංග්‍රහ කොට ග්‍රන්ථයක් නිර්මාණය කිරීම යෙහෙකැයි කල්පනා කළේ ය. අපගේ ස්වාමි වූ ක්‍රිස්තුන් වහන්සේගේ වර්ෂයෙන් 1298 වැන්නෙහි දී ජිනීවා නුවර බන්ධනාගාර ගතව සිටි කාලයෙහි එකී බන්ධනාගාරයෙහි ම සිටි පිසා නුවර වැසියකු වූ රස්ටිචෙලෝ මහතා ලවා මේ පොත ලියැවීය. මෙහි ඇතුළත්

Scanned by CamScanner

කැර අත්තේ මාර්කෝ පෝලෝගේ මතකයෙහි රැඳී තිබූ කරුණු පමණි. පුරා වසර විසිහයක් මුළුල්ලේ මාර්කෝ පෝලෝ නොයෙක් දේශයන්හි සංචාරය කෙළේ ය. මේ පොත කොටස් තුනකින් සමන්විත ය.

අපගේ ස්වාමීන්ගේ වර්ෂයෙන් 160 දී බොල්ඩ්වින් අධිරාජයා කොස්තන්තිනෝපලය පාලනය කෙළේ ය. වැනිසියේ ඩොගේ පුරවරය පාලනය කෙළේ පොන්ටේ මහතා ය. යථෝක්ත වර්ෂයේ දී මාර්කෝ පෝලෝ සිය පියාණන් වූ නිකොලෝ පෝලෝ ද, මෆියෝ පෝලෝ ද යන වැදගත් උගත් දෙපළ සමග ස්වකීය නෞකාවකින් අගනා වෙළඳ භාණ්ඩ පටවා ගෙන කොස්තන්තිනෝපලයෙන් සූඩක් වරාය බලා පිටත් වූහ. අගනා ස්වර්ණාභරණ සහ වෙනත් වෙළෙඳ භාණ්ඩ ඈත රටවලට ගොස් විකිණීම ඔවුන්ගේ අභිප්‍රාය විය. ඔව්හු කලු මුහුදේ සූඩක් වරායට නිරුපද්‍රිතව සේන්දු වූහ.

එහි නැංගුරම් ලා දින කිහිපයක් රැඳී සිට අනතුරුව බටහිර ටාටර් අධිපති බර්තාගේ මාලිගය වෙත ගමන් ඇරැඹූහ. ගොඩබිම ඔස්සේ මේ ගමනට දින ගණනක් ගත විය. බර්තා කුමාරයා ත්‍යාගශීලි නිර්ලෝභී සාධාරණ ගුණගරුක තැනැත්තකු ලෙස ටාටර්වැන්ගේ ප්‍රශංසාවට ලක්වූවෙකි. බර්තා කුමාරයා මේ වැනිසියානු වෙළෙඳුන් මහත් ගෞරවාදරයෙන් පිළිගත්තේ ය. කුමාරයාගේ පිළිගැනීමෙන් තුටු පහටු වූ වෙළෙඳ පිරිස ඉතා අලංකාර අගනා ස්වර්ණාභරණ රාශියක් ඔහු අභිමුවෙහි තැබූහ. යථෝක්ත ස්වර්ණාභරණ කෙරෙහි කුමාරයා සිය ප්‍රසාදය පළ කළ බැවින් ඔව්හු ඒ සියල්ල පරිත්‍යාග කළහ. මේ පරිත්‍යාගය පිළිබඳව මවිතයට පත් වූ කුමරා එමෙන් දෙගුණයක් මුදල් ගෙවීමටත් තවත් වටිනා තුටු පඬුරු සම්භාරයක් වෙළෙඳුන්ට පිරි නැමීමටත් නියෝග කෙළේ ය. වෙළෙඳ පිරිසට වඩා තමන් දානපති බව පෙන්වීමේ අදහසිනි.

වසරක පමණ කාලයක් වැනිසියානු වෙළෙන්දෝ මේ ප්‍රදේශයේ වාණිජ කටයුතු කරගෙන ගියහ. අනතුරුව මවු රට බලා යෑමට තීරණය කළ නමුදු බර්තා කුමරු හා නැගෙනහිර ප්‍රදේශය පාලනය කළ හුලාගු කුමරු අතර යුද්දයක් ඇරැඹිණ. මේ යුද්දය නිසා වැනිසියේ වෙළෙඳුන්ගෙන් ආපසු ගමනට බාධා පැමිනුණි. සටනේ දී හුලාගු කුමාරයාගේ සේනා ජයග්‍රහණය අත්පත් කැර

Scanned by CamScanner

ගති. මෙය අති බිහිසුණු සටනකි. ආපසු ගමන් ඇරැඹීමට සූදානම් වී සිටි වෙළෙඳුනට ඉදිරි මග අනාරක්ෂිත විණ. මේ අනාරක්ෂිත මාර්ගය මග හැර වෙනත් දිසාවකින් ආපසු යෑමට ඔව්හු තීරණය කළහ.

කොස්තන්තිනෝපලය බලා නැගෙනහිර දිසාවෙන් ගමන් කළ හොත් අනතුරු වළකා ගත හැකි බව ඔවුන්ගේ තීරණය විය. එය ජනාකීර්ණ මාර්ගයක් නොවන බව ද ඔවුනට දැනගන්නට ලැබිණ. බර්තා කුමරාගේ රාජ්‍යයේ දේශ සීමාව අසලින් මේ මාර්ගය වැටී තිබිණි. මේ මාර්ගය ඔස්සේ ගමන් කළ වෙළෙඳ පිරිස 'උකාකා' නමැති නගරයකට ළඟා වූහ. එය බටහිර ඛාන්වරයාගේ දේශ සීමාවේ පිහිටියේ ය. අනතුරුව එහි සිට ඉදිරියට ගමන් කොට ටයිග්‍රීස් ගංගාව තරණය කළහ. මෙය දෙව්ලොව ගංගා සතරින් එකක් ලෙස සැලැකේ. (ඔවුන් තරණය කැර ඇත්තේ වොල්ගා නදියයි) දින දාහතක් එතැන් සිට ඉදිරියට කාන්තාරයක් ඔස්සේ ගමන් කළහ. අනතුරුව ඔවුන් පිවිසියේ 'බුඛාරා' නමැති අලංකාර පුරවරයට ය. මේ පළාත හඳුන්වනුයේ ද බුඛාරා යන නමිනි. එහි පාලකයා 'බරක්' නම් විය. සමස්ත පර්සියාවේ ම අත්‍යාලංකාර නගරය එයයි. මේ නගරයෙහි සිට ආපසු යෑමට හෝ ඉදිරියට ගමන් කිරීමට දුෂ්කර වූයෙන් පුරා වසර තුනක් වෙළෙඳ පිරිස එහි රැඳී සිටියහ. පසුව ඔවුනට එක්තරා බුද්ධිමත් වැදගත් වංශවත් පුද්ගලයකු මුණ ගැසුණි. ඔහු හුලාගු ගේ දූතයෙකු වශයෙන් කුබ්ලායි ඛාන් අධිරාජයා බැහැදැකීමට ගමන් අරඹා සිටියේ ය. කුබ්ලායි ඛාන්ගේ මාලිගය පිහිටියේ ගිනිකොන හා නැගෙනහිර අතර ඈත ප්‍රදේශයක ය. තානාපතිවරයාට මේ වෙළෙඳ දෙසොහොවුරන් මුණ ගැසීම නිසා මහත් සතුටක් ඇති විය. ඉතාලි ජාතිකයකු මුණ ගැසීමට ඉමහත් අපේක්ෂාවක් පැවැති බවත් මේ වෙළෙඳ දෙසොහොවුරන් මුණ ගැසීමෙන් තම බලාපොරොත්තුව ඉටු වූ බව තානාපතිවරයා කියා සිටියේ ය. වෙළෙඳුන් හට ටාටර් භාෂාවෙන් කථා කිරීමට හැකිවීම ඔවුනට අදහස් හුවමාරු කැර ගැනීමට මහත් වාසියක් විය. ඔවුන්ගේ අදහස් හා ඇවතුම් පැවතුම් ගැන ප්‍රසාදයට පත් රාජ දූතයා තමන් සමග කුබ්ලායි ඛාන් අධිරාජයා බැහැදැකීමට යන ගමනට එක් වන ලෙස ඇරියුම් කෙළේ ය. යම් හෙයකින් කුබ්ලායි ඛාන් අධිරාජයා හමුවට ගියහොත් එතුමා මහත් සතුටින්

Scanned by CamScanner

ඔවුන් පිළිගනු ඇතැයි ද තානාපතිවරයා කී ය. එපමණක් නොව අගනා තුටුපඬුරු පිරිනමන බව තමාට සහතික බව ද කියා සිටියේ ය.

සියරට බලා යාත්‍රා කිරීමට අපේක්ෂා කළ නමුදු ඒ ගමන අන්තරාදායක බව හැඟී ගිය බැවින් වෙළෙඳ සොහොවුරෝ තානාපතිවරයා සමග කුබ්ලායි ඛාන් හමුවීමට යෑමට සිය එකඟතාව පළ කළහ. අනතුරුව වැනිසියේ සිට පැමිණි ක්‍රිස්තු ලබ්ධික සේවකයන් කිහිප දෙනා ද සමග වෙළෙඳ සහෝදරයන් තානාපතිවරයාට එක් වී ගමනාරම්භ කෙළේ දේවාශිර්වාදය ප්‍රාර්ථනා කරමිනි. කුබ්ලායි ඛාන් අධිරාජයාගේ මාලිගයට ළඟාවීමට ඔවුනට වසරක පමණ කාලයක් ගතවිණ. මේ ප්‍රමාදයට හේතු වූයේ අතර මඟ දී හමු වූ ගංගා උතුරා යෑමත් හිමපතනයත් නිසා ය. මේ ගමනේ අතර මග දී මවිතය දනවන බොහෝ දෑ දක්නට ලැබිණ. එහෙත් ඒ කරුණු මේ අවස්ථාවෙහි ඉදිරිපත් නොකැරේ. ඉදිරි සංචාරය පිළිබඳ කථාන්තරයේ දී ඒ ගැන අසන්නට ලැබෙනු ඇත.

තානාපතිවරයා සංචාරක වෙළෙඳුන් කුබ්ලායි ඛාන් අධිරාජයා වෙතට කැඳවා ගෙන ගියේ ය. අධිරාජයා ඔවුන් පිළිගත්තේ ඉමහත් සතුටිනි. ප්‍රථම වරට රෝමයෙන් පැමිණි ආගන්තුකයන් දෙදෙන සමග ප්‍රිය වදනින් අල්ලාප සල්ලාපයෙහි යෙදී සුමධුර ආහාර පානාදියෙන් සංග්‍රහ කොට ගරු සම්මාන සැලකිලි දැක්වූයේ ය. පෞද්ගලික තොරතුරු ආගිය ගමන් පිළිබඳව සාකච්ඡා කොට අනතුරුව රෝමය පිළිබඳ විස්තර විමසී ය. බටහිර ලෝකය පිළිබඳව ද රෝම අධිරාජයා පිළිබඳ විස්තර ද යුරෝපයේ වෙනත් රජවරුන් කුමාරවරුන් පිළිබඳව ද ක්‍රිස්තු ලබ්ධිකයන් පිළිබඳව ද විස්තර විමසා දැනගත්තේ ය. ඒ ඒ රාජධානිවල විශාලත්වය, ආණ්ඩු ක්‍රමය, සංග්‍රාමෝපක්‍රම අධිකරණය, නීති පද්ධතිය, විදේශ සම්බන්ධතා ආදිය ගැන ද කුබ්ලායි ඛාන් අධිරාජයා ඔවුන්ගෙන් අසා දැන ගත්තේ ය. පාප් තුමාගේ තොරතුරු ආගමික පූජා විධි ක්‍රම ආගම් ඇදහීම ක්‍රිස්තු ධර්මය සම්බන්ධ බොහෝ තොරතුරු අධිරාජයා සංචාරක වෙළෙඳුන්ගේ නැවත නැවත විමසා අවබෝධ කැර ගති.

ටාටර්වරුන්ගේ භාෂාව හෙවත් මොංගෝලියාවේ භාෂාව ඉතා හොඳින් කථා කළ හැකි වූ බැවින් සංචාරක වෙළෙඳුන්ට අධිරාජයා සමග ඉතා පහසුවෙන් අදහස් හුවමාරු කැරගත හැකිවිණ. මේ

Scanned by CamScanner

සාකච්ඡාවෙන් ප්‍රමුදිත වූ අධිරාජයා වරින් වර ඔවුන් සමග සාකච්ඡා කෙළේ ය. ඔවුන් අධිරාජයා විමසූ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු දුන්නේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් පැහැදිලි නිශ්චිත ප්‍රත්‍යක්ෂ අවබෝධයෙනි. වැඩිදුරටත් විවිධ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමෙන් පසු අධිරාජයා තීන්දු කෙළේ ඔවුන් රෝමයේ පාප් වහන්සේ වෙත දූත මෙහෙවරක යෙදවීමට ය. මේ පිළිබඳව වැඩි දුරටත් සිය අමාත්‍ය මණ්ඩලය සමග සාකච්ඡා කොට "බොතගල්" නමැති සිය රාජ දූතයා කැඳවාගෙන ගොස් පාප් වහන්සේ හමුවන ලෙස වෙළෙඳ බුද්ධිමතුන් සියයක් තම රටට ගෙන්වා ගැනීමට ද කටයුතු කරන ලෙසට සැලසුම් සකස් කැර ගැන්මට ද දැන්වීය. ඔවුන් විවිධ ශිල්ප ශාස්ත්‍රයන්හි නිපුණයන් විය යුතු අතරම ක්‍රමානුකූලව විධිමත් ලෙස ක්‍රිස්තු ධර්මය පිළිබඳව සාකච්ඡා කිරීමට හැකි පිරිසක් විය යුතු බව ද කීවේ ය. ටාටර්වරුන් යක්ෂයන් දෙවියන් සේ සලකා පුද පූජා පවත්වන බැවින් ඔවුන්ගේ අන්ධ විශ්වාස මිත්‍යා විශ්වාස දුරු කර සත්‍යාවබෝධය ලබා දිය හැකි පිරිසක් මෙරටට කැඳවා ගත යුතු බවට වැඩි දුරටත් කරුණු පහදා දුනි.

"ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මය තමන් ගෞරවයෙන් සලකන බවත් උන්වහන්සේ සැබෑ දෙවියකු ලෙස පිළිගන්නා බවත් එහෙයින් දූතයන් ආපසු එන ගමනේ දී උන්වහන්සේගේ සොහොන මත නිරන්තරයෙන් දැල්වෙන ප්‍රදීපයෙන් තෙල් ස්වල්පයක් ද රැගෙන ආ යුතු ය." යයි ඔහු නියෝග කළේ ය.

අධිරාජයාගේ මේ නියෝගය ඔවුන් හිස් මුදුනින් පිළිගන්නා බවට අධිරාජයා අබිමුවෙහි මුනින් වැතිර නමස්කාර කොට ප්‍රතිඥා දුන්හ. අනතුරුව අධිරාජයා රෝමයේ පාප් වහන්සේට භාරදෙනු පිණිස සංදේශයක් ලියැවී ය. එපමණක් නොව ටාටර් රාජ්‍යයේ සාම්ප්‍රදායික චාරිත්‍රානුකූලව රන් පතක රාජාඥාව ලියා අධිරාජයාගේ මුද්‍රාව තබා ස්වකීය යටත් ප්‍රදේශවල අධිපතීන්ට පෙන්වා ගමන් පහසුකම් ද උපකාර ද ලබාගන්නා ලෙස කියා තානාපතීන්ට භාර දුන්නේ ය. එවිට ඒ ඒ ප්‍රදේශයන්හි දී නවාතැන් පහසුකම් ද, ආහාර පාන ද, ආරක්ෂාව ද, එක් නවාතැන් පලක අවශ්‍ය ආරක්ෂා භටයන් සැපයීමට ද එමගින් නියෝග කැර තිබිණ. දූතයන්ගේ ගමනට අත්‍යවශ්‍ය සියලු පහසුකම් සැපයෙන බැවින් ඔව්හු අධිරාජයාට නමස්කාර කොට ගමනාරම්භ කළහ.

Scanned by CamScanner

දූත පිරිස දින විස්සක ගමනින් අනතුරුව අධිරාජයාගේ දූතයා වූ බොගතාල් දරුණු ලෙස රෝගාතුර වූයේ ය. මෙය බලවත් ගැටලුවක් වූයෙන් අනතුරුව කළ යුත්තේ කුමක් දැයි පිරිස එක්වී සාකච්ඡා කළහ. රෝගියා රහි රඳවා සෙසු පිරිස ඉදිරියට ගමන් කළ යුතු බවට තීරණය වූයේ ය. ස්වර්ණ පත්‍රයේ ලියැවුණු රාජාඥාවට අදාළ පරිදි ඉදිරි මාර්ගයේ සියලු තැනදී ම දූත පිරිසට අවශ්‍ය සියලු ආධාර උපකාර නොඅඩුව ලැබිණ. නවාතැන්වලදී ද, නගර හා බලකොටුවල දී ද ඔවුට ආහාරපාන සත්කාර සංග්‍රහ ආරක්ෂාව සැලසුණු නමුදු ඔවුන්ගේ ගමන බලවත් දුෂ්කරතා නිසා මන්දගාමී විය. දැඩි සීතල හිමපතනය ගංගා ඇල දොළ වර්ෂාවන් නිසා පිරී ඉතිරී යෑම නිසා ඔවුනට සුළු ආසියාවේ "ලයි අස්සුස්" නගරයට ළඟා වීමට තුන් වර්ෂයක කාලය ගතවිණි. එතැන් සිට ක්‍රි.ව. 1269 අප්‍රේල් මාසයේ දී ඔව්හු අක්‍රා වෙත ළඟා වූහ. මේ අවස්ථාවේ දී හතරවන ක්ලෙමන්ට් පාප් තුමා ස්වර්ගස්ථ වූ බව ඔවුනට දැනගන්නට ලැබිණ. ස්වර්ගස්ථ වූ පාප් තුමා විසින් පත් කැර එවන ලද එම් කෙඩල් ඩෝ ඩි කොන්ති ඩි පියසෙන් ෂා නැමැති නියෝජිතයෙක් එහි සිටියේ ය. ටාටර් අධිරාජයා විසින් එවන ලද දූත පිරිසට අදාළ තොරතුරු මේ තානාපතියා වෙත ඉදිරිපත් කැරිණ. අලුත් පාප් වහන්සේ පත්වන තුරු එහි රැඳී සිටීම ප්‍රඥාගෝචර බව ඔහු දූත පිරිසට පැවසී ය. ඊට පසු රෝමයට යෑමට කටයුතු සලසා ගැන්ම මැනවයි කීවේ ය. මේ කරුණු සලකා බලා දූත පිරිස වැනිසියේ වෙසෙන ස්වකීය ඥාතීන් මුණ ගැසීමට යෑමට තීරණය කළහ. අක්‍රාවෙහි සිට නෙග්‍රොපොන්ට් දක්වා නෞකාවකින් යාත්‍රා කර එතැන් සිට වැනිසිය බලා ගමන් ගත්තෝ ය. වැනිසියේ තම නිවසට ළඟා වූ නිකෝලෝට දැනගන්නට ලැබුණේ දරු ප්‍රසූතියකින් පසුව සිය භාර්යාව මිය ගිය බව ය. එපමණක් නොව ඇය බිහිකළ පිරිමි දරුවා මාර්කෝ ඒ වන විට එකුන් විසි වියට පත්ව සිටියේ ය. මේ පොත ලියන ලද්දේ පසුව පෙරදිග ලෝකයේ සංචාරය කළ මාර්කෝ නමැති ඒ පුත්‍රයා ය.

නව පාප්තුමාගේ පත්වීම බොහෝ කරුණු නිසා ප්‍රමාද වූයේ ය. මේ ප්‍රමාදය නිසා නිකොලේ ප්‍රධාන දූත පිරිසට වසර දෙකක් තිස්සේ වැනිසියේ රැඳී සිටීමට සිදුවිණ. ඔවුන්ගේ ප්‍රමාදය අධිරාජයාගේ නොසතුටට හේතුවීමට ඉඩ ඇති බව ද තමන් එහි

Scanned by CamScanner

නොගොස් වැනිසියේම රැඳී සිටීමට ඉඩ ඇතැයි ද සිතිය හැකි බැවින් අක්‍රා නුවර බලා කඩිනමින් පිටත් වීමට සූදානම් වූහ. මේ ගමනට තරුණ මාර්කෝ පෝලෝ ද එකතු විය. අනතුරුව ඔවුන් ජෙරුසලමට ගොස් ක්‍රිස්තුස් වහන්සේගේ සොහොනෙහි දැල්වෙන ශුද්ධ වූ ප්‍රදීපයෙන් තෙල් ස්වල්පයකුත් රැගෙන ඛාන් අධිරාජයාගේ සංදේශය එහි සිටි කුමාරයාට භාර දුන්හ. පාප් කෙනෙකු මේ වනතුරුම පත් නොවූ බැවින් ඔව්හු ලයි අස්සු බලා පිටත්ව යෑමට සැරසුණෝ ය. ඒ සමගම ඉතාලියෙන් තානාපති කාර්යාලයට පණිවිඩයක් ලැබුණේ ය. කාඩිනල් වරුන්ගේ මණ්ඩලය මගින් ඒ සංදේශය එවා තිබූ අතර එයින් කියැවුණේ අක්‍රාහි තානාපති වරයා දසවන ග්‍රෙගරි නමින් පාප් පදවි ප්‍රාප්ත වූ බවයි.

අභිනව පාප් තුමාගේ පත්වීම නිසා ඛාන් අධිරාජයාගේ අභිලාෂය ඉටු කළ හැකි වන බැවින් දූත පිරිසේ ඉදිරි ගමන නවතා ආපසු තමන් වෙත එවන ලෙස ආර්මේනියාවේ රජුට පණිවිඩයක් යැවිණ. මේ පණිවිඩය නිසා දූත පිරිස ආපසු හැරී අක්‍රා නගරයට පැමිණියහ. ආර්මේනියාවේ රජු ඔවුන්ට ආරක්ෂක භටයන් ද සපයා දී පාප්තුමාගේ පත්වීම පිළිබඳ සිය සතුට පළ කැරෙන සංදේශයක් ද භාර දී ඒ සංදේශය රැගත් තානාපතිවරයා සමග මේ පිරිස පාප්තුමා වෙත යැවී ය.

අක්‍රා නගරයට සැපත් වූ පිරිස අභිනව පාප්තුමා බැහැදැකීම සඳහා තානාපති මන්දිරය වෙත ගියහ. දූත පිරිස නව පාප්තුමා පිළිගත්තේ මහත් ප්‍රීතියෙනි. ඒ සමගම එකී අවස්ථාවෙහි එහි සිටි විවිධ භාෂා ශාස්ත්‍ර කලා ශිල්ප හසල බුද්ධිමත් භාෂා විශාරද දේශනාවෙහි සමත් පූජකවරුන් දෙදෙනෙකු ද අධිරාජයාට භාර දීම සඳහා සංදේශයක් ද ලියවා පිරිස නියමිත ගමනට පිටත් කැර හැරියේ ය. මෙයින් එක් පූජකයකු විශෙන්සාහි ප්‍රියාර් නිකොලොස් නම් වූ අතර අනෙකා ට්‍රිපොලියෙහි ප්‍රියාර් විලියම් නම් විය. ඔවුනට ගිහියන් පැවිදි කිරීමේ බලයත් පව් සමා කිරීමේ බලයත් සියලු ආගමික බලතලත් පවරා දී පාප් වහන්සේ ගේ බලය අනුව කටයුතු කිරීමට අනුමැතිය ද දුන්නේ ය. ඒ හැරුණු විට මේ පූජකයන් දෙදෙනාට අගනා තුටු පඬුරු ද පිරිනැමිණි. ඛාන් අධිරාජයාට තම නමින් භාරදීමට ඉතා අලංකාර පළිඟු මල් බඳුන් කිහිපයක් ද භාර දුන්නේ ය. එසේම තම ආශිර්වාදය කුබ්ලායි ඛාන් අධිරාජයා වෙත

Scanned by CamScanner

පිරිනමන ලෙද සන්වා දූත පිරිසේ ගමනට සුබ පැතී ය. පාප් වහන්සේගෙන් සමුගත් ඔව්හු ලයි අස්සුස් වරාය වෙතට ළඟා වූහ. එතැන් සිට ආර්මේනියාව බලා ගමන් ගත්තේ පා ගමිනිනි. බැබිලෝනියාවේ බන්ඩොක්දාරි නමැති සොල්ඩන්වරයා මේ අවස්ථාවේ ආර්මේනියාවට කඩා වැදී විශාල විනාශයක් කළ බැව් අතරමගදී ඔවුනට දැන ගන්නට ලැබිණ. මේ ආක්‍රමණය නිසා ආර්මේනියාවේ විශාල කොටසක් විනාශ වූයේ ය. මේ ඇසීමෙන් භීතියට පත් පූජකවරු ඛාන්වරයා වෙත භාරදීමට පාප්තුමා දුන් තුටු පඬුරු සංදේශ හා වෙනත් ලියකියවිලි වැනිසියානු වෙළෙඳුන්ට භාර දී දේවස්ථානයේ ආරාමයේ යුද සෙනෙවියන්ගේ ආරක්‍ෂාව සහිතව වෙරළබඩ දෙසට ගමන් කළහ. එහෙත් මාර්කෝපෝලෝ ඇතුළු පිරිස අනතුරු ගැන නොතකා ආර්මේනියාවේ දේශ සීමාව ඉක්මවමින් ඉදිරියට ම ගියෝ ය. අතරමගදී කාන්තාර හා දුර්ග මාර්ග පසුකර උතුරු හා ගිනිකොන දිසාවට ගමන් කොට මහාඛාන් වරයා පිළිබඳ තොරතුරු විමසා බැලූහ. ඒ වන විට කුබ්ලායි ඛාන් අධිරාජයා ක්ලි-මෙන් පූ නගරයෙහි රැඳී සිටින බව දැනගන්නට ලැබුණි. ඔවුන්ගේ ගමනට මේ වන විට අවුරුදු තුනහමාරක් ගත වී තිබිණි. දූත පිරිස අධිරාජයා හමුවන බව දැනගන්නට ලැබුණු වහාම දින හතළිහක ගමන් දුර ප්‍රමාණයට පිරිසක් පිටත් කර ඔවුන්ට අවශ්‍ය සියලු පහසුකම් සැලසීමට නියෝග කෙළේ ය. සීත ඍතුවේ දී ඔවුන්ගේ ගමන් වේගය බාල වී පැවතිණි. එසේම සියලු දෙනා බලවත් ලෙස විඩාපත්ව සිටින බැවින් ඉඳුම් හිටුම් ආහාර පාන සත්කාර සංග්‍රහ පැවැත්වීමට අවශ්‍ය සියලු කරුණු සම්පාදනය කැරවීය.

දේව ආශිර්වාද හා සත්කාර සංග්‍රහ හේතු කොට ඔව්හු නිරුපද්‍රිතව අධිරාජ මාලිගය වෙත ළඟා වූවෝ ය. අධිරාජයා රාජ සභාව රැස්කර ප්‍රභූවරුන් හා එක්ව උත්කර්ෂවත් අන්දමින් දූත පිරිස පිළිගත්තේ හරසරිනි. දූතයෝ ද රජුට නමස්කාර කොට ස්තුති පූර්වක ව ගෞරව දැක්වූහ. රජු ඉදිරියේ වැඳ වැටුණු වැනිසියානු දූත පිරිස නැගිටුවා ආ ගිය පුවත් පවසන ලෙස කීවේ ය. අනතුරුව නැගී සිටි නිකොලෝ තම ගමන් විස්තරය රජු හමුවේ තැබූයේ ව්‍යක්ත ස්වරයෙනි. අධිරාජයා ඒ සියලු තොරතුරු අසා සිටියේ මහත් අවධානය යොමු කරමිනි. අනතුරුව පාප් වහන්සේ විසින් එවන ලද තුඩු පඬුරු ද ත්‍යාගයන් ද සංදේශය

Scanned by CamScanner

ඇතුළු සියලු ලිය කියවිලි අධිරාජයාට ඔප්පු කළහ. ඒ පිළිබඳව අධිරාජයාගේ ස්තුතිය ද සතුට ද පළ කෙළේ ය. ජෙරුසලමෙහි ශුද්ධ ප්‍රදීපයෙන් රැගෙන ආ තෙල් ද රජුට භාර දුනි. මහත් ගෞරවයෙන් එය පිළිගත් අධිරාජයා සුරක්ෂිතව තබන ලෙස සේවකයන්ට නියෝග කෙළේ ය. අනතුරුව අධිරාජයාගේ අවධානය යොමු වූයේ තරුණ මාර්කෝ වෙත ය. නිකොලෝ මේ මගේ පුත්‍රයා යැයි මාර්කෝ හඳුන්වා දුන් කල්හි අධිරාජයා මහත් සතුටට පත්විණි. මාර්කෝ සතුටින් පිළිගත් අධිරාජයා ඔහු රජ වාසල ගෞරවාන්විත සේවක මණ්ඩලයට පත් කෙළේ ය. ඉක්බිති අධිරාජයා වැනිසියානු වෙළෙඳ දූතයන් ඇතුළු පිරිස වෙනුවෙන් ඉතා උත්කර්ෂවත් භෝජන සංග්‍රහ පවත්වා පසුව ඔවුන් රජවාසල නිලයනට වඩා උසස් තනතුරුවලට පත් කෙළේ ය. මාර්කෝ ටාටර් භාෂාව නොබෝ කලකින් උගෙන එරට සිරිත් විරිත් අනුව හැසිරෙන්නට පටන් ගති. ඉතා ඉකිමනින් ටාටර් භාෂාව ව්‍යක්ත ලෙස කථා කිරීමට ද ලිවීමට ද කියැවීමට ද දක්ෂයෙක් වූයේ ය. පසුව අධිරාජයා ඔහුගේ දක්ෂතා පරීක්ෂා කිරීම සඳහා අතිශය භාරදූර රාජකාරි පවරා කරෂාන් නගරයට පිටත් කෙළේ ය. එහි යෑමට හමසක කාලයක් ගත වේ.

මේ අතර නිකොලෝ අධිරාජයා ප්‍රීතියෙන් සිටින අවස්ථාවක ඔහු ඉදිරියේ වැඳ වැටී තමා සහ තම පවුල වෙනුවෙන් සානුකම්පිතව සලකා බලා ආපසු මව් රටට යෑමට අවසර ඉල්ලා සිටියේ ය. එහෙත් ඒ ආයාචනය නිසා රජු සිත් තැවුලට පත්වූ බව පෙනිණ. මෙතරම් අසීරු අවදානම් අනතුරුදායක ගමනක් යෑමට සැරසෙන්නේ කවර හෙයින්දැයි අධිරාජයා නිකොලෝගෙන් විචාළේ ය. ධනලාභ පතා මේ ගමන යෑමට අපේක්ෂා කරන්නේ නම් එයින් ලැබෙන ධනය මෙන් දෙගුණයක් ලබා දීමට කැමැති බව අධිරාජයා වැඩි දුරටත් කියා සිටියේ ය. ගෞරව සැලකිලි අවශ්‍ය තරම් වැඩි දුරටත් ලබා දෙන බවත් නිකොලෝ ඇතුළු පිරිස කෙරෙහි තමා විශ්වාසවන්ත ලෙස පිළිගැනීමක් සහිත බවත් කියමින් අධිරාජයා යථෝක්ත ඉල්ලීම ප්‍රතික්ෂේප කෙළේ ය.

නිකොලේගේ ආයාචනය කැරෙන අවස්ථාවේ අධිරාජයා යටතේ ඉන්දියාවේ අධිපති බවට පත්වී සිටින අරගන් ඛාන් ගේ බිසොව මිය යෑමෙන් බලවත් ගැටලුවක් ද පැන නැගී තිබිණ. බොල්ගානා නම් වූ මේ බිසොවගේ මරණාසන්න අවස්ථාවේ

Scanned by CamScanner

ඉල්ලීමක් කරමින් අන්තිම කැමැති පත්‍රයක් ලියා තැබුවේ ය. ඒ ඉල්ලීම වූයේ ඇය කෙරහි ගෞරවයක් ඇත්නම් කැතේ නුවර සිටින්නා වූ ඥාති පරපුරෙහි කුමරියක් හැර අන් කිසිදු ස්ත්‍රියකට ඇයට හිමි අසුන ගැනීමට ඉඩ නොසැලසිය යුතු බව ය. අර්ගන් මියගිය දේවියගේ අවසාන ඉල්ලීම ඉටු කිරීම සඳහා උලතායි - අපස්කා - ගොසා යන ප්‍රඥාසම්පන්න රාජ්‍ය නිලධාරීන් තිදෙනා පිරිවර ද සමග කුබ්ලායි ඛාන් අධිරාජයා වෙත යැවීමට තීරණය කෙළේ ය. මියගිය බිසොවගේ ඥාති පරපුරෙන් පැවැත එන කුමාරියක නිසි පරිදි තෝරා එවන ලෙස ආයාචනා කරමිනි.

මෙකී දූත පිරිස කැතේ නුවර දී කුබ්ලායි ඛාන් අධිරාජයා මුණ ගැසී අර්ගන් කුමාරයාගේ සංදේශය භාර දුන්හ. අධිරාජයාගේ නියෝගය පරිදි රාජ පුරුෂයන් සුදුසු ප්‍රදේශය කරා ගොස් සතළොස් හැවිරිදි රූමත් කුල කාන්තාවක තෝරා ගෙන පැමිණියෝ ය. මේ රූමතිය දූත පිරිසට පෙන් වූ කල්හි ඇය සාකල්‍යයෙන් ම තම රජුට ගැලපෙන බව කියා මහත් සතුටින් පිළිගත්හ. අනතුරුව දූත පිරිස කුමරිය ද කැටුව සියරට යෑමට සූදානම් වූවෝ ය. මේ දූත පිරිසේ ගමන අත්‍යවශ්‍ය පහසුකම් සහ මාර්ගෝපකරණ සැපයීමට සෑහෙන තරම් පරිවාර ජනකායක් ද පත් කැරිණ. අර්ගන් ඛාන් රජු වෙත නව දේවිය කැඳවාගෙන යන්නා වූ පරිවාර ජනකායට අධිරාජයාගේ නියෝජිතයා ලෙස මාර්කෝ පෝලෝ ද එක්විය. කරශාන්හි පැවැති අර්බුදය ඉතා බුද්ධිමත් ලෙස ද සාර්ථක ලෙස ද විසඳලීමට මාර්කෝ පෝලෝ සමත් වූ බැවින් ඔහුගේ මෙහෙවර ස්තුති ප්‍රශංසා මුඛයෙන් පිළිගන්නා ලදී.

මෙසේ දුරබැහැර ප්‍රදේශයන්හි සංචාරය කිරීමේ දී අසන්නට දකින්නට ලැබුණු දෑ මාර්කෝ පෝලෝ පොතක සටහන් කැර ගත්තේ ය. එබඳු තොරතුරු විස්තර ලේඛනාරූඪ කැර ගැන්මෙන් අධිරාජයා මහත් සතුටට පත්වන බව තරුණ මාර්කෝ පෝලෝ කල්පනා කෙළේ ය. එතැන් සිට මාර්කෝ පෝලෝ තමන් සංචාරය කළ සෑම ප්‍රදේශයක ම විස්තර තොරතුරු සිරිත් විරිත් සහ සතුන් වෘක්ෂලතා පිළිබඳ විශේෂ කරුණු ලේඛනාරූඪ කරගෙන පැමිණ අධිරාජයා හමුවෙහි කියැවීය. ඒ ඇසීමෙන් කුබ්ලායි ඛාන් අධිරාජයා මහත් සතුටට ද, මවිතයට ද පත් විය. මාර්කෝ පෝලෝ රාජ්‍ය සේවයේ යෙදී සිටි දාහත් වසර මුළුල්ලේ අධිරාජයාගේ අතිශය විශ්වාසවන්ත සේවකයා ලෙස අධිරාජයාට යටත් ප්‍රදේශයන්හි ද

Scanned by CamScanner

අධිරාජ්‍යයේ සියලු ප්‍රදේශයන්හි ද සංචාරය කෙළේ ඒ පිළිබඳ සංචාරක සටහන් ලියා ගනිමිනි. ඇතැම් රටවල ඔහු සංචාරය කෙළේ ස්වකීය පෞද්ගලික අභිලාෂය අනුව ය. එහෙත් ඔහු එබඳු සංචාරයන්හි යෙදුණේ අධිරාජයාගේ අවසරය හා අභිමතය අනුවයි. එබැවින් පර්යේෂණාත්මක ලෙස ද තර්කානුකූල ලෙස ද සියැසින් දුටු කරුණු ද ඇසූ කරුණු ද විධිමත් ලෙස ලේඛනාරූඪ කෙළේ ය. මෙපරිද්දෙන් නැගෙනහිර ලෝකය පිළිබඳව ඒ කාලයේ බොහෝ දෙනා නොදත් කරුණු රාශියක් නිවැරැදි ලෙස එක් රැස් කැර ලියා තැබීමට ඔහු සමත් වූයේ ය. මේ නිසා ඇතැම් නිලධාරීහු ඔහු කෙරෙහි ඊර්ෂ්‍යා පරවශ හැඟීම් ඇති කැර ගත්හ. මේ කාලය තුළ රාජ්‍ය සේවයේ යෙදීමෙන් වැනිසියානු වෙළෙඳුනට විශාල ධනස්කන්ධයක් රැස් කැර ගැනීමට අවස්ථාව සැලසිණ. රන් අබරණ හා මුතු මැණික් වෙනත් අගනා වස්තු සම්භාරයක් ඒ අතර විය. එහෙයින් අධිරාජයා ජීවතුන් අතර සිටිය දී ම ඔවුනට සිය මව්රට බලා යෑමට සිත් පහළ විය. මේ වන විට අධිරාජයා වයෝවෘද්ධව සිටි හෙයින් යම් හෙයකින් පසු කාලයෙක ස්වදේශය බලා ගමන් ඇරැඹීමට ප්‍රමාද වුවහොත් එයට බලවත් අවහිර බාධා ඇතිවෙතැයි ද ඔව්හු කල්පනා කළහ. ගරු බුහුමන් තාන්න මාන්න හා වස්තුව රජයෙන් ලැබුණ ද සිය රට බලා නැව් නැගීමේ ආශාව එයට වඩා බලවත් විණ. අධිරාජයා ජීවත්ව සිටයදීම ගමනාරම්භ කළහොත් රාජ්‍ය අනුග්‍රහය සහ ආරක්ෂාව සැලසෙන බවත් ඒ සා විශාල දුර ප්‍රමාණයක් රාජ්‍ය අනුග්‍රහයෙන් තොරව ගමන් කිරීම අනතුරු දායක බවත් කියා අවසර පතා සිටියහ. අධිරාජයා ඔවුනට අවසර දුන්නේ ය. තමන් මෙරටට පැමිණි මාර්ගයෙන් ම ආපසු සියරට යාමට පිටත් වූහ. පුරා මාස අටක් ඉදිරියට ගමන් කළ පසු ටාටර් කුමාරවරුන් අතර යුද්ධයක් හටගත් බැවින් ආපසු හැරීමට සිදුවිණ. යළිත් මාස අටක් ආපසු ගමන් කොට ඔව්හු කුබ්ලායි ඛාන් අධිරාජයාගේ මාලිගාවට ළඟා වූහ. තමන්ට සිදු වූ බාධාව පිළිබඳව කියා සිටි අවස්ථාවේ මාර්කෝ පෝලෝ ද නැගෙනහිර ඉන්දියා දූපත් හි සිට යාත්‍රා කිහිපයකින් එහි ළඟා විය. මාර්කෝ පෝලෝ රාජකාරි ගමනක යෙදී ආපසු පැමිණි මේ අවස්ථාවේ ඒ පිළිබඳ විස්තර වාර්තාවක් අධිරාජයාට ඉදිරිපත් කෙළේ ය. මාර්කෝ පෝලෝ සංචාරයෙහි යෙදුණු ප්‍රදේශ ගැන ද මුහුදේ ස්වරූපය පිළිබඳව ද අධිරාජයාට කරුණු සැල කරද්දී කුමරිය කැන්දාගෙන යෑමට පැමිණි ඉන්දීය දූත පිරිසට ද ඒ තොරතුරු ඇසුණි. ඔවුන්

ඉන්දියාවේ සිට කුබ්ලායි ඛාන් අධිරාජයා හමුවට පැමිණ තෙවසරක් ඉක්ම ගොස් තිබිණ. මේ පිරිස වැනිසියේ වෙළෙඳුන් සමග සාකච්ඡා කළෝ ය. ඉක්බිති දෙපිරිස එක්ව එක් මගකින් ගමන් කිරීමට තීන්දු කොට ඒ පිළිබඳව අධිරාජයාගෙන් අවසර ගැනීමට සුදුසු අවස්ථාවක් පැමිණෙන තුරු බලා සිටියහ. මුහුදු මගින් ගමන් කිරීමට අධිරාජයා අවසර ලබා දුනහොත් නාවික සංචාරයන්හි පළපුරුදු වැනිසියන් වෙළෙඳුන් තිදෙනාගේ සේවය ලබා ගැනීමට ද අර්ගන් රජුගේ දේශයට සේන්දු වන තුරු යුරෝපීයයන් තිදෙනා ද රජ කුමරිය ද තානාපතින් ද ඒ හා සමග යැමට ද තීන්දු කොට ගෙන ඒ සඳහා අයැදුම් පතක් සකස් කොට අධිරාජයාට පිළිගැන්වූහ. මේ අයැදුම්පත කියැවූ අධිරාජයා කණස්සල්ලට පත්වූ බව ඔහුගේ මුහුණින් පෙනී ගියේ ය. එසේ වුවද මේ ගමනේ වැදගත්කම හා අවශ්‍යතාව අවබෝධ කැරගත් අධිරාජයාට ඒ සඳහා අවසර නොදී සිටීමට නොහැකි විණ. බැගෑපත් වී කළ මේ ආයාචනයට අධිරාජයා අවසර දුන්නේ ය. මේ අවස්ථාව ගිලිහී ගියේ නම් වැනිසියානු වෙළෙඳුන්ට කිසිදා සියරට යැමට ඉඩ ප්‍රස්තා නොසැලසෙන්නට ඉඩ තිබිණ. අධිරාජයා වැනිසියානු වෙළෙඳුන් තමන් වෙත කැඳවා නිහතමානී හෘදයංගම ස්වරයෙන් ආමන්ත්‍රණය කොට ඔවුන් කෙරෙහි පවත්නා හිතවත් කමත් ගෞරවයෙන් ප්‍රකාශ කෙළේ ය. සියරට ගොස් කලක් එහි ගතකොට නැවත අඹු දරුවන් ද සමග තමා වෙත පැමිණෙන ලෙස දැන්වීය.

අනතුරුව ස්වර්ණ පත්‍රයක රාජකීය අවසර පත්‍රයක් ද ලියවා දුනි. ඔවුන් ගමන් ගන්නා මාර්ගයෙහි රජතුමා අයත් සෑම ප්‍රදේශයක දී ම පත්‍රය පෙන්වූ කල්හි ගමනට අවශ්‍ය ආරක්ෂාව ඉඳුම් හිටුම් ආහාර පාන ආදී සියල්ල නොපිරිහෙළා සැපයේ. එය ඉතා බලවත් අධිකාර පත්‍රයකි. එපමණක් නොව පාප් වහන්සේ ප්‍රංශයේ ස්පාඤ්ඤයේ රජවරුන් හා සෙසු යුරෝපා රටවල රජුන් වෙත ගොස් අධිරාජයාගේ තානාපතියන් වශයෙන් කටයුතු කිරීමේ බලය සහිත තවත් අක්ත පත්‍රයක් ද භාර දුන්නේ ය.

කුඹ ගස් හතරකින් ද, රුවල් නවයකින් ද සමන්විත නැව් දාහතරක් ඇතුළත් නැව් කණ්ඩායමකින් පිටත්වීමට ද අධිරාජයා අවසර දුනි. නැව් කණ්ඩායම විවිධ කොටස්වලට බෙදා ගමනට සංවිධානය කළ ආකාරයත් කුඹ ගස්වල කඹ බැඳි ආකාරයත් මෙහි සඳහන් නොවන්නේ අනවශ්‍ය විස්තර නිසා ය. දෙසිය පනහක් - දෙසිය හැටක් පමණ පිරිසක් නැව් කණ්ඩායමේ සේවයෙහි

Scanned by CamScanner

යෙදුණහ. එක් එක් නැව පැදවීමට හතරදෙනා පස්දෙනා බැගින් යෙදවිණ.

තරුණ රජ කුමරිය රැක බලා ගැනීම සඳහා තානාපතිවරයන් තිදෙනා ද, නිකලෝ මපියෝ, මාර්කෝ පෝලෝ යන තිදෙනා ද අධිරාජයාගෙන් සමුගැනීම සඳහා ගිය අවස්ථාවේ දී අගනා රතු මැණික් ස්වර්ණාභරණ හා තවත් මහාසී ත්‍යාග භාණ්ඩ රැසක් පිරිනමන ලදී. එසේ ම අවුරුදු දෙකකට ප්‍රමාණවත් ආහාර පාන ද නැව්වලට පටවන ලෙස නියෝග කෙළේ ය. මෙසේ ගමනාරම්භ කොට තුන් මාසයක් මුළුල්ලේ මුහුදේ යාත්‍රා කිරීමෙන් ඉක්බිති දකුණු දෙස පිහිටි ජාවා නැමැති දූපතට ගොඩබටහ. එහිදී දක්නට ලැබුණු අරුම පුදුම තොරතුරු මාර්කෝ පෝලෝගේ වාර්තාවෙහි කියැවේ.

අනතුරුව නැව් නැග අටළොස් මසක් සාගරයේ යාත්‍රා කොට අරගන් රජුගේ දේශයට සේන්දු වූහ. අතරමගදී දක්නට ලැබුණු දෑ සහ රට රාජ්‍යයන් පිළිබඳ සවිස්තර තොරතුරු ඉදිරියෙහි සඳහන් වෙයි. ටාටර් දේශයේ සිට අර්ගන් රජුගේ රාජ්‍යයට ළඟාවන විට නැවියන් සහ සෙසු මගීන් අතරින් හයසියයක් පමණ මිය ගියහ. අර්ගන් රජුගේ තානපතීන් අතින් ඉතිරි වූයේ "ගොෂා" පමණි. කාන්තාවන් අතරින් මියගියේ එක් සේවිකාවක පමණි. අර්ගන් රජු අභාවප්‍රාප්ත වූ බව ඔවුනට දැන ගන්නට ලැබුණේ එරටට ගොඩ බැසීමෙන් පසු ය. රජුගේ ළාබාල පුත්‍රයා වෙනුවෙන් රට පාලනය කරමින් සිටියේ "කි අකටු" ය. රජකුමරිය කවුරු හට භාරදිය යුතු දැයි ගැටලුවක් වූයේ ඒ ගැන දැන ගැන්මට දූත පිරිස කි අකටු වෙත ගොස් උපදෙස් ලබා ගත්හ. ඇය "කසාන්" කුමරුට භාරදෙන ලෙස දන්වන ලදින් දූත පිරිස ඒ රාජකාරිය නිසි අයුරින් ඉටුකර කි අකටුගේ නිවෙස වෙත පැමිණියහ. මේ වන විට කස්සන් කුමරා සිටියේ ආබර්සෙක්කො නමැති ප්‍රදේශයෙහි ය. සතුරු හමුදා ආක්‍රමණයක් නිසා ආබර්සෙක්කො ප්‍රදේශයෙහි රැකවල් යොදා තිබිණි. කි අකටු ගේ නිවෙසට පැමිණි දූත පිරිස මාස නවයක් එහි රැඳී සිටියහ. නව මාසය ගෙවී යත්ම ගමන් ඇරඹීමට සූදානම් වූ දූත පිරිසට "කි අකටු" ස්වර්ණමය අධිකාර පත්‍රයක් පිළිගැන්වීය. එය අඟල් පහක් පමණ පළල ය. දිග රියනකි. මෙය රන්මය පිටපත් හතරකින් යුක්ත ය. අවුන්ස අටක් බරැති රන්කාසි තුනක හතරක බරින් යුක්ත ය.

Scanned by CamScanner

අධිරාජයාට දෙවියන් වහන්සේගේ ආරක්ෂාව හා ආශිර්වාදය ලැබේවා යනුවෙන් මේ අධිකාර පත්‍රය ආරම්භ කොට තිබිණ. එතුමාගේ ශ්‍රී නාමය ශතවර්ෂාධික කාලයක් අනුස්මරණය කොට නමස්කාර කෙරේවා යයි අනතුරුව සඳහන් විණ.

මේ අධිකාර පත්‍රයේ සඳහන් කරුණු නොපිරිහෙළා ඉටු නොකරන අයගේ දේපල රාජ සන්තක කිරීමටත් මරණ දඬුවම පැමිණවීමටත් නියෝග කැරිණ. එසේම මොවුන් තිදෙනා තානාපතිවරුන් සේ සැලකෙන බැවින් තම යටත් රටවලදී අවශ්‍ය ගරු සම්මාන දීමට ද ඔවුන්ගේ සියලු වියහියදම් දැරීමට ද අවශ්‍ය පූර්ණ ආරක්ෂාව සියලු තන්හි දී සැලසීමට ද විධි විධාන යෙදිය යුතු විය. සියලු තන්හි දී ඒ ඒ රටවල නිලධාරීහු එකී නීති රීති නියෝග නිසි පරිදි පිළිපැද්දෝ ය. ඇතැම් ස්ථානයක දී අශ්වාරෝහක භටයන් දෙසීයක් බැගින් ඔවුනට ආරක්ෂාව සඳහා සලසා දුන්හ. කි අකටු ගේ පාලනය පිළිබඳව මේ සමයේ ජනයා කලකිරී සිටි බැවින් සතුරන්ගෙන් අතවර යෙදෙන්නට ද ඉඩ තිබිණි. එහෙත් එවැන්නකට මුහුණ පෑමට සිදුවූයේ නැත. මෙසේ ඉදිරියට ගමන් කරද්දී චීනයේ කුබ්ලායි ඛාන් අධිරාජයා මිය ගිය බැව් අසන්නට ලැබිණ. එහෙයින් යළිත් පෙරදිගට ගමන් කිරීමේ බලාපොරොත්තු ඒ සමගම අහෝසි විය. සියලු ලාභ අපේක්ෂා භංග වූයෙන් වැනිසියානු වෙළෙන්දෝ ඉක්මන් ගමනින් ත්‍රෙබිසොන්ඩ් නමැති නුවරට ළඟා වූහ. එතැනින් කොස්තන්තිනෝපලයට ද එතැනින් වැනිසියට ද සැපත් වූහ.

1295 දී ඔවුන් සිය මව්රටට සැපත් වූයේ විශාල ධනයක් උපයා ගෙන ය. මනා සෞඛ්‍යයෙන් යුක්ත වූ බැවින් සිය පෙරදිග සංචාරයේ සතුට භුක්ති වින්දෝ ය. නොයෙක් දුක් ගැහැට විඳිමින් අනතුරු මගහැර සතුටින් නිවෙසට ළඟාවීමට හැකිවීම ගැන ඔව්හු දෙවියනට ස්තුති පූජා පැවැත්වූහ.

ලෝකයේ පෙරදිග රට රාජ්‍යයන්හි බොහෝ කාලයක් වාසය කිරීමෙන් මාර්කෝ පෝලෝ විසින් ලබා ගන්නා ලද ශ්‍රේෂ්ඨ දැනුම් සම්භාරය හා ප්‍රඥා පාඨවය පිළිබිඹු වන අයුරින් ලියූ දේශාටන කථාන්තරයෙහි සඳහන් වන්නේ කවර විස්තර තොරතුරු දැයි පාඨකයාට සංක්ෂේපයෙන් වැටහෙන පරිදි මෙය පසුබිම් කථනයක් සේ ඉදිරිපත් කැරුණු බව සැලකුව මැනවි.

Scanned by CamScanner




# මැද පෙරදිග

ආර්මේනියාවෙන් මේ කතාව පටන් ගැනීමට මට අවසර දෙන්න! සැබවින්ම ආර්මේනියා නමින් රටවල් දෙකක් තිබේ. එකක් මහා ආර්මේනියාව ය. අනෙක සුළු ආර්මේනියාව ය. සුළු ආර්මේනියාවෙහි අධිපතියා රජෙකි. සෙබස්ටොස් නම් හෙතෙම යුක්ති ගරුක සාධාරණ පාලනයක් මගින් රටවැසියාට යහපත සලසයි. ටාටර් පාලනය යටතේ මේ ප්‍රදේශය පවතී. මේ දේශයෙහි ගම්මාන රැසක් ද, නගර රාශියක් ද වෙයි. එහි විශාලත්වය නිසා ජනගහනය ද විශාල ය. වනාන්තර ප්‍රදේශ සිවුපා සතුන්ගේ ද, පක්ෂීනගේ ද, කුකුළන්ගේ ද කෙළිපිටියකි. එහි දේශගුණය එතරම් සෞඛ්‍යාරක්ෂක නොවේ. දේශගුණය ශරීරය බෙලහීන කරවන සුලු ය. රටේ වංශවත් නිර්භීත පිරිමි යුද්ධ හමුදාවට බැඳෙති. එහෙත් ඔවුන් දැන් බියගුල්ලන් බවට පත්වී ඇත. ඔවුන්ගේ විශිෂ්ටත්වයක් හෝ ශ්‍රේෂ්ඨත්වයක් මෙකල නොමැත. මත්පැන් බීම හැර වෙනත් කාර්යයක නොයෙදෙති.

අයාස් නගරය මුහුදු වෙරළබඩ පිහිටා තිබේ. එය ඉතා කලබලකාරී වෙළෙඳ පොළකි. විවිධ ප්‍රදේශවලින් ගෙන එනු ලබන කුළුබඩු වර්ග හා විවිධ රෙදි වර්ග ගෙන එනු ලබන්නේ මේ නගරයට ය. මේ ද්‍රව්‍ය සහ ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ මිලදී ගැනීම සඳහා වෙළෙන්දෝ වැනිසියෙන් සහ තවත් නොයෙක් රටවලින් මෙහි පැමිණෙති. වෙළෙන්දන් සහ ප්‍රත්‍යන්ත ප්‍රදේශයන් ගෙන් පැමිණෙන ජනයා ස්වකීය ගමනාරම්භක කේන්ද්‍රස්ථානය වශයෙන් යොදා ගෙන ඇත්තේ මේ නගරයයි.

Scanned by CamScanner

කුඩා ආර්මේනියාව දකුණු පසින් ගිව්සුමක් සහිතව පාලනය වන භූමි ප්‍රදේශයකි. දැන් එය සැරසින්වරුන් යටතේ පවතී. උතුරේ සිට බටහිර දක්වා සීමාවෙහි ඇත්තේ තුර්කි දිස්ත්‍රික්කයකි. කරමන් නමින් හැඳින්වේ. ඊසාන දිගින් හා නැගෙනහිර දිසාවෙන් ඇත්තේ නැගෙනහිර තුර්කියයි. කයිසාරි හා සිව යන නගර ද තවත් බොහෝ නගර ද මෙහි ඇත. ඒ සියල්ල ටාටර්වරුන් සතු ය. බටහිර දිසාවෙන් පිහිටියේ සමුද්‍රයයි. මේ සමුද්‍රය හරහා ගමන් කරන නැව්වලට ක්‍රිස්තු ධර්මය පැතිර පවතින රටවල් කරා ළඟා විය හැකි ය.

තුර්කියේ වෙසෙන ජනයා වර්ග තුනකට අයත් වේ. තුර්කෝමන්වරු මහමද් ආගම අදහති. එහි පවත්නේ මහමත් තුමාගේ ආඥාව ය. මේ ජනතාව නොදියුණු ය. ම්ලේච්ඡ භාෂාවක් කථා කරති. ඔව්හු කඳුකරයේ ද, නිම්න භූමිවල ද හැසිරෙති. වාසයට වඩාත් සුදුසු ස්ථාන ඔව්හු සොයා දැන ගනිති. මේ ජනයා සැරි සරනුයේ කණ්ඩායම් වශයෙනි. ඔවුන්ගේ ඇඳුම් සකස් කරගෙන ඇත්තේ සත්ත්ව සම් වර්ගවලිනි. ඔවුන්ගේ නිවාස ද තනා ඇත්තේ සම්වලින් හෝ ලොම් රෙදි වලිනි. මේ ප්‍රදේශයේ ඉතා අනර්ඝ අශ්වයෝ බෝවෙති. එසේ ම ඉස්තරම් කොටලුවන් ද බෝවේ.

අනෙක් ජනවර්ග දෙක නම් ආර්මේනියන් වරු සහ ග්‍රීකයන් ය. ඔවුන් ද අනෙක් ජනවර්ගයන් සමග එක් ව ජීවත්වනු පෙනේ. ගම්වල ද, නගරවල ද ජීවත්වන මොවුන් වෙළඳමෙහි සහ හස්ත කර්මාන්තවල ද නියුක්ත ය. ඒ හැරුණු විට ගොවිතැනෙහි ද යෙදේ. මෙරට ජනයා ලෝකයේ ඉස්තරම් වර්ගයේ කලාල නිෂ්පාදනය කරති. ඒ හැරුණු විට අති අනර්ඝ රෙදි පිළි නිෂ්පාදනය කැරේ. මේ රෙදිපිළි ලෝහිත සහ වෙනත් වර්ණයන්ගෙන් ද යුක්ත ය. ඒවා ඉස්තරම් වටිනාකම් සහිත වේ. ඒ හැරුණු විට වෙනත් විවිධාකාර රෙදිපිළි වර්ග ද නිෂ්පාදනය කරනු ලැබේ. මෙහි පිහිටි වඩාත් ප්‍රසිද්ධ නගර වනුයේ කොන්යා, කයිසාරී සහ සිවාස් ය. ඒ හැරණු විට තවත් නගරයන් ද වෙයි. ඒ නගර සංඛ්‍යාව විශාල ය. ඒ සංඛ්‍යාව දිගින් දිගට ම සඳහන් කිරීමට සැරසුණහොත් මා විඩාවට පත්වන්නේ ය. මේ සියලු නගර ලෙවාන්ට්හි ඛාන් වරයාගේ පාලනය යටතේ පවතී. මේ ටාටර් ඛාන් වරයා මෙහි පාලනය පවත්වාගෙන යෑම සඳහා පත්කර සිටී.

මේ විස්තර මෙතෙකින් නවතා මහා ආර්මේනියාවේ තොරතුරු කීමට පටන් ගනිමි.

Scanned by CamScanner

මහා ආර්මේනියාව අති විශාල භූමි ප්‍රදේශයකි. මේ දේශයට ඇතුළුවන දොරටුවෙහි එර්සින්කන් නමැති පුරවරයක් ඇත. ලෝකයේ ඉස්තරම් මැලියම් මිශ්‍ර සන රෙදි නිෂ්පාදනය කරනු ලැබේ. එසේ ම තවත් කර්මාන්ත ගණනාවක් ද ඇත්තේ ය. එපමණක් නොව ලෝකයේ අනෙක් කිසිදු රටක දක්නට නොලැබෙන පරිදි ස්නානය සඳහා පිරිසිදු උල්පත් ජලය පවතී. මෙහි වසන්නේ ආර්මේනියන්වරුන් හා ටාටර් වහලුන් ය. මෙහි නගරවරයන් හා පුරවරයන් රාශියකි. එහෙත් එරිසින්කන් වඩාත් අලංකාර පුරවරයයි. ආර්ච්බිෂොප් පදිංචි වී සිටිනුයේ ද එහි ය. අනෙක් ප්‍රධාන නගර නම් එර්සේරුම් හා එර්සිස් ය. ට්‍රිබයිසන්ට් හි සිට ටැබ්රිස් දක්වා ගමන් ගන්නා මාර්ගයෙහි බේබර්ට් නමැති බළකොටුවක් ඇත. එහි විශාල රිදී පතලයකි.

ලෙවන්ට් ටාටර් හමුදා ග්‍රීෂ්ම කාලයේ රැඳී සිටිනුයේ මේ ප්‍රදේශයෙහි ය. ග්‍රීෂ්ම කාලය සිවුපාවුනට බෙහෙවින් හිතකර ය. එහෙයින් ටාටර්වරු තම සිවුපාවුන් සමග ග්‍රීෂ්ම කාලය මෙහි ගත කරති. එහෙත් ශීත කාලයෙහි දී ඔවුන් මේ ප්‍රදේශයෙන් බැහැර වීම පුරුද්දකි. සිවුපාවුනට හිම පතනයෙන් පීඩා විඳීමට සිදුවන බැවින් මේ හිම පතනයෙන් සතුන්ගේ ජීවිත අනතුරට භාජන වේ. හිම පතනය අතිශයින් දරුණු ය. එහෙයින් ටාටර්වරු මේ ප්‍රදේශය හැර තම සතුන් ද සමග වියළි කාලගුණයක් පවත්නා ස්ථාන කරා යති. සතුන්ගේ ආහාරයට ප්‍රමාණවත් තණකොළ සහිත තණබිම් ප්‍රදේශවලට ගමන් ගන්නාහ.

මහා ආර්මේනියාව මධ්‍යයෙහි ඉතා උස් පර්වතයක් තිබේ. එහි හැඩය හතරැස් ය. එහි නෝවාගේ පෙට්ටියක් මෙන් වැසූ නැව පිහිටා ඇතැයි සැලැකේ. එය පළලින් විශාල ය. දිග ය. මේ පර්වතය වටා ගමන් කිරීමට දින දෙකකට වැඩි කාලයක් ගත වේ. වර්ෂය මුළුල්ලේ ම එහි මුදුන සන හිම තලාවෙන් වැසී තිබේ. කිසිවකුටත් එහි මුදුනට ළඟාවිය නොහේ. මේ හිම තලාව කිසිවිටෙකත් මුළුමනින් ම දියවී නොයයි. නිරන්තරයෙන් ම පරණ හිම තට්ටු මත අලුත් හිමපතනය වේ. එහෙත් තෙතමනය සහිත සුළඟ නිසා බෑවුම්වල හිම දිය වී පහළ දිය සීරා වශයෙන් ගලන්නේ ය. වියළි කාලයෙහි මෙහි පැළෑටි සරුවට වැඩේ. එහෙයින් සිවුපාවුනට ආහාර සුලභ වේ. පර්වතයෙන් ගලන දිය සීරා හේතුවෙන් හාත්පස මඩ වගුරක් වේ.

Scanned by CamScanner

ගිණිකොන දෙසින් ඇත්තේ මොසුල් රාජධානියයි. උතුරෙන් ජෝර්ජියාව ය. මේ ප්‍රදේශ පසුව විස්තර කරන්නෙමි. ජෝර්ජියාවේ දේශ සීමාවෙහි තෙල් උල්පතක් ඇත. ඒ උල්පතෙන් මතුවන තෙල් ඇලක් මෙන් ගලා යයි. මේ තෙල් එක්වරකට නැව් සියයකට පටවනු ලැබේ. කෑම සඳහා මේ තෙල් නුසුදුසු ය. එහෙත් පහන් දැල්වීමට සුදුසු ය. ඔටුවන්ගේ කැසීමට හා තුවාලවලට ඖෂධයක් සේ භාවිතා කැරේ. ඈත පුදේශවල සිට ජනයා මේ තෙල් ගෙන යෑම සඳහා පැමිණෙති. ප්‍රත්‍යන්ත සියලු ප්‍රදේශයන්හි පහන් දැල්වීම සඳහා වෙනත් කිසිදු තෙල් වර්ගයක් නොමැත. ජෝර්ජියාවෙහි රජු හැම විටම හඳුන්වනුයේ දවිද් මලික් යනුවෙනි. දවිද් රජු යනුවෙන් එතුමා හැඳින්වීම සාමාන්‍ය සම්ප්‍රදායයි. ටාටර්වරුන්ගේ අධිපතියා මේ රජතුමා ය. පුරාණයේ මේ ප්‍රදේශයේ රජුන් උපත ලබන විට ඔවුන්ගේ දකුණු උරහිසෙහි රාජාලියෙකුගේ ලකුණ සටහන් වී ඇතැයි කියනු ලැබේ. ජෝර්ජියන්වරු රූපසම්පන්න ජනතාවකි. රණකාමී ය. දක්ෂ ධනුර්ධරයන් ය. යුද්ධ ශිල්පයෙහි ශූරයෝ ය. ක්‍රිස්තු ලබ්ධිකයන් වන මොවුහු ග්‍රීක් පල්ලියේ නීති රීති අනුගමනය කරති. හිස කෙස් කෙටි කර කපති. දේවගැතියන්ගේ ඇඳුමට සමාන ඇඳුමක් හඳිති.

බටහිර දෙසට ගමන් ගන්නා අවස්ථාවේ ඇලෙක්සැන්ඩර් හට මේ ප්‍රදේශය පසුකැර යෑමට නොහැකි විය. මාර්ගය ඉතා පටු හා අනතුරු දායක වූ බැවිනි. එක පාර්ශ්වයකින් මහ මුහුද ය. අනෙක් පසින් ඉතා උස් කඳු හා වනාන්තරයයි. එහෙයින් අශ්වයන් පිට ගමන් කිරීම අසීරු ය. මහ මුහුදට හා කඳුකර වනාන්තරයට මැදින් පිහිටි මේ පටු දුෂ්කර මාවත ලීග හතරක් පමණ දුරට විහිදේ. වෙළෙඳ කටයුතු සඳහා මේ මාර්ගයේ ගමන් කරන්නේ ඉතා සුළු පිරිසකි. ඇලෙක්සැන්ඩර් හට මේ මාර්ගයේ ගමන් කළ නොහැකි වූයේ එහෙයිනි. ඇලෙක්සැන්ඩර් මෙහි කුළුණක් සහ බලකොටුවක් ඉදිකැර විය. එහෙයින් ස්වදේශිකයන් ඇලෙක්සැන්ඩර් හට ප්‍රහාර එල්ල කිරීමට නොහැකි විය. "යකඩ ගේට්ටුව" නමින් මේ ස්ථානය හැඳින්වේ. ටාටර්වරුන් පර්වත දෙකක් අතර සිරකළ ස්ථානය මෙය බැව් ඇලෙක්සැන්ඩර් පොතෙහි සඳහන් වේ. එහෙත් ජනයා පවසන්නේ කොමේනියන්වරුන් සහ වෙනත් ජන කොටසක් මෙසේ සිරකළ බව ය. ඒ අවස්ථාවෙහි ටාටර් වරුන් මෙහි සිටියේ නැත.

Scanned by CamScanner

මේ ප්‍රදේශයේ නගර සහ ගම්මාන රාශියකි. පට රෙදි මෙහි නිෂ්පාදනය කරනු ලැබේ. රන් නූලෙන් වැඩ දැමූ පට රෙදි හා වෙනත් රෙදි පිළි මෙහි නිමැවේ. ඒ නිෂ්පාදන අති විශිෂ්ඨ ය. මෙහි විශිෂ්ඨ ගණයේ උකුස්සන් දක්නට ලැබේ. සියලු බඩු බාහිරාදිය හා විවිධ කර්මාන්ත මේ ප්‍රදේශයේ පවතී. මුළු ප්‍රදේශයෙහි ම විශාල කඳු පර්වත ද, කෙටි දුර්ග මාර්ග ද ඇත්තේ ය. මේ මගින් මාර්ග අවහිර හා රක්ෂාවරණ ද සැලැසේ. ටාටර්වරුන් පවා මේ රටේ සමස්ත ප්‍රදේශයෙහි සංචාරය කර ඇතැයි සංකා විරහිතව කිව නොහේ. මේ කඳු මුදුන්වල සිලින්ඩරාකාර ගස් වැවේ.

සාන්ත ලෙනාර්ඩ් නමැති දේවස්ථානයක් මෙහි ඇත්තේ ය. එහි අරුම පුදුම හාස්කම් තිබේ. සාන්ත ලෙනාඩ් දේවස්ථානය පසෙකින් පිහිටි කන්දෙන් ගලා හැළෙන ජලය පිරී සැදුණු විශාල විලක් ඇත. එහි විශාල හෝ කුඩා මාළුන් එකකු හෝ දක්නට නොමැත. එහෙත් ශුද්ධ සෙනසුරාදා සිට එහි මාළුන් බෝවීමට පටන් ගැනේ. පාස්කු මංගල්‍යය තෙක් කාලය තුළ එහි මාළු බහුල ය. ඒ කාලය ඉක්ම ගිය පසු යළිත් එක මාළුවකුදු දක්නට නොලැබේ.

මේ රටේ මුහුදු දෙකක් දක්නට හැකි ය. උතුරින් කළු මුහුද පිහිටියේ ය. නැගෙනහිරින් බාකු නමැති මුහුද ය. ගෙල් නැතහොත් ගෙලාන් නමින් ද මේ මුහුදු හැඳින්වේ. එහි වට ප්‍රමාණය සැතපුම් 2800 කි. එක් අතකින් එය විලක් ලෙස හැඳින්විය හැකි ය. එය හාත්පසින්ම වටවී ඇති බැවින් ද, කිසිදු ස්ථානයකින් වෙනත් මුහුදකට සම්බන්ධ වී නැති හෙයින් ද විලක් ලෙසින් පෙනේ. එහි ගමන් කිරීමට දින දොළහක් ගතවෙයි. ජනයා පදිංචි දූපත් ද එහි තිබේ. අගනා නගර ද ගොඩනගා තිබේ. මේ දූපත්හි වාසය කරන්නේ සරණාගතයන් ය. ටාටර්වරුන් පර්සියාවේ ප්‍රදේශ යටත් කැර ගැනීම නිසා මේ ජනයා සරණාගතයන් වශයෙන් ආරක්ෂාව පතා දූපත්වල පදිංචියට පැමිණ සිටිති. අසල කඳුකර ප්‍රදේශවල ද ඔව්හු පදිංචි වී සිටිති. මේ මුහුදේ මත්ස්‍යයන් බහුල ය. සැමන්, ස්ටර්ජන් ආදි විශාල මත්ස්‍යයන් හා ගංගා රැසක් ද මේ මුහුදට ගලා බසී. යුප්‍රටීස් ගංගාව ද ඇතුළුව ය. මෑත වර්ෂයන් හි ගෙනොයිස් වෙළෙන්දෝ නැව් මගින් මෙහි පැමිණීමට පටන් ගත්හ. ගිලාන් නමැති පටරෙදි වෙළඳාම සඳහා ය.

මේ ප්‍රදේශයෙහි ටිෆ්ලිස් නමින් හැඳින්වෙන සුන්දර නගරයකි. මේ නගරය වටා ලොකු කුඩා නගර ද පිහිටියේ ය. ජනයා අදහන්නේ

Scanned by CamScanner

ක්‍රිස්තු ධර්මයයි. ආර්මේනියන්වරු ජෝර්ජියන්වරු සැරසින්වරු මෙහි වෙසෙති. ඔවුන් සුළු සංඛ්‍යාවකි. පටරෙදි හා වෙනත් රෙදිපිළි වර්ග මෙහි නිෂ්පාදනය කැරේ. මෙකී කර්මාන්ත ජනතාවගේ ජීවනෝපාය වේ. ඔවුන් සියලු දෙනා ටාටර් හි ප්‍රධාන ඛාන්ගේ යටත් වැසියෝ ය.

මෙහි දී මා විස්තර කළේ ප්‍රදේශයෙහි නගර දෙක තුනක් පමණක් ගැන බව ඔබ සිහිතබා ගත යුතු ය. අනෙක් නගරවල ද වැදගත් කුතුහලය දනවන කරුණු ඇත. ඇතැම් නගරයක විශේෂයෙන් වැදගත් ලෙස සැලකිය හැකි දෑ බහුල ය. එහෙත් සමහර නගර ගැන කීමට නොගියෙමි. විශේෂයෙන් සඳහන් කළ යුතු නගර හා ඒ සම්බන්ධ වැදගත් කරුණු පහත විස්තර සමගින් දක්වන්නෙමි. ආර්මේනියාවෙන් උතුරුදිග ගැන බොහෝ කරුණු කී බැවින් දකුණු හා නැගෙනහිර ප්‍රදේශ පිළිබඳව ඊ ළඟට කිව යුතු ය.

මොසුල් විශාල රාජධානියකි. එහි මහමදික අරාබි ජනයා වෙසෙති. ක්‍රිස්තු ලබ්ධික ජනයා ද සුලු සංඛ්‍යාවක් ජීවත් වන්නාහ. එහෙත් රෝමානු කතෝලිකයන් නොවේ. රෝමානු කතෝලික ආගමෙහි දෝෂ කිහිපයක් ඔවුහු දකිති. ඔවුන් නෙස්ට්‍රොලියන් හා ජාකොබ්වරුන් වශයෙන් හඳුන්වනු ලැබේ. කතෝලිකයන් යන නමින් මේ පිරිස හැඳින්වේ. ආර්ච්බිෂොප්, බිෂොප්වරුන් දේවගැතිවරුන් හා වෙනත් පූජකයන් කාතේයි, ඉන්දියාව, බැග්ඩෑඩ් හා අනෙකුත් රටවල සංචාරය කරති. රෝමයේ පාප්තුමා සංචාරය කරන්නාක් මෙනි. මවිසින් විස්තර කරන ලද ක්‍රිස්තියානින් නෙස්ටෝරියන් හා ජාකොබ්වරුන් ය.

මෙහි නිෂ්පාදනය කරනු ලබන පටරෙදි හා රන්මුවා රෙදි පිළි හඳුන්වනුයේ මොසුලින් නමිනි. මේ ද්‍රව්‍ය වෙළෙඳමේ යෙදෙන ජනයා ද මොසුලින් නමින් හැඳින්වේ. ඔව්හු විශාල වශයෙන් කුළුබඩු හා අනෙකුත් අගනා ද්‍රව්‍ය වෙළෙඳමෙහි ද යෙදෙති.

මෙහි කඳුකර ප්‍රදේශවාසී ජනයා කුර්ද් වරුන් නමින් හැඳින්වේ. ඔවුන් අතරින් සමහරු නෙස්ටෝරියන් හා ජාකොබ් ක්‍රිස්තියානිහු වෙති. සෙසු පිරිස සැරසින්වරු ය. ඔව්හු මහමදිකයෝ ය. මොවුන් කලහකාරී ය. නීතිගරුක නොවේ. වෙළෙඳුන් මංකොල්ල කෑමට නිතර පෙළඹෙති. මෙකී ප්‍රදේශයට ඔබ්බෙන් පිහිටා ඇත්තේ මුස්

Scanned by CamScanner

හා මර්දින් ය. මෙහි කපු නිෂ්පාදනය කැරේ. එයට අමතරව මැලියම් මිශ්‍ර රෙදි නිපදවනු ලැබේ. ජනයා වෙළඳාමෙහි ද, හස්ත කර්මාන්තයන්හි ද නියුක්ත වේ. ටාටර් රජුගේ යටත් වැසියෝ ය.

දැන් මොසුල් නුවරින් තික්ම බැග්ඩෑඩ් නුවර දෙසට හැරෙන්නෙමි.

බැග්ඩෑඩ් වූ කලී අති විශාල පුරවරයකි. සියලු ක්‍රිස්තියානින්ගේ ප්‍රධාන ආගමික පූජකවරයා රෝමයේ වාසය කරන්නා සේ සමස්ත ලෝකයේ සැරසින් වරුන්ගේ ආගමික නායකයා වූ කාලිප් තුමා මේ පුරවරයෙහි වෙසේ. නගර මධ්‍යයෙහි විශාල ගංගාවක් ගලා ඉන්දියන් සාගරයට ගමන් කරති. වෙළෙන්දෝ මේ ගංගාව ඔස්සේ ස්වකීය වෙළෙඳ භාණ්ඩ රැගෙන යති. එති. බැග්ඩෑඩ් නගරයේ සිට මුහුද දක්වා ගමන් කිරීමට සම්පූර්ණයෙන් දින දහ අටක් ගත වේ. වෙළෙඳුන් ඉන්දියාවට යන්නේ මේ ගංගාව ඔස්සේ කායිස් නගරයට ගොස් එතැනින් ඉන්දියන් සාගරයට පිවිසීමෙනි. බැග්ඩෑඩ් නගරයේ සිට ගංගාව ඔස්සේ කායිස් නගරයට ගමන් කරන අතරමගදී "බස්රා" නමැති විශාල නගරයක් හමුවේ. බස්රා නගරය පුරා රටඉඳි වැවී ඇත. ලෝකයේ ඉස්තරම් රටඉඳි ඇත්තේ එහි ය. ඉන්දියාවෙන් ගෙනෙනු ලබන මුතු ක්‍රිස්තියානු ලෝකයට අලෙවි කැරෙනුයේ බැග්ඩෑඩ් නගරයෙනි. මුතු ඇට විද මාල සැදීමට සිදුවන්නේ මෙහිදී ය. පටරෙදි හා රන්මුවා රෙදි පිළි ද මෙහි නිෂ්පාදනය කරේ. "නැසිඩ්" හා "නැක්" යනුවෙන් මේවා හැඳින්වේ. ඉතා ලක්ෂණ ලෙස පක්ෂීන් හා සිවුපාවුන්ගේ සටහන් සහිතව මේ රෙදිපිළි නිෂ්පාදනය කරනු ලැබේ. මහමද් ආගම ඉගෙනීම සඳහා මෙය යෝග්‍ය මධ්‍යස්ථානයකි. භූත විද්‍යාව, ස්වභාව ධර්ම විද්‍යාව, තාරකා විද්‍යාව, භූමි චිත්‍ර බලා පේන කීම, මුහුණෙහි ස්වභාවය බලා ශාස්ත්‍ර කීම ආදී ශාස්ත්‍රයන් මේ නගරයේ ඇත. බැග්ඩෑඩ් වූ කලී අතිශය අලංකාර යෝධ පුරවරයකි.

බැග්ඩෑඩ් හි කාලිප්වරයා සතුව ලෝකයේ අන් කිසිවකුට අයත් නොවන තරමේ රන් රිදී මැණික් සම්භාරයක් සහිත භාණ්ඩාගාරයක් ඇත්තේ ය. ඒ ගැන විස්තර කිරීමට ඉඩක් දෙන්න! මේ සිද්ධිය වූයේ අපගේ ස්වාමින්ගේ 1255 (ක්‍රි. ව. 1258) වර්ෂයේ ය. ටාටර්වරුන්ගේ ප්‍රධාන ඛාන්වරයා එනම් හුලාගු ඛාන් විශාල හට සේනාවක රැගෙන බැග්ඩෑඩ් නගරය ආක්‍රමණය කිරීමට පැමිණියේ ය. ටාටර්වරුන්ගේ අධිපතින් වූ සහෝදරයන් සිවු දෙනා අතරින්

Scanned by CamScanner

හුලුගු එක් සහෝදරයෙකි. වැඩිමල් සහෝදරයා මොන්ගු ය. මේ සහෝදරයින් කාතේයි පුරය හා අනෙකුත් ප්‍රත්‍යන්ත රාජ්‍යයන් යටත් කරගත් නමුදු එයින් සෑහීමට පත්වූයේ නැත. සමස්ත ලෝකයම යටත් කර ගැනීම ඔවුන්ගේ අභිප්‍රාය විය. ඔවුන් සිවුදෙනා කොටස් හතරකට බෙදී නැගෙනහිර දිසාව ජයගැනීම සඳහා එක් තැනැත්තෙක් ද, තවත් එක් තැනැත්තෙක් දකුණු දිසාවට ද, අනෙක් දෙදිසාව ජය ගැන්ම සඳහා අනෙක් සහෝදරයන් දෙදෙනා ද නික්ම ගියෝ ය. හුලුග් නමැති සහෝදරයා දික්විජය සඳහා නික්මුණේ දකුණු දිසාවට ය. දකුණු පෙදෙසේ සියලු නගර ජයගනිමින් ඉදිරියට ගමන් කළ ඔහු බැග්ඩෑඩ් නගරයට ළඟා වූයේ ය. හෙතෙම බැග්ඩෑඩ් නගරයේ ශක්තිය ගැන හොඳින් දැන සිටියේ ය. එහෙයින් තම ශක්තිය යොදා නගරය ජය ගැනීමට වඩා කූට උපායකින් ජයගත යුතු යයි කල්පනා කෙළේ ය. ඔහුගේ බල ඇණිය 100000 කින් යුක්ත විණි. පාබල සේනාවට අමතරව ය. එහෙත් ඔහු කාලිප් හට ප්‍රදර්ශනය කෙළේ තමන්ගේ පිරිස ඉතා සුලු බවකි. එදෙසට ළංවීමට පෙර හුලුග් කෙළේ තම පිරිසෙන් කොටසක් වනාන්තරයේ එක් පැත්තක ද, තවත් පැත්තක තවත් කොටසක් ද වශයෙන් කොටස් කැර සඟවා තැබීමයි. සෙසු කොටස දොරටු අසල තරයේ රැකවලෙහි රැඳවී ය. පැමිණි සතුරු සෙනග සුළු සංඛ්‍යාවක් බව පෙනුණු හෙයින් කාලිප් අනතුරක සේයාව නොතකා හැරියේ ය. මහමද්තුමාගේ ධජය කෙරෙහි විශ්වාසය තබා වචනයෙන් ඔවුන් පන්නා දැමීමට කාලිප් සැරසුණි. මෙය දුටු හුලුග් සිය පිරිස සමග ඉදිරියට පැන කාලිප් ඇතුළු සහචරයන් වනාන්තරය දෙසට එළවාගෙන ගියේ ය. හුලුග් ගේ සේනා සැඟවී සිටියේ වනාන්තරයේ ය. සැඟවී සිටි පිරිස වහා ඔවුන් වටකර අල්ලා ගත්හ. කාලිප් ද නගරය ද හුලුග් අතට පත්විය. ඉක්බිති කාලිප්ගේ බලකොටුව සොයා ගන්නා ලදී. රත්රන් ඇතුළු ධන සම්භාරය ගබඩා කැර තිබුණේ ඒ තුළ ය. යථෝක්ත වස්තු සම්භාරය දැකීමෙන් හුලුග් මවිතයට පත්විය. ඉක්බිති කාලිප් තමන් අබිමුවට කැඳවන ලෙස කීවේ ය.

"කාලිෆ්! මේ වස්තු සම්භාරය ගෙඩගසා තැබුවේ ඇයි? ඔබ මේ වස්තුවට මොනවද කරන්න හිතාගෙන හිටියේ? මං ඔබේ සතුරකු බවත් ඔබට විරුද්ධව පැමිණෙන බවත් දන්නේ නැද්ද? මේ වස්තුව පැහැර ගන්න බව හිතුවෙ නැද්ද? ඔබ මේ වස්තුව වංශාධිපතීන්ට හා කුලී භේවායන්ට දී රට - නගරය රැකගන්න සිතුවේ නැත්තේ ඇයි?"

හුලගු ඇසූ ප්‍රශ්නවලට කාලිෆ් නිරුත්තර විය. කීමට පිළිතුරක් නොවූයෙනි.

"කාලිෆ් මේ වස්තුවට ඔබ බොහොම ආදරය කරන බව මම දන්නවා!"

"මම දැන් මේ වස්තුව ඔබට කෑමට දෙනවා!"

ඉන්පසු හුලගු සිය භටයනට අණ කෙළේ කාලිෆ් රැගෙන ගොස් ධන සම්භාරය පිරී ඇති බලකොටුව තුළට දමා කෑමට හෝ බීමට හෝ කිසිවක් නොදෙන ලෙස ය.

"කාලිෆ් දැන් ඉතින් ඔය භාණ්ඩාගාරයේ තියෙන රත්රන් බඩ පිරෙන තුරු කාපන්. ඒ හැර වෙනත් ආහාරයක් ලැබෙන්නෙ නෑ!"

යනුවෙන් කී හුලගු එතැනින් බැහැර විය. සිවුදිනක් ඇවෑමෙන් කාලිෆ් මිය ගියේ ය. මෙසේ මරණයට පත් නොවී සිය ධනය සොල්දාදුවනට හා ජනතාවට ද බෙදා දී ආරක්ෂාව සලසා ගන්නට ඉඩ තිබිණි. එහෙත් එවැන්නක් නොකෙට ඔහු අසරණව මිය ගියේ ය. එදින පටන් මෙම නගරයෙහි කාලිෆ්වරයෙක් නැත.

ටැබ්රික් නගරය වෙත යෑමට පෙර බැග්ඩෑඩ් නගරයේ සිදුවීම් හා සිරිත් විරිත් ඔබට කියන්නෙමි. එහෙත් මේ විස්තර බොහෝ දිගින් දිගට ඇදී යන බැවින් මෙහි සඳහන් කරනුයේ සංක්ෂෙපයෙනි. පළමුවෙන් අරුම පුදුම දෙයක් ගැන කියමි. එය අසන්න. ක්‍රි. ව. 1225 දී බැග්ඩෑඩ් හි කාලිෆ්වරයෙක් සිටියේ ය. හෙතෙම ක්‍රිස්තු ලබ්ධිකයන් කෙරෙහි දැක්වූයේ විරෝධතාවකි. සිය දේශයේ ක්‍රිස්තුලබ්ධිකයන් සැරසින් ආගමට හරවා ගන්නේ කෙසේදැයි හෙතෙම දිවා රාත්‍රී කල්පනා කෙළේ ය. එසේ කළ නොහැකි වුව හොත් ඔවුන් මරා දැමීමට ද ඔහු සිතී ය. මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය කුමක් දැයි සිය ආගමික පූජකයන්ගෙන් හා ඇමැතිවරුන්ගෙන් විමසන ලදී. ඔවුන් සියලු දෙනා ම එක්ව ක්‍රිස්තු ලබ්ධිකයන් සැරසින් ආගමට හරවා ගැන්මේ උපක්‍රමයක් යෙදූහ. ඔව්හු ක්‍රිස්තියානි ලබ්ධිකයන්ගේ ශුභාරංචිය පිළිබඳව පවත්නා විශ්වාසය බිඳ හෙළිය යුතු යයි තීරණය කළෝ ය. යම් හෙයකින් එය පිළිබඳව අබ ඇටයක තරම් හෝ විශ්වාසයක් ඇත්නම් පර්වත දෙකක් යා කළ හැකි යයි සඳහන අනුව ක්‍රිස්තු ලබ්ධිකයන්ගේ ආගමික පදනම බිඳ හෙළීමට කටයුතු සකස් කැරිණ.

Scanned by CamScanner

කාලිප් සියලු ක්‍රිස්තු ලබ්ධිකයන් ද, නෙස්ටොරියන් හා ජාකොබ්වරුන් ද තමන් හමුවට කැඳවිය. ඒ කැඳවීම අනුව විශාල ජන සේනාවක් රැස්විය. කාලිප් ශුභාරංචිය සඳහන් කරන කඳු පර්වත දෙකක් යා කිරීමේ කථාව යථෝක්ත ග්‍රන්ථයෙන් උපුටා ඔවුන් ඉදිරියෙහි කියැවීය. මහත් සතුටට පත්ව සිටි කාලිෆ් එහි සඳහන් කරුණු සත්‍යයක් දැයි ක්‍රිස්තු ලබ්ධිකයන් වෙතින් විමස ය. එය සැබැවින්ම සත්‍ය ප්‍රකාශයක් බව ක්‍රිස්තු ලබ්ධිකයෝ කීහ. දෙවියන් කෙරෙහි අබ ඇටයක තරම් හෝ විශ්වාසයක් ඇත්නම් කඳු පර්වත දෙකක් යා කළ හැකි ය යන දේව වාක්‍යය සත්‍යයක් දැයි හේ නැවත විමසීය. සත්‍යයක් නම් එසේ කළ හැකි බව පෙන්වන ලෙස ද කාලිෆ් කීය.

"සැබවින්ම අපි කඳු පර්වත දෙකක් යා කර පෙන්වන්නෙමු" ක්‍රිස්තු ලබ්ධිකයෝ අභියෝගය පිළිගත්හ.

"එසේ නම් අර පෙනෙන කඳු පර්වත දෙක එකිනෙක යා කර පෙන්විය යුතුයි" කාලිප් නුදුරින් පිහිටි කඳු වැටි දෙකක් පෙන්වීය.

"මේ සඳහා මම ඔබට දින දහයක කාල සීමාවක් දෙනවා. දස වැනි දිනයේ එසේ නොකළහොත් ක්‍රිස්තියානින් සියලු දෙනම මරා දමනවා! නැතහොත් සියලු පණ බේරා ගැනීමට කැමති නම් මහමද් ආගම වැළඳ ගත යුතුයි...."

මෙසේ කී කාලිෆ් වරයා ක්‍රිස්තු ලබ්ධිකයන්ට ආපසු යෑමට ඉඩ හළේ ය.

කාලිෆ් ගේ වචන ඇසූ ක්‍රිස්තු ලබ්ධිකයෝ මහත් භීතියට පත් වූහ. මරණයෙන් බේරීමට කළ යුත්තේ කුමක් දැයි නොදැන වික්ෂිප්ත ව දෙවියන් වහන්සේ නිසා තමන් මහත් විපතකට මුහුණ පා සිටි බැවින් ශෝක භරිත වූහ. ඔව්හු ආර්ච් බිෂොප් - බිෂොප් හා සෙසු පූජා ප්‍රසාදීන් වෙත එළැඹ විපතින් මිදීමට උපදෙස් පැතුහ. ඉක්බිති සියලු දෙනා එක්ව කාලිප්ගේ කෲර දඬුවමෙන් මිදීම සඳහා දෙවියන් වහන්සේට යාඥා කිරීමට තීරණය කළහ. ලොකු කුඩා ගැහැනු පිරිමි සියලු දෙනා එක්ව අට දිනක් මුළුලලේ යාඥා කරමින් දෙවියන් වහන්සේගේ පිහිට පැතුවෝ ය. දින අටක් දිවා රාත්‍රී නොකඩවා යාඥා කරමින් දිව්‍ය ලෝකයේ සහ මිහිමත බල පරාක්‍රමය දක්වන්නා වූ දෙවියන් වහන්සේ තමන් සියලු දෙනා මේ මහත් විපතින් මුදාගන්නා ලෙස යාඥා කළෝ ය. අටවන දිනයෙහි එක්තරා දේව දූතයෙක් දෙවියන් වහන්සේගේ පණිවිඩය රැගෙන ඉතා භක්තිමත් බිෂොප් තුමකු වෙත පැමිණියේ ය.

Scanned by CamScanner

"ඕ! බිෂොප් තුමනි! අසවල් සපත්තු සාදන්නා වෙත යන්න. ඔහුගේ එක් ඇසක් අන්ධ ය. ඔහු කැඳවාගෙන අවුත් ඔහු ලවා යාඥා කරවන්න. එවිට කඳු දෙක එකට යාවනු ඇත."

යනුවෙන් දේවදූතයා බිෂොප් හට කීවේ ය.

දැන් මේ සපත්තු සාදන්නා ගැන විස්තරය කියමි.

ඔහු ඉතා අවංක ය. භික්මුණු නිර්මල ජීවිතයක් ගත කරන්නෙකි. ඔහු බොහෝ උපවාස කර ඇත. කිසිදු පවක් නොකරයි. ඔහුගේ දිනපතා ආහාරය ද දන් දෙයි. දෙවියන් වහන්සේගේ නාමයෙනි. පවිත්‍ර ජීවිතයක් ගත කරන ඔහු වැනි යහපත් පුද්ගලයකු ඒ ප්‍රදේශයේ නොමැත. විශ්වාසවන්තයකු වූ ඔහු යහපත් ජීවිතයක් ගත කරන්නෙකි. "ඔබේ ඇසක් ඔබට කරදර කරයි නම් එය උපුටා දමාපන්" යන ශුභාරංචියෙහි කියමන ඔහු අසා ඇත. එබන්දක් ඔහුට අත්දකින්නට සිදුවිය.

මේ සපත්තු සාදන්නාගේ නිවසට එක්තරා රූමත් කාන්තාවක් පාවහන් මිලදී ගැනීම සඳහා පැමිණියා ය. ඔහු ඇයගේ පතුල සහ පාදය පෙන්වන ලෙස කී ය. එසේ කෙළේ ඇගේ පාදයට සරිලන පාවහන් තෝරා දිය යුතු නිසා ය. සැබැවින්ම මේ රූමත් කාන්තාවගේ පාදය ද පියකරු ය. කාන්තාවගේ පියකරු පාදය දැක්මෙන් ඔහුට ආස්වාදයක් ලැබුණි. කාන්තාවට සපත්තු වික්කේ ද නැත. කාන්තාව නික්ම ගිය පසු සපත්තු සාදන්නා තමන් කාන්තාවගේ පාදය දෙස ආසාවෙන් බලන්නට සිදුවීම ගැන මහත් සේ පශ්චාත්තාප වූයේ ය.

"බොරුකාරයා රැවටිලිකාරයා උඹ මොනවද හිතන්නේ? ඒ දර්ශනය නිසා උඹ මුලාවුණා! උඹේ ඇස් නිසයි එහෙම වුණේ. ඇස! උඹ තමයි වැරදි කාරයා!" කියමින් ඔහු තියුණු ආයුධයක් ගෙන තම ඇස පසාරු වී යන පරිදි වැරෙන් ඇන ගත්තේ ය. ඒ ඇසෙහි පෙනීම සදහටම නැති විය. සැබැවින්ම ඔහු අවංක ගුණගරුක යහපත් පුද්ගලයෙකි.

දැන් යළිත් අපේ කතාවට හැරෙමු.

සපත්තු සාදන්නා මේ ස්ථානයට ගෙන්විය යුතු බවට බිෂොප්තුමා හට බොහෝ වාර ගණනක් දැනුම් දෙන ලදී. ඒ අනුව සපත්තු සාදන්නා කැඳවාගෙන ඊමට කටයුතු යෙදිණ. සපත්තු සාදන්නා කැඳවාගෙන ආ පසුව කඳු දෙක යා කරන ලෙස යදින්නැයි

Scanned by CamScanner

ඔහුගෙන් ඉල්ලා සිටියෝ ය. තමා එතරම් ගුණයහපත් පුද්ගලයකු නොවන බව ද ස්වාමීන් වහන්සේ තමන්ගේ යාඥාවට කරුණානුග්‍රහය දක්වන්නේ ද යනු සැක සහිත යයි ද ඔහු පළමුවෙන් මේ සඳහා ඉදිරිපත් වීමට අදි මදි කෙළේ ය. එහෙත් ක්‍රිස්තු ලබ්ධිකයෝ ඔහුට පෙරැත්ත කරමින් කෙසේ හෝ යාඥා කරන ලෙස ඉල්ලා සිටියහ. අවසානයේ දී කෙසේ නමුදු ඔහු මේ භාරදූර කාර්යය ඉෂ්ට කිරීම සඳහා ඉදිරිපත් විය.

කෙසේ නමුදු කාලිප්වරයා නියම කළ දින දහයේ සීමාව කෙළවර දසවන දිනය උදා වූයේ ය. එදින සියලු ක්‍රිස්තියානිහු පාන්දරින්ම අවදි වූහ. ලොකු, කුඩා, බාල, මහලු, ස්ත්‍රී, පුරුෂ සියලු දෙනා ම දේවස්ථානයට රැස්වී දේව මෙහෙය පැවැත්වූහ. ඉක්බිති ඔව්හු කඳු පර්වත පාමුල තැනිතලාවෙහි ගැලවුම්කාරයාණන් වහන්සේගේ කුරුසිය සිටුවා සියලු දෙනා ම යාඥාවට පටන් ගත්තෝ ය. මේ අවස්ථාවට රැස්වූ පිරිස 100000 අධික ය. ඔවුන් දෙවියන් වහන්සේගේ කුරුසිය පෙරටුකොට ගෙන යාඥා කරන කල්හි කාලිප්වරයා ද එතැනට පැමිණයේ ය. ඒ හා සමග සැරසින්වරු ද විශාල සංඛ්‍යාවක් පැමිණියහ. ඔවුන් පැමිණියේ ක්‍රිස්තු ලබ්ධිකයන් මරා දැමීමටයි. කිසි ලෙසකිනිදු කඳු පර්වත එහා මෙහා කිරීමට හැකිවෙතැයි නොසිතූ බැවිනි. මේ අවස්ථාවෙහි කුඩා, බාල, මහලු, ස්ත්‍රී, පුරුෂ සියලු ක්‍රිස්තියානින් සිටියේ භීතියෙනි. සැකයෙනි. තැනිතලා භූමියෙහි ක්‍රිස්තුලබ්ධිකයන් සැරසින් වරුන් මෙසේ රැස්වී සිටිය දී සපත්තු සාදන්නා කුරුසිය ඉදිරියෙහි දණගසා දෝත් දිව්‍ය ලෝකය දෙසට ඔසවා

"ගැලවුම්කාරයාණන් වහන්සේගේ නාමයෙන් යාඥා කරමි. මේ කඳු පර්වත දෙක එකිනෙක යා කරනු මැනව! එසේ නොවුව හොත් මෙහි රැස්වී සිටින සියලු කිතුණු බැතිමතුන් කෲර වූ මරණයට පත්වන්නේ ය. පියාගේත්, පුත්‍රයාගේ, ස්ප්‍රිතු සාන්තුවරයාගේත් නාමයෙන් මේ කඳු පර්වත එකිනෙක චලනය වී අවුත් එකිනෙක යා වෙත්වා" යි යාඥා කෙළේ ය. ඔහුගේ යාඥාව කෙළවර වත්ම කඳු පර්වත දෙක චලනය වෙමින් අවුත් එකිනෙක සම්බන්ධ විය. කාලිප්වරයා ඇතුළු පිරිවර එදෙස ගල් ගැසී බලා සිටියහ. රැස්ව සිටි සැරසින්වරු සැහෙන සංඛ්‍යාවක් ක්‍රිස්තුලබ්ධිය වැළඳ ගත්හ. කාලිප්වරයා ද ක්‍රිස්තියානි ආගමට හැරුණේ ය. ඔහු රහසිගතව

Scanned by CamScanner

කුරුසියක් පැළඳ සිටි බව මරණයෙන් පසු අනාවරණය විය. එහෙයින් සැරසින්වරුන් මියගිය කාලිප්වරයාගේ මෘත දේහය කාලිප් වරුනට අයත් සොහොන් කොත් අතරේ තැන්පත් කෙළේ නැත. වෙනත් ස්ථානයක මිහිදන් කළහ.

යථෝක්ත අරුම පුදුම සිද්ධිය පිළිබඳව දැන් ඔබ සියලු විස්තර දැනගත්තෙහි ය. සපත්තු සාදන්නාගේ අරුම පුදුම බල මහිමය වර්ෂයක් පාසා සිහිපත් කරමින් ක්‍රිස්තියානි ජනයා පූජෝපහාර පවත්වන්නාහ. උපවාස ශීලය ආරක්ෂා කරමින් දේව මෙහෙයෙහි යෙදෙන්නාහ. එහෙත් තවමත් යම් යම් කරුණු අතින් ආමේනියන්වරු ද නෙස්ටොරියන්වරු ද, ජාකොබ්වරුන් ද එකිනෙකා කෙරෙහි විරුද්ධත්වය දක්වන්නෝ ය.

ඉරාකයෝ පිහිටිටැබ්රිස් විශාල පුරවරයකි එහි බොහෝ නගර හා පුරවරයන් පිහිටා ඇත. එහෙත ටැබ්රිස් ඉතා අලංකාර පුරවරයයි. ඒ පිළිබඳ විස්තර මෙසේ ය.

ටැබ්රිස් හි ජනයාගේ ජීවනෝපාය වෙළෙඳම සහ කර්මාන්තයි. විශාල වශයෙන් පට රෙදි හා රන්මුවා රෙදිපිළි කර්මාන්තය මෙහි සිදුකැරේ. ඉන්දියාවේ සහ බැග්ඩෑඩ්හි සිට ගෙනෙනු ලබන වෙළෙඳ භාණ්ඩයන් සඳහා මෙය කදිම මධ්‍යස්ථානයකි. මොසුල්, හොර්මුස් ආදි ස්ථානවලින් පැමිණෙන වෙළෙන්දෝ ද ලතින් වෙළෙන්දෝ ද විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා මෙහි පැමිණෙති. එසේම මැණික් වෙළෙඳමට ද අගනා මධ්‍යස්ථානයකි. සංචාරක වෙළෙඳුන් හට විශාල ලාභ ලබා ගත හැකි ස්ථානයකි. එහි වෙසෙනුයේ මිශ්‍ර ජන කොට්ඨාසයකි. ජාකොබ් ජෝර්ජින් පර්සියන් සහ මහදිකයන් ද දක්නට ලැබේ. ඔවුන් මෙහි ස්වදේශිකයෝ ය. "ටැබ්රිස්" නමින් හැඳින්වේ. නගරය හාත්පස සුන්දර පලබර උයන්වතු දක්නට හැකි ය. ටැබ්රිස් හි සැරසින්වරු නපුරු ය. විශ්වාසය නොතැබිය හැකි අනතුරුදායක පිරිසකි. මහමද් තුමාගේ ධර්මය අදහන නමුදු ඔවුන්ගේ අදහසට විරුද්ධ වේ නම් කවර තරමේ සාහසික ක්‍රියාවකට වුවද පෙළඹෙති. ඔවුන්ගේ යහපත සඳහා ගන්නා වූ කවර පියවරක් නිසා වුව ද පාපයක් සිදු නොවේ. ක්‍රිස්තියානින් අතින් තුවාල සිදුවුවහොත්, නොඑසේ නම් මරණයට පත් වුවහොත් ආගම භක්තියෙන් ජීවිත පරිත්‍යාග කළ අයුරින් සැලැකේ. මේ හේතුව නිසා ඔව්හු දරුණු අපරාධකාරයෝ

Scanned by CamScanner

වෙති. ඕනෑම සාවද්‍ය ක්‍රියාවක් සඳහා ඔවුහු මහමත්තුමාගේ ආගම දඩමීමා කර ගනිති. සෙසු ලෝකයා අපරාධ වශයෙන් සලකන කරුණු ඔව්හු ආගමේ මුවාවෙන් සාධාරණීකරණය කරති. ස්වකීය යහපත සඳහා කවර අපරාධයක් කළ ද එයින් පව් සිදු නොවෙතැයි ඔව්හු විශ්වාස කරති. ඔවුන් මරණයට කැපවන මොහොතේ දී පූජක තැන පැමිණ මහමත්තුමා විශ්වාස කරන්නේදැයි අසයි! මහමත්තුමා දෙවියන්ගේ දූතයා ලෙස පිළිගන්නේදැයි අසයි! "ඔව්" යනුවෙන් පිළිතුරු දුනහොත් ඔහුට අභය දානය ලැබේ. ටාටර්වරුන් සහ තවත් ජාතීන් රැසක් තම ආගමට හරවා ගැන්මට ඔවුන් මේ ක්‍රියා කලාපය උපයෝගී කැර ගනිති. පාපය මග හරවා ගැන්මට මේ ආගම බලපත්‍රයක් ලෙස භාවිතා කළ හැකි බැවිනි. සාන්ත බාර්සමෝ නමින් ඉදි කළ දේවස්ථානයක් ටැබ්රිස්හි ඇත්තේ ය. මෙහි ප්‍රධාන පූජකතුමා සහ භික්ෂූන් පිරිසක් ද වසන්නාහ. මොවුන්ගේ ඇඳුම ලෝගුවකට සමාන ය. මේ භික්ෂූන් ලොම් ආස්තරණ නිෂ්පාදනය කරති. ඒවා උත්සව අවස්ථාවන්හි දී සාන්තර බාර්සමෝ අබිමුව පිහිටි පූජාසනයේ අතුරා බුහුමන් කරති. මේ භික්ෂූන් පිණ්ඩපාතයේ වඩින විට මේ ඇතිරිලි ගෙන ගොස් තම දායකයනට හා ධනවතුනට දෙති. මේ ඇතිරිලි භාවිතයෙන් ශාරීරික වේදනා කැක්කුම් සුව වෙතැයි විශ්වාස කැරේ. එබැවින් හැම කෙනෙකුම පාහේ මේ ඇතිරිල්ලක් ලබා ගැන්මට කැමැති ය.

දැන් අපි ටැබ්රිස් ප්‍රදෙශයෙන් ඈත් වී පර්සියාව දෙසට හැරෙමු. එය දර්ශනීය එමෙන්ම ප්‍රබල ප්‍රදේශයකි. පෙරදී එසේ පැවැතිය ද මේ වන විට ටාටර්වරුන් ඒ ප්‍රදේශයට බලවත් පාඩු හානි සිදුකැර ඇත.

පර්සියාවේ සැවේ නමැති නගරයක් තිබේ. ක්‍රිස්තුන් වහන්සේ වන්දනා කිරීම සඳහා පූජකවරු (මාගි) න් තිදෙනෙකු පිටත්ව ගියේ මේ නගරයෙනි. ඔවුන් තිදෙනා මිහිදන් කළ ස්ථානයෙහි විශාල අලංකාර සොහොන් කොත් තුනක් ඉදිකැර තිබේ. ඒ හැම ස්මාරකයක්ම සතරැස් ගොඩනැගිල්ලකි. එහි වහල ඉතා අලංකාර කැටයමින් සමන්විත ය. දර්ශනීය ය. මේ ස්මාරක තුන එකකට එකක් පෙළට පිහිටා තිබේ. ඔවුන්ගේ මෘත ශරීර ද විනාශ නොවී දිස් වේ. හිසකේ සහ රවුළ වැවේ. එකකුගේ නම බල්තසාර් ය. දෙවැන්නා ගැස්පාර් ය. තුන්වැන්නා මැල්කොයිර් ය. මේ තිදෙනා

Scanned by CamScanner

කවුරුන්දැයි මාර්කෝ එහි වැසියන් බොහෝ දෙනෙකුගෙන් විමසීය. හැම දෙන ම කියා ඇත්තේ පුරාණයේ මෙහි වාසය කළ රජුන් තිදෙනෙකුගේ සොහොන් බව ය. ඒ හැර වැඩි විස්තරයක් කීමට ඔව්හු නොදත්හ. එහෙත් පසුව ඔහු මෙහි ඉහතින් දැක්වූ කරුණු දැන ගැන්මට සමත් විය.

දින තුනක් ඉදිරියට ගමන් කිරීමෙන් පසු හමුවූයේ කලා අටෂ්පරස්තාන් නමැති නගරයකි. මේ නගර වැසියෝ ගිනි දෙවියා පුදන්නෝ ය. ඔවුන් ගිනි දෙවියා පුදන්නේ කවර හේතුවක් නිසා දැයි මම ඔබට විස්තර කරන්නෙමි. පුරාණයෙහි මේ රටේ රජවරු තිදෙනෙක් ශුද්ධෝත්තමයකුගේ උපත ගැන අසා රත්රන් ද, කට්ටකුමංචල් ද, සුවඳ ලාටු ද පුද පඬුරු ලෙස රැගෙන එහි ගියහ. ශුද්ධවන්තයාට පූජා ගෞරව පිණිස ය. ඒ යන අතර ඔව්හු එක්තරා කතිකාවක් ඇති කැර ගත්හ. එනම් මෙලොවට බිහිවී ඇත්තේ රජෙකු නම් අප ගෙන යන පඬුරු අතරින් පළමුව රත්රන් භාරගනු ඇත. කට්ටකුමංචල් භාරගත්තේ නම් ඔහු දෙවියෙකි. සුවඳ ලාටු භාරගත්තේ නම් රෝගීන් සුවපත් කරන්නෙකි. ඔව්හු කුමරා බිහි වී සිටින ස්ථානය කරා ළඟාවූහ. පළමුව කුමරා බැහැ දකින්නට ගියේ රජවරුන් තිදෙනා අතරින් බාල ම තැනැත්තා ය. ඔහුට දක්නට ලැබුණේ කුමරා තම වයසේම තම පෙනුමෙන්ම යුත් කෙනෙකු ලෙසිනි. ඔහු මවිතයට පත්ව පිටතට පැමිණියේ ය. ඉක්බිති මැදි වයසේ තැනැත්තා කුමරු බැහැදක්නට ගියේ ය. ඔහුට කුමරා දක්නට ලැබුණේ තම වයසේම තම පෙනුමෙන් ම යුත් කෙනෙකු හැටියට ය. ඔහු ද පිටතට පැමිණියේ මවිතයට පත්වෙමිනි. ඉක්මබිති කුමරා දැක්මට ගියේ වයසින් වැඩි ම රජු ය. ඔහුට ද කුමරා පෙනුණේ තම වයසේ ම තම පෙනුමෙන් ම යුත් කෙනකු වශයෙනි. මේ අරුම පුදුම සිද්ධිය ගැන රජවරුන් තිදෙනා සාකච්ඡා කෙළේ මවිතයෙනි. කෙසේ වුවද මේ පුදුමය වටහා ගත නුහුනු රජවරුන් තිදෙනාම එක්වර කුමරු බැහැදැක්මට ගියහ. එවිට ඔවුන් දුටුවේ බිළිඳු කුමරෙකි. කලින් දක්නට ලැබුණු ස්වරූපයෙන් නොවේ. ඒ වන විට බිළිඳගේ වයස දින දහතුනකි. රජවරු තිදෙනා කුමරා වන්දනා කොට රත්රන් ද, කට්ටකුමංචල් ද, සුවඳ ලාටු ද පූජා කළහ. බිළිඳු කුමරු ඒ සියලු පූජා ද්‍රව්‍ය සතුටින් භාරගත්තේ ය. කුමරා ද රජවරුනට තුටු පඬුරක් ලෙස වසන ලද

Scanned by CamScanner

මංජුසාවක් පිරි නැමී ය. රජවරුන් තිදෙනා පෙරළා සිය රට බලා ගමන් ඇරඹූහ.

දින කිහිපයක් ගමන් කළ පසු කුමරා දුන් මංජුසාව කුමක්දැයි විවෘත කැර බැලීමට රජවරු තිදෙනා උනන්දු වූහ. මංජුසාව විවෘත කැර බැලූ විට දක්නට ලැබුණේ ගලකි. මෙය කුමක් විය හැකි දැයි ඔව්හු කුතුහලයට පත්වූහ. එහෙත් එය කවර අරමුණක් ඇතිව කුමරා තමන්ට දුන්නේ දැයි ඔවුනට වටහා ගත නොහැකි විය. රජවරුන් තිදෙනා කුමරා දැක්මට ගියේ රජකු ද, සාත්තුවරයකු ද නැතහොත් රෝග සුවපත් කරන්නකු ද යන ගැටලු සහගත අවිනිශ්චිත හැඟීමෙනි. මේ බව දත් කුමරා ඔවුනට මංජුසාවක බහා ලූ ගලක් දුන්නේ තමන් කවුරුද යන විශ්වාසය තහවුරු කිරීමේ අටියෙනි. එහෙත් රජවරු තිදෙනා ඒ බව නොදත්හ. ඔව්හු ඒ ගල ළිඳකට විසි කළහ. එකෙණෙහිම ඒ ළිඳ තුළින් විශාල ගිනි ජාලාවක් පැන නැංගේ ය. ඒ අග්නි ජාලය එහි පහමත් වූයේ දිව්‍ය ලෝකයෙනි. දිව්‍ය මහිමය වටහා ගත් රජවරුන් තිදෙනා ඒ අග්නි ජාලාවෙන් ස්වල්පයක් සුරක්ෂිතව රැගෙන ගොස් අලංකාර මණ්ඩපයක් තුළ ආරක්ෂා සහිතව තැබූහ. එදා පටන් පුද පූජා පවත්වමින් මේ ගින්න වන්දනා මාන කළෝ ය. දෙවියකු ලෙස සලකමිනි. ඔවුන්ගේ යාග හෝම සඳහා ගිනි දල්වන්නේ ද මේ සුරක්ෂිත අග්නි ජාලයෙන් දැල්ලක් ගෙන යමිනි. ඔවුනගේ දේවස්ථානයන්හි මේ ගින්න මහත් ගෞරවයෙන් පුදනු ලැබේ. ඔවුන් මේ ගින්න සියලු ආගමික වතාවත් සඳහා භාවිත කිරීම ආගමික චාරිත්‍රයකි. මේ ගින්න සුරක්ෂිතව පවත්වා ගැන්ම සඳහා ඔවුහු දස දිනක් වන්දනාවෙහි යෙදෙති.

මේ පුරවරයේ ජනතාව ගිනිදෙවියා පිදීමට යොමු වූයේ යථෝක්ත කරුණු හේතුවෙනි. මේ සම්බන්ධයෙන් ඔබ කරුණු රැසක් දැනගන්නට ඇතැයි සිතමි. මාර්කෝ පෝලෝ මේ කරුණු සත්‍ය වශයෙන් අසා දැනගත්තේ පුරවැසියන්ගෙනි. එදා බිළිඳු කුමරා බැලීමට ගිය "මාගි" වරුන් තිදෙනා ගමන් ඇරඹූයේ සැවේ - හවග් සහ කෂාන් යන තුන් රාජ්‍ය වෙතිනි.

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ දීර්ඝ විස්තරය ප්‍රමාණවත් යයි හැඟේ. ඊළඟට පර්සියාවේ සෙසු නගර ගැන ද පුරවැසියන් හා ඔවුන්ගේ සිරිත් විරිත් ද විස්තර කරනු රිසියෙමි.

පර්සියාවේ රාජධානි අටක් ඇත්තේ ය. පර්සියාව විශාල රටක් බැවිනි. එහි විස්තර මෙසේ ය. රටට ඇතුළුවන තැනම පිහිටි පළමුවන රාජධානිය "කස්වින්" නම් වේ. දෙවැනි රාජධානිය පිහිටා ඇත්තේ දකුණු දෙසිනි. එය කුර්දිස්ථාන් නම් වේ. තුන්වන රාජධානිය ලුරිස්ථාන් ය. හතරවන රාජධානිය ෂුලිස්ථාන් ය. පස්වන රාජධානිය ඉස්පහාන් ය. හයවන රාජධානිය ෂිරාස් ය. හත්වන රාජධානිය ෂබාන්කර ය. අටවන රාජධානිය තුන් සහ කායින් ය. එය නියම වශයෙන් ම පිහිටා ඇත්තේ පර්සියාවෙහි ය. මේ රාජධානි සියල්ල පිහිටා ඇත්තේ කස්වින් රාජධානියෙන් දකුණු දිගිනි. තුන් සහ කායින් රාජධානිය පමණක් එයින් වෙන්ව හුදෙකලාව පිහිටියේ ය.

මේ සියලු රාජධානින්හි ඉතා උසස් වර්ගයේ අශ්වයන් දක්නට ලැබේ. වෙළෙඳම සඳහා මේ සතුන් ඉන්දියාවට යැවේ. ඉහළ මිළ ගණන් වලට මේ සතුන් අලෙවි කරනුයේ උසස් ජව බලයෙන් යුක්ත බැවිනි. මේ සතෙකුගේ වටිනාකම පවුම් දෙසීයක් පමණ වේ. ලෝකයේ අනෙක් රටවල ද මෙහි අශ්වයන් සඳහා සැහෙන ඉල්ලුමක් තිබේ. හොඳම අශ්වයකු රිදී මාර්ක් තිහකට පමණ අලෙවි කැරේ. මේ අශ්වයන් මිල අධික වනුයේ ඔවුන්ගේ විශේෂ ලක්ෂණ නිසා ය. ස්වල්ප ආහාරයකින් මේ සතුන් යැපේ. එහෙත් විශාල බරක් ගෙනයා හැකි ය. එක් දිනක දී බොහෝ දුරක් ගමන් කරයි. සෙසු අශ්වයන් හා කොටළුවනට වඩා ශක්තිමත් ය. මෙහි වෙළෙඳුන්ට එක් ප්‍රදේශයක සිට තවත් පළාතකට යෑමේ දී වියළි, දුෂ්කර, වැලි සහිත පිදුරු හෝ තණකොළ ද, පිරිසිදු ජලය ද නොමැති මාර්ගයන් සඳහා මේ අශ්වයින් බෙහෙවින් යෝග්‍ය ය. එහෙයින් මේ අශ්වයින් ඉහළ මිලකට අලෙවි කළ හැකි ය. දුෂ්කර මාර්ගයන්හි පිම්මේ ගමන් කළ හැකි බැවින් සංචාරක වෙළෙඳුන් තෝරාගන්නේ මේ අශ්වයන් ය. ඔවුන් බඩු බාහිරාදිය ඔබ මොබ ගෙන යෑම සඳහා ඔටුවන් ද යොදා ගැනේ. ඔවුන් නඩත්තු කිරීම ලාභදායක බැවිනි. මා ඉහතදී සඳහන් කළ අශ්වයන් කායිස් හා හෝර්මුස් යන නගර අතර ගමනාගමනය සඳහා යොදාගනු ලැබේ. ඉන්දියන් සාගරය අසල වෙරළ තීරය ඔස්සේ ගමනාගමනය සඳහා ය. වෙරළබඩ ප්‍රදේශයෙන්හි දී මේ අශ්වයන් ඉහළ මිලකට විකුණනු ලැබේ. ඉන්දියාව අශ්වයනට ජීවත් වීමට හෝ බෝවීමට හෝ සුදුසු ප්‍රදේශයක් නොවේ. උෂ්ණත්වය අධික බැවිනි. එහි දී මේ සතුන්ගේ ගතිගුණ

Scanned by CamScanner

වෙනස් වේ. කුලප්පු වේ. තුවාල වණ ආදිය ඇති වේ. ගාත්‍රා ආබාධ සහිත වුවහොත් මේ සතුන්ගේ අගයක් නොමැත.

මේ නගර රාජධානින්හි වෙසෙන ජනයාගෙන් වැඩි දෙනා ප්‍රචණ්ඩ ය. ලේ පවසින් යුක්ත ය. ඔව්හු එකිනෙකා මරා ගනිති. රජයට පක්ෂපාතී නීති ගරුක බවක් නැත. ටාටර්හි අධිපති ලෙවන්ට් ගණනකට නොගැනේ. මේ දාමරිකයන්ගෙන් බලවත් අතවර කරදර සිදුවනුයේ සංචාරක වෙළෙඳුන්ට ය. රජය මෙවැනි අපරාධ කරනවුන් හට දඬුවම් දැඩි නියම කැර ඇත. වෙළෙඳුන්ගේ ඉල්ලීම පරිදි ගම්වැසියන් විසින් ඔවුනට ආරක්ෂාව සපයනු ලැබේ. මේ සඳහා ගෙන යන බඩු ප්‍රමාණය අනුව ගාස්තුවක් ගෙවනු ඇත. මේ මුදල් ගෙවන්නේ ගමනේ දුර ප්‍රමාණයත් බඩු ගෙන යන සතුන්ගේ සංඛ්‍යාවත් අනුව රිදී කාසි වලිනි. ග්‍රෝට්ස් නමින් හැඳින්වෙන රිදී කාසි දෙකක් හෝ තුනක් බඩු පැටවූ එක් එක් සතකු වෙනුවෙන් මේ මුර කාරයන්ට ගෙවිය යුතු වේ. සංචාරක වෙළෙඳුන්ගේ ආරක්ෂාවට කළ හැකි සියල්ල රජය මගින් සිදු කැරේ. එහෙත් එපමණකින් මේ මංකොල්ල කරුවන් මැඩ පැවැත්විය නොහේ. වෙළෙඳුන් ද ගමන් කරන්නේ දුනු ඊතල ආදි ආයුධ සන්නද්ධව ය. ඔව්හු ද මංකොල්ලකරුවන් නසා වනසා දමති. එසේ වුව ද ඔවුන් දෙපිරිස ම අදහන්නේ මහමත් තුමන්ගේ ධර්මයයි.

මේ නගරවරයන්හි වෙළෙඳුන් ද, කර්මාන්ත කරුවන් ද බහුල ය. ඔව්හු සවර්ණමය රෙදිපිළි හා විවිධ ගණයේ සේද රෙදි නිෂ්පාදනය කරති. මෙහි ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි කපු වගාව ද පවතී. තිරිඟු, බාර්ලි, මෙනේරි ඇතුළු ධාන්‍ය වර්ග සුලභ ය. සියලු පලතුරු වර්ග ද හිඟ නොවේ. මේ පලතුරුවලින් වයින් නිෂ්පාදනය කැරේ. සැරසින් වරුනට වයින් පානය තහනම් යයි සමහරු විරුද්ධ මතයක් ප්‍රකාශ කරති. ඔවුන්ගේ ධර්මය අනුව එය සාවද්‍ය ක්‍රියාවකි. වයින් පෙරීමේ දී කොටසක් මිහිරි පානයක් ලෙස ලබාගත හැකි ය. එය පානය කිරීම වරදක් නොවේ. ධර්මයට පටහැනි නැත. එයට මත්පැන් (වයින්) නම භාවිත නොකැරේ. රසය අනුව එයට භාවිතා කැරෙන නාමය ද වෙනස් වේ. පෙරීමේ දී අදියරෙන් අදියරට ඇතිවන නිෂ්පාදන වෙනස්කම් අනුව ය.

පර්සියාවේ යස්ඩ් නමැති දර්ශනීය නගරයක් තිබේ. එය වාණිජ මධ්‍යස්ථානයකි. මෙහි පට රෙදි නිෂ්පාදනය කැරේ. විශාල

Scanned by CamScanner

නිෂ්පාදනයක් වන මේ පටරෙදි බහුල වශයෙන් අලෙවියට යෙදේ. එය ඉතා ලාභදායක වෙළෙඳ ව්‍යාපාරයෙකි. මෙහි වැසියෝ මහමදිකයෝ ය.

මෙතැනින් නික්ම සත් දිනක් මුළුල්ලේ ගමනෙහි යෙදුණු අතර ජනාවාස තුනක් පමණි හමුවූයේ. නවාතැන් ගත හැකි වූයේ තුන් පළක පමණි. මග දෙපස දක්නට ලැබුණේ සරු සාරෙට වැඩුණු රටඉඳි වගාවකි. මේ පෙදෙසෙහි ගමන සිතට ප්‍රියජනක විය. ඉන් ඔබ්බෙහි වනාන්තරයයි. එහි ඇටිකුකුළන් වැනි පක්ෂි (චකෝර) වර්ගයක් ද, වටුවන් ද දක්නට ලැබුණේ ය. මේ ප්‍රදේශයේ ගමන සංචාරක වෙළෙඳුන්ට මහත් ප්‍රසාද ජනක ය. මෙහි ඉතා හොඳ වල් බූරුවන් ද දක්නට ලැබේ. සත් දිනක ගමනින් පසු ළඟා වූයේ කෙර්මන් නමැති රාජධානියට ය.

කෙර්මන් රාජධානිය පිහිටා ඇත්තේ පර්සියාවේ කෙළවරෙහිම ය. එය පාලනය කෙළේ පරම්පරානුයාත අධිපතියෙකි. ටාටර් වරු එහි පාලන බලය අල්ලා ගත්හ. එයින් පසු පාරම්පරික අධිපතිභාවය අහෝසි විය. එහෙත් ටාටර් අධිපතියා පැරණි පාලකයාට තමන් රිසි පරිදි විසීමට වරම් දුන්නේ ය. මෙහි නීල වර්ණ පාෂාණ විශේෂයක් බහුල වශයෙන් හමුවේ. කඳුකර ප්‍රදේශයන්හි ය. කඳු පර්වත හාරා මේ පාෂාණ වර්ගය සොයාගනු ලැබේ. මේ පාෂාණ වර්ගය උණුකර වානේ සහ තවත් ලෝහයක් මහා පරිමාණයෙන් නිෂ්පාදනය කැරේ. මේ ලෝහ වර්ගවලින් දේශීය අවශ්‍යතාවනට අදාළ ආයුධ තනනු ලැබේ. කටකලියා, තෝන් ලනු, කඩුදුනු, අශ්වාරෝහකයන්ගේ සපත්තු අඩියේ සන් කටු, හී කොපු (හියොවුරු) සහ අශ්වාරෝහක භටයන්ට අවශ්‍ය සියලු ආයුධ ද උපකරණ ද සාදනු ලැබේ. කුල කාන්තාවනට හා ඔවුනගේ දූවරුනට සතා සතුන් පක්ෂීන් මල් හා අනෙක් විසිතුරු ගෙත්තම් කිරීමට අවශ්‍ය ගෙතුම් කටු හා ඉඳිකටු සාදන්නේ ද මේ ලෝහයෙනි. විවිධ වර්ණ සේද රෙදිවැල විචිත්‍රාකාරයෙන් මේ වැනි මැහුම් ගෙතුම් කැරේ. ධනවත් වංශවතුන්ගේ නිවාසවල දක්නට ලැබෙන මෙබඳු විසිතුරු දොර ජනෙල් තිර කොට්ට මෙට්ට ඇතිරිලි චිත්තාකර්ෂණීය ය.

මෙහි කඳුකරයේ විශාල උකුස්සන් කුරුළුගොයින් දක්නට හැකි ය. මොව්හු අධික වේගයෙන් පියාසර කරති. මේ පක්ෂීන්ගේ ළපැත්ත ද පෙඳයේ යට පැත්ත ද පාදයන්හි උඩු කොටස ද රත් පැහැති ය.

Scanned by CamScanner

මිනිය නොහැකි තරම් වේගයෙන් පියාසර කරන උකුස්සන්ගෙන් අනෙක් කිසිදු පක්ෂියකුට දිවි ගලවා ගත නොහේ.

කෙර්මන් රාජධානියෙන් නික්ම සත් දිනක් ගමන් ගත්තේ සානුවක් ඔස්සේ ය. බොහෝ නගර ද, ගම්මාන ද, ජනාවාස ද අතරමගදී පසු කරමිනි. අශ්වයකු පිටින් එහි ගමන් කිරීම ආස්වාද ජනක ය. ඇටිකුකුළන් (චකෝර) ආදී පක්ෂි වර්ග එහි බහුල වශයෙන් කෙළි දෙළෙන් හැසිරෙනු පෙනේ. ඉක්බිති සංචාරකයා ළඟාවූයේ මහා උත්සංගයකට ය. එනම් බෑවුමකට ය. ඊළඟ ප්‍රදේශයට ළඟා වූයේ දින දෙකක් මේ බෑවුමේ පහළට ගමන් කිරීමෙනි. එහි දෙපස විවිධ වර්ගයේ පලතුරු දක්නට ලැබිණි. මෙ ගේ දොර බහුල වූ ප්‍රදේශයක්ව පැවැති නමුදු දැනට ඒ කිසිවක් දක්නට නොලැබේ. එහෙත් නෝමැඩ්වරු සිය ගවරංචු සමග මෙහි හැසිරෙති. කෙර්මන් නගරයත් මේ මහා බෑවුමත් අතර ප්‍රදේශය අතිශයින් ශීතාධික ය. සීත ඍතුවෙහි මෙනි. කොපමණ ශීතාවරණ ඇඳුම් පැළඳුම් භාවිතා කළ ද ප්‍රයෝජනයක් නොමැති තරම් ය.

කෙර්මන් රාජධානිය සම්බන්ධ එක්තරා අත්හදා බැලීමක් ගැන ඔබට කියමි. මේ රටේ මිනිසුන් යහපත් නිහතමානී සාමකාමී පරහිතකාමී සාමදානශීලී පුද්ගලයන් බවට පත් කිරීමට මෙහි රජතුමා විසින් යොදාගත් එක්තරා . ක්‍රියා මාර්ගයක් විය. එනම් : දිනක් රජතුමා සියලු පැවිද්දන් තමන් වෙත කැඳවීය. මගේ සිතෙහි එක්තරා ගැටලුවක් ඇත. එය මට විසඳගත නොහේ. අපගේ පර්සියාවෙහි අසල්වැසි රාජ්‍යයන්හි ජනයා නීතිගරුක නොවේ. එකිනෙකා ඇනකොටා ගනිති. කලකෝලාහල කරති. මරා ගනිති. නොයෙක් ප්‍රචණ්ඩකාරී සිදුවීම් පවතී. මෙයට හේතුව කුමක් ද? රජතුමා ප්‍රශ්න කෙළේ ය.

"භූමියෙහි පසෙහි වරද!" යයි පැවිදි පඬිවරු පිළිතුරු දුන් හ. එවිට රජතුමා මෙහි ඉහත සඳහන කළ ඉස්පාහාන් රාජධානිය වෙත පැවිදි පිරිසක් යවා එහි සාහසික අපරාධ කැරෙන ප්‍රදේශ පිරික්සන ලෙස කීය. ඉන්පසු නැව් හතක් පුරා එම ප්‍රදේශයෙන් පස් ගෙනවුත් කෙර්මන් රාජධානියෙහි එක්තරා ස්ථානයක අතුරා පිටියක් සේ සකස් කර ඒ පිටිය ඇතිරිලිවලින් වැසී ය. කිසිවකුටත් ඒ පස් නොපාගන සේ අණ කෙළේ ය. ඉක්බිති රජතුමා අමුත්තන් කැඳවා මේ පිටිය මත භෝජන සංග්‍රහයක් පැවැත්විය. භෝජන

Scanned by CamScanner

භුක්ති විඳි පිරිස මඳ වේලාවකින් කෝපාවිෂ්ටව පරුෂ වචන කියමින් එකිනෙකා ලුහුබඳිමින් ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන්නට වූහ.

මේ ප්‍රචණ්ඩත්වය බිහිවන්නේ පසේ පොළොවේ වැරැද්ද නිසා බව රජතුමා යථෝක්ත පරීක්ෂණයෙන් අවබෝධ කැර ගත්තේ ය.

දෙදිනක් මුළුල්ලේ ප්‍රපාතය පසුකොට ගමන් කළ ඉක්බිති ළඟාවූයේ විශාල නිම්නයකට ය. එය අද්දර "කමදින්" නගරය පිහිටියේ ය. එක් අවධියෙක මෙය යෝධ නගරයකි. අතිශය දර්ශනීය ලෙස පැවතිණ. අද එය අන්ධකාර ය. පරිහානියට පත්ව ගොසිනි. ටාටර්වරුන් කිහිප වරක් ආක්‍රමණය කිරීමෙනි. මේ නගරය පිහිටි නිම්න භූමි ප්‍රදේශය අතිශයින් උෂ්ණාධික ය.

මීළඟට මා ඔබට විස්තර කියන්නේ රුද්බාර් ප්‍රදේශය පිළිබඳව ය. එහි තිරිඟු සහ අනෙකුත් ධාන්‍ය වර්ග වගා කැරේ. රටඉඳි, ඇපල් සහ තවත් කොළ පැහැති පලතුරු වර්ගයක් බහුලව දක්නට ලැබේ. අපගේ ශීත දේශගුණයෙහි වැවෙන පලතුරු එහි දක්නට නැත. කොබෙයියන් අතිවිශාල සංඛ්‍යාවක් මෙහි හැසිරේ. එහෙත් සැරසින්වරු මේ පක්ෂීන්ගේ මස් නොකති. පිළිකුල නිසා ය. මෙහි වලිකුකුළන්ට සමාන පක්ෂි වර්ගයක් ද සිටිති. මේ වලිකුකුළු වර්ගයට ම අයත් තවත් පක්ෂි වර්ගයක් ද එහි දක්නට ලැබෙයි. අනෙක් රටවල වලිකුකුළන්ට වඩා මේ පක්ෂීන් වෙනස් ය. කළු - සුදු වර්ණ සංකලනයෙන් යුක්ත ය. පාද සහ හොට රතු ය. මෙහි සිවුපා සතුන් ද අනෙක් ප්‍රදේශවල හමුවන සතුනට වඩා වෙනස් ය. හිම මෙන් සුදු ගවයන්ගේ ශරීර විශාල ය. ලොම් සිනිඳු ය. කෙටි ය. අධික උෂ්ණය නිසා ය. අං විශාල ය. මොට ය. උල් වී නැත. පොල්ගෙඩි තරම් විශාල මොල්ලියක් සහිත ය. මෙය ලෝකයේ ඉතාමත් සිත්ගන්නා ලක්ෂණයකි මේ ගොනුන්ගේ පිටෙහි බර පැටවීමේ දී ඔටුවන් මෙන් බිම දිගාවෙති. බර පැටවූ පසු නැගිට ඉතා හොඳින් බඩු ගෙන යති. මනා ශරීර ශක්තියෙන් පිරිපුන් බැවිනි. බූරුවන් තරම් විශාල බැටලුවෝ ද මෙහි සිටිති. ඔවුන්ගේ වල්ගා ඝන ලොමින් පිරී පවතී. රාත්තල් තිහක් පමණ බරින් යුතු වේ. ඉතා පුෂ්ටිමත් මේ සතුන් හොඳ ආහාරයකි.

මේ නිම්නයෙහි බොහෝ නගර ද, ගම්මාන ද ඇත. එහි ගොඩනැගිලි තනා ඇත්තේ මැටි බදාමයෙනි. සෑහෙන තරම් උස් මේ ගොඩනැගිලි බිත්ති සෑහෙන තරම් ඝනකම් ය. කරවුනා නමැති

Scanned by CamScanner

මොංගුල් ආක්‍රමණිකයන්ගෙන් ආරක්ෂා වීම සඳහා මේ අයුරින් ඉදිකැර තිබේ. ඔවුන් කොල්ලකාර කණ්ඩායමකි. ඔවුහු ඉන්දියානු මව්වරුන්ගේ හා ටාටර් පියවරුන්ගේ දරුවෝ ය. මොව්හු වටලා කොල්ලකෑමෙහි යෙදෙති. මේ සඳහා ඉතා දුෂ්ට ක්‍රියාමාර්ගයක් අනුගමනය කරති. මෙය ඉන්ද්‍රජාලයක් බඳු ය. ඇඳිරි වැටුණු පසු ඔවුන් ළඟටම එනතුරු කිසිවකුටත් දැක හඳුනා ගත නොහේ. ඇඳිරි වැටුණු පසු දින හතක ගමනින් පසු ඔව්හු හාත්පස විසිරෙති. ප්‍රදේශය ගැන ඔවුනට පැහැදිලි අවබෝධයක් ඇත. අන්ධකාරයේ ඔව්හු හාත්පසින් පැමිණ වටලති. සමහර විට පිරිස දස දහසක් පමණ වේ. සමහර විට එයට වඩා අඩුවෙයි. නැතහොත් වැඩි වෙයි. තමන් මංකොල්ල කෑමට අදහස් කරන තැන මෙසේ පැමිණ වටලා ගනිති. එළිමහනේ මිනිසකු සතකු බඩුබාහිරාදියක් නොමැති නම් පමණක් ඔවුන්ගෙන් බේරීමට හැකි ය. ඔවුන් යමක් හෝ යමකු පැහැරගත්තේ නම් වන්දියක් ගෙවා මුදා ගත හැකි නොවේ. මහලු අය අසුවුවහොත් මරා දමති. තරුණයන් අල්ලා ගත් විට දාසයන් හෝ වහලුන් හෝ වශයෙන් විකුණති. මොවුන්ගේ රජු නිගුදර් නම් වේ. මේ නිගුදර් රජු චඝාතායි රජ වාසලට ගියේ ය. ශ්‍රේෂ්ඨ ඛාන් වරයාගේ සහෝදරයා වෙතට ය. දස දහසක සේනාවක් සමග ගොස් එහි රැඳී සිටියේ ය. චඝතායි ඔහුගේ මාමා කෙනෙකු බැවිනි. චඝතායි මහා බලසම්පන්නයෙකි. මෙසේ චඝතායි සමීපයෙහි රැඳී සිටියදී නිගුදර් ඉතා නිහීන තුච්ඡ ක්‍රියා මාර්ගයක් සැලසුම් කෙළේ ය. දස දහසක පිරිවර සමග මිනිසුන් ගෙළ කපා මරා දමමින් මංකොල්ල කමින් ආර්මේනියාවෙන් නික්ම මාමණ්ඩියගෙන් ද ඉවත් වී බදකෂාන් ප්‍රදේශයට ගියේ ය. එතැනින් පෂායි නමැති ප්‍රදේශයට ළඟාවිණ. ඉක්බිති ඔහු පිරිවර සමග ගියේ කාශ්මීරයට ය. මේ ගමනේ දී ඔහුගේ පිරිවරින් සෑහෙන පිරිසක් ද අශ්වයන් ද විනාශ විය. ඉතා පටු දුෂ්කර මාර්ගයක ගමන් ගැනීම නිසා ය. ඉන්දියාවේ දිලිවාර් නමැති ස්ථානයට ළඟාවීමට ඔහුට හැකිවිය. (දිලිවාර් යනු ලාහෝර් යයි සිතිය හැකි ය.) එහි දී ඔහු අගනා නගරයක් අල්ලා ගති. එහි පාලකයා වූ අසිදින් සුල්තාන් නමැති ධනවත් රජු පලවා හැරියේ ය. තවමත් සගයන් සමග ඔහු එහි රැඳී සිටී. කිසිවකුගේ බසකට ඇහුම්කන් නොදෙමිනි. තම රාජධානිය හාත්පස වසන්නා වූ අනෙකුත් ටාටර්වරුන්ට එරෙහිව ඔහු යුද්ධ ප්‍රකාශ කෙළේ ය. ඉක්බිති දින තිහක් හතළිහක් පමණ මං කොල්ල

Scanned by CamScanner

කමින් ආක්‍රමණය කරමින් ඉදිරියට ගමන් ගති. ඔහු ගමන් ගත්තේ රුද්බාර් දෙසට ය. මෙය ශීත කාලයයි. හෝර්මුස් හි වෙළෙඳමට පැමිණි වෙළෙන්දෝ ඉන්දියාවෙන් වෙළෙඳුන් පැමිණෙන තුරු බලා සිටියහ. ගමන් වෙහෙසින් විඩා වූ දුබල වූ කෘශ වූ අශ්වයන් රුද්බාර් තැනිතලාවෙහි අලුත් තණ උලා කෑමට දිගෙලි කළහ. මේ දෙස කරවුනා දාමරිකයෝ බලා සිටියෝ ය. උන් අල්ලා ගැනීම සඳහා ය.

මෙහි දී මාර්කෝ පෝලෝ ද අල්ලා ගැන්මට අන්ධකාරයේ දී මේ සොරමුල උත්සාහ දැරූ නමුදු එය සාර්ථක වූයේ නැත. ඔහු අනූ නවයෙන් දිවි ගලවාගත්තේ ය. කමාසාල් නමැති නගරයට පළායෑමෙන් දිවි ගලවා ගත හැකි විණ. එහෙත් ඔහුගේ සහචරයන් බොහෝ දෙනෙකුන් මං පහරන්නන්ගේ ග්‍රහණයට හසු විය. සමහරුන් විකිණූහ. ඇතැමුන් මරා දැමූහ.

මා ඉහත සඳහන් කළ තැනිතලා භූමිය පසුකැර යෑමට දින දෙකක් ගත වේ. එහි දකුණු කෙළවර දරුණු බෑවුම් සහිත ය. මේ බෑවුම කෙළින්ම සැතපුම් විස්සක් දුරට විහිදේ. එය දුෂ්කර භයානක අනතුරුදායක මාවතකි. හාත්පස සොරු ගැවසෙති. සංචාරකයා මේ ප්‍රාන්ත දුෂ්කර මාර්ගය පසු කිරීමෙන් පසු යළිත් පිවිසියේ සුන්දර නිම්න භූමියකට ය. හෝර්මුස් නමින් මේ නිම්නය හැඳින්වේ. එහි ළඟාවීමට ඔහුට දෙදිනක් ගතවිණි. එහි පිරිසිදු ජලය සහිත ගංගා ද, රටඉඳි වගාවක් ද දක්නට ලැබුණි. වලිකුකුළන් වැනි පක්ෂීන් ද, ගිරවුන් ද අපට නුපුරුදු පක්ෂීන් ද එහි විය. එතැන් සිට දෙදිනක් ගමන් කොට හෙතෙම මුහුදුබඩට පැමිණියේ ය. මුහුදුබඩ හෝර්මුස් නමැති නගරයක් තිබිණි. අනර්ඝ වරායක් ද එහි විය. ඉන්දියාවේ සිට නැව් මගින් වෙළෙන්දෝ මෙහි ළඟා වෙති. ඔව්හු විවිධ කුළුබඩු වර්ග ද, මැණික් ද, මුතු ද විවිධ වර්ගයේ පට රෙදි ද, රත්රන් හා ඇත්දත් ද රැගෙන එති. ඒ හැරුණු විට තවත් බොහෝ වෙළෙඳ භාණ්ඩ ද රැගෙන එති. ලෝකයේ නන් දෙසින් පැමිණෙන ගැනුම් කරුවනට මෙහි දී මේ වෙළෙඳ බඩු විකුණනු ලැබේ. මෙය ප්‍රධානතම වෙළෙඳ මධ්‍යස්ථානයකි. බොහෝ නගර හා පුරවර එයට සම්බන්ධ ය. රාජධානියේ අගනුවර ද මෙය වේ. එහි රජු රූඑමෙදාන් අහ්මඩ් ය. දේශගුණය උෂ්ණාධික ය. සෞඛ්‍යයට හිතකර නොවේ. සූර්යතාපය තදින් පවත්නා බැවිනි. මෙහි දී වෙළෙන්දකු මියගිය හොත් රජු ඔහුගේ බඩුබාහිරාදිය රාජ සන්තක කරයි.

Scanned by CamScanner

මේ ප්‍රදේශයෙහි රට ඉඳිවලින් වයින් නිෂ්පාදනය කැරේ. අනෙකුත් නිෂ්පාදනයනට අමතරව ය. එය අනර්ඝ පානයකි. එහෙත් වැඩි දෙනා එය බීමට නොපෙළඹේ. බඩ විරේක වන බැවිනි. එහෙත් පසුව සුවපහසුවක් දැනේ. ස්වදේශිකයනට අපගේ ආහාර නුපුරුදු ය. මස් හා පාන් කෑමෙන් ඔව්හු රෝගී වෙති. රටඉඳි, කරවල, තලපත් මාළු, රතුලූනු යනාදිය ඔවුන්ගේ ආහාරයට ඇතුළත් ය.

ඔවුන්ගේ නැව් අයහපත් තත්ත්වයක පවතී. නැව් සෑදීමේ දී ඔවුන් යකඩ ඇණ භාවිතා කරන්නේ නැත. ඒ වෙනුවට කොහු ලනුවලින් බඳිති. අශ්ව කෙඳිවලින් සෑදූ නූල්වලින් නැව් බඳෙහි අවශ්‍ය ස්ථාන රටාවකට අනුව මසනු ලැබේ. අශ්ව කෙඳි කරදියට දිරාපත්වන්නේ නැත. සෑහෙන කලක් හොඳ තත්ත්වයෙන් පවතී. ඔවුන්ගේ නැව්වල ඇත්තේ එක් කුඹ ගසකි. එක් රුවලකි. එක් සුක්කානමකි. තට්ටු කිහිපයක් නැත. නැවට බඩු පැටවූ පසු ඒවා සම් ඇතිරිලිවලින් වසනු ලැබේ. ඉන්පසු මේ බඩු බාහිරාදිය මත අශ්වයන් පැටවීම සාමාන්‍ය සිරිතයි. මේ අශ්වයන් ඉන්දියාවට ගෙනයන්නේ විකිණීම සඳහා ය. ඔවුනට යකඩ ඇණ නොමැති නිසා ඒ වෙනුවට ගසන්නේ ලී කූඤ්ඤ ය. මේ හේතුවෙන් ඔවුන්ගේ නැව් ශක්තිමත් නොවේ. එහෙයින් මුහුද මැද දී බොහෝ විට මෙබඳු නැව් මුහුදුබත් වේ. ඉන්දියන් සාගරය දරුණු ප්‍රචණ්ඩ කුණාටු සහගත බැවිනි.

මෙහි ජනයා කාළවර්ණ ය. මහමත් තුමාගේ ආගම අදහති. උෂ්ණ කාලයෙහි ඔවුන් නගරයෙහි රැඳී සිටින්නේ නැත. ඔවුහු ගම් බිම් කරා යති. එහි ගංගා වැව් පොකුණු තිබේ. ඒ අසල දැව දඬු කෝටු ආදියෙන් ලතා මණ්ඩප තනා ගනු ලැබේ. ජලාශ මැද කණු සිටුවා ඒ මත ද මැහි තනා හාත්පසින් ආවරණය කොට කොළ අතු ගවසා එහි රැඳී සිටිත්. එසේ වුව ද අධික සූර්‍ය තාපයෙන් උෂ්ණයෙන් ආරක්ෂා විය නොහේ.

එයටත් වඩා ඔබට කිවයුතු තවත් කරුණක් ඇත. එනම් නිස්සාර වැලිතලා හරහා හමා එන අධික උෂ්ණය සහිත සුළඟ ගැන ය. දිනකට කිහිප වරක් මේ අධික උෂ්ණය සහිත සුළඟ හමා එයි. සමස්ත නිම්නය සිසාරා හමා එන උෂ්ණාධික සුළඟින් කිසි ලෙසකිනුදු ආරක්ෂා විය නොහේ. මාරාන්තික මේ උෂ්ණාධික සුළඟ හමා එන බව දැනගත් වහාම ජනී ජනයා කරවටක් දියේ

Scanned by CamScanner

ගිලෙති. මේ උෂ්ණාධික සුළඟෙහි මාරාන්තික දරුණු බව කොතරම් දැයි කීමට මාර්කෝ පෝලෝ එහි සිටිය දී වූ සිද්ධියක් මෙසේ ය. හෝර්මුස් හි රජුගෙන් කෙර්මනයේ රජුට ලැබිය යුතු ආදායම් නොලැබෙනසේ එය අවහිර කරමින් හෝර්මුස් හි ජනයා නගරයෙන් පිටත රැඳී සිටින බවට ආරංචියක් ලැබුණි. එය සැලවීම නිසා අශ්වාරෝහක භටයන් එක්දහස් හයසියයක් ද, පාබල සේනාවෙන් පන්දහසක් ද රුද්බාර් නිම්නය ඔස්සේ එහි පිටත් කර යැවී ය. හදිසි ප්‍රහාරයක් එල්ල කිරීමේ අදහසිනි. සාවද්‍ය මඟ පෙන්වීම් නිසා ඔවුනට එක් දිනකින් ගමන සමාප්ත කොට අපේක්ෂිත ස්ථානයට ළඟාවීමට හැකි වූයේ නැත. හොර්මුස් නගරයට නුදුරු එක්තරා වනාන්තරයක ඔව්හු රාත්‍රියේ ලැගුම් ගත්හ. පසුදින ඔව්හු ගමන් ඇරඹූවෝ ය. එකෙණෙහිම ගිනියම් සුළඟ හමා ආවේ ය. සියලු දෙනාම හුස්ම හිරවී මරණයට පත් වූහ. එක් මිනිසකු හෝ ඉතිරි නොවී ය. රජතුමා වෙත මේ ආරංචිය රැගෙන ඒමට හෝ කිසිවකු නොවිණි. කෙසේ නමුදු මේ පුවත සැළවී මළ සිරුරු වළලා දැමීම සඳහා හෝර්මුස් හි සිට පිරිසක් පිටත්ව ගියහ. තමන්ට ගිනි සුළඟින් අනතුරක් නොවේ යයි සිතමිනි. මළසිරුරු සොහොනට රැගෙන අතර යළිත් ගිනියම් සුළඟ හැමීම නිසා ඔවුන්ගේ අත් සිරුරින් ගැලවී ගියේ ය. එහෙයින් මළ සිරුරු වළලා දැමීමට අවස්ථාවක් ලැබුණේ නැත.

මේ ප්‍රදේශයේ ගොවියන් තිරිඟු සහ බාර්ලි වපුරන්නේ නොවැම්බර් මාසයේ ය. මාර්තු මාසය අවසන් වීමට පෙර අස්වනු නෙළා ගනු ලැබේ. පලතුරු නෙළා ගන්නේ ද මේ මාර්තු මාසයේ දී ය. පලතුරු පැසී ඉදෙන්නේ ද මේ කාලයේ ය. මේ කාලයෙන් පසු රට ඉඳි හැරෙන්නට අනෙක් කිසිදු බෝග වර්ගයක් දක්නට නොමැති තරම් ය. මැයි මාසයේ දී රට ඉඳි ද වරයි. සියලු ගඩාගෙඩි බෝගවර්ග හීන වන්නේ අධික සූර්ය තාපය ද, උෂ්ණත්වය ද හේතුවෙනි.

මෙහි නැව්වල තවත් විශේෂත්වයක් නම් සිදුරු වැසීම සඳහා කීල (තාර වැනි ද්‍රව්‍යයක්) භාවිතා නොකිරීමයි. ඒ වෙනුවට යොදාගන්නේ කිසියම් මත්ස්‍ය විශේෂයකින් ලබාගන්නා තෙල් වර්ගයකි.

ස්ත්‍රියක හෝ පුරුෂයකු මිය ගිය කල්හි ශෝකාලාප කියමින්

Scanned by CamScanner

හඬ නගමින් වැළපීම මේ ප්‍රදේශයේ දක්නට ලැබෙන තවත් විශේෂ කරුණකි. මරණයකින් පසු වංශවත් කාන්තාවෝ අවුරුදු හතරක් මුළුමනින් ම ගතවන තුරු මෙසේ වැළපෙති. අඩු තරමින් දිනකට එක් වරක් හෝ මහ හඬින් හඬා වටෙන්නාහ. මේ විලාපයට හැඬීමට නෑසියෝ ද, අසල්වැසියෝ ද දායක වෙති. කුලියට හඬන කාන්තාවන් ද මෙහි දක්නට ලැබේ. මියගිය ස්ත්‍රියගේ හෝ පුරුෂයාගේ නෑසියන් මෙවැනි පළපුරුදු කාන්තාවන් ගාස්තුව ගෙවා හැඬීමෙහි විලාප කීමෙහි යෙදවීම ද මෙහි පවත්නා සිරිතකි.

මේ නගරය පිළිබඳ තොරතුරු සෑහෙන ප්‍රමාණයක් විස්තර කළෙමි.

ඉන්දියාවේ තොරතුරු කීමට මෙය සුදුසු අවස්ථාව නොවේ. සුදුසු තැනදී අදාළ අවස්ථාවෙහි ඒ ගැන විස්තර කරන්නෙමි. දැන් මා හැරෙන්නේ උතුරු දිසාවට ය. එහි පිහිටි රටවල් හා ප්‍රදේශ ගැන තොරතුරු කීමට පටන් ගනිමි. කෙර්මන් නගරයෙන් අප පිටත් වූයේ වෙනත් මාර්ගයකිනි. මේ නගරය හරහා මිස එහි යෑමට වෙනත් මාර්ගයක් නැති බව මා ඉහතදී සඳහන් කැර ඇත. අප ගමන් අරඹන අවස්ථාව වන විට කෙර්මන් හි රජු වූයේ රුඑමෙඩන් අහ්මඩ් නමැති අධිපතියෙකි.

හෝර්මුස් හි සිට කෙර්මන් දක්වා වැටී ඇති මාර්ගයෙහි හාත්පස නිම්නයෙහි ආහාර ද්‍රව්‍ය සුලභ ය. වලිකුකුළන් සුලභ ය. ඉතා අඩු මිලට ගත හැකි ය. පලතුරු ගස් හා රට ඉඳි වගාව හාත්පස දක්නට ලැබේ. මෙහි තිරිඟු පිටිවලින් සාදන පාන් තිත්ත ය. මේ පාන් කෑමට හැක්කේ පුරුදු අයට පමණි. පාන් තිත්තවීමට හේතුව මෙහි ජලයෙහි බලපෑම ය. ජලස්නානය කිරීම සඳහා මෙහි උණුදිය උල්පත් තිබේ. උණුදිය උල්පත් ජලය රෝගාබාධ සුව කිරීමට හේතුකාරක වේ. විශේෂයෙන් චර්මරෝග සුවපත් වීමට මේ උණුදිය උල්පත් ජලයෙන් ස්නානය කිරීම කදිම ප්‍රතිකාරයකි.

මීළඟට විස්තර කැරෙන්නේ උතුරු දිසාවෙහි පිහිටි රටවල් පිළිබඳව ය. කෙර්මනයෙන් පිටත් වූ ඉක්බිති දින හතරක් එක දිගට ගමන් කරන්නට සිදුවූයේ දුෂ්කර ජනශූන්‍ය මාවතක ය. හාත්පස දක්නට ලැබුණේ වනාන්තරය යි. තුන් දිනක් මුළුල්ලේ ගමන් කළ ද ගලා බස්නා දිය පහරක් දක්නට ලැබුණේ නැත. මේ ප්‍රදේශයේ වතුර කිවුල් ය. තණ පිට්ටනියක මෙන් හරිත වර්ණ වූ ජලය

Scanned by CamScanner

පමණක් මෙහි තිබේ. අම්හිරි තිත්ත රසය බැවින් කිසිවකුටත් මේ ජලය පානය කළ නොහේ. එහි ජලය බින්දුවක් පානය කළ හොත් දස වරක් වමනය යයි. එයින් නිෂ්පාදනය වන ලුණුවල ස්වභාවය ද එසේම ය. මේ ලුණුවලින් කුඩා කැටයක් හෝ කෑවහොත් පාචනය සෑදේ. එබැවින් මේ ප්‍රදේශය ඔස්සේ ගමන් කරන ජනයා තමනට අවශ්‍ය පරිදි පානීය ජලය රැගෙන යති. අසීමිත පිපාසයෙන් පෙළෙන සිවුපාවෝ මේ අපවිත්‍ර ජලය පානය කරත් ඔවුනට දරුණු ලෙස පාචනය වැළඳී විනාශ වේ. දින තුනක් මුළුල්ලේ මේ ප්‍රදේශය ඔස්සේ ගමන් කළ ද ජනාවාසයක් දක්නට ලැබුණේ නැත. හාත්පස ප්‍රදේශය ජනශූන්‍ය වී පාලුවට ගොසිනි. එහි සතා සතුන් නොමැත. එයට හේතුව ආහාර පාන නොමැති වීම ය.

තවත් දින හතරක් මුළුල්ලේ ගමන් කෙළේ ද අම්හිරි ජලය සහිත සතා සතුන් නොමැති ගස් කොළන් දක්නට නොලැබෙන ප්‍රදේශයක් ඔස්සේ ය. එහි හමුවනුයේ බූරුවන් පමණි. කෙර්මන් රාජ්‍යයට අයත් මෙකී ප්‍රදේශය පසු කිරීමෙන් පසු ළඟා වූයේ කුහ් - බැනන් නමැති නගරයට ය. මෙය සුවිසල් නගරයකි. එහි ජනයා මහමදිකයෝ ය. යකඩ ද, වානේ ද බහුල ය. ඔව්හු විශාල වානේ කැඩපත් නිෂ්පාදනය කරති. ඒවා අනර්ඝ ය. ඔව්හු ඇස් පිරිසිදු කිරීමේ ඖෂධ වර්ගයක් ද සාදති. මැටි භාජන ද මේ ප්‍රදේශයේ නිෂ්පාදනය කැරේ. මේ භාජන ගින්නේ ලා පුළුස්සනු ලැබේ. මේ උදුන් ලෝහ මැස්සකින් සමන්විත ය. මෙහි ශේෂවන අළු ඖෂධයක් ලෙස භාවිතයට ගැනේ.

කුහ්-බැනන් නගරයෙන් නික්මුණු සංචාරකයා පුරා දින අටක් ගමන් ගත්තේ කාන්තාර ප්‍රදේශයක ය. ඉහත සඳහන් කළ ප්‍රදේශයට ද වඩා මේ ප්‍රදේශයෙහි ජලය ඉතා අපිරිසිදු ය. පානයට නොහොබී. ගස්කොළන් පලතුරු හෝ සතා සතුන් මේ ප්‍රදේශයෙහි දක්නට නොලැබේ. එබැවින් මගීනට අවශ්‍ය සියලු ආහාරපාන ගමනාන්තය දක්වා රැගෙන යා යුතු වේ. සත්ත්වයන්ට අවශ්‍ය ජලය හැරුණු විට අන් සියලු ආහාර පාන ද්‍රව්‍ය ගෙන යෑම අත්‍යවශ්‍ය ය. සිවුපාවුන් ද මේ ජලය අප්‍රිය කරති. එහෙයින් පිටි කවලම් කර බීමට සලස්වනු ලැබේ. එහි සිට දින අටක් ගමන් කිරීමෙන් පසු ළඟා වූයේ කුන් - කායින් නමැති ප්‍රදේශයට ය. එහි නගර සහ පුරවර බොහෝ ය. මෙය පිහිටියේ පර්සියාවේ උතුරු දේශ සීමාවෙහි ය. හාත්පස

Scanned by CamScanner

කාන්තාරයකි. මේ කාන්තාරය මැද එක් වෘක්ෂයක් පමණක් පිහිටා තිබේ. ක්‍රිස්තියානින් මෙය හඳුන්වනුයේ "වියළි ගස" නමිනි. දැන් ඒ ගස ගැන විස්තරයක් ඉදිරිපත් කරමි. මේ ගසෙහි කඳ විශාල ලෙස වැඩී තිබේ. එක් පැත්තක පත්‍ර හරිතවර්ණ ය. අනෙක් පැත්තෙහි පත්‍ර සුදු ය. මේ ගසෙහි දුඹුරු පැහැති විශාල ගෙඩි සෑදේ. මේ ගෙඩිවල ඇත්තේ ලෙල්ල පමණි. ඇතුළත මද නොමැත. ගසෙහි ලීය තද ය. කහ පාට ය. එහි සිට සැතපුම් සියයක දුරක් යන තුරු ගස්කොළන් නොමැත. මෙහි වැසියන් කියන්නේ ඇලෙක්සැන්ඩර් හා ඩේරියස් අතර යුද්ධය සිදුවූයේ මෙහි දී බව ය. මේ ප්‍රදේශයේ ගම්මාන ද නගර ද සකල සම්පත්තියෙන් ආඪ්‍ය ය. දේශගුණය සම ශීතෝෂ්ණ ය. මෙහි ජනතාව මහමද් ලබ්ධිකයෝ ය. මනා පෙනුමෙන් යුක්ත ය. කාන්තාවන් අතිශය රූප සම්පන්න ය.

මෙතැන් සිට ඉදිරියට ගමන් කළ විට හමුවූයේ මියුලෙහෙත් නමැති ප්‍රදේශයයි. මියුලෙහෙත් යන්නෙහි අරුත මිත්‍යාලබ්ධික යනුයි. සැරසින් වරුන්ගේ ධර්මය අනුව කඳුකරයේ ෂෙයික් නමැත්තෙක් විසී ය. දුරාතීතයෙහි ය. බොහෝ ජනයාගෙන් මාර්කෝ පෝලෝට අසන්නට ලැබුණු කථා ප්‍රවෘත්තිය දැන් ඔබට ඉදිරිපත් කරන්නෙමි.

ඔවුන්ගේ භාෂාවෙන් ෂෙයික් හැඳින්වූයේ අලව්දින් යනුවෙනි. ඔහු කඳුවැටි දෙක අතර නිම්නයෙහි දර්ශනීය උයනක් ඉදිකළේ ය. එහි ලෝකයේ ඇති තරම් පලතුරු වර්ග වගා කෙළේ ය. අතිශය දර්ශනීය මාලිගා ඉදි කෙළේ ය. මේ මාලිගා ස්වර්ණමය සැරසිල්ලෙන් අත්‍යලංකාර ලෙස නිර්මාණය කරන ලදී. මිහිමත දක්නට ලැබෙන සියලු සුන්දර චිත්තාකර්ෂණීය සම්පත් මේ උද්‍යානයෙහි නො අඩුව දක්නට ලැබිණ. එහි පීලි හතරකින් එකකින් වයින් ද, එකකින් කිරි ද, එකකින් මීපැණි ද, එකකින් ජලය ද යනාදි වශයෙන් ලැබේ. නාට්‍යාංගනාවෝ ලෝකයේ අති සුන්දර රැඟුම් ඉදිරිපත් කළහ. ගායනා කරති. ලෝකයේ අග්‍රගණ්‍ය ගැයුම්, වැයුම්, රැඟුම් එහි පැවතිණ. මේ මගින් සිය වැසියනට මෙය පාරාදීසය ලෙස වටහා ගැන්මට ඉඩ සැලසී ය. මහමද්තුමා සැරසින් වරුනට කියා ඇත්තේ පාරාදීසයට යන්නවුනට රූබර කාන්තාවන් ද, වයින් , කිරි පැණි, මිහිරි රසැති ජලය සහිත ගංගා ද හමුවන බව ය. මේ භූමි භාගය මෙලෙසින් නිර්මාණය කරන ලද්දේ

Scanned by CamScanner

යථෝක්ත හැඟීම් පදනම් කොට ගෙන ය. සැබැවින් ම මෙය පාරාදීසය වන්නේ යයි එරට සැරසින්වරු විශ්වාස කළහ. මිනී මැරීමට කැමැති අයට හැර අන් කිසිවකුටත් මේ භූමි භාගයට ඇතුළු විය නොහේ. මේ උද්‍යානයට ඇතුළු වන දොරටුවෙහි ඉතා ශක්තිමත් බලකොටුවක් ඇත. මෙයට බියපත් නොවන කිසිදු මනුෂ්‍යයකු ලෝකයේ නැති තරම් ය. එසේ ම බලකොටුව තුළින් හැර මේ උද්‍යානයට ඇතුළු වීමට වෙනත් මාර්ගයක් නොමැත. හවුරුදු දොළහේ සිට විස්ස දක්වා වයස් ප්‍රමාණයේ තරුණයන් ෂෙයික් විසින් මෙහි ආයුධ සන්නද්ධව සේවයේ යොදවන ලදී. මේ තරුණයන් මහමත්තුමා කියා ඇති පාරාදීසයේ ස්වභාවය කටකතා මගින් අසා තිබුණි. මේ උද්‍යානය දැක්මෙන් එය සත්‍ය බව ඔව්හු තේරුම් ගත්හ. වරකට තරුණයන් සිව්දෙනෙකු, දහදෙනකු, විසිදෙනකු හෝ තම අභිමතය පරිදි තෝරාගෙන ඔවුනට මත් බෙහෙතක් දෙනු ලැබේ. ඔවුන් නින්දට වැටුණු කල්හි යථෝක්ත උද්‍යානය තුළට ගෙන යති. පසුව නින්දෙන් අවදි වූ කල්හි ඔවුනට දක්නට ලැබෙන්නේ හාත්පසින් යට කී සුන්දර වස්තූන් ය. දර්ශනයන් ය. ඒ දර්ශනය නිසා සැබැවින්ම ඔවුන් සිටින්නේ පාරාදීසයකැයි යන හැඟීම ඇති වේ. ඔවුන් වටා නාට්‍යාංගනාවෝ රැඟුම් දක්වති. එමෙන් ම ඉහත සඳහන් කළ ආශ්චර්යජනක දර්ශන ඔවුනට දක්නට ලැබේ. ඔව්හු එහි දිගින් දිගට ම රැඳී සිටිති. ආස්වාදජනක ප්‍රබෝධයෙන් කුල්මත් වෙමිනි. මේ තරුණයන් හට අවශ්‍ය සියල්ල නොඅඩුව එහි දී ලැබේ.

ෂෙයික් මේ සුන්දර දර්ශනය සහිත කඳුකරයෙහි වාසය කෙළේ මහමත්තුමා ලෙසිනි. පෙදු ජනයා සැබෑ වූ මහමත්තුමා ඔහු යයි විශ්වාස කළහ. ඔහුට යම් කිසිවකු මැරවීමට අවශ්‍ය වූ විට මත්ද්‍රව්‍ය දී ඒ සඳහා යවන තැනැත්තා හැකිතාක් සනතර්පණය කරයි. ඔවුන් නින්දේ සිටිය දී ඒ ස්ථානය කරා ගෙන යයි. එකල්හි මෙම තරුණයෝ ඇස් හැර බලන විට ඔවුන් සිටින්නේ බලකොටුවක් තුළ බව වටහා ගනිති. මවිතයට පත්වෙති. මෙ අරුම පුදුම සතුට කුමක්දැයි වටහා ගැනීමට අපොහොසත් වන්නාහ. කිසිදා නොසිතූ නොපැතූ ලෙස පාරාදීසයකට පැමිණ ඇතැයි හඟිති. ආපසු නික්ම යෑමේ සිතක් ඇති නොවේ. ඉක්බිති ඔව්හු ෂෙයික් වෙතට යති. ඉක්බිති යටත් පහත්ව ගරු බුහුමන් දක්වති. ශ්‍රේෂ්ඨ වූ මහමත්තුමා ඔහු යය විශ්වාසය ඇති කැර ගනිති. ඔවුන් පැමිණියේ කොහි සිට දැයි ඔහු

Scanned by CamScanner

විමසයි. ස්වර්ගයේ සිට පැමිණියේ යයි පිළිතුරු දෙති. සිය මුතුන් මිත්තන් විසින් පවසන ලද ස්වර්ගය හා මහමත්තුමා මේ යයි ඔවුන්ගේ සිත්හි විශ්වාසය තහවුරු වේ. ඉන්පසු මේ කථාන්තරය ඔව්හු සෙසු ලෝකයාට ප්‍රකාශ කරති. ඒ අසා ස්වර්ගය කරා යෑමට ඔව්හු ද අභිලාෂයක් දක්වති. එහෙත් එසේ ගමන් ගන්නේ මරණයට ය. එහි ඇතුළුවන දවස ගැන ඔවුන් සිත සිතා සිටින්නේ ඉමහත් ආසාවකිනි.

ෂෙයික් හට යම් බලසම්පන්න අධිපතියකු මරා දැමීමට අවශ්‍ය වූ කල්හි ඉතා හොඳ ඝාතකයන් තෝරා ගනී. ඉන්පසු අසවල් අය අසවල් අය මරා දැමිය යුතු යයි නියෝග දී යවයි. ඔව්හු කිසිදු පැකිළීමක් නොමැතිව ස්වකීය අධිපතියාට පක්ෂපාතීව නියෝග කළ කාර්‍ය්‍යය ඉටුකරයි. ඉන්පසු ආපසු පැමිණෙති. එහි දී අල්ලා ගනු ලැබුවෝ මරණයට පත්වෙති. ආපසු පැමිණියවුන් සිය කාර්‍ය්‍යය ඉතා හොඳින් ඉටුකළ බව පවසා ඔවුනට ගරු සත්කාර වශයෙන් භෝජන සංග්‍රහයක් පැවැත්වේ. මේ අවස්ථාවෙහි ඉතා හොඳින් තම නියෝග ඉටුකරන්නේ කවුරුන්දැයි ඔහු අවබෝධ කැර ගනී. ඉන්පසු ඔවුන් චරපුරුෂයන් වශයෙන් ඒ ඒ ප්‍රදේශවලට පිටත් කැර හරී. ඉතා හොඳ මිනීමරුවන් ද පිටත් කරයි. එපරිද්දෙන් අධිපතියන් හෝ තමන් කැමැති වෙනත් පුද්ගලයන් හෝ මරවයි. ඔවුන් මෙසේ මරවන්නේ ස්වර්ගයට යැවීම තම අධ්‍යාශය බව ප්‍රකාශ කරමිනි. මේ ආකාරයෙන් ඔහු විවිධ ප්‍රදේශවල පාලකයන් අධිපතියන් මිනීමරුවන් චරපුරුෂයන් දූතයන් යවමින් උපක්‍රම සහිතව මැරවූයේ ය. මේ නිසා බොහෝ රජවරු ද, අධිපතීහු ද මරණ බිය හේතු කොටගෙන ෂෙයික් සමග හිතමිතුරු දම් වගා කැර ගත්හ. මෙබඳු දරුණු ඉරණමකට මුහුණ පෑමට සිදුවූයේ ඔවුනොවුන් අතර සුහද මිත්‍රතා මගින් එකමුතුව නොසිටි බැවිනි. ඔවුනොවුන්ගේ ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් පක්ෂපාතී භාවයක් නොවූ නිසා ය.

කඳුකරයේ ෂෙයික් හා ඔහුගේ ඝාතන සම්බන්ධයෙන් ඉහත විස්තර කැරිණි. ඔහු එම සිහසුනෙන් පහකෙළේ කවුරුන්ද කෙසේද යන වග දැන් පැවසිය යුතුව ඇත. මෙහි දී පැවැසිය යුතු එක් කරුණක් ගිලිහී ගියේ ය. ෂෙයික් විසින් උප රජවරුන් දෙදෙනෙකු තෝරා ගෙන සිටියේ ය. ඔහුගේ ක්‍රියාමාර්ගය සහ සිරිත් විරිත්

Scanned by CamScanner

පවත්වා ගෙන යෑම සඳහා ය. එයින් එක් තැනැත්තකු අසල්වැසි දමස්කස් වෙත යවන ලදී. අනෙක් තැනැත්තා යැවූයේ කුර්දිස්ථානයට ය. ඔහු නෙරපා හැරි අයුරු මෙසේ ය. එය සිදුවූයේ ක්‍රි. ව. 1262 දී ය. ලෙවන්ට්හි හුලාගු නමැති ටාටර් අධිපතියා ෂෙයික්ගේ දරුණු අපරාධ ගැන අසා ඔහු වනසා දැමීමට කල්පනා කෙළේ ය. තම සේනාධිපතියන් විශාල සේනාවක් ද සමග ෂෙයික් ගේ බලකොටුව කරා යැවී ය. එය අල්ලා ගත නොහැකිව තුන් වසරක් ම ගෙවී ගියේ ය. එසේ කල් ගෙවී ගියේ ඔවුනට කෑම බීම සුලභව එහි තිබූ බැවිනි. වසර තුනක් අවසානයේ කෑම බීම හිඟ විය. එකල්හි ෂෙයික් අලව්දීන් හා ඔහුගේ සියලු ජනයා ද මරා දමා ප්‍රදේශය අත්පත් කැර ගත්හ. එතැන් පටන් ෂෙයික්ගේ ඝාතන ද කඳුකරයේ ෂෙයික් බලය ද සියලු පාප ක්‍රියාවන් ද හමාර වූයේ ය.

දැන් අපි වෙනත් මාතෘකාවක් දෙසට යොමුවෙමු.

Scanned by CamScanner




# චීනයට...!

මේ බලකොටු ප්‍රදේශයෙන් නික්ම ගමන් ගත්තේ සුන්දර නිම්න භූමියක් ඔස්සේ ය. එහි පසෙකින් දිස්වූයේ කඳුවැටි පෙළකි. මේ නිම්න භූමියේ සරුසාර ලෙස ගස් කොළන් වැඩී තිබිණි. වනගත පක්ෂීන් ද, පලතුරු ද බහුල ය. සියලු දෙයින් අඩුපාඩුවක් නොමැත. හමුදාවන් ප්‍රත්‍යන්ත ප්‍රදේශවලින් ලැබෙන දෙයට නැඹුරු වෙති. ගම් හා නගර සහිත මේ ප්‍රදේශය පසු කිරීමට දින හයක් සම්පූර්ණයෙන් ම ගත විය. එහි වැසියෝ මහමදිකයෝ ය. සමහර අවස්ථාවන්හි සංචාරකයාට සැතපුම් පනහක හෝ හැටක තරම් දීර්ඝ කාන්තාර ප්‍රදේශ පසු කිරීමට සිදුවිය. එහි ජලය නොමැත. අවශ්‍ය ආහාර පාන සියල්ල රැගෙන යා යුතු වේ. සිව්පාවෝ වතුර සොයා බොහෝ දුර ගමන් කරති. කාන්තාරයේ බීමට වතුර පොදක් නොමැති බැවිනි.

දින හයක් ගමන් කිරීමෙන් පසු ඔහු ළඟා වූයේ ෂිබාර්ඝාන් නමැති නගරයට ය. අවශ්‍ය සියලු දෑ හිඟයක් නොමැතිව එහි ලබාගත හැකි ය. මේ ප්‍රදේශයේ කොමඩු බහුල ය. මේ කොමඩු ආහාරය සඳහා පිළියෙල කරගන්නේ මෙසේ ය. ඔව්හු ඒවා සිහින් තීරුවලට පෙතිවලට කපති. සම් තීරු මෙනි. ඉන්පසු හිරු එළියේ වියළනු ලැබේ. ඉන්පසු මේවා මී පැණිවලට ද වඩා රසවත් ය. මෙය රට පුරාම වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් අලෙවි කැරේ. සිවුපාවුන් ද, පක්ෂීන් ද බහුලව දඩයම් කරනු ලැබේ. මේ ප්‍රදේශයෙන් නික්ම ඉක්බිති ළඟා වූයේ බාල්ක් නමැති පුරවරයට ය.

Scanned by CamScanner

බාල්ක් අතිවිශාල දර්ශනීය පුරවරයකි. එය අසාමාන්‍ය සුන්දරත්වයෙන් හා විශාලත්වයෙන් යුක්ත නගරයක් වුව ද ටාටර්වරුන් සහ වෙනත් ආක්‍රමණිකයෝ මේ නගරය සුණු විසුණු කළහ. එහි කිරිගරුඬ ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් නටබුන් වී තිබේ. ඒවා දැනුදු දක්නට හැකි ය. මේ ප්‍රදේශයේ වාර්තාවනට අනුව ඇලෙක්සැන්ඩර් රජු ඩේරියස් ගේ දියණිය සිය භාර්යාව ලෙස පාවා ගත්තේ මෙහිදී ය. මෙහි ජනයා මහමදිකයෝ ය. ලෙවන්ට් හි ටාටර් අධිපතියාගේ බල ප්‍රදේශයේ සීමාව මේ නගරයයි. ඊසාන දිග පර්සියාවේ නැගෙනහිර දෙසට සමීපව පිහිටියේ ය.

මේ නගරයෙන් පිටත්ව ඊළඟට ගමන් ගත්තේ තාලිබාන් නමැති ප්‍රදේශයට ය. බාල්ක් නගරයෙන් පිටත් වූ තැන් පටන් දින දොළහක් ඊසාන දිගට ගමන් කළ කාලය තුළ ජනී ජනයා කිසිවකුත් හමුවූයේ නැත. සියලු ජනී ජනයා කඳුකරයට පළා ගොසිනි. සොරුන් සහ මංකොල්ලකරුවන්ගේ ප්‍රහාරයනට බියෙනි. ජලය ද සුලභ ප්‍රදේශයකි. දඩයම් ද සුලභ මේ ප්‍රදේශයේ සිංහයෝ ද වෙසෙති. ආහාර දුර්ලභ බැවින් මගීනට අවශ්‍ය කෑම ගෙන යා යුතු ය. එසේම තමන්ගේ අශ්වයන්ට අවශ්‍ය ආහාර ද ගෙන යා යුතු වේ.

දින දොළහක ගමනින් පසු සංචාරකයා ළඟාවන්නේ "තාලිබාන්" නගරයට ය. ධාන්‍ය වෙළෙඳාම බහුල වශයෙන් පවත්නා නගරයකි. මෙය දර්ශනීය නගරයකි. දකුණු දෙසින් පිහිටියේ කඳුකරයකි. එහි ලුණු නිෂ්පාදනය කැරේ. අසල්වැසි ප්‍රදේශවල ජනයා නිරන්තරයෙන් මෙහි පැමිණෙති. ලුණු රැගෙන යෑම සඳහා ය. ලෝකයේ ඉස්තරම් ලුණු ඇත්තේ මෙහි ය. යකඩ ගල් කටුවකින් විනා කඩා වෙන් කළ නොහේ. මෙහි ඇති ලුණු තිධිය ලෝකය අවසානය වන තුරු ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් බව මට සහතික ය. කොට්ටම්බා සහ පිස්ටැචෝ නමැති කොළ පැහැති පලතුරු වර්ගය ද කඳුකරයෙහි බහුල ය. මේවා බහුල වශයෙන් අලෙවි කැරේ.

දින තුනක් එතැන් සිට ඊසාන දිගට ගමන් කළ පසු හමුවයේ ජනාකීර්ණ සරුසාර ප්‍රදේශයකි. පලතුරු ධාන්‍ය සහ මිදි බහුල ය. මෙහි ජනයා මහමදිකයෝ ය. ඔව්හු අශීලාචාර මිනීමරුවෝ ය. ඔවුන්ගේ කාලය බහුලව ගතවන්නේ බේබදුකමිනි. ඔව්හු අනර්ඝ වයින් නිෂ්පාදනය කරති. ජනයා මත්ලෝලයෝ ය. මොවුන්

Scanned by CamScanner

හිස්වැසුම් පළඳින්නේ නැත. ඒ වෙනුවට වියත් දහයක් පමණ දිග රෙදි පටියක් හිසේ බඳිති. ඔව්හු දක්ෂ දඩයක්කරුවෝ ය. ඕනෑම සතකු දඩයම් කරති. රෙදි භාවිතා නොකරන ඔවුන් ඇඳුම් ලෙස භාවිතා කරන්නේ සතුන්ගේ සම් ය. සතුන්ගේ සම්වලින් පාවහන් ද තනාගතිති. සම් පදම් කරන අයුරු ඔවුනට පළපුරුදු ය.

එහි සිට තුන් දිනක ගමනින් පසු ළඟා වූයේ "ඉෂ්කෂාම්" නමැති නගරයට ය. සිටුවරයකු විසින් මේ නගරය පාලනය කරනු ලැබේ. ඔහුගේ අනෙක් නගර හා පුරවරය පිහිටා ඇත්තේ කඳුකරයෙහි ය. මේ පුරවරය මැදින් සැහෙන තරම් විශාල ගංගාවක් ගලා බසී. මේ ප්‍රදේශයේ උකුස්සන් බහුල ය. දඩයක්කාරයෝ මේ උකුස්සන් දඩයම් කරති. උකුස්සෝ අහසේ කරකැවෙමින් කුරුමානම් අල්ලා සුනඛයන් ඩැහැගෙන යති. බොහෝ ප්‍රදේශවල සුනඛයනට උකුස්සන් තුවාල සිදුකර ඇත.

මේ නගරය අති විශාල ය. ඔවුන්ටම ආවේණික භාෂාවක් ඇත. කඳුකරයේ වාසය කරන මොවුන් එඬේරුන් ය. ගල් ගුහාවන්හි වාසය කරති. ඉක්බිති තෙදිනක් ගමන් කර ළඟා වූයේ බදකෂාන් නමැති ප්‍රදේශයට ය. අතරමග ප්‍රදේශය ජනශූන්‍ය ය. ආහාරපාන දුර්ලභ ය. එබැවින් මඟීන් ගමනට අවශ්‍ය ආහාරපාන රැගෙන යා යුතු ය. එහෙත් අශ්වයන්ට ප්‍රමාණවත් තණකොළ ඇත.

බදකෂාන් නැතහොත් බලාෂාන් ප්‍රදේශයේ ජනයා මහමදිකයෝ ය. ඔවුනට විශේෂ වූ භාෂාවක් කථා කරති. මෙය විශාල රාජධානියකි. දින දොළහක් ගමන් කිරීමෙන් මේ රාජධානිය පසුකළ හැකි ය. ඇලෙක්සැන්ඩර් රජු හා ඩේරියස් ගේ දියණිය ගේ පරපුරෙන් පැවත එන පරම්පරාවේ රජවරු මේ ප්‍රදේශයේ අධිපතියෝ වූහ. මහා ඇලෙක්සැන්ඩර් රජුට ගෞරව කිරීම් වස් සුල්කරනීන් යන පදය ඔව්හු භාවිත කරති. එය මහා ඇලෙක්සැන්ඩර් නාමයට පර්යාය වශයෙන් යොදාගත් සැරසින් වචනයකි.

මේ රටෙහි අගනා රතු මැණික් හමුවේ. ඉතා කාන්තිමත් මේ මැණික් අනර්ඝ ය. උසස් වටිනාකමින් යුක්ත ය. කඳු පර්වත අතර පතල් කපා මේ මැණික් සොයාගනු ලැබේ. පතල් ඉතා ගැඹුරු ය. දෝනා හෑරීම ද සිදු කැරේ. රිදී සොයා ගැනීමට පතල් හා දෝනා කනින්නාක් මෙනි.

මී ළඟට මා විස්තර කියන්නේ සමර්කාන්ඩ් ප්‍රදේශය ගැන ය. එය අතිවිශාල දර්ශනීය නගරයකි. පිහිටා ඇත්තේ වයඹ දිගිනි. ක්‍රිස්තු ලබ්ධිකයන් හා සැරසින්වරු මෙහි වාසය කරති. ඔවුන්ගේ අධිපතියා ප්‍රධාන ඛාන්වරයාගේ බෑනා ය. එහත් ඔවුන් දෙදෙනා අතර මිත්‍රත්වයක් නොමැත. දෙදෙනා ඔවුනොවුන් කෙරෙහි වෛරයෙන් පසුවෙති. ඊළඟට මා ඔබට කියන්නේ මේ නගරහි දක්නට ලැබුණු අරුම පුදුම සිද්ධියක් ගැන ය.

එය සිදුවූයේ නොබෝ කලකට ඉහත දී ය. ප්‍රධාන ඛාන් වරයාගේ සහෝදරයා වූ චඝතායි සහ තවත් බොහෝ පිරිසක් ක්‍රිස්තු ධර්මය වැළඳ ගත්හ. මෙ නිසා සමර්කාන්ඩ්හි වැසියෝ තම අධිපතියා ක්‍රිස්තු ලබ්ධිකයකු වීම ගැන මහත් ප්‍රීති ප්‍රමෝදයට පත්වූහ. ජනයා මේ නගරයෙහි සාන්ත ජෝන්ගේ නාමයෙන් බැප්ටිස්ට් දේවස්ථානයක් ගොඩනැගුවෝ ය. යථෝක්ත දේවස්ථානය ගොඩනැගීමේ දී වහලයට ආධාරකයක් වශයෙන් ඇති කුළුණෙහි පාදමට ඉතා දර්ශනීය ශිලාවක් පිහිටුවන ලදී. මේ ශිලාව සැරසින් වරුන් හට අයත් වූවකි. චඝතායි ගේ මරණයෙන් පසු සැරසින්වරු මේ විසිතුරු ශිලාව ලබා ගැන්මට කැස කැවූහ. අවසානයේ දී බලහත්කාරයෙන් යථෝක්ත ශිලාව උදුරා ගැන්මට සූදානම් වූහ. එය සැරසින්වරුනට දුෂ්කර කාර්යයක් නොවී ය. එයට හේතුව සැරසින්වරුන් සංඛ්‍යාවෙන් ක්‍රිස්තු ලබ්ධිකයනට වඩා දස ගුණයක් වූ බැවිනි. ක්‍රිස්තියානිහු යථොක්ත විචිත්‍ර ශිලාව වෙනුවට වෙනත් ඕනෑම වස්තුවක් සැරසින්වරුනට දීමට පොරොන්දු වූහ. යම් හෙයකින් ස්ථම්භය පාදමෙහි ඇති මුල්ගල ගැලවුවහොත් එයින් දේවස්ථානයට බලවත් ආපදාවක් සිදුවන බැවිනි. එහෙත් සැරසින්වරුන් කියා සිටියේ රත්රන් හෝ වෙනත් කිසිදු සම්පතක් අනවශ්‍ය බවත් ඒ සියල්ලටම වඩා විචිත්‍ර ශිලාව අගනා බවත් එය ඔවුනට අත්‍යවශ්‍ය බවත් ය. මෙකී අවස්ථාව වන විට රාජ්‍ය බලය පැවැතියේ මහා ඛාන්වරයා ගේ බෑනා වෙත ය. ඔහු මේ ශිලාව දින දෙකක් ඇතුළත සැරසින්වරුනට භාරදිය යුතු යයි නියෝග කෙළේ ය. යථොක්ත නියෝගය නිසා කුමක් කළ යුතු දැයි ක්‍රිස්තියානිහු වික්ෂිප්ත වූහ. මේ අවස්ථාවෙහි ඇදහිය නොහැකි තරම් විශ්මයක් සිදුවිය. මුල්ගල ගලවන දිනයේ උදේ ඉබේම එය දරා සිටි කුළුණ ඉහළට එසැවිණි. අපගේ ජේසු ස්වාමි දරුවන්ගේ

Scanned by CamScanner

මහිමයෙන් එය වියත් තුනක් ඉහළට එසැවුණේ ය. එය පාදමෙහි තිබූ සැරසින්වරුන්ගේ ශිලාව පහසුවෙන් ගලවා ඉවත් කළ හැකි වන පරිද්දෙනි. අද දක්වාම මේ කුළුණ ඉහළට එසැවුණ වනම කිසිදු ආධාරකයක් නොමැතිව නිශ්චලව පවතිනු දැකගත හැකි ය. මෙය ලෝකයේ දක්නට ලැබෙන මහා අරුම පුදුම සිද්ධියකි.

මෙහි සිට දින පහක් ගමන් කළ පසු හමුවූයේ යාර්කන්ඩ් නමැති ප්‍රදේශයයි. මෙහි වැසියෝ මහමදිකයෝ ය. නෙස්ටෝරියානු ක්‍රිස්තුලබ්ධිකයන් ද සැහෙන පිරිසක් දක්නට ලැබේ. මොවුන් සියලු දෙනාම මහා ඛාන් වරයාගේ යටත් වැසියෝ ය. කපු කර්මාන්තය මෙහි විශාල වශයෙන් සිදුවේ. ඉක්බිති ගමන් ගත්තේ ඛෝටාන් වෙතට ය. ඛෝටාන් පිහිටා ඇත්තේ ඊසාන දිසාවෙනි.

ඛෝටාන් වෙත යෑමට දින අටක් ගමන් කළ යුතු විය. මේ ප්‍රදේශය මහා ඛාන්වරයාගේ පාලනය යටතේ පවතී. ඛෝටාන් වැසියෝ මහමත් භක්තිකයෝ ය. එහි නගර හා පුරවර රැසකි. එයින් බොහොමයක් දර්ශනීය ය. මෙහි අගනුවර හඳුන්වන්නේ ද ප්‍රදේශයේ නමිනි. මේ ප්‍රදේශයේ බහුල වශයෙන් කපු වැවේ. මිදිවතු පලතුරු වතු හා වෙනත් පලබර වැවිලි සුලභ ය. ජනතාවගේ ජීවනෝපාය වෙළෙඳම හා කර්මාන්ත ය. ඔවුන් යුද කාමී ජනතාවක් නොවේ. එතැන් සිට ඉදිරියට දින පහක් ගමන් කළ කල්හි ඊසාන දිගින් හමුවූයේ පෙම් නමැති ප්‍රදේශයයි. මෙහි ජනයා මහමත්තුමන් අදහති. මහා ඛාන්වරයාගේ පාලනය යටතේ මේ ප්‍රදේශය පවතී. ගම්මාන හා නගර රාශියක් මෙහි පිහිටා තිබේ. මේ ප්‍රදේශයේ අතිශය දර්ශනීය අගනුවර පෙම් නමින් හැඳින්වේ. යථෝක්ත ප්‍රදේශය හරහා ගලා බස්නා ගංගාවන්හි සූර්ය කාන්ත පාෂාණ ද තවත් අගනා මැණික් වර්ග ද හමුවේ. මෙහි ජනතවට අගහිඟයක් නොමැත. කපු වගාව සරුසාර ය. වෙළෙඳම සහ කර්මාන්ත ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපායයන් ය. මෙරට ජනතාව අතර එක්තරා විශේෂ චාරිත්‍රයක් පවතී. එනම් ස්වාමි පුරුෂයා භාර්යාවගෙන් වෙන්ව දින විස්සකට වඩා වැඩි දින ගණනක් ගතවන ගමනක යෙදුණ හොත් ඇය වෙනත් පුරුෂයකු සමග වසන්නී ය. පුරුෂයෝ ද මේ වරප්‍රසාදය ම භුක්ති විඳිති. කාෂ්සර් හි සිට පෙම් නගරය දක්වා සමස්ත ප්‍රදේශය ඉන් ඔබ්බෙහි සැහෙන පළාතක් ද තුර්කිස්ථානයට අයත් වේ. තුර්කිස්ථානයෙහි සිට ඊසාන දිගින් පිට තවත් ප්‍රදේශයක් නම්

චර්-චෑන් ය. මෙය දර්ශනීය සරුසාර ප්‍රදේශයකි. එහෙත් එහි සෑහෙන ප්‍රදේශයක් ටාටර්වරුන් විසින් වනසන ලදී. මෙහි ජනයා අදහන්නේ මහමත්තුමා ය. නගර හා පුරවර රැසක් සහිත මේ රාජධානියෙහි අගනුවර චර්චෑන් ය. එහි ගංගාවන්හි සූර්යකාන්ත පාෂාණ හා වෙනත් අගනා මාණික්‍ය වර්ග හමුවේ. මේවා කැතේ (චීනය) දේශයට අපනයනය කැරේ. විශාල වශයෙන් ලාභ උපදවන වෙළෙඳමකි. මෙහි මැණික් සුලභ ය. එමෙන්ම අනර්ඝ ය.

බෝටාන් හි සිට පෙම් දක්වා ද, පෙම් සිට චර්චෑන් දක්වා ද මාර්ගය වාලුකාවකි. අම්හිරි අපිරිසිදු ජල උල්පත් මෙහි තිබේ. එහෙත් ඇතැම් ස්ථානයක බිමට සුදුසු පිරිසිදු ජලය හමුවේ. යුද හමුදාවක් මේ ප්‍රදේශය හරහා ගමන් ගන්නා කල්හි ජනයා ස්වකීය අඹු දරුවන් ද සතා සිවුපාවුන් සමග දින දෙක තුනක් මේ වාලුකාවෙහි ගත කරති. ඔවුනට එහි තම සිවුපාවුන් හා අඹු දරුවන් සමග ජීවත්විය හැකි බැවිනි. මේ ප්‍රදේශය හරහා හමා එන ප්‍රචණ්ඩ වැලි කුණාටුව නිසා කිසිවකුටත් ඒ ඔස්සේ ගමන් කළ නොහේ. කිසිදු සතකුට හෝ එහි සැරිසැරීමට නොහැකි බැවින් ඔවුනට මේ වැලි කුණාටු හේතුකොට ගෙන සතුරන්ගෙන් ගැලවීමට අවාරණය සලසයි. එහෙත් මිතුරු හමුදාවක් ගමන් කරන කල්හි තත්ත්වය මෙයට වඩා වෙනස් ය. ඔවුන්ගේ සතුන් අල්ලා ගෙන මරා කෑමට අවශ්‍ය නොවන බැවිනි. හමුදාවනට ඔවුන්ට දඩ ගෙවීමට ද වුවමනා නොවේ. වැසියෝ තම අස්වනු මෙහි ඇති ගල් ගුහාවල සඟවා තබති. සතුරන් පැහැර ගනිතැයි බියෙනි. මාසයක් මාසයක් පාසා තම තමනට අවශ්‍ය ධාන්‍ය ප්‍රමාණය ඔව්හු රැගෙන යති.

චාර්චෑන් ප්‍රදේශයෙන් නික්ම දින පහක් ගමන් කිරීමෙන් පසු විශාල නගරයකට ළඟාවීමට හැකි විය. දින පහක් මුළුල්ලේ ගමන් කිරීමට සිදුවූයේ වැලි කතරක් ඔස්සේ ය. එහි ජලය බීමට සුදුසු නොවේ. අම්හිරි ය. එහෙත් අතරින් පතර පිරිසිදු ජලය සහිත ස්ථාන ද හමුවේ. මේ වැලි කතර ආරම්භවත්ම විශාල නගරයක් දක්නට ලැබේ. මේ නගරය හඳුන්වනුයේ ලොප් නමිනි. මේ නගරය මහා ඛාන්වරයා යටතේ පවතී. කාන්තාරය ද හඳුන්වනුයේ ලොප් යනුවෙනි. කාන්තාරය හරහා ගමන් ගන්නා සංචාරකයන් නවාතැන් ගන්නේ මෙකී පුරයෙහි ය. සතියකට ප්‍රමාණවත් වන පරිදි ඔවුන්

Scanned by CamScanner

ගමන් ගන්නා සිවුපාවුනට ද විවේකය සහ ආහාර පාන ලබා දෙන්නේ මෙහිදී ය. මේ නගරය ප්‍රධාන ඛාන්වරයා යටතේ පවත්නා අතර එහි වැසියෝ මහමදිකයෝ වෙති. මාසයකට පමණ අවශ්‍ය ආහාරපාන සම්පාදනය කරගත් පසු සංචාරකයෝ මේ මහා කාන්තාරයේ ගමන් අරඹති.

ඉහත සඳහන් කළ කාන්තාරය අති විශාල ය. එහි එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා ගමන් කිරීමට වර්ෂයක් ගත වේ. ඉතා ම පටු ස්ථානය හරහා වුව ද ගමන් කිරීමට මාසයක් ගතවනු ඇත. මේ මාර්ගය කඳුවැලිතලා හා නිම්න ප්‍රදේශ සහිත ය. ආහාර පාන කිසිවක් එහි නොමැත. එක් දිනක් දිවා රාත්‍රි ගමනකින් පසු විශාල පිරිසකට ප්‍රමාණවත් ජලය සැපයීම දුෂ්කර ය. එහෙත් පනහක් හෝ සියයක් පමණ පිරිසකට හා ඔවුන්ගේ සිවුපාවුනට අවශ්‍ය ජලය සපයා ගත හැකි වේ. මේ අයුරින් ජලය ඇති ස්ථානයක් වෙත යෑමට දිවා රැය නොනැවතී සම්පූර්ණ දවසක් ගමන් කිරීමට සිදුවේ. මෙහි තුන් හතර පළක ජලය අම්හිරි ය. අපිරිසිදු ය. ඒ හැරුණු විට විසි අට පළක ජලය බීමට සුදුසු තත්ත්වයක පවතී. කුරුල්ලන් හෝ සිවුපා සතුන් මේ ප්‍රදේශයේ දක්නට නොලැබේ. එයට හේතුව ආහාරය සඳහා කිසිවක් නොමැති වීම ය. එහෙත් එක්තරා විශේෂ කරුණක් මේ කාන්තාර මාර්ගයේ ගමන් ගන්නා කල්හි අත්දැකීමට ලැබේ. එය ඉතා අද්භූත අත්දැකීමකි. ඒ සම්බන්ධව තොරතුරු ඔබට ඉදිරිපත් කරමි.

රාත්‍රි කාලයෙහි සිවුපාවකු පිට නැගී මේ කාන්තාරය හරහා ගමන කිරීමේ දී යම් හෙයකින් කිසියම් පුද්ගලයකුට කිනම් හේතුවක් නිසා හෝ සුනංගු වීමට සිදුවුවහොත් නැතහොත් නින්දට යෑමට සිදුවුව හොත් යළිත් ඔහුට තම පිරිස කරා යෑමට එක්වීමට පෙර හුදෙකලා වේ. මේ අවස්ථාවෙහි දී ඔහුට භූතයන් කථා කරන හඬ ඇසේ. සමහර විට නම කියා අඬ ගසන හඬ ද ඇසේ. තනි වූ තැනැත්තාට මේ අවස්ථාවෙහි දී සිතෙන්නේ තම මිතුරන් අඬගසන බව ය. මේ හේතුවෙන් ඔහු මං මුළා වෙයි. එසේ මං මුළා වුවහොත් ඔහු යළිත් දක්නට නොලැබේ. මේ අයුරින් බොහෝ සංචාරකයෝ අතුරුදහන් වූහ. බොහෝ දෙනා වැනසුණහ. සමහර විට රාත්‍රියේ ඝෝෂාකාරී කලබැගෑනියක් ඇසේ. අශ්වාරෝහකයන් කණ්ඩායමක් මාර්ගයෙන් බැහැර ගමන් කරන බවක් හැඟේ. එවිට සිතෙන්නේ

Scanned by CamScanner

තම කණ්ඩායමේ පිරිසක් එදෙස ගමන් කරන බවකි. එයට රැවටී රැය එළිවනතුරුම වැරදි දිසාවක ගමන් කරති. මේ නිසා ඔව්හු අකරතැබ්බයනට ලක්වෙති. ඇතැම් අවස්ථාවක කාන්තාරය හරහා ගමන් කරන විට මිනිසුන් කණ්ඩායමක් තමන් වෙත පැමිණෙනු පෙනේ. එවිට ඒ සොරුන් කණ්ඩායමකැයි සිතා සංචාරකයෝ බියපත්ව පළා යති. මෙබඳු අවස්ථාවන්හි දී ගමන් ගත් මග වැරැදේ. යළිත් නිසි මග සොයා ගැන්මට නොහැකි වීම නිසා මං මුළා වෙති. සමහර විට දිවා කාලයේ පවා භූතයන් නගන ශබ්ද ඇසේ. සංගීත භාණ්ඩ වාදනය කරන හඬ ඇසේ. විශේෂයෙන් බෙර වාදනය කරන හඬ නැගේ. අත්පුඩි ගසන හඬ මතු වේ. මෙවැනි අද්භූත සිද්ධීනට මුහුණ පෑමට සිදුවන බැවින් සංචාරකයන් මේ කාන්තාරයේ ගමන් කරන්නේ බොහෝ දුරට ඔවුනොවුනට සමීපව කණ්ඩායම් වශයෙනි. නින්දට යෑමට පෙර ඔවුන් ඉදිරියට ගමන් කළ යුතු මාර්ගය නිශ්චිතව වටහා ගැන්ම සඳහා කිසියම් සලකුණක් තබති. තමන් සමග ගමන් කරන සිවුපාවුන්ගේ ගෙලෙහි සීනු බැඳීම ද සිරිතකි. ඒ සීනුවල ශබ්දය නිසා මග වැරදීමෙන් සිදුවන මං මුළා වීම් මඟ හැරේ.

සංචාරකයන් කාන්තාර මාර්ගය ගෙවා පසුකරන්නේ මේ අයුරින් දුෂ්කරතාවලට මුහුණ පාමිනි. ඒ ගැන විස්තර ඔබට ඉදිරිපත් කෙළෙමි. මීළඟට මා කියන්නේ කාන්තාරය පසු කොට ගමන් කළ ඉක්බිති හමුවන ප්‍රදේශ ගැන ය.

පුරා දින තිහක් කාන්තාරයේ ගමන් කිරීමෙන් පසු සංචාරකයා ළඟාවන්නේ සා-චෞ නමැති නගරයට ය. එය පිහිටියේ ඊසාන දිගෙනි. එය මහා ඛාන්වරයා සතු ප්‍රදේශයකි. මේ නගරය පිහිටා ඇත්තේ ටැන්ගස් නමැති පළාතෙහි ය. මෙහි වැසියෝ පිළිම වන්දනා කරන්නෝ ය. තුර්කින් ද සෑහෙන සංඛ්‍යාවක් මෙහි වෙසේ. ඔවුන් නෙස්ටෝරියානු ක්‍රිස්තියානින් ය. සැරසින්වරු ද මෙහි වෙසෙති. පිළිම වන්දනා කැරෙන ආගමක් අදහන මෙහි ජනයා කථා කරන්නේ ඔවුන්ට ම ආවේණික භාෂාවකි. වෙළෙඳම ඔවුන්ගේ වෘත්තියක් නොවේ. ඔවුන් ජීවිකාව කරගන්නේ ධාන්‍ය වගාවෙනි. එහි විහාරාරාම හා පූජ්‍යස්ථාන රාශියකි. මේ පූජ්‍යස්ථානයේ විවිධාකාර විචිත්‍ර ප්‍රතිමා දක්නට ලැබේ. ඔව්හු භක්තිමත්ව ආගමට කැපවී කටයුතු කරන්නාහ. මෙහි දරුවන් සිටින පිරිමි කිසියම්

Scanned by CamScanner

ප්‍රතිමාවක් ඉදිරියට සිය දරුවන් සමග බැටලුවන් ගෙන එති. ප්‍රතිමාව ඉදිරිපිටදී බැටලුවා එයට කැප කරති. ඉන්පසු බැටලුවාගේ මස් පිස පූජා පවත්වන්නා හ. මෙසේ පූජා පවත්වන්නේ තම දරුවන් ආරක්ෂා කරන ලෙස ආයාචනා කරමිනි. ඔවුන් විශ්වාස කරන්නේ මාංශ ව්‍යංජනයෙහි රසය මේ ප්‍රතිමා භුක්ති විඳින බව ය. මෙය උත්සවාකාරයෙන් පවත්වන පූජාවකි. යථෝක්ත පූජාව පැවැත් වීමෙන් පසු ඉතිරිවන මස් ඔව්හු ගෙදර ගෙන යති. ඉක්බිති මේ මස් සිය ඥාති මිත්‍රාදීන් සමග මහත් උත්සව ලීලාවෙන් අනුභව කරති. මාංස අනුභවයෙන් පසු ශේෂවන ඇට කටු මහත් ගෞරවයෙන් එකතු කර පෙට්ටියක් තුළ ආරක්ෂා සහිතව තබනු ලැබේ. සිවුපාවාගේ හිස, පාද, අතුනුබහන් හා ලොම් ද මස් කොටසක් ද පූජකයාට පිරිනමති.

ලෝකයේ හැමරටකම පාහේ පිළිම වන්දනා කරන ආගම් අදහන ජනයා මෘත ශරීර ආදාහනය කරති. මෘත ශරීරය ආදාහන භූමිය කරා රැගෙන යන මාර්ගයේ කිසියම් තැනක ලීවලින් කුඩා ගෙයක් තනා පටරෙදි හා ස්වර්ණමය රෙදිපිළිවලින් එය සරසනු ලැබේ. මෙහි සිට මෘත ශරීරය රැගෙන යන්නේ සැරසිලි සහිත මාර්ගයක ය. අවමඟුල් පෙරහරෙහි යන පිරිස වයින් සහ ආහාරපාන මෘත ශරීරයට පූජා කරති. ඔවුන් එසේ කරන්නේ මියගිය තැනැත්තා මතු ආත්ම භාවයේ දී එබඳු ආහාරපාන නොඅඩුව ලබන බව විශ්වාස කරමිනි. ආදාහනාගාරයට ගෙන ගිය කල්හි කඩදාසිවලින් අශ්වයන්ගේ හා ඔටුවන්ගේ රූප සටහන් ද, කාසිවල ආකෘති ද කපා මේ සියල්ල මළ සිරුර සමග දවනු ලැබේ. මේ කරනුයේ ලබන ආත්මයේ දී මියගිය තැනැත්තා අශ්වයන් හා ඔටුවන් ද, මිල මුදල් ද, දැසි දසුන් ද, සෙසු වස්තුව ද නොඅඩුව ලබන්නේ යැයි පවත්නා විශ්වාසය හේතු කොටගෙන ය. මෘත ශරීරය සුසානය කරා ගෙන යන කල්හි විවිධාකාර සංගීත භාණ්ඩ වාදනය කරමින් තූර්ය නාද පවත්වනු ලැබේ. මේ සියල්ල සංවිධානය වනුයේ මළ තැනැත්තාගේ හා ඔහුගේ පවුලේ තත්ත්වය අනුව ය.

මේ සම්බන්ධයෙන් කිවයුතු තවත් කරුණු තිබේ. යම් තැනැත්තකු මිය ගිය කල්හි ඔහුගේ උපන් වේලාව මාසය හා දිනය තම ප්‍රදේශයේ ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයාට දන්වනු ලැබේ. ඒ කරුණු අනුව සටහනක් සකස් කරන ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයා මෘත දේහය

Scanned by CamScanner

ආදාහනය කළ යුතු දිනය දන්වනු ලැබේ. සමහර විට සතියක්, මාසයක් නැතහොත් හමසක් පමණ කාලයක් මෘත ශරීරය ආදාහනය නොකොට තබා ගැන්මට සිදුවේ. ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයාගේ උපදේශයට පිටුපා කිසි විටෙකත් ඔවුන් මෘත ශරීරය ආදාහනය කරන්නේ නැත. නිසි දිනය එළැඹෙන තුරු ඔව්හු මෘත ශරීරය සුරක්ෂිතව තබා ගනිති. ඒ සඳහා අනුගමනය කරන්නා වූ ක්‍රියා මාර්ගය මෙසේ ය. ලෑලිවලින් පෙට්ටික් තනා අලංකාර ලෙස තීන්ත ගා සරසා මෘත දේහය ඒ තුළ තැන්පත් කරනු ලබේ. කපුරු හා වෙනත් කුළුබඩු වර්ග ආදිය උපයෝගී කරගෙන මෘත ශරීරය කල් තබා ගත හැකිවන සේ බෙහෙත් ගල්වති. හුණු සහ මැලියම් වර්ග එකට අනා මළ සිරුරේ සිදුරු වසා දුර්ගන්ධය පැතිරීම වළක්වනු ලැබේ. ඉන්පසු මළසිරුර පටරෙද්දකින් වසති. මියගිය තැනැත්තා ජීවත්ව සිටියදී ප්‍රිය කළ ආහාරපාන එපරිද්දෙන්ම මෘත දේහයට පිළිගැන්වීම දිනපතා සිදු කැරේ. ආදාහනය සඳහා මෘත ශරීරය නිවසින් බැහර රැගෙන යන තුරුම මේ අයුරින් නොකඩවා ආහාර පාන පිළිගැන්වේ. මළමිනිය නිවසින් බැහැරට ගෙන යන්නේ ද ජ්‍යොතිශ්ශාස්ත්‍රීය උපදේශ අනුව ය. මළ මිනිය අසවල් දොරටුවෙන් බැහරට ගත යුතු යයි ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයා උපදෙස් දෙයි. එයට කිසියම් ශුභ දිසාවක් ද, ශුභ හෝරාවක් ද නියම කැරේ. සමහර විට දොරටුවකින් නොව බිත්තියක් සිදුරු කර මෘත ශරීරය බැහැරට ගැනීමේ අවස්ථාවන් ද යෙදේ.

මේ සියල්ල ඔවුන් කරන්නේ මියගිය තැනැත්තාගේ ප්‍රාණ කාරයාගෙන් ඇති විය හැකි අපල උපද්‍රව බැහැර කර ගැන්ම සඳහා ය. සුබ වේලාවකින් හා සුබ දිශාවකින් මෘත ශරීරය බැහැරට ගත්තේ ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයා විසින් මිය ගිය තැනැත්තාගේ කේන්ද්‍ර සටහන අනුව ප්‍රකාශ කරන උපදෙස් අනුව ය. මෙය අනාගතයේ දී එල්ල විය හැකි උපද්‍රව වළක්වා ගැනීමේ පිළිවෙතකි. මේ සම්බන්ධයෙන් බොහෝ කරුණු විස්තර කෙළෙමි. දැන් කාන්තාරය කෙළවර වයඹ දිග ප්‍රදේශයේ පිහිටි නගර ගැන විස්තරයක් කරන්නෙමි.

කාබුල් රාජධානියෙහි නගර හා ගම්මාන රැසක් පිහිටා ඇත්තේ ය. එහි ප්‍රධාන නගරය ද කාබුල් නම් වේ. මේ ප්‍රදේශය පිහිටා ඇත්තේ කාන්තාර දෙකකට මැදිව ය. මහා කාන්තරය හා තුන්

Scanned by CamScanner

දින ගමනකින් ගෙවිය හැකි කාන්තාරය යන දෙක අතර ය. ප්‍රතිමා වන්දනා කරන ආගමක් අදහන මෙහි ජනයා ඔවුන්ගේ ම භාෂාවක් කථා කරති. ඔවුන් ජීවත් වන්නේ කෘෂි කර්මාන්තයෙනි. ඔවුන් සතුව ඉස්තරම් ආහාර පාන වර්ග තිබේ. මේ ආහාර පාන වර්ග සංචාරකයනට අලෙවි කරති. මෙහි ජනයා ප්‍රීතියෙන් කල්ගත කරති. සංගීතය, ගායනය, වාදනය, නාට්‍යය, කියවීම, ලිවීම ආදිය තම අභිමතය හා පල ප්‍රයෝජන උදෙසා පවත්වාගෙන යන්නාහ. කායික ආස්වාදය ඔව්හු ප්‍රමුඛස්ථානයෙහි ලා සලකති. මෙහි ජනයා අමුත්තන් පිළිගන්නේ මහත් ආදරණීය උණුසුම් හැඟීමෙනි. ගෘහණීය ආගන්තුකයා සතුටු කිරීම සඳහා හැමදෙයක් ම කරන්නී ය. අමුත්තා නිවසේ සිටියදී ගෙහිමියා දින දෙක තුනක් සිය කටයුතු සඳහා බැහැර යයි. අමුත්තාට භාර්යාව සමග කැමැති පරිදි හැසිරීමට අවස්ථාව සැලසේ. ඇය සමග එකම යහනේ සතුටු විය හැකි ය. මෙහි ස්ත්‍රීහු තමන් රිසි පරිදි පුරුෂයන් සමග විනෝද වෙති. ඒ ගැන කිසිදු ලජ්ජාවක් නොමැත. මේ ප්‍රදේශයේ කාන්තාවන් රූමත් ය. ප්‍රසන්න ය. කවර මොහොතක වුවද එක්වීමට සූදානම් ය.

මොන්ගු ඛාන්ගේ පාලන සමයහි වූ එක්තරා සිදුවීමක් ගැන කිව යුතු ය. මොන්ගු ඛාන් ටාටර් වරුන්ගේ අධිපතියා ය. මේ ප්‍රදේශයේ කාන්තාවන් බාහිර පුද්ගලයන් සමග සම්බන්ධකම් පැවැත්වීම තහනම් කරමින් එවැනි ක්‍රියාවනට බරපතල දඬුවම් පමුණුවන බව ද ප්‍රකාශ කෙළේ ය. මෙය ඔවුනට මහත් ආපදාවක් ලෙස පෙනුණි. එහෙත් වසර තුනක් ඔව්හු මොන්ගු ඛාන්ගේ නියෝගයට අනුකූලව කටයුතු කළහ. ඉන්පසු ඔව්හු මේ ගැන රැස්වී සාකච්ඡා කළෝ ය. ඉතා වටිනා ත්‍යාගයක් මොන්ගු වෙත යවා සතුටට පත්කොට තම චිරාගත සම්ප්‍රදායානුකූල ආගන්තුක සත්කාරය පවත්වාගෙන යෑමට අවසර පතා සිටියහ. ඔවුන්ගේ පාරම්පරික චාරිත්‍රය වූයේ තම භාර්යාවන් අමුත්තන්ට පිරිනමා ඔවුන්ගේ ප්‍රසාදය දිනාගෙන අස්වැන්න බෙදා හදා සතුටින් ජීවත්වීම බව මොන්ගුට කීහ.

"මේ නිර්ලජ්ජා ක්‍රියාව තව දුරටත් කළ යුතු නම් කරපල්ලා! මෙය පුරාණ චාරිත්‍රයක් නම් එසේම පවත්වා ගනිල්ලා" යයි ඛාන් කීවේ ය. ඉන්පසු මේ චාරිත්‍රය අද දක්වාම පවතී.

උයිගුරිස්ථාන් යන මහා ඛාන්වරයා යටතේ පවත්නා තවත්

Scanned by CamScanner

ප්‍රදේශයකි. බොහෝ නගර හා පුරවර මෙහි දක්නට ලැබේ. ප්‍රධාන නගරය හඳුන්වන්නේ කර බෝජා නමිනි. එයට සම්බන්ධ තවත් නගර හා පුරවර රාශියකි. ප්‍රතිමා වන්දනා කරන ආගමක් මෙහි වැසියෝ අදහති. සැරසින්වරු ද නෙස්ටෝරියනු ක්‍රිස්තියානින් ද මෙහි වෙසේ. ප්‍රතිමා වන්දනා කරන ආගමිකයන් හා ක්‍රිස්තු ලබ්ධිකයන් අතර ආවාහ - විවාහ සිදුවේ. මොවුන්ගේ ආදිතම පාලකයා රජු මනුෂ්‍ය උත්පත්තියක් නොලැබූ එස්කා නමැති වෘක්ෂයෙහි සාරයෙන් බිහි වූ තැනැත්තෙකු යයි විශ්වාස කරත්. සියලු ජනයා පැවැත එන්නේ ඔහුගේ පරම්පරාවෙනි. මෙහි වැසියෝ ඉතා භක්තිමත් ලෙස ආගම ධර්මයට කැපවී ජීවත් වෙති. ඔව්හු නිදහස් කලාවන් හි නිපුණයෝ ය. මෙහි ධාන්‍ය හා ඉස්තරම් වයින් වර්ග සුලභ ය. එහෙත් ශීත කාලයෙහි අධික ශීතල දේශගුණය ලෝකයේ මා දන්නා අනෙක් කිසිදු රටක නොමැති තරම් ය. කාන්තාරයේ මායිමේ ඊසාන දිගින් පිටි තවත් පළාතක් නම් සින් සින් තලාස් ය. දින දහසයක් ගමන් කළ විට හමුවන මේ ප්‍රදේශය මහා ඛාන්වරයා යටතේ පවතී. එහි නගර හා පුරවර රාශියකි. ජනතාව ආගම් තුනකට අයත් වේ. ප්‍රතිමා වන්දනා කරන ආගම මහමත් ආගම හා නෙස්ටෝරියානු ක්‍රිස්තියානි ආගම යනුයි.

උතුරු දේශ සීමාවෙහි කඳු වැටියෙහි වානේ සහ ලෝහ ඉල්ලමක් තිබේ. එහි වෙඩි බෙහෙත් වැනි රසායනික ද්‍රව්‍යයක් සහිත ඉල්ලමක් ද ඇත. කිසියම් සත්ව කොට්ඨාසයක් (ගිනි කටුස්සා) ලෙස මේ ගැන සඳහන් කරතුදු එය එසේ නොවේ. එහි යථා ස්වභාවය ඔබට විස්තර කරමි. ගිනි මැද ජීවත් වීමට කිසිම සතකුට නොහැකි ය. සතර මහා භූතයන්ගෙන් නිර්මිත බැවිනි. මේ සම්බන්ධයෙන් නිරවුල් දැනුමක් නොමැති බැවින් ජනයා ගිනි කටුස්සා ගැන කතා කරති. ගිනි අතර ජීවත්වන කටුස්සන් ගැන කියතුදු සත්‍යය එය නොවේ. යථා ස්වභාවය ඔබට විස්තර කරමි. සූර්පිකාර් නමැති මගේ මිත්‍රයෙක් සිටියේ ය. තුර්කි ජාතිකයකු වන හෙතෙම මහා බුද්ධිමතෙකි. හෙතෙම බොහෝ කලක් මේ පෙදෙසේ විසී ය. මහා ඛාන්වරයාගේ සේවය සඳහා ය. මේ වෙඩිබෙහෙත් මිශ්‍ර රසායනික ද්‍රව්‍යය හා වානේ යකඩ ඉල්ලම් කැණීම සඳහා ද නිෂ්පාදනය සඳහා ද ඔහු සිය සේවය කැපකර සිටියේ ය. වසර තුනකට වරක් මහා ඛාන් මේ කර්මාන්තය සඳහා පාලකයන් පත් කළේ ය. මේ ඉල්ලම කැණ එහි

Scanned by CamScanner

කැබලි පිටතට ගත් විට ලොම් වැනි කෙඳි ලැබේ. මේවා ඇත්තේ එකිනෙකට සම්බන්ධව ය. මේ ද්‍රව්‍යය මම ඇසින් දුටුවෙමි. පළමුවෙන් මේවා හොඳින් වියළා විශාල තඹ වංගෙඩියක ලා කොටනු ලැබේ. ඉන්පසු ජලයෙන් සෝදා මඩ හා පස් ඉවත් කැරේ. නූල් හෝ කෙඳි වැනි මේ ද්‍රව්‍යය නූල් මෙන් සකස් කැර රෙදි වියන අයුරින් වියා රෙදි වර්ගයක් සකස් කරගනු ලැබේ. මෙසේ වියා ගන්නා රෙදි සුදු පැහැති නොවේ. එහෙත් කිසියම් වේලාවක් ගින්නෙහි ලා තැබූ කල හිම මෙන් සුදු වේ. කලක් ගත වන විට මේ රෙදි වර්ගය දුඹුරු පැහැය හෝ දුර්වර්ණ වූ විට යළිත් සුලු වේලාවක් ගින්නෙහි ලා පුළුස්සනු ලැබේ. එවිට නැවත වරක් හිම මෙන් සුදු වේ. මේ වස්ත්‍ර දැන් රෝමයේ ඇත. ඉතා අගනා ත්‍යාගයක් ලෙස මහා ඛාන්වරයා එය පාප්තුමා වෙත යැවී ය. අපගේ ස්වාමි වූ ජේසුන් වහන්සේ ගේ අත්පිස්නාව මේ වස්ත්‍රයක ඔතා සුරක්ෂිතව තබා ඇත.

දැන් මේ ප්‍රදේශයෙන් නික්ම ඊසාන දෙසට ගමන් කරන්නෙමි. දින දහයක් ඉදිරියට ගමන් කළ කල්හි ඊසාන දිගින් හමුවන ප්‍රදේශයෙහි විශේෂයෙන් කිව යුතු කිසිවක් නොමැත. එතැන් සිට ඉදිරියට දින දහයක් ගමන් කළ කල්හි හමුවූයේ සූ-චෞ නමැති ප්‍රදේශය ය. එහි නගර හා පුරවර බොහෝ ය. අගනුවර හඳුන්වනුයේ ද සූ-චෞ නමිනි. මෙහි සමහර ජනයා ක්‍රිස්තු ලබ්ධිකයෝ ය. සමහරු පිළිම වන්දනා කරති. මෙකී ප්‍රදේශයත් ඉහතින් අවසානයට සඳහන් කළ ප්‍රදේශ දෙකත් එක් ව ටැන් ගුට් නමැති විශාල ප්‍රදේශය සැදුම් ලද්දේ වෙයි. මෙකී ප්‍රදේශයේ කඳුකරයේ රුබාබ් (තිරස්සවාලු වැනි) නමැති පැළෑටි විශේෂය වැවෙයි. වෙළෙන්දෝ මේ ඖෂධ පැළෑටිය අවට ලෝකයාට අලෙවි කරති. මේ ප්‍රදේශය හරහා ගමන් කරන සංචාරකයෝ තම සිවුපා සතුන් සමග යථෝක්ත කඳුකර ප්‍රදේශයට නොයති. එයට හේතුව විෂ සහිත පැළෑටි වර්ගයක් එහි තිබීම ය. මේ පැළෑටිය අනුභව කළ සිවුපාවුන්ගේ කුර හැලේ. එහෙත් මේ ප්‍රදේශයට ආවේනික සිවුපාවුන් පැළෑටිය ගැන දන්නා බැවින් එය මග හැර යෑමට පුරුදු ය. ඉතා සුවදායක දේශගුණයක් මේ ප්‍රදේශයේ පවතී. මෙරට වැසියන්ගේ ඡවි වර්ණය එළලු ය. කෘෂිකර්මාන්තයෙන් ජීවත්වන මෙහි ජනතාව සුළු වශයෙන් වෙළහෙළඳම් කටයුතුවල ද නිරත වන්නාහ.

Scanned by CamScanner

ඊළඟට අප ගමන් ගන්නේ කාන්-චෞ නමැති විශාල දර්ශනීය පුරවරයට ය. වැන් ගුට් හි අගනුවර එයයි. සමස්ත ප්‍රදේශයට ම ඇති එක ම නගරය ද මෙය වේ. පිළිම වන්දනා කරන ආගම් අදහන්නවුන් ද මහමදිකයන් ද මෙහි වාසය කරනු පෙනේ. ක්‍රිස්තු ලබ්ධිකයන් ද මෙහි වාසය කරන අතර විශාල දේවස්ථාන තුනක් ද නගරයේ පිහිටා තිබේ. පිළිම වන්දනා කරන්නවුන්ගේ ආගමික විහාරාරාමයන් ද, පූජ්‍යස්ථානයන් ද බොහෝ ය. විශාල ප්‍රතිමා මේ පූජ්‍යස්ථායන්හි දැකිය හැකි ය. සමහර ප්‍රතිමා අඩි දහයක් පමණ විශාල ය. ඇතැම් පිළිම දැවයෙන් ද, ඇතැම් පිළිම මැටියෙන් ද, ඇතැම් පිළිම ගලෙන් ද තෙළා ඇති අතර මේ සියලු පිළිම රනින් හා විසිතුරු කැටයමින් අලංකාර වේ. මෙහි විශාල පිළිම සැතපුණු ඉරියව්වෙන් තනා තිබේ. ඒ වටා පිළිම ඇත්තේ ය. බැතිමත්හු මේ පිළිම ප්‍රදක්ෂිණා කරමින් පුද පූජා වන්දනා කරති.

මේ වනතුරු පුද පූජා පවත්වන ආකාරය කීමට නොහැකි විය. එබැවින් මෙහි ජනයා වන්දනාමාන පුද පූජා පවත්වන ආකාරය පහත විස්තරයෙන් පැහැදිලි වේ.

මොවුන් ජීවත්වන්නේ ධර්මානුකූල ප්‍රතිපත්තීනට යටත්ව ය. ඔව්හු සිල්වත් ධාර්මික ජීවිත ගත කරති. සල්ලාලකම් නොතකන නමුදු එය පාපයක් සේ ප්‍රමුඛස්ථානයෙහි ලා නොසලකති. ගැහැනියක් තමන් වෙත ප්‍රේම කරන්නෝ ඒ ප්‍රේමය භාරගැනීම පාපයක් සේ නොසලකති. එහෙත් පළමුවෙන් ම තමා ඒ සඳහා ඉදිරිපත් වන්නේ නම් එය පාපයකි. යම් හෙයකින් පුරුෂයකු අස්වාභාවික ස්ත්‍රී දූෂණයක් කළ හොත් මරණ දඬුවම නියම කැරේ. චන්ද්‍ර චාරය අනුව පොහොය දින පහක් ඔවුන්ගේ මාසයට ඇතුළත් වේ. මේ කාලය තුළ කිසිම සිවුපාවකු හා පක්ෂියකු මැරීම හෝ මස් කෑම තහනම් ය. පාපයකි. මේ විශේෂ පොහෝ දින පහේ දී ඔවුන් සෙසු දිනවලට වඩා ධර්මානුකූල ප්‍රතිපත්ති අනුගමනය කරන බව පෙනේ. භික්ෂූහු මත්ස්‍ය මාංසාහාරයෙන් දිවි හිමියෙන් වැළකී සිටිති. එහෙත් ගිහියන් මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නැත. භාර්යාවන් තිස් දෙනෙකු දක්වා එක් පුද්ගලයකුට පාවා ගත හැකි ය. ඒ ඒ පුද්ගලයාගේ තරාතිරම වත් පොහොසත්කම් අනුව ය. විවාහයේ දී දැවැද්ද දෙනුයේ ගවයන් වහලුන් හා මුදලිනි. පළමුවන භාර්යාවට හැම විට ම ප්‍රධානස්ථානය හිමි වේ.

Scanned by CamScanner

යම් භාර්යාවක් අකීකරු හෝ අප්‍රසාදයට ලක්වී නම් ඇයට රිසි තැනක යෑමට ඉඩ හරිනු ලැබේ. පිරිමි සිය නෑනාවරුන් ද පියාගේ වැන්දඹු භාර්යාවන් ද (තම මව හැර) සහේට ගනිති. අපි පාපයන් සේ සලකන බොහෝ දෑ ඔවුනට පාප ක්‍රියා නොවේ. ඔවුන් ජීවත්වන්නේ සිවුපාවුන් මෙනි.

දැන් ඒ ගැන කළ විස්තර ප්‍රමාණවත් ය. උතුරු ප්‍රදේශයේ අනෙකුත් ස්ථාන දෙසට හැරෙමු. නිකොලෝ මැපෙලෝ සහ මාර්කෝ මේ නගරයේ පුරා වසරක කාලයක් ගත කළහ. එහෙත් එ ගැන අත්දැකීම් හෝ වාර්තා සටහනක් තබා නොමැත. එහෙයින් ඒ ගැන කථා කිරීම පසෙක තබා උතුරු දෙසට දින හැටක් ගමන් කරමු.

කාන් - චෞ නගරයෙන් පිටත් වූ සංචාරකයා දොළොස් දිනක ගමනකින් පසු ළඟාවූයේ එට්සිනා නමැති නගරයට ය. වාලුකා කාන්තාරයේ උතුරු කෙළවර මෙම නගරය පිහිටියේ ය. මෙය ද ටැන්ගුට් පළාතට අයත් වේ. ප්‍රතිමා වන්දනා කරන ආගමක් අදහන මෙහි ජනයාට ඔටුවන් හා ගවයන් බොහෝ වෙති. උකුස්සන් කුරුළුගොයන් ඉතා හොඳින් බෝ වේ. කෘෂිකර්මය මෙහි වැසියන් ගේ ජීවනෝපායයි. වෙළෙඳුන් එහි නොමැත.

මෙහි දී සංචාරකයා දින හතළිහකට අවශ්‍ය මාර්ගෝපකරණ සපයා ගත්තේ ය. එට්සිනා නගරයේ සිට උතුරු දෙසට ගමනාරම්භ කොට දින හතළිහක් මුළුල්ලේ ගෙයක් දොරක් නොමැති පාලු කාන්තාරයේ ගමන් කෙළේ ය. කඳුකරයෙහි ද නිම්න ප්‍රදේශයෙහි ද හැරුණු විට ග්‍රීෂ්ම කාලයෙහි මෙහි කිසිවකුත් වාසය නොකරති. වන සත්තු මෙහි වසෙති. වල් බූරුවන් බහුල ය. පයින් ගස් ද වැවේ. උතුරු දිගට දින හතළිහක් ගමන් කළ පසු කාන්තාරය ගෙවා තවත් ප්‍රදේශයකට ළඟා විය හැකි ය. එනම් කරකෝරුම් නගරයට ය. මේ නගරයේ වටප්‍රමාණය සැතපුම් තුනකි. විශාල මැටි තාප්පයකින් මේ නගරය වට කැර තිබේ. එයට හේතුව මේ ප්‍රදේශයේ ගල් හිඟකම ය. ටාටර්වරුන් ඔවුන්ගේ නගරයෙන් පැමිණ පළමු වරට අල්ලා ගත්තේ මේ ප්‍රදේශයයි.

ටාටර්වරුන් පිළිබඳ ප්‍රවෘත්තිය ද ඔවුන් සිය අධිරාජ්‍ය බලය ලෝකය පුරා ව්‍යාප්ත කළ ආකාරය ද දැන් ඔබට විස්තර කරමි.

Scanned by CamScanner

ටාටර්වරුන් විසූයේ ඈත උතුරු ප්‍රදේශයේ චෝර්චා ප්‍රදේශයේ ය. මෙය බොහෝ දුරට විහිද ගිය නිම්න භූමියකි. එය ජන ශූන්‍ය ය. එහෙත් සරුසාර ය. ගංගා ගලා බස්නා බැවින් ජල හිඟයක් නොමැත. ඔවුන්ට අධිපතියකු සිටියේ නැත. එහෙත් උන්ග් ඛාන් යනුවෙන් ඔවුන්ගේ භාෂාවෙන් හඳුන්වන බලවතකුට ගෞරව දැක්වූහ. එහි අරුත ශ්‍රේෂ්ඨ බලධාරියා යනුයි. මේ වූ කලී ප්‍රෙස්ටර් ජෝන් ය. ලෝකයේ සුප්‍රසිද්ධ ඔවුන්ගේ අධිරාජයා ය. සෑම සිවුපාවුන් දස දෙනෙකුගෙන්ම එකකු ඔහු ගෞරවයක් වශයෙන් පිරිනැමූහ. ඒ හා සමගම මේ ප්‍රදේශය ජනාකීර්ණ වූයේ ය. මෙසේ ජනගහනය වර්ධනය වීම භයානක අනතුරක් බව ප්‍රෙස්ටර් ජොන් අවබෝධ කැර ගත්තේ ය. ඔහු මෙම ජනගහනය කොටස් තුනකට බෙදා රටවල් රාශියකට පිටත් කැර හැරියේ ය. එසේම ඔහුගේ සෙන්පතියන් කිහිප දෙනෙක් ද ඒ ප්‍රදේශ කරා යවන ලදී. මේ කරුණ සම්පූර්ණ කරනු සඳහා ය. ප්‍රෙස්ටර් ජෝන් ගේ ක්‍රියා කලාපය ටාටර්වරුන්ට වටහා ගත හැකි විණි. මේ නිසා ඔවුන් මහත් අසහනයට පත්ව සෙසු ජනයාගෙන් වෙන්ව උතුරු පෙදෙසේ කාන්තාර ප්‍රදේශයකට ගමන් ගත්හ. ඔවුනට කරදර කිරීමට ඔහුට නොහැකි වන පරිද්දෙනි. මේ ජනයා ඔහුට එරෙහිව කැරලි ගැසූහ. ටික කලක් ඔව්හු මෙසේ කැරලි ගසමින් සිටියෝ ය.

අපගේ ජේසු ස්වාමිදරුවාණන්ගේ උත්ථානය සිදුවූ 1187 වර්ෂයෙහි ටාටර්වරු තමන්ගේ අධිපතියා තෝරාපත් කර ගත්හ. ඔවුන්ගේ භාෂාවෙන් මේ රජු හැඳින්වූයේ චිංගීස් ඛාන් යනුවෙනි. හෙතෙම ශූර බුද්ධිමතෙකි. ව්‍යක්ත කථිකයෙකි. දීප්තිමත් සොල්දාදුවෙකි. මේ තෝරා ගැනීමෙන් පසු ටාටර්වරු ලෝකයේ නොයෙක් රටවල පැතිරී ගිහ. එමගින් චිංගීස් ඛාන් හට ඔහුගේ අධිපතිත්වය වටහා ගත හැකි විය. ඔහු ඉන් නිසි ඵල ප්‍රයෝජන ලබාගත්තේ ය. ඉන් ඔබ්බට මා ඔබට කුමක් කියන්නද? ටාටර්වරු ඔහු පිරිවරා ගත්හ. චිංගීස් ඛාන් මේ පිරිස දුනු ඊතල හා ඔවුන්ගේ චිරාගත අවි ආයුධවලින් සන්නද්ධ කෙළේ ය. ඉක්බිති ප්‍රදේශ යටත් කැර ගැන්ම සඳහා පිටත් කර හරින ලදී. ඔව්හු ප්‍රදේශ අටක් ජයගත්හ. ඔහු ඒ ප්‍රදේශවල වැසියන්ට හානි කෙළේ නැත. දේපළ විනාශ කෙළේ ද නැත. එහෙත් ඔහු ඒ ප්‍රදේශ තම ආධිපත්‍යයට නතු කැර ගත්තේ ය. ඒ ඒ ප්‍රදේශවල ජනයා ඔහුගේ යහපත් රාජ්‍ය

Scanned by CamScanner

පාලනයෙහි ආධිපත්‍යය පිළිගත්හ. අති විශාල ජන සංඛ්‍යාවක් ඔහුගේ යටත් වැසියන් වූහ. සමස්ත පෘථිවි තලයම පාහේ ඔහුගේ ආධිපත්‍යයට නතු කැර ගත හැකි යයි සිතී ය.

ක්‍රි. ව. 1200 දී චිංගීස් ඛාන් ප්‍රෙස්ටර් ජෝන් වෙත දූත පිරිසක් යැවී ය. ප්‍රෙස්ටර් ජෝන් ගේ දියණිය පාවා ගැන්මට මංගල යෝජනාවක් කරමිනි. මෙය තමාට කළ නිග්‍රහයක් අවමානයක් ලෙස සිතූ ප්‍රෙස්ටර් ජෝන්,

"චිංගීස් ඛාන්ට ලජ්ජ නැද්ද මගේ දුව ගැන මඟුල් අහන්න. ඔහු මගෙ යටත් වැසියෙක්. ඔහු මගේ දාසයෙක් බව දන්නෙ නැද්ද?" යනුවෙන් කෝපාවිෂ්ට ව ගුගුළේ ය.

"චිංගීස් ඛාන්ට මගෙ දුව දෙනවට වඩා හොඳයි ගිනි ගොඩකට විසි කරනවා! චිංගීස් ඛාන්ට ගිහිං කියාපල්ලා මං කියාපු දේ. දැන් මට හොඳ පොටක් පෑදිලා තියෙනවා එයාව මරල දාන්න. ද්‍රෝහියකු වශයෙන් බියගුල්ලකු හැටියට. යටහත් ප්‍රධානියකු ලෙස?"

මෙසේ කෝපාවිෂ්ටව බෙරිහන් දුන් ප්‍රෙස්ටර් ජෝන් දූතයන් පන්නා දැමූයේ යළිත් කිසි විටෙකත් එහි නොපැමිණෙන ලෙස නියෝග කරමිනි.

දූතයන් ආපසු චිංගීස් ඛාන් වෙත ගොස් ප්‍රෙස්ටර් ජෝන් පැවසූ වදන් අකුරකුදු නොහැර දන්වන ලදී.

එපවත් ඇසූ චිංගීස් ඛාන් හද පැළී යන තරම් ශෝකයට පත් විය. එසේ ම කෝපය ද නිම් හිම් නොමැති විය. ඔහුට සිය ආධිපත්‍යය පිළිබඳ අභිමානයක් පැවතිණ. හෙතෙම ටික දිනක් නිහඬව සිටියේ ය. ප්‍රෙස්ටර් ජෝන් කළ අවමානයට පළිගත යුතු බැව් තමන් වහලෙක් දැයි පෙන්වන බවත් උච්චස්වරයෙන් සියල්ලන්ටම ඇසෙන සේ හඬ නැඟුවේ ය. ඔහු සිය බලසම්පන්න යුධ නිලධාරීන් සෙන්පතියන් කැඳවා යුද්ධයට අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කෙළේ ය. ඉක්බිති ඔහු ප්‍රෙස්ටර් ජෝන් හට පනිවිඩයක් යැවූයේ තමන් යුද්ධයකට පැමිණෙන බවත් ඉතා හොඳින් ආරක්ෂාව සලසාගන්නා ලෙසත් දනිවමිනි.

ප්‍රෙස්ටර් ජෝන් මේ පණිවිඩය ගණනකට ගත්තේ නැත. ඔහු කීවේ චිංගීස් ඛාන්ගේ සේනාවට බලයක් නොමැති බවයි. යම් හෙයකින් චිංගීස් ඛාන් පැමිණිය හොත් ඔහු අල්ලා මරා දමන බව

Scanned by CamScanner

කීවේ ය. සිය සේනාවට සූදානම් වන සේ ප්‍රෙස්ටර් ජෝන් පණිවිඩ යැවී ය. විශාල සේනාවක් සටනට සූදානම් වී පැමිනුණි. දෙපක්ෂයේ සේනාවන් සටන සඳහා පෙරමුණ ගමන් ගති. මේ පිළිබඳ විස්තර කථාව දීර්ඝ වශයෙන් කීමෙන් ඇති ඵලය කුමක් ද? චිංගීස් ඛාන් හා ඔහුගේ සේනාව සුන්දර විශාල නිම්න භූමියක් කරා පැමිණියේ ය. මේ ප්‍රදේශය හැඳින්වූයේ ටෙන්දුක් නමිනි. ප්‍රෙස්ටර් ජෝන් ගේ හමුදාව මුණ ගැසීම සඳහා පෙරමුණට ගමන් ගත් චිංගීස් ඛාන්ගේ බල සෙනග මෙපමණකැයි කිව නොහැකි තරම් අසංඛ්‍ය ය. ප්‍රෙස්ටර් ජෝන් ගේ සේනාව එහි පැමිණෙන බව ඇසූ චිංගීස් ඛාන් සතුටින් පිනා ගොස් සතුරා පිළිගැනීමට සූදානම් විය. සටන් කිරීමට හොඳින් ඉඩකඩ ඇති ප්‍රදේශයකට පැමිණෙන බැවිනි. චිංගීස් ඛාන් ප්‍රෙස්ටර් ජෝන් පැමිණෙන තුරු බලා සිටියේ යුද්ධය ආරම්භ කිරීම සඳහා ය.

දැන් චිංගීස් ඛාන් හා ඔහුගේ සේනාව ගැන කථා කිරීම මඳකට නවතා ප්‍රෙස්ටර් ජෝන් හා ඔහුගේ සේනාව දෙසට හැරෙමු.

ප්‍රෙස්ටර් ජෝන් ද තම සේනාව සමග ඉදිරියට ගමන් ගත්තේ ය. ටෙන්දුක් නිම්නය කරා පැමිණ චිංගීස් ඛාන්ගේ සේනාව කඳවුරු ගසා සිටි ස්ථානයට සැතපුම් විස්සක් ඈතින් කඳවුරු ගැසී ය. දෙපිරිසම සටන් දිනය එළඹෙන තුරු විවේක ගනිමින් උද්‍යෝගවත්ව සිටියහ. දැන් මේ සේනාවන් දෙකම රැඳී සිටිනුයේ ටෙන්දුක් නිම්නයේ ය. මේ අතර දිනක් චිංගීස් ඛාන් ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන් තමන් හමුවට කැඳවී ය. ක්‍රිස්තියානි හා සැරසින් ජ්‍යොතිෂ් ශාස්ත්‍රඥයෝ එහි පැමිණියහ. ප්‍රෙස්ටර් ජෝන් හා තමන් අතර සිදුවන යුද්ධයෙන් ජය අත්වන්නේ කවුරුන්ට දැයි චිංගීස් ඛාන් විමසී ය. ඔව්හු තම ශාස්ත්‍ර ඥානය මෙහෙයවා විමසා බැලූහ. සැරසින් ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන් කීවේ තමනට එයට පිළිතුරු සැපයිය නොහැකි බව ය. එහෙත් ක්‍රිස්තියානි ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ මේ වගකීම භාරගත්හ. ඔවුන් ලී දඬුවක් ගෙන සමාන කොටස් දෙකකට බෙදා එක් කොටසක් එක් පසෙකින් ද අනෙක් කොටස අනෙක් පසින් ද තැබූහ. එක් කැබැල්ලක් චිංගීස් ඛාන් වශයෙන් ද අනෙක් කැබැල්ල ප්‍රෙස්ටර් ජෝන් යනුවෙන් ද නම් කරන ලදී. කිසිවකු හටත් මේ ලී කැබැලි ස්පර්ශ කිරීමට ඉඩක් ලැබුණේ නැත.

ඉක්බිති ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ චිංගීස් ඛාන් ඇමතූහ.

Scanned by CamScanner

"උතුමාණෙනි, මේ එක ලී කැබැල්ලක් නම් කැර ඇත්තේ ඔබේ නමිනි. අනෙක් ලී කැබැල්ල ප්‍රෙස්ටර් ජෝන් ගේ නමිනි. අපගේ මන්ත්‍ර ජප කිරීමෙන් පසු මෙයින් එක් ලී කැබැල්ලක් එසවුණහොත් එහි නම සඳහන් තැනැත්තා යුද්ධයෙන් ජයගනු ඇත." චිංගීස් ඛාන් මේ සිදුවීම දැක ගැන්මට සූදානම් වූයේ නොඉවසිල්ලෙනි. ක්‍රිස්තියානු ජ්‍යොතිර්වේදීහු ගීතිකා පෙත රැගෙන මන්ත්‍ර ජප කිරීමට පටන් ගත්හ. මන්ත්‍ර ජප කිරීමෙන් පසු චිංගීස් ඛාන් යනුවෙන් නම් කැර ඇති ලී කැබල්ල ඉහළට එසවී ප්‍රෙස්ටර් ජෝන් යනුවෙන් නම් කැර ඇති ලී කැබැල්ල මත පිහිටියේ ය. කිසිවකුගේත් ස්පර්ශයකින් තොරව ය. සියලු දෙනා මේ සිද්ධිය ඇස් පනාපිට දුටහ. මේ දර්ශනයෙන් චිංගීස් ඛාන් මහත් උද්දාමයට පත් විය. ක්‍රිස්තියානි පූජකයින් සත්‍යවාදී බව ඔහු කීය. ඉන්පසුව ඔහු ක්‍රිස්තියානීන් හට සැලකුයේ මහත් ගරු බුහුමන් සහිතව ය. ක්‍රිස්තියානින් සත්‍යවාදී බවත් පූජකයන් සැබෑ ශුද්ධවන්තයන් බවත් ඔහුගේ නිගමනය විය.

දින දෙකකට පසු දෙසේනාවන් අතර යුද්ධය ආරම්භ විය. මෙය අතිශය දරුණු භයානක යුද්ධයකි. දෙපිරිසෙන්ම විශාල සංඛ්‍යාවක් අනතුරට පත්වූහ. එහෙත් අවසානයේ ජයග්‍රාහකයා වූයේ චිංගීස් ඛාන් ය. මේ යුද්ධයේ දී ප්‍රෙස්ටර් ජෝන් මරුමුවට පත්විණ. සටනේ දී අතක් අහිමි වුවද චිංගීස් ඛාන් දිගින් දිගටම සිය සටන ව්‍යාප්ත කෙළේ ය. පුරා ඉදිරි සවසරක් චිංගීස් ඛාන් බොහෝ නගර හා ප්‍රදේශ යටත් කැර සිය අණසක පැතිරවීය. හෝ - චෞ නමැති නගරයේ දී දණහිසට වැදුණු හී පහරකින් තුවාල ලැබූ චිංගීස් ඛාන් රෝගාතුරව මිය ගියේ ය. එය අභාග්‍යයකි. එහෙත් චිංගීස් ඛාන් විචක්ෂණ දූරදර්ශී නිර්භීත පාලකයෙකි. චිංගීස් ඛාන් නමැති පාලකයා ටාටර්වරුන් විසින් තෝරාගත් ආකාරය ඉහත සඳහන් කෙළෙමි. ප්‍රෙස්ටර් ජෝන් අධිපතිත්වයට පත්වූ ආකාරය ද කීවෙමි. දැන් ඔවුන්ගේ චාරිත්‍ර වාරිත්‍ර හා ඇවතුම් පැවතුම් විස්තර කළ යුතුව තිබේ.

චිංගීස් ඛාන්ගේ මරණයෙන් පසු ඔවුන් සිය පාලකයා වශයෙන් පත්කැර ගත්තේ කුයුක් ඛාන් ය. ඊළඟට පාලකයා වූයේ බාටුඛාන් ය. අල්ටවු ඛාන් සිවුවැන්නා ය. පස්වැන්නා මොන්ගු ඛාන් ය. හවැන්නා කුබ්ලයි ඛාන් ය. ඔහු අන් සියලු දෙනාටම වඩා ශ්‍රේෂ්ඨතර ය. අනෙක්

Scanned by CamScanner

පස් දෙනා එක්කොට ගත් කල්හි පවා කුබ්ලයි ඛාන්ගේ බලය ඉතා උසස් තලයක පවතී. සියලු ක්‍රිස්තියානි රජුන් හා සැරසින් පාලකයන් එක්කොට සලකා බැලුව ද ඒ සියලු දෙනා අභිභවා යෑමේ බලයක් කුබ්ලයි ඛාන් සතු විය. මේ බව මගේ කෘතියෙහි ඉදිරිපත් කැරෙන කරුණුවලින් පැහැදිලි වනු ඇත.

චිංගීස් ඛාන්ගේ පටන් පැවැත එන සියලු අධිපතීන් මිහිදන් කරන සුසානය වූයේ අල්තායි නමින් හැඳින්වෙන කඳුකරයයි. යම් කිසිවකු මළ විට දින සියයක ගමනක් තරම් දුර බැහැර වුවද මිහිදන් කිරීම සඳහා මේ කඳුකරයට ගෙන යා යුතු වේ. මෙහි දී සිහි තබාගත යුතු කරුණක් වෙයි. ඛාන්වරයකු (අධිපතියකු) මියගිය කල්හි දින හතළිහක් හෝ ඊට අඩු හෝ වැඩි හෝ දුර ගමනක් වුවද සහපිරිවර සමග මෘත දේහය මේ කඳු මුදුනට ගෙන යනු ලැබේ. මෘත ශරීරය කැටුව ගිය පිරිස ද එහි දී මරා දැමීම සිරිත ය.

"පලයව් - වැළපියව්! තොපගේ අධිපතියාට මතු භවයේ සේවය කරව්!" කියා ආඥා පනවා මරා දමති. මතු භවයේ දී මෙසේ මිය යන පිරිස මහා ඛාන්වරයාගේ පිරිවර වශයෙන් උපදිතැයි විශ්වාසයක් ඔවුන් කෙරෙහි පවතී. ඛාන්වරයාගේ අශ්වයන් ද මේ සමගම මෙලෙසින්ම මරා දමනු ලැබේ. අශ්වයන් ද මතු ආත්ම භාවයේ දී ඛාන්වරයා ගේ මෙහෙවරට උපදිතැයි විශ්වාස කැරේ. මෙසේ මරා දමන්නේ ඛාන්ගේ විශිෂ්ට ගණයේ අශ්වයන් ය.

මොන්ගු ඛාන් මියගිය අවස්ථාවෙහි දී මෘත ශරීරය සමග ගමන් ගත් විසි දහසක පිරිස මරා දමන ලද්දේ යථෝක්ත විශ්වාසය පදනම් කැර ගනිමිනි.

තවමත් මා කථා කරන්නේ ටාටර්වරුන් ගැන ය. ඔවුන් ගැන කථා කිරීමට බොහෝ දෑ ඇත්තේ ය.

ඔවුන් ශීත සෘතුව ගත කරන්නේ තණ බිම් සහිත උෂ්ණ ප්‍රදේශවල ය. ඔවුන්ගේ සිවුපාවනට ආහාර පාන සුලභ බැවිනි. උෂ්ණ කාලයෙහි ශීතල දේශගුණය සහිත ප්‍රදේශවලට සංක්‍රමණය වෙති. කඳුකරය අතර නිම්න ප්‍රදේශයන්හි ය. සීතල ප්‍රදේශවල ඇටමැස්සන් හෝ අශ්වයන්ට පීඩාකාරී මැසි උවදුරු නොමැත. මාස දෙක තුනක් ඔවුහු මේ ප්‍රදේශවල ගත කරති. එසේම තැනින් තැනට මේ කාලය තුළ සංක්‍රමණය වෙති.

Scanned by CamScanner

ඔවුන්ගේ නිවාස රවුම් ය. ලී දඬුවලින් තනා පොතු වර්ගවලින් ආවරණය කැරේ. රෝද හතරක් සහිත කරත්ත ඔව්හු යන යන තැන ගෙන යති. ඉතා හොඳින් සකස් කළ මේ කරත්ත රිසි පරිදි ගෙන යා හැකි තරමට සැහැල්ලු ය. ඔවුන්ගේ නිවාස හැම විටම විවෘත ය. දොරටුව ඇත්තේ දකුණු දිසාවට ය. රෝද දෙකේ කරත්ත ද ඔව්හු පාවිච්චි කරති. ඝන ලොම් රෙදි විශේෂයකින් මේ කරත්ත ආවරණය කැර තිබේ. වර්ෂාවක දී නොතෙමෙන ලෙසිනි. මේ කරත්ත ඉතා ක්‍රමානුකූලව සකස් කර ඇත. හරකුන් හෝ ඔටුවන් මේ කරත්ත ඇදීම සඳහා යොදා ගැනේ. ගමන් බිමන් වල දී අඹුදරුවන් ද, බඩු බාහිරාදිය ද ගෙන යන්නේ මේ කරත්ත වලිනි.

මෙහි වෙළහෙළඳම් කටයුතු කරන්නේ කාන්තාවන් ය. ගෘහෝපකරණ සියල්ල ගෙනෙනු ලබන්නේ ද කාන්තාවන් විසිනි. මේ කටයුතුවලට පිරිමි හවුල් නොවෙත්. දඩයම් යුද්ධ කටයුතු හා සතුන් පුහුණු කිරීම ආදිය ඔවුන්ගේ සිරිත ය. මස් සහ කිරි ඔවුන්ගේ ආහාර ය. තණබිම්වල බහුල මීයන් ද දඩයම් කරති. අශ්වයන්ගේ මස් බල්ලන්ගේ මස් කෑම හෝ වෙළඹුන්ගේ කිරි බීම තහනම් නොවේ. ඕනෑම වර්ගයක මස් මෙහි ජනයා අනුභව කරති. අන්‍යයකුගේ භාර්යාවක් ස්පර්ශ කිරීම පවා බරපතල වරදක් ලෙස සලකති. මෙහි කාන්තාවෝ ස්වකීය ස්වාමි පුරුෂයනට අවනත ය. ඉතා හොඳ පවුල් ජීවිතයක් ගත කරති. ඉතා හොඳින් පවුලේ වගකීම් උසුළති. එක් පවුලක සාමාජික සංඛ්‍යාව දහයක් විස්සක් පමණ වේ. ඔවුන් හැම දෙනාම එකමුතුව හොඳින් සාමකාමීව කාලය ගත කරන අතර තම තමනට අයත් වැඩ කටයුතුවල යෙදේ. සිත් පීඩාගෙන දෙන වචනයක් පවා ඔවුන් වෙතින් නොඇසේ. දූ දරුවන් හොඳින් රැක බලා ගනිමින් පවුලේ එදිනෙදා කටයුතුවල නිරත වේ. පොදු හැඟීමෙන් එවැනි කටයුතුවල යෙදේ. එක් පුරුෂයකුට භාර්යාවන් කැමැති ප්‍රමාණයක් රඳවා ගත හැකි ය. තමන්ට නඩත්තු කළ හැකි නම් ස්ත්‍රීන් සියයක් වුවද පාවා ගත හැකි ය. ස්වාමියා භාර්යාවගේ මවට දෑවැද්දක් දෙයි. භාර්යාවගෙන් ස්වාමියාට එවැනි දෑවැද්දක් නොලැබේ. පළමුවන භාර්යාවට වඩාත් හොඳ සැලකිලි ලැබේ. හැමවිටම ප්‍රමුඛස්ථානය හිමිවනුයේ ඇයට ය. භාර්යාවන් සංඛ්‍යාව වැඩිවන බැවින් දූ දරු සංඛ්‍යාව ද අධික

Scanned by CamScanner

වේ. ඔවුන් අතර ඇවැස්ස නෑකම අනුව ආවාහ - විවාහ සිදු කැරේ. පියා මියා ගියහොත් පියාගේ භාර්යාවන් වැඩිමහල් පුත්‍රයා විසින් පාවාගනු ලැබේ. තමාගේම මව හැර අනෙක් භාර්යාවන් පාවා ගැනීම සිරිතකි. වැඩිමහල් සහෝදරයකු මළ කල්හි ඔහුගේ භාර්යාව අනෙක් සහෝදරයකු පාවා ගනී. මේ ජනයා උත්කර්ෂවත් ලෙස විවාහ මංගල උත්සව පවත්වති.

මීළඟට මා කියන්නේ ඔවුන්ගේ ආගම ගැන ය. ශ්‍රේෂ්ඨතම දෙවියකු කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය පවතී. මේ උත්කෘෂ්ට දෙවියන් වෙත යාඥා පුද පූජා පවත්වන්නාහ. සුවඳ දුම් හා වෙනත් ද්‍රව්‍ය මේ පූජාවන් අතර වේ. ඔවුන්ගේ ප්‍රාර්ථනාව යහපත් සෞඛ්‍යය හා බුද්ධිමත් භාවයයි. නටිගායි නමැති ඔවුන්ගේම දෙවියකු ද අදහනු ලැබේ. මේ දෙවියා භූමාටු ය. දරුවන් ද, සිවුපාවුන් ද, ගොවිතැන් ද ආරක්ෂා කරනු ලබන්නේ මේ දෙවියා විසිනි. සෑම නිවසකම මේ දෙවියන්ගේ පිළිරුවක් සන ලොම් හා රෙදිවලින් තනා පූජා පවත්වනු ලැබේ. එපමණක් නොව නටිගායි දෙවියන්ගේ පතිනියන්ගේ ද, දරුවන්ගේ ද පිළිරූ එලෙසම නිර්මාණය කැරේ. දෙවියන්ගේ හමුදා අධිපතියකු යම්කිසි මෙහෙයුමකට පිටත් කැර හරින්නේ නම් දස දහසක හමුදාවේ ප්‍රධානියාට අණ කරන්නේ දහසක හමුදාවක් ඔහුට ලබා දෙන ලෙස ය. ඉක්බිති ඔහු දහසක හමුදාවේ ප්‍රධානියාට යථෝක්ත නියෝගය නිකුත් කරයි. ඉක්බිති ඒ නියෝගය පහළ තලයට යොමුකැරෙන අතර දහසක හමුදා භටපිරිස ලබා දෙන ලෙස නියෝග කැරේ. නියෝගය ලද වහාම යථෝක්ත කාර්යය නොපමාව සම්පාදනය කරනු ලැබේ. ලෝකයේ අනෙක් කිසිදු ස්ථානයක දක්නා නොලැබෙන තරම් පක්ෂපාතී භාවයක් මේ හමුදාවන්හි දැකිය හැකි ය. 100,000ක හමුදා සේනාංකය මේ රටෙහි හඳුන්වනු ලබන්නේ "තුක්" නමිනි. 10,000 ක හමුදා සේනාංකයක් හැඳින්වෙනුයේ "ටොමැටන්" නමිනි. එසේම දහසක, සියයක හා දහයක හමුදා කණ්ඩායම් හැඳින්වීම සඳහා ද විශේෂ නම් යෙදේ.

කිසියම් නිම්න ප්‍රදේශයක හෝ කඳුකරයක ඔවුන් යුද මෙහෙයුමක් සැලසුම් කරන්නේ නම් පළමුවෙන් ඔත්තු බැලීම සඳහා 200 ක සේනාවක් යවනු ලැබේ. ඉන් දෙදිනකට පසු තවත් එවැනි පිරිසක් යවයි. සේනාව සමග ද සේනාව පසු පසින් ද තවත් ඔත්තු

Scanned by CamScanner

කාර සේනාංක දෙකක් යවනු ලැබේ. එවිට සම්පූර්ණ ඔත්තුකාර සේනාංක සංඛ්‍යාව හතරක් වේ. ඔවුන් මෙසේ කරන්නේ දැනුම් දීමකින් තොරව පහර දීමට යුද හමුදාවට නොහැකි වන පරිද්දෙනි.

දීර්ඝතම විශාල යුද මෙහෙයුමක් සඳහා ඔවුන් නික්ම යන කල්හි බඩු බාහිරාදිය විශාල ප්‍රමාණයක් පොදි බැඳ ගෙන යන්නේ නැත. ඔවුන් ගෙනයන්නේ සම් පසුම්බි දෙකක් පමණි. බීමට අවශ්‍ය කිරි දමා ගැනීමට හා ආහාර පිසින බඳුනක් මේ පසුම්බි දෙකෙහි ගෙන යති. වර්ෂාවෙන් ආරක්ෂා වීම සඳහා කුඩා කූඩාරමක් ද ගෙන යනු ලැබේ. පුරා දින දහයක්ම ගමන් කරන ඔවුන් කිසිදු ආහාරයක් පිළියෙල කැරගන්නේ නැත. මෙසේ ගමන් කරන සෑම අශ්වාරෝහකයෙක් ම අශ්වයාගේ නහරයක් සිදුරු කැර ලේ උරා බොති. පිටි කිරි ද පානය කරති. එය තලපයක් මෙන් ඝන ආහාරයකි. ඔවුන් වියළි පිටි කිරි සාදාගන්නේ මෙසේ ය. පළමුව කිරි උතුරන තුරු රත්කරනු ලැබේ. කිරි උණුකිරීමෙන් පසු මිදෙන යොදය වෙනත් භාජනයකට දමා බටර් පිළියෙළ කැර ගැනේ. දිගු කලක් පවත්නා පරිද්දෙන් කිරි වියළා ගැනීමට නොහැකි නිසා ය. යොදය ඉවත් නොකළ කිරි අව්වේ තබා වියළා දිගුකල් තබාගත නොහේ. යොදය ඉවත් කළ කිරි ඉන්පසු අව්වේ තබා වියළා ගැනේ. මෙසේ වියළාගත් කිරි රාත්තල් දහයක් පමණ යුද මෙහෙයුමක් සඳහා පිටත්ව යන කල්හි ගෙනයති. මේ පිටිකිරි ලබු ගෙඩියක හැඩය ඇති සම් පැසක දමා තමන් කැමැති ප්‍රමාණයක් ජලය දමා රාත්තල් භාගයක් පමණ පිටිකිරි කවලම් කැර සෑම උදයක ම බොති. අශ්වයා පිට ගමන් කරන විට වතුර සමග මුසුකළ පිටි කිරි නිසි පදමට දියවේ. මෙය ඔවුන්ගේ උදය ආහාරය වේ.

සතුරන් සමග සටනට එළැඹි කල්හි ඔවුන් අනුගමනය කරන්නා වූ ක්‍රමෝපායයන් මෙසේ ය. ඔව්හු උපායක් ලෙස පසුබැස යෑමට ද ලජ්ජා නොවෙති. එසේ පසුබැස ගොස් වෙනත් තැනක දී පහර එල්ල කරති. ඔවුන්ගේ අශ්වයන් මේ උපක්‍රමයන් සඳහා මනා ලෙස පුහුණු කැර ඇත. සුනඛයන් මෙන් වේගයෙන් දිව ගොස් ආපසු කරකැවී පැමිණීමට හැකිවන ලෙසිනි. මෙසේ පළාගොස් නැවත වේගයෙන් ආපසු හැරී මුහුණට මුහුණ ලා සතුරන් හා සටන් කරති. ඊතල විද අශ්වාරෝහකයන් ද, අශ්වයන් ද මරා දමන්නාහ. මෙබඳු යුද උපක්‍රම භාවිතා කරමින් සතුරන් බිඳහෙළා

Scanned by CamScanner

බොහෝ ජයග්‍රහණ අත්කර ගත්හ. බොහෝ ප්‍රදේශ යටත් කැර ගත්හ.

මා ඉහත සඳහන් කෙළේ අමිශ්‍ර ටාටර්වරුන්ගේ ක්‍රියා ශූරත්වයයි. චාරිත්‍ර හා විධික්‍රමාවලියයි. එහෙත් කැතේ පුරයේ වාසය කරන ජනයා දේවභක්තිකයන් සමග මිශ්‍ර වී සිටිති. ඔවුන්ගේ සිරිත් විරිත් අනුගමනය කරනු ලැබේ. ලෙවන්ට් හි වාසය කරන ජනයා සැරසින්වරුන්ගේ ඇදහිලි විශ්වාස සිරිත් විරිත් අනුගමනය කරන්නාහ.

ඊළඟට මා විස්තර කරන්නේ ටාටර්වරුන්ගේ යුක්තිය පසිඳලීමේ අධිකරණයේ ස්වභාවයයි. ප්‍රධාන පෙළේ අපරාධ නොව සුළු පරිමාණයේ සොරකම් ආදිය සඳහා කෝටුවකින් පහර දෙනු ලැබේ. පහර දාහතක්, විසිහතක්, තිස්හතක් ආදි වශයෙන් දහයෙන් දහය වැඩි කරමින් පහර එකසිය හතක් දක්වා දඬුවම් දීම නීතියයි. මේ පහර දීම නිසා බොහෝ වරදකරුවන් මිය යති. අශ්වයකු සොරකම් කිරීම වැනි වරදකට දෙන දඬුවම කඩුවෙන් දෙකඩ කිරීම ය. මේ දඬුවමෙන් මිදීමට නම් සොරාගත් භාණ්ඩයේ වටිනා කම මෙන් නව ගුණයක දඩයක් ගෙවිය යුතු ය. එසේ දඩය ගෙවූ කල්හි සෙසු දඬුවම්වලින් නිදහස් වේ.

සියලු ප්‍රධානීන් හා අනෙකුත් අයිතිකරුවන් තමන්ගේ සතුන් හංවඩු ගසා ඇත. අශ්වයන්, වෙළඹුන්, ඔටුවන්, ගවයන්, දෙනුන් හ අනෙකුත් විශාල සිවුපාවුන් තම අයිතිය දැක්වෙන පරිදි හංවඩු ගසනු ලැබේ. මෙසේ හංවඩු ගැසූ සිවුපාවුන් තණපිටි හා කඳුකර ප්‍රදේශයන්හි මුදා හැරීම සිරිත ය. ඔවුන් රැක බලා ගැන්ම සඳහා එඬේරුන් නැත. සමූහ වශයෙන් ගැවසුණ ද මේ සත්තු නිසි ලෙස හිමිකරු වෙත පැමිණෙති. ඔවුන්ගේ බැටලු කොටලු ආදි සතුන් විශාල ය. පුෂ්ටිමත් ය. අනර්ඝ ය.

මේ ජනයා අතර එක්තරා අරුම පුදුම චාරිත්‍රයක් පවතී. එය මේ වන තුරු ඔබට පැවසීමට අමතක විය. යම් හෙයකින් මෙහි කෙනෙකුගේ සිවු හැවිරිදි පිරිමි දරුවකු මියගිය හොත්, එසේම තවත් කෙනෙකුගේ ගැහැනු දරුවකු මියගිය හොත් ඔවුන් දෙදෙනා අතර විවාහ මංගල්‍යයකට කටයුතු පිළියෙළ කැරේ. මියගිය දැරිය මියගිය දරුවාට පාවාදුන් ලෙසට විවාහ ගිවිසුමක් පිළියෙළ කරනු

Scanned by CamScanner

ලැබේ. ඉන්පසු මේ විවාහ ගිවිසුම් පත්‍රය පුළුස්සති. මෙසේ පිළිස්සීම නිසා නැගෙන දුම අහසට නැගී සුළඟේ පාවී ගොස් ඊළඟ ආත්ම භාවයේ දී ඔවුන් දෙදෙනාට අඹු සැමියන් ලෙස ජීවත්වීමට අවශ්‍ය පසුබිම සකස් වේ. මේ කරුණ අරභයා ඔව්හු විවාහ මංගලෝත්සවයක් මහ ඉහළින් පවත්වති. මෙහි දී තැනින් තැන ගොඩගසන ආහාර පාන රසමසවුළු ඊළඟ ආත්මයේ තම දරුවන්ට ලැබෙන බව විශ්වාස කරති. මේ හැරුණු විට කඩදාසි වල විවිධ පුද්ගලයන්ගේ ද, අශ්වයන්ගේ ද, ඇඳුම් පැළඳුම්වල ද, මුදල්වල ද, ගෘහභාණ්ඩවල ද චිත්‍ර ඇඳ ඒ සමගම පුළුස්සති. ඔවුන් මෙසේ කරන්නේ තම දරුවන්ට මතු ආත්මයේ දී මෙලොවදී ලැබුණු පරිදි දැසි දසුන් සතා සතුන් ඇඳුම් පැළඳුම් ආහාර පාන නෑදෑයන් ගෘහභාණ්ඩ නෑසියන් හිතමිතුරන් ද සියලු උපභෝග පරිභෝග වස්තූන් ද නො අඩුව ලැබෙතැයි විශ්වාසයෙනි. යථෝක්ත ප්‍රාර්ථනාවෙනි. ජීවත්ව සිටියදී මෙන් සියලු අවශ්‍යතා සපුරාලීමේ චේතනා පෙරදැරිව ය.

මීළඟට සංචාරකයා පසුකර යන්නේ කරකෝරුවේ හා අල්තායි යන ප්‍රදේශයන් ය. ටාටර්වරුන් සිය මළවුන් මිහිදන් කරන්නේ මේ පෙදෙසෙහි ය. උතුරු දිසාවට ගමන් කළ සංචාරකයා ඉක්බිති ළඟාවන්නේ බාර්ගු නමැති නිම්න ප්‍රදේශයකට ය. මෙහි ළඟාවීම සඳහා දින හතළිහක කාලයක් ගත වේ. එහි වැසියන් හඳුන්වනුයේ මෙක්‍රිට් නමිනි. ඔවුන් ම්ලේච්ඡ ගෝත්‍රයකි. පශුපාලනය ඔවුන්ගේ ජීවිකා වෘත්තියයි. බහුල වශයෙන් පිනිමුවන් ඇති දැඩි කරති. ගමන් බිමන් සඳහා පිනිමුවන් යොදා ගනිති. මොවුන්ගේ සිරිත් විරිත් ටාටර්වරුන්ගේ මෙනි. මහා ඛාන්වරයාගේ යටත්වැසියන් ය. ඔවුනට ධාන්‍ය හෝ වයින් වර්ග නොමැත. එහෙත් වියළි කාලයෙහි කොතෙකුත් දඩයම් හි යෙදෙති. සිවුපාවුන් හා පක්ෂීන් ය. අධික ශීතල නිසා ශීත ඍතුවෙහි සිවුපාවුන් හෝ පක්ෂීන් දක්නට නොලැබේ. එහෙත් උෂ්ණ කාලයෙහි වැව් පොකුණු විල් කළපු ආදියෙහි ජලචර පක්ෂීන් බහුල ය. මේ කාලයෙහි මේ පක්ෂීන්ගේ පිහාටු හැළේ. දඩයක්කරුවෝ මේ ඉගිලීමට නොහැකි පක්ෂීන් මරා ගනිති. මසුන් ද ඔවුන්ට සෑහෙන තරම් ලැබේ.

දින හතළිහක් ගමන් කිරීමෙන් පසු සංචාරකයා ළඟා වූයේ

Scanned by CamScanner

සාගර වෙරළකට ය. මෙහි උකුස්සන්, කුරුළුගොයන්, කිරලුන් බහුලව අසල පිහිටි කඳුකරයේ දක්නට ලැබේ. ජනී ජනයා දක්නට නොමැත. සෙසු හාත්පස සිවුපාවුන් හෝ පක්ෂීන් නොමැත. බාගෙලැක් නමින් හැඳින්වෙන පක්ෂි විශේෂයක් පමණක් දැකිය හැකි ය. උකුස්සෝ මේ පක්ෂීන් දඩයම් කරත්. ඉහත කී පක්ෂි වර්ගය ඇටි කුකුළන් වැනි ය.. පාද ගිරවුන්ගේ වැනි ය. පෙඳය දිග ය. ඉතා වේගයෙන් පියාඹති. මහා ඛාන්වරයාට උකුස්සන් කුරුළුගොයන් අවශ්‍ය වූ විට ඒ සඳහා මිනිසුන් එවන්නේ මේ ප්‍රදේශයට ය. මේ ප්‍රදේශය උතුරු ප්‍රදේශයේ ඉතා ඈත පිහිටා තිබේ. ධ්‍රැව තාරකාව වමට හුරුව දකුණු දෙස පසුබිමින් දිස් වේ. ක්‍රිස්තු ලබ්ධිකයන් වෙසෙන පළාත්වල සිට ටාටර්වරුන්ට මේ පක්ෂීන් සැපයේ. ඛාන්වරයා ද ලෙවන්ට් ඛාන්වරයාට ද ආර්ගුහන්ට ද වෙනත් අවශ්‍ය අයට ද මේ පක්ෂීන් සපයනු ලැබේ. මුහුදින් ඈත උතුරුකරයේ ස්වභාවය ඉහත සඳහන් විය. මීළගට අප ගමන් කරන්නේ ශ්‍රේෂ්ඨ ඛාන්වරයා දෙසට ය. මා පැවසූ කාන් - චෞ ප්‍රදේශයෙන් ගමන් අරඹමිනි.

කාන් - චෞ ප්‍රදේශයෙන් නික්මුණු සංචාරකයා දින පහක් නැගෙනහිර දෙසට ගමන් කෙළේ ය. මේ ප්‍රදේශයේ අවතාර හොල්මන් බහුල ය. රාත්‍රියේ භූතයන් කථා කරන හඬ ඇසේ. ඊළගට ඔහු ළඟා වූයේ එර්ගුයි උල් නමැති රාජධානියට ය. (කන්සු ප්‍රදේශයේ ලියැංග් - චෞ විය හැකි ය.) මෙහි සිටිනුයේ ශ්‍රේෂ්ඨ ඛාන්වරයාගේ යටත් වැසියන් ය. ටැන්ගුට් හි විශාල ප්‍රදේශයකි. එහි රාජධානි රැසකි. මේ ප්‍රදේශ වැසියන් නෙස්ටෝරියානු ක්‍රිස්තියානින්, දේව භක්තිකයන් හා මහමදිකයන් ය. මෙහි නගර රැසකි. අගනුවර එරගුයි උල් ය. මෙතැන් සිට ගිනිකොණ දිගට මාවත විහිදී ඇත්තේ කැතේ දේශයේ රටවල් දෙසට ය.

මේ මාවත ඔස්සේ ගමන් ගන්නා කල්හි හමුවන්නේ සින්ජු නමැති නගරයයි. අදාළ ප්‍රදේශය ද එනමින්ම හැඳින්වේ. නගර සහ පුරවර රැසක් සහිත මේ ප්‍රදේශය ද ටැන්ගුට් පළාතට අයත් ය. ශ්‍රේෂ්ඨ ඛාන්වරයාට යටත් ය. වැසියෝ දේවාගම අදහති. සමහරු මහමදිකයෝ ය. ක්‍රිස්තියානි ලබ්ධිකයෝ ද මෙහි වෙසෙත්. ගව සම්පත බහුල ය. අලියකු තරම් විශාල මෙහි ගවයන් දර්ශනීය ය. පසුපස ප්‍රදේශය හැරුණු විට දිග ලොම් සහිත ය. මේ ලොම් තුන්

Scanned by CamScanner

වියතක් තරම් දිග ය. මේ සතුන් පුදුමාකාර දර්ශනයකි. ගෘහාශ්‍රිතව ද ගව පාලනය පවතී. වල් හරකුන් අල්ලා ගෙනවුත් බෝ කරනු ලැබේ. සී සෑම සඳහා මේ ගවයන් යොදා ගැනේ. අනෙක් ගවයකුට වඩා දෙගුණයක් ශක්තිමත් ය. දෙගුණයක වැඩ කොටසක් කළ හැකි ය.

මේ ප්‍රදේශයෙන් සමස්ත ලෝකයේම අනර්ඝ කස්තුරි ලැබේ. ඒ කස්තුරි ලබාගන්නේ මෙසේ ය. මේ ප්‍රදේශයේ මුව වර්ගයට අයත් කුඩා සිව්පාවකු (කුරංගයා) දක්නට ලැබේ. ඝන ලොම් සහිත ය. රූපාකාර ය. මුවකුට සමාන ය. අං නොමැත. මුඛයේ සිහින් දත් හතරකි. උඩු ඇන්දේ දෙකක් ද, යටි ඇන්දේ දෙකක් ද වශයෙනි. මේ සිවුපාවා දර්ශනීය ය. කස්තුරි මුවාගේ උදරය යටි පැත්තේ පෙකනිය සමීපයෙහි දකුණු පැත්තේ මසට ද, සමට ද අතර ලේ පිරුණු කුඩා පැසක් ඇත. මසත් සමග මේ පැස කපා ගත් විට එහි ඇතුළත පුරා ඇති ලෙය කස්තුරි නම් වේ. මෙය ඉතා ප්‍රබල සුවඳ විලවුනකි. (මේ කස්තුරි පුර සඳ එළියේ පදම් කර පසුව හිරු රැසේ වියළා ගනු ලැබේ. කස්තුරි මුවාගේ මස රසවත් ය. මාර්කෝ පෝලෝ කස්තුරි මුවාගේ හිස් කබලක් ද, පාද ද වැනිසියට රැගෙන ආවේ ය.) මේ ප්‍රදේශයෙහි දක්නට ලැබෙන අනගිතම වස්තුවක් ලෙස කස්තුරි හැඳින්විය හැකි ය.

මෙකී ප්‍රදේශයේ ධාන්‍ය සුලභ නොවේ. ජනතාව ජීවත්වන්නේ වෙළඳමෙන් සහ කර්මාන්ත මගිනි. මේ ප්‍රදේශය පසු කැර යෑමට දින විසිපහක් ගත වේ. වලි කුකුළන්ට වඩා දෙගුණයක් විශාල පක්ෂි වර්ගයක් මෙහි වෙසේ. අපගේ රටේ මේ වර්ගයට වඩා දෙගුණයක් විශාල වේ. මොනරකු තරම් විශාල ය. පුංචි වෙතොත් ස්වල්පයකි. වියත් දහයක් තරම් දිග පෙඳයක් සහිත ය. සමහර පක්ෂීන්ගේ පෙඳය අඩි නවයක් හෝ අටක් පමණ දිග ය. අඩු තරමින් වියත් හතක් පමණ වේ. ඉතා පියකරු දර්ශනීය පියාපත් සහිත පක්ෂි වර්ග රාශියක් මෙහි වෙසේ.

මේ ප්‍රදේශයේ ජනයා පිළිම වන්දනා කරති. මහත ශරීර ද කුඩා නාස ද නිකටෙහි ශක්තිමත් රැවුල් ගස් ස්වල්පයක් ද සහිත ය. ස්ත්‍රීන්ගේ හිසෙහි හැර අන් කිසිදු තැනක රෝම නොමැත. මෙහි කාන්තාවන් රූමත් ය. හස්ත පාද මසින් පිරී පවතී. පිරිමි දුරාචාරයේ යෙදෙති. ස්ත්‍රීන් කැමැති සංඛ්‍යාවක් පාවාගත හැකි ය. පහත් කුලයක

Scanned by CamScanner

වුවද රූමත් ස්ත්‍රියක වුවහොත් කිසියම් අධිපතියෙක් ඇය පාවාගනී. රූමත් බව මුල්කොට ගෙන ය. ඇගේ මවට මුදල් විශාල ප්‍රමාණයක් පරිත්‍යාග කැරේ. ඇය බලාපොරොත්තු වන තරම් මුදල් ලැබේ.

යළිත් නැගෙනහිර දිසාවට ගමන් අරඹමු. එර්ගුයිඋල් සිට නැගෙනහිර දෙසට දින අටක් ගමන් කළ කල්හි ටැන්ගුට් පළාතටම අයත් එග්රිගයියා නමැති නගරය (කන්සුහි නිංග්-හ්සියා) හමුවේ. එහි නගර ද පුරවර ද රාශියකි. ජනතාව දේවාගම අදහති. එහෙත් එහි නෙස්ටෝරියානු ක්‍රිස්තු ලබ්ධිකයන්ගේ දේවස්ථාන තුනක් තිබේ. ප්‍රධාන නගරය කලාචාන් (ටිං-යුඇං-යි (කන්සු) ) නම් වේ. ඔවුහු ශ්‍රේෂ්ඨ ඛාන්වරයාගේ යටත් වැසියෝ ය. ඔටුවන්ගේ ලොම්වලින් මෙහි ඉතා අනර්ඝ නිෂ්පාදන කරනු ලැබේ. විශාල සංඛ්‍යාවක් නිෂ්පාදනය කැරේ. කැතේ සහ අනෙකුත් ප්‍රදේශවලට මේ නිෂ්පාදන නිර්යාත කරනු ලැබේ. සුදු පැහැති මේ ලොම් පලස් උසස් තත්ත්වයක පවතී.

නැඟෙනහිර දෙසට ඉදිරියට ගමන් කරන කල්හි තෙන්දුක් නමැති පළාතට පිවිසුණි. එය ප්‍රෙස්ටර් ජෝන් හට අයත්ව තිබූ ප්‍රදේශයකි. නගර හා ගම්මාන රැසක් මෙහි තිබේ. ප්‍රධාන නගරය හඳුන්වන්නේ ද තෙන්දුක් නමිනි. ජනතාව ශ්‍රේෂ්ඨ ඛාන්වරයාගේ යටත්වැසියන් ය. ඔවුන් ප්‍රෙස්ටර් ජෝන්ගේ පරපුරෙන් පැවත එන්නවුන් ය. මෙකී ප්‍රදේශය පාලනය කරනුයේ ද ප්‍රෙස්ටර් ජෝන්ගෙන් පැවත එන අධිපතියෙකි. හෙතෙම පූජකයෙකි. ප්‍රෙස්ටර් ජෝන් යන ගරු නාමය ද දරයි. ඔහුගේ පෞද්ගලික නාමය ජෝර්ජ් ය. ශ්‍රේෂ්ඨ ඛාන්වරයාට යටත් පාලකයකු වශයෙන් කටයුතු කරයි. ඉහතදී ප්‍රෙස්ටර් ජෝන් ආධිපත්‍යය දැරූ සමස්ත ප්‍රදේශය ම නොවේ. එයින් එක්තරා කොටසකි. ශ්‍රේෂ්ඨ ඛාන්වරයා හැම විටම ඔහුගේ පරපුරෙන් පැවැත එන දූවක හෝ වෙනත් රාජකීය කාන්තාවක මේ ප්‍රදේශය පාලනය කරන්නා වූ කුමාරයකුට පාවා දෙයි. ඔටුවන්ගේ ලොම්වලින් අගනා නිෂ්පාදන මෙහි දක්නට ලැබේ. කෘෂිකර්මය ද, පශුපාලනය ද මෙහි ජනයාගේ ජීවන වෘත්තීන් වේ. මා ඉහත පැවසූ පරිදි මෙහි පාලකයෝ ක්‍රිස්තියානිහු ය. එහෙත් දේවාගම අදහන්නවුන් ද මහමදිකයන් ද ඒ අතර වේ. ආර්ගන් නමැති ජන කොට්ඨාසයක් ද වේ. තෙන්දුක්වරුන් හා ස්වදේශිකයක් මිශ්‍රවීමෙන් මේ ජන කොට්ඨාසය ඇති විය. ඔවුන් රූමත් ය. සෙසු ජනයාට වඩා බුද්ධිත් ය. වෙළඳම වඩාත් ප්‍රිය කරති.

Scanned by CamScanner

මෙකී ප්‍රදේශයෙහි ප්‍රෙස්ටර් ජෝන්ගේ වාසස්ථානය පිහිටියේ ය. ටාටර්වරුන්ගේ අධිපතිත්වය දරමින් සමස්ත ප්‍රදේශයේ පාලකයා වශයෙන් විසූ අවධියෙහි ය. මේ වාසස්ථානය දැන් ඔහුගේ පරපුරෙන් පැවත එන අය ප්‍රයෝජනයට ගනිති. ජෝර්ජ් රජු ඔහුගේ පරපුරෙන් පැවත එන හවැන්නා ය. මොහු පිළිබඳව ඉහතදී සඳහන් කෙළෙමි. අපේ භාෂාවෙන් ගොග් සහ මැගොග් යනුවෙන් හැඳින්වෙනුයේ මේ ස්ථානයයි. ස්වදේශිකයන් මේ ස්ථානය හඳුන්වනුයේ උග් සහ මුන්ගුල් යනුවෙනි. මෙකී ප්‍රදේශ දෙකේහි ජීවත්වනුයේ විශේෂ ජන කොට්ඨාසයකි. ගොග් හි ජීවත්වනුයේ උන්ග් වරුන් ය. මුන්ගුල් හි ටාටර්වරු වෙසෙති.

දින හතක් පුරා ගමන් කළ සංචාරකයාට නැගෙනහිර පිහිටි කැතේ දේශය වෙත යන අතර මහමදිකයන්, දේවභක්තිකයන් හා නෙස්ටෝරියානු ක්‍රිස්තුලබ්ධිකයන් වසන්නා වූ නගර හා පුරවරයන් රැසක් හමුවිය. ඔවුන් කර්මාන්ත හා වෙළෙඳ කටයුතු වලින් ජීවිකාව කරගන්නා බව කිව යුතු ය. නාසිච් හා නැක්හ් නමින් හැඳින්වෙන ස්වර්ණමය රෙදිපිළි ද විවිධාකාර සේද රෙදි ද මෙහි නිෂ්පාදනය කැරේ. ඔවුන් ශ්‍රේෂ්ඨ ඛාන්වරයා ගේ යටත් වැසියන් වේ. විවිධ ලොම් රෙදි වර්ග ද ස්වර්ණමය රෙදි හා පටරෙදි ද නිෂ්පාදනය කරනු ලැබේ. තවද මෙහි සින්ඩාචු නමැති නගරයක් තිබේ. එහි හමුදාවනට අවශ්‍ය යුද්ධෝපකරණ නිෂ්පාදනය කැරේ. එහි කඳුකර පෙදෙසේ ඉතා අගනා රිදී නිධියක් ඇත. විශාල වශයෙන් රිදී නිෂ්පාදනයක් එහි සිදුවේ. පක්ෂීන් හා සිවුපාවුන් ද බහුල ලෙස දඩයම් කැරේ.

මෙයින් නික්ම තුන් දිනක් ගමන් කළ පසු හමුවනුයේ චැගන් - නෝර් නමැති නගරයකි. මෙහි ශ්‍රේෂ්ඨ ඛාන්වරයාට අයත් සුවිසල් මාලිගාවක් තිබේ. ගංගා ද වැව් ද ඇති මේ පෙදෙසේ ජලාශයන්හි හංසයන් බහුල ය. ඛාන්වරයා විනෝදය සඳහා පැමිණෙනුයේ මේ ප්‍රදේශයටයි. එහි දර්ශනීය තැනිතලා ද ඇත. ශ්‍රේෂ්ඨ ඛාන්වරයා දක්ෂ දඩයක්කරුවෙකි. උකුස්සන් කුරුළුගොයන් ආදී පක්ෂීන් දඩයමහි ලොල් වූවෙකි. මෙහි වර්ග පහකට අයත් කොකුන් දක්නට ලැබේ. එක් වර්ගයක් සහමුලින් කාළ වර්ණ ය. ලොකු කලු කපුටකු වැනි ය. ශරීර ප්‍රමාණයෙන් විශාල ය. තවත් වර්ගයක් තනි සුදු පැහැති ය. මේ කොකුන්ගේ පියාපත් දර්ශනීය ය. පියාපත්හි මොනරුන්ගේ පිලෙහි

Scanned by CamScanner

මෙන් වටකුරු ඇස් සලකුණු දිස්වේ. තද රතු පැහැති පෙඳ වටයක් ද කළු හිසක් ද සුදු කළු මිශ්‍ර ගෙලක් ද ඇත. අනෙක් පක්ෂීන්ට වඩා ශරීර ප්‍රමාණය විශාල වේ. තුන්වන වර්ගය අපට හුරු පුරුදු කොකුන් ය. සිවුවන කොකුන් වර්ගය කුඩා ය. දෙකන් අසල දිගටි පිහාටු තිබේ. රත් පැහැති පෙඳ වටයක් සහිත මොවුන්ගේ පියාපත් කාළ වර්ණ ය. ඉතා පියකරු පක්ෂියෙකි. පස් වන වර්ගය විශාල ය. අලු පැහැති ය. හිස රතු සහ කළු වර්ණයෙන් අලංකාර වී තිබේ. මෙකී නිම්න භූමි ප්‍රදේශයේ කොකුන් වලිකුකුළන් හා චකෝරයන් බහුල ය. විවිධ වර්ගයනට අයත් වලිකුකුළන් මෙහි දක්නට ලැබේ.

ශ්‍රේෂ්ඨ ඛාන්වරයා මේ ප්‍රදේශයේ කලුකුන් නමැති විශාල පක්ෂි වර්ගය ඇති කරයි. මොවුන් සිත්ගන්නා දර්ශනයකි. ග්‍රීෂ්ම කාලයෙහි මේ සතුන්ගේ ආහාරය සඳහා කුරහන් හා වෙනත් ධාන්‍ය වර්ග වගා කැරේ. කිසිවකුටත් මේ ධාන්‍ය වර්ග නෙළා ගැන්මට අවසර නොමැත. මේ සතුන්ගේ ආහාරය සඳහා පමණක් යථෝක්ත ධාන්‍ය වෙන්කර තිබේ. එපමණක් නොව මේ පක්ෂීන් ආරක්ෂා කිරීම සඳහා මුරකරුවෝ ද සිටිති. ශීත කාලයෙහි ධාන්‍ය වර්ග නෙළා සතුන්ගේ ආහාරය පිණිස දෙයි. ධාන්‍ය වර්ග පොළොවෙහි ඉස මුරකරු නළාවක් හැඬවූ විට ආහාරය සඳහා මේ පක්ෂීහු රොද බැඳෙති. මෙකී පක්ෂීන්ට රාත්‍රිය ගත කිරීම සඳහා ඛාන්වරයා මඩු කුඩාරම් තනා ඇත. මේ ප්‍රදේශයට ඛාන්වරයා පැමිණි විට ඔහුට අවශ්‍ය තරම් පක්ෂීන් සැපයේ. ශීත කාලය වන විට මේ පක්ෂීන් මනා ලෙස වැඩේ. එසේම අධික ශීතල නිසා ඛාන්වරයා මේ ප්‍රදේශයේ රැඳී නොසිටී. එහෙයින් ඔහුට අවශ්‍ය තරම් සතුන් ඔටුවන්ගේ පිටින් සපයනු ලැබේ.

මේ ප්‍රදේශයේ සිට සංචාරකයා ගමන් ගත්තේ ඊසාන දෙසට ය. තුන් දිනක ගමනින් පසු ෂැංග්-ටු නමැති නගරයට පැමිනුණි. මේ නගරය ඉදි කරන ලද්දේ වර්තමාන පාලක කුබ්ලායි ඛාන් විසිනි. නගරයේ නම කුබ්ලායි ය. කුබ්ලායි ඛාන් විසින් කිරිගරුඬ හා වෙනත් විසිතුරු පාෂාණ වර්ග උපයෝගී කොට ගෙන මේ නගරයේ විශාල මාලිගාවක් ඉදිකරන ලදී. එහි ශාලා හා ආලින්ද විසිතුරු කැටයමින් අලංකෘත ය. සම්පූර්ණ මාලිගාව විවිධාකාරයෙන් අලංකාර කැරිණි. එහි එක් කෙළවරක් නගර මධ්‍යයෙහි පිහිටා ඇති අතර අනෙක් කෙළවර ප්‍රාකාරයට සමීපව තිබේ. මේ කෙළවර

Scanned by CamScanner

සිට තවත් ප්‍රාකාරයක් සැතපුම් දහසයක් දිගට මාලිගයේ ප්‍රතිවිරුද්ධ දිසාව දක්වා ඉදිකොට තිබේ. එහි වතුර මල් දිය පහර හා තණපිටි ආදිය දර්ශනීය ලෙස තනා ඇත. මාලිගය තුළින් ගොස් විනා වෙනත් ස්ථානයකින් මේ උද්‍යානයට ඇතුළු විය නොහේ. දඩයම් සඳහා සියලු සත්ත්ව වර්ග ඛාන්වරයා මෙහි ඇති දැඩි කරයි. ගෝනුන්, මුවන්, කස්තුරි මුවන්, පිනිමුවන්, උකුස්සන්, කුරුළුගොයන් ආදී විවිධ සතුන් මෙහි ගාල් කොට ඇත. කළුකුන් පමණක් දෙසියයක් පමණ වේ. මේ සත්වෝද්‍යානය නැරඹීම සඳහා සතියකට වරක් ඛාන් පැමිණේ. අශ්වයා පිටින් පැමිණෙන ඔහු කොටියකු සෑදලයේ පසුභාගයේ නැම්මෙහි රඳවා ගෙන එයි. යම් හෙයකින් ඔහුට දඩයමක් දැකීමට කැමැති වුවහොත් ගෝනකු මුවකු හෝ පිනිමුවකු දඩයම් කිරීම සඳහා කොටියා උසිගන්වයි. කොටියා දඩයම් කළ සතාගේ මස් උකුස්සනට කෑමට දෙයි. ඛාන් මෙසේ කරන්නේ විනෝද ක්‍රීඩාවක් වශයෙනි.

මේ සංවෘත උද්‍යානය තුළ දර්ශනීය වනයක් තිබේ. ඛාන්වරයා ඒ දර්ශනීය වනය තුළ ද විශාල මාලිගාවක් ගොඩනගා ඇත. සම්පූර්ණයෙන් ම වේවැල් වලින් තනා ඇති මේ මාලිගය විචිත්‍ර ය. සිවුපාවුන්ගේ හා පක්ෂීන්ගේ රූ සටහන් මේ මාලිගාවෙහි විචිත්‍ර ලෙස කැටයම් කැර තබේ. මනා ලෙස කැටයම් කළ කුලුනු සහිත මෙකී මාලිගාවෙහි විචිත්‍ර ලෙස වර්ණාලේප කැර ඇත්තේ ය. සෑම කුලුනකම මකර රුවක් දිස්වේ. වහලය දරා සිටිනුයේ මකරුන්ගේ වල්ගා ආධාරයෙනි. මකරාගේ දෑත ඉදිරියට නෙරා තිබේ. වහලය ද තනා ඇත්තේ සහමුලින්ම වේවැල්වලිනි. එය හොඳින් තීන්ත ආලේප කැර ඇත්තේ වතුරට ඔරොත්තු දෙන අයුරිනි. යථෝක්ත මාලිගයේ ඉදිකිරීම් කටයුතු සිදු කළ ආකාරය මෙහි දී විස්තර කළ යුතු වේ. මේ ඉදිකිරීම් සඳහා ගත් වේවැල්වල වට ප්‍රමාණය අඩි තුනක් පමණ වේ. දිග අඩි දහයෙහි සිට පහළොවක් පමණ ය. මෙබඳු දිග වේවැල් පතුරු ගසා ඒ පතුරු එකිනෙකට යා වන සේ අතුරා ඇණ ගසා තිබේ. ගොඩනැගිල්ල ශ්‍රේෂ්ඨ ඛාන්වරයාගේ සැලසුමකට අනුව නිර්මාණය කරන ලද්දකි. ඛාන්වරයාගේ අභිමතය පරිදි මේ ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ද ගෙන යා හැකි ය. සේද රැහැන් දෙසියයක් මේ ගොඩනැගිල්ල ඇද බැඳ තැබීමට අවශ්‍ය වේ.

Scanned by CamScanner

ඛාන්වරයා අවුරුද්දේ මාස තුනක් ෂැංග් - ටු හි ගත කරයි. ජූනි, ජූලි හා අගෝස්තු යන මාස තුනෙහි ඔහු එහි ගත කරන්නේ අධික උෂ්ණ කාලයක් බැවිනි. එසේම විනෝද ක්‍රීඩාවන්හි යෙදීමටත් ය. මෙකී මාස තුනක කාලය තුළ ඉහත කී වේවැල් මාලිගාව සකසා එහි ගත කරයි. ඔහු නික්ම ගිය පසු එය හකුළා තබනු ලැබේ. අවශ්‍ය අවස්ථාවෙහි ප්‍රයෝජන ගැන්මටත් සෙසු අවස්ථාවන්හි හකුළා තැබීමටත් හැකිවන පරිදි මෙය නිර්මාණය කැර ඇත.

අගොස්තු මාසයේ 28 වන දා ඛාන් මෙකී මාලිගයෙන් හා මේ ප්‍රදේශයෙන් බැහැර වෙයි. සෑම වසරකම මේ දිනයෙහි නිශ්චිත ලෙසම ඔහු නික්ම යයි. එයට හේතුව කුමක්දැයි මම ඔබට කියමි. ඔහු සතුව කප්පාදු නොකළ සුදු අශ්වයන් හා වෙළඹුන් පට්ටියක් ඇත. සුදු හිම පැහැති වෙළඹුන් පමණක් 10,000 ක් පමණ සිටී. මේ වෙළඹුන්ගේ කිරි බීමට අවසර ඇත්තේ අධිරාජ්‍ය පරම්පරාවේ අයට පමණි. මේ සම්බන්ධ තවත් විශේෂ කරුණක් වෙයි. සුදු වෙළඹුන් ගේ කිරි පානය කරන පිරිස හඳුන්වන්නේ "හොරියට්" නමිනි. මේ විශේෂ තත්ත්වය ස්ථාපිත කරන ලද්දේ චිංගිස් ඛාන් විසිනි. පුරාණ කාලයෙහි ඔහු සමග ජයග්‍රහණය අත්පත් කරගත් පිරිස වෙනුවෙනි. ඛාන්වරයා ඒ අසලින් ගමන් කරන කල්හි සුදු අශ්වයන් හා වෙළඹුන් ඔහු ඉදිරියට පැමිණේ. අශ්වයන් වෙළඹුන් ඔහු ගමන් කරන තුරු රැඳී සිටිය යුතු ය. නැතහොත් මේ සතුන් බැහැරවන තුරු ඔහු නැවතී සිටී. ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන් හා නිමිත්ත පාඨකයන් ඛාන්වරයාට කියා ඇත්තේ සෑම වසරකම අගෝස්තු මස 28 වැනි දා මේ සුදු වෙළඹුන්ගේ කිරි වලින් අහසේ පොළොවේ දෙවියන්ට පූජා පැවැත්විය යුතු බව ය. අහසට සහ පොළවට සුදු වෙළඹුන්ගේ කිරි ඉසීමෙන් යථෝක්ත පූජාව පවත්වනු ලැබේ. මේ පූජාව පැවැත්වීම නිසා ප්‍රමෝදයට පත්වන දෙවියන් භූතයන් ඛාන්වරයාගේ සියලු දේපළ ද ජනී ජනයා ද සතුන් පක්ෂීන් හා ගොවිතැන් ද ආරක්ෂා කරන බව ඔවුන්ගේ විශ්වාසයයි.

මෙසේ පුද පූජා පැවැත්වීමෙන් පසු ඛාන්වරයා කැමති දිසාවකට ගමන් කරන්නේ ය. එහෙත් එයට පෙර මට අමතක වූ තවත් එක්තරා කරුණක් ගැන කිව යුතුව ඇත. ඛාන්වරයා සිය මාලිගාවෙහි සිටියදී කාලගුණය වැසි සහිත හෝ වැසිබර වුවහොත් යහපත් කාලගුණයක් උදාකැර දීමෙහි සමත් ඉන්ද්‍රජාලිකයන් හා

Scanned by CamScanner

ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන් ඒ සඳහා ඛාන්වරයාට උපකාර කරයි. ඔවුන්ගේ ශාස්ත්‍ර ඥානයෙන් වැසි වලාකුළු මාලිගාව අවට ප්‍රදේශයෙන් බැහැර කිරීමේ මන්ත්‍ර විධි ක්‍රියාත්මක කැරේ. එවිට හාත්පස ප්‍රදේශය වැසි සහිත වලාකුළු බර වුව ද මාලිගාව ඉහළ අහස පැහැපත්ව යහපත් කාලගුණයෙන් යුතුව පවතී. මේ ප්‍රඥාවන්තයන් ටිබැට් හා කාශ්මීර ජාතිකයන් ය. මේ දෙකොට්ඨාසය මන්ත්‍ර බලයෙන් ඉතා තපුරු භයානක ක්‍රියාවන්හි ශූරයන් ලෙස සැලකේ. එසේ ම මොවුන් යක්ෂයන් හා සම්බන්ධ කටයුතුවල යෙදේ. ඔවුන් යථොක්ත අරුම පුදුම ක්‍රියාවන්හි යෙදෙනුයේ අතිශය පරිශුද්ධ භාවයෙන් යුතුව දේව බලමහිමයෙන් බව සෙසු ජනතාවට ඒත්තු ගන්වති. ඔවුන් මේ කාර්යයන්හි යෙදෙනුයේ අපවිත්‍ර කැත කුණු තවරාගෙන ය. ඔවුන් එය කරන්නේ අවස්ථාවට යෝග්‍ය පරිදි හෝ ජනයාගේ අවධානය යොමුකැර ගැන්ම පිණිස විය හැකි ය. මුහුණ අපවිත්‍ර ය. සෝදා පිරිසිදු නොකරති. හිස නොපීරති. ඔවුන් හැම විටම ජීවත්වන්නේ ආවේශ වූවන් ලෙසිනි. මේ මන්ත්‍රකාරයන්ට විශේෂ වූ සිරිතක් ඇත. ඒ ගැන මා ඔබට කිව යුතු ය. බලධාරීන් විසින් කිසියම් වරදකට යම්කිසි තැනැත්තකුට මරණ දඬුවම පැමිණ වුවහොත් මොව්හු ඒ මෘත ශරීරය ගෙන ගොස් උයාගෙන කති. එහෙත් ස්වභාවික මරණයට පත් වූ මළ සිරුරු එසේ ගෙන ගොස් පිස නොකති.

ඉහත කී මන්ත්‍රකරුවන්ගේ නැතහොත් ඉන්ද්‍රජාලිකයන්ගේ තවත් යාග ක්‍රමයක් ගැන මෙහි දී සඳහන් කළ යුතු වේ. ඔවුන් හඳුන්වනුයේ භක්ෂි නමිනි. ඛාන්වරයා සිය උත්තර සභා ශාලාවේ අසුන් ගන්නේ පොළොවේ සිට අට රියනක් උස් ස්ථානයක ය. ඛාන්ගේ මේසය සහ පුටුව පිහිටා ඇත්තේ සෙස්සවුන් අසුන් ගෙන සිටින ස්ථානයෙන් අට රියනක් ඉහළිනි. එතැන් සිට අඩි දහයක් පමණ දුරින් කිරි සහ වයින් පිරවූ භාජන බිම තබා ඇත. මේ සියල්ල එසේ සකස් කර ඇත්තේ දේව පූජාවක් වශයෙනි. භක්ෂි නමැති පූජකවරු මේ අවස්ථාවේ දී ස්තෝත්‍ර ගායනා කරති. ඉන්පසු ඔව්හු ඛාන්වරයා දෙසට ගමන් කරන්නාහ. මේ පූජාව පවත්වන්නේ 10,000 ක පිරිසක් බලා සිටියදී ය. මා මේ කරුණු සඳහන් කරන්නේ එක් වචනයක් හෝ අසත්‍යයක් නොවන සහතික හැඟීමෙනි. මේ පූජාව දින ගණනක් පැවැත්වේ.

Scanned by CamScanner

භක්ෂි පූජකයන් මේ පූජාව පවත්වන කල්හි ඔවුන්ගේ දෙවියන් එහි රැස්වේ. ඒ බව භක්ෂි පූජකයෝ ඛාන්වරයා වෙත ගොස් දන්වති.

"උතුමාණෙනි, මේ මේ පූජාවන් සඳහා මේ... මේ... දෙවිවරුන් පැමිණ ඇත." යනුවෙන් ඔවුහු ඒ ඒ දෙවිවරුන්ගේ නම් සඳහන් කරති. අයහපත් කාලගුණය දුරු කරමින් අපගේ භවබෝග සම්පත් ආරක්ෂා කිරීම සඳහා මේ දෙවිවරුන් වෙනුවෙන් යාගහෝම පැවැත්විය යුතුය උතුමාණෙනි!"

"මේ යාගය සඳහා කළු මුහුණු සහිත බැටලුවන් මෙපමණ සංඛ්‍යාවක් අවශ්‍යයි. මෙපමණ සුවඳ ද්‍රව්‍ය අවශ්‍ය ය. මෙපමණ දර අවශ්‍ය ය. ඒ පූජා ද්‍රව්‍ය උපයෝගී කැරගෙන යාගය පවත්වා අපගේ ජීවිත ද ගව සම්පත ද ගොවිතැන් ද සුරක්ෂිත කරන ලෙස යාඥා කරමු." යනුවෙන් භක්ෂි පූජකයෝ ශ්‍රේෂ්ඨ ඛාන්වරයා හමුවේ කියා සිටිති. මේ අවස්ථාවේ දී ඛාන්වරයා තමන් අවට රැස්වී සිටින සේනාපතිවරුනට නියෝග කරමින් භක්ෂිවරුන්ගේ යාගයට අවශ්‍ය සියල්ල නොපමාව සපයා දෙන ලෙස කියා සිටී. සේනාපතිවරු භක්ෂි පූජකයනට අවශ්‍ය සියල්ල නොපමාව සපයති. ඉක්බිති සුවඳ ද්‍රව්‍ය දල්වමින් යාගය ආරම්භ කැරේ. සතුන් මරා මස් පිස රසකැවිලි වර්ග ද සමග පූජාව පවත්වනු ලැබේ. මස් හා රසකැවිලි දෙවියනට කැප කරමින් හාත්පස විසුරුවති. ඔවුන් දෙවියන් සතුටු කිරීමේ යාගය පවත්වනුයේ ඒ අයුරිනි.

ඒ ඒ දෙවිවරුන් සඳහා නියමිත වෙන වෙන ම දිනවල මේ යාගහෝම පැවැත්වීම සම්ප්‍රදායයි. අපගේ සාන්තුවරුන් උදෙසා පූජා පවත්වන්නාක් මෙනි. මෙහි විශාල විහාරාරාම පූජ්‍යස්ථාන ඇත්තේ ය. කුඩා නගර වැනි මේ විහාරාරාම හා පූජ්‍යස්ථානයන්හි භික්ෂූන් 2000 ක් පමණ වසන බව කිව යුතු ය. මේ භික්ෂූහු වෙනත් ජනයාට වඩා හොඳින් ඇඳුම් හඳිති. ඔවුහු හිස රැවුළු ඉතා හොඳින් බූගාති. ඉතාමත් ආකර්ශනීය පුද පූජා දෙවියන් උදෙසා පවත්වන්නා වූ මේ පූජකවරුන්ගේ ගාථා සූත්‍ර පිරිත් සජ්ඣායනා කර්ණරසායන ය. සිත් පහදවන ප්‍රදීප පූජාවන් ද පැවැත්වේ.

ඉහත සඳහන් කරන ලද භක්ෂිවරුනට තම තරාතිරම අනුව විවාහ ජීවිතයක් ගත කිරීමට අවසර තිබේ. ඔව්හු දරුවන් ද ඇති දැඩි කරති.

Scanned by CamScanner

හක්ෂි පූජකයන් හැරුණු විට තවත් පූජක පිරිසක් ද මෙහි දක්නට ලැබේ. ඔවුන් සි එංග් - සෙන්ග් නමින් හැඳින්වේ. මේ පූජකවරු ඔවුනටම විශේෂ වූ ධර්මයකට අනුව පිළිවෙත් පුරමින් වරදින් වැළකී සිටිති. අත්ථකිලමතානු යෝගය වැනි ශීලයක් සමාදන් වී සිටින මෙකී පූජකවරුන් ගැන විස්තරයක් ඔබට ඉදිරිපත් කරමි.

ධාන්‍ය කුඩු ධාන්‍ය පොතු හැර ඔවුන් අන් කිසිම ආහාරයක් ජීවිත කාලය මුළුල්ලේ ම අනුභව කරන්නේ නැත. මෙකී ආහාරය පිළියෙල කැර ගන්නේ පහත සඳහන් ආකාරයටයි. තිරිඟු ඇට පළමුවෙන් උණුවතුරේ බහා ටික වේලාවක් තැම්බෙන්නට ඉඩ හරිනු ලැබේ. ඉන්පසු තිරිඟු ඇටය ඉවත හැර කුඩු සහිත පොත්ත වෙන්කැර ගනිති. ඔවුන් ආහාරයට ගන්නේ මේ කුඩු පොත්ත පමණි. එය රසවත් කිරීම සඳහා කිසිදු ද්‍රව්‍යයක් මිශ්‍ර කරන්නේ ද නැත. වර්ෂයකට කිහිප වරක් මොවුහු උපවාසයේ යෙදෙති. උපවාස කාලයෙන් පසුව වුවද ඔවුන්ගේ ආහාරය වන්නේ ඉහත කී තිරිඟු පොතු පමණි. ඉතා විශාල ප්‍රතිමා ඔවුන්ගේ පූජ්‍යස්ථානවල දක්නට ලැබේ. ඇතැම් විට ඔව්හු ගිනි දෙවියා ද වන්දනා කරන්නෝ ය. මෙහි වසන තවත් ආගමික පූජක කොට්ඨාසයක් පිළිම වන්දනාවෙහි නොයෙදේ. මේ පූජක දෙකොට්ඨාසයෙන් එක් පූජක කොට්ඨාසයක් විවාහ වන්නේ නැත. ලෝකයේ කිසිදු සම්පතක් කෙරෙහි ඇලීමක් නොමැත. ඔවුන්ගේ හිස රවුළු මුඩු කැර ඇත. ඔව්හු කළු හෝ නිල් සිවුරු පොරවති. පට සිවුරු වුවද කළු හෝ නිල් පැහැති ය. පන් ඉඳිකොළ ආදියෙන් වියූ පැදුරුවල නිදති. ලෝකයේ අනෙක් කිසිදු තැනක දක්නට නොලැබෙන සරල වාම් තවුස් ජීවිතයක් ගත කරති.

ඔවුන්ගේ සියලු ප්‍රතිමාවලින් මූර්තිමත් කැර ඇත්තේ දේවතාවියන් ය. ස්ත්‍රී නාම ඒ සියලු ප්‍රතිමාවන් හැඳින්වීමට යෙදේ.

ඒ සම්බන්ධ බොහෝ විස්තර ඔබට ඉදිරිපත් කෙළෙමි. ටාටර්වරුන්ගේ අධිපතියා වන ශ්‍රේෂ්ඨයන් අතර අති ශ්‍රේෂ්ඨයා ලෙස හැඳින්වෙන කුබ්ලායි ඛාන් පිළිබඳව අරුම පුදුම සත්‍ය තොරතුරු මෙතැන් සිට ඔබට කියැවීමට ලැබෙනු ඇත.

Scanned by CamScanner




# කුබ්ලායි ඛාන්

මෙතැන් සිට මා ඔබට විස්තර කරනුයේ දැනට චීනයේ පාලකයා වන ශ්‍රේෂ්ඨ ඛාන්වරයාගේ උදාරතර ක්‍රියා කලාපයයි. අපගේ භාෂාවෙන් මේ තනතුර හැඳින්විය හැක්කේ "ශ්‍රේෂ්ඨ අධිපතීන්ගේ ශ්‍රේෂ්ඨයා" යනුවෙනි. සැබැවින් ම මේ ශ්‍රේෂ්ඨ නාමය හාත්පසින් ම ඔහුට ගැලපේ. අධිරාජයාගේ යටත් වැසියන්ගේ සංඛ්‍යාවත් ඔහුගේ පාලනයට යටත් භූමි ප්‍රදේශයත් භාණ්ඩාගාරයට ලැබෙන අප්‍රමාණ ආදායමත් අනුව ය. හෙතෙම අතීත සහ වර්තමාන සියලු රජුන් බලපරාක්‍රමයෙන් අභිභවා යන්නෝ වෙයි. සියලු රට වැසියෝ ඔහුට යටත් කටයුතු කරති. ලොව අන් කිසිදු රටක රජකුට එබඳු පක්ෂපාතී භාවයක් නොලැබේ. මවිසින් ඉදිරියේ දී ඉදිරිපත් කැරෙන විස්තර තොරතුරු මගින් යථෝක්ත සත්‍යතාව සනාථ වේ.

හෙතෙම පැවත එන්නේ චින්ගීස් ඛාන් පරම්පරාවෙනි. අඛණ්ඩව පැවත එන්නා වූ යථෝක්ත පරම්පරාවේ හවැන්නා ලෙස කුබ්ලායි ඛාන් මේ ශ්‍රේෂ්ඨ පදවි ප්‍රාප්ත විය. ක්‍රි. ව. 1256 දී ඔහු සිංහාසනාරූඪ වූයේ ය. ක්‍රි. ව. 1298 වන විට කුබ්ලායි ඛාන් සිංහාසනාරූඪ වී අවුරුදු හතළිස් දෙකකි. කායශ්ශූරත්වයත්, උදාර චරිත ස්වභාවයත්, ස්වකීය සහෝදරයන්ගේ සැලැසුම් සහගත ක්‍රියා පද්ධතියත්, හමුදා නිලධාරියකු ලෙස තාරුණ්‍යයෙහි දී දැක්වූ රණකාමිත්වයත් ආඥා පැවැත්වීමෙහි විශිෂ්ටත්වයත් හේතුකොට ගෙන ඔහුට මේ පදවියට පත්වීමට මං සැලසුණි. ඒ කෙරෙහි ජනතාවගේ ප්‍රසාදයත් අවධානයත් යොමුවී තිබිණි. ප්‍රධාන සෙනෙවිවරුන්ගේ ආධාර

Scanned by CamScanner

උපකාර ඔහුට නොමඳව ලැබුණේ ය. අධිරාජ පදවියට අත්‍යවශ්‍ය සුදුසුකම් නො අඩුව සපුරා තිබිණි. අධිරාජ පදවියට පත්වී මේ වන විට වසර හතළිස් දෙකක් ගෙවී ඇත. දැනට ඔහුගේ වයස අවුරුදු අසූ පහකි. ටාටර් සංග්‍රාමයන්හි දී ඔහු දැක්වූ රණශූරත්වය අනභිභවනීය ය. කිසිදු අවස්ථාවක ඔහු පරාජය වී නොමැත. සංග්‍රාමෝපක්‍රමයන්හි දී විචක්ෂණ බුද්ධිමතෙකි. එහෙත් අධිරාජ පදවියට පත් වීමෙන් පසු ඔහු සංග්‍රාම භූමියට ගියේ නැත. ඒ වෙනුවට කුබ්ලායි ඛාන් ස්වකීය පුත්‍රයන් හා සේනාපතියන් යැවූයේ ය. එසේ වුවද එක්තරා විශේෂ යුද්ධයක් සඳහා කුබ්ලායි ඛාන් සේනා පිරිවරා සංග්‍රාම භූමියට පිවිසිණි. එයට පසුබිම් වූ සිද්ධිය මෙසේ ය.

කුබ්ලායි ඛාන් ගේ ඥාතියකු වන නයාන් නමැති අධිපතියා පළාත් කිහිපයක් තම වසඟයට ගෙන සේනා සංවිධානය කරමින් සිටියේ ය. අසරුවන් හාර ලක්ෂයක් සටන් බිමට යොමු කිරීමට තරම් සේනා බලයක් ඔහු සතුව පැවැතිණි. ඛාන් යටතේ වුසූ ප්‍රාදේශීය පාලකයන් භාරකාරත්වය ඉසුලූ ප්‍රදේශ නයාන් යටත් කරගෙන සිටියේ ය. ක්‍රි. ව. 1286 දී අධිරාජයාගේ පාලනයෙන් මිදී ස්වාධීන පාලකයකු වශයෙන් පෙනී සිටි ඔහු 'කායිදු' නමැති තවත් බලවත් අධිපතියකු සමග සම්බන්ධතා ඇති කැරගත්තේ ය. මෙසේ රහස් සම්බන්ධතා ඇති කැරගත් කායිදුගේ පාලන ප්‍රදේශය මහා තුර්කියට මායිම් වී තිබිණි. 'කායිදු' අධිරාජයාගේ බෑනා කෙනෙකි. අධිරාජයා ඔහුගේ අතීත වැරැදිවලට දඬුවම් දී තිබූ බැවින් වෛරී හැඟීමෙන් කල්ගත කෙළේ ය. මේ නිසා කායිදු නයාන් සමග සම්බන්ධතා ඇති කැර ගෙන අධිරාජයාට එරෙහිව යුද්ධ කිරීමට සැරසුණි. ඔවුන්ගේ මේ රහසිගත යුද්ධ කුමන්ත්‍රණය අධිරාජයාට සැළවිය. පළමුවෙන් ම අධිරාජයා කායිදු හා නයාන් අතර පණිවිඩ හුවමාරු මාර්ග වසා දැමී ය. ඒ සමගම කායිදුට හා නයාන්ට සේනා සංවිධානය කිරීම සඳහා වූ පහසුකම් ඇන හිටියේ ය. අනතුරුව මහරජතුමා කම්බලු නගරයේ සිට යුද්ධය සඳහා කටයුතු සංවිධානය කෙළේ ය. රට පුරා සිටි සියලු යුද්ධ සේනා එකමුතු කරන ලදී. මේ සේනාවට තුන් ලක්ෂ හැට දහසක අශ්වාරෝහක හමුදාවක් ද, ලක්ෂයක පාබල සේනාවක් ද මෙහෙයැවිණ. රජුගේ මාලිගාවේ විවිධ කාර්යයන්හි නිරතව සිටියුද්ධ භටයෝ ද මේ

හමුදාවට එක් වූහ. විසි දවසක් පුරා සේනා සංවිධාන කටයුතු සමාප්ත කැරිණි. කැතේ නගරය නිරතුරු ආරක්ෂා කිරීම සඳහා විවිධ ස්ථානයන්හි රඳවා සිටි හමුදා එක්තැන් කිරීමට අවම වශයෙන් දින තිහක හතළිහක පමණ කාලයක් ගතවේ. ඒ කාල සීමාව තුළ දී අධිරාජයාගේ ක්‍රියා කලාපය සතුරන්ට සැලවූයේ නම් සතුරා කඩා පැන රජයේ මර්මස්ථාන අල්ලාගැනීමට ඉඩ තිබිණි. අධිරාජයාගේ අදහස වූයේ හැකිතාක් ඉක්මනින් කායිදූ නතිකර ඔහු අල්ලා ගැනීම ය. ඒ සමගම ඔහුගේ සේනා පරාජය කැර සුනු විසුනු කැර දැමීම ය. රජතුමා ඉතා සූක්ෂ්ම ලෙස ද, බුද්ධිමත් ලෙස ද සේනා සංවිධානය කළ බව පෙනේ. කැතේ හා මංජි යන නගරබද ප්‍රදේශ අවට රජුට පක්ෂපාතී නොවූ ද්‍රෝහී පිරිස් ද සිටියහ. ඔවුන් බලා සිටියේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන රජුට එරෙහිව කැරලි කෝලාහල ඇති කිරීමට ය. අගනුවරින් පිටස්තර නොයෙක් ප්‍රදේශයන්හි ජනගහනය අධික වූ බැවින් විශේෂ ස්ථානයන්හි ආරක්ෂා සංවිධාන තර කළ යුතුව තිබිණි. රජුගේ බුද්ධිමත් දූරදර්ශී ක්‍රියා කලාපය නිසා සතුරනට එහි කඩා වැදීමට අවස්ථා සැලසුණේ නැත. අවුරුදු දෙකකට වරක් මේ ප්‍රදේශයන්හි හමුදා නිලධාරීන්ට හා හමුදා භටයන්ට ස්ථාන මාරු ලබා දීම චිරාගත සම්ප්‍රදායයකි. මේ ක්‍රමය නිසාත් රජුගේ හමුදා පාලනයෙහි විචක්ෂණ භාවය නිසාත් ප්‍රදේශවාසී ජනතාව මහත් සේ හිතවත්ව රජු කෙරෙහි පක්ෂපාතව සිටියහ. එහෙයින් බැහැරින් පැමිණෙන සතුරකුට හෝ ආක්‍රමණිකයකුට හෝ එකතුවීමට ජනතාව පොළඹවා ගැනීම දුෂ්කර ක්‍රියාවකි.

හමුදාව නඩත්තු කෙළේ රාජ්‍ය භාණ්ඩාගාරයේ මහ අරමුදලෙනි. එයට අමතර වශයෙන් ඔවුනට කිරි හරකුන් ඇති කැර කිරි, මී කිරි, ගිතෙල්, වෙඬරු ආදි පස්ගෝරස විකුණා මුදල් උපයා ගැනීමට ද අවස්ථා සලසා දී තිබේ. එමගින් ලැබෙන ආදායමින් ඔවුනොවුනට ජීවනෝපාය සලසා ගැනීමට අවස්ථාව සැලැසේ. මේ අයුරින් සේනා සංවිධානය කොට දින තිහකින් හතළිහකින් හෝ හැටකින් ගමන් කිරීමට හැකිවන අයුරින් පිහිටුවා තිබුණි. මේ අයුරින් තැනින් තැන ස්ථානගත කොට ඇති භටයන් එක් තැනකට එකමුතු කෙළේ නම් අප්‍රමාණ සංඛ්‍යාවක් වනු ඇත. එකී භට සංඛ්‍යාව එක් රැස්වුවහොත් එය විශ්මය ජනක දර්ශනයකි.

Scanned by CamScanner

මේ අයුරින් සේනා සංවිධානය කොටගෙන අධිරාජයා නයාන් ගේ පාලන ප්‍රද්ශය කරා ගමන් කෙළේ ය. මෙකී සේනාව සුනංගු නොවී එක ම වේගයෙන් නොනැවතී ගමන් කළ බව කිව යුතු ය. ඔවුන් අපේක්ෂා කළ ස්ථානය කරා ළඟා වීමට ගත වූයේ විසිපස් දිනකි. මේ ගමන සිදුවූයේ නොසිතූ පරිද්දෙනි. නයාන්ට හෝ නයාන් ගේ ප්‍රදේශයේ කිසිවකුටත් ඒ ගැන අංශුමාත්‍රයකින් හෝ දැන ගැනීමට නොලැබිණ. මහා මාර්ගයන්හි ගමන් ගන්නා කිසිවකුටත් නයාන් ගේ පාලන ප්‍රදේශයට යෑමට අවසර නොලැබිණි. යම් හෙයකින් ගියේ නම් ඔවුන් අත් අඩංගුවට ගැනීමට කටයුතු යොදා තිබිණි. ආරක්ෂා සංවිධාන ඉතා සූක්ෂ්ම ලෙස තර කැර තිබුණු බැවිනි. අධිරාජයාගේ යුද්ධ සේනාව ගමන් කොට නතර වූයේ කඳු වැටියක් අසල ය. මේ කඳු වැටියේ අනෙක් පාර්ශ්වයේ නයාන් ගේ සේනා කඳවුරු බැඳගෙන සිටියහ. අධිරාජයා ඒ බව දැන තම පිරිසට දෙදිනක් විවේක ගැන්මට අවස්ථාව සලසා දුනි. මේ විරාමයෙහි දී අධිරාජයා ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන් කැඳවා යුද්ධයෙහි ජයග්‍රහණය පිළිබඳව අනාවැකි විචාළේ ය. ඔව්හු ජ්‍යොතිෂ්ශාස්ත්‍රානුකූලව පරීක්ෂා කොට බලා යුද්ධයේ ජයග්‍රහණය කුබ්ලායි ඛාන් අධිරාජයාට හිමිවන බව ප්‍රකාශ කළහ. මෙය යුද්ධ හමුදාවේ ධෛර්යය ඔදවැඩීමට හේතුවන කරුණකි. අතීතයේ දී ද යුද්ධ හමුදාවන් ධෛර්යමත් කිරීම සඳහා අධිරාජයා ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන්, නිමිත්ත පාඨකයන් හා විවිධාකාර ගුප්ත ශාස්ත්‍රඥයන් කැඳවා අනාගතය ගැන විමසන ලද්දේ ය. මෙවර ද ජ්‍යොතිර්වේදීන්ගේ අනාවැකියෙන් ඔදවැඩී ගිය කුබ්ලායි ඛාන් ගේ සේනා පසුදා උදෑසන කඳු මුදුනට නැගුණහ. නයාන් ගේ සේනාව පෙනෙන තෙක් මානයේ ඔව්හු වාඩිලා කඳවුරු ගසා ගත්හ. එහෙත් නයාන් ගේ සේනාව සටනක් සඳහා කිසිදු සූදානමකින් තොරව නොසැලකිලි මත්ව සිටිනු පෙනිණ. ඒ අතර නයාන් කූඩාරමක් තුළට වැදී ඔහුගේ බිරියන්ගෙන් එකියක වැළඳගෙන සිටියේ ය. අධිරාජයාගේ හමුදාව ළඟාවන බව ඇසීමෙන් කලබල වූ ඔහු වහ වහා සේනා එක් රැස් කරන්නට පටන් ගති.

එහෙත් මේ තීරණාත්මක අවස්ථාවේ කායිදූ ගේ යුද්ධ සේනාවන් ගේ පැමිණීම අපේක්ෂා කළ ද ඔවුන් එහි ළඟා වූයේ නැත. මේ නිසා නයාන් බලවත් සේ වික්ෂිප්ත විය. එහෙත් ඔහු තින්දෙන් අවදි වී වහා සේනා සවිධානය කරන්නට පටන් ගති.

අධිරාජයා ගමන් කළේ විශාල ඇතුන් සතර දෙනෙකු මත ඉදිකළ බලකොටුවක් වැනි කුඩාරමක් ඇතුළත ය. ඒ ඇතුන්ගේ ශරීර මනා ලෙස පදම් කළ සම්වලින් ආවරණය කැර තිබිණ. සතර වටින් වැදෙන ඊතල හා ආයුධ පහරට ඔරොත්තු දෙන ආකාරයෙනි. ඒ සන්නාහයට පිටතින් රන් තහඩු සවිකැර තිබුණේ ය. ඒ හැරුණු විට සතර දිශාවේ ආරක්ෂාව සඳහා දක්ෂ දුනුවායෝ ද රැඳී සිටියහ. බලකොටුව මතුයෙහි ඉර-හඳ ලාංඡන සහිත අධිරාජයාගේ ධජය ද ඔසවා තිබුණේ ය. දුනු හී ආදි ආයුධ ගත් අශ්වාරෝහක සේනාංක තිහක් අධිරාජයාගේ හමුදාවට අයත් විණි. එක් සේනාවක් දස දහසක් බැගින් විය. ප්‍රධාන සේනාංක තුනක් අධිරාජයා විසින් මෙහෙයවන ලදී. එක් යුද්ධ සේනාවක් දකුණු පසින් ගමන් ගති. තවත් සේනාවක් වම්පසින් ගමන් ගන්නා ලදී. නයාන් ගේ සේනාවන් හාත්පසින් වටකැර අල්ලා ගැනීම සඳහා ය. අශ්වාරෝහක හමුදා ඉදිරිපසින් බිහිසුණු කඩු හෙල්ල ආදී ආයුධ දරාගත් පන්සියයක පාබල සේනාවක් ගමන් කරවීය. මේ පාබල සේනාව සෑහෙන දුරක් ඉදිරියට ගොස් යළිත් බිය වී ආපසු හැරී යන ආකාරයක් ප්‍රදර්ශනය කොට සතුරා උපක්‍රමශීලී ලෙස රවටා අශ්වාරෝහකයන් අතින් මැරුම් කෑමට සලස්වන ලදී. මේ සේනාංක පුරුදු පුහුණු කැර තිබුණේ සතුරා අවස්ථානුකූලව මුලා කොට මරණයට පත් කළ හැකිවන පරිදිදෙනි. සටන් බිමට එළැඹෙන අවස්ථාවෙහි විවිධාකාර යුද බෙර සක් ආදී නානා ප්‍රකාර තූර්ය භාණ්ඩ එක්ව මහා ඝෝෂාවක් නැගෙන අයුරින් වාදනය කරන්නට පටන් ගති. තවත් පිරිසක් ටාටර්වරුන්ගේ සාම්ප්‍රදායික රණ ගී ගායනා කරන්නට වන්හ. ටාටර්වරුන් යුද්ධ භූමියට පිවිසෙන්නේ රණබෙර හඬට අනුව රණ ගී ගායනා කරමිනි. ඒ හඬ අනුව කෙතාලම් වාදනය කිරීම ඔවුන් සංග්‍රාමයන්හි දී භාවිතා කිරීම සිරිතයි. එකවර යුද බෙර වැයුම ද නිසා නැගුණේ මහත් ඝෝෂාවකි. මේ හඬ බියකරු ය. මවිතය දැනවී ය. වම් පසින් ද, දකුණු පසින් ද සූදානම් ව සිටි සේනාවනට අධිරාජයා පළමුකොට අණ දුනි. ඉන් අනතුරුව එකිනෙකා ආයුධවලින් ඇන කඩුවලින් කොටා ගැනීමට පටන් ගත්හ. ඒ හා සමග දුනුවායන් විසින් විදින ලද ඊතල පහර වැදී ඇද වැටුණු යුද භටයන්ගේ හා අශ්වයන්ගේ සිරුරුවලින් හාත්පස වැසී තිබිණි. මරාපියව්! කොටාපියව්! ඇනපියව්! යන ශබ්දය අතරින් තුවාල ලද හේවායන්ගේ මර ළතෝනි ඇසුණේ සිත් කම්පා

කරවමිනි. මාරාන්තික ශබ්ද හාත්පස පැවතුනි. අඩයටි, හෙල්ල, තෝමර, කඩු, හී ආදියෙන් ඔවුනොවුනට පහර එල්ල කිරීම නිසා යුද පිටිය තුවාලකරුවන්ගෙන් වැසී ගියේ ය. ආයුධ සරඹයත් තුවාලකරුවන්ගෙන් නැගෙන අඳෝනා බස් හා "කපවු, කොටවු, මරවු" යන හඬ තොර තෝංචියක් නොමැතිව නැගෙන්නට වන. මේ සටන අතිශයින් බිහිසුණු විය. රණපිටිය පුරා තුවාල කරුවන්ගේ සිරුරු හා මළ සිරුරු ගොඩ ගැසී කඳුගැසී තිබිණ. එහෙයින් දෙ සේනාවෙහි කිසිවකුටත් ඔබ මොබ ගමන් කළ හැකි වූයේ නොවේ. එහෙයින් එදින යුද්ධයෙහි ජයග්‍රහණය කවුරුන් සතුදැයි කිව නොහැකි සේ අවිනිශ්චිත විය. උදය කාලයේ පටන් ගත් සටන පස්වරුව වන විට ජයග්‍රහණය දෙපක්ෂයට දෝලනය වන ආකාරයක් දක්නට ලැබිණ. නයාන්ගේ සේනාව සටන් කෙළේ කෙසේ හෝ තම ස්වාමියාට ජයග්‍රහණය අත්පත් කැර දීමේ ස්ථිර අධිෂ්ඨානයෙනි. නයාන් තම වැසියන්ට නිදහසේ ජීවත්වීමට පසුබිම සකස් කැර දුන් බැවින් ඔහු ඉමහත් කැපවීමකින් යුතුව සටන් වැදුණහ. සතුරා පරාජය කිරීමට ද තම ස්වාමියා වෙනුවෙන් ජීවිතය පිදීමට ද නයාන්ගේ හටයෝ සැරසී සිටියහ. කොපමණ ධෛර්‍යයෙන් සටන් කළ ද නයාන් ගේ සේනාව පරාජය වන ලකුණු පෙනිණ. මේ අවස්ථාවේ දී නයාන් පළා යෑමට උත්සාහ කළ නමුදු අධිරාජයාගේ හටයන්ගේ ග්‍රහණයට අසුවිය. නයාන් නොමරා අධිරාජයා ඉදිරියට ගෙන යන ලදී. අධිරාජයා නයාන් මරා දැමීමට අණ කෙළේ ය. වධකයෝ නයාන් ගෙන ගොස් විශාල ඇතිරිලි දෙකක ඔතා ප්‍රාණය හානි වන තුරු ඒ මේ අතට වේගයෙන් සෙළවූහ. එසේ කරන ලද්දේ ඥාතීන්ගේ ලේ සොළවා මරා දැමීමට ඔවුන්ගේ පරම්පරාවේ චාරිත්‍රය නොවන බැවිනි. නයාන් ද අධිරාජයාගේ ඥාති පරම්පරාවටම අයත් වූවෙකි.

නයාන් අල්ලා ගැනීමෙන් පසු පරාජයට පත් හමුදාවේ ඉතිරි වූ හටයෝ අධිරාජයා වෙත පැමිණ අධිරාජයාගේ සේනාවනට එක්වී යටහත් පහත් බව ප්‍රකාශ කළෝ ය. කොර්ෂ - කාර්ලි බාර්ස්කොල් සිටින් ගුයි යන පළාත්වලට ඔව්හු අයත් වූවෝ ය. නයාන් කිතු සමය වැළඳ සිටි නමුද ඒ බව පැවැතියේ රහසක් වශයෙනි. එහෙත් සටන් බිමට එළැඹෙණ විට හෙතෙම කුරුස ලාංඡනය ඔහුගේ ධජයනහි සටහන් කර තිබිණ. ක්‍රිස්තුලබ්ධික

Scanned by CamScanner

හටයෝ රාශියක් ඔහුගේ හමුදාවනට ඇතුළත්ව සිටියහ. ඔවුන්ගේ මෘත දේහයන් රණබිමෙහි තනිකර සෙස්සන් බැහැර වූහ. ක්‍රිස්තියානි ධජය පෙරටු ගමන් කොට යුද්ධයෙන් පරාජය වීම ගැන යුදෙව්වෝ ද මුස්ලිම්වරු ද ඔවුනට සරදම් කළහ. තමනට සරදම් කිරීම ගැන උදහස් වූ කිතුනුවෝ අධිරාජයා වෙත ගොස් තමන් අවමානයට පත් කිරීම ගැන පැමිණිලි කළහ. මෙයින් කෝපයට පත් අධිරාජයා ඔවුන් තමන් වෙතට කැඳවා අවවාද හා තරවටු කෙළේ ය.

ක්‍රිස්තුස් වහන්සේ සර්ව සාධාරණ ය. එහෙයින් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියෙන් නයාන්ට ජයග්‍රහණයක් නොලැබුණේ ඔහු කොල්ලකාරී අධාර්මික පුද්ගලයකු වීම නිසා ය. අධිරාජයාට ද්‍රෝහී වීමෙන් ඔහු කෙළේ වරදකි. එහෙයින් නිසි දඬුවම ඔහුට ලැබුණි. "දෙවියන් වහන්සේ වරදක් කර නැත. සත්‍යයේ යුක්තියේ හා ධර්මයේ මූර්තියක් වන්නා වූ ක්‍රිස්තුන් වහන්සේගේ නාමයට අපකීර්තියක් වන අයුරින් කථා නොකළ යුතු යයි" අධිරාජයා වැඩි දුරටත් ප්‍රකාශ කෙළේ ය.

විජයග්‍රහණයෙන් පසු ජයඝෝෂා නගමින් අධිරාජයා කම්බලු නමැති අගනුවරට සම්ප්‍රාප්ත වූයේ උත්සවශ්‍රීයෙනි. නොවැම්බර් මාසයේ දී අධිරාජයා කම්බලු නරයට සම්ප්‍රාප්ත වූයේ ය. එතැන් සිට පෙබරවාරි - මාර්තු දෙමස ද අධිරාජයා ගත කෙළේ මේ නගරයෙහි ය. ක්‍රිස්තියානි ආගමික උත්සව පවත්වන්නේ මේ කාලයේ දී බව දැනගත් අධිරාජයා ක්‍රිස්තු ලබ්ධිකයන්ට රාජ මාලිගයට පැමිණෙන ලෙස දැනුම් දුනි. රජතුමා ඔවුන් පිළිගත්තේ හෘදයංගම මිත්‍රශීලී හැඟීමෙනි. ඔවුන් අතරට පැමිණි අධිරාජයා බයිබලය දෝතින් ගෙන එය සුවඳ දුමින් සුවඳවත් කර සිපගත්තේ මහත් භක්තියෙනි. ඉක්බිති අධිරාජයා එහි රැස්ව සිටි අධිපතීන් උසස් නිලධාරීන් හා ප්‍රභුවරුන් අමතා ප්‍රකාශ කෙළේ තමා අනුගමනය කරමින් ඒ අයුරින් ම බයිබලයට ගෞරව බහුමාන දක්වන ලෙසට ය. ඔව්හු මහත් කැමැත්තෙන් ඒ අයුරින් ම බයිබලයට ගෞරව උපහාර දැක්වූහ. අධිරාජයා පාස්කු උත්සවයේදීත් නත්තල් උත්සවයේදීත් මේ අයුරින්ම ගෞරව උපහාර දැක්වීමට මහත් සේ උනන්දු විය. ඒ හැරුණු විට මුස්ලිම්වරුන්ගේ ද, යුදෙව්වන්ගේ ද, බෞද්ධ හින්දු ආගමිකයන්ගේ ද, උත්සව අවස්ථාවන්හි දී ද ඒ අයුරින්ම උපහාර ගෞරව හරසර දැක්වීය. හෙතෙම සෑම ආගමකට ම එක්

Scanned by CamScanner

බඳු අයුරින් ගෞරව සැලකිලි දැක්වූ බව සඳහන් කළ යුතු ය. මෙසේ ආගම්වලට සලකන්නේ කවර හෙයින් දැයි ප්‍රශ්න කළ විට අධිරාජයා මෙසේ පිළිතුරු දුන්නේ ය.

"ශ්‍රේෂ්ඨ ශාස්තෲහු සතර දෙනෙක් වෙති. විවිධ ජාතීහු උන්වහන්සේ වෙත වන්දනාමාන පුද පූජා පවත්වති. ක්‍රිස්තු ලබ්ධිකයෝ ජේසුස් වහන්සේ ඔවුන්ගේ ශාස්තෘවරයා ලෙස සලකති. මුස්ලිම්වරුන්ගේ ශාස්තෘවරයා මහමුද් ය. යුදෙව්වන්ගේ දෙවියන් මෝසස් ය. සොගොමොම්බර් ප්‍රතිමාවට වැඳුම් පිදුම් කරන්නෝ එතුමා තමන්ගේ ආගමික නායකයා සේ සලකති. එසේ ම මම ද ගෞරව කරන්නෙමි. දෙව්ලොව දී ඔවුන් සතර දෙනා අතරින් කවර උතුමකුගේ වුව ද පිහිටාධාරය ඉල්ලා සිටින්නෙමි."

අධිරාජයා මෙසේ ප්‍රකාශ කළ ද ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අධික විශ්වාසයක් පවත්නා බව පෙනී ගියේ ය. එසේ වුව ද මේ ආගමේ නියම කර තිබෙන පරිදි ආචාර විධි පිරිසිදු ලෙස නොපවත්වන බව ඔහුගේ හැඟීමයි. ක්‍රිස්තුන් වහන්සේ කුරුසිය මත තබා කසයෙන් තළා ඇණ ගසා මරා දමන ලද බැවින් ඔසවා ගෙන යෑමට අධිරාජයා ඉඩ දුන්නේ නැත. අධිරාජයා ක්‍රිස්තු ධර්මයට ගෞරව කළ ද ඔහු ක්‍රිස්තුභක්තිකයකු නොවන්නේ කිනම් හේතුවක් නිසා දැයි ප්‍රශ්නයක් නැගෙනු ඇත.

අධිරාජයා නිකොලෝ සහ මපියෝ පෝලෝ යන දෙදෙනා රජ දූතයන් ලෙස පාප් තුමන් වෙත පිටත් කැර යවන මොහොතෙහි ක්‍රිස්තු ධර්මය පිළිබඳ අදහස් ප්‍රකාශ කළහ. ඔවුන්ගේ බස් ඇසූ රජතුමා ක්‍රිස්තු ලබ්ධිය පිළිගත යුතු දැයි විචාළේ ය.

"මේ දේශයන්හි වසන්නා වූ ක්‍රිස්තු පූජකවරු අදක්ෂයෝ ය. ඒ බව සියලු දෙනා දනිති. ඔවුනට ආශ්වර්‍ය්‍යමත් දෑ කළ නොහේ. එහෙත් ප්‍රතිමා වන්දනා කරන්නා වූ ආගමිකයෝ පුදුමාකාර ක්‍රියා කරති. මේසය අසල මා හිඳගෙන සිටින විට ශාලාවේ වෙනත් තැනක මැද පිහිටි මේසයක් මත ඇති මිදි යුෂ බඳුන් ඉබේම පිරී ඉබේම මා අතට එයි. එය ඔබ දැක ඇත්තෙහි ය. ප්‍රතිමා වන්දනා කරන ආගමිකයන්ට අහසේ වැහි වලා ඉවතට පා කර හැර වර්ෂාව නවතාලීමට හැකි වේ. ඔවුන් පුද පූජා කරන්නා වූ ප්‍රතිමා කතා කරනු ඇසේ. ප්‍රතිමාවලින් විචාරන්නා වූ ප්‍රශ්නවලට ද පිළිතුරු

Scanned by CamScanner

දෙනු පෙනේ! ඇසේ! එහෙත් මා ක්‍රිස්තියානි ආගම වැළඳගත හොත් කවර හාස්කමක් නිසා මා ක්‍රිස්තු ලබ්ධිකයකු වූයේ දැයි යම් කිසිවකු ප්‍රශ්න කළහොත් දිය හැකි පිළිතුර කුමක් ද? පිළිමවලට වන්දනාමාන කරන්නෝ විවිධ ආශ්චර්‍ය්‍ය ජනක ක්‍රියා මගින් ඔවුන්ගේ පාරිශුද්ධියත් බලයත් ප්‍රාතිහාර්‍ය්‍ය මගින් පෙන්වා දෙන්නාහ. ඔවුන්ගේ ගැඹුරු විද්‍යා ඥානය හේතු කොට ගෙන විවිධාකාර ප්‍රාතිහාර්‍ය්‍ය මගින් මගේ ජීවිතය පවා විනාශ කිරීමට හැකි යයි සිතේ. එහෙයින් ඔබගේ නායක පූජකතුමා හමුවට ගිය කල්හි ඉතා දක්ෂ ධර්ම ශාස්ත්‍රාදියෙහි නිපුණ උගත් පූජකවරුන් සිය දෙනෙකු මෙහි එවන ලෙස ඉල්ලා සිටින්න. එවිට ඔවුන් මෙහි පැමිණි කල්හි ප්‍රතිමා වන්දනා කරන්නා වූ බැතිමතුන් අභිමුඛයෙහි වාද විවාද පවත්වා ඔවුන්ගේ මතවාද බිඳ දැමීමට කටයුතු කළ හැකි වනු ඇත. ඔවුන්ට ද එවැනි ප්‍රාතිහාර්‍ය්‍ය පෑමේ ශක්තියත් පවත්නා බව පෙන්වා දිය යුතු ය. ප්‍රතිමා වන්දනා කරන ආගමිකයන් එබඳු දෑ කරනුයේ භූතයන් යක්ෂයන් ආධාර කොට ගෙන බව කියා තමන් එබඳු කටයුතු නොකරන බවත් තමන් අභිමුඛයෙහි එබඳු දෑ ප්‍රදර්ශනය නොකරන බවත් කියා එයින් වැළකී සිටින ලෙස ඉල්ලා සිටිය යුතු ය. එසේ කළ හොත් මම ඔවුන්ගේ ආගම කොන් කරන්නෙමි. තහනම් කරන්නෙමි. එසේ වුවහොත් මම ද ක්‍රිස්තු ධර්මය වැළඳ ගෙන බෞතීස්මය ලබන්නෙමි. එවිට මා මෙන්ම රාජ සභාවේ සියලු දෙනාම ක්‍රිස්තු ලබ්ධිකයන් වනු ඇත. අනතුරුව සියලු නිලධාරීහු ද රටවැසියෝ ද ක්‍රිස්තියානිය වැළඳ ගන්නාහ. එවිට ක්‍රිස්තු භක්තියෝ බහුල වන්නාහ." පාප්තුමා යම් හෙයකින් ක්‍රිස්තු ධර්මය දේශනා කිරීමට උගත් බුද්ධිමත් දක්ෂ විචක්ෂණ පූජකයන් පිටත් කැර එවූයේ නම් අධිරාජයා ඒ ධර්මය පිළිගන්නා බවට මේ ප්‍රකාශය සාක්ෂියකි. ඒ පිළිබඳව අධිරාජයා අවධානය යොමු කැර සිටි බව ද එමගින් පැහැදිලි ය.

නැවතත් යුද්ධය පිළිබඳ කරුණු පැවසීමට පටන් ගනිමි. යුද්ධ ජයග්‍රහණය සඳහා ඇප කැප වී ක්‍රියා කළ සේනාපතියන්ට නිලධාරීන්ට හා භටයන්ට ගරු සම්මාන ත්‍යාග ප්‍රදානය කළ ආකාරය මෙසේ ය.

තාන්න මාන්න පිදීමට අදාළ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අධිරාජයා වංශවත් අධිපති බලවතුන් අතරින් දොළොස් දෙනෙකු

Scanned by CamScanner

ගෙන් යුත් අධීක්ෂණ මණ්ඩලයක් පත්කරන්නේ ය. මේ අධීක්ෂණ මණ්ඩලයෙහි සාමාජිකයන්ගේ කාර්‍ය්‍ය භාරය වනුයේ යුද්ධයට සහභාගි වූ මුලාදෑනින්ගේ, සේනාපතියන්ගේ, සොල්දාදුවන්ගේ රණපිටියෙහි දී අනුගමනය කරන ක්‍රියා කලාපය ඔවුන්ගේ ඇප කැපවීම ආදී කරුණු විමසා බැලීමයි. එසේ විමසා බලා අධිරාජයාට පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ඉක්බිති අධිරාජයා මේ වාර්තා පරීක්‍ෂා කැර බලයි. හමුදා නිලධාරීන්ගේ ද, භටයන්ගේ ද දක්ෂතා සුදුසුකම් යනාදී සියල්ල සලකා බලා තනතුර උසස් කරයි. එසේම ස්ථිර තනතුරු ලබා දෙයි. සෙබළුන් සියයකට ප්‍රධානව සිටි හමුදා නිලධාරියා සෙබළුන් දහසකට නායකයා ලෙස පත් කරයි. රිදී කුසලාන ද, ත්‍යාගයක් ද ඔහුට පිරිනමනු ලැබේ. භටයන් සියයකට ප්‍රධාන හමුදා නිලධාරියාට රිදී පදක්කම් ද, භටයන් දහසකට නායක හමුදා නිලධාරියකුට රත්රන් ආලේප කළ රිදී පදක්කම් ද දස දහසකට ප්‍රධාන හමුදා නිලධාරියකුට සිංහ ශීර්ෂ මූර්තියක් සහිත ස්වර්ණමය පදක්කම් ද පිරිනමයි. පළමුවෙන් කී පදක්කම් අවුන්ස (සග්ගි) එකසිය විස්සක් බරින් යුක්ත ය. සිංහ ශීර්ෂ මූර්තියක් සහිත ස්වර්ණමය පදක්කමක් අවුන්ස (සග්ගි) දෙසිය විස්සක් බරින් යුක්ත ය. මෙකී පදක්කම්වල ඉහළ කොටසේ රජුගේ ප්‍රකාශයක් සඳහන් කැර ඇත.

> "අපේ අති උත්තම දෙවියන් වහන්සේ ගේ මහානුභාවය හා බලපරාක්‍රමය හේතුකොට ගෙන අපගේ රාජ්‍යයෙහි ආරක්ෂාව සැලසෙන්නා සේ ම අපගේ මහා අධිරාජයටත් ආරක්ෂාව සලසන සේක්වා! ආශිර්වාද කරන සේක්වා! මෙහි ලේඛනාරූඪ කොට ඇති පරිදි රජුට පක්‍ෂපාතී නොවන්නා වූ වරදකරුවන් මරණයට පත් කිරීම ද සමූලඝාතනය ද සිදුකරත්වා!"

මෙකී වගන්තිය සහිත පදක්කම දරන්නා වූ මුලාදෑනීන්ට නිලධාරීන්ට විශේෂ බලතල වරප්‍රසාද පවරා දී නියම කොට ඇත. ලක්ෂයක හමුදාවක් මෙහෙය වන්නා වූ සේනාපතියකුට ආඥාපතියකුට පිරිනැමෙන පදක්කම අවුන්ස (සග්ගි) තුන් සියයක බරින් යුක්ත වේ. එබඳු පදක්කමක ඉහළ කොටසේ ඉහත සඳහන් වැකිය සඳහන් කැර තිබේ. එහි පහත කොටසේ සිංහ රූපය ද ඉර - හඳ ලාංඡන ද සඳහන් කැර ඇත්තේ ය. මෙබඳු උසස්

Scanned by CamScanner

හමුදාපතිවරයකු රථයක නැඟී හෝ අශ්වයකු මත හෝ ගමන් කරන විට ඔහුට ප්‍රසිද්ධ ස්ථානයන්හි ඡත්‍රයක ආවරණය සැලසිය යුතුයි. එමගින් ඔහුගේ ප්‍රභූත්වයත් උදාරත්වයත් පිළිබිඹු කැරේ. රිදියෙන් තැනූ ආසනයක් හිඳ ගැනීම සඳහා පිළිගැන්වේ. උසස් වංශවත් ප්‍රභූනට රාජ ආඥාව සහිත අධිකාරි පත්‍ර පිළිගන්වන විට උකුස්සකුගේ ලාංඡනය සහිතව නිර්මාණය කිරීම සම්ප්‍රදායයි. රාජකීය දඩකෙළිවල දී ඉහත සඳහන් කළ පක්ෂීන් යොදා ගැනේ. මේ පදක්කම ලද හමුදාපතියකුට ඕනෑම රාජ කුමාරයකු ගේ හමුදා පෙළපාලියකට මේ පදක්කම පැළඳගෙන සම්බන්ධ වීමේ අවසරය ඇත. එසේම මෙබඳු උසස් නිලධාරීන් හට රජතුමාගේ අස්හලෙන් සෙසු නිලධාරීන්ගේ අශ්වයන් රැගෙන යෑමට අවසර ඇත.

කුබ්ලායි ඛාන් අධිරාජයා මධ්‍යම ප්‍රමාණයේ දේහ සම්පත්තියෙන් යුත් පුද්ගලයෙකි. ඔහුගේ අඟපසඟ පිරිපුන් ය කඩවසම්ය. මුහුණ ප්‍රියංකර ය. රතු රෝස මලක පැහැ ගනී. එබැවින් මුහුණ ශෝභා සම්පන්න ය. දෙනෙත තද කලු පැහැති ය. දර්ශනීය ය. තියුණු ය. ඍජු උස් නැහැයකි. අධිරාජයාට බිසෝවරුන් සතර දෙනෙකි. මේ ප්‍රධාන බිසෝවරුන් සතර දෙනා උසස් ප්‍රභූ වංශවත් පරපුරකින් පැවැත එයි. යථෝක්ත බිසෝවරුන් සතර දෙනා අතරින් පළමුවෙන් දරුවකු බිහිකරන තැනැත්තියගේ දරුවාට අනාගත රාජ්‍යය හිමි වේ. එය මේ රටේ සම්මත චාරිත්‍රයයි. එහෙත් ඇතැම් අවස්ථාවන්හි දී මෙම සම්ප්‍රදායය වෙනස් වී ඇති බව කිව යුතු ය. බිසෝවරුන් සතර දෙනාම අග බිසෝවරුන් ලෙස සැලකේ. ඔවුන් සතර දෙන සඳහා වෙන වෙන ම මාලිගා සතරෙකි. එක් බිසොවකට තුන්සියය බැගින් බිසෝවරුන් සතර දෙනාටම අතිශය රූමත් සේවිකාවෝ වෙති.

එමෙන් ම එක් එක් මාලිගය සඳහා තරුණ සේවකයන් විශාල සංඛ්‍යාවක් යොදවා තිබේ. ඒ හැරුණු විට අන්තඃපුරයේ වෙනත් සේවිකාවන් සඳහාත් මුරකරුවන් ලෙසත් චරපුරුෂයන් ලෙසත් විශාල පිරිසක් කටයුතු කරන්නාහ. නිදන කාමරවල සේවය සඳහා නපුංසකයන් ද, කාන්තාවන් සමූහයක් ද සිටිති. සමස්තයක් වශයෙන් සලකා බලන කල්හි එක් බිසෝ මැදුරක මුළු සේවක පිරිස දහසක් පමණ වේ. ඇතැම් විට අග බිසොවට පණිවිඩයක් යවා අධිරාජයා වෙත කැඳවා ගනී. සමහර විට අධිරාජයා බිසෝ මාලිගය කරා

යන්නේ ය. අග බිසෝවරුන් හැරුණු විට තවත් ස්ත්‍රීන් රාශියක් රජතුමාගේ මනදොළ සපුරාලීම සඳහා සැදී පැහැදී සිටිති. ඔව්හු මාලිගයේම රැඳී සිටින්නාහු ය. මෙකී ස්ත්‍රීන් රජමාලිගාවට ගෙන්වා ගන්නේ උන්ගුත් නමැති ප්‍රදේශයෙනි. එහි කාන්තාවන් පංච කල්‍යාණයෙන් ද, රූප සම්පත්තියෙන් ද අනූන බැව් අති පුරාණයේ පටන් ප්‍රසිද්ධ ය.

අධිරාජයා වර්ෂයකට වරක් හෝ මාස කිහියකට වරක් විශේෂ රාජ පුරුෂයන් පිරිසක් උන්ගු ප්‍රදේශයට යවා විමර්ශනය කොට අතිශය රූමත් ලලනාවන් හාරසියයක් හෝ පන්සියයක පමණ සංඛ්‍යාවක් රාජ මන්දිරයට අන්තඃපුරයට කැඳවා ගැනේ. වයසින් අඩු අතිශය රූමත් ළඳුන් පමණක් තෝරා ගැනීම සම්ප්‍රදායයි. රාජ දූත පිරිස උන්ගු ප්‍රදේශයට ළඟා වූ පසු සමස්ත ප්‍රදේශයේ සිටින්නා වූ රූමත් යොවුන් දැරියන් සියලු දෙනාට ම එක් තැනකට එක්රැස් වන සේ පණිවිඩ විසුරුවා හරිනු ලැබේ. තරුණියන් එසේ එක්රැස් වූ පසු ස්ත්‍රී ලක්ෂණ විද්‍යාවෙහි නිපුණ විශේෂඥයෝ ඔවුන් පරීක්ෂා කරනු ඇත. කේශ කල්‍යාණය, මුහුණේ පියකරු පෙනුම, ඇසි බැම, මුව දෙතොල යනා දී අඟ පසඟයන්හි ස්වභාවය මෙහි දී හොඳින් පරීක්ෂා කැරේ. දේහ විලාසය ද එහි දී සැලකිල්ලට භාජන වේ.

මේ යුවතියන්ගේ මිල නියම කරනුයේ රූප ලක්ෂණය අනුවයි. එකිනෙකා රත්රන් කැරට් දහසය, දහහත, දහඅට, විස්ස යනාදී වශයෙන් මිල නියම කැරේ. ඉක්බිති මේ ළඳුන් අධිරාජයා හමුවට පැමිණවීමෙන් පසු තවත් විශේෂඥ පිරිසක් ලවා යළිත් පරීක්ෂා කරවනු ලැබේ. මෙසේ තෝරා ගන්නා තරුණියන් පිරිසෙන් වඩාත්ම උසස් සුදුසුකම් ලත් තිහක් හෝ හතළිහක පමණ පිරිසක් රජ මැදුරේ සේවය සඳහා තෝරාගන්නේ ඉහළ මිලක් නියම කරමිනි. මෙසේ තෝරාගත් තරුණියන් රජවාසල උසස් නිලධාරීන්ගේ හා නිලමෙලාගේ භාර්යාවෝ යළිත් පරීක්ෂණයට භාජන කරන්නාහ.

මේ තරුණියන් පළමුකොට නිලමෙලාගේ හා ප්‍රභුවරුන්ගේ නිවාසයන්හි රඳවා ගෙන රාත්‍රියේ දී රහසිගතව ඔවුන්ගේ අඟපසඟ පරීක්ෂා කැරේ. රහස් ප්‍රදේශයන්හි පිහිටීම, අඟපසඟයන්හි අශෝභන පෙනුමක් තිබේ ද? නිදාගන්නා විට දඟලන්නේ ද, දත්කුරු සපන්නේ ද, ගොරවන්නේ ද, ශරීරයේ දුර්ගන්ධයක් ඇත්ද, මුඛය දුර්ගන්ධයක් ඇත්ද යනාදී සියල්ල විමසා බලනු ලැබේ. ඉන්පසු මේ තරුණියන්

Scanned by CamScanner

පිරිස පස්දෙනා බැගින් කණ්ඩායම් ගත කොට රාජ මන්දිරයේ සේවයට රෑ තුනක් ද, දිවාකාල තුනක් ද බැගින් යෙදවේ. ඔවුන් සලකනුයේ ස්ත්‍රීරත්න වශයෙනි. අධිරාජයා විසින් නියෝග කරන්නා වූ කටයුතු නිසි පරිදි සිදු කැරෙන්නේ දැයි විමසා බලනු ලැබේ. පිරිසිදුකම ද, කඩිසරකම ද මෙහි දී අගය කැරෙයි. මේ අයුරින් පස් දෙනා බැගින් මුළු යොවුන් ළඳුන් පිරිසම සේවයෙහි යොදවනු ලැබේ.

පස් දෙනා බැගින් වූ මේ කණ්ඩායම රජ මැදුරේ අභ්‍යන්තරයෙහි බාහිර යාබද ශාලාවන්හි ද විවිධ කටයුතුවල යෙදවේ. අධිරාජයාට අවශ්‍ය අහාර පාන එක් තැනක සිට තවත් තැනකට ගෙන ගොස් දීම ඔවුන්ගේ මෙහෙවර ය. ඍජුවම රජුගේ සේවයට යෙදවූ කාන්තාවෝ මෙබඳුම සේවයක යෙදෙත්. රූප ස්වභාවයෙන් අඩු සෙසු ලලනාවන් රදලවරුන්, ප්‍රභූවරුන් හා වෙනත් උසස් නිලධාරීන් අතර බෙදා දෙනු ලැබේ. ඔවුහු එහි දී ඉවුම් පිහුම්, මැහුම් ගෙතුම්, සැරසිලි ආදී කටයුතු පිළිබඳ පුහුණුව ලබත්. මෙසේ පුහුණු වූ තරුණියන් යම් කිසිවකුට විවාහ කැර ගැනීමට අවශ්‍ය වුවහොත් දායාදයත් සමග ඇය පාවා දෙනු ලැබේ.

අධිරාජයා මෙසේ යුවතියන් කැඳවා රජ මැදුරේ රඳවා ගැනීම ගැන විරුද්ධත්වයක් ඒ පළාතේ වැසියන්ගේ සිත්හි ඇති නොවන්නේ දැයි සැකයක් යම් කිසිවකුගේ සිත්හි පැන නැගීමට ඉඩ තිබේ. ඒ එසේ නොවේ. ඔව්හු ඒ පිළිබඳව සතුටු වන්නාහ. එය තමනට කරන ලද ගෞරවයක් ලෙස සලකති. අප දියණිය ජනිත වූයේ සැපවත් ජීවිතයක් ගත කිරීමේ භාග්‍යය සහිතව නම්, ඇයට සුඛෝපභෝගී ජීවිතයක් සඳහා වරම් ඇත්තේ නම් ඇයට අධිරාජ්‍ය මන්දිරයේ දී ඒ සම්පත් ලැබෙනු ඇත. අප කෙසේ නම් ඇයට එබඳු අවස්ථාවක් සලසා දෙන්නෙමු ද? යනුවෙන් කියති. යම්කිසි අයහපත් ක්‍රියාවක යෙදීම නිසා ඒ දියණිය රජමැදුරෙන් පිටමං කළහොත් ඔවුන් කියන්නේ ග්‍රහ අපල දෝෂයක් නිසා මෙබඳු ආපදාවකට මුහුණ පෑ බවකි.

කුබ්ලායි ඛාන් අධිරාජයාගේ ප්‍රධාන මහේෂිකාවගෙන් පිරිමි දරුවන් විසි දෙදෙනෙකු ලැබී ඇත. ඔවුන් සියලු දෙනා අතරින් වැඩිමලා වනුයේ චින්ගීස් නම් වෙයි. යුවරාජ පදවියට පත් කැර ඇත්තේ චින්ගීස් ය. අධිරාජයා ජීවත් ව සිටියදීම ඔහුට ගරු

Scanned by CamScanner

නම්බුනාම පිරිනමා යථෝක්ත තනතුර පවරා දී තිබේ. එහෙත් ඔහු අධිරාජ තනතුරට පත්වීමට පෙර අභාවප්‍රාප්ත විය. මියගිය යුවරාජයාගේ පුත්‍රයා ටිමූර් නමින් හැඳින්වේ. ඔහුට අනාගත රාජ්‍යය හිමිවනුයේ පිය උරුමයෙනි. හෙතෙම අතිදක්ෂ නව යොවුන් කුමාරයෙකි. සටන් පෙරමුණෙහි දී හේ සිය දක්ෂතා විදහා පෑවේ ය. ඒ හැරුණු විට අධිරාජයාගේ සෙසු භාර්‍යාවන් බිහිකළ කුමාරවරු පස් විසි දෙනෙක් වූහ. ඔවුහු ද දක්ෂ රණශූරයන් වශයෙන් අධිරාජයාගේ විවිධ හමුදාවන්හි පදවි තනතුරු දරා සිටියෝ ය. මොවුහු රාජකීය සම්භාවනීයයන් ලෙස පිළිගන්නා ලදහ. අග බිසෝවරුන්ගේ පුත්වරු සත් දෙනෙකු ද විශාල ප්‍රදේශ හතක පාලකයන් ලෙස කටයුතු කළෝ ය. අධිරාජයාගේ සිතැඟි පරිදි උසස් ගුණාංගයන්ගෙන් සමන්විතව හොඳින් ඒ ඒ ප්‍රදේශයන්හි පාලන තන්ත්‍රය මෙහෙයවූහ.

අධිරාජයා සෑම වර්ෂයක ම තුන් මාසයක් එනම් දෙසැම්බරයේ සිට මාර්තු දක්වා වාසය කරන්නේ උතුරු චීනයේ නැතහොත් කැතේ ප්‍රදේශයේ ගිනිකොණ දිග මායිමෙහි පිහිටි ඛාන් - බාලික් පුරවරයෙහි ය. එහි විශාල මාලිගාවෙක ය. නව නගරයෙහි දක්ෂිණ දිශාවෙන් මේ සුවිසල් මාලිගාව පිහිටා තිබිණ. මේ මාලිගාව යෝධ ප්‍රාකරයකින් වටකැර තිබේ. චතුරස්‍රාකාර මේ ප්‍රාකාරයට පිටතින් විශාල දිය අගලකි. ප්‍රාකාරයෙහි එක් පැත්තක් සැතපුම් අටක් දිග ය. ගැඹුරු දිය අගලට පිටතින් සතර දිශාවෙන් පැමිණෙන්නා වූ මහජනයාට රැඳී සිටීම සඳහා සතර දිශාවේ විශාල දොරටු සතරක් දක්නට ලැබේ. එහි අභ්‍යන්තර ප්‍රදේශයේ සැතපුමක් පමණ දුරින් හමුදා භටයෝ රැඳී සිටිති. එයට පිටතින් සතරැස් සැතපුම් හයක භූමි ප්‍රදේශයක් තවත් ප්‍රාකාරයකින් වටකැර තිබේ. යථොක්ත ප්‍රාකාරයේ දකුණු පාර්ශ්වයේ තවත් වාසල් තුනක් ඉදිකැර තිබේ. උතුරු පැත්තේ ද වාසල් තුනකි. එහි මධ්‍යයෙහි පිහිටි දොරටුව සෙසු දොරටුවලට වඩා ප්‍රමාණයෙන් විශාල ය. විශාල දොරටුව නිතර වසා තිබේ. අධිරාජයා මාලිගයට පැමිණෙන විට ද පිටත්වන විට ද පමණක් එය විවෘත කැරේ. නිතර විවෘතව පවත්නා කුඩා දොරටු දෙක මහාජනයාගේ යෑම් ඊම් සඳහා ය. සැතපුම් හයක් වූ ප්‍රාකාරයෙන් සීමා කරන ලද භූමි භාගයෙහි දර්ශනීය විශාල ගොඩනැගිලි අටක් දක්නට ලැබේ. ඒ ගොඩනැගිලි වෙන් කැර ඇත්තේ රජයේ යුද්ධෝපකරණ ගබඩා කිරීමට ය. එක එක්

Scanned by CamScanner

ගොඩනැගිල්ල තුළ එක් එක් වර්ගයේ යුද්ධ උපකරණ භාණ්ඩ තැන්පත් කැර තිබේ. එක් ගොඩනැගිල්ලක දුනුවායන්ගේ හමුදාවට අයත් යුද උපකරණ ය. තවත් ගොඩනැගිල්ලක අශ්වාරෝහක හමුදා භටයන්ට සහ අශ්වයන්ට අවශ්‍ය උපකරණ ය. මේ අයුරින් එකිනෙකට වෙනස් ඒ ඒ හමුදාවට අවශ්‍ය උපකරණ බඩු බාහිරාදිය සහ විවිධ මෙවලම් තැන්පත් කැර තිබේ. විශාල ප්‍රාකාරයකින් වට කරන ලද්දා වූ තවත් භූමි ප්‍රදේශයක් ඇතුළත අඩි විසි පහක් උස තවත් ප්‍රාකාරයකි. ඒ ප්‍රාකාරය අධික ඝනකමින් යුක්ත ය. ශක්තිමත් ය. කියතක දැති මෙන් තැනූ තවත් මිටි ප්‍රාකාර පංතියකි. මේ ප්‍රාකාරය ද ප්‍රමාණයෙන් සැතපුම් හතරකි. එක් පැත්තක් දිගින් සැතපුමකි. ඒ ප්‍රාකාරය වටා දොරටු හයක් තනා තිබේ. ඉහත සඳහන් කළ කොටුව ඇතුළත ද විශාල ගොඩනැගිලි අටක් දක්නට ලැබේ. යුද උපකරණ ගබඩා අයුරින්ම මේ ගබඩා ද තනා ඇත්තේ ය. එහි ඇත්තේ රජතුමාගේ සියලු ආභරණ, ඇඳුම් පැළඳුම් ඔටුනු සිංහාසන ජයකොන්ත රාජ කකුද භාණ්ඩ හා වෙනත් රාජකීය උපකරණ ය. මෙබඳු භාණ්ඩවලින් පිරවූ පෙට්ටි අල්මාරි ආදී වස්තු එහි දක්නට ලැබේ.

එක් ප්‍රාකාරයක පටන් අනෙක් ප්‍රාකාරය දක්වා වූ හිස් භූමි ප්‍රදේශය විවිධාකාර දර්ශනීය වෘක්ෂලතාවන්ගෙන් පියකරු ලෙස සකස් කර ඇත. තණ පිට්වල ගෝනුන්, මුන්, තිත් මුවන්, කස්තුරි මුවන්, ඕලු මුවන් ආදී මුව වර්ගයට අයත් සිවුපාවුන් ද හැසිරෙනු පෙනේ. මේ සතුන්ගේ ආහාරය සඳහා තණපිටි වෙන් කැර ඇත්තේ ය. ඔබ මොබ ගමන් කිරීමට හැකිවන අයුරින් ඒ අතරින් අඩි තුනක් උසින් යුත් පටු මං පෙත් තනා තිබේ. එයට යාවන සේ පදික වේදිකා ද තනා ඇත. වැහි වතුර ගලා බස්නා ලෙස ජල මාර්ග පද්ධති ද ක්‍රමානුකූලව ඉදිකැර තිබේ. කානු සහ අගල් ඔස්සේ මඩ නොරැඳෙන ලෙස ජලය බැස යයි. මෙසේ බැස යන ජලය වෘක්ෂලතාවන්ගේ පෝෂණය සඳහා යෙදැවේ. වර්ග සැතපුම් හතරක් ඇතුළත පිහිටි භූමි භාගයෙහි අධිරාජයාගේ සුවිශාල දර්ශනීය මාලිගය පිහිටා තිබේ. ඒ වූ කලී මා මෙතෙක් දුටු විශාලතම දර්ශනීය මාලිගය බව කිව යුතු ය. උතුරු කෙළවරේ පිහිටි ප්‍රාකාරයේ සිට දකුණු කෙළවරේ ප්‍රාකාරය දක්වා මේ මාලිගය ඉදිකැර තිබේ. එහි අංගනය පමණක් ඉතිරි වී ඇත. ඉහළ පෙළේ හමුදා නිලධාරීහු ද, මුර සෙබළෝ ද එහි නිරතුරු සැරිසරති. මහල්

Scanned by CamScanner

කිහිපයක් නැත ද රජ මාලිගය උස් ව පෙනේ. එයට හේතුව රාජමාලිගය වේදිකාවක් මත තනා තිබීම ය. මාලිගය ගොඩනගා තිබෙනුයේ පොළොව මට්ටමේ සිට අඩි දහයක් උස් වූ වේදිකාවක් හෙවත් අත්තිවාරමක් මත ය. ඒ වටා රියන් දෙකක් පමණ උස් වූ කිරිගරුඬ ප්‍රාකාරයකි. එහි පිට පැත්තේ පිහිටා ඇති ටැම් සහ ගරාදි වැට දර්ශනීය ය. මෙය පළලින් අඩි හතකි. මහ ජනයාට ඒ අසලට පැමිණ මාලිගය නැරඹීමට අවස්ථාව සැලසේ.

මෙකී මාලිගයේ ප්‍රධාන ශාලාවල ද වෙනත් අභ්‍යන්තර ගොඩනැගිලිවල ද දැවමුවා මකර කැටයම් දිස් වේ. පක්ෂීන්ගේ සිවුපාවුන්ගේ, යුද භටයන්ගේ, මූර්ති කැටයම්, සටන් දර්ශන දැවමුවා බිත්තිවල දැකිය හැකි ය. මාලිගාවේ ඇතුළත වියන විවිධ වර්ණයෙන් ද, කැටයමින් ද, සිතුවමින් ද අලංකාර ය. කිරිගරුඬ පාෂාණයෙන් තැනූ දර්ශනීය සෝපාන හතරක් මාලිගයේ හතර පැත්තේ ඉදිකැර ඇත්තේ ය. එකී පියගැට පෙළ ඔස්සේ ඉහළට ගොස් කිරිගරුඬ ප්‍රාකාරයට ගොඩ වීමෙන් පසු මාලිගය තුළට පිවිසීමට පුළුවන. මාලිගය ඇතුළත විශාල ශාලාවකි. දහස් ගණනකට එහි රැඳී ආහාර පාන ගැනීමට ඉඩකඩ ඇත. මාලිගය ඇතුළත කාමර විශාල සංඛ්‍යාවකි. ඒ කාමර සියල්ල අංග සම්පූර්ණ ය. කිසිදු අඩු ලුහුඬුවක් එහි නොමැත. මේ කාමර තුළ වියන රතු නිල් කහ හරිත ආදී වර්ණාලේප කොට අලංකාරව පවතී. දොර ජනෙල් ඉතා දීප්තිමත් ලෙස ඔප දමා ඇත්තේ ය. මාලිගයේ පසු පෙදෙසෙහි විශාල ගොඩනැගිලි දිගින් පුළුලින් යුතුව තනා ඇත්තේ ය. රජතුමාට අයත් රන් රිදී මුතු මැණික් ආභරණ පළඳනා වටිනා රෙදිපිළි අගනා ස්වර්ණමය රජතමය භාජන යනාදී සියල්ල මේ ගබඩා කාමර තුළ ආරක්ෂිතව තබා ඇත. ඒ හැරුණු විට ඒ කොටසෙහිම අධිරාජයාගේ අග බිසෝවරුන්ගේ ද, සෙසු බිසෝවරුන්ගේ ද, වෙනත් කාන්තාවන්ගේ ද, ඔවුන්ගේ මෙහෙකරුවන් ගේ හා මෙහෙකාරියන්ගේ ද නිවාස, ස්නානාගාර, නිදන කාමර, මුළුතැන්ගෙවල්, ඇඳුම් අඳින සැරසිලි කරන කාමර යනාදී වශයෙන් තවත් ගොඩනැගිලි රාශියකි.

සුඛ විහරණය හා ආරක්ෂාව නිසි පරිදි සලසා ඇති බැවින් අධිරාජයාට මෙහි රැඳී රාජ්‍ය පාලන කටයුතු පහසුවෙන් පවත්වා ගෙන යා හැකි වේ. මහා අධිරාජයාගේ මාලිගාවට ප්‍රතිවිරුද්ධ

Scanned by CamScanner

පාර්ශ්වයේ තවත් එබඳුම දර්ශනීය සුවිසාල මන්දිරයක් දිස් වේ. එය චින්ගිස් නමැති යුවරාජයාගේ වාසස්ථානයයි. ඔහු අනාගත රාජ්‍යය හිමි රජුගේ මුණුබුරා ය. සියලු කටයුතු මේ මන්දිරය තුළ සිදුවන්නේ ද මහා අධිරාජයාගේ මන්දිරයෙහි පැවැත්වෙන්නා වූ ආකාරයෙන්ම ය. මාලිගයේ උතුරු දිශාවෙන් මහා ප්‍රාකාරයේ සිට ඊතලයක් පතිත වන්නා වූ දුර ප්‍රමාණයෙහි එක් ස්ථානයක පස් කන්දක් දක්නට ලැබේ. මේ පස් කන්දේ පාමුල විෂ්කම්භය සැතපුමක් පමණ වේ. මේ කෘත්‍රිම කඳු ගැටය මත විවිධාකාර දර්ශනීය වෘක්ෂලතා වගා කැර ඇත. මල් හා ගෙඩි හට ගන්නා ලොකු කුඩා ගස් කොළන් රාශියක් සිටුවා ඇති මේ කන්දේ දර්ශනය මනස්කාන්ත ය. රාජ්‍යයෙහි කිනම් ස්ථානයක දර්ශනීය වෘක්ෂයක් ඇත්තේ යයි අධිරාජයාට සැලවුවහොත් ඔහු ඒ ගස මුලින් උදුරා පස් කුට්ටියත් සමග ඇතුන් ලවා ගෙන්වා ගෙන මේ "ගස් කන්දේ" සිටුවීමට නියෝග කරයි. මේ පස් කන්ද හෙවත් ගස් කන්ද නිර්මාණය කෙළේ අධිරාජ මාලිගය අසල විශාල ළිඳක් කැණීමෙන් පස් ගොඩ දැමීමෙනි. ළිඳක් වුව ද එය විශාල පොකුණක් වැන්න. මෙකී විශාල පොකුණට දිය සපයන්නේ ජල මාතිකාවක් මගිනි. මේ පොකුණේ දියෙන් පස් කන්දේ සිටුවා ඇති වෘක්ෂලතා පෝෂණය වේ. එයින් ගලා යන දිය දහරාව තවත් ගැඹුරු සුවිශාල පොකුණකට එක් රැස් වේ. මේ පොකුණ පිහිටා ඇත්තේ අධිරාජ මාලිගයත් යුවරාජ මාලිගයත් අතර ය. එය ජලජ පැළෑටි සහ විවිධ වර්ගයේ මත්ස්‍යයන් බෝකිරීම සඳහා යොදාගෙන ඇත. මාලිගයේ ආහාර සඳහා අවශ්‍ය මත්ස්‍යයන් ප්‍රමාණවත් තරම් මේ පොකුණේ බෝ වෙයි. සේරුන්, හංසයන් ආදි වෙනත් ජලචර පක්ෂීහුද මේ පොකුණේ සැරිසරති. මේ පොකුණේ ගලා යන ජල මාතිකා දිගේ මත්ස්‍යයන් බැහැර යෑම වැළැක්වීම සඳහා යකඩ දැල් ආවරණ යොදා ඇත. පොකුණට ඉහළින් මාලිගා දෙක අතර ඔබමොබ ගමන් කිරීම සඳහා පාලමක් යොදා තිබේ.

අධිරාජයාගේ මාලිගා විස්තර මෙතෙකින් සමාප්ත කොට මෙතැන් සිට ප්‍රකාශ කරනුයේ තයිදු නමැති පුරවරයේ තොරතුරු ය.

ඛාන් බාලික් නමැති රාජකීය පුරවරය-ගොඩනගා ඇත්තේ විශාල ගංගාවක නිම්නයෙහි ය. අති පුරාණයෙහි සිටම ඛාන් බාලික්

Scanned by CamScanner

සුන්දර රමණීය නගරවරයක් ලෙස ප්‍රසිද්ධියට පැමිනුණි. ඛාන් - බාලික් යනුවෙන් නම් කැර ඇත්තේ මෙය අධිරාජයාගේ නගරය බැවිනි. එහෙත් මෑත භාගයේ අධිරාජයාට විරුද්ධව කැරලි ගැසීමට සැරසෙන සතුරන් විරුද්ධකාරයන් මේ ප්‍රදේශයේ ගැවසෙන බව නිමිත්ත පාඨකයෝ රජුට කීහ. එහෙයින් අලුත් නගරයක් තැනීමට අධිරාජයා සිතා ගත්තේ ය. අලුත් නගරය තැනීම ආරම්භ කෙළේ ඉහත සඳහන් කළ ගංගාවේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයෙහි ය. මෙහි දී මා කලින් විස්තර කෙළේ නව නගරයෙහි මාලිගා සංකීර්ණය පිළිබඳවයි. අලුත් නගරය තනා නිම කිරීමෙන් පසු අධිරාජයා පැරැණි නගරවැසියන් සියලු දෙනාට ම එහි පැමිණ පදිංචි වන සේ නියෝග කෙළේ ය. එසේ වුවද පුරාණ නගරයේ පදිංචි සමහරු අලුත් නගරයේ විසීමට යෑමට අභිලාෂයක් නොදැක්වූහ. එයට හේතුව රජුට එරෙහි වීම නිසා නොවේ. ඉඩකඩ මඳ යයි සැලකූ බැවිනි. මෙකී නගරය ඉදි කෙළේ ඍජුකෝණාශ්‍රයක් ලෙසිනි. එය දිගින් පළලින් සැතපුම් විසි හතරකි. එක් පැත්තක් සැතපුම් හයකි. සමස්ත නගරයම ආවරණය වන පරිදි විශාල ප්‍රාකාරයක් ඉදිකැර තිබේ. මේ ප්‍රාකාරයෙහි පාදම අඩි දහයක ඝනකමින් යුක්ත ය. මුදුනේ ඝනකම අඩි තුනකි. ඉහළට වන විට ක්‍රමයෙන් සිහින් වී යන ආකාරයෙනි. පවුරේ තැනින් තැන කුරුබිලි තනා තිබේ. ශක්තිමත් සුදු පැහැති බදාමයකින් මෙකී කුරුබිලි තනා ඇත්තේ ය. ඍජු රේඛාවකට සිටින සේ සියලු ඉදි කිරීම් කැර ඇති බැවින් කවර දිසාවක සිට බැලුවද පෙනී යන්නේ ඍජුව ය.

ඍජු රේඛාවක සිටින සේ නගර අභ්‍යන්තරයෙහි ද ඉදිකිරීම් නිමවා තිබේ. ප්‍රාකාරයේ එක් පැත්තක වාහල්කඩක් මතට නැගී අනෙක් පැත්ත කෙළින් බැලුවොත් එහි පිහිටි වාහල්කඩ එක එල්ලේ පෙනෙන්නේ ය. එක වාහල් දොරටුවකින් ඇතුළු වන කෙනෙකුට ඇතුළත මහජනයා සඳහා වූ වෙළඳහල් සහ ආපන ශාලාවලට පිවිසීමට හැකි ය. රෙදි පිළි ආහාර පාන ගෙදර දොර භාවිතයට අවශ්‍ය බඩුමුට්ටු යනාදි සියල්ල නො අඩුව එහි විකිණීමට ඇත. ඒ ඒ වීථි දෙපස ඇත හිස් ප්‍රදේශයෙහි සතරැස් කොටුවල එකම පේළියට සිටින සේ විවිධ වර්ගයේ ගස් සිටුවා තිබේ. මේ අයුරින් ගස් සිටුවා ඇති භූමි ප්‍රදේශය අතර තුර ගොඩනැගිලි තැනීමට සුදුසු ස්ථාන වෙන් කැර ඇත. එක් එක් පවුලක එක් එක්

ප්‍රධානියාට හිමි වන සේ මේ බිම් කැබැල්ල පවරා දෙනු ලැබී ය. ඒ ඒ ගෝත්‍රයේ මෙනම් පුද්ගලයාට මෙකී ඉඩම් කොටස පවරා දුන් බවත් ඉදිරි කාලයේ ඔහුගේ පරම්පරාවේ සාමාජිකයනට එහි උරුමය හිමිවන බවත් ප්‍රකාශ කැරේ. දාම් ලෑල්ලක කොටු බෙදා වෙන් කැර තිබෙන පරිදි මේ ඉඩම් කොටස් මායිම් ලකුණු කොට තිබේ. මනා ලෙස සැලසුම් කොට නගරාලංකාරයට බාධා නොවන පරිද්දෙනි. විශාල ප්‍රාකරයක් නගරය වටා තිබේ. ඒ ප්‍රාකාරයෙහි වාහල්කඩ දොළසකි. මහා ප්‍රාකාරයෙහි වාහල්කඩ මත ගෙඩි ගෙවල් ද තනා ඇත. එක් පැත්තක ගෙඩි ගෙවල් පහක් බැගින් ඉදිකරන ලදී. ඕවරක විශාල ලෙස ඉදිකර තිබෙන බැවින් පුරවරය ආරක්ෂා කිරීමට යොදා තිබෙන මුර භටයන් එහි තැන්පත් කැර තැබීමට පුළුවන. එක් එක් දොරටුව අසල මුර භටයන් දොළොස් දෙනා බැගින් මෙහෙවරෙහි යොදවා ඇත්තේ ය. සතුරු ආක්‍රමණ එල්ල නොවුණද මෙතරම් විශාල සේනාංකයක් මුර සේවයෙහි යොදවා ඇත්තේ අධිරාජයාගේ බල පරාක්‍රම හා ප්‍රෞඪත්වය ප්‍රදර්ශනය කිරීමේ අභිලාෂයෙනි. එපමණක් නොව කැතේ වැසියන් කවදා හෝ රජුට එරෙහිව නැගී සිටිතැයි සැකයක් ද අධිරාජයාගේ සිතෙහි පවත්නා නිසා ය. මේ සැකය රජුගේ සිතට ඇතුළු කරන ලද්දේ නිමිත්ත පාඨකයන් හා ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන් විසිනි.

සතරැස් සැතපුම් විසි හතරකින් පරිමිත මේ පුරවරය මධ්‍යයෙහි ඉතා උස් ගොඩනැගිල්ලක් මත ගංඨාරයක් සවිකැර තිබේ. රාත්‍රියෙහි මේ ගංඨාරය නාද කිරීමෙන් පසු මේ නගරයෙහි මංමාවත් ඔස්සේ කිසිවකුත් ඔබ මොබ ගමන් කරන්නේ නැත. ඉතා හදිසි ආපදාවක දී මිස ඔවුහු වීථි ඔස්සේ ගමන් නොකරති. යම් හෙයකින් හදිසි අවශ්‍යතාවක් නිසා ඔබ මොබ යෑමට සිදුවුවහොත් හුළු එළියක් රැගෙන යා යුතු ය.

වාසල් දොරටුවලින් පිටස්තර බාහිර ප්‍රදේශයෙහි පෙනෙන තෙක් මානයේ විහිදුනු මංමාවත් හා නිවාස පේළි තිබේ. එක් මාවතක් සැතපුම් තුනක් හෝ හතරක් දුරට විහිදේ. පිට නුවර ජනගහනය ඇතුළු නුවර ජනගහනයට වඩා අධික ය. සැතපුමකට පමණ දුරින් විදේශයන්ගෙන් පැමිණෙන වෙළෙඳ ප්‍රජාව සඳහා ආපනශාලා ද, තානායම් ද පිහිටුවා තිබේ. ඒ ඒ රටවලින් පැමිණෙන වෙළෙඳුන්

Scanned by CamScanner

හා ආගන්තුකයන් සඳහා වෙන වෙනම තානායම් ඇත්තේ ය. ලොම්බාවරුන්, ජර්මානුවන්, ප්‍රංශ ජාතිකයන් යනාදී වශයෙන් විවිධ ජාතිකයෝ වෙන වෙන ම මේ තානායම්හි ලැගුම් ගනිති.

ඇතුළු නුවර ද පිට නුවර ද ගණිකාවෝ විසි පන්දහසක් පමණ සිටිති. මේ ගණිකාවන් සියයකට දහසකට එකා බැගින් නිලධාරීන් පත් කැර ඇත. ඔවුන් සියලු දෙනාටම ප්‍රධාන කපිතාන් ජනරාල්වරයෙකි. විදේශවලින් පැමිණෙන දූතයන්ගෙන් මුදල් අය කැර ගැනීම සිරිතකි. මේ ආදායම අධිරාජයාගේ ප්‍රයෝජන සඳහා ය. එබැවින් එසේ අය කැර ගන්නා මුදල් පරිපාලනයක් කිරීම ද සිදුවේ. තානාපතින් පිළිබඳ කටයුතු සිදු කැරෙනුයේ ගෞරවාන්විත ආකාරයෙනි. මේ තානාපතිවරුනට එක් එක් තැනැත්තාට එක් ගණිකාවක බැගින් සෑම රාත්‍රියක් පාසාම යවනු ලැබේ. එක රැයකදී යැවූ ගණිකාව ඊළඟ රාත්‍රියෙහි යවන්නේ නැත. මෙසේ ගණිකාවන් තානාපතිවරුනට සපයන්නේ අධිරාජයාගෙන් පිරිනැමෙන්නා වූ ගෞරවනීය තුටුපඬුරක් වශයෙනි. අබිසරුලියන් සඳහා ගාස්තු ගෙවන්නේ රාජ භාණ්ඩාගරයෙනි. එහෙයින් රාජ දූතයන් ගණිකාවන්ට ගාස්තු ගෙවිය යුතු නොවේ.

මේ පුරවරයෙහි රාත්‍රී මුර සංචාර නිරන්තරයෙන් පැවැත්වේ. මුර භටයන් තිහක - හතළිහක පමණ කණ්ඩායමක් වශයෙන් නිරතුරු වීථි සංචාරය කරන්නේ ය. නිවෙස් තුළින් පිටවී යන එන පුද්ගලයන් ගැන ඔව්හු නිරතුරු විපරම් කරති. නගරයෙහි මහා ගංඨාරය තුන්වන වරට නාද කිරීමෙන් පසු රාත්‍රී කාලයෙහි වීථි සංචාරය කරන්නවුන් පරීක්ෂා කිරීම පටන් ගැනේ. නිතර නිතර රාත්‍රියේ ගමන් කරන්නවුන් රාත්‍රියේ අල්ලා ගෙන රඳවා තබා පසු දින ඔවුන් පරීක්ෂා කර කරුණු විමසීමට පටන් ගනී. ඒ සඳහා විශේෂ නිලධාරියකු පත් කැර තිබේ. අල්ලා ගන්නා ලද යම් පුද්ගලයකු අපරාධයක් කැර ඇත්නම් අපරාධයක් සැලසුම් කැර ඇත්නම් ඔහුට දඬුවම් දෙනු ලැබේ. ඇතැම් විට දෙපා තැලීම, පහර දීම හෝ මරණීය දඬුවම් දීම ආදිය සිදු කැරේ. අපරාධකරුවන්ගේ ලේ සෙළවීම බරපතල වරදක් ලෙස සලකන්නේ ආගමික පූජකයන්ගේ අනුශාසනා හේතුවෙනි. භික්ෂූහු උගත් නක්ෂත්‍රකරුවෝ වෙති. බක්ෂි යනුවෙන් හැඳින්වෙනුයේ භික්ෂූන්ට ය. ටිබැට් දේශයේ බෞද්ධ භික්ෂූහු ලාමාවරුන් ලෙස හැඳින්වෙති.

Scanned by CamScanner

අරාබින් හා පර්සියානුවන් ඔවුන් හඳුන්වනුයේ 'බක්ෂි' යනුවෙනි. ලේ සෙළවීමත්, සතුන් ඝාතනය කොට බලි බිලි පූජා පැවැත්වීමත් ඔවුන්ගේ ආගමට විරුද්ධ වේ.

අල් - තයිදු පුරවරයේ අභ්‍යන්තර ස්වභාවය විස්තර කිරීමෙන් පසු කැතේ වැසියන් රජුට එරෙහිව කැරලි ගැසීමට හේතුව ඔබට පහදා දෙන්නෙමි.

රජයේ පදවි තනතුරු දීමෙන් ඉඩම් පවරා දීම ආදී කටයුතු සංවිධානය කිරීම සඳහා දොළොස් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් තිබේ. ඇක්මැක් නමැති මුස්ලිම් (සැරසින්) ජාතිකයා ඔවුන් සියලු දෙනාටම වඩා අධිරාජයා සමග සමීප සම්බන්ධකම් පැවැත්වූවෙකි. අධිරාජයා මුලා කොට ගෙන තම අවශ්‍යතා සපුරා ගැනීමට ඔහු හැම විටම මාන බැලුවේ ය. නිදහසේ තම සිතැඟි පරිදි කටයුතු කිරීමට ඔහු ඉඩකඩ සලසාගෙන තිබිණි. ඔහු රජයේ ඇතැම් තනතුරු පත් කිරීමටත් පුද්ගලයන් අහේතුකව තනතුරුවලින් නෙරපා හැරීමටත් රජුට උපදෙස් දුන්නේ ය. ඇතැම් පුද්ගලයන් අධිරාජයාට විරුද්ධව කටයුතු කරන්නේ යයි කියා බිඳුවා ඔවුන් මරා දැමීමට ද කටයුතු යෙදී ය. ඇක්මැක් කියන කරන දෑ අධිරාජයා විමසීමකින් තොරව පිළිගැනීම නිසා බොහෝ ජනයා අසරණ වූහ. මරණ දඬුවමට යටත් වූහ. ඇක්මැක් ගේ බලපෑම නිසා බොරු වැරැදිවලට හසු වූ පුද්ගලයන්ට නීතියේ පිළිසරණ ලබා ගැනීමට පවා නොහැකි විය. ඇක්මැක් රජුගේ සිත් දිනාගෙන බොහෝ අයුතු අසාධාරණ කටයුතු කෙළේ ය.

බොහෝ රූමත් ස්ත්‍රීහු ඔහුගේ වසඟයට පත්වූහ. ඇක්මැක්ගේ රුදුරු වසඟයට පත් නොවූ රූමත් ස්ත්‍රියක ඒ ප්‍රදේශයේ නොමැති තරම් ය. පියකරු කන්‍යාවන් සිටින නිවෙස් කරා පණිවිඩකරුවන් යවා ඔහු ඔවුන් තමන් වෙත ගෙන්වා ගත්තේ පියවරුන්ට උසස් තනතුරු දෙන බවට පොරොන්දු වෙමිනි. මහජනයා ඇක්මැක් සැලකුවේ උපරාජයා හැටියට ය. ඇක්මැක් රජයේ අසවල් අසවල් තනතුරු හිස් වී ඇතැයි අධිරාජයාට පවසා ඔහු මුලා කොට කලින් කී පරිදි ස්ත්‍රීන් ලබා දෙන අයට තනතුරු දුන්නේ ය. අධිරාජයා තම අධම ක්‍රියා කලාපයට උපක්‍රමයෙන් පොළඹවා ගත් ඇක්මැක් බොහෝ අසාධාරණ දුෂ්ට ක්‍රියාවන්හි යෙදුණි. බොහෝ තරුණියන් තම මනදොළ සපුරා ගැන්මට බලහත්කාරයෙන් යොදා ගති.

Scanned by CamScanner

ඒ නිසා වැසියෝ ඔහු කෙරෙහි උරණව සිටියහ. මේ සියලු අසාධාරණ දුෂ්ට අපරාධයන්හි ද කාම අපරාධයන්හි ද යෙදුණු බව ප්‍රකට වූයේ ඔහුගේ මරණයෙන් පසුවයි.

ඇක්මැක්ට පුතුන් විසිපස් දෙනෙකි. ඔව්හු ද රජයේ ඉහළ තනතුරුවලට පත්ව සිටියහ. ඇක්මැක් සේ ඔව්හු ද දරුණු දුෂ්ට අපරාධයන්හි ද, නොපණත් කම්වල ද, ස්ත්‍රී දූෂණයෙහි ද යෙදුණෝ ය. ඇක්මැක් අධිරාජයා මුල් කොට ඇතැම් පුද්ගලයන්ට තනතුරු ලබා දුන්නේ අල්ලස් ගැනීමෙනි මෙබඳු අයුතු අසාධාරණ හේතු කොට ගෙන ඔහු විශාල මුදලක් උපයාගති. වසර විසිදෙකක පමණ කාලයක් මුළුලලේ අසාධාරණ ලෙස බලය පරිහරණය කිරීම නිසා කැතේ ප්‍රදේශ වාසීහු ඇක්මැක් මරා දැමීමට කුමන්ත්‍රණය කළහ. ඒ හා සමගම රජයට විරුද්ධව කැරලි ගැසීමට ද සැරසුණහ. මේ සඳහා මහජනයා රහසිගතව එක්රැස්වී සාකච්ඡා කළෝ ය.

මේ කුමන්ත්‍රණයට මූලික වූයේ කැතේ වැසියකු වූ චෙන් හු නමැති සේනාපතියා ය. ඔහු හය දහසක් පමණ වූ සේනාංකයක ප්‍රධානියෙකි. ඔහුගේ මවට ද, බිරිඳට ද, දියණියට ද ඇක්මැක් ගෙන් අතවර සිදුවී තිබිණි. එසේ ම වාන් හූ ද දස දහසක සේනාංකයක ප්‍රධානත්වය දැරී ය. අධිරාජයා ඛාන් - බාලික් නගරයේ මාලිගාවේ තුන් මාසයක් රැඳී සිට අනතුරුව ෂැංග් - ටු මාලිගයෙහි වාසය පිණිස පිටත්ව යන්නේ ය. එමෙන්ම යුවරජ චින්ගීස් ඛාන් කුමරා ද සුපුරුදු මාලිගයෙහි වාසයට යයි. අහ්මඩ් (ඇක්මැක්) එතැන් සිට රජුගේ බලය අතට ගෙන තම සිතැඟි පරිදි ඒ ප්‍රදේශයේ පාලනය පවත්වයි.

මේ අවස්ථාවෙහි චෙන් - හු සහ වාන් - හු එකතුව කැතේ ප්‍රදේශයේ ප්‍රධානීන් සමග රහසිගතව සාකච්ඡා පවත්වා ගෙන ගියෝ ය. ඔවුන්ගේ මාර්ගයෙන් රටේ සෙසු ප්‍රදේශයන්හි ප්‍රධානීන්ට ද අවශ්‍ය කටයුතු සැළ කළහ. කිසියම් දිනයෙක ගිනිමැලයක් දල්වන බව ද ඒ සංඥාවෙන් පසු ඉදිරියට හමුවන සියලු රැවුල් කාරයන් මරා දැමිය යුතු යයි දන්වා සිටියෝ ය. කැතේ වැසියන් රවුළ වවන්නේ නැත. එහෙත් ටාටර්වරු ද මුස්ලිම්වරු ද, ක්‍රිස්තියානි කාරයෝ ද රවුළ වවන්නෝ වෙති.

කුබ්ලායි ඛාන් සිංහාසනාරූඪ වූයේ නීත්‍යානුකුල උරුමයෙන් නොවේ. ආයුධ බලයෙනි. එහෙයින් කැතේ වැසියෝ ඔහුට ගරුසරු

නොකරති. එමෙන්ම අධිරාජයා අධිකරණයට ද රජයේ උසස් තනතුරුවලට ද පත්කැර ඇත්තේ ටාටර්වරුන් මුස්ලිම්වරුන් හා ක්‍රිස්තු ලබ්ධිකයන් ය. විදේශිකයන් හා ඥාතීන් ද උසස් තනතුරුවලට පත්කරන ලදී. එහෙයින් අධිරාජයාගේ පාලනය පිළිබඳව රටවැසියෝ අමනාපයෙන් කෝපයෙන් සිටියහ. කැතේ වැසියන්ට මුස්ලිම්වරුන් සහ ටාටර්වරුන් සැලකුවේ පහත් අන්දමිනි. වහලුන්ට මෙනි. මුස්ලිම්වරුන් සැලකුවේ ඊටත් වඩා දුෂ්ට ආකාරයෙනි. කුමන්ත්‍රණයට අදාළ සියලු කරුණු සංවිධානය කැර ගැන්මෙන් පසු චාන් හු සහ වෙන් හු රාත්‍රියේ රහසිගතව අධිරාජ මාලිගයට ඇතුළු වීමට තීන්දු කළහ. චාන්හු සෙනෙවියා මාලිගයට ඇතුළු වී එහි ශාලාවක සිංහාසනයක හිඳ පහන් දල්වා ඇක්මැක් (අහ්මඩ්) හට වහා එහි පැමිණෙන ලෙස දන්වා දූතයකු යැවී ය. චින්ගිස් කුමාරයාගේ පනිවිඩයක් වශයෙන් පිළිගෙන දූතයා අහ්මඩ් (ආක්මැක්) වෙත ගොස් වහා රජමැදුරට පැමිණෙන ලෙස දන්වා සිටියේ ය.

මධ්‍යම රාත්‍රියේ එබඳු නියෝගයක් ලැබීම පිළිබඳව අහ්මඩ් මවිත විය. එහෙත් කුමරාගේ නියෝගයක් පැහැර හැරිය නොහැකි බැවින් හෙතෙම රජමාලිගය බලා පිටත් වූයේ කඩිනමිනි. නව නගරයේ මහවාසල දොරටුවෙන් අහ්මඩ් ඇතුළු වනවාත් සමගම ටාටර් සෙන්පතියකු ඔහුට මුණ ගැසුණි. කෙග්තායි දොළොස් දහසක මුර හට සේනාවක් ප්‍රධානියෙකි. මේ හදිසියේ කුමක් සඳහා මාලිගයට යන්නේ දැයි හේ අහ්මඩ්ගෙන් විමසී ය. චින්ගීස් කුමරා මාලිගයට පැමිණෙන බවත් ඔහුගේ නියෝගය පරිදි පැමිණි බවත් අහ්මඩ් කීය. එහෙත් චින්ගීස් කුමරා එසේ හදිසියේ පැමිණීමට හේතුවක් නැතැයි කොග්තායි සෙනෙවියා කී ය. එහෙත් කුමරා පිළිගැනීමට හට කණ්ඩායමක් සූදානම් කරන ලෙස ද කොග්තායි කීවේ ය. අහ්මඩ් ගෙන්වා ගත් නමුදු ඉන්පසු ක්‍රියා කළ යුතු ආකාරය ගැන චාන්හු සෙනෙවියා වික්ෂිප්තව සිටියේ ය. අහ්මඩ් මාලිගය පුරා දැල්වෙන ප්‍රදීපාලෝකය අතරින් ගොස් සිහසුනෙහි හිඳිනුයේ චිංගීස් ඛාන් කුමරා යයි සිතා මහත් ගෞරවයෙන් චාන්හු ඉදිරිපිට මුනින් වැටී නමස්කාර කෙළේ ය. එකෙණෙහි දොරකඩ අසල රැක සිටි වෙන්හු නමැති කුමන්ත්‍රණයේ හවුල්කාර හමුදා නිලධාරියා අහ්මඩ්ගේ ගෙළ කඩුවෙන් ගසා සිඳලූයේ ය. මේ සියල්ල කොග්තායි

Scanned by CamScanner

සැඟවී බලා සිට සිංහාසනයේ හිඳගෙන සිටි වාන් හු වෙත හීයක් විද්දේ ය. ඒ ශර ප්‍රහාරයෙන් ඔහු මැරී වැටුණි. අනතුරුව අහ්මඩ් මරා දැමූ චෙන් හූ අත් අඩංගුවට ගන්නා ලදී. ඉන්පසු අතරමගදී හමුවන සියලු ජනයා අල්ලා මරා දමන ලෙස කොග්තායි සිය යුද භටයන්ට නියෝග කෙළේ ය. කුමන්ත්‍රණය වැරදී ගිය බව දත් කැතේ වැසියෝ සිය නිවෙස් තුළ ම රැඳී සිටියහ. එහෙයින් සෙසු ප්‍රදේශවල කැතේ ජාතිකයන්ට ද ඒ බව දන්වා යැවීමට ඔවුනට ක්‍රමෝපායක් නොතිබිණි. කොග්තායි කුමන්ත්‍රණය පිළිබඳ සියලු තොරතුරු ඛාන් වෙත දන්වා යැවී ය. අධිරාජයා මේ පිළිබඳ පුළුල් පරීක්ෂණයක් පවත්වා කුමන්ත්‍රණකරුවනට දඬුවම් පමුණුවන ලෙස නියෝග කෙළේ ය. කුමන්ත්‍රණයට හවුල් වූ සියලු දෙනා මරා දමන ලදී. පිට පළාත්වල සිටි කුමන්ත්‍රණකරුවෝ ද දඬුවම් ලදහ. ඒ හැරුණු විට අධිරාජයා විසින් මෙබඳු කුමන්ත්‍රණයක් සිදුවීමට කරුණු විමර්ශනය කරන ලදී. අහ්මඩ් ගේ ජනතා ද්‍රෝහී ක්‍රියා හේතුකොට ගෙන ජනයා කුමන්ත්‍රණයට පෙළඹුණු බව අවබෝධ කැර ගත් අධිරාජයා ඔහු සපයාගත් සියලු ධනය රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙන්වා ගති. අහ්මඩ් ගේ පුතුන් සත් දෙනෙකු ද්‍රෝහීන් ලෙස සලකා ඔවුන්ගේ හිස සිඳ දමන්නට නියෝග කෙළේ ය. අහ්මඩ් ගේ මෘත දේහය යළිත් ගොඩගෙන කැබලිවලට කපා සුනඛයන්ට ආහාර පිණිස දීමට ද නියෝග කෙළේ ය. අහ්මඩ් ගේ පුත්‍රයන් සමග එක්වී ජනයාට වධහිංසා පැමිණ වූ බොහෝ දෙනෙකුට ද හම ගසා දඬුවම් දීමට කටයුතු සැලසී ය. 'සරසින්' නමැති මුස්ලිම්වරුන්ගේ මඟ පෙන්වීම නිසා මේ සා ව්‍යසනයක් සිදුවූ බව තේරුම්ගත් අධිරාජයා ඔවුන් නින්දිත පිරිසක් ලෙස නම් කෙළේ ය. ඔවුන්ගේ විවාහ චාරිත්‍ර ද ටාටර්වරුන් විවාහ චාරිත්‍රානුකූලව පැවැත්විය යුතු බවට නියම කැරිණ. සිවුපාවුන් සහ වෙනත් සතුන් ගෙළ සිඳ මරාදමනු වෙනුවට බඩ පළා මැරීමට එකඟ කරවා ගන්නා ලදී. මේ සියල්ල සිදුවන ආකාරය මාර්කෝ පෝලෝට ද සියැසින් දැකගැන්මට අවස්ථාව ලැබිණ.

මීළඟට විස්තර කරන්නේ අධිරාජයා සිය රාජ සභාව පවත්වන ආකාරයයි.

කුබ්ලායි ඛාන් අධිරාජයා හට දොළොස් දහසක අශ්වාරෝහක බලකායක් වෙයි. මේ හමුදාව ටාටර් භාෂාවෙන් හඳුන්වන්නේ

"කසිතන්" යනවෙනි. කසිතන් යන්නෙහි අරුත "අධිරාජයා වෙනුවෙන් ඇප කැප වී සිටින භටයන්" යනුයි. මෙතරම් විශාල අශ්වාරෝහකයන් පිරිසක් තමන් වටා සිටින බවක් අධිරාජයා නොදනී. එහෙත් එය රාජ්‍යාරක්ෂාවට අයත් කාර්‍යයකි. අශ්වාරෝහක දොළොස් දහසේ බල ඇණියට ප්‍රධානීහු සතර දෙනෙක් වෙති. එක් සෙන්පතියකු යටතේ තුන් දහසක සේනාවක් පවතී. දින තුන බැගින් ඔව්හු හමුදා සේවයේ යෙදිය යුතු ය. දිවා රාත්‍රී තුනක් බැගිනි. එක් භට පිරිසකගේ විරාමයෙන් අනෙක් භට සේනාව රාජ්‍යාරක්‍ෂාව භාර ගැනීම අනිවාර්යයි. විවේක ගන්නා භටයනට නිවාඩු කාලය තුළ දී විශේෂ හේතුවක් නොමැතිව මාලිගයෙන් බැහැර යාමට අවසර නොමැත. එහෙත් තම පෞද්ගලික අවශ්‍යතා අනුව නිවාස කරා යෑමට වුවමනා වුවහොත් සේනාපතියාට දන්වා නිවාඩු අවසර ගත යුතු ය. පවුලේ කෙනෙකුගේ දුඃඛදායක අවස්ථාවක දී නිවාඩු ගත යුත්තේ ලිපියක මාර්ගයෙනි. දීර්ඝ නිවාඩුවක් ගත යුතු නම් ඒ සඳහා අධිරාජයාගෙන් අවසර ගත යුතු වේ. සියලු භටයන් රාත්‍රියෙහි ස්වකීය නිල නිවාස තුළ ම රැඳී සිටිය යුතු ය.

අධිරාජයා වරින් වර රාජකීය උත්සව පවත්වයි. මේ උත්සවයට පැමිණෙන රාජකීයයන් හා සම්භාවනීය ප්‍රභූවරුන් උදෙසා අසුන් පනවනු ලබන්නේ විශේෂ පිළිවෙළකට ය. අධිරාජයාගේ මේසය තබන්නේ සිංහාසනය ඉදිරි පිටිනි. ඔහු දකුණු දිශාභිමුඛව උතුරු දිශාවේ පිහිටි ආසනයේ හිඳී. අධිරාජයාගේ වම් පසින් අග බිසොව අසුන් ගත්තී ය. සිංහාසනයට දකුණු පසින් තරමක් මිටි අසුන් පේළියකි. එහි අසුන් ගන්නේ රාජ කුමාරවරුන් සහ ලේ නෑයන් සහ රදළවරුන් ය. අනාගත රාජ්‍යය හිමි චින්ගිස් කුමරාගේ ආසනය එයට වඩා උසින් සිටින සේ තබයි. කුමාරවරුන් හිඳගත් කල අගරජුගේ පාද ඔවුන්ගේ හිස් මට්ටමේ සිටින සේ අසුන් පිළියෙල කැරේ. කාන්තාවන් සඳහා ආසන පනවා ඇත්තේ අනුක්‍රමයෙන් මිටි වන ලෙසිනි. රජුගේ පුතුන්ගේ භාර්‍යාවන්, මුණුබුරන්ගේ භාර්‍යාවන් හා රදළවරුන්ගේ භාර්‍යාවන්ට ද අසුන් ගන්නේ වම්පසිනි. ඉන් ඉක්බිති නිලමවරුන්ගේ ද, හමුදා නිලධාරීන්ගේ ද භාර්‍යාවෝ අසුන් ගනිති. තනතුරු පදවි ප්‍රභූත්වය යනාදී සියල්ල සලකා බලා එයට අනුරූප වන ආකාරයෙන් ආසන

Scanned by CamScanner

පැනවෙයි. සියලු දෙනා ම අසුන් ගන්නේ තම තරාතිරම පදවි තනතුරු ප්‍රභූත්වය යනාදි කරුණු සලකා බලා වෙන් කැරුණු සුදුසු අදාළ ආසන මත ය. අධිරාජයා මේ සියලු දෙනාටම වඩා ඉහළින් වේදාකාව මත සිංහාසනාරූඪ වී සිටී. ඔහුට උත්සවයට සහභාගි වන සියලු දෙනා ම පැහැදිලිව පෙනේ. මේ උත්සවයේ දී එයට සහභාගිවන සියලු දෙනාටම එක සේ මෙබඳු ආසනවල හිඳ ගැනීමට ඉඩ පහසුකම් නොයෙදේ. ඔව්හු බිම අතුරන ලද බුමුතුරුණු මත හිඳගනිති. මේ උත්සවය සඳහා බොහෝ දුර බැහැර සිට නානාප්‍රකාර ජනයා පැමිණෙති. ඔව්හු අනර්ඝ දුර්ලභ විචිත්‍ර තෑගි භාණ්ඩ රැගෙන එති. එපමණක් නොව තවත් විශාල පිරිසක් උත්සව ශාලාවෙන් පිටත ද රැස්වී හිඳිති. වැඩවසම් රාජකාරිවල ද නිලතලවල ද නියුක්තයෝ මෙසේ ශාලාවෙන් පිටත සිටින්නාහ. අහිමි වූ නිල තනතුරු යළි ලබා ගැන්මට ද ගම්බිම් ප්‍රවේණි රාජකාරි ආදිය අපේක්ෂාවෙනි ඔවුන් මෙසේ රැස් වී සිටිනුයේ. රජ මාලිගාවේ පැවැත්වෙන මෙබඳු උත්කර්ෂවත් උත්සව, විවාහ මංගල උත්සව ආදියෙහි දී රැස්වීමට ඔව්හු මහත් කැමැත්තක් දක්වති.

අධිරාජයා හිඳගෙන සිටිනුයේ ප්‍රධාන උත්සව ශාලාවේ මැද වේදිකාව මත ය. රජුගේ අසුන ළඟ අගනා දැවමුවා පෙට්ටගමකි. එහි එක් පැත්තක දිග තුන් රියනකි. රත්තරනින් කළ සත්ව රූප එහි ඔබ්බා ඇත. ඒ තුළ විශාල කළසක් තිබේ. මෙය අගනා රන්, මිණි, මුතු ආදියෙන් සරසා අලංකාර කැර ඇත්තේ ය. ඒ තුළ විශාල කළසක මිදි යුෂ පුරවා තිබේ. පෙට්ටගම සතර පැත්තේ තවත් භාජන සතරක වෙළඹ කිරි ද, ඔටු කිරි ද, තවත් මධුර පාන වර්ග ද පුරවා තිබේ. ගැලුම් හැටක් පමණ මේ එක් එක් බඳුනක පුරවා තැබීමට පුළුවන. මේසය මත මිදි යුෂ වත් කිරීමට කුසලාන තබා තිබේ. මේ භාජන රනින් රිදියෙන් හැඩ වැඩ දමා අලංකාර කැර ඇත. එක් බඳුනක පුරවන බීම ප්‍රමාණය හත් අට දෙනෙකුට පානය කිරීමට සෑහේ. මේසබලට හිඳගෙන සිටින පිරිසෙන් සෑම දෙදෙනෙකු ඉදිරිපිටම ඉහත කී ආකාරයේ බඳුනක් බැගින් ඇත්තේ ය. පීරිසියක් ද, අඬුවක් සහිත භාජනයක් ද එහි ඇත. සෑම බඳුනකම මත්පැන් පුරවා එය හිස දක්වා ඔසවා පහත් කිරීමෙන් මධු සාදය ඇරැඹේ. පුරුෂයන් සේම ස්ත්‍රීන් ද මධු පානයට එක්වේ. මහරජතුමා

Scanned by CamScanner

ඉදිරිපිට ඇත්තා වූ භාජනවල අගය මෙතෙකැයි ප්‍රමාණ කළ නොහේ.

යටත් ප්‍රදේශවලින් ද, විදේශ රාජ්‍යයන්ගෙන් ද පැමිණෙන අමුත්තන්ට සංග්‍රහ කිරීම සඳහා විශේෂ නිලධාරීහු පිරිසක් වෙති. විදේශීය රටවලින් පැමිණෙන ආගන්තුක සම්භාවනීය ප්‍රභූවරුන් මේ උත්සවයෙහි චාරිත්‍ර ගැන නොදන්නා බැවින් ඔවුන් දැනුවත් කිරීමත් සුදුසු පරිදි අසුන් ගැන්වීමත් ආහාරපාන හා වෙනත් අවශ්‍යතා සපුරාලීමත් ඔවුනට පැවරුණු රාජකාරියයි. කිසිදු අඩුපාඩුවක් නොවන ලෙස සේවකයෝ වහා ක්‍රියාත්මක වන්නාහ.

මේ විශාල ශාලාවෙහි සෑම දොරටුවකම ප්‍රාංශු දේහධාරී දොරටුපාලයන් දෙදෙනෙකු බැගින් සිටිති. ඔවුන් සිටිනුයේ දොරටුවේ දෙපසිනි. ඔවුන්ගේ අතේ යෂ්ටිය බැගින් තිබේ. මෙසේ දෙරටුපාලයන් සිටුවා ඇත්තේ ඇතුළට පිවිසෙන හා පිටවන අමුත්තන් දොරටුවෙහි එළිපත්ත පෑගීම වැළැක්වීම සඳහා ය. එහි පිවිසෙන - පිටවන සියලු දෙනාටම ඔවුහු එළිපත්ත නොපාගන ලෙස නියෝග කරති. යම් හෙයකින් එළිපත්ත පෑගුව හොත් දොරටු පාලයෝ ඔහුගේ ඇඳුම් ගලවා ගනිති. එය ආපසු ලබා ගැනීමට මුදලක් ගෙවිය යුතු වේ. යම් හෙයකින් ඇඳුම බේරා ගැනීමට අපොහොසත් වුවහොත් තමන්ට නියම කර ඇති පරිදි දොරටු පාලයෝ අමුත්තාට පොලු පහර දෙති. දොරටුව පෑගීමේ වරද ගැන නොදත් ආගන්තුකයන් විශේෂ නිලධාරියකු වෙත යවනු ලැබේ. එවිට එකී නිලධාරියා ඔහුට අවවාද කැර නිදහස් කරයි. එළිපත්ත පෑගීම අසුබ බව මෙරට පවත්නා විශ්වාසයකි. දොරටුපාලයන් පත් කැර සිටින්නේ ඒ අපලයෙන් ආගන්තුකයන් බේරා ගැනීම සඳහා ය. එහෙත් මත්පැන් පානයෙන් වෙරි වූ තැනැත්තන් අතින් ඒ වරද සිදුවුවහොත් එයට කිසියම් නිදහසක් ලැබෙයි.

රජුගේ ආහාරපාන තබා ඇති මේසයෙහි ආවතේව සඳහා විශාල පිරිසක් සිටිති. ඔව්හු නානාප්‍රකාරයෙන් රජතුමාට සංග්‍රහ කරන්නාහ. මේ ආවතේවකාරයන් සියලු දෙනාම මුකවාඩම් බැඳගෙන සිටිති. මෙසේ මුකවාඩම් බැඳගෙන සිටිනුයේ පියකරු සේද හෝ වේල් රෙදි පටිනි. එයට හේතුව රජතුමාගේ ආහාරපාන ආදියට සේවකයන්ගේ ආශ්වාස, ප්‍රශ්වාස, මුවින් නිකුත්වන වාතය වැදීම වළකාලීමේ අටියෙනි. සේවකයන් අමුත්තන්ට බීම බඳුනක් පිළිගැන්වූ කල්හි ඔව්හු ඒ බඳුන අතට ගෙන අඩි තුනක් පමණ

Scanned by CamScanner

පසු පසට ගොස් බිම දණ ගසා රජතුමාට ගෞරවය පළකරති. ඒ සමගම උත්සවයට පැමිණි රාජ භවනයේ නිළියන් ඇතුළු සියලු අමුත්තෝ රජතුමාට ගෞරවාචාර දක්වන්නේ බිම වැතිරගෙන ය. එවිට සියලු සංගීත කණ්ඩායම් එක්වර වාදන ආරම්භ කරයි. මේ අවස්ථාවට සංගීත කණ්ඩායම් රාශියක් සහභාගි වේ. භෝජන සංග්‍රහය පවත්නා කාලය ඇතුළත ද රජතුමා ආහාර පාන ගන්නා තෙක් ද තූර්යවාදන නොකඩවා පැවැත්වේ. මේ අතරතුර අමුත්තෝ අධිරාජයාට වරින් වර ගෞරවාචාර පවත්වන්නාහ. මේ භෝජන සංග්‍රහයට ආහාර පාන වර්ග රාශියක් සම්පාදනය කැරේ. විස්තර කළ නොහැකි ආහාර පාන වර්ග වලින් පිරී ඉතිරී යයි. අතුරුපස ගැනීමෙන් පසු මේස මතින් ආහාර පාන වර්ග සියල්ල ඉවත් කරනු ලැබේ. ඉන්පසු විදේශයන්ගෙන් පැමිණි අමුත්තන් ඇතුළු රාජකීයයන්, සම්භාවනීයයන්, ප්‍රමුඛ පිරිස පිනවීම සඳහා නාට්‍ය ශිල්පීහු ද, විජ්ජාකාරයෝ ද, ගායන වාදන ශිල්පීහු ද විවිධාකාර විවිධ ප්‍රසංග ඉදිරිපත් කරති. මේ දර්ශන නරඹා සියලු දෙනා විනෝද වෙති.

සැප්තැම්බර් මාසයේ විසි අටවන දාට යෙදෙන්නා වූ රජුගේ ජන්ම දිනය වෙනුවෙන් වාර්ෂික උත්සවයක් රාජ්‍යය පුරා හැම තැනකම පැවැත්වේ. එසේ ම යටත් ප්‍රදේශයන්හි ද එලෙසින් ම රජු වෙනුවෙන් උපන් දින උත්සව පවත්වනු ලැබෙයි. ටාටර්වරුන් විසින් පවත්වන්නා වූ මෙය උත්කර්ෂවත් උත්සවයකි. ඒ හැරුණු විට සෑම වර්ෂයකම පළමු වන දිනයෙහි අලුත් අවුරුදු උත්සවය ද පැවැත්වේ. රජතුමා අලංකාර ලෙස රත්තරනින් හැඩ වැඩ දැමූ ඇඳුමකින් සැරැසී මේ උත්සවයට සහභාගි වේ. විසි දහසක පමණ භට සේනාව ද, යුද හමුදා ප්‍රධානීන් ද, වෙනත් ප්‍රභූවරුන් රදළ වරුන් හා රාජ නිලධාරීන් ද මේ උත්සවයට සහභාගි වන්නේ රජතුමාගේ ඇඳුමට සමාන පැහැයෙන් යුත් ආයිත්තමින් සැරසෙමිනි. එහෙත් ඔවුන්ගේ ඇඳුම් රජතුමාගේ ඇඳුම තරම් වටිනාකමින් යුක්ත නොවේ. රදළයන්ගේ හා යුද හමුදාවේ නිලධාරීන්ගේ ඇඳුම් පිළියෙළ කැර ඇත්තේ සේද පට පිළිවලිනි. මේ ඇඳුම් රන්වන් ය. රත්රන් නූලෙන් වැඩ දැමූ මුවසම් පටියක් ඔවුන්ගේ සැට්ටය ඉනට තදවන සේ බඳිති. අගනා පාවහන් ද පළඳිති. රාජකීය සමීප ආශ්‍රය පවත්වන්නා වූ රදළවරු මේ උත්සවයේ දී අධිරාජයා විසින් සපයා දෙනු ලැබූ රන්, මිණි, මුතු

Scanned by CamScanner

ආදියෙන් සැරසූ අනර්ඝ මහත් අගයෙන් යුත් ඇඳුමින් පැළඳුමින් සැරසෙති. අවුරුද්දේ චන්ද්‍ර මාසයේ දහතුන් වන දින පවත්වන උත්සවයේ දී ද ඔව්හු මෙබඳු අගනා ඇඳුමින් පැළඳුමෙන් සැරසෙති. කිසියම් රාජ්‍ය උත්සවයකදී රජතුමා විශේෂ පැහැයකින් යුත් විශේෂ ඇඳුමකින් සැරසෙන්නේ නම් රාජ සභාවේ රදළවරුන් ද එකී පැහැයෙන් ම සැරසී සිටිය යුතු ය. එහෙත් ඇඳුමේ වටිනාකම අධිරාජයාගේ ඇඳුමේ වටිනාකමට වඩා අඩු ය. මෙබඳු ඇඳුම් ප්‍රභූවරු උත්සව සඳහා නිතර සූදානම් කර ගෙන සිටිති. එක් ඇඳුමක් වසර දහයක් පමණ කිසි පලුද්දක් නොමැතිව පරිහරණය කළ හැකි වේ. රාජකීය උත්සව සංදර්ශන, පෙළපාලි ආදිය මගින් ප්‍රදර්ශනය කරනුයේ අධිරාජයාගේ ශ්‍රී විභූතිය ය.

අධිරාජයාගේ ජන්මෝත්සවය වෙනුවෙන් ටාටර්වරු ද, වෙනත් රට වැසියෝ ද විවිධාකාර පඬුරු පාක්කුඩම් තෑගි බෝග එවති. අගනා තුටු පඬුරු රැගෙන බොහෝ දෙනා පැමිණෙන්නේ වරප්‍රසාද ලබා ගැනීමට ය. ඉඩම්, නින්දගම්, තනතුරු ආදිය ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. ඔවුන් සියලු දෙනා ම දොළොස් දෙනෙකුගෙන් සමන්විත පාලන අධිකාර මණ්ඩලයකට යොමු කෙරේ. මෙහි දී ඒ පිළිබඳව සාධාරණ විනිශ්චයක් ගෙන ඔවුන්ගේ ඉල්ලීම් ඉටුකැර දෙනු ලැබේ. ඒ හැරුණ විට ක්‍රිස්තු ලබ්ධිකයෝත්, පිළිම වඳින්නෝත්, මුස්ලිම්වරුත් ඔවුනොවුන්ගේ ආගමානුකූල වත් පිළිවෙත් පූජෝත්සව පවත්වා රජුට දීර්ඝායුෂ හා ශ්‍රී සමෘද්ධිය ප්‍රාර්ථනා කරති. පැමිණෙන සියලු ජනයා රජුට ශුභාශිර්වාද පවත්වා ආපසු යති.

ටාටර්වරුන්ගේ වර්ෂාරම්භය වනුයේ පෙබරවාරි මාසයේ පළමු වැනි දා ය. ඔව්හු එදිනට උත්සව සැණකෙළි පවත්වන්නාහ. අධිරාජයාත් සියලු නිලධාරීහු ද, රටවැසියෝ ද සුදු ඇඳුමෙන් සැරසෙති. එය ඔවුන්ගේ චිරාගත පාරම්පරික චාරිත්‍රයකි. සුදු ඇඳුමෙන් සැරසීමෙන් වාසනාව ද, ශ්‍රී සමෘද්ධිය ද, සෞභාග්‍යය ද හිමිවෙතැයි ඔවුහු විශ්වාස කරති. අධිරාජයාට යටත් ප්‍රදේශවල ද ප්‍රදේශ අධිපතියන් යටතේ පවත්නා ප්‍රදේශයන්හි ද සියලු දෙනා නව වසර වෙනුවෙන් තෑගි බෝග පිළිගන්වති. රන්, රිදී, මැණික් හා සුදු රෙදි කච්චි රාශියක් ද අධිරාජයාට පඬුරු කරති. රජතුමාට සෞභාග්‍යයත් භාණ්ඩාගාරයේ පූර්ණත්වයත් පතා ඔවුහු මෙසේ පඬුරු පාක්කුඩම් පිළිගන්වති.

Scanned by CamScanner

ඒ හැරුණු විට කුමාරවරු ද, රදළයෝ ද, ප්‍රභූවරු ද, වංශාධිපතීහු ද නව වසර වෙනුවෙන් සුදු පැහැති තෑගි බෝග හුවමාරු කරගන්නාහ. සියලු ජනයා එකිනෙකාට ශුභ ප්‍රාර්ථනා කරති. ඔවුනොවුන් සිප ගනිමින් තුටු පඬුරු පිළිගන්වමින් ගෞරවාදර දක්වනු පෙනේ. අධිරාජයාට අලුත් අවුරුද්ද වෙනුවෙන් ධවල අශ්වයන් විශාල සංඛ්‍යාවක් පඬුරු කැරේ. සුදු අශ්වයන් හෝ තරමක් සුදු පැහැයට හුරු අශ්වයන් අලුත් අවුරුද්ද වෙනුවෙන් පඬුරු කිරීම වාර්ෂිකව සිදුවේ. ඔවුනොවුන්ගේ වත්කමේ හැටියට නවය බැගින් තෑගි දෙති. වරකට අශ්වයන් නව දෙනා බැගින් නව වරක් අශ්වයන් අසූ එක් දෙනකු රජු වෙත තෑගි කරති. රෙදිපිළි ද, රන් රිදී ස්වර්ණාභරණ ආදිය ද නවය බැගින් නව වරක් පිළිගැන්වේ. මේ සියල්ල සලකා බලන විට අධිරාජයාට එක් අවුරුදු උත්සවයකදී පමණක් අශ්වයන් ලක්ෂයක ප්‍රමාණයක් ලැබෙයි. අධිරාජයාට අයත් හස්තීන් පන්දහසක් පමණ අලුත් අවුරුදු උත්සව සංදර්ශන පෙරහරෙහි ගමන් කරනු පෙනේ.

පක්ෂි රූප, සිවුපා සතුන්ගේ රූප සටහන් සහිත රන් නූලෙන් වැඩ දැමූ පටසේද වස්ත්‍රවලින් ඇතුන්ගේ සිරුරු සරසති. අධිරාජ මාලිගයේ පරිහරණය කරන්නා වූ පිඟන් කෝප්ප රන් රිදී තැටි කෙණ්ඩි ආදි බඩු බාහිරාදිය පෙට්ටගම් දෙකක් ඇතුන්ගේ පිට උඩ තබා පෙරහරේ ගෙන යති. ඔටුවන්ගේ පිටේ රජ මාලිගයේ ගෘහභාණ්ඩ ගෙන යනු ලැබේ. මෙසේ ගෘහභාණ්ඩ රැගෙන යන ඔටුවන්ගේ සංඛ්‍යාව ද විශාල ය. හස්තීන්, අශ්වයන්, ඔටුවන්, අධිරාජයාගේ දර්ශනය පිණිස මාලිගයෙහි දොරටුව අසලින් වීථි සංචාරයෙහි යෙදේ. මෙසේ ගමන් ගන්නා සතුන්ගේ සංඛ්‍යාව ලක්ෂයකට අධික ය. එය දර්ශනීය පෙරහරකි. තේජාන්විත දර්ශනයකි.

රාජකීය සංදර්ශනය පැවැත්වෙන්නා වූ මහෝත්සව දිනයෙහි ප්‍රධාන ශාලාවේ කෑම මේස පිළියෙල කිරීමට පෙර සියලු උසස් නිලධාරීහු ද, කුමාරවරු ද, නිලමවරු ද, අශ්වාරෝහක හමුදා ප්‍රධානීහු ද, ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ ද, වෛද්‍යවරු ද, ඉඩම් හිමි රදළවරු ද, හමුදාපතිවරු ද, පළාත් ප්‍රධානීහු ද අධිරාජයා හමුවෙහි පෙනී සිටිති. ශාලාවට ඇතුළු වීමට ඉඩකඩ නොමැති වූ විට සෙසු පිරිස පිටත රැස්වී සිටින්නාහ.

Scanned by CamScanner

නිලතල පටිපාටිය හා ප්‍රභූත්වයට අනුකූලව ඔවුහු ශාලාව ඇතළත රැස්වී සිටිති. පළමුවන පේළියේ අධිරාජයාගේ පුත් කුමාරවරු ද, රජ පවුලේ මුණුබුරන් ආදි රාජකීයයෝ අසුන් ගන්නාහ. අනතුරුව ප්‍රතිරාජයන් ද, පළාත් ප්‍රධානීන් ද, උසස් තනතුරු දරන්නන් ද තම පදවි ස්ථානාන්තර අනුව හිඳගත යුතු ය. තම තමන් වෙනුවෙන් වෙන් කළ ආසනයන් නිසි පරිදි තෝරාගෙන පිළිවෙළ නොවරදවා අසුන් ගනිති. ඉක්බිති ප්‍රධාන පුරෝහිතයා නැගී සිට අධිරාජයා හමුවේ වැඳ වැටී නමස්කාර කරන සේ විධාන කරන්නේ ය. ඒ සමගම ප්‍රධාන පුරෝහිතයා "දෙවියන් වහන්සේ අපගේ අධිරාජයාණන්ට රාජ්‍ය ශ්‍රී වැළඳීම සඳහා ආයුරාරෝග්‍ය සම්පත් ලබාදෙන සේක්වා" යයි ප්‍රාර්ථනා කරයි. උස් හඬින් කරන්නා වූ මේ ප්‍රාර්ථනය සමගම රැස්ව සිටින්නා වූ මහා ජනතාව "දෙවියන් වහන්සේ ඒ ප්‍රාර්ථනාව ඉෂ්ට කරන සේක්වා" යයි මහත් සේ ඝෝෂා නගමින් කියති. ඉන්පසු නැවත වරක් ප්‍රධාන පුරෝහිතයා "දෙවියන් වහන්සේ අපගේ අධිරාජයාණන්ගේ රාජ්‍යයේ බලය තේජස අභිවෘද්ධිය සුරක්ෂිත කරන සේක්වා" යයි උස් හඬින් ප්‍රාර්ථනා කරයි. සමගිය සාමය භවබෝග සම්පත් වර්ධනය ද හෙතෙම ප්‍රාර්ථනා කරමින් ආයාචනා කරන්නේ ය. ඒ අනුව රැස්ව සිටින මහා සේනාව ද "දෙවියන් වහන්සේ යථෝක්ත ප්‍රාර්ථනාව සඵල කරන සේක්වා" යයි උස් හඬින් කියා සිටිති. අනතුරුව මහා ජනතාව සිවු වරක් දණින් වැටී ගෞරව පූර්වක ශුභාශිංසන ආයාචනා හා අභිවාදන පවත්වන්නාහ.

අනතුරුව ප්‍රධාන පූජකවරයා පූජාසනය වෙත පැමිණෙන්නේ ය. හෙතෙම අලංකර පිළියෙන් පිරුවටයෙන් සරසන ලද පූජාසනය මත අධිරාජයාගේ නාමය සඳහන් කරන ලද රත් පැහැති ලෝහමය පත් ඉරුවක් තබයි. ඉන්පසු මහා ශාලවේ රැස්ව සිටින සියලු දෙනා වෙනුවෙන් ප්‍රධාන පූජකයා පූජාසනයටත් රජුගේ නම සඳහන් ලෝහමය රත් පැහැති පත් ඉරුවටත් සුවඳ දුම් අල්ලයි. ඉක්බිති රැස්ව සිටින සියලු දෙනා ම පසඟ පිහිටුවා වැඳ පූජාසනයට ගෞරව බහුමාන දක්වති. මේ ආකාරයෙන් පූජෝපහාර පැවැත්වීමෙන් පසුව පැමිණි පිරිස අධිරාජයාට තෑගි පිරිනැමීමට පටන් ගනිති. මේ තෑගි බෝග අධිරාජයාට පෙනෙන පරිදි විශේෂ ස්ථානයක තැන්පත් කරයි. රජතුමා මේ තෑගි පිරිනමන ආකාරය දෙස බලා සිටී.

Scanned by CamScanner

ඉන්පසු සේවකයෝ රාජකීය භෝජන සංග්‍රහය සඳහා කටයුතු සූදානම් කරති. රාජකීය භෝජන සංග්‍රහයට සහභාගි වන රාජකීයයන් වංශාධිපතීන් ප්‍රභුවරුන් හා ප්‍රදේශාධිපතියන් අසුන් ගන්නේ ඔවුන් වෙනුවෙන් තරාතිරම අනුව පිළියෙල කැර ඇති ආකාරයට ය. භෝජන සංග්‍රහයෙන් පසු නාට්‍ය හා සංගීත සංදර්ශන ඇරඹේ. සියලු දෙනාම නැටුම් ගැයුම් රඟුම් නරඹා මහත් සේ සතුටු වෙති. භෝජන සංග්‍රහය පැවැත්වෙන අතරතුරදී හීළෑකරන ලද සිංහයකු අධිරාජයා ඉදිරියට ගෙන එති. මේ සිංහයා අධිරාජයා ඉදිරිපිට බිම වැතිර නමස්කාර කරයි. එතෙකින් භෝජන සංග්‍රහය සමාප්ත වේ.

හේමන්තයේ දී අධිරාජයා කැතේ ප්‍රදේශයේ අගනගරයෙහි වාසයට පිටත් වෙයි. දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි යන තුන්මාසයේ මෙහි දේශගුණය ඉතා සීතල ය. අධිරාජයාගේ මාලිගාවේ සිට සැතපුම් හතළිහක ප්‍රදේශය තුළ වසන්නා වූ සියලු දඩකෙළි කරුවන්ට දඩයම් කිරීමට වන වැදීමට සූදානම් වන සේ අණබෙර පතුරුවා දන්වනු ලැබේ. එපමණක් නොව කරතේ පළාතේ වනාන්තරවල සිටින සියලු විශාල සතුන් අල්ලා මාලිගාවට එවන ලෙස නියෝග කැරේ. වලසුන්, තිත් මුවන්, ගෝනුන් හා විවිධ වර්ගයේ මුවන් මෙසේ අල්ලා එවිය යුතු ය. මේ නියෝගය ලබන්නේ ප්‍රාදේශීය ආණ්ඩුකාරවරුන් ය.

රජයෙන් නින්දගම් ලබා සිටින සියලු දෙනාම ඒ ඒ පළාත්වල සිටින මස් පිණිස ගත හැකි සියලු සතා සතුන් ඊයෙන් විද හෝ දඩබල්ලන් ලවා අල්වාගෙන හෝ රාජමාලිගයට යැවිය යුතු ය. රජමාලිගයේ සිට ගවු තිහක පමණ දුර ප්‍රමාණයේ අල්ලා ගනු ලබන සතුන්ගේ මස් පමණක් මෙසේ යවනු ලැබේ. එයට දුර බැහැර ප්‍රදේශවල මස් කරන සතුන් කුණුවන බැවින් එබඳු මස් රජ මැදුරේ ආහාරය පිණිස යවන්නේ නැත. ඒ සතුන් හමගසා පදම් කොට රජුගේ යුද හමුදාවේ අවශ්‍යතා සඳහා යවනු ලැබේ.

අධිරාජයාගේ කුණම් මඩුවේ දඩයම් සඳහා පුරුදු පුහුණු කළ විවිධ වර්ගයෙන් සතුන් විශාල සංඛ්‍යාවක් වෙති. කොටි, කොළ දිවියන් හා සිංහයන් විශාල සංඛ්‍යාවක් දඩකෙළියට පුරුදු පුහුණු කර රඳවා ගෙන ඇත. බැබිලෝනියාවේ සිංහයන්ට වඩා ශරීර ප්‍රමාණයෙන් විශාල සිංහයෝ මෙහි දඩයමට පුරුදු කර සිටිති.

Scanned by CamScanner

මේ සිංහයන්ගේ පිටේ දිගට සුදු කළු රතු වයිරම් සලකුණු දිස්වේ. මේ සිංහයන් දඩයමට අති ශූර ය. වල් ඌරන්, කුළු හරකුන්, වල් බූරුවන්, වලසුන්, මුවන්, ගෝනුන් දඩයම් කරනු ඇත. දඩයම සඳහා මේ සිංහයන් ඔවුන් රඳවා සිටින කූඩුවෙන් මුදා හළ විට ඒයක වේගයෙන් ගොස් සිවුපාවන් මත කඩා පැන දඩයම් කරන ආකාරය භයංකාර දර්ශනයකි. අධිරාජයා මෙබඳු සිංහයන් කූඩු කර ගෙන උන්ට නිතර ගැවසී පුරුදු කුඩා බල්ලකුත් සමග දඩකෙළි සඳහා පිටත්ව යන්නේ ය. සිංහයන් කූඩුවල දමාගෙන යන්නේ කිනම් ගොදුරක් කවර තැනකදී දුටුවත් ලේ පිපාසයෙන් පැන යාමට දඟලන බැවිනි. වනාන්තරය තුළට ගොස් සිංහයන් මුදාහරින්නේ ද සුළං හමන අත පරීක්ෂාවට ලක්කිරීමෙන් පසුව ය. සිංහයන්ගේ ඉව වැටුණු කල්හි වනගත සතුන් පළා යන බැවිනි. දඩයමට පුරුදු කළ රාජාලි වර්ගයක් ද රජුගේ දඩයම් සතුන් අතර සිටිති. ඕනෑම විශාල වෘකයකු අල්ලා ගැනීමට තරම් මේ රාජාලියන් ගේ 'නඛ පඤ්ජර' ශක්තිමත් ය.

අධිරාජයාගේ දඩයක්කාර නිලයේ ප්‍රධානීන් දෙදෙනා එක කුස උපන් සහොදරයන් ය. එකකු බයන් නම් වේ. අනෙකා මින්ගන් නම් වේ. 'කුයුක්චි' යන නිල නාමයෙන් ඔවුන් හඳුන්වනු ලැබේ. ඒ වචනයෙහි තේරුම දඩයක්කාරයන්ගේ ප්‍රධානියා යනුයි. ඔවුන් විසින් දඩයමට පුරුදු පුහුණු කරන ලද සුනඛයන් සංඛ්‍යාව අති විශාල ය. දහස් ගණනකට අධික ය. දස දහසක් පමණ සහායකයන් පිරිසක් දඩ කෙළියට සහභාගි වේ. ඉහත සඳහන් කරන සහෝදරයන් දෙදෙනෙකු අතරින් එක් සහෝදරයකුගේ සේනාවේ පිරිස රතුපාට නිල ඇඳුමක් අඳිති. අනෙක් සහෝදරයාගේ සේවක පිරිස නිල් පැහැති ඇඳුමක් අඳිති. දඩයක්කරුවන් දෙදෙනෙකු සමග පසුපසින් ගමන් ගන්නා සුනඛයන් සංඛ්‍යාව පන්දහස ඉක්මවයි. මේ දෙදෙනාගෙන් එක් අයෙක් අධිරාජයා දඩයමේ යන විට දකුණු පසින් වනාන්තරයට වැදී සතුන් වට කරයි. අනෙක් සහෝදරයා වාම පාර්ශ්වයෙන් වනාන්තර ගත වී සතුන් එළවයි. මෙසේ වට කිරීම නිසා කිසිදු වනගත සතකුට පහසුවෙන් පැන යෑමට ඉඩක් නොයෙදේ. මෙසේ වමින් හා දකුණින් වට කරන ප්‍රදේශය එක් දවසකින් පසුකැර යෑමට නොහැකි තරම් විශාල ය. දඩයම් කරුවන්ගේ හා දඩබල්ලන්ගේ ක්‍රියා කලාපය අරුම පුදුම දර්ශනයකි.

Scanned by CamScanner

මේ අතර අධිරාජයා ද දුනු ඊතල රැගෙන ඒ මේ අතට දුව පැන හැසිරෙමින් දඩකෙළියේ යෙදේ. සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසයේ පටන් ඊළඟ අවුරුද්දේ මාර්තු මාසය දක්වා රජවාසලට දඩමස් සැපයීමට මේ සහෝදරයන් දෙදෙනා බැඳී සිටිති. එහෙත් ඇටිකුකුළන්ගේ මස් භාරගන්නේ නැත. තුන් දෙනෙකු අනුභව කරන මස් ප්‍රමාණයට අනුපාතිකව මාළු සැපයිය යුතු ය.

අගනුවර වාසය කරන්නා වූ අධිරාජයා මාර්තු මාසයේ ගිනිකොණ දිග පිහිටි මුහුදේ දෙදිනක කාලය ගත කරයි. මේ සවාරිය සඳහා පුරුදු කරන ලද දඩයක්කරුවන් ද, උකුස්සන්, කුරුලුගොයන් ආදි පක්ෂීන් ද රැගෙන යෑම අධිරාජයාගේ සිරිත ය. විදේශයන්ගෙන් ආනයන කැර පුරුදු පුහුණු කළ රාජාලීන් ද මේ හා සමග රැගෙන යති. මේ පක්ෂීන් රැගෙන යන්නේ පක්ෂීන් දඩයම් කිරීම සඳහා ය. අධිරාජයා සමග දස දහසක පමණ දඩකෙළිකරුවන් පිරිසක් පිටත්ව යන අතර සිය ගණනක කණ්ඩායම් වශයෙන් ඔවුන් සෑම දිසාවකටම පිටත් කර යවනු ලැබේ. ඒ අතර රජු සමග දඩයමේ යෑමට විශාල පිරිසක් රඳවා ගැනේ. මොවුන් හඳුන්වනුයේ 'ටොස්කාඩර්' යනුවෙනි. දස දහසක් පමණ වූ මේ සේනාව එකා දෙදෙනා වශයෙන් ඔවුනොවුනට සමීප වනාන්තරයේ සිටුවනු ලැබේ. වලයාකාරව ඔවුන් මෙසේ ස්ථානගත කරනුයේ පැන යෑමට ඉඩකඩ නොදී වනසතුන් වටලෑම සඳහා ය. මෙසේ දඩකෙළියෙහි යෙදෙන සෑම පුද්ගලයෙකුටම නළාවක් ද හිස ගෙළ ආවරණය වන සේ පැළඳීමට කබායක් ද සැපයේ. රාජාලීන් කුරුලු ගොයින් ආදී පක්ෂීන්ට සුදුසු අවස්ථාවෙහි පියාඹා යෑමට ඔව්හු අණ දෙති. මේ අයුරින් පුරුදු කළ උකුස්සන් පසුපස හඹා යෑමට අවශ්‍ය නොවේ. එයට හේතුව 'දඩකෙළි දෙපාර්තමේන්තුවේ' සේවකයන්ගේ වගකීම සියලු තන්හි දී මේ පක්ෂීන් පිළිබඳව අවධානයෙන් සිටීම ය. සෑම පක්ෂියකුම අධිරාජයාට හෝ රදල අධිපතීනට අයත් සේ සැලැකේ. සෑම පක්ෂියෙකුගේ ම පාදයක කුඩා රිදී තහඩු කැබැල්ලක් එල්ලා තිබේ. පක්ෂියාගේ හිමිකරුගේ නමත් භාරකරුගේ නමත් එහි සඳහන් ය. යම් හෙයකින් පක්ෂියකු අල්ලා ගත හොත් ඒ පක්ෂියාගේ හිමිකරු, භාරකරු කවුරුන්දැයි එමගින් හඳුනාගත හැකි වේ. ඇතැම් විට සොයා ගැනීමට නොහැකි වුවහොත් බුලර්ගෂ නමැති නිලධාරියාට ඌ භාරදිය යුතු ය. හිමිකරුවන් හඳුනා ගැනීමට

Scanned by CamScanner

නොහැකි වන අශ්වයකු, කඩුවක්, පක්ෂියකු හෝ වෙනත් බඩු බාහිරාදියක් ලැබුණහොත් හෝ අහුලා ගනු ලැබුවහොත් එය ඉහත කී නිලධාරියා වෙත ගෙන ගොස් භාරදිය යුතු ය. එහි අයිතිකරු පැමිණෙන තුරු යටකී භාණ්ඩ ඔහු භාරයේ පවතී. එසේ අදාළ නිලධාරියාට භාර නොදී තමන් සන්තකයේ තබාගත හොත් ඔහු සොරෙකු හැටියට ගණන් ගැනේ. දඩකෙළියේ දී නැතිවන බඩු බාහිරාදිය ද අදාළ නිලධාරියාට භාරදිය යුතු වේ. අස්ථානගත භාණ්ඩ ආරක්ෂා කරන නිලධාරියාගේ කාර්යාලය කාටත් පෙනෙන පරිදි උස් ස්ථානයක ය. ඒ කාර්යාලය ඉදිරිපිට කොඩියක් ද ඔසවා තිබේ. තමන්ගේ යම් භාණ්ඩයක් නැතිවුවහොත් මේ ස්ථානයට පැමිණ ඒ ගැන තොරතුරු ලබාගත හැකි ය. නැති වූ භාණ්ඩ හෝ සතුන් ලබා ගැනීමට පුළුවන. මේ ක්‍රමය නිසා බොහෝ දෙනාට සහන සැලැසේ.

අධිරාජයා සන වනාන්තරය මැදින් මුහුද සීමාව දක්වා සතුන් ලුහුබැඳ යන්නේ ය. අධිරාජයාගේ දඩකෙළි සවාරිය ලෝකයේ අන් කිසිදු දේශයක දක්නට නොලැබෙන ආකාරයේ සැණකෙළියක් බඳු ය. ගමනාගමනයට සුදුසු මං මාවත් වනාන්තරය තුළ නොමැති බැවින් අධිරාජයා ගමන් ගන්නේ ඇතුන් දෙදෙනකු මත තැනූ මණ්ඩපයක හිඳගෙන ය. එසේ ගමන් කළ නොහැකි වන මං පෙත් ඔස්සේ ඔහු ඇතකු පිට නැගී යයි. සමහර ස්ථානවලදී ඇතුන් සතර දෙනෙකුගේ පිට තැනූ මණ්ඩපයක රැඳී දඩකෙළි සවාරියේ යන්නේ ය. මෙකී මණ්ඩපය විසිතුරු මල් ලියකමින් සරසා තිබේ. ඇතුළත රන් පිළියෙන් වටතිර ඇද ඇත්තේ ය. පිටපැත්ත අවුරා ඇත්තේ සිංහ සම්වලිනි. මෙසේ මණ්ඩපයක් තුළ අධිරාජයා දඩකෙළි සවාරියෙහි යෙදෙනුයේ වාතාබාධ ආදිය හටගැනීම වළක්වා ලීමේ අටියෙනි. මේ මණ්ඩපය තුළ ඉතාමත් දක්ෂ ලෙස දඩයමට පුහුණු කරන ලද රට කුරුලු ගොයන් දොළොස් දෙනෙකු ද රැගෙන යයි. ඒ රජුගේ විනෝදාස්වාදය සඳහා ය. එසේ ම අධිරාජයාට සමීප කුළුපග නිලධාරීන් දොළොස් දෙනෙක් ද මණ්ඩපය ඇතුළත රැඳී සිටිති. ගමන් මණ්ඩපය දෙපසින් අශ්වාරෝහකයෝ ද ගමන් ගන්නාහ. ඔව්හු පක්ෂි රංචු සහ කොක් රංචු අහසේ පියාසර කරන විට ඒ බව අධිරාජයාට දන්වති. එවිට අධිරාජයා ගමන් මණ්ඩපයෙහි තිර මෑත් කොට පක්ෂීන් පියාඹන සුන්දර දර්ශනය

Scanned by CamScanner

නරඹයි. ඇතැම් විට රජතුමා ගමන් මණ්ඩපය තුළ සිටින රට කුරුලු ගොයන් මුදාහරින්නේ අහසේ පියාඹන පක්ෂීන් අල්ලා ඩැහැගෙන ඒම සඳහා ය. රට කුරුලු ගොයි අහසේ නිදහසේ පියාඹන පක්ෂීන් අල්ලාගෙන එති. පක්ෂීන් මණ්ඩපය තුළට වී සටන් කරන පොරබඳන ආකාරය අධිරාජයා නරඹන්නේ සුවපහසු අසුනක හාන්සි වී විනෝදාස්වාදය විඳිමිනි. රජතුමා සමග සිටින හමුදා භටයෝ ද මේ දර්ශනය නරඹා සතුටු වෙති. මෙබඳු දර්ශන නරඹමින් ගමන් මණ්ඩපයේ සිටින අධිරජයා සහ පිරිවර ටොස්කාඩර් නමැති ස්ථානය වෙත ගමන් ගනිති. මෙය රාජකීය දරු මුණුබුරන් වංශාධිපතීන් රදළවරුන් ආරක්ෂක භටයන් ඇතුළු මුළු මහත් පිරිස සහ පුරුදු කළ පක්ෂීන් සිවුපාවන් ද සමග එහි පිවිසුණු කල්හි එය මහා සැණකෙළියක සිරි ගනී. ඔවුනට රැඳී සිටීම සඳහා කූඩාරම්, මඩු කූඩාරම් විවිධාකර මණ්ඩප ආදිය ඉදිකැර තිබේ. අධිරාජයා ලැගුම් ගන්නා ශාලාව තුළ දස දහසක් පමණ සේනාංකයකට රැස් වී සිටීමට ඉඩකඩ පවතී. අධිරාජයා වෙනුවෙන් වෙන්කැර ඇති ශාලා ව ඉතා අලංකාර ය. රාජ්‍යයේ උසස් නිලධාරීන්ට ද වෙනත් ප්‍රභූවරුන්ට ද එහි නවාතැන් ගැනීමට වෙනම කාමර තිබේ. මේ ගොඩනැගිල්ලට අයත් ප්‍රධාන දොරටුව දකුණට පිහිටියේ ය. නැගෙනහිර පැත්තේ තවත් ගොඩනැගිල්ලක් ඇත. එය රජතුමාට සහ විශේෂ ප්‍රභූවරුන් කිහිප දෙනකුට විවේක සුව විඳීම සඳහා ය. කිසියම් පුද්ගලයකු අධිරාජයා මුණ ගැසීමට අවශ්‍ය වුවහොත් ඔහු එතැනට කැඳවනු ලැබේ. එකී ස්ථානයට පසු පසින් අලංකාර ලෙස පිළියෙල කැරුණු තවත් මණ්ඩපයකි. එය රජුගේ යහන් ගබඩාවයි. සෙසු පිරිසට ලැගුම් ගැනීම සඳහා තවත් කාමර පිළියෙල කැර තබේ. එහෙත් ඒ කාමර රජුගේ යහන් ගබඩාව පිහිටි ගොඩනැගිල්ල හා සම්බන්ධ කැර නැත. මේ ගොඩනැගිලි තනා ඇත්තේ කැටයම් කරන ලද දැව ස්ථම්භ තුනක් උපයෝගී කැරගෙන ය. මණ්ඩපයන්හි වහල මේ දැව ටැම් දරා සිටී. කූඩාරම් ආවරණය කැර ඇත්තේ සුදු, කළු, රතු සිංහ හම් තීරුවලට කපා මනා ලෙස මසාගත් පටිවලිනි. එහි ඇතුළු පැත්ත ආවරණය කැර ඇත්තේ ලොම් සහිත මුගටි වර්ගයේ සතුන්ගේ සම්වලිනි. කළු ලොම් ඇති තවත් කිසියම් සත්ත්ව වර්ගයක ගේ සම් ද මෙසේ ආවරණ කිරීමට යොදා තිබේ. මේ සම් වර්ගයේ වටිනාකම ඉතා

Scanned by CamScanner

අධික බව සමස්ත ලෝකයේම පිළිගැනීමයි. කළු පැහැති ලොම් සහිත මුගටි වර්ගයේ සතකුගේ සමක් කිසියම් ඇඳුමකට එකතු කැර මසා තිබේ නම් ඒ ඇඳුම රන් මිල දහසක් වටී. මේ කියන ලද රන් වටිනාකම ඉංග්‍රීසි සිලිම් නවයක අගයට සමාන වේ. ටාටර්වරුන් මුගටියා වැනි මේ සිව්පාවා හඳුන්වනුයේ 'රොන්ඩෙස්' යනුවෙනි. මේ කියන මුගටි වර්ගය ශරීර ප්‍රමාණයෙන් උගුඩුවකු තරම් යයි කියති. කූඩාරම් ගැටගසා තිබෙන්නා වූ ලනු අඹරා තිබෙන්නේ පට හා සේද නූල් වලිනි. අධිරාජයා ලැගුම් ගන්නා ප්‍රධාන මණ්ඩපයට ආසන්නව බිසෝවරුන් ගේ මණ්ඩප ඉදිකැර තිබේ. මෙකී මණ්ඩප ද ඉදිකැර ඇත්තේ කලින් කී පරිදි ඉතා අලංකාර අන්දමිනි. ඒ හැරුණු විට වෙන වෙනම කූඩාරම්වල කූඩුවල විදේශ රටවලින් ගෙන්වන ලද උකුස්සන් රාජාලින් ද බටගොයින් ද තවත් නොයෙක් වර්ගවල පක්ෂීන් ද දඩයම් පිණිස යොදාගන්නා වූ වෙනත් සිවුපාවෝ ද සිටිති. ටාටර්වරුන්ගේ වනිතාවෝ මෙහි සියලු තත්හි හැසිරෙති. අමුත්තන්ට සතුන් විකිණීම ආදි කටයුතුවල යෙදෙන්නාහ. ඔවුන් මේ කටයුතුවල යෙදෙනුයේ ඉතා කඩිසර ලෙසිනි.

දඩකෙළි උත්සවය මහ සැණකෙළියක් වැන්න. බැලූ බැල්මට පෙනී යන්නේ මේ ප්‍රදේශය අධික ජනගහනයෙන් යුත් නගරයක් ලෙසිනි. මේ උත්සවය නැරඹීම සඳහා විවිධ ප්‍රදේශවලින් ජනී ජනයා පැමිණෙති. රජ පවුලේ සියලු දෙනා ද, රාජකීයයන් සියලු දෙනා ද, රාජ වෛද්‍යවරයන්, ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයන්, පක්ෂීන් රැක බලා ගන්නවුන් ද ඒ පිරිස අතර වෙති. බොහෝ රාජ්‍ය නිලධාරීහු ද මේ උත්සවයට සහභාගි වන්නාහ. අපගේ පාස්කු උත්සව කාලය දක්වාම අධිරාජයා මේ ප්‍රදේශයෙහි කාලය ගත කරන්නේ ය. දිග ගෙල සහිත කොකුන් ද, හංසයන් ද දඩයමට පුරුදු පුහුණු කළ සෙසු සතුන් ද රැගෙන අධිරාජයා මෙකී කාලය මුළුල්ලේ මහත් විනෝදයෙන් දඩකෙළියෙහි යෙදෙයි. වැව් විල් ගංගා ජලාශ ආදියෙහි ද දඩකෙළි සවාරියෙහි යෙදෙමින් විනෝදාස්වාදය ලබයි. එසේ ම ඔහුගේ පිරිවර ද විවිධ ස්ථාන කරා යවමින් හැකිතාක් දඩමස් රැස්කැර ගැනීමට අවස්ථාව සලසයි. මේ දඩකෙළි සවාරි කාලය තුළ අධිරාජයා ලබන්නා වූ විනෝදය වර්ණනා විෂයාතික්‍රාන්ත ය. ඇසින් දුටු කෙනෙකුට විනා සෙසු කිසිවකුටත් මේ උත්සව සමයෙහි උත්කර්ෂවත් භාවය විස්තර කළ නොහේ.

Scanned by CamScanner

අධිරාජයාගේ රාජධානිය තුළ කිසිදු ව්‍යාපාරිකයෙකුට, කාර්මිකයකුට හෝ ගොවියකුට ගිජුලිහිණියන්, උකුස්සන්, කුරුල්ලන් ඇල්ලීමට යොදාගන්නා කුරුලුගොයන් හෝ වෙනත් කිසියම් පක්ෂියකු රඳවා ගැනීම තහනම් වේ. එසේ ම කිසිදු අධිපතියකුට හෝ අශ්වාරෝහකයකුට රජු සිටින ප්‍රදේශයක සිට සැතපුම් පහක්, දහයක්, පහළොවක් ඇතුළත ප්‍රදේශ සීමාව තුළ කිසිදු සත්ත්වයකු ලුහුබැඳ යැමට අවසර නැත. සතුන් පුරුදු කරන්නාගේ අවසර පත්‍රයක් හෝ දඩකෙළි අවසර පත්‍රයක් නැතිව සතුන් ලුහුබැඳ යැම සපුරා තහනම් වේ. එහෙත් බල ප්‍රදේශයෙන් පිටත එබඳු කටයුතුවල යෙදීමට බාධාවක් නොමැත.

මාර්තු මාසයේ පටන් ඔක්තෝබර් මාසය දක්වා කාල සීමාව ඇතුළත හාවුන්, ගෝනුන්, මුවන් හා විශාල පක්ෂීන් මරා දැමීමට රාජ්‍යයේ කිසිදු බලවතකුට හෝ අවසරයක් නැත්තේ ය. පක්ෂීන් හා සිවුපාවුන් බෝවන්නේ මේ කාලයේ බැවින් සත්ව ප්‍රජාවේ වර්ධනයට බාධා කිරීමට නොහැකි වන පරිදි බාධක තහනම් නීති පනවා තිබේ.

සතුන් බෝවීම සඳහා මේ කාලයේ කිසිදු දඩකෙළියක යෙදීමට කිසිවෙකුටත් අවසර නැත.

දඩකෙළි සවාරි සමය සමාප්ත වීමෙන් පසු අධිරාජයා ඔහුට සුපුරුදු මාවත ඔස්සේ අගනුවරට ගමන් ගනී.

දඩකෙළි උත්සව සමය අවසන් කැර අධිරාජයා අගනුවරට පැමිණීමත් සමග යළිත් උත්සවයක් පැවැත්වෙයි. තෙදිනක් මුළුල්ලේ මේ උත්සවය පවත්වනු ලබන්නේ මහත් උත්කර්ෂවත් ගෞරවාන්විත ආකාරයෙනි. දඩකෙළියට සහභාගි වූ සියලු දෙනාටම භෝජන සංග්‍රහයක් පැවැත්වේ. නානාප්‍රකාර විවිධ ප්‍රසංග නාට්‍ය සංදර්ශන ආදිය පවත්වා ඔවුන් ප්‍රීති ප්‍රමෝදයට පත් කැරෙයි. මේ උත්සවය බලා සිටින විට මවිතයක් මෙන් හැඟේ.

මේ පුරවරය අතිශයින් ජනාකීර්ණ ය. ඇතුළු නුවරට වඩා පිටතින් පිහිටි ප්‍රදේශයේ ජනගහණය වඩාත් අධික ය. ඇතුළු නුවර ද පිටත නුවර ද පිහිටි නිවාස සමූහයකි. නගරයේ ප්‍රධාන දොරටු දොළහට එක එල්ලේ පිහිටි දොළොස් නුවර නිවාස සංඛ්‍යාව ද අතිශයින් අධික ය. වාණිජ ව්‍යාපාරයන්හි යෙදී සිටින්නවුන් ඇතුළු නුවරට වඩා පිටි නුවර පදිංචියෙහි රැඳී සිටීමට කැමැති ය.

Scanned by CamScanner

අගරජු වාසය කරන්නා වූ පුරවර සමීපයෙහි ඔවුන් බහුල වශයෙන් ගැවසෙනුයේ වෙළහෙළඳාම් කර ගැනීමට පහසු වන බැවිනි. ප්‍රධාන නගරය හා ඒ අවට පිහිටි ගොඩනැගිලි අතිශයින් අලංකාර ය. දර්ශනීය ය. ඒ සියල්ල දෙවැනි වන්නේ නම් ඒ අධිරාජයාගේ මන්දිරයනට පමණි. අභ්‍යන්තර නගරයෙහි නැතහොත් ඇතුළු නුවර මිනී මිහිදන් කරන්නේ නැත. පිළිම අදහන බෞද්ධාගමිකයන් ආදි පිරිසගේ මෘත දේහයන් නගරයෙන් බැහැර ඒ සඳහා වෙන්කැර තිබෙන සුසානයන්හි ආදාහනය කැරේ. මරණ දඬුවමට පමුණුවන ලද පුද්ගලයන්ගේ මෘත ශරීරයන් ද ආදාහනය කරනුයේ එතැන්හි ය. ගණිකා වෘත්තියෙහි යෙදෙන කාන්තාවන් හැසිරෙනුයේ පිටි නුවර ය. ඔවුන් වැඩි වශයෙන් කාලය ගත කරනුයේ අප්‍රසිද්ධව ය. ගණිකා ස්ත්‍රීහු විසි පන්දහසක් පමණ වෙති. නොයෙක් ප්‍රදේශවලින් පැමිණෙන වෙළෙඳුන් සංචාරකයින් හා වෙනත් ජනයා හේතුකොට ගෙන ගණිකාවන්ගේ සංඛ්‍යාව වර්ධනය වෙයි. ලෝකයේ කවර රටක වුවද ඇත්තා වූ දුර්ලභ අගනා ලක්ෂණ බඩු බාහිරාදිය සියල්ල මේ පුරවරයෙහි ද දක්නට ලැබේ. ඉන්දියාවෙන් ද බොහෝ වෙළෙඳ භාණ්ඩ මෙහි ගෙන එයි. ඔප දැමූ මැණික් වර්ග, මුතු, ඖෂධ වර්ග, කුළුබඩු ආදිය ඉන්දියාවෙන් මේ පුරවරයට සැපැයේ. කැතේ පුරයට අයත් විවිධ ප්‍රදේශවලින් ද වෙනත් දුරබැහැර ප්‍රදේශවලින් අගනා දුර්ලභ බඩු බාහිරාදිය බොහෝ ප්‍රමාණයක් මේ නගරයට ගෙන එනු ලැබේ. මාලිගය අසල ප්‍රදේශය අතිශයින් ජනාකීර්ණ බැවින් බොහෝ වෙළෙන්දෝ මේ අවට හැසිරෙති. මේ වෙළඳ භාණ්ඩ රැගෙන එන රථ වාහන ද දහසකට අධික ය. ඒ හැරුණු විට (සිල්ක්) පට සේද මිටි තවලම් අශ්වයන් පිටින් ගෙන එති. රත්රන් කෙදි, රන් තහඩු, පට සේද රෙදි හා නොයෙක් රෙදිපිළි වර්ග මෙහි වෙළෙඳාම පිණිස ගෙන එනු ලැබේ. අගනුවර පවුර වටා සල්පිල් කඩ මණ්ඩි කඩපිල් රාශියකි. නොයෙක් භාණ්ඩ නිෂ්පාදනය කැර මේ සල්පිල්හි විකිණීමට තබති. මේ භාණ්ඩ විකුණා ඔවුන්ගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගනිති.

රසායන විද්‍යානුකූලව කඩදාසි නිෂ්පාදනය කරන ආකාරය අධිරාජයා දැන සිටියේ ය. කඩදාසිවලින් මුදල් නෝට්ටු මුද්‍රණය කරන්නා වූ මුද්‍රණ යන්ත්‍රයක් ඛාන් - බාලික් නගරයේ පිහිටුවා

තිබිණි. අධිරාජයා මුදල් නෝට්ටු සඳහා කඩදාසි නිෂ්පාදනය කෙළේ මෙසේ ය. සේද පණුවන්ගේ ආහාරය පිණිස වවන්නා වූ මල්බෙරි ගස් බහුල වශයෙන් මේ ප්‍රදේශයේ ඇත. ගසේ පිට පොත්තටත් ලීයටත් අතර පිහිටි සියුම් සිවිය ගෙන කපා කොටා වංගෙඩිවල දමා කුඩුකර කල්ක සාදා වියළා කඩදාසි නිෂ්පාදනය කෙළේ ය. මේ කඩදාසි එක් එක් ප්‍රමාණයට කපා මුදල් වශයෙන් භාවිතා කැරේ. ඉතා කුඩා කඩදාසි කැබැල්ල දොයිතුවක වටිනාකමින් යුක්ත ය. එයට මඳක් ප්‍රමාණයෙන් විශාල කඩදාසි කැබැල්ල වැනීසියන් රිදී කාසියක් වටී. වැනීසියානු රිදී දෙක, පහ, දහය හා ඊට වඩා වැඩි වටිනාකමින් යුත් රිදී කාසි, රන් කාසි එක, දෙක, තුන යනාදී වශයෙන් ඒ කාලයේ විවිධ රටවල භාවිතා කළ රන්කාසි, රිදී කාසිවලට ප්‍රමාණ සරිලන පරිදි ඉහත කී කඩදාසි කපා සකස් කරන ලදී. මේ කඩදාසි රිදී රන් කාසි හා වටිනාකමින් යුක්ත බව තීන්දු කැරුණේ රාජ්‍ය උත්සවයක් පවත්වමිනි. මෙකී මුදල් නෝට්ටුවලට රාජ්‍ය නිලධාරීන්ගේ අත්සන් ද තබන ලදී. රජතුමාගේ මුදල් භාරකාර ප්‍රධාන නිලධාරියාගේ මුද්‍රව ද මෙහි තබන ලද්දේ ය. යම් කිසි තැනැත්තකු හොර නෝට්ටු නිෂ්පාදනය කැර හෝ භාවිතා කැර අසුවුව හොත් මරණීය දණ්ඩනය හිමි වේ. මේ අයුරින් අධිරාජයාගේ අණ පරිදි මුදල් නෝට්ටු භාවිතය සමස්ත රාජ්‍යයෙහිම පැතිරිණ. සමස්ත චීන අධිරාජ්‍යය පුරා පතළ වූ මෙකී මුදල් නෝට්ටු භාවිතය යම් කිසිවකු පැහැර හැරිය හොත් භාරගැනීම ප්‍රතික්ෂේප කළහොත් මරණ දඬුවම නියම වේ. එහෙයින් සියලු දෙනා ම මෙකී මුදල් නෝට්ටු භාවිතය එක හෙළා පිළිගත්හ. විදේශයන්ගෙන් පැමිණෙන වෙළෙඳුන් ද විජාතිකයන් ද භාණ්ඩ ගැනීම ද, විකිණීමට ද රන්, රිදී, මුතු, මැණික් ආදී වටිනා දෑ මිලදී ගැනීමටත් මේ මුදල් නෝට්ටු වලංගු විය. කවර භාණ්ඩයක් වුවද මේ මුදලින් මිලදී ගැනීම චීන රාජ්‍යය පුරා ප්‍රචලිත විය.

වසරකට කිහිප වරක් වෙළෙන්දෝ ගැල් පුරා බඩු බාහිරාදිය පටවා ගෙන නොයෙක් පළාත්වල සිට අගනුවරට පැමිණෙති. රන් නූලෙන් වියූ අගනා රෙදිපිළි ද ඔවුහු රැගෙන එන්නාහ. මේ අගනා රෙදිපිළි ඔව්හු අධිරාජයා ඉදිරියෙහි ප්‍රදර්ශනය කරන්නාහ. අධිරාජයා වෙළෙඳ භාණ්ඩ තක්සේරු කරන්නා වූ අතිදක්ෂ විශේෂඥයන් කැඳවා ඒ සියල්ල පරීක්ෂා කරවයි. මේ පරීක්ෂණ මණ්ඩලය

Scanned by CamScanner

දොළොස් දෙනෙකුගෙන් සමන්විත ය. ඔව්හු පරීක්ෂණයෙන් අනතුරුව මිල නියම කරති. මිල නියම කිරීමෙන් පසු අධිරාජයා යළිත් ඒ ගැන අවධානය යොමු කැර ලාභයක් තබාගෙන අලෙවි කිරීමට වෙළෙන්දන්ට අනුමැතිය දෙයි. රජ මැඳුරට ගන්නා භාණ්ඩ හා රෙදිපිළි සඳහා එවෙලේම නෝට්ටුවලින් වටිනාකම ගෙවනු ලැබේ. ඒ අදහසට එකඟව වෙළෙන්දෝ භාණ්ඩ විකුණති. කිසියම් වෙළෙන්දකු භාණ්ඩ සඳහා මුදල් නෝට්ටු භාරනොගෙන ඒ වෙනුවට වෙනත් භාණ්ඩ හුවමාරු කැර ගැනීමට අවසර ඇත්තේ ය.

කාලයාගේ ඇවෑමෙන් ගෙවී ගිය හෝ ඉරී ගිය මුදල් නෝට්ටු ආපසු යන්ත්‍රාලයට භාර දී ඒ වෙනුවට අලුත් නෝට්ටු ලබාගැනීමට පහසුකම් සලසා ඇත. එසේ ම මුදල් නෝට්ටු වෙනුවට භාජන බඳු පටි හෝ කර්මාන්තයකට අවශ්‍ය අමුද්‍රව්‍ය වශයෙන් රන් රිදී හෝ වෙනත් ද්‍රව්‍ය ලබාගත හැකි ය. අධිරාජයා සියලු හමුදා නිලධාරීන්ට වැටුප් ගෙවන්නේ මෙකී මුදල් නෝට්ටුවලිනි. මෙකී මුදල් නෝට්ටුවල ද රන් රිදීවල ද කිසි වෙනසක් නොමැත. මේ අනුව චීන අධිරාජයා ලෝකයේ සමකාලීන අනෙක් රටවලට වඩා ක්‍රමානුකූල මුදල් හා ආර්ථික පාලන සංවිධානයකින් යුක්ත වූ බව සඳහන් කළ යුත්තේ ය.

යුද හමුදාවේ සියලු කටයුතු අධීක්ෂණය සඳහා ඉතා උසස් වංශවත් රදළ අධිපතියන් දොළොස් දෙනකුගෙන් යුත් පාලක මණ්ඩලයක් පිහිටුවා තිබේ. යුද හමුදාවේ සියලු ක්‍රියාකාරකම් මේ මණ්ඩලය මගින් සියුම් ලෙස විමර්ශනය කැරේ. කඳවුරු පිහිටුවීම, කඳවුරු මාරු කිරීම, හමුදා නිලධාරින් මාරු කිරීම, පත් කිරීම, විවිධ කටයුතු සඳහා හමුදාව පිටත් කැර යැවීම අධීක්ෂණ මණ්ඩල සතු වගකීමයි. ඒ ඒ අවස්ථාවනට ප්‍රමාණවත් හමුදාව මෙපමණ යයි තීන්දු කරනු ලබන්නේ ද මේ අධීක්ෂණ මණ්ඩලය මගිනි. යුද්ධයන්හි දී දක්ෂ ලෙස සටන් කළ හමුදා නිලධාරීන් හා හමුදා භටයන් තෝරා ගැනීම, බියගුළු අදක්ෂ නිලධාරීන් හඳුනා ගැනීම හා ඔවුන් වෙනුවෙන් නිසි පියවර ගැනීම ද ඔවුන් සතු වගකීමකි. කිසියම් අණදෙන නිලධාරියකු ගේ හැසිරීම අයහපත් බව පෙනී ගියහොත් ඔහු තනතුරෙන් පහත හෙළනු ලැබේ. දහසක සේනාංකයක අධිපතියකු වැරැදි ලෙස හැසිරේ නම් සියයක බල ඇණියක ප්‍රධානියකු බවට පහත හෙළයි. අතිශය දක්ෂ නිලධාරීන්ට දස දහසක

බල ඇණියක ප්‍රධානත්වය හිමි කැර දෙයි. මේ උසස්වීම් අධිරාජයා අනුමත කළ යුතු ය. දස දහසක හමුදාවක ප්‍රධානත්වයට පත් කැරුණු නිලධාරියා හට වරප්‍රසාද ප්‍රදානය කිරීම ද සිදුවේ. උසස් තනතුරට හිමි සහතික පත්‍රය හෙවත් ලෝහමය සන්නසක් පුද කැරේ.

ඒ හැරුණු විට ත්‍යාග රාශියක් ද පිරිනමනු ලැබේ. එසේ කරන්නේ සෙසු හමුදා නිලධාරීන් දිරි ගැන්වීමේ අටියෙනි. මෙසේ පිරිනමන තෑගි බෝග වටිනාකමෙන් අධික ය. ප්‍රධාන පාලක නිලධාරීන් දොළොස් දෙනාගේ මණ්ඩලය 'ෂෙයිංග්' නමින් හැඳින්වේ. මෙකී මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයක ස්වරූපයෙන් කටයුතු කරයි. ඔවුන් වගකියන්නේ අධිරාජයාට පමණි. ඒ හැරුණු විට තවත් උසස් නිලධාරීන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් තිබේ. මොවුන්ගේ රාජකාරි වනුයේ ප්‍රාදේශීය ආණ්ඩු තිස් හතරේ කටයුතු අධීක්ෂණය කිරීමයි. ඛාන් - බාලික් නගරයේ දර්ශනීය ශාලාවක ඔවුන්ගේ කාර්යාලය පිහිටියේ ය. මේ ශාලාව විශාල ය. කාමර රාශියකි. එක් එක් ප්‍රාදේශීය පළාත් ආණ්ඩුවක කටයුතු සොයා බැලීම සඳහා අධිකරණ බලතල සහිත උසස් නිලධාරියෙක් සිටී. ඔහුට ලිපිකරුවන් පිරිසක් ද වෙති. මේ සියලු නිලධාරීන් සඳහා වෙන වෙන ම කාමර ඇත. ඒ ඒ පළාත් පාලනය කිරීම සඳහා අදාළ නීති රීති කටයුතු නිසි පරිදි සිදුවන්නේ දැයි ඔව්හු සොයා බලති. ඇතැම් ප්‍රාදේශීය ආණ්ඩුවල ආණ්ඩුකාරවරුන් පත් කිරීමට නිර්දේශ කරනුයේ ද ඉහත කී මණ්ඩලයයි. සුදුස්සන් තෝරාගෙන අධිකාර සන්නස් භාරදීම සඳහා අධිරාජයාට නිර්දේශ කිරීම ඔවුන්ගේ කාර්ය භාරයයි. මොවුනට රන් හෝ රිදී අධිකාර පත්‍ර පිරිනැමේ. ආදායම් බදු රැස් කිරීම මුදල් පරිපාලනය වෙළෙඳ ගනුදෙනුවලින් ලැබෙන ආදායම් විමර්ශනය කිරීම සියලු ප්‍රාදේශීය දෙපාර්තමේන්තුවල කටයුතු විමර්ශනය කිරීම ද මෙකී මණ්ඩලයට පැවැරේ. 'ෂෙයිංග්' නමින් යථෝක්ත විනිශ්චය මණ්ඩලය හැඳින්වේ. මෙකී මණ්ඩලය ද්විතීය අධිකරණයක් බඳු ය. මේ මණ්ඩලය ද වගකීමට බැඳී සිටිනුයේ අධිරාජයාට පමණි. තායි මණ්ඩලය හා ෂෙයිංග් මණ්ඩලය අතිශයින් උත්තරීතර ලෙස සැලැකේ. 'තායි' මණ්ඩලයට ආරක්ෂක හමුදා පිළිබඳ වගකීම පමණක් හිමි ය. එහෙයින් එය අධි උත්තර මණ්ඩලය ලෙසින් සැලැකේ.

Scanned by CamScanner

ඛාන් - බාලික් පුරවරයේ සිට විවිධ ප්‍රදේශ කරා ගමන් කළ හැකි වන පරිදි මහා මර්ග පද්ධතියක් ඉදිකැර තිබේ. මෙකී මාර්ගයන්හි සැතපුම් තිහක් හෝ හතළිහක් දුර ගමන් කළ විට නවාතැන් පළක් හමුවේ. මේ නවාතැන් පළ හෙවත් විශ්‍රාමශාලා පිහිටුවා ඇත්තේ ගමනාගමනයෙහි යෙදෙන්නා වූ මගීන් සඳහා ය. විශාල මන්දිර ද භෝජන ශාලා ද මෙහි පිහිටුවා තිබේ. මේ නවාතැන් හඳුන්වනු ලබන්නේ 'යාම්බ්' නමිනි. අංග සම්පූර්ණ වනසේ ද, අලංකාර වූ ද ආකායෙන් මෙකී විශ්‍රාමශාලා සකස් කැර ඇත්තේ ය. කාමර තුළ අලංකාර ගෘහ භාණ්ඩ ඇත්තේ ය. කවර තරාතිරමේ අයකුට නවාතැන් ගැනීමට වුවද එහි නවාතැන් සුවපහසුකම් පවතී. ඇතැම් තානායම්හි රජවාසල නියෝගයෙන් ආහාර පාන ඇතුළු පහසුකම් සම්පාදනය කැරේ. සියලු මංසංධිවල ද කඩවත්වල ද අවශය තරම් මුරකාවල් තර කැර තිබේ. එහෙයින් කවර තරාතිරමේ නිලධාරියකුට වුවද මේ තානායම්හි රැඳී සිටීමට බිය විය යුතු නොවේ. අගනා අශ්වයන් හාරසියයක පමණ සංඛ්‍යාවක් මේ තානායම් අසල නිරන්තරයෙන් සූදානම් කැර ඇත. අධිරාජයාගේ පණිවුඩකරුවෝ විවිධ ප්‍රදේශ කරා යන අතරතුර දී මේ තානායම් පළවල නතර වෙති. එසේ ම ඔවුන් ගමන් කළ විඩාපත් අශ්වයන් මුදා හැර මෙතැන දී වෙනත් අශ්වයන් තෝරා ගැනේ. අශ්වයන් සඳහා වෙනම ඉස්තාල තානායම් අසල පිහිටුවා තිබේ.

බොහෝ දුරබැහැර ගමනාගමන පහසුකම් නොමැති කඳුකර ප්‍රදේශයන්හි ද මෙබඳු විශ්‍රාමශාලා අධිරාජයාගේ නියමයෙන් පිහිටුවා තිබේ. මෙකී තානායම් ද සියලු පහසුකම් සහිතව අංග සම්පූර්ණ ලෙස සකස් කැර ඇත්තේ ය. සියලු ගෘහ භාණ්ඩ ද එහි අඩුවක් නොමැතිව තබා ඇති බව කිව යුතු ය. අධිරාජයා දුර බැහැර කඳුකර ප්‍රදේශයන්හි ඉඩම් වගා කිරීමට සේවකයන් යොදවා ඇත. ගම්මාන ගොඩනැගීම හා සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා ගමන් ගන්නා වූ නිලධාරීන් ඇතුළු විවිධ පුද්ගලයෝ මේ දුරබැහැර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති ලැගුම් හල්හි නවාතැන් ගනිති. අධිරාජ්‍යයේ සෑම ස්ථානයක් වෙතම ගමන් කිරීමට ද එහි සියලු ක්‍රියාකාරකම් සොයා බැලීමට ද මේ තානායම් පිහිටුවා තිබීම නිසා පහසු වේ. රාජ සභාවට පත්වීම් ලබා පැමිණෙන රාජ දූතයන්ට ද මෙකී විශ්‍රාම ශාලා නිසා ගමනාගමන පහසුකම් සැලැසේ. එපමණක් නොව

Scanned by CamScanner

සමස්ත අධිරාජයයේ ම මනා සම්බන්ධීකරණයක් ඇතිවේ. පාලන සංවිධානය අතින් සලකා බලන කල්හි මෙහි අධිරාජයා විශිෂ්ට දේශපාලනඥයකු පාලකයකු බව ප්‍රත්‍යක්‍ෂ වේ. හෙතෙම සෙසු රජවරුන්ට වඩා ශූර රාජ්‍ය තාන්ත්‍රිකයෙකි.

ඉහත සඳහන් කළ තානායම් හි රඳවා සිටින අශ්වයන්ගේ සංඛ්‍යාව දෙලක්ෂයක් පමණ වේ. මේ වූකලී මවිතය දනවන්නා වූ කාරණයකි. එයින් ලැබෙන ප්‍රතිඵල විපුල ය. මේ කටයුතු පවත්වා ගෙන යෑම සඳහා සේවකයන් කෙසේ සොයාගන්නේ දැයි කෙනෙකුට ප්‍රශ්නයක් මතුවිය හැකි ය. මෙතරම් විශාල ජන සේනාවකට ආහාර පාන සපයන්නේ කෙසේ දැයි ප්‍රශ්නයක් මතුවනු ඇත. එහෙත් සියල කටයුතු සඳහා ඒ රටේ ඕනෑ තරම් පිරිමි සිටිති. පිළිම අදහන බෞද්ධයෝ ද මුස්ලිම්වරු ද බහු විවාහයන්හි යෙදෙති. එක පුරුෂයාට ස්ත්‍රීන් හය හත් දෙනා, අට දෙනා, දස දෙනා බැගින් සිටිති. ඇතැම් පවුලක පිරිමි දරුවෝ තිහක් පමණ වෙති. පියාගේ ව්‍යාපාරික කටයුතුවල ද, රාජ්‍ය යුද්ධ හමුදාවෙහි කටයුතුවල ද ඔව්හු නිරත වන්නාහ. පිරිමි දරුවන් විස්සක් තිහක් නැති පවුලක් දක්නට ලැබෙනුයේ කලාතුරෙකිනි. අපගේ චාරිත්‍රානුකූලව අපට ඇත්තේ එක් භාර්‍යාවක පමණි. ඇයට දරුවන් නොලැබුණ ද ඇය සමගම විවාහ ජීවිතය ගත කළ යුතු ය. එබැවින් දරු පවුලක අගය ප්‍රයෝජනය එලය නොලැබී යයි. අපගේ ජනගහනය මෙරට ජනගහනයට වඩා අඩු ය.

මෙහි ජනයාට ආහාරපාන හිඟ නැත. ටාටර්වරුන් චීනුන් මත් ජී හෙවත් දකුණු චීනයේ වැසියන්ගේ ප්‍රධාන ආහාරය බත් ය. ධාන්‍ය වර්ග තණහාල්, මෙනේරි ආදිය ග්‍රේන්ස් තුනකින් එකට සියයක අස්වැන්නක් ලැබේ. ඔවුන්ගේ භූමිය ඉතා සරුසාර බැවිනි. පාන් ආහාරයට නොගන්නා මොව්හු ඉඳිආප්ප, නූඩ්ල්ස්, රොටි ආදිය සාදා මස් සමග අනුභව කරති. සම්පූර්ණ භූමි ප්‍රදේශයම වගා කරති. මුඩුබිම් මේ රටේ ශීඝ්‍රයෙන් බෝවෙති. ගවයින් සහ අශ්වයන් කුඹුරු වැඩට යොදා ගැනේ. අශ්වයන් හය දෙනෙකු අට දෙනෙකු හෝ නිතර කෙත්බිම් වගා කිරීම සඳහා ගෙන යති. විශාල ජනගහනයක් බෝවීමට මේ සංවර්ධන ක්‍රියාදාමය උපයෝගී වේ. එසේම ආහාර පාන සුලභ වී ඇත්තේ නිෂ්පාදනය අධික බැවිනි.

Scanned by CamScanner

සැතපුම් තුනෙන් තුනට පමණ ගම්මාන දැකිය හැකි ය. ඒ මධ්‍යයෙහි තැපැල් හලක් බැගින් ඇත. මේ තැපැල් පළවල පා ගමනින් පණිවිඩ ගෙන යන තැපැල් සේවකයෝ රැඳී සිටිත්. මේ සේවකයෝ කුඩා මිණිගෙඩිවලින් සරසන ලද බඳ පටියක් පළඳිති. මේ මිණිගෙඩිවල ශබ්දය නිසා ගම්වැසියෝත් මහජනයාත් තැපැල් කරුවකු පැමිණෙන බව දැනගනිති. එක හුස්මට මේ තැපැල් කරුවෝ සැතපුම් තුනක දුර වේගයෙන් දුවති. ඔහු එන බව තැපැල්හලේ රැඳී සිටින අනෙක් තැපැල්කරුවෝ දැන ගනිති. එවිට ඔවුනතුරෙන් එක් තැපැල්කරුවෙක් ඒ තැපැල් මල්ල ගෙන තවත් සැතපුම් තුනක දුර දුවයි. මේ ආකාරයෙන් සැතපුම් තුනෙන් තුනට තැපැල්කරුවෝ තැපැල් මලු රැගෙන දුවති. මෙබඳු ශීඝ්‍ර තැපැල් සේවාවක් සමස්ත අධිරාජ්‍යය පුරා පවතී. දිවා රාත්‍රී දින දෙකක් ඇතුළත කාලයකින් ඕනෑම දුරබැහැර ප්‍රදේශයක සිට ඕනෑම පණිවිඩයක් මහරජුට ලැබෙන්නට ඉඩකඩ සැලසේ. ඛාන් - බාලික් හෙවත් පීකිං නුවර සිට උදේ වරුවේ නෙළාගන්නා පලතුරු වර්ග පසුදා පස්වරුවෙහි ෂැංග් - ටු මාලිගයට ලැබෙන්නට සැලැස්වෙයි. මේ ආකාරයට නොමැති නම් සාමාන්‍යයෙන් සලකා බලන විට මේ ගමනට දින දහයක් ගත වෙයි. සැතපුම් තුනෙන් තුනට පිහිටි මේ තැපැල් පළවල ලිපිකරුවෙක් සේවයේ යෙදෙයි. හෙතෙම තැපැල් මල්ල ගෙන ආ වේලාවත් එතැනින් අනෙක් තැපැල් පළට රැගෙන පිටත් වූ වේලාවත් පොතක ලියා තබයි. උසස් නිලධාරීහු තැපැල නිසි පරිදි බෙදා හරින්නේ දැයි පරීක්ෂා කරති. යම් හෙයකින් තැපැල් බෙදීමේ කටයුතු ප්‍රමාද වුවහොත් හෝ අක්‍රමවත් වුවහොත් හෝ ඔහුට දඬුවම් නියම කැරේ. මේ තැපැල් දුවන්නෝ අයබදුවලින් නිදහස් කරති. එහෙත් අධිරාජයා ඔවුනට වැටුප් ගෙවයි.

දුරබැහැර ප්‍රදේශයන්හි තැපැල් බෙදා හරිනුයේ අශ්වාරෝහකයන් ගේ මාර්ගයෙනි. එහෙයින් තැපැල් කන්තෝරු සඳහා වැඩි වියදමක් දැරීමට සිදු නොවේ. තැපැල් පළවල පාලනය සිදුවන ආකාරයත් එහි සේවය සඳහා යොදවා සිටින අශ්වයන් සංඛ්‍යාවත් ඒ ඒ තැපැල් හලට අවශ්‍ය බඩු බාහිරාදිය ගැනත් ඒ සැපයිය හැකි ප්‍රදේශ වැසියන් ගැනත් මහරජතුමා නිලධාරීන් ලවා විමර්ශනය කරවා අවශ්‍ය විධි විධාන සැලසීමට උපදෙස් දෙයි. වත්පොහොසත්කම් අනුව තැපැල් කන්තෝරුවලට පරිත්‍යාගයන් කිරීමට ද නියෝග කරයි. තැපැල්

Scanned by CamScanner

කන්තොරු අවට පෙදෙසේ පදිංචිකරුවෝ එහි අවශ්‍යතා සපුරා ලන්නාහ. නගරයේ පාලනයෙහි නියුක්ත වූවෝ තැපැල් අශ්වයන්ගේ නඩත්තුව සඳහා යන වියදම ගෙවති. එයින් අධිරාජයාට ගෙවන බදු මුදල් අඩුකැර ගැනේ. මහජනයා රජු වෙනුවෙන් ගෙවන අය බද්දෙන් කොටසක් අශ්වයන් නඩත්තුව කරන බැවින් අඩුකර ගැනේ.

යම් තැපැල් ස්ථානයක අශ්වයන් හාරසියයක් රඳවා ඇත ද දිනපතා ඒ සිවුපාවන් සියල්ලම සේවයෙහි නොයෙදේ. දිනපතා සේවයේ යෙදෙනුයේ අශ්වයන් දෙසියයක් පමණි. මාසයක් පමණ මේ අශ්වයන් සේවයේ යෙදෙන අතර අනෙක් අශ්වයන් දෙසියය තණපිටි කරා යැවෙයි. මේ ආකාරයෙන් මාරුවෙන් මාරුවට අශ්වයන් හාරසියයම තැපැල් සේවයේ යෙදැවේ. අශ්වයන් මාර්ගයෙන් හෝ පා ගමනින් තැපැල් ගෙන යන්නවුන් කිසියම් ජලාශයකින් හෝ ගංගාවකින් හෝ එතෙර විය යුතු නම් ඒ සඳහා යාත්‍රා තුන හතරක් හැම විට ම සූදානම් කර තබා ඇත. ගස් කොළන් නොමැති කාන්තාරයක් ඔස්සේ තැපැල් ගෙන යැමට සිදුවේ නම් ඒ දේශ සීමාවන්හි පිහිටි ප්‍රාදේශීය සභාව හෝ නගර සභාව මගින් අශ්වයන් හෝ ගමන් පහසුකම් හෝ සැලසිය යුතු වේ. විදේශ තානාපතීන් රජ මැදුරට කැඳවාගෙන එන්නේත් ආපසු කැඳවාගෙන යන්නේත් මේ ක්‍රමය අනුගමනය කරමිනි. රාජ දූතයන්ට ද පණිවිඩකාරයන්ට ද සෙසු ආගන්තුකයන්ට ද ප්‍රාදේශීය සභාව හෝ නගර සභාව හෝ ආහාර පාන සම්පාදනය කැර දිය යුතු වේ. මේ සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කැර යවනු ලැබේ. ඉතා දුර බැහැර ස්ථානයකට තැපැල් ගෙනයාම සිදුවේ නම් ඒ සඳහා යොදාගන්නා අශ්වයන් සංඛ්‍යාවෙන් අඩක් අධිරාජයාගෙන් සැපැයේ. ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව හෝ නගර පාලක සභාව ඒ සඳහා වැය කරන්නේ මුළු වියදමින් අඩක් පමණි. කිසියම් හදිසි අත්‍යවශ්‍ය පණිවිඩයක් ගෙන සැතපුම් දෙතුන් සියයක් ඈත දුර බැහැර ප්‍රදේශයකට යා යුතුවේ නම් අශවයන් පිටින් නොනැවතී වේගයෙන් ගමන් කළ යුතු ය. ඈත පළාතක කැරැල්ලක් අරගලයක් හෝ වෙනත් ව්‍යසනයක් පවතී නම් ඔවුන් පවනට බඳු වේගයෙන් යා යුතු ය. උකුස්සාගේ ලාංඡනය සහිත ලෝහ බලපත්‍රයක් ඔව්හු රැගෙන යති. දෙදෙනෙකු කිසියම් බලවත් කඩිනම් පණිවුඩයක් රැගෙන යන්නේ නම් ඔවුන් පිටත් වන්නේ එකම ස්ථානයකිනි.

එකවර ය. උසස් ජවබල සම්පන්න අසුන් අරා ගමන් ගන්නාහ. හිසෙහි සුම්බරයක් බැඳ එකම වේගයෙන් නොනැවතී ගමන් කොට තණ පිටියක් හමු වූ කල විවේක ගනිති. දිනකට සැතපුම් දෙසිය පණහක පමණ දුර ප්‍රමාණයක් පසු කරති. සැතපුම් විසි පහක දුර ගමන් කළ විට අසුන් නවත්වන්නා වූ ස්ථානයක් හමු වේ. එහි දී වෙනත් අසුන් දෙදෙනෙකු ලබා ගෙන නැවත ගමනාරම්භ කැරේ. පණිවිඩයෙහි වැදගත්කම හා හදිසිය අනුව රාත්‍රියෙහි ද ගමන් කිරීමට ඔවුනට සිදුවේ. හඳ එළිය නැත්නම් හුළු එළි ගත් දෙදෙනෙක් ඔවුන් ඉදිරිපසින් දුවති. දහවල් කාලයේ මෙන් රාත්‍රියේ ගමන වේගවත් නොවේ. හුළු එළිකරුවන්ගේ වේග අනුව යා යුතුවන බැවිනි. මෙසේ දීර්ඝ ධාවනයන්හි යෙදෙන අසරුවන් දක්ෂයන් සේ සැලැකේ.

මෙතැන් සිට මා විස්තර කරනුයේ අධිරාජයා වසරකට දෙවරක් සිදුකරන්නා වූ මහා පරිත්‍යාගයන් පිළිබඳ කරුණු ය.

සෑම වර්ෂයක් පාසා ම අධිරාජයා තම දේශයේ වැසියනට සිදුවන අලාභහානි පරීක්ෂා කිරීමට කොමිසමක් පත් කර යවයි. ආපදා අවස්ථාවන්හි දී අධිරාජයා වැසියන්ගෙන් අයබදු නොගනී. ඔවුනට අවශ්‍ය ධාන්‍ය රජයේ ගබඩාවලින් නිකුත් කිරීමට නියෝග කරන්නේ ය. හැම විටම හැම පළාතකම ධාන්‍යාගාර පුරවා තැබීමට රජතුමා උපදෙස් දී ඇත. ආපදා අවස්ථාවන්හි දී මේ ධාන්‍ය සාධාරණ මිලකට මහ ජනයාට ලබා දිය යුතු ය. වෙළෙඳ පොළෙන් වී ලාහක් ලබා ගන්නා මුදලෙන් රජයේ ගබඩාවලින් ලාස් හතරක් ගැනීමට පුළුවන. ගව රෝග වසංගත ඇති වූ විට මියගිය හරකුන් වෙනුවට රජුගේ ගව පට්ටිවලින් ගවයන් රැගෙන යෑමට අවසර ඇත. ගව පට්ටි හිමියන්ගෙන් රජයට අය විය යුතු බද්ද වෙනුවට ඔව්හු රජයට ගවයන් දෙති. පට්ටියක සිටින ගවයන්ගෙන් සියයට දහයක් රජුගේ බද්ද වශයෙන් භාරදිය යුත්තේ ය.

තම රාජ්‍යයේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා අධිරාජයා තම පූර්ණ අවබෝධය හා අවධානය යොමු කැර ඇත්තේ ය. ජනතාවගේ වෙළෙඳ ව්‍යාපාර කර්මාන්ත ව්‍යාපාර ආදී කටයුතු කිරීමට හැම අතින්ම පහසුකම් සලසා දෙයි. මහජනයා කෙරෙහි මහත් දයාවකින් හා කරුණාවෙන් අධිරාජයා කටයුතු කරන බව අපක්ෂපාතව මෙහි දී සඳහන් කළ යුතු ය. ගවයන්ගෙන් හෝ

Scanned by CamScanner

බැටලුවන්ගෙන් අයවිය යුතු බද්ද ඒ සතුන්ගේ හිමිකරුගෙන් වසර තුනක් ගතවන තුරු රජයෙන් අය නොකැරේ. එක ගවයකු හෝ එක බැටලුවකු හෝ රංචුවක් හෝ සිටිය ද මේ බදු සමාව එලෙසින් ම ක්‍රියාත්මක වේ. වෙළෙඳ භාණ්ඩ ප්‍රවාහනය කරන්නා වූ නැවකට යම් හෙයකින් අකුණු සැරයක් වැදුණ හොත් තොටුපල ගාස්තු හෝ රේගු බදු අයකරන්නේ නැත. එය අසුභ නිමිත්තක් ලෙස සලකන බැවිනි. නැවක බඩු පටවා ගෙන යන පිරිසෙහි ප්‍රධාන වෙළෙන්දා කෙරෙහි දෙවියන්ගේ ශාපය නිසා මෙසේ අකුණු වැදෙන බවත්, දෙවියන්ගේ උදහසට ලක් වූ භාණ්ඩවලින් තීරුබදු අය කැර ඒ මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයට ගැනීම අයෝග්‍ය ලෙසත් අධිරාජයා සලකයි.

රාජ්‍යයේ සියලු ප්‍රධාන මං මාවත් දෙපස පල දරන්නා වූ ගස් කොළන් සිටුවීමට අධිරාජයා නියෝග කැර ඇත. එමගින් පුරවරය අලංකාර වීමට ද ආර්ථික ලාභ ලැබීමට ද හේතුවේ. මගීන්ට සෙවණ සැලසීම ද හේමන්ත ඍතුවෙහි හිමෙන් වැසී යැමෙන් ආවරණය වන මං මාවත් සොයා ගැනීම ද එයින් සැලසෙන තවත් වාසියකි. මෙසේ ගස් කොළන් වැවීමට හැකිවනුයේ සරුසාර භූමි ප්‍රදෙශයන්හි පමණි. අනෙක් ප්‍රදේශයන්හි සෙල්ටැම් සිටුවීමට ද නැතහොත් කුලුණු ඉදිකැර තැබීමටත් නියෝග කැරිණි. හිම පතනය පවත්නා කාලය තුළ මගීන්ට නිසි පරිදි පාර සොයා ගැනීමට ආධාර වනු පිණිස ය. මේ කටයුතු නිසි ලෙස ඉටුවී ඇත්දැයි විමර්ශනය කිරීමට නිලධාරී පිරිසක් ද පත්කැර තිබේ. මංමාවත් දෙපස මෙසේ පල දරන ගස් කොළන් සිටුවූයේ ආගමික පූජකයන්ගේ උපදෙස් අනුව යයි ද පවසති. ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ ද, ආගමික නායකයෝ ද මංමාවත් දෙපස පල දරන ගස් කොළන් සිටුවීම මහත් පුණ්‍ය කර්මයක් බව ද එමගින් දීර්ඝායුෂ ලැබෙන බව ද කියති. අධිරාජයා මංමාවත් දෙපස රුක් රෝපණය කෙළේ යථෝක්ත උපදේශය ද සැලැකිල්ලට ගනිමින් යයි ද විශ්වාස කැරේ.

කැතේ ප්‍රදේශයේ ඇතැම් ජනයා බත් ද තවත් කුළුබඩු වර්ග ද මිශ්‍රකැර මද්‍යසාරයක් පෙරා බීමට ගනිති. එය ඉතා රසවත් ය. ශරීර සෞඛ්‍යයට අහිතකර නොවේ. ඒ හැරුණු විට වෙනත් මද්‍යසාර භාවිතා නොකරති. මෙය ජලය මෙන් පැහැදිලි ද්‍රව්‍යයකි. උණු උණුවේ බීමට ගන්නා බැවින් ඉක්මනින් මත් ගතිය දැනේ. අනෙක් සුරා වර්ගයකට වඩා ප්‍රබල ය.

Scanned by CamScanner

මේ ප්‍රදේශයේ හැම තැන ම කළු පැහැති භූගත ගල් වර්ගයක් තිබේ. ජනයා කඳු සහ පොළොව හාරා මේ ගල් වර්ගය ගොඩගනිති. මේ ගල් වර්ගය ගින්නෙහි ලා පිළිස්සූ කල්හි තද රත් පැහැති ගිනි අඟුරු සේ දිලිසේ. ඇවිළේ. නහර මෙන් මේවා පොළොවේ හැම තැනම හමු වෙයි. බොහෝ වේලා මේ ගිනි අඟුරු නොනි වී පවත්නා බැවින් එයින් නැවත නැවත ගිනි දල්වා ගැනීමට හැකි වේ. දැල්වූ සැණෙන් ගිනිදැල්ලක් නැගුණ ද ක්‍රමයෙන් නිවී යයි. එහෙත් ඒ අඟුරුවලින් දැඩි තාපයක් නිකුත් වේ. මේ රටේ දර හිඟයක් නැතත් ජනගහනය අධික බැවින් සෑම නිවසකම පරිහරණය සඳහා දර විශාල ප්‍රමාණයක් අත්‍යවශ්‍ය වේ. එහෙයින් මේ ගල් අඟුරු වර්ගය ද දහනය සඳහා භාවිතා කැරේ. මේ ප්‍රදේශයේ හැම මනුෂ්‍යයකුම පාහේ සතියකට තෙවරක් උණු දිය නාති. ශීත කාලයේ දිනපතා ම වාගේ උණුවතුරෙන් ස්නානය කරති. වත් පොහොසත් කම් අනුව සෑම නිවසකම උණු පැන් ගෙයක් (ස්නානාගාරයක්) තනා තිබේ. ජලය උණු කිරීම බහුලව සිදුවන බැවින් දර විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ.

ආපදා අවසථාවන්හි දී අධිරාජයා ජනයාට ධාන්‍ය ආහාර වර්ග පරිත්‍යාග කරන බව ඉහත සඳහන් විය. දිළින්දන් සඳහා අධිරාජයා විසින් කරනු ලබන පරිත්‍යාග මෙතැන් සිට විස්තර කැරෙයි. කිසියම් දරු පවුලක පොහොසත්ව සිට අභාග්‍ය සම්පන්න තත්ත්වයකට ඇද වැටුණහෙත් නැතහොත් වෙනත් ආපදාවක් නිසා අසරණ වුවහොත් අධිරාජයා ඒ ගැන සොයා බලා වසරකට අවශ්‍ය ධාන්‍ය සහ වෙනත් ආහාර ද්‍රව්‍ය සැපයීමට නියම කරයි. ධාන්‍යාගාර අසල ප්‍රදේශයේ පදිංචි වී සිටින්නා වූ ඒ කටයුතු භාර නිලධාරීන් වෙත ඔව්හු වසර අවසානයේ දී රජයෙන් ලබාගත් ආධාර වෙනුවෙන් කොටසක් නැවත භාර දෙති. ගොවියන් සඳහා අනෙක් අවුරුද්දට ලබා දෙන ධාන්‍ය ප්‍රමාණයෙන් රජයේ භාණ්ඩාගාරයට ලබා දුන් ධාන්‍ය ප්‍රමාණය පිළිබඳ සටහනක් ලබා දෙති. රජයේ ගබඩාවලන් දිළිඳු ගොවියන්ට ඇඳුම් පැළඳුම් රෙදිපිළි සැපයේ.

රෙදිපිළි වෙනුවට ලොම්, සේද, පට, හණ යනාදිය ලබාගත්තෝ එයින් වස්ත්‍ර නිෂ්පාදනය කරති. වැසියන්ගෙන් ලබාගන්නා ලොම් සේද පට හණ යනාදී අමුද්‍රව්‍ය රජයේ නිලධාරීහු පේෂකාරයන්ට

Scanned by CamScanner

ලබා දී වස්ත්‍ර නිෂ්පාදනය කොට රාජ්‍ය ගබඩාවන්හි තැන්පත් කර ගබඩා කර තබන්නාහ. රෙදි විවීම සඳහා පේෂකර්ම ශාලා පිහිටුවා තිබේ. පේෂ කර්මාන්තකරුවන් සතියට එක් දිනක් එහි පැමිණ නොමිලේ රජය වෙනුවෙන් රෙදි විවීමෙහි යෙදිය යුතු ය. රාජ්‍ය පේෂ කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කරන්නා වූ රෙදිපිළි දිළින්දන්ට ලබා දිය යුතු යයි රාජ නියෝගයක් පවතී. ශීත කාලයට හා උෂ්ණ කාලයට විශේෂ ඇඳුම් වර්ග අවශ්‍ය වුවද දිළින්දන්ට ඒ සපයා ගත නොහේ. යුද්ධ හමුදාව සඳහා අවශ්‍ය නිල ඇඳුම් පිළියෙළ කරන්නේ ද මෙකී පේෂ කර්ම ශාලාවල ය. ලොම්වලින් සෑදූ ඇඳුම් හැම නගරයක ම ගබඩා කැර තිබේ. රාජ්‍ය ආදායමෙන් දහයෙන් පංගුවේ බදු මුදලෙන් මේ සඳහා වියදම් සපයා ගැනේ.

පාරම්පරික චින්තනයට සිරවී සිටින බුද්ධාගම නොවැළඳගත් ටාටර්වරු පරිත්‍යාගශීලී නොවෙති. පිනට දීම ඔවුනට නුපුරුදු ය.

"ඉල්ලන්න එන්න එපා! උඹට දෙවියන් පිටුපාලා. නරක දසාවක් ලබලා. උඹ හිතන්නේ දෙවියන් මට පමණක් භවබෝග සම්පත් දීලා කියලයි. උඹට දෙවියන් අනුකම්පා කළා නම් හිඟමන් යදින්න සිද්ධ වෙන්නේ නෑ! උඹටත් මට වගේ පොහොසත් වෙන්න තිබුණා. උඹට හරි නොගියට පළි ද අපි? පලයන් යන්න මූසල කාලකණ්ණියා. බොරු කන්නලවු නොකර පලයන්" කියමින් අසරණයන් පළවා හරිති.

එහෙත් ප්‍රතිමා වන්දනා කරන බෞද්ධයෝ එසේ නොවෙති. ඔව්හු අසරණයන්ට පිහිට වෙති. ප්‍රභූවන්තයෝත් බෞද්ධ භික්ෂූන් වහන්සේත් දන් දීම උතුම් පුණ්‍ය ක්‍රියාවක් සේ සලකති. අනුශාසනා කරති. දන් දෙන අයට දෙවියන්ගේ ආශිර්වාදය ලැබෙන බව පවසති. අධිරාජයාට ද මෙසේ අවවාද අනුශාසනා කරන බැවින් දන් දීම උතුම් කොට සලකයි. ආහාර පාන පතා රජ මාලිගාවට පැමිණෙන සියලු දෙනා කුසගිනි නිවාගෙන ආපසු යති. දුගී මගී යාචකාදීන් සඳහා දිනපතා රජ මාලිගාවේ දන්සැලක් පැවැත්වේ. මේ දාන ශාලාවේ සියලු කටයුතු සඳහා සේවකයන් යොදා ඇත. බත්, මෙනේරි, කුරක්කන් ආදි ආහාර වර්ග පිරවූ භාජන විසි දහසක් දිනපතා දුගී මගී යාචකාදීන් උදෙසා අධිරාජයා පිරිනමයි. මවිතය දනවන මේ දානශාලාව හේතු කොට සියලු මහජනතාව අධිරාජයාට සලකන්නේ දෙවියකුට මෙන් මහත් භක්තියෙනි.

Scanned by CamScanner

චීනයේ ඛාන් බාලික් (පීකිං) නගරයේ ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝත්, අනාවැකි ප්‍රකාශ කරන්නෝත් පන් දහසක් පමණ වෙති. ඔවුන් ක්‍රිස්තියානි, මුස්ලිම් හා චීන ජාතිකයන් අතර දක්නට ලැබේ. මේ සියලු දෙනා නඩත්තු කරන්නේ රජයේ වියදමෙනි. දිළිඳු පවුල්වල සාමාජිකයනට සලකන අයුරින්ම රජතුමා ඔවුනට ආහාරපාන ඇඳුම් පැළඳුම් යනාදි සියල්ල සපයා දෙයි. ඔවුන්ගේ කාර්‍යය නැකැත් කීම ය. ඔවුන් ළඟ රාශි චක්‍රයේ සටහන් ද, ග්‍රහතාරකා පිළිබඳ සටහන් ද, ග්‍රහචාරය ද, මධ්‍යාහ්නය පසුකරන වේලාව ද යනාදි දෛනික ජ්‍යොතිෂ්ශාස්ත්‍රීය කරුණු ද ඔව්හු තමන් ළඟ තබා ගෙන එදිනෙදා පලාඵල විස්තර කරන්නාහ. රාශි චක්‍රය කොටස් දොළසකට බෙදා තිබේ. පංචාංග ලිත් නිර්මාණය කරන්නා වූ ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ විවිධ ගුරුකුලවලට අයත් වෙති. වාර්ෂිකව ඔවුන් ස්වකීය ගුරුකුල මූලස්ථාන වෙත ගෙස් ග්‍රහචාර පිළිබඳ කරුණු සමාලෝචනය කිරීම සිරිතකි. ග්‍රහ චක්‍රයේ ග්‍රහ ගමන හා චන්ද්‍ර චාරය අනුව කාලගුණ, දේශගුණ, ඍතුගුණ වෙනස්වීම් පිළිබඳව ඔවුහු නිරතුරු නිරීක්ෂණය කරති. අකුණු ගැසීම්, ගංවතුර වර්ෂාව, භූමිකම්පා, ධාරානිපාත වර්ෂා පිළිබඳව ද වසංගත රෝග, හදිසි අනතුරු, බිහිසුණු මරණ, යුද්ද කලකෝලාහල, කැරලි, රාජ්‍ය කුමන්ත්‍රණ, මහජන කැළඹිලි ආදි සියලු කරුණු පිළිබඳව ද ඔව්හු අනාවැකි ප්‍රකාශ කරමින් රජතුමා හා මහජනයා දැනුවත් කරති. වානිජ සංචාරයෙහි දී පාඩු සිදුවන බවත් නැතහොත් ගමන සාර්ථක වන බවත් ඔව්හු අකුරටම කියති. රාශි චක්‍රයෙහි ග්‍රහ චාරය අනුව සියල්ල සිදුවන බවත් එහෙත් දේව කරුණා මහිමය හේතු කොටගෙන සුභ අසුභ විපාක වෙනස් විය හැකි බව ද ඔවුන්ගේ අදහස ය. වාර්ෂික සංවත්සර පලාඵල ඔව්හු ලේඛනයක සකස් කර ප්‍රදර්ශනය කරති. මෙය 'ටකුඉම්' නමින් හැඳින්වේ. අනාගතය පිළිබඳ දැන ගැනීමට අවශ්‍ය අයට සුළු මුදලකට මේ 'ටකුඉම්' අලෙවි කැරේ.

කිසියම් ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයකු නිවැරැදි අනාවැකියක් පැවැසුව හොත් ඔහුට මහජනයාගේ ගෞරවය හිමිවේ. චීනයේ ජනයා වැදගත් කටයුතු ආරම්භ කිරීමේ දී ද, වෙළෙඳ ව්‍යාපාර පටන් ගැනීමේ දී ද, විදේශ වාණිජ කටයුතු සඳහා නික්ම යෑමේ දී ද, කවර නම් වටිනා කටයුත්තක් පටන් ගැනීමේ දී ද ජ්‍යොතිෂ්ශාස්ත්‍රීය

Scanned by CamScanner

උපදෙස් ලබා ගැනීම, නැකැත් බැලීම කරති. ඒ සඳහා සුදුසු වර්ෂය මාසය දිනය කාල හෝරාව නැකත ආදිය ගණිතානුසාරයෙන් විමසා දැන ගනිති. ජන්ම කේන්ද්‍රය සමග තත්කාලීන ග්‍රහ චාරය සසඳ බලා ඵල විපාක විමසති. ජ්‍යොතිර්වේදියා සියල්ල සලකා බලා සුබ අසුබ පලාඵල කථනයෙහි යෙදේ.

ටාටර්වරුන් ජ්‍යොතිෂ්ශාස්ත්‍රානුකූලව සුබ අසුව විමර්ශනයෙහි යෙදෙනුයේ රාශි චක්‍රය අවුරුදු දොළොස කොටස්වලට බෙදා ග්‍රහබලය ග්‍රහචාරය සලකා බලමිනි. පළමුවන වර්ෂය සිංහ රාශියයි. වෘෂභ රාශිය දෙවැන්න ය. තෙවැන්න මකරයයි. සිවුවැන්න සුනඛ නම් වේ. මේ ආකාරයෙන් වර්ෂ දොළස නම් කැර තිබේ. කිසියම් පුද්ගලයකුගේ උපත සිදුවූයේ කිනම් වර්ෂයකදැයි ප්‍රශ්න කළහොත් සිංහ වර්ෂයේ, මෙනම් මාසයේ, මෙනම් දිනයේ, රාත්‍රියේ හෝ දහවල මෙනම් පැයේ, මෙනම් විනාඩියට යයි කියති. දරුවකුගේ උත්පත්තිය සිදුවූ කල්හි මෙනම් වර්ෂයේ, මෙනම් මාසයේ, මෙනම් දිනයේ, මෙනම් පැයට, මෙනම් විනාඩියට උපත සිදුවී යයි පොතක ලියා තැබීම දෙමාපියන්ගේ සිරිත ය. ප්‍රථම කාල චක්‍රය වර්ෂය දොළසකි. නැවත එතැන් සිට ඊළඟ දොළොස් වර්ෂය ගණනය කැර පලාඵල කියති. වර්ෂ දොළසකින් දොළසට මේ අයුරින් ග්‍රහ පලාඵල කථනය කරනු ලැබේ.

මවිසින් ඉහත දී ද සඳහන් කරන ලද පරිදි කැතේ (චීන) ප්‍රදේශ වාසීහු පිළිම වන්දනා කරන්නෝ වෙති. එනම් බෞද්ධාගමිකයෝ ය. දේව ප්‍රතිමා හෝ දේව රූප සටහන් දෙවියන්ගේ නම් සඳහන් තහඩුවක් නිවාසයන්හි ඉතා උස් ස්ථානයක පිහිටුවති. මල් පහන් සුවඳ දුම් පූජා කිරීම සඳහා ය. මෙසේ පුද පූජා පවත්වන නිවාසයන්ට ද එහි වැසියන්ට ද දේවාශිර්වාද ලැබේ යයි විශ්වාස කැරේ. දැන් ඔසවා බිම වැතිර තෙවරක් නළල බිම තබා ඔව්හු වන්දනා කරති. බුද්ධියත් නුවණත් නිරෝගී භාවයත් සෞභාග්‍යයත් ප්‍රාර්ථනා කැරෙමිනි. ඔවුන් පුද පූජා පවත්වන්නා වූ ස්ථානයෙහි බිම 'නතිගයි' නමැති ප්‍රතිමාවක් තබති. පෘථිවියෙහි පවත්නා සමස්ත වස්තු සම්භාරයට හා ධන ධාන්‍ය ආදි බවබෝග සම්පත් සියල්ලට මේ ප්‍රතිමාවෙන් මූර්තිමත් කැරෙන දෙවියන් අධිපතිවන්නේ යයි මෙහි ජනයා විශ්වාස කරත්. මේ දෙවියන්ට දේවියක් ද, දරුවෝ ද සිටිති. මල් පහන් සුවඳ දුම් ආදිය පුදා පසඟ පිහිටුවා තෙවරක් නළල බිම

Scanned by CamScanner

තබා නමස්කාර කරමින් ඔවුන් ප්‍රාර්ථනා කරනුයේ නිසි කලට වර්ෂාව ය, භවබෝග සම්පත් ය, සරුසාර අස්වැන්නකි, පවුලේ සෞභාග්‍ය ය, දූ දරුවන්ගේ දියුණුව ය යන මේවා ය.

මරණයෙන් පසු නැවත ඉපදීම හෙවත් පුනරුත්පත්තිය මෙහි ජනයා විශ්වාස කරති. කෙනකු මිය ගිය පසු ඔහුගේ ආත්මය තවත් සිරුරකට පිවිසේ. කිසියම් පුද්ගලයකු ජීවිත කාලය තුළ ගත කළ දැහැමි හෝ දුෂ්ට ක්‍රියාවන්ට අනුකූලව ඊළඟ ආත්ම භාවයේදී සුඛිත මුදිත හෝ දුඃඛිත වන බවයි. දිළින්දකු යහපත් ක්‍රියාවල යෙදුණේ නම් මරණින් මතු පොහොසත් පවුලක උපදී. සාමාන්‍ය පවුලක උපන් තැනැත්තකු යහපත් ක්‍රියාවන්හි යෙදී මිය පරලොව ගියේ නම් ධනවත් පවුලක මවක කුස පිළිසිඳ ගනී. ක්‍රම ක්‍රමයෙන් උසස් ජීවිතයක් හිමි කැර ගනිමින් පසුව දේවත්වයට පත්වන බව ද කියති. ඉතා උසස් පවුලක ජනිත පුද්ගලයකු වුවද අයහපත් පාපකාරී දුෂ්ට කටයුතුවල යෙදුනේ නම් හේ අනුක්‍රමයෙන් පරිහානියට පත්වී සුනඛයකු වන බව ද විශ්වාස කැරේ. ආත්මයෙන් ආත්මයට පහත් අසරණ තත්ත්වයකට පත්වේ.

මෙහි ජනයා ආචාරශීලි ය. ප්‍රියමනාප ලෙස පිළිසඳරෙහි යෙදෙති. ආචාර සමාචාර සුහදශීලී ය. කතාබහෙන් ද මුහුණින් ද ඔවුන්ගේ සතුට ප්‍රීතිය සොම්නස පිළිබිඹු වේ. ශිෂ්ට සම්පන්න ජනතාවකි. ආහාර පාන කැවිලි පෙවිලි ආදියෙන් සංග්‍රහ කරනුයේ ඉතා පිරිසිදු ලෙසිනි. පියකරු ආකාරයෙනි. දූ දරුවෝ දෙමාපියන්ට ඉතා උසස් අන්දමින් ගරු සරු ලෙස සලකති. දෙමාපියන්ට නොසැලකීම නිසා නින්දා ලබති. දෙමාපියන්ට අගෞරව, අවමාන, අපහාස වන අන්දමින් දූ දරුවන් කටයුතු කළහොත් ඒ ගැන විමසා බලා දඬුවම් නියම කැරේ. තදබල දඬුවම් පැවැත්වීමට උසාවියක් මහජන විනිශ්චය මණ්ඩලයක් පිහිටුවා තිබේ. සාපරාධී ක්‍රියාවලට සම්බන්ධ වරදකරුවෝ බන්ධනාගාර ගත කරති. සමහරුන්ගේ කුළල මිරිකති. වර්ෂ තුනක් බන්ධනාගාර තුළ සිටි සිරකරුවන් රාජ නියෝගය පරිදි මුදා හරිනු ලැබේ. බන්ධනාගාරයෙන් මුදා හැරීමේ දී සිරකරුගේ කම්මුලේ සලකුණක් තබා අපරාධකාරයකු බවට හඳුන්වයි.

අධිරාජයා සූදුව සහ සියලු වංචනික ක්‍රියා තහනම් කෙළේ ය. මේ රටේ සියලු ජනයා ලොව අන් සියලු රටවල ජනතාවට වඩා

Scanned by CamScanner

සුදුවට ලොල් වූහ. ජනතාව මේ භයානක පරිහානි මුඛයෙන් මුදා ගැනීම සඳහා ආඥාවක් පැනවීය.

> "...නුඹලා මගේ කඩුවට යටත් ය. කඩුවේ බලයෙන් නුඹලා යටත් කරගත් මට නුඹලාගේ දේපළ ද අයත් ය. එහෙයින් නුඹලා සුදු කෙළින්නේ නම් සෙල්ලම් කරන්නේ මගේ දේපළ සමග බව සිහිතබා ගත යුතු ය."

මෙසේ ආඥා පැනවුවද අධිරාජයා කිසිවකුගේ දේපළක් පැහැර ගත්තේ නැත. පවරා ගත්තේ නැත. මේ ආඥාව සියලු ජනයා ගෞරවයෙන් පිළිපදිති. ගරුකරති.

මෙහි වැසියන් රජතුමා දුටු විට නුදුටු සේ මගහැර නොයන්නේ ය. රජතුමා හිඳින ස්ථානයක සිට සැතපුම් භාගයක පමණ දුර ප්‍රමාණයක් ඇතුළත කැකෝ ගසන්නේ නැත. යටහත් පහත් භාවය දක්වති. ඔවුන් සිටින තැන්වල කෙළ ගසන්නේ නැත. තත්ත්වයේ හැටියට කෙළ ගසන භාජනයක් රැගෙන යති. උස් ස්ථානවල සිට බිමට කෙළ ගසන්නේ ද නැත. රාජ සභාවේ දී යමකු තමන් සතු කෙළ බඳුනට කෙළ ගසා එහි පියන වසා නැගිට සිංහාසනයට හිස නමා ආචාර කරයි.

රාජ සභාවට පැමිණෙන්නවුන් අමතර පාවහන් සඟලක් ගෙන යති. රාජ සභාවට ඇතුළු වීමට පෙර ලැබෙන විරාමයේ දී ඔවුන් පැළඳගෙන ආ පාවහන් ගලවා තම සේවකයන්ට භාරදිය යුතු ය. ඒ වෙනුවට අනෙක් පාවහන් සඟල පැළඳගෙන රාජ සභා ශාලාවට පිවිසෙති. මෙසේ කරනුයේ රාජ සභාවෙහි බිම අතුරා ඇති අගනා බුමුතුරුණු කොඳු පලස් කිලිටි වීම වැළැක්වීම සඳහා ය. මේ බුමුතුරුණු සේද පටනුලින් ද, රන් රිදී කෙඳිවලින් ද, විසිතුරු ලෙස වෛවර්ණයෙන් ද, මල් ලියකමින් ද හැඩ වැඩ දමා ඇති බැවිනි.




# පීකිං සිට බෙංගාලයට

ඛාන් බාලික් පුරවරයෙහි සිට කැතේ දක්වා ගමන ආරම්භ කෙළෙමි. මේ ගමනේ දී අතරමග දක්නට ලැබෙන ශ්‍රී විභූතිය හා සම්පත් පිළිබඳව මෙතැන් සිට විස්තර කිරීමට කැමැත්තෙමි.

නගරයෙන් පිටත් වී සැතපුම් දහයක් දුර ගෙවූ කල්හි පුලිසන්සින් නමැති විශාල ගංගාව හමුවේ. මුහුදට ගලා බස්නා මේ ගංගාවේ වෙළෙඳුන් සමග වෙළෙඳ බඩු බාහිරාදිය ප්‍රවාහනය කැරේ. යථෝක්ත ගංගාවෙන් එතෙර මෙතෙර ගමන් කිරීමට අලංකාර පාලමක් ඉදිකැර තිබේ. සමස්ත ලෝකයෙහිම එතරම් දර්ශනීය පාලමක් දක්නට නොලැබෙන තරම් ය. මා එසේ කියන්නේ කවර හෙයින්දැයි ඔබට විස්තර කරන්නෙමි. මේ පාලම දිගින් රියන් තුන් සියයක් පමණ වේ. පළල රියන් අටක් පමණ ය. අශ්වාරෝහකයන් දස දෙනකුට එක්ව එක පෙළට උරෙනුර නොගැටී ගමන් කළ හැකි වේ. මේ පාලමෙහි ආරුක්කු විසි හතරකි. එසේම ගංගාව පතුළට කිඳ බැස්වූ ශක්තිමත් කණු විසි හතරක් මේ පාලම දරා සිටී. අළු පැහැති ගරුඬ ගලින් සහමුලින්ම පාලම නිර්මාණය කැර තිබේ. මෙය ඉතා කදිම අලංකාර ශක්තිමත් නිර්මාණයකි. පාලමේ මුදුන් කොටස මදක් පටුවන සේ ද, ඍජු ලෙස ද ඉදිකරන ලද්දේ වෙයි. පාලම දෙපැත්තේම ගරුඬ පාෂාණයෙන් නිම කැරුණු බැම්මකි. මෙහි උස් ගරුඬ පාෂාණමය කුළුණු පේළියකි. ඊමත කිරිගරුඬයෙන් නිමැවූ ඉබ්බන් ගේ මූර්තිවලින් අලංකාර කැර තිබේ. මේ කුළුණු පාමුල ගරුඬ පාෂාණයෙන් නිමැවූ සිංහ මූර්ති දැකිය හැකි ය. ඒ මූර්ති ප්‍රමාණයෙන්

Scanned by CamScanner

හා නිර්මාණ කෞශල්‍යයෙන් විශිෂ්ට ය. සිංහ මූර්ති පේළි දෙකකට සිටින සේ තනා තිබේ. කුළුණු දෙකක් අතර ඇති අවකාශය අළු පැහැති ගරුඬ පාෂාණ පුවරුවලින් ආවරණය කැර ඇත. මේ ගරුඬ පාෂාණ පුවරු විවිධ කැටයම් මගින් අලංකාර වේ. මේ අයුරින් පාලම දෙපස ගරුඬ පාෂාණ පුවරුවලින් ආවරණය කැර ඇත්තේ ඔබ මොබ ගමන් ගන්නවුන් ජලයට ඇද වැටීම වළක්වාලීම සඳහා ය. මෙය කවරකු විසින් වුවද නැරඹිය යුතු දර්ශනීය විශිෂ්ට නිර්මාණයකි. පහළට නෙරා ඇති බෑවුම බැලූ බැල්මට පෙනෙනුයේ උඩුකුරු වන ආකාරයකි.

ඉහත විස්තර කළ දර්ශනීය පාලමෙන් එතෙර වී සැතපුම් තිහක් බටහිර දෙසට ගමන් කළ විට පියකරු නිවාස, කෙත්වතු, මිදිවතු ආදිය දක්නට ලැබිණ. ඉක්බිති පිවිසියේ චෝ - චෞ නමැති පියකරු දර්ශනීය සුවිසල් පුරවරයට ය. මේ ප්‍රදේශයේ ප්‍රතිමා සහිත ආගමික සිද්ධස්ථාන පිහිටා තිබේ. එය වාණිජ සහ කර්මාන්ත පුරවරයකි. පටසේද ද, රෙදිපිළි ද, රන් භාණ්ඩ ද, සුවඳ විලවුන් ද මෙහි නිෂ්පාදනය කැරේ. සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් ද නොමඳව සම්පාදනය කැරෙන පුරවරයකි.

සැතපුමක් පමණ ඉදිරියට ගමන් කළ විට ප්‍රධාන මාර්ගය කොටස් දෙකකට බෙදේ. බටහිර මාර්ගය කැතේ හරහා විහිදේ. ගිනිකොණ දිගට විහිදෙන මාර්ගය 'මන්සි' නමැති විශාල පළාතට යි. බටහිර දිසාවට ඇති මාර්ගයේ ගමන් කළ කල්හි දින දහයකින් කැතේ පසුකර තායි - යුවාන් - ෆූ වෙත පිවිසිය හැකි ය. මේ මාර්ගයේ අලංකාර නගර දක්නට ලැබේ. සරුසාර වෙළෙඳ මධ්‍යස්ථානයන්හි ද විවිධ වෙළෙඳ භාණ්ඩයන් ද, කර්මාන්තයන් ද දිස්වේ. ඒ අතර සරුසාර කෙත්වතු ද මිදිවතු ද ඇත්තේ ය. එයට අමතරව විශේෂයෙන් කිවයුතු දෑ නොමැත. මෙහි වාසය කරන්නෝ ශිෂ්ට මනුෂ්‍යයෝ ය. නගර අතර ප්‍රවාහනයට ද වෙළඳ බඩු ඔබ මොබ රැගෙන යෑමටද පහසුකම් සහිත මාර්ග පද්ධතියක් ද ඇත. සෑම නගරයකම වෙළෙඳ මධ්‍යස්ථාන ද දැකිය හැකි ය. දස දිනක් ගතවන මේ ගමනේ දී අනෙක් නගරවලට වඩා විශාල නගරයක් හමුවේ. එය 'අක් - බාලික්' නම් වේ. එය ඛාන්වරයාගේ දඩකෙළි බිමෙහි එක් සීමාවකි. ඛාන් සහ ඔහුගේ පිරිවර හැරුණු විට අන් කිසිවකුටවත් එහි දඩකෙළි සඳහා හැසිරීමට අවසර නොමැත.

Scanned by CamScanner

එහෙත් දඩකෙළි භූමියෙහි භාරකරුගේ අවසරය ලත් අයට වැදගත් පවුල්වල අයට ද මෙහි දඩකෙළි සඳහා අවසර ලැබේ. මෙහි වනසතුන් බහුල ලෙස බෝවේ. හාවුන් මේ ප්‍රදේශයෙහි අප්‍රමාණ ලෙස දැකිය හැකි ය. ඛාන්වරයා සිය පිරිවර සමග මේ ප්‍රදේශයට පැමිණ දඩයමෙහි යෙදේ.

දස දිනක ගමන කෙළවර සංචාරකයා පිවිසෙනුයේ තායි - යුආන් ෆු නමැති අගනුවරට ය. තායි - යූ ආන් - ෆු නමින් සමස්ත නගරවරයම හැඳින්වේ. විශාල සෞභාග්‍යයෙන් පිරි පුරවරයකි. මහා වෙළෙඳ මධ්‍යස්ථානයකි. කර්මාන්ත පුරවරයකි. ඛාන්වරයාගේ හමුදාවනට අවශ්‍ය සියලු ද්‍රව්‍ය සපයනු ලබන්නේ මේ නගරයෙනි. මිදි වතු බහුල වශයෙන් දක්නට ලැබෙන අතර වයින් නිෂ්පාදනය ද මහා පරිමාණයෙන් සිදුවේ. මේ නගරයෙහි හැරුණු විට අනෙක් කිසිදු ප්‍රදේශයක වයින් නිෂ්පාදනය නොකැරේ. මෙහි නිෂ්පානය කැරෙන වයින් සෙසු ප්‍රදේශවලට ද බෙදාහරිනු ලැබේ. මල්බෙරි වගාව ද පට පණුවන් බෝ කිරීම ද බහුල බැවින් පට හා සේද රෙදි කර්මාන්තය අතිශයින් දියුණු ය.

තායි - යුආන් - ෆු සිට දින හතක් අසු පිටින් ගමන් කොට බටහිර දිශාවෙන් පිහිටි කයි චු නමැති දර්ශනීය බලකොටුව සහ මාලිගාව පිහිටි ස්ථානයට ළඟාවීමට හැකි විය. එක්තරා කාලයක එය ගොඩනගන ලද්දේ ස්වර්ණ නමැති රජතුමා විසිනි. බලකොටුව තුළ පිහිටි මාලිගය අතිශයින් දර්ශනීය ය. එහි විශාල ශාලාවෙහි පැරැණි රජවරුන්ගේ ආලේඛ්‍ය චිත්‍ර දැකිය හැකි ය. එය නැරඹීමට සුදුසු ආකර්ෂණීය දර්ශනීය ස්ථානයකි. පුරාණ රජ දරුවන් විසින් මේ සියල්ල නිර්මාණය කළ බව පැවසේ.

ස්වර්ණ රජතුමා අතිශයින් ප්‍රබල පාලකයෙකි. ඔහුගේ වාසස්ථානයෙහි සියලු කටයුතු සඳහා යෙදවූයේ යුවතියන් ය. යුවතියෝ විශාල සංඛ්‍යාවක් ඔහුගේ පිරිවර වශයෙන් සිටියහ. රජතුමා බලකොටුවෙන් පිටත ගමන් ගන්නා කල්හි ඔහුගේ රථය ඇදගෙන ගියේ ද මේ යුවතියන් ය. මේ යුවතියෝ රජතුමාගේ විනෝදය සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කළහ. ඉතා ගෞරවනීය ලෙස ද යුක්තිගරුක හා සාධාරණ ලෙස ද ස්වර්ණ රජතුමා ස්වකීය පාලනය ගෙන ගියේ ය. ප්‍රෙස්ටර් ජෝන් හා ස්වර්ණ රජතුමා පිළිබඳ කථා ප්‍රවෘත්තියක් මේ රටේ ජනතාව අතර ප්‍රකටව පවතී.

Scanned by CamScanner

දැන් ඒ කතාව ඔබට කියන්නෙමි. මෙය සත්‍ය කතාවක් බව එහි වැසියෝ කියති.

එක්තරා අවස්ථාවක රජවරුන් දෙදෙන අතර යුද්ධයක් පැවතිණ. ස්වර්ණ රජතුමා උන්ග් ඛාන් හට යටත්ව සිටියේ ය. ඔහු පිළිබඳව ඉහත දී සඳහන් කෙළෙමි. ප්‍රෙස්ටර් ජෝන් නමින් හැඳින්වූයේ ද මේ රජු ය. හෙතෙම ස්වකීය බලය යොදා ස්වරණ රජු පරාජය කිරීමට කටයුතු කළ ද ජය අතපත්කැර ගත හැකි වූයේ නොවේ. එසේම රජුට කිසිදු හානියක් කිරීමට ද සමත්වූයේ නැත. මේ නිසා ඔහු බලවත් කෝපයට පත්ව සිටියේ ය. ස්වර්ණ රජුගෙන් පළිගැනීම සඳහා ප්‍රෙස්ටර් ජෝන් හෙංචයියන් සත් දෙනෙකු යෙදවීය. ස්වර්ණ රජතුමා අල්ලා තමන් වෙත රැගෙන ඒම සඳහා ය. මොවුන් සත් දෙනා ප්‍රෙස්ටර් ජොන් කී පරිදි කටයුතු කිරීම පිණිස ඔහුගේ අනුමැතිය ලබා ස්වර්ණ රජතුමා වෙතට ගියහ. ඉතා දුරබැහර රාජ්‍යයක සිට පැමිණියේ රජුට හිතවත්ව කටයුතු කිරීම සඳහා කැමැත්තෙන් බව ඔවුහු පැවැසූහ. ස්වර්ණ රජතුමා ඔවුන් කී බස පිළිගෙන ගෞරවාන්විතව සුදුසු පරිදි ගරු සත්කාර කළේ ය.

ප්‍රෙස්ටර් ජෝන් ස්වර්ණ රජතුමා වෙත එවූ චරපුරුෂ හෙංචයියන් සත්දෙනා කිසිදු වෙනසක් නොපෙන්වා පුරා දෙවසරක් මුළුල්ලේ රාජ්‍ය සේවයෙහි යෙදුණහ. ඔවුන් රජුට දැක්වූ ළෙන්ගතු ස්වභාවය හේතුකොට රජතුමා ද ඔවුනට සැලකුවේ තම පුතුන් සත්දෙනෙකු ලෙස දයාවෙනි. රජු ඔවුන් සත්දෙනා සමග දඩකෙළි සඳහා පිටත්ව ගියේ ද වෙනත් ආරක්ෂකයන් කිසිවකුත් නොමැතිව ය. දිනක් මෙසේ හෙංචයියන් සත්දෙනා සමග වනගත දඩකෙළි සවාරියක් සඳහා පිටත්ව ගිය ස්වර්ණ රජතුමා අල්ලා ගැනීමට මාන බැලීමට සුදුසු අවස්ථාවක් උදා විය. ගංගාවෙන් එතෙර වී සැතපුමක් පමණ දුර වන මැදට ගමන් කළ රජතුමාගේ ආරක්ෂාව සඳහා වෙනත් කිසිවකුත් නොමැති බව ඔවුනට පෙනිණ. රජු සමග තවත් පිරිසක් පැමිණ සිටියද ඔවුන් ගඟෙහි අනෙක් ඉවුරෙන් ඔබ්බෙහි වූ බැවින් චරපුරුෂයන් සත්දෙනා සුදුසු අවස්ථාව බලා රජු අල්ලා ගත්හ. කඩු අමෝරාගත් ඔව්හු තම බසට කීකරු වී ප්‍රෙස්ටර් ජෝන් වෙත යෑමට අවනත නොවුවහොත් ස්වර්ණ රජතුමා මරා දමන බවට තර්ජනය කළහ. මේ කතාව ඇසූ ස්වර්ණ රජතුමා අන්මන්ද විය.

Scanned by CamScanner

"මගේ තරුණ මිතුරනි! ඇයි මෙහෙම කරන්නේ. ඔබ මා රැගෙන යන්නේ කොතැනටද?" යනුවෙන් ප්‍රශ්න කළේ විමතියෙනි.

"අපේ ප්‍රෙසටර් ජෝන් රජු වෙත ඔබ රැගෙන යනවා" ඔව්හු පිළිතුරු දුන්හ.

"මා ඔබට කොපමණ හොඳින් සැලකුවාද, විශ්වාස කළා ද? මිත්‍රත්වයෙන් යුතුව මගේ රැකවරණයෙහි ඔබ කොපමණ හොඳින් කල් ගත කළා ද? ඇයි මෙහෙම මිත්‍රද්‍රෝහී ක්‍රියාවක් කරන්නේ" රජු ප්‍රශ්න කෙළේ ය.

"මෙය අපරාධයක්, බරපතල වරදක්" රජු ඔවුනට වැඩි දුරටත් කියා සිටියේ ය.

එහෙත් එබසට සවන් නොදුන් චරපුරුෂයෝ ස්වර්ණ රජතුමා ප්‍රෙස්ටර් ජෝන් වෙත ගෙන ගියහ. ප්‍රෙස්ටර් ජෝන් ස්වර්ණ රජු දැක අමන්දානන්දයට පත් විය. එසේම ඔහු ස්වර්ණ රජතුමා පිළිගත්තේ ද අවඥා සහගතව ය. අනතුරුව තම ගවයන් බැටලුවන් ආදි සිවුපා සතුන් රැකබලා ගැනීම සඳහා ස්වර්ණ රජු යොදවන ලෙස ප්‍රෙස්ටර් ජෝන් රාජ පුරුෂයන්ට අණ කෙළේ ය. මෙසේ ගවපල්ලකු ලෙස යෙදවූයේ රජුට අවමාන අපහාස කිරීමේ චේතනාවෙනි. පුරා වසර දෙකක් මුළුල්ලේ ස්වර්ණ රජතුමා මහත් දුකසේ එඬේරකු ලෙස ප්‍රෙස්ටර් ජෝන්ගේ සිවුපා සතුන් රැක බලාගති. දැඩි රැකවරණ යටතේ මහත් දුක් පීඩා විඳ ඔහු එඬේරකු සේ කටයුතු කෙළේ ය. ඔහු පැන යෑමට මාන බැලුවේ නැත.

වසර දෙකකට පසු ප්‍රෙස්ටර් ජෝන් මේ ගවපල්ලා තමන් වෙතට කැඳවූයේ ය. ඉතා අලංකාර වස්ත්‍රාභරණයෙන් සරසා මහත් සේ ගරු සත්කාර කොට ප්‍රෙස්ටර් ජෝන්

"උතුමාණෙනි! ඔබ මට එරෙහිව යුද්ධ නොකරන පුද්ගලයකු බව පැහැදිලි ය. එය එසේමැයි නේද?" යනුවෙන් ප්‍රශ්න කෙළේ ය.

"එසේ ය! කිසිවිටෙකත් එවැන්නක් නොසිදුවන්නේ ය. ඔබට එරෙහිව යුද්ධ කළ හැකි කිසිවෙකුත් මෙහි නොමැත. මින්පසු ගෞරවාන්විත ලෙස ඔබට සේවය කරමි" රජතුමා කීවේ අවංක ස්වරයෙනි. ඉන්පසු ප්‍රෙස්ටර් ජෝන් ස්වර්ණ රජුට අශ්වයකු සහ අශ්ව සන්නාහයක් ද ලබා දුන්නේ ය. එසේ ම අලංකාර පිරිවර සේනාවක් ද සපයා දී ප්‍රෙස්ටර් ජෝන් සමුගත්තේ මිත්‍රත්වය පළ කරමිනි. එදා සිට ඔව්හු ගජ මිතුරෝ වූහ.

Scanned by CamScanner

දැන් ඊළඟට නැවතත් අපගේ සංචාරය දෙසට හැරෙමු.

මේ බළකොටුවෙන් නික්ම බටහිර දෙසට සැතපුම් විස්සක් දුර ගමන් කළ විට හමුවන්නේ කරා - මොරාන් නදියයි. එය විශාල නදියක් බැවින් එතෙර විය යුත්තේ පාලමකිනි. ගැඹුරින් ද පළලින් ද මේ ගංගාව සුවිසල් ය. සමුද්‍රරට ගලා බසින මෙකී ගංගා ඉවුරේ බොහෝ නගර සහ පුරවර පිහිටා තිබේ. මේ ගංගාව අසල දේශ සීමාවෙහි ඉඟුරු බහුලව වගා කැරේ. සේද පට රෙදි ද විශාල වශයෙන් නිෂ්පාදනය සිදුවේ. එසේ ම එහි වගා කැරෙන උක්ගස් වට ප්‍රමාණයෙන් අඩි එකහමාරක් තරම් ය. මෙයින් විවිධාකාර ප්‍රයෝජන ලබා ගැනෙයි. ඉතා දර්ශනීය පක්ෂීහු මෙහි වාසය කරති.

දින දෙකක් ගමන් කිරීමෙන් පසු මේ නදියෙන් බටහිර දිශාවෙහි පිහිටි හෝ - චුංග් - පු නමැති නගරයට පිවිසුණෙමි. එහි ජනයා කැතේ දේශයෙහි මිනිසුන්ට සමාන ය. පිළිම වන්දනා කරති. එහි වෙළෙඳ හා කර්මාන්ත මධ්‍යස්ථානයක් තිබේ. එහි ස්වර්ණමය රෙදි පිළි නිෂ්පාදනය කැරේ. රන් නූලෙන් හැඩ වැඩ දැමූ වස්ත්‍ර ද වෙනත් නොයෙක් රෙදි පිළි ද නිපදවනු ලැබේ.

හෝ - චැංග් - ෆූ පසු කොට බටහිර දිසාවට සැතපුම් අටක් දුර ගමන් කළ විට මග දෙපස දක්නට ලැබුණේ ජනාකීර්ණ නගර හා වෙළෙඳහල් ය. වගා කළ විශාල වතු යායවල් හාත්පස දිස් විය. වාණිජ නගර හා කර්මාන්ත පුරවරයන් ද එහි තිබිණ. පට පණුවන් බෝ කිරීමට යෝග්‍ය මල්බෙරි වගාවන් ද සරුසාරව පැවතිණ. මෙහි වැසියෝ පිළිම වන්දනා කරති. තුර්කි නෙස්ටෝරියන්වරු ද (සරසින්), මුස්ලිම්වරු සුළු පිරිසක් ද එහි වාසය කරන්නාහ. වන සත්ත්වයන් බහුල බැවින් දඩයමට කදිම ප්‍රදේශයකි. විවිධ වර්ගයේ පක්ෂීන් හා සිවුපාවන් බහුලව දක්නට ලැබේ. මග දෙපස විසිතුරු නරඹමින් අට දිනක් මුළුල්ලේ ගමන් කොට සින් - ග්න් - ෆු නමැති පුරවරයට පිවිසුණෙමු. අතිපුරාණයෙහි පටන් මෙය අගනුවරකි. ඉතා ධාර්මික බලවත් ඉසුරුමත් රජවරු මෙහි වුසූහ. දැන් මෙහි අධිපතියා මහා ඛාන්වරයාගේ පුත්‍රයා වූ "මංගලායි" ය. පියරජු ඔහු කිරුළ පළඳවා මෙහි අධිපතියා ලෙස සිංහාසනාරූඪ කෙළේ ය. මෙය විවිධාකාර භාණ්ඩ නිපදවන ප්‍රදේශයකි. රන් නූල්වලින් වියන අලංකාර සිනිඳු රෙදිපිළි මෙහි නිපදවේ. සේද නිෂ්පාදනය ද සේද

Scanned by CamScanner

නූල් ද නිපදවන අතර යුද්ධායුධ හා යුද හමුදාවට අවශ්‍ය සියලු භාණ්ඩ ද මෙහි දී තනනු ලැබේ. ආහාර පිණිස ගන්නා කුළුබඩු ධාන්‍ය හා අනෙක් ද්‍රව්‍ය අඩු මිලට මෙහි දී ගත හැකි වේ.

නගරයේ සිට සැතපුම් පහක් දුරින් සුන්දර නිම්න භූමියෙක මංගලායි රජුගේ පියකරු මාලිගාව ඉදිකැර ඇත. එහි ජල යන්ත්‍ර ද, වතුර මල් ද, කුඩා දිය ඇලි ද මාලිගය තුළ මෙන් ම පිටත ද ඇත. විශාල ප්‍රාකාරයකින් වට කළ සැතපුම් පහක පමණ උයනක් ද ඒ අසල වෙයි. විශාල කඳවුරක් ද එහි තිබේ. විවිධ වර්ණවලට අයත් පක්ෂීන් ද, සිවුපාවන් ද සහිත සත්වෝද්‍යානයක්ද එහි පිහිටුවා තිබේ. රාජ මාලිගය පිහිටුවා ඇත්තේ මේ වනෝද්‍යානය තුළ ය. මේ මාලිගය තුළ විශාල කාමර රාශියකි. ලාකඩවලින් කළ කැටයම් හා බිතුසිතුවම් ද අලංකාර ලෙස නිර්මාණය කැර ඇත්තේ ය. කිරිගරුඬ හා වෙනත් විසිතුරු පාෂාණයෙන් කැරුණු විචිත්‍ර නිර්මාණ ද දැකිය හැකි ය. මංගලායි රජතුමා ද සිය පියා අනුගමනය කරමින් යුක්තිගරුකව ද, නීතිගරුකව ද ධාර්මික පාලනයක් ගෙන යන්නේ ය. ජනතාවගේ අභිවෘද්ධිය ශුභ සිද්ධිය උදෙසා කටයුතු කරන බැවින් පොදු ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වී සිටී.

මංගලායි රජුගේ මාලිගයේ සිට දකුණු දෙසට දින තුනක් මුළුල්ලේ ගමන් ගත් අපට මග දිගටම දක්නට ලැබුණේ සුන්දර නගර හා බලකොටු ය. මෙහි ජනතාව ද වෙළඳාමෙහි ද, කර්මාන්තයන්හි ද යෙදී සිටිති. මෙහි බහුල වශයෙන් සේද රෙදි නිෂ්පාදනය කැරේ. එතැන් සිට අප ගමන් ගත්තේ උස් කඳු, ගිරි ශිඛර, මිටියාවත් හා නිම්න භූමි ඔස්සේ ය. ඒ චූකලී හැං චුන් ප්‍රදේශයයි. මෙහි ජනාවාස සහ නගර පිහිටියේ ය. ජනයා බහුල වශයෙන් ගොවිතැන් කරති. සතුන් දඩයම් කිරීමෙහි ද යෙදෙති. පිළිම වන්දනා කරන්නා වූ ආගම අදහති. ඝන වනාන්තරයෙන් ගැවසී ගත් බැවින් වන සතුන් බහුල ය. සිංහයන්, වග වලසුන්, දිවියන්, මුවන්, ගෝනුන් ආදී සිවුපාවන් බහුල බව කිව යුතු ය. පුරා දින විස්සක් මේ ප්‍රදේශ ඔස්සේ ගමන් කිරීමට සිදුවිණ. කඳු හෙල් නිම්න භූමි පසුකැර යා යුතු වේ. අතර මග නොයෙක් ස්ථානයන්හි තානායම් ද, නගර ද, කඩවීදි ද ඇති බැවින් මගියන් හට රිසි පරිදි විවේක ගෙන සුවසේ යා හැකි ය.

දින විස්සක් බටහිර දිසාවට ගමන් කළ විට අක් - බාලික් මන්සි

Scanned by CamScanner

නමැති ප්‍රදේශය හමුවේ. එය සහමුලින්ම තැනිතලාවකි. මෙහි ජනගහනය අධික ය. ගෘහ කර්මාන්ත සහ වෙළඳාමෙන් වැසියෝ ජීවිකාව කරන්නාහ. ප්‍රධාන වගාවක් ලෙස දක්නට ලැබුණේ ඉඟුරු ය. කැතේ රාජ්‍යයේ සෑම පළාතකට ම වෙළෙඳ භාණ්ඩයක් ලෙස මෙහි වගා කැරෙන ඉඟුරු යවනු ලැබේ. එය අධික ලාභයක් සහිත වෙළඳාමකි. තිරිඟු, යව, වී සහ අනෙක් ධාන්‍ය වර්ග ද සුලභ ය. සහල් සහ අනෙකුත් ධාන්‍ය වර්ග පහසු මිලට ලබා ගැනීමට පුළුවන. මුළු මහත් තැනිතලා භූමි ප්‍රදේශය වගාවන්ගෙන් ගැවසී පවතී. මෙහි අගනුවර, අක් - බාලික් මන්සි නමින් හැඳින්වේ. මන්සි දේශ සීමාවේ පිහිටි 'සුදු පුරවරය' ලෙස 'ධවල නගරය' ලෙස ද ප්‍රකට ය. සරුසාර කෙත්වතු නගර හා ගම්මාන පසු කරමින් දෙදිනක් ඉදිරියට ගමන් කෙළෙමු. එහි දී කඳුකර ප්‍රදේශයක් පසු කිරීමට සිදුවිය. කඳුවැටි, ගිරි ශිඛර, මිටියාවත් ඔස්සේ ගමන් කර විසි දිනකට පසු ළඟාවූයේ පිළිම වන්දනා කරන්නා වූ බෞද්ධාගමිකයන් පදිංචි පෙදෙසකටයි. එහි දී දඩමස් ආදි ආහාරවලින් දවස් ගත කැරිණි. අප්‍රමාණ වන සිවුපාවන් ද, කස්තුරි මුවෝ ද මේ ප්‍රදේශයේ ගැවසෙති.

චෙන් - ටු - ෆු නගරයට ළඟා වීමට දින විස්සක් ගෙවුණි. අතීතයේ එය ප්‍රබල අලංකාර පුරවරයකි. මේ නගරය සැතපුම් විස්සක භූමි ප්‍රමාණය වසා ඉදිවී තිබේ. ඉහත දී මේ පුරයේ රජ කළ රජතුමාට පුතුන් තිදෙනෙකු සිටි අතර ඔවුන් තිදෙනම තමා ඇවෑමෙන් රාජ්‍යය පාලනය කළ යුතු යයි කියා සිටියේ ය. එහෙයින් රාජ්‍යය තුනට බෙදා ඔවුන් තිදෙනාට පවරා දුනි. ප්‍රාකාර තුනකින් රාජ්‍යය තුනට බෙදා තවත් මහා ප්‍රාකාරයකින් මේ රාජ්‍ය තුනම වට කරන ලදී. මේ රජවරුන් තිදෙන ස්වකීය රාජ්‍යයේ ඒ ඒ කොටස මනා ලෙස පාලනය කළහ. ඔවුන් සතු රාජ්‍ය අති විශාල ය. සෞභාග්‍ය සම්පන්න ය. එහෙත් පසුව කුබ්ලායි ඛාන් අධිරාජයා මේ රජවරුන් තිදෙනා වනසා යථෝක්ත රාජ්‍යය අත්පත් කැරගති.

මේ නගරය ඔස්සේ විශාල් ගංගා කිහිපයක් ගලා බසී. දුර බැහැර කඳුකරයේ සිට මේ ගංගා ගලන්නේ ය. ඇතැම් ගංගා පුරවර පැදකුණු කරමින් ඒ මේ අතට හැරෙමින් ගලයි. මත්ස්‍ය සම්පත බහුල ය. ගංගාවන් සැතපුම් බාගයක් තරම් පළල ය. සමහර ගංගා යාර දෙසියයක් හාරසියයක් තරම් පළල ය. අතිශයින්

Scanned by CamScanner

ගැඹුරු ය. මෙහි ඇති විශාලතම ගංගාව කියැංග් සුයි නම් වේ. මෙ ගංගාව ඔස්සේ ගමන් කිරීමට දින අසූවක් හෝ සියයක් වැය කිරීමට සිදුවේ. මේ ගංගාව ගලා බසින්නේ මහා සාගරයට ය. ඒ පිළිබඳ තවත් විස්තර පසුව පවසමි. ඉහත සඳහන් කළ ගංගා හරහා ඉතා ලක්ෂණ ශක්තිමත් ශිලාමය පාලම් තනා තිබේ. එහි දෙපස කිරිගරුඬ ස්ථම්භ පිහටුවා ඇති අතර දර්ශනීය කැටයම් සහිත ය. සෑම පාලමක් ම ආවරණය වන අයුරින් දැවමුවා වහලයක් සවිකැර තිබේ. මේ වහලයේ ඇතුළත විවිධ කැටයම් සහ සිතුවම් සහිත ය. පාලම දෙපස තැනූ වේදිකාවෙහි අලංකාර සල්පිල් ය. වෙළෙන්දෝ එහි දෙපස හිඳ විවිධාකාර භාණ්ඩ අලෙවි කරත්.

මේ කුඩා වෙළඳ කුටි සංවිධානය කර ඇත්තේ සිත්ගන්නා සුලු ආකාරයෙනි. පාලම කෙළවර බදු අය කරන කර්යාලය පිහිටුවා තිබේ. මෙහි වෙළෙඳුන්ගෙනන් බද්දක් ද පාලමෙන් එගොඩ මෙගොඩ යන අයගෙන් කඩවත් බද්දක් ද අය කැරේ. රන් දහසක් පමණ බද්දක් එකතු වේ. උදාසන සිට රාත්‍රිය දක්වා වෙළහෙළඳාම් සිදුවන්නේ ය. මේ ප්‍රදේශවාසීහු බුද්ධාගම අදහති. චෙංග් - ටු - ෆු වෙතින් පිටත්ව දින පහක් ගමන් කෙළේ තැනිතලාවක් හා නිම්න භූමියක් ඔස්සේ ය. අතරමග විශාල අලංකාර නිවාස ද, ගම්මාන ද දක්නට ලැබිණ. මෙහි සිංහයන් වග වලසුන් හා වෙනත් සිවුපාවන් ගැවසේ. පේෂ කර්මය ද දැල්රෙදි විවීම ද කර්මාන්තයක් වශයෙන් මේ පෙදෙසේ පැවැත්වේ.

අනතුරුව පිවිසුනේ ටිබැට් දේශයට ය. මොංගුඛාන් ගේ ආක්‍රමණයෙන් පසු සමස්ත ප්‍රදේශය ම පාළු වී ගොසිනි. ජනශූන්‍ය ය. දින විස්සක ගමනේ දී නිවාස කඳවුරු බලකොටු ආදිය විනාශ වී ගොස් තිබෙන ආකාරය දක්නට ලැබුණි. ජනශූන්‍ය වීම නිසා වන සිවුපාවෝ විශාල ලෙස බෝ වූහ. එහෙයින් මේ ප්‍රදේශය හරහා ගමන් ගන්නා මගීන්ටත් වෙළෙඳුන්ටත් මහත් අතවර පැමිණේ. රාත්‍රි කාලයේ ඔවුන් ගත කරන්නේ කිනම් මොහොතක හෝ සිංහයන් ව්‍යාඝ්‍රයන් ආදී සතුන්ට බිලිවේදැයි භීතියෙනි. මේ ප්‍රදේශයේ ගමන් ගන්නා ජනයා තමනට අවශ්‍ය ආහාර පාන සියල්ල රැගෙන යා යුතු වේ. ස්වකීය බඩු බාහිරාදිය ආරක්ෂා කැර ගැන්ම සඳහා මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවේ. කිනම් මොහොතක වුව ද තම බූරුවන් හා අශ්වයන් වන මෘගයන්ගේ ග්‍රහණයට ලක් විය

Scanned by CamScanner

හැකි බැවිනි. මෙහි·ගංගා අසබඩ විශාල උණපඳුරු වැවේ. උණ ගසක වට ප්‍රමාණය තුන් වියතක් පමණ ය. බඹ දහයකට වඩා දිග ය. සමහර උණගස් කොළ පැහැති ය. සංචාරකයන් මෙවැනි උණගස් කිහිපයක් කපා එක් මිටියකට බඳිති. සැන්දෑ ජාමයේ තම නවාතැන් පළ ඉදිරිපිට තබා මෙකී උණ මිටිවලට ගිනි තබති. ගිනි ඇවිළෙන්නේ මහත් ශබ්දයක් නගමින් උණගස් පිපිරෙමිනි. මේ පිපිරුම් හඬ වෙඩි හඬක් ලෙස සැතපුම් දෙකක් තරම් ඈතට විහිදී යයි. ඒ හඬට බියවී සිංහ, කොටි, වලස් ආදි සිවුපාවෝ බියෙන් පළා යති. වෙළෙන්දෝ මේ ප්‍රදේශ හරහා තවලම් රැගෙන යන අශ්වයන්ගේ පාද ලෝහ දම්වැල් දමා බඳිති. අශ්වයන්ගේ හා බූරුවන්ගේ පාද මෙසේ ලෝහ දම්වැල් දමා බඳින්නේ වග වලසුන් ආදි රුදුරු සිවුපාවන්ගේ හඬින් බියපත් වී මේ සතුන් හිස් ලූ ලූ අත දුවන බැවිනි. මෙසේ මහත් කරදරවලට පත් වූ වෙළෙඳුන් සහ මගියන් අපමණ ය. මෙවැනි අතුරු අනතුරු සහිත මාර්ගයේ ගමන් ගන්නා විසි දිනක කාලය තුළ කිසිත් තැනක භෝජන ශාලා හෝ තානායම් නැත. දින හතරක් පහක් ගමන් කළ පසු නැවත ආහාර පාන හා වෙනත් අඩුම කුඩුම සපයා ගත යුතු වේ. කඳු මුදුන්වලදී බලකොටු ද කඳවුරු ද වෙනත් ගොඩනැගිලි ද සහිත පාලු ප්‍රදේශ හමුවේ. එහෙත් එහි ජනාවාස නැත. තවත් සෑහෙන දුරක් ඉදිරියට ගමන් කළ විට සුලු ජනගහනයක් සහිත ප්‍රදේශ හමුවේ. ඒ ප්‍රදේශයන්ගෙන් වන මෘගයන් ගෙන් බිහිසුණු අනතුරු සිදු නොවන්නේ ය.

මේ ප්‍රදේශ වාසීහු පිළිම අදහන්නෝ වෙති. එහෙත් ඔවුන් අතර අසාමාන්‍ය විවාහ චාරිත්‍රයන් පවතී. තිසි වයසට පත් තරුණ තරුණියෝ විවාහ වීමට අකැමැත්තක් දක්වති. තරුණියකව සිටින තුරු මෙහි ලලනාවන් විවාහ වන්නේ නැත. මෙහි පිරිමින් සරණ පාවා ගන්නේ කලින් පිරිමියකු සමග හෝ පිරිමින් කිහිප දෙනෙකු සමග සංවාසයේ යෙදුණු ස්ත්‍රීන් ය. කන්‍යාවක ලෙස සිටින තුරු ඒ යුවතිය සමග විවාහ වීමට කැමැති නොවේ. කිහිප වතාවක් සම්භෝගයෙහි යෙදුණු ස්ත්‍රියක සමග විවාහ වීම දෙවියන්ගේ සන්තුෂ්ටියට හේතුවන්නේ යයි ඔව්හු විශ්වාස කරන්නාහ.

පිරිමින් කිහිප දෙනෙකු සමග ඇසුරේ නොයෙදුණු ස්ත්‍රිය අවලංගු කාසියක් ලෙසින් සැලැකේ. පිට පළාත්වල සිට පැමිණ ඒ ප්‍රදේශයේ කුඩාරම් ගසා ගෙන තාවකාලිකව ලැගුම් ගන්නා වෙළඳ

ජනයාට තරුණ දූවරුන් පවරා දෙනු ලබන්නේ මවුවරුන් විසිනි. වෙළෙන්දෝ තමන් කැමැති ස්ත්‍රීන් තෝරා ගනිති. එසේ තෝරා නොගත් තරුණියෝ දුක්මුසුව කණස්සල්ලෙන් ආපසු යති. වෙළෙඳුන් කුඩාරම් ගසාගෙන සිටින තුරු මේ යුවතියන් සමග සතුටු වෙති. එහෙත් ඔවුන් ආපසු යන විට මෙම ස්ත්‍රීන් ද කැටුව යන්නේ නැත. ඔව්හු තම ඇසුරේ වුසූ කාන්තාවනට ඇඳුම් පැළඳුම් කතකර ආභරණ හා විසිතුරු භාණ්ඩ තුටු පඬුරු වශයෙන් දෙති. ඔවුනට වුවමනා වන්නේ මේ අයුරින් තෑගි බෝග හැකිතාක් ලබා ගැනීමයි. මෙසේ තෑගි බෝග ලබා ගෙන නිවස කරා ගිය පසුව ඇයට මංගල යෝජනා ඉදිරිපත් වේ. ආගන්තුකයන් සමග මේ අයුරින් තෑගි බෝග ලැබෙන්නේ දෙවියන්ගේ ආශිර්වාදය හේතුකොට ගෙන යයි ඔවුහු විශ්වාස කරති.

මේ අයුරින් ලැබෙන තෑගි බෝග, ඇඳුම් පැළඳුම්, ආභරණ සහිත ස්ත්‍රියක සමග සරණ බැඳීමට මෙහි තරුණයෝ කැමති වෙති. ඒ අනුව ඇයගේ වත් පොහොසත්කම තීන්දු කැරේ. මනමාලයෝ බහුල වශයෙන් ඇය පතා පැමිණෙති. විවාහ මංගල උත්සව අවස්ථාවෙහි දී ආගන්තුකයන්ගෙන ලැබුණු තුටු පඬුරු ආභරණ ආදිය නෑදැයනට දැක ගැනීම සඳහා ප්‍රදර්ශනයට තබයි. තෑගි තුටු පඬුරු රාශියක් හිමි කාන්තාව භාග්‍යවන්තියක සේ සලකන බැවින් බොහෝ පිරිමි ඇය කෙරෙහි ආසක්ත වන්නාහ. එබඳු ස්ත්‍රියක සමග යුග දිවියට එළැඹීමෙන් වාසනාව උදාවන්නේ යයි ද කියති. විවාහ වීමෙන් පසු ඒ ස්ත්‍රිය සමග කිසිදු ආකාරයක මිත්‍රශීලීභාවයක් පැවැත්වීම සෙසු පිරිමිනට තහනම් ය. මේ තහනම් නීතිය අකුරට ම ක්‍රියාත්මක වේ.

බුද්ධාගම් කාරයන් වුවද මේ රටේ ජනයා කෙරේ විශ්වාසය තැබිය නොහේ. ඔවුන් නපුරු ජන කොට්ඨාසයකි. සොරකම් නොකරන බව කීවත් සාහසික සොරකම්වල යෙදෙති. සතුන්ගේ මස් පක්ෂීන්ගේ මස් හා පලතුරු ඔවුන්ගේ ආහාරයයි.

කස්තුරි මුවන් මේ රටේ බහුල ය. කස්තුරි මුවන් නිසා සමස්ත ප්‍රදේශයේම කස්තුරි සුවඳ පැතිරේ. පුන් පෝ දිනයෙහි මුවන්ගෙන් කස්තුරි වැගිරේ. කස්තුරි මුවාගේ නාභියෙහි ගෙඩියක් ලෙසින් කස්තුරි හටගනී. මේ කස්තුරි කෝෂය මාසයකට වරක් පිපිරී කස්තුරි

Scanned by CamScanner

වැහෙන විට ඒ සුවඳ දසත විහිදේ. ඔව්හු කස්තුරි 'ගුඩ්ඩේරි' යන නමින් හඳුන්වති.

මෙහි ජනයා ඛාන් අධිරාජයගේ මුදල් නෝට්ටු භාවිතා කරන්නේ නැත. කොරල් වර්ගයක් ඒ සඳහා භාවිතා කරති. ඈත ප්‍රදේශවල සිට පැමිණෙන වෙළෙන්දෝ මධ්‍යධරණී වෙරළේ හටගන්නා කොරල් මොවුනට දෙති. භාණ්ඩ හුවමාරුවෙහි දී ය.

මොවුන්ගේ ඇඳුම් සතුන්ගේ සම්වලින් පිළියෙළ කැර ගැනේ. ටිබැට් දේශයටම සීමා වූ භාෂාවක් කතා කරති. පුරාණයේ දී ටිබැටය රාජ්‍ය අටකට බෙදා පලනය කැරිණි. එහි ප්‍රබල රාජ්‍යයක්ව පැවැතිණ. නගර රාශියක් එහි වූයේ ය. ගංගා හා ගිරිශිඛර බහුල මේ පළාතේ ගංගාවන්හි වැල්ලේ රත්රන් කුඩු මිශ්‍ර ය. ටිබැටයේ ගංගා ගලා ගොස් චීනයේ මහා ගංගා සමග එකතුවන ස්ථානයන්හි දෙතෙර රන්කුඩු මිශ්‍ර වැලි කඳු ගැසේ. ඉන්පසු මේ රන්වැලි පෙරා රන්කුඩු වෙන්කැර ගනිති. මෙහි කාන්තාවෝ කොරල් මාල සහ වෙනත් ආභරණ තනා පළඳිති. කොරල් සහ රත්රන් මුදල් වෙනුවට ද භාවිතා කරන්නාහ.

කොරල් සහ රන්මාල ප්‍රතිමා සැරැසීමට ද යොදා ගැනේ. විවිධ අමුද්‍රව්‍ය භාවිත කොට දළ රෙදිපිළි නිපදවති. බොහෝ අගනා ඖෂධ වර්ග මේ ප්‍රදේශයේ ඇත. එහෙත් එබඳු ඖෂධ වර්ග අපගේ යුරෝපයේ රටවලට රැගෙන යන්නේ නැත.

ටිබැට් ජාතිකයෝ දක්ෂ මන්ත්‍රකාරයෝ ය. මන්ත්‍ර ගුරුකම් භාවිත කොට ගෙන මවිතය දනවන කටයුතු කරති. කිසිදා අසන්නට නොලැබුණු දකින්නට නොලැබුණු ඉන්ද්‍රජාල කරති. ඔව්හු චණ්ඩ මාරුත ද, අකුණු ගෙරවිලි විදුලි කෙටීම් ආදිය ඇති කරන්නාහ. තමන් රිසි පරිදි ඒවා නවතාලීමට ද සමත් වෙති. මොව්හු අයහපත් කොඩිවින අණවින හදි හූනියම් කිරීමෙහි දක්ෂයෝ ය.

මේ මිනිසුන් ඇතිදැඩි කරන්නා වූ සුනඛයන් ශරීර ප්‍රමාණයෙන් විශාල ය. ඕනෑම වන සිවුපාවකු, කුළු හරකකු ලහුබැඳ අල්ලා මරා දැමීමට තරම් ශක්තිමත් ය. රුදුරු ය. මෙහි සිටින්නා වූ "බෙයාමිනි" නමැති භයානක කුළු හරකුන් ද මේ සුනඛයෝ ලුහුබැඳ අල්ලා මරා දමත්. යැක් නමැත් ගවයෝ ද මේ පළාගේ බෝවෙති. ඉතා වටිනා කුරුලුගොයන් ද මෙහි ඇති කරනු ලැබේ. වේගයෙන්

Scanned by CamScanner

පියාසර කරන්නා වූ විශාල උකුසු ගණයට අයත් පක්ෂීහු ද ඇති කරති. මෙහි ජනයා යට කී සතුන් සමග දඩකෙළියේ යෙදෙන්නාහ. ඉහත සඳහන් කළ පරිදි මේ පළාත ද කුබ්ලායි ඛාන් අධිරාජයා යටතේ පාලනය වෙයි.

අනතුරුව ගමන් ගත්තේ කයින්දු නමැති පළාතට ය. එය පිහිටියේ කැතේ රාජ්‍යයේ අපරදිගිනි. ඉහත දී මේ පළාතේ පාලනය ගෙන ගියෝ කුමාරවරු ය. පසුව කුබ්ලායි ඛාන් මේ ප්‍රදේශය යටත් කොට පාලනය සඳහා ආණ්ඩුකාරවරුන් පත් කෙළේ ය. ජනයා බෞද්ධාගම අදහති. නගර පුරවර බලකොටු රාශියක් මෙහි දක්නා ලැබේ. ප්‍රධාන නගරය අගනුවර පිහිටා ඇත්තේ එහි ප්‍රවේශය අසලම ය. ඉතා සුදු බබළන මුතු වර්ගයක් මෙහි ඇත්තේ ය. එහෙත් ඒ මුතු වටකුරු නොවේ. මෙකී මුතු වර්ගය ලැබෙනුයේ එහි පිහිටි ලුණු දිය විලකිනි. මුතු හාරන්නේ රජුගේ අවසරය අනුව පමණි. ඉවක් බවක් නොමැතිව මුතු හැරීමෙන් එහි අගය බාල වන නිසා ය. ඒ අසල පිහිටි තවත් කන්දකින් අගනා නිල් මැණික් වර්ගයක් හමුවේ. මැණික් ගැරීමට ද අවසර ගත යුත්තේ රජුගෙනි.

මේ පළාතේ ජනතාව අතර ම්ලේච්ඡ පිළිකුල උපදවන ක්‍රියා කලාපයක් ඇත. එය නින්දා සහගත අශෝභන අසභ්‍ය චාරිත්‍රයක් ලෙස ඔවුහු නොසලකති. විදේශවලින් හෝ වෙනත් පළාත්වලින් පැමිණෙන ආගන්තුකයන්ට තම බිරිඳ දියණිය හෝ සහෝදරිය සමග රිසිසේ ගත කිරීමට ඉඩකඩ ලබා දෙති. ස්වාමියා ආගන්තුකයන් කැටුව ගොස් තම භාර්යාව හෝ දියණිය හෝ සහෝදරිය ඔවුනට භාර දී නිවසින් බැහැර යයි. ආගන්තුකයා නිවසෙහි සිටින බව හැඟවීම සඳහා හිස් වැසුමක් හෝ සාටකයක් දොරකඩ හෝ ජනේලය අසල තබයි. ඒ සංඥාව පවත්නා තාක් ගෘහමූලිකයා ස්වකීය නිවස කරා නොපැමිණේ. ඔවුන් මෙසේ කරන්නේ දෙවියන්ගේ ආශිර්වාදය ලැබෙතැයි විශ්වාසයක් පවත්නා බැවිනි. මේ දේවාශිර්වාදය හේතුකොට ගෙන බවබෝග සම්පත් වර්ධනය වෙතැයි සලකති.

වෙළෙඳාම සහ වෙනත් ගනුදෙනු සඳහා මෙහි ජනයා භාවිතා කරන්නේ රන් කැබැලි ය. රත්රන් කුඩු උණුකර රන් කූරු සාදා ඒවා එක් එක් ප්‍රමාණයේ කැබැලිවලට කපා මුදල් වශයෙන් භාවිතා කැරේ. රන් කැබැලිවල බර අනුවය එහි වටිනාකම නිශ්චය

කැරෙනුයේ. ඒ හැරුණු විට මේ රටේ ඇති ලුණු දිය උල්පත්වලින් ගලා එන ලුණු වතුර ගෙන තැටිවල දමා උණුකර වියළති. එවිට ලුණු මිදී රොටියක් මෙන් සෑදේ. මෙසේ පදම් කරගත් ලුණු රොටි කැබැලිවලට කපා පැන්ස දෙකේ වටිනාකමට කාසි මෙන් හුවමාරුව සඳහා යොදා ගැනේ. වියළා ගත් ලුණු කැබැලි ගඩොළු පුළුස්සන්නා සේ උදුන්වල පුළුස්සති. මේ ලුණු කැබලිවල එක් පැත්තක් මටසිලිටි ය. එහි අධිරාජයාගේ ලාංඡනය තැබූ විට වලංගු කාසි බවට පත්වේ. මෙකී ලුණු කාසි තැනීම රජයේ නිලධාරීන්ගේ භාරයේ සිදු කැරේ. සෙසු අයට ලුණු කාසි නිෂ්පාදනය තහනම් වේ. වැනිසියේ වටිනාකම අනුව සලකා බලන විට රත්රන් අවුන්සයකින් හයෙන් පංගුවක් ලුණු කැබලි හාරසිය අසූවකට සමාන වේ. ලුණු කාසියක වටිනාකම රත්රන් අවුන්සයකින් හාරසිය අසූවක පංගුවකට සමාන ය. වැනිසියේ තක්සේරුව එයයි. රන් සග්ගි එකකට ලුණු කාසි අසූවක් දීමට මෙහි දී වෙළෙන්දෝ කටයුතු කරති. කඳුකර වැසියනට මුදල් ගණුදෙනු ගැන වැඩි අවබෝධයක් නොමැති බැවින් බැහැරින් පැමිණෙන වෙළෙන්දෝ ඔවුන් රවටති. ලුණු කාසි හතළිහක් පනහක්, හැටක් දී රත්රන් සග්ගියක් ලබා ගැනීම ආදි වංචා කරති. මෙහි කඳුකර ජනයා බැහැර ප්‍රදේශවලට නොයන බැවින් ඔවුන්ගේ රත්රන් කස්තුරි ආදිය වැඩි මිලකට විකුණා ගැනීමට අවස්ථා නොයෙදේ. වෙළෙඳ මධ්‍යස්ථාන ද නොමැති තරම් ය. එහෙයින් වරින් වර පැමිණෙන වෙළෙඳුනට මේ වටිනා බඩු බාහිරාදිය ලාබෙට ලබා ගැනීමට අවස්ථාව සැලැසේ. රත්රන් කුඩු ගංගා ආශ්‍රිත වැලි තලාවෙන් ලබා ගැනීමට හැකි බැවින් අඩු මිලට විකුණුව ද ප්‍රමාණය විශාල බැවින් අධික මුදලක් එක්රැස් කැර ගැන්මට හැකි වේ. වෙළෙන්දෝ ටිබැටයේ නොයෙක් පළාත්වල සංචාරය කරමින් කඳුකර වැසියන්ගෙන් විවිධ භාණ්ඩ අඩු මුදලට රැගෙන යති. ගුද්දෙරි නමින් හඳුන්වන අගනා කස්තුරි මෙහි බහුල ය.

මුතු ලැබෙන විල්වල විවිධ වර්ගයේ මසුන් බෝවේ. එසේ ම මෙහි ජනයාට අත්‍යවශ්‍ය ලුණු ද විල්වලින් ලැබේ. එපමණක් නොව වන සතුන් ද විශාල සංඛ්‍යාවක් සිටිති. කොටි, වග වලසත්, අඳුන් දිවියන්, විවිධ මුව වර්ග හිඟයක් නොමැත. නානාප්‍රකාර පක්ෂී සමූහයන් ද දක්නට හැකි ය. මිදිවලින් මත් පැන් සාදා නොගැනේ.

Scanned by CamScanner

ඒ වෙනුවට බත් හා තිරිඟුවලින් මධ්‍යසාරය පෙරා ගනිති. එයට විවිධ කුළුබඩු වර්ගත් මිශ්‍ර කරන්නාහ. එසේ පෙරාගත් මධ්‍යසාරය රසවත් ය. කරාබු ගස් ද මෙහි බහුලව වැවෙයි. කුළුබඩු වර්ගයක් වන කරාබු නැටි වෙළෙඳාම බහුලව පවතී. මේ ගස කුඩා ය. ශාකපත්‍ර සිහින් ය. දිගටි ය. ඉඟුරු වගාව ද කුරුඳු වගාව ද සරුසාර ය. මෙකී වෙළෙඳ භාණ්ඩ අපගේ රටවලට නොසැපයේ.

කයින්දු නගරයෙන් නික්ම ඉක්බිති දින දහයක් ගමන් කොට ගම් හා නගර පසු කරද්දී වල්සතුන් හා පක්ෂීන් ද දක්නට ලැබිණ. මෙහි සඳහන් කළ පරිදි ම මේ ප්‍රදේශයේ ජනතාවගේ එදිනෙදා දිවි පෙවෙත ගතවේ. දස දින ගමන කෙළවර වද්දී "බ්‍රියස්" ගංගාව අසලට පැමිණියෙමු. කයින්දු ප්‍රදේශය පැදකුණු කරමින් මෙම ගංගාව ගලා බසී. එහි වැලිතලාවන්හි රත්රන් කුඩු බහුල ය. කුරුඳු වගාව ද සරුසාර ය. බ්‍රියස් ගංගාව සාගරයට ගලා බසී.

ගංගාවෙන් එතෙර වූ පසු හමුවන්නේ කර - ජැංග් පළාත ය. අති විශාල භූමි ප්‍රදේශයක් බැවින් කොටස් හතකට බෙදා පාලනය කැරේ. මෙකී භූමි ප්‍රදේශය බටහිර දෙසට විහිදේ. ජනයා බුද්ධාගම් කාරයෝ ය. මෙය ද කුබ්ලායි ඛාන් අධිරාජයාට යටත් ප්‍රදේශයකි. එසෙන් - ටී මුර් නැමති පුත්‍රයා මෙහි පාලකයා වශයෙන් පත්කැර සිටී. ධනවත්, බුද්ධිමත් කුමාරයෙකි. බලසම්පන්න පාලකයකු වන හෙතෙම යුක්ති ගරුක ය. ධර්මිෂ්ට ය.

මෙහි සිට නැවත දින පහක් බටහිර දෙසට ගමන් කෙළෙමු. මෙහි නගර සහ පුරවර රාශියකි. මස් මාළු පලතුරු එළවළු ආදිය ද සෙසු ආහාර පාන ද මේ ප්‍රදේශයේ බහුල ය. එසේ ම අනර්ඝ අශ්වයෝ මෙහි බෝවෙති. මේ ජනයා ඔවුනටම ආවේණික භාෂාවක් කතා කරන අතර එය වටහා ගැනීම දුෂ්කර ය. දින පහක ගමනින් පසු මෙහි අගනුවරට පැමිණියෙමු. එය අතිවිශාල ය. වෙළෙන්දෝ සහ කර්මාන්තකරුවෝ බහුලව වාසය කරති. බෞද්ධයෝ ද, නෙස්ටෝරියන් ක්‍රිස්තු ලබ්ධිකයෝ ද, මහමදිකයෝ ද සිටින්නාහ. තිරිඟු සහ වී බහුලව වගා කැරෙයි. තිරිඟු පිටි පෝෂ්‍යදායක නොවන සේ සලකා බත් ප්‍රධාන ආහාරය ලෙස ගනිති. භූමිය සරුසාර බැවින් ගොවිතැන් ද සශ්‍රීක ය. ධාන්‍ය වර්ග කුළුබඩු සමග මිශ්‍රකර ආහාර පිළියෙළ කැර ගන්නාහ. අවර්ණ සුරා වර්ගයක් ද පානය කරන්නෝ ය. මුහුදෙන් ලබා ගන්නා සුදු පැහැති බෙලිකටු වැනි

Scanned by CamScanner

කටු වර්ගයක් මුදල්, කාසි ලෙස පරිහරණය කැරෙයි. රිදී 'සග්ගියා'ක් බෙලිකටු අසූවක අගයට සමාන වේ. වැනිසියානු (ග්‍රොට්ස්) කොඩි දෙකක වටිනාකමට ද සමාන ය. පිරිසිදු රිදී සග්ගි අටක් පිරිසිදු රන් කැබැල්ලකට ද සමාන ය. මෙහි ලවණ උල්පත්වලින් ලුණු සාදාගනු ලැබේ. ලුණු වෙළෙඳාමෙන් රජයට විශාල ආදායමක් ලැබෙන බව කිව යුතු ය.

පිටස්තර ආගන්තුක පුද්ගලයන් ස්වකීය භාර්යාවන් සමග ඔවුන්ගේ කැමැත්ත අනුව සම්බන්ධකම් පවත්වන්නේ නම් විරුද්ධත්වය නොදක්වති. එය අපකීර්තියක්, බරපතල වරදක් ලෙස නොසැලකේ. මෙහි සැතපුම් සියයක පමණ වට ප්‍රමාණයෙන් යුත් විශාල විලකි. විවිධ වර්ගයේ විශාල මසුන් එහි බෝවේ. අමු කුකුළු මස්, බැටලු මස්, ගව මස්, මීහරක් මස් ආහාරයට ගනිති. මස් වර්ග කුඩා කැබැලිවලට කපා කුළුබඩු වර්ග හා ලුණු මිශ්‍රකර සලාදයක් මෙන් පිළියෙළ කැර අනුභව කරත්. එහෙත් දිළින්දෝ මස් කැබලි සුදුළූනු සමග මිශ්‍රකර ලුණු දියෙහි පොඟවා ගෙන කති.

"යාචි" නමැති ප්‍රදේශයෙන් නික්ම දින දහයක් එක දිගටම බටහිර දෙසට ගමන් කෙළෙමු. යළිත් කරා - ජැංග් නමින් හැඳින්වෙන්නා වූ රාජධානියකට පිවිසුණෙමු. එහි අගනුවර ද කරා - ජැංග් නම් වේ. ජනතාව බුද්ධාගම අදහති. කුබ්ලායි ඛාන්ගේ යටත් වැසියෝ ය. හකාජි නමැති රජකු එහි පාලකයා ය. කුබ්ලායි ඛාන් ගේ පුත්‍රයෙකි. ගංගාවලින් රත්රන් බහුල වශයෙන් ලැබේ. කඳුවල රන් ඉල්ලම් ඇත. ගංගාවල රන්කුඩු බහුල ය. රත්රන් සග්ගි එකක් රිදී සග්ගියෝ හයක වටිනාකමින් යුක්ත ය. "සග්ගියෝ" යනු වැනිසියේ ඉතා අඩු අගයෙන් යුත් කාසියකි. බෙලිකටු ද මුදල් වශයෙන් භාවිතා කැරේ. බෙලිකටු මේ පළාතෙන් නොලැබේ. ඒවා ලබාගන්නේ ඉන්දියාවෙනි. මෙහි පුරුෂයන් දීග නොගිය කන්‍යාවන් පාවාගන්නේ නැත.

මේ රටේ අති විශාල සර්ප වර්ගයක් දක්නට හැකි ය. රියන් දාහතක් හෝ දහ අටක් පමණ දිග වියත් දහයක් පමණ වට ප්‍රමාණ සහිත මේ සතාගේ ගෙළ ආසන්නයේ කුඩා පාද දෙකකි. ඒ පාදවල කොටියාගේ මෙන් රළු නියපොතු තුනක් බැගින් පිහිටියේ ය. මෙයින් එක් පාදයක් කුඩා ය. අනෙක විශාල ය. පැන්ස හතරේ පාන් ගෙඩියක් සේ දෙනෙත විශාල ය. තියුණු ය. දීප්තිමත් ය.

Scanned by CamScanner

මුඛය සහ හනු මිනිසකු ගිල දැමීමට හැකිවන තරමට විශාල ය. එක්වරටම මිනිසකු ගිල දැමිය හැකි ය. දත් විශාල ය. තියුණු ය. කිසිදු මිනිසකු හෝ සතකු මේ අරුම පුදුම සතාට ළං නොවේ. ඒ හැරුණු විට අඩි අටක්, දහයක්, දොළහක් තරම් දිග වෙනත් සර්පයෝ ද සිටිති.

දිවා කාලයේ මේ සර්පයෝ වනයේ ගුහාවලට වැදී සිටිති. අධික තාපයෙන් බේරීම සඳහා ය. රාත්‍රී කාලයේ මේ සත්තු එළිමහනේ ආහාර ගොදුරු සොයා යති. කවර සතකු වුවද ගොදුරට ගන්නා මේ සර්පයෝ සිංහයකු කොටියකු හෝ වෘකයකු වුවද අල්ලාගෙන ගිල දමති. ගොදුරු ගිල දැමීමෙන් පසු විලකට හෝ ගඟකට හෝ ජලාශයකට ඇදෙති. මේ සතුන්ගේ ගමන බර ලී කොටයක් ඇදෙන හඬ වැන්න.

වෘත්තියක් ලෙස මේ සතුන් අල්ලන ජන කොට්ඨාසයක් සිටිති. මේ උරගයන් යන එන හැසිරෙන මං ඉසවු බලා දැනගෙන මං තලාවන්හි තියුණු යකඩ උල් ගැසූ ලී කොටන් වැල්ලෙන් යටකැර තබනු ලැබේ. මේ උරගයන් ඒ බවක් නොදැන තදින් බඩ ගා යන විට බඩවත දරුණු සේ තුවාල වේ. මේ තුවාල කුණුවීමෙන් උරගයන් මැරේ. කපුටන් මළකුණ කෑමට වටවී කෑගසන විට දඩයක්කරුවෝ එතැනට ගොස් උරග උදර පළා 'පිත්තාශය' ගලවා ගැනීම සිරිත ය. මේ පිත්තාශය ඉතා අගනා ඖෂධයක් ලෙස භාවිතයට ගැනෙයි. පිස්සු බල්ලු විෂට මේ පිත්තාශයෙන් ස්වල්පයක් මධ්‍යසාරයහි දිය කර පෙවූ විට රෝගියා සුවපත් වේ. ගර්භනී මාතාවන් ප්‍රසව වේදනාවෙන් පීඩාවට පත්වූ කල්හි මෙකී ඖෂධයෙන් මාත්‍රාවක් දුන් කල්හි සුවසේ දරුවා බිහි වේ. ගෙඩි වණ තුවාල පිළිකා ආදියට ද වෙනත් රෝගාබාධයනට ද මෙය ප්‍රත්‍යක්ෂ ඖෂධයක් ලෙස භාවිතා කැරේ. මෙකී උරගයන්ගේ මස් අධික මිලකට විකිණෙයි. ප්‍රදේශවාසීහු එය ඉතා රසවත් ආහාරයක් බව කියති.

මේ ප්‍රදේශයේ බිහිවන අශ්වයන් ශරීර ප්‍රමාණයෙන් විශාල ය. පැටවුන් ඉන්දියාවට විකුණනු ලැබේ. මේ සිවුපාවුන්ගේ වලග දිග නිසා ද පිට දිගට ගසා ගන්නා බැවින් ද එහි අග පුරුක ඉවත් කැරෙයි. අසරුවා පිටේ නැග යන විට අශ්වයා වලිගය ගැසීමෙන් ඇතිවන අතවරය වැළැක්වීම සඳහා ය. දිග පා වළල්ලක පාද රඳවාගෙන මේ රටේ අශ්වාරෝහකයෝ ගමන් ගනිති. අපගේ

Scanned by CamScanner

ප්‍රංශයේ අශ්වාරෝහකයන් ගමන් කරන ආකාරයෙනි. එහෙත් ටාටර්වරු ද අනෙක් අශ්වාරෝහකයෝ ද ගමන් ගන්නේ කෙටි පා පටියක් සහිත සෑදලයක් භාවිතා කරමිනි. පහසුවෙන් දුන්න භාවිතා කිරීමට එය උපකාරී වේ. ඔවුන් දුන්නෙන් විදින්නේ අසුපිට හිඳ පා පටියට බර දී නැගී සිටිමිනි. මීහරක් සමින් තැනූ සන්නාහයක් පළඳිති. හෙල්ලක් ද පලිසක් ද හරස් දුන්නක් ද මේ අශ්වාරෝහකයෝ රැගෙන යන්නෝ ය. විෂ පෙවූ ඊතල ඔව්හු භාවිතා කරති.

මොවුන් භයානක කුමන්ත්‍රණවල යෙදෙන බව කිවයුතුමැයි. යන එන සියලු තන්හි වස විෂ රැගෙන යන්නේ අපරාධයක් සඳහා අල්ලා ගතහොත් ඒ මොහොතෙහි ම සියදිවි නසා ගැන්මට ය. ශාරීරික වධ වේදනා විඳීමට, දඬුවම් විඳීමට වඩා මරණය යෙහෙකැයි ඔවුන් කල්පනා කරන බැවිනි. අධිරාජයා පළාතේ බලය තමන් නතු කැර ගැනීමට පෙර මෙහි වැසියෝ දරුණු බිහිසුණු ක්‍රියාවන්හි යෙදුණහ. එහෙයින් කිසියම් තැනැත්තකු මාරක විෂක් වසක් ගිල දැමූ විට වහාම වමනය කරවයි. එසේ කළ නොහැකි වුවහොත් අවාසනාවන්ත ලෙස මැරේ. රාත්‍රී කාලයේදී කිසියම් උසස්, උගත්, ගුණවත් උතුම් පුද්ගලයකු ඔවුන්ගේ නිවසෙහි ලැගුම් ගතහොත් ගෙහිමියා ආගන්තුකයා මරා දමයි. ඔහුගේ මුදල් හෝ අන් කිසිවක් පැහැර ගැනීමේ අදහසින් නොවේ. මියගිය පුද්ගලයාගේ උගත් උතුම් ශ්‍රේෂ්ඨ ආත්මය ඒ නිවස අරක්ගන්නා බවට පවත්නා විශ්වාසය නිසා ය. එසේ මළගිය ප්‍රාණකාරයාගේ ආත්මය මේ නිවසෙහි සාමාජිකයන්ට බුද්ධිය ද, සෞභාග්‍යය ද, වාසනාව ද උදාවෙතැයි විශ්වාස කරති. වෙළෙඳ ව්‍යාපාර එමගින් දියුණු වන බව ද ගෘහමූලිකයාට මළගිය ප්‍රාණකාරයා ආරූඪ වීමෙන් වාසනාව උදාවෙතැයි අදහති. මේ අමන දුෂ්ට ක්‍රියාව නිසා බොහෝ වටිනා ජීවිත විනාශ විය. එහෙත් කුබ්ලායි ඛාන් අධිරාජයා මේ රට යටත් කිරීමෙන් පසු මේ දුෂ්ට අපරාධ ක්‍රමයෙන් දුරුවී ගියේ ය. මෙවැනි ක්‍රියා කරන අපරාධකාරයන්ට දරුණු දඬුවම් නියම කරන ලදී.

කාරා - ජැංග් ප්‍රදේශයෙන් පිටත් වී බටහිර දෙසට දින පහක් ගමන් කිරීමෙන් පසු සාර්-දණ්ඩන් නමැති පළාතට පිවිසුණෙමු. එය අධිරාජයාගේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශයකි. මෙහි ප්‍රධාන නගරය "වෝචාන්" නම් වේ. මේ රටේ මුදල් වෙනුවට භාවිතා කරනුයේ රන් කැබැලි ය. එහි බර අනුව මිල නියම කැරේ. බෙලි

Scanned by CamScanner

කවු ද මුදල් වශයෙන් භාවිතා වෙයි. එක් රන් අවුන්සයට රිදී අවුන්ස පහක් මාරු කැර ගැනේ. රත්රන් "සග්ගියෝ" එකක් රිදී "සග්ගියෝ" පහකට සමාන ය. රිදී ඉල්ලම් මේ රටේ නැත ද රත්රන් සුලභ ය. පිටරටවලින් රිදී රැගෙන එන වෙළෙන්දෝ රන් වලට හුවමාරු කිරීමෙන් අධික ලාභ උපයති. මෙහි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම උඩු ඇන්දේ සහ යටි ඇන්දේ දත්වලට රන් කොපු දමාගෙන ඇත. දත්වලට සිරවන සේ දමා ඇති මේ රන්කොපු ගලවා දමන්නේ නැත. පිරිමි අත්වල ද, දෙපාවල ද පච්ච කොටවා ගෙන සිටිති. ඉඳිකටු පහක් එක මිටියකට බැඳ ඒ ඒ ස්ථානවලින් ලේ ගලන තුරු අනිති. ඉන්පසු එසේ ඉඳිකටුවලින් කෙටූ තැන්වල කළු පාට සායමක් තවරනු ලැබේ. ඒ සායම සදහටම පවතී. සේදුවත් ඉවත් නොවේ. ශරීරයේ පච්ච කොටවා ගත් පුද්ගලයා ඒ මගින් අලංකාර වීම පමණක් නොව වැදගතකු ලෙස ද සැලකුම් ලබයි. අශ්වයන් පිට නැගී යෑමට ද දුනු හී පලිහ කඩු ආදිය රැගෙන කටයුතු කිරීමට ද මෙහි පුරුෂයන් දක්වන්නේ ඉමහත් කැමැත්තකි. හමුදා රාජකාරි අගේ කොට සලකන්නාහ. සතුන් ලුහුබැඳ දඩයමේ යෑමට ද කැමැති ය. නිවසේ සියලු කටයුතු ස්ත්‍රී පක්ෂයට පැවරේ. කුලියට ගත් වහලුන් හෝ යුද්ධවලදී අල්ලා ගත් උදවිය මේ ස්ත්‍රීන්ගේ සහායකයන් සේ කටයුතු කරත්.

මෙහි ස්ත්‍රිය බිළිඳකු ප්‍රසූත කළ පසු මව දරුවා සෝදා පිරිසිදු කොට රෙදිවල ඔතා ස්වාමිපුරුෂයාට දෙන්නී ය. ඉන්පසු පුරුෂයා දරුවා යහනෙහි තබා දින හතළිහක් තුරුළු කර ගෙන සිටී. මේ කාලය තළ දරුවා වෙනුවෙන් කළ යුතු සියලු සත්කාර ඇප උපකාර කරනුයේ පිරිමියා ය. මෙම කාලය තුළ දරුවා බැලීමට පැමිණෙන නෑදෑ හිතවතුන් ආසිරි සෙත් පතන්නේ පියාට ය. ස්ත්‍රිය එම කාලය තුළ ගෙදර දොර අනෙක් වැඩකටයුතුවල යෙදෙන්නී ය. දරුවාට කිරි පෙවීමට පමණක් සැමියාගේ පසෙකින් වැතිර ගන්නී ය.

බොහෝ ආහාර මෙහි ජනයා අනුභව කරනුයේ අමුවෙනි. නැතහොත් කලින් කී පරිදි සලාදයක් මෙන් සාදාගෙන කති. බත්වලට කුළුබඩු මිශ්‍රකර පල්වෙන්ට තබා මද්‍යසාර පෙරා ගනිති. එය ඉතා රසවත් බීමකි. මෙහි වැසියනට සිද්ධස්ථාන හෝ වන්දනා කිරීමට ප්‍රතිමා නැත. ඔවුන් ආගම ලෙස සලකන්නේ මුතුන් මිත්තන් හෝ වයසින් වැඩිම පුද්ගලයා ය. පවුලේ සියලු දෙනා ජීවත්වන්නේ

Scanned by CamScanner

මුතුන් මිත්තන් නිසා යයි ඔවුහු විශ්වාස කරති. ලිවීමට කියැවීමට නොදනිති. කිසිත් ශිල්ප ශාස්ත්‍රයක් ගැන හැඟීමක් දැනීමක් නොවේ. මේ මිනිසුන් දෙස බැලූ කල්හි ඔවුන්ගේ තරාතිරම තේරම් ගත හැකි ය. මේ වූ කලී ඝන වනාන්තරයෙන් වැසී ගිය කඳුකර ප්‍රදේශයකි. ග්‍රීෂ්ම ඍතුවේ දී පවා හාත්පස අන්ධකාර ය. දේශගුණය අහිතකර ය. මේ කාලයේ ආගන්තුකයෝ ද වෙළෙන්දෝ ද කඩිනමින් මේ පළාතෙන් බැහැර වෙති.

දෙපිරිසක් අතර වෙළහෙළදාමක් හෝ වෙනත් ණය ගනුදෙනුවක් සිදුවන්නේ ඔවුන්ගේ රැහේ නායකයා මැදිහත් වීමෙනි. ගනුදෙනුවක දී රැහේ ප්‍රධානියා දිග ලී කැබැල්ලක් ගෙන එය සමාන කොටස් දෙකකට කඩයි. එය හතරැස් ලී කැබැල්ලකි. ඒ කැබැලි දෙකේ ණය දුන් ප්‍රමාණයත්, ණය ගත් ප්‍රමාණයත් සඳහන් වන අයුරින් කට්ට දෙකක කපයි. ඒ ලී කැබලි දෙක ණය දුන් පාර්ශ්වයට හා ණය ගත් පාර්ශ්වයට බාර දෙයි. ණය ගෙවා දමන තුරු මේ ලී කැබැලි දෙක දෙපාර්ශවය සුරැකිව තබා ගනී. ණය ගෙවූ පසු ණයකාරයා තමා සන්තකයේ තබූ ලී කැබැල්ල ආපසු බාර දෙයි. එතැනින් ගනුනෙුව කෙළවර වේ. දෙපක්ෂයම සතුටට පත් වේ.

කරා - ජැංග්, චෝවාන් හා යාචි යන ප්‍රදේශවල වෛද්‍යවරුන් නොමැත. යමකු ලෙඩ වූ කල්හි ඖෂධ ප්‍රතිකාර වෙනුවට තොවිල් පවිල් මන්තර ගුරුකම් දේව පූජා ආදියට යොමුවෙති. මේ සඳහා කපුරාල හෝ කට්ටඩියා ගෙන්වා ගැනීම ඔවුන්ගේ පුරුද්ද ය. ලෙඩාගෙන් රෝගය පිළිබඳ තොරතුරු විමසා යකැදුරා හෝ කපුරාල අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි. ඔව්හු බෙර ගසමින් විවිධාකාර යාදිනි කවි ගී ගයමින් නටති. මෙසේ නටන විට ඔවුන් අතුරෙන් එක් කට්ටාඩියකුට භූත ආවේශයක් ඇති වෙයි.

භූතාරූඪ වූ තැනැත්තාගෙන් රෝගය ගැන ද එයට කළ යුතු පිළියම් ගැන ද අසා දැනගනිති. එවිට බෙරවාදනය නවත්වති. භූතයා ආතුරයාට ආවේශ වී කතා කර සියලු තොරතුරු කියයි. භූතයාට සිදුවූ වැරදි ද කියන අතර ඒ සඳහා අවශ්‍ය බලි බිලි ගැන ද සඳහන් කරන්නෝ ය. එවිට කපුවෝ ද කට්ටඩි ද කන්නලවු කියමින් සියලු වරදට සමා වී රෝගියා අත්හැර යන සේ අයැද සිටිති. ශරීරයේ රුධිරයෙන් පූජා පවත්වන බවට ද පොරොන්දු වෙති.

Scanned by CamScanner

අනතුරුව කරනු ලබන පුද පූජා සහිත තොවිලයෙන් ආතුරයා සුවපත් නොවුවහොත් යකැදුරන් කියන්නේ භූතයා තදබල ලෙස වෛරයෙන් සිටින බවකි. බලි බිලි පූජාවෙන් භූතයා සතුටු කිරීමට අපහසු බවයි. නැතහොත් රෝගියා සුවය ලබන බව කියා කාල වර්ණ හිස් සහිත බැටලුවන් සංඛ්‍යාවක් බිලිදිය යුතු යයි නිර්දේශ කරත්. යකැදුරන් සහ ඔවුන්ගේ භාර්යාවන් රැස්වී යථෝක්ත පූජාව පැවැත්වූ පසු යක්ෂයා හෝ භූතයා සතුටට පත්වී ආතුරයා අත්හැර යන බව ප්‍රකාශ කරන්නාහ. මේ බිලිපූජාව සහිත තොවිලය සඳහා ආතුරයාගේ නෑදෑයන් සෑම දෙයක් ම සපයා දෙනු ලබන්නේ හැකිතාක් කඩිනමිනි.

යකැදුරෝ පවුල් පිටින් පැමිණ තොවිලය පටන් ගනිති. බැටලුවන් මරා රුධිරය ගෙන අහස දෙසට විසිකරන්නාහ. අනතුරුව පහන් දල්වා අගිල් ගුගුල් කට්ට කුමංජල් ආදි සුවඳ දුම් දවා රෝගියාගේ නිවස සුවඳවත් කරති. බැටලු මස් තැම්බූ වතුර නිවස පුරා ඉසිති. නිවසේ අහමුලු නැර මේ වතුර ඉසිති. ඔවුන් පෙරා ගත් මද්‍යසාර කුළුබඩු සමග මිශ්‍රකර මහ හඬින් සිනාසෙති. කවි සින්දු ගී යාදිනි කියමින් නටති. දෙවියන් යකුන් භූතයන් සතුටු කිරීම පිණිස විවිධ ඉරියව් දක්වති. අනතුරුව භූතාවේශයයෙන් පසුවන තැනැත්තාගෙන් වැඩි දුරටත් කළ මනා දෑ පිළිබඳව විචාරති. තවත් බිලිපූජා අවශ්‍යදැයි ප්‍රශ්න කරති. දෙවියන් භූතයන් සතුටට පත්වූ බව ආරූඪයෙන් පැවැසේ. අනතුරුව සියලු දෙනා තොවිල් කවි ගී සින්දු කියමින් නටති. ආවේශ වූ තැනැත්තා තොවිලය සාර්ථක වූ බව පැවසූ කල්හි කපුවන් යකැදුරාගේ කට්ටඩින් නැටුම හා කවි කීම නවතා කෑම මේසයට හිඳගෙන මස් වර්ග කමින් මත්පැන් බොති. ස්ත්‍රීන් ද පිරිමින් ද මෙසේ මත් පැනින් ද මස් කෑමෙන් ද සන්තර්පණය වූ පසු නියමිත ගාස්තුව ද රැගෙන ආපසු යෑම සිරිත ය.

රෝගියා සුවපත් වුව හොත් තොවිලය සාර්ථක වූ සේ සලකා. දෙවියන් බිලිපූජාවෙන් සතුටු වන බව අදහති. රෝගියා සුවපත් නොවී මරණයට පත්වුවහොත් සැලකෙන්නේ බිලිපූජාව ඉඳුල් වූ නිසා මේ අවාසනාව සිදුවූ බවකි. දොළ පිදේනි දෙවියන්ට යකුන්ට හෝ භූතයන්ට පිදීමට පෙර ඉඳුල් කිරීම භයානක බව ඔවුන්ගේ පිළිගැනීම ය. එසේ ඉඳුල් කළ හොත් භූතයාගෙන් හෝ යක්ෂයා ගෙන් සමාවක් කරුණාවක් නොලැබන බව කියති. බත්, මස්,

මාළු, පලතුරු, මත්පැන් ආදි සියල්ල නො ඉඳුලෙන් පූජා කළ යුතු වේ. මේ පළාතේ සියලු දෙනා ම මේ ආකාරයෙන් ලෙඩ දුක් වැළඳුණු කල තොවිල් පවිල් බලි බිලි පූජා නොකරති. පොහොසත් ධනවත් අය පමණක් මෙසේ වියදම් කර ශාන්ති කර්ම යාතු කර්ම කරවති. එසේ වුවද පිළිම වන්දනා කරන ආගමේ ජනයා මෙවැනි බිලි පූජා නොකරති. මන්සි හා කැතේ හි සෑම ප්‍රදේශයකම මේ අයුරින් තොවිල් පවිල් සිදුවේ. වෛද්‍යවරුන් දුර්ලභ බැවින් යකැදුරෝ අන්ධ විශ්වාස හා භක්තියෙන් යුතු අනුවණ මිනිසුන් රවටා මුදල් උපයති.

මේ අතර වෝචාංග් හි සිදු වූ සටන ගැන කීමට මට අමතක විය. ඒ සටන ගැන තොරතුරු මේ කෘතියට අගනා ප්‍රයෝජනවත් විස්තරයක සේ හඟිමි. සටනට එළඹුණු දෙපක්ෂය ගැන ද සටන් කළ ආකාරය ද විස්තර කරන්නෙමි.

සටන සිදුවූයේ 1272 දී ය. වොචාන් සහ කරා - ජැංග් යන පළාත් දෙක සතුරු ආක්‍රමණයකින් වළක්වා ලීමේ අරමුණෙන් කුබ්ලායි ඛාන් අධිරාජයා මහා සේනාවක් සංවිධානය කැර එවී ය. ඒ වන විට එසෙන් ටීමූර් හෝ වෙනත් රජ පවුලේ කෙනකු ඒ ප්‍රදේශයේ පාලනයට පත් කැර තිබුණේ නැත. මියෙන් රාජ්‍යයේ සහ බෙංගාලයේ රජු බලවත්ය. ඔහුගේ රාජ්‍යය බලවත් ය. හෙතෙම ධනේශ්වරයෙකි. ටාටර්වරුන් විශාල යුද්ධ සේනාවක් රැගෙන තම පළාතට පැමිණෙන බව දැනගත් වහාම මියෙන්හි රජතුමා එයට මුහුණ දීම සඳහා විශාල සේනාවක් සංවිධානය කෙළේ ය.

චීන අධිරාජයාගේ සේනාවට එක්වරම පහර දී විනාශ කළ හොත් නැවත හෙතෙම තම රාජ්‍යය ආක්‍රමණය නොකරනු ඇතැයි මියෙන් රජුගේ අදහස විය. ඒ අදහස අනුව මියෙන් (බුරුම) රජු ඇතුන් විශාල සංඛ්‍යාවකින් සමන්විත සේනාවක් සංවිධානය කෙළේ ය. අති විශාල යුද බල ඇණියක් ද සංවිධානය කැරිණ. ඇත් හමුදාවේ ඇතුන්ගේ පිට උඩ බලකොටු ද ඉදි කෙළේ ය. මේ බළකොටු හෙවත් යුද් මණ්ඩප ඇතුළත භටයන් දොළසක්, දහසයක් පමණ ප්‍රමාණයකට ඉඩකඩ තිබිණ. ඒ හැරුණු විට විශාල අශ්වාරෝහක හමුදාවක් ද පෙරමුණෙහි ගමන් කිරීමට යෙදවිණ. හස්ති සේනාව ද අශ්ව සේනාව ද පිරිවරා බුරුම රජු සටන් බිමට එළැඹිණි. අධිරාජයාගේ හමුදාව වෝචාංග් පෙදෙසේ රැඳී සිටි බැවින් බුරුම

(මියෙන්) රජු ද සේනා පිරිවරා ඒ අසලට ම ගොස් කඳවුරු බැඳගති. හතළිස් දහසක පමණ සේනාවක් මෙහි වූ බව පැවැසේ.

මියෙන් රජු විශාල සේනාවක් රැගෙන පැමිණෙන බව ටාටර්වරුන්ගේ සෙන්පති වූ නසර් - උද්දීන් හට දැනගන්නට ලැබිණි. හෙතෙම රණශූරයෙකි. එහෙත් ඔහුගේ සේනාව දොළොස් දහසක් පමණ විය. එහෙත් පළපුරුදු දක්ෂ යුද භටයන් ඔහු සතු වූ බැවින් කිසිදු පසුබෑමකින් තොරව වෝචාංග් හි විශාල ගස් කොළන් සහිත තැනිතලාවකට තම සේනා මෙහෙයැවී ය. එසේ කෙළේ හස්ති සේනාව ප්‍රහාරයකට පැමිනුණ හොත් ගස්කොළන්වලට ආවරණය වී අරක්ෂාව සලසා ගත හැකි බැවිනි. පරාජය පෙනුණ හොත් ආරක්ෂා සහිතව පසුබැසීමට හැකි බව ද ඔහුගේ අදහස විය. අනතුරුව සතුරා සටනට පොළඹවා ගැනීමේ අටියෙන් මියෙන් රජුගේ සේනාව දෙසට හී පහර යවන්නට පටන් ගති. ඉක්බිති තම සේනාවේ යුද්ධ මුලාදෑනීන් අමතා වේගවත් කථාවක් පැවැත්වීය. නිර්භීතව සටන් කළ යුතු බව ද ඉහත දී කළ සටන්වලට වඩා දක්ෂ ලෙස සටන් කළ යුතු බව ද චිත්ත ධෛර්‍යයෙන් යුතුව කටයුතු කළ යුතු බව ද සේනාවේ සංඛ්‍යාවට වඩා චිත්ත ධෛර්‍යය හා සංවිධාන ශක්තිය ද මනා හික්මීම ද වැදගත් බව ඔහු කියා සිටියේ ය.

මියෙන් (බුරුම) රජුගේ සේනාව පළපුරුදු නැති බවත් මෙයට පෙර යුද්දයකට එළඹී නොමැති බවත් ඔවුනට තිසි යුද පුහුණුවක් නොමැති බවත් විශාල සේනාවක් වුවද ඔවුන් පරාජය කිරීම පහසු බවත් කී ය. එසේ ම තම සේනාව මෙයට පෙර යුද වැදී ශක්තිය හ ධෛර්‍යය ද රණකාමිත්වය ද ප්‍රදර්ශනය කළ බැවින් මේ සටන විජයග්‍රහණ කරන බව ද කියමින් තම සේනාව ඔද තෙද එඩි ගැන්වී ය. ටාටර්වරුන් සමස්ත ලෝකයේ ම රණ ශූරයන් ය. තම ඇසුණු පමණින් සතුරන් බියවන බව ද කියා සිටියේ ය.

ටාටර්වරුන් තැනිතලාවක පැත්තකට වී සිටින බව ඇසූ මියෙන් රජු වහා සේනාවට අණ දුන්නේ ය. චීන කඳවුරකට සැතපුමක් ළඟා වී ඇත් හමුදාව ඉදිරියෙන් ගමන් ගන්නා අයුරින් ද අශ්වාරෝහක හමුදාව දෙපසින් පාබල සේනාංක දෙකක් ගමන් ගන්නා අයුරින් ද සේනා සංවිධානය කර රජතුමා මේ පිරිස මැද හරියේ රැඳී මෙහෙයුම් කෙළේ ය. සතුරන්ගේ එක් හටයාට තමන්ගේ

Scanned by CamScanner

භටයන් සිවුදෙනා බැගින් සිටිත බැවින් සටන පහසුවෙන් ජයගත හැකි බව කියමින් රජතුමා සිය සේනා දිරි ගැන්වීමෙහි යෙදිණි. අපගේ සේනාව විශාල බැවින් ද බලවත් බැවින් ද මෙතරම් විශාල සේනාවකට මුහුණ පා නොමැති බැවින් ද ජයග්‍රහණය නියත බවත් නිර්භීතව සටන් කරන ලෙසට රජතුමා සිය සේනාවන් ඔද තෙදබල ගැන්වී ය.

සිය ගණන් ඇතුන්ගේ කුංච නාදය දසත පැතිරිණි. ඒ හඬට රණ බෙර හඬ ද, කපව් කොටවු, අනිවු මරව් යන හඬ ද එක පැහැර නැගිණි. රජුගේ සේනාව ළඟාවන තුරු බලා සිටි ටාටර්වරු දැඩි වීර වික්‍රමාන්විත භාවය පෙන්වමින් සටන පටන් ගත්හ. එහෙත් පාවෙන කඳුගැට වැනි ඇතුන් පිට තැනූ යුද මණ්ඩප මත නැගි සෙබලුන්ගේ මෙහෙයුම නිසා ටාටර්වරුන්ගේ අශ්වයෝ කලබල වූහ. බියපත් වූහ. එබැවින් අශ්වරෝහක භටයනට තම අශ්වයන් පාලනය කැරගත හැකිවූයේ නැත. මේ අවස්ථාවේ මියෙන් රජු ජයග්‍රහණයේ පෙරනිමිති දකිමින් සේනාවන් සමග ඉදිරියටම ගමන් ගති. තම අශ්වාරෝහක භටයන් අන්දමන්ද වනු දුටු ටාටර්වරුන්ගේ සෙන්පතියා ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්තව අශ්වාරෝහකයන්ට අසු පිටින් බැස අසුන් ගෙන ගොස් ගස් බඳින ලෙස නියෝග කෙළේ ය. අනතුරුව අශ්වාරෝහකයෝ ඒ නියෝගය පිළිපැද වහා පැමිණ මියෙන් රජුගේ ඇත් සේනාවට ඊතල වලින් විදින්නට වූහ. එයට පිළිතුරු වශයෙන් මියෙන් රජුගේ භටයෝ ද ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට ශර වර්ෂා පතිත කළහ. එහෙත් ඒ ශර වර්ෂා ටාටර්වරුන්ගේ ප්‍රහාර තරම් ප්‍රබල වූයේ නැත. එක දිගටම මියෙන් රජුගේ ඇත් සේනාවට පහර වැදීම නිසා ඇත්තු වේදනාවෙන් හිස් ලූ ලූ අත බියපත්ව දුවන්නට වූහ. ඇතුන් කීකරු කැර ගැන්මට ඇත්ගොව්වන්ට හැකි වූයේ නැත. ඇත්තු කැළේ කඩාගෙන දිවූහ. ගස්වල ද අතුවල ද වැදීම නිසා ඇතුන්ගේ පිට මත ඉදි කැර තිබූ යුද්ධ මණ්ඩප කඩා වැටී භටයෝ තුවාල ලදහ.

සතුරන් පළා යනු දුටු ටාටර් සේනාව නිසි ලෙස සංවිධානය වී අශ්වයන් පිළියෙළ කැර ගෙන ලුහුබැඳ යන්නට වූහ. මෙය අති බිහිසුණු සටනක් විය. මියෙන් රජුගේ සේනා දුර්මුඛ වූ බව පෙනිණ. රජතුමා ඔවුන් අතරට පැමිණ සෙන්පතියන් අමතා කෙසේ හෝ ධෛර්‍ය සම්පන්නව සටන් කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඇත්

සේනා පළාගිය ද සටන ජයගත හැකි බව ද කීවේ සේනාපතියන් දිරිගැන්වීමේ අදහසිනි.

එහෙත් ටාටර්වරුන්ගේ ධනුර්ධරයන්ගේ ශූරත්වය නිසා මියෙන් රජුගේ සේනා බෙහෙවින් පීඩාවට පත්වූහ. මේ යුද හටයන්ට ටාටර්වරුන්ට මෙන් ආරක්ෂක ඇඳුම් පැළඳුම් තිබුණේ නැත. ඒ පිළිබඳ කෝපයෙන් සිටි හටයෝ සටනේ දී දුර්මුඛ වූහ. දෙපක්ෂයෙන් ම එල්ල වූ ශර වර්ෂා අවසානයේ යුද්ධ කරන්නට පටන් ගත්තේ කඩු මුගුරු ආදිය භාවිතා කර ගනිමිනි. මුහුණට මුහුණ ලා කළ මේ සටනේ දී දෙපක්ෂයේ ම හටයෝ විශාල සංඛ්‍යාවක් තුවාල වූහ. අත් පා ආදි අඟ පසඟ කැපී ඇද වැටෙන හටයන්ගේ මර ළතෝනියෙන් සමස්ත ප්‍රදේශයම කම්පා විය. ගලා යන රුධිර ධාරා බිහිසුණු දර්ශනයකි. මෙසේ හඬන වැළපෙන විලාප කියන විපතට පත් සේනා අතරින් ගමන් කරමින් මියෙන් රජු ඔවුන් දිරිමත් කරමින් සටන ජයගත යුතු බව කියා සිටියේ ය. තව තවත් හටයන් රණ පිටියට ළඟා කරමින් සටන පවත්වා ගෙන ගිය ද එය සාර්ථක නොවන බව මියෙන් රජුට පෙනිණ. සතුරන් කඩා වදින බැවින් ඉදිරි ගමන අසාර්ථක බව ද වැටහුණි.

සමස්ත යුද පිටියම මැරී වැටුණු තුවාල වී ඇද වැටුණු හටයන්ගේ හා අශ්වයන්ගේ මළ කඳන් වලින් වැසී ගොස් තිබිණ. පණ බේරාගත් හටයෝ පළායන්නට සූදානම් වූහ. ටාටර් හටයෝ පළා යන හටයන් ලුහුබැඳ තලා පෙළා කොටා මරා දැමූහ. රජතුමා ද ආපසු හැරුණි. ටාටර්වරු ජයග්‍රහණය ලැබූහ. බෙංගාල හා මියෙන් සේනා යුද්ධයෙහි සන්නාහ සන්නද්ධ නොවූ බැවින් ආරක්ෂාව නොමැති වීමෙන් මරණයට පත් වූ බව කිව යුතු ය. ඇත් හමුදාවට ද ආරක්ෂාව නොමැති වීම විනාශයට හේතුවිණ. ඇතුන්ට ආරක්ෂක ඇඳුම් නොතිබීම නිසා පළමු සටන් පෙරමුණ බිඳ වැටුණි.

එසේ ම ටාටර්වරුන් සිය ආරක්ෂාව පතා සටන් භූමිය වශයෙන් යොදාගෙන තිබුණේ ඝන වනාන්තරයකි. යම් හෙයකින් එළිමහන් ප්‍රදේශයක මේ සටන සිදුවූයේ නම් මියෙන් රජුගේ සේනා ජයග්‍රහණය කරා මෙහෙයවන්නට ඉඩ තිබිණි. ඇත් හමුදාව පෙරමුණෙහි යවා දෙපසින් අශ්වාරෝහක හමුදා දෙකක් යැවූයේ නම් ටාටර්වරුන් වටකැර පහර දෙන්නට ඉඩ තිබිණි. ඇත් හමුදාව දරුණු ලෙස වනයට කඩා වැදීම නිසා ටාටර් හමුදාවට තවත්

Scanned by CamScanner

වාසියක් ලැබිණි. ඇතුන් සමග වනයට වැදුණු පිරිස ගස් කොළන් කපා මං ඇහිරීමට උත්සාහ කළ ද එය ද අසාර්ථක ප්‍රයත්නයක් විය. වන වැදී සිටි බොහෝ දෙනෙක් මරුමුවට පත්වූහ. ඇතුන් සමග සිටි දෙසියයක පමණ පිරිසක් සිරකරුවන් වශයෙන් අල්ලා ගන්නා ලදහ.

මේ යුද්ධයේ අත්දැකීම අනුව ටාටර්වරුන්ගේ හමුදාවට ඇත් සේනාවක් ද එකතු කරන ලදී. මේ යුද්ධය දක්වා ටාටර්වරුනට ඇත් හමුදාවක් නොවිණ. යුද්ධයෙන් ජයග්‍රහණය කළ කුබ්ලායි ඛාන් අධිරාජයා මියන් සහ බෙංගාල රජුනට අයත් වූ සියලු ප්‍රදේශ තම යටතට ගත්තේ ය.

සාර්දන්ඩන් ප්‍රදේශයෙන් නික්ම ගමන් ගත්තේ කඳු ගිරි හෙල් නිම්න භූමි ඔස්සේ ය. එය ජනශූන්‍ය පෙදෙසකි. දවස් දෙක හමාරක් තිස්සේ මෙසේ ගමන් කොට පිවිසියේ නිම්න භූමි ප්‍රදේශයකටයි. එහි තුන් දවසක් පුරා පැවැත්වෙන වෙළඳ පළක් ඇත. සතියකට තුන් දිනක් පැවැත්වෙන මේ පොළට නොයෙක් පළාත්වලින් වෙළෙන්දෝ පැමිණෙත්. පොළ පැවැත්වෙන දිනවල දී කඳුකර ප්‍රදේශවාසීන් එහි පැමිණෙනුයේ රත්රන්වලට රිදී හුවමරු කැර ගැන්මට ය. මොවුනට රත්රන් පිටරටවලට විකිණීමට අවසර නැත. එහෙත් රත්රන් වෙළෙඳුන්ට දී ඒ වෙනුවට ඔවුන්ට අවශ්‍ය බඩු බාහිරාදිය ලබා ගැන්මට අවසර ඇත. වෙළෙන්දෝ රත්රන්වල වටිනාකමට සරිලන පරිදි බඩු බාහිරාදිය ගෙනවුත් දෙති. මේ වෙළෙන්දන්ගේ වාසස්ථාන ස්වදේශිකයෝ නොදනිත්. එහෙයින් භාණ්ඩ හුවමාරු කැරෙනුයේ වෙළෙඳපළෙහි දී ය. රත්රන් වෙළෙඳාමෙන් අධික ලාභයක් උපයා ගැනේ.

මෙතැනින් ඔබ්බෙහි දකුණු පාර්ශ්වයේ ඉන්දියාව පිහිටි දෙසින් මියෙන් නගරය වෙයි. මේ මාර්ගය වැටී තිබුණේ ඝන වනාන්තරය මැදිනි. දින පසළොසක ගමනින් පසු එහි ළඟාවීමට හැකි විණ. වනාන්තර පෙදෙසේ අලි ඇතුන් ද කඟවේනුන් ද වෙනත් වනසතුන් ද බහුල ය. ජනයාගෙන් තොර බිම් පෙදෙසක් පසු කරමින් ගමන් කළ පසු මියෙන් නුවරට ළඟා වූයෙමු.

මියෙන් අතිවිශාල අලංකාර පුරවරයකි. අගනුවර ද හැඳින්වෙනුයේ මියෙන් යන නමිනි. බුද්ධාගම අදහන මෙහි ජනතාව

Scanned by CamScanner

ඔවුනටම විශේෂ වූ භාෂාවක් කථා කරති. මෙය කුබ්ලායි ඛාන් අධිරාජයාට යටත් ප්‍රදේශයකි. මියෙන් පුරවරයෙහි පිහිටි විශේෂ සැලකිය යුතු නිර්මාණයක් ගැන ඔබට කියමි.

ඉහත කාලයේ මෙහි පාලනය ගෙන ගියේ බලවත් ධනවත් රජෙකි. මේ රජු මරණාසන්න කාලයෙහි ඔහුගේ මෘත දේහය තැන්පත් කරන ස්ථානයේ දෙපසින් විශාල සොහොන් කොත් දෙකක් කිරිගරුඬ පාෂාණයෙන් නිර්මාණය කරන ලෙස නියෝග කැර තිබිණ. උසින් අඩි හැටක් වන අයුරින් ද, එයට සරිලන මහතින් ද එක් එක් කොණෙහි ස්තම්භ හතරක් බැගින් සිටින අයුරින් ද මෙය ඉදිකරන ලදී. මේ ස්තම්භ මස්තකයෙහි කළසක හැඩය ගත් හිස් හතරක් ද තැනවීමට නියෝග කැර තිබිණ. මෙයින් එක් සොහොන් කොතක් අඟලක් ඝනකම රන් තහඩුවලින් වසන ලදී. අනෙක අඟලක් ඝනකම රිදී තහඩුවලින් ආවරණය කැරිණ. මේ සොහොන් කොත් ඈතට පෙනෙන්නේ රනින් හා රිදියෙන් බබළන ස්තම්භ විලසිනි. රිදියෙන් කළ ස්තම්භය මුදුනේ ජේකඩ වටා රන් හා රිදී සීනු එල්ලා තිබේ. එයින් මිහිරි නාද නිකුත් වේ. මෙය කදිම නිර්මාණයකි. රජුගේ සොහොන් ගැබ ද රනින් හා රිදියෙන් තනා තිබේ. මෙතරම් අනර්ඝ නිර්මාණයක් කිරීමට රජු නියෝග කැර ඇත්තේ තම ගෞරවය හා සිහි මුළා නොවී පැවැත්ම සලකාගෙනයි.

මීළඟට විස්තර කැරෙනුයේ කුබ්ලායි ඛාන් අධිරාජයා මේ නගරය අල්ලා ගැනීමට සැලසුම් කළ ආකාරයයි.

පළමුවෙන් ම කුබ්ලායි ඛාන් අධිරාජයා දක්ෂ බුද්ධිමත් නිලධාරියකු එහි පිටත් කැර යැවී ය. ඔහුට කැමැති පරිදි සේනා රැගෙන යාමට ද අවසර දුනි. ඒ සමඟ නිතර රජවාසල ගැවසෙන මන්ත්‍රකාරයෝ ද ගියහ. නගරය අත් පත් කැර ගැන්මෙන් පසු ඔවුනට ඉහත සඳහන් කරන ලද දර්ශනීය සොහොන් කොත් දක්නට ලැබිණ. ඉක්බිති ඒ පිළිබඳ තොරතුරු අධිරාජයාට දන්වා යවන ලදී. එම සොහොන් කොත් කොපමණ අගනා වුවද කිසිදු අලාභයක් නොකරන ලෙසත් මියගිය රජුගේ සොහොනට අලාභ හානි නින්දා කිරීම බලවත් පාපයක් බවත් අධිරාජයා දැන්වීය. මළවුන් සිහිකිරීම සඳහා වූ කිසිවක් කඩා වඩා ගැනීම නින්දිත තුච්ඡ ක්‍රියාවක් සේ ඔවුන් සලකන බැවිනි. එබැවින් මේ ස්මාරකය ඉතා ගරු සරු ලෙස ආරක්ෂා කරන ලදී.

Scanned by CamScanner

මේ රටේ අලි ඇත්තු ද බහුලව වෙසෙති. මේ සතුන් ශරීර ප්‍රමාණයෙන් විශාල ය. කුළු හරක්, ගෝන්නු, මුවෝ සහ වෙනත් සිව්පාවෝ බහුලව වෙසෙති.

බෙංගාලය පිහිටියේ ඉන්දියාවේ දකුණු දිග මායිමේ ය. 1920 මාර්කෝ පෝලෝ ඛාන් අධිරාජයාගේ රාජ සභාවේ කටයුතු කළ අවදියේ බෙංගාලය ඔහුට යටත්ව තිබුණේ නැත. එහෙත් බෙංගාලය යටත් කර ගැනීම සඳහා අධිරාජයා යුද මෙහෙයුම් කරමින් සිටියේ ය. ශක්තිමත් ලෙස ආරක්ෂක විධි විධාන යොදා තිබූ බැවින් බෙංගාලය යටත් කැර ගැනීමට හැකි වූයේ නොවේ. එහි රජතුමා ද ප්‍රබලයෙකි. මෙහි ජනයා කථා කළේ ඔවුනටම ආවේණික වූ භාෂාවකි. ප්‍රතිමා වන්දනා කරන ආගමක් අදහති. භූත විද්‍යාව ද මේ රටේ ජනප්‍රියව පවතී. සියලු තරාතිරම්වල ජනයා ද අධිපතියෝ ද ආගම කෙරෙහි භක්තිමත් ය.

මේ රටේ ගවයන් ඇතකු තරම් උස ය. එහෙත් එතරම් මහත නැත. මස්, බත්, කිරි මෙහි ජනතාවගේ ආහාර වේ. ආහාර වර්ග ඕනෑ තරම් තිබේ. කපු වගාව සරු සාර ය. වෙළෙඳ ව්‍යාපාරය බහුල ය. ජටා මාංස, ඉඟුරු, උක් හා ඖෂධ වර්ග මෙහි වගා කැරෙයි. වෙළෙන්දෝ ඉන්දියාවේ නොයෙක් ප්‍රදේශවලින් මෙහි ළඟාවෙති. මෙරටින් නපුංසකයන් මුදලට රැගෙන යෑමට මේ වෙළෙන්දෝ කැමැති වෙති. යුද්ධවලින් අල්ලා ගන්නා පිරිමින් ලිංග ඡේදනය කොට නපුංසකයන් ලෙස විකුණනු ලැබේ. මේ රටේ කුමාරවරු ද අධිපතියෝ ද මේ නපුංසකයන් තම අන්තඃපුර ආරක්ෂා කිරීමට යොදවති. වහලුන් වශයෙන් ද යොදා ගැනේ. මෙහි පැමිණෙන වෙළෙඳුන් නපුංසකයන් මුදලට ගෙන වෙනත් රටවලට ගෙන ගොස් විකුණති. මෙය අධික ලාභ ලැබෙන වෙළඳාමකි. දින තිහක් තිස්සේ ගමන් කළ යුතු රටක් ලෙස විශාල ප්‍රදේශයක පැතිර තිබේ. බෙංගාලයේ නැගෙනහිර මායිමේ කයුගිඟු නමැති පළාත පිහිටා තිබේ.

කයුගිඟු ප්‍රදේශය පාලනය කරනුයේ දේශීය රජෙකි. ජනතාව පිළිම වන්දනා කරන්නා වූ ආගම අදහති. මේ රටේ රජතුමා කුබ්ලායි ඛාන් අධිරාජයාට කප්පම් ගෙවන්නේ ය. අධික සැප සම්පත් විඳින මේ රටේ රජතුමාට භාර්‍යාවන් හාර සියයකි. තම රාජ්‍යයේ සිටින රූමත් ස්ත්‍රීන් සියලු දෙනා ම මේ රජුගේ අන්තඃපුරයට

කැඳවා ගැනේ. රත්රන් ද ඖෂධ වර්ග ද මෙරට බහුල ය. මුහුදෙන් ඈත පිහිටි රාජ්‍යයක් බැවින් වෙළෙඳාම සරු නැත. ඇතුන් ද සිවුපාවන් ද බහුල ය. මිදි වලින් පෙරන සුරා මෙහි හිඟ ය. ධාන්‍ය ද වෙනත් ඖෂධ වර්ග ද මිශ්‍ර කොට මත් පැන් පෙරා ගෙන බොති. ශරීරය පුරා පච්ච කොටවා ගැනීමට මෙරට ස්ත්‍රීහු ද පිරිමි ද කැමැති වෙති. විවිධ සිවුපාවන්ගේ ද පක්ෂීන් ගේ ද රූප සටහන් ශරීරයේ සෑම තැනම කොටවා ගැනීම මේ පළාතේ ප්‍රචලිත ය. පච්ච කෙටීමේ යෙදෙන වෘත්තිකයන් මෙරට බහුල ය. පච්ච කොටන්නේ ඉඳිකටුවලිනි. අත් පා වල ද පපුවේ ද මෙහි ජනයා පච්ච කොටවා ගෙන තිබෙන අයුරු දුටුවෙමි. අඟ පසඟ මත ඉඳිකටුවලින් කොටා තුවාල කර ඊ මත කළු පැහැති දියරක් ආලේප කරති. ඉන්පසු සෝදා දැමුවත් එය ඉවත් නොවේ. ශරීරයේ සෑම තැනම වැඩි වැඩියෙන් පච්ච කොටවාගෙන සිටින ස්ත්‍රීන් පුරුෂයන් හැඩකාරයන් ලෙස සමාජයේ පිළිගැනීමට භාජන වේ.

කයුගිඟු ප්‍රදේශයෙන් නැගෙනහිරින් 'අනියු' පිහිටියේ ය. එය ද කුබ්ලායි ඛාන් ට යටත් ප්‍රදේශයකි. බුද්ධාගම අදහන ප්‍රතිමා වන්දනා කරන පිරිසක් මෙහි වෙති. ගව මස් ද, ධාන්‍ය වර්ග ද ආහාරයට ගනිති. ඔවුනටම ආවේණික භාෂාවක් කථා කරත්. අශ්වයන් ද ගවයන් ද බහුල වශයෙන් මෙහි බෝවේ. මේ සතුන් සංචාරක වෙළෙඳුන්ට විකුණනු ලැබේ. තණබිම් සහ ගව ආහාර බහුල ය. එහෙයින් ගව පාලනය දියුණු ලෙස සිදුවේ. අත් පා කණකර ආභරණ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම පළඳිනු දැකිය හැකි ය. කාන්තාවන්ගේ අභරණ වටිනාකමෙන් ඉහළ ය. මීහරකුන් ද, කිරි දෙනුන් ද, ගවයන් ද බහුල මේ ප්‍රදේශයේ ආහාර පාන සුලභ ය. මෙහි සිට කයුගිඟු පළාතට ගමන් කිරීමට දින විසි පහක් ගතවේ. එතැන් සිට බෙංගාලයට යෑමට දින විස්සක් ගතවේ. එහි සිට දින අටක් ගමන් කොට නැගෙනහිර දෙසින් පිහිටි ටොලොමන් වෙත ළඟා වීමට හැකි විය. එහි ජනයා පිළිම වන්දනා කරන්නෝ ය. දේශීය භාෂාවෙන් කථා කරති. මෙය ද ඛාන් අධිරාජයාට අයත් ප්‍රදේශයකි. ඉතා සුන්දර රූපශ්‍රීයෙන් යුත් ජන කොට්ඨාසයක් මෙහි වාසය කරති. ශරීරය තඹ පැහැයට හුරු ය. උස් දේහ සම්පත්තියකින් යුක්ත ය. යුද්ධයෙහි දක්ෂ ය. ගනුදෙනු කිරීමෙහි දී වංචා නොකරති. නගර හා බලකොටු උස් කඳු මුදුන්හි පිහිටා තිබේ. මෘත දේහයන්

Scanned by CamScanner

ආදාහනය කරනු ලැබේ. ශේෂවන ඇට කටු මංජුසාවන්හි බහා කඳු මුදුන්හි ගල් ගුහාවන්හි සඟවති. වන සතුන්ගේ අතවරයෙන් ආරක්ෂා කිරීමේ උපක්‍රමයක් වශයෙනි. රත්රන් බහුලව ලැබෙන ප්‍රදේශයකි. එහෙත් මුදල් වශයෙන් භාවිතා කරන්නේ ඉන්දියාවෙන් ගෙනෙන පිළිස්සූ පිඟන් කටු කැබැලි සහ බෙලිකටු ය. කලින් කී කයුගිඟු හා අනියු පළාත්වල මුදල් භාවිතය මෙනි. ආහාර පාන ද ඉහත කී පළාත්වල ආහාර පානවලට සමාන වේ.

මෙතැන් සිට කුයි ජු පළාතට ළඟාවූයේ දින දොළහක් ගංගාවක් ඔස්සේ යාත්‍රා කිරීමෙනි. ගංගාව දෙපස බොහෝ නගර ද බලකොටු ද දක්නට ලැබිණ. ගමනාන්තයේ දී අප ළඟා වූයේ කුයිජු නමැති සුන්දර නගරයටයි. මෙහි වැසියෝ පිළිම වන්දනා කරන ආගම අදහති. කුබ්ලායි ඛාන් අධිරාජයාට යටත් ප්‍රදේශයකි. වෙළෙඳාම සහ හස්ත කර්මාන්ත ආශ්‍රයෙන් මෙහි ජනයා ජීවිකාව කර ගනිති. කිසියම් ගස් වර්ගයකින් ලබාගන්නා පොතු ආශ්‍රයෙන් රෙදි වර්ගයක් නිපදවති. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ග්‍රීෂ්ම කාලයේ දී මෙම රෙදිවලින් ඇඳුම් පිළියෙළ කරගෙන ප්‍රයෝජනයට ගනිති. පුරුෂ පක්ෂය රණකාමී ය. චීන අධිරාජයාගේ මුද්‍රාව සහිත කරදාසි මුදල් නෝට්ටු පරිහරණය කරන්නාහ. ඒ හැර වෙනත් මුදල් වර්ග භාවිත නොකැරේ.

සිංහයන් බහුල බැවින් මේ ප්‍රදේශයේ ජනයා නගරයෙන් බැහැර රාත්‍රී කාලයේ නවාතැන් ගන්නේ නැත. නැව්වලින් ගමන් ගන්නා අය ද නැව් හෝ ඔරු පාරු ගං ඉවුරේ රඳවා තබන්නේ නැත. සිංහයන් නැව් ඔරු පාරුවලට පැන රාත්‍රී කාලයේ මිනිසුන් ඩැහැගෙන යන බැවිනි. එහෙයින් ඔරු පාරු නවතා තබන්නේ ගංගාව මැද ය. මෙහි ගංගා ඉතා පළල ය. එසේ ම මේ පළාතේ ශරීර ප්‍රමාණයෙන් විශාල බල්ලන් වර්ගයක් ඇත. මේ බල්ලන් දෙදෙනකුට විශාල ව්‍යාඝ්‍රයන් හෝ සිංහයන් දෙදෙනෙකු මරා දැමීමට හැකි ය. දුනු ඊතල රැගෙන මේ බල්ලන් දෙදෙනකු ද සමග යන මිනිසකුට සිංහයකු මුණ ගැසුණහොත් සිංහයා බියපත්ව ගසකට මුවාවෙයි. මෙසේ මුවාවන්නේ බල්ලන් සමග සටනට සූදානම් වීමක් ද වශයෙන් විය හැකියි. එවිට බල්ලෝ සිංහයා සමග පොරට වැටෙති. ඒ සමගම ධනුර්ධරයා ඊතයෙන් විද සිංහයා අඩපණ කරයි. ඒ අතර බල්ලෝ එක පොකුරේ වැටී සිංහයාට

Scanned by CamScanner

මාරාන්තික තුවාල සිදු කරත්. අවසානයේ සිංහයා බල්ලන්ට පරදී.

සේද රෙදි පිළි නිෂ්පාදනය මෙහි බහුලව පවතී. වෙළෙඳ නැව් මගින් මේ රෙදිපිළි වෙනත් ප්‍රදේශ කරා රැගෙන යනු ලැබේ. වෙළෙඳාම මෙහි ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගයයි. දින දොළසක් ඉදිරියට ගමන් කොට ළඟාවූයේ චෙන්ග් - චු - ෆු නගරයට ය. අතර මගදී නගර සහ පුරවරයන් හමුවිය. චෙන්ග් - චු - ෆු නරය ගැන ඉහත දී මේ කෘතියෙහි සඳහන් කැරිණි. එතැන් සිට දින අසූවක් අසු පිටින් ගමන් කොට චෝ - චෞ ප්‍රදේශයට ළඟා විය. චෝ - චෞ ප්‍රදේශයෙහි විස්තර මේ කෘතියෙහි ඉහත දී සඳහන් විය.

Scanned by CamScanner




# පීකිං සිට ඇමෝයි දක්වා

චෝ - චෞ සිට දකුණු දෙසට ගමන් කොට හෝ - කියෙන් - ෆු නගරයට ළඟාවීමට හැකි විය. අතරමගදී සරුසාර කෙත් බිම් වාණිජ නගර කර්මාන්ත පුරවර රාශියක් දක්නට ලැබිණ. ඒ ප්‍රදේශයන්හි ජනයා බෞද්ධයෝ ය. අධිරාජයාගේ මුදල් නෝට්ටු මොව්හු භාවිතා කරති. හෝ - කියෙන් - ෆු නගරය කැතේ දේශයට අයත් ය. මේ නගරයට අප පිවිසුණේ වෙනත් මාර්ගයකිනි. අනෙක් දිසාවකිනි. මෘත ශරීර ආදාහනය කැරේ. ක්‍රිස්තු ලබ්ධිකයන් පිරිසක් ද මෙහි වාසය කරති. ඔවුනගේ දේවස්ථානයක් ද මෙහි පිහිටුවා තිබේ. වෙළෙඳම හා කර්මාන්ත ආශ්‍රයෙන් මෙහි ජනයා ජීවිකාව කර ගනිති. සේද රෙදි නිෂ්පාදනය බහුලව සිදු කැරේ. රන් නූල්වලින් රෙදි නිෂ්පාදනය ද සිදු වේ. ඉතා සිනිඳු සියුම් රෙදිපිළි ද සාටක ද මෙහි නිෂ්පාදනය කැරෙයි. බලකොටු හා නගර මේ ප්‍රදේශයේ බහුල ය. නගරය පසෙකින් ගලාබස්නා විශාල ගංගාව ඔස්සේ වාණිජ භාණ්ඩ ප්‍රවාහනය කැරේ. ඛාන් - බාලික් නගරයට බහුල වශයෙන් මෙහි නිපදවන බඩු බාහිරාදිය ගෙනයනු ලැබේ. මේ ගංගාවට සම්බන්ධ වන ලෙස ඇල මාර්ග කපා භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සලසා ඇත.

මෙහි ලුණු නිෂ්පාදනය බහුලව සිදුවේ. මේ ප්‍රදේශයේ භූමියේ පස ලුණු මිශ්‍ර ය. ජනයා ලුණු පස් කපා කඳු ගසා ඊමත ජලය වත් කරති. මේ ජලය සමඟ ලුණු සේදී දියවී ගලා යයි. ජලය ගලා යෑමට සුදුසු වන පරිදි කානු කපා තිබේ. කානුවලින් ගලන ජලය එක්රැස් කොට විශාල තැටිවල දමා උදුන්හි තබා ගිනි දල්වා

Scanned by CamScanner

වියළෙන්ට හරි. ලුණු දිය උණුකරන භාජන විශාල ය. එහෙත් ගැඹුර අඟල් හතරකට වඩා නැත. ලුණු භාජන උණු වී තිවෙන විට සුදු පැහැයෙන් කැට වශයෙන් මිදේ. මෙසේ පිළියෙළ කැර ගන්නා ලුණු විකිණීම සඳහා ගෙන යති. ලුණු විකිණීමෙන් සෑහෙන ආදායමක් උපයා ගත හැකි වේ. එමගින් රජයට ද සැලකිය යුතු බද්දක් ලැබේ. පීච් නමැති රසවත් පලතුරු වර්ගයක් ද මේ පළාතේ ඇත. එක් පීච් ගෙඩියක් රාත්තල් දෙකක් තරම බර ය.

අනතුරුව චන්ග්ලි නගරය දෙසට හැරෙමු. දකුණු දෙසට කැතේ පළාතේ සිට දින හයක් ගමන් කළ විට චන්ග්ලි වෙත පිවිසීමට හැකි ය. මේ ගමනේ දී අලංකාර නගර ද පුරවර ද දක්නට ලැබිණි. සෞභාග්‍ය සම්පන්න මේ ප්‍රදේශයන්හි වැසියෝ බුද්ධාගම අදහති. අධිරාජයාගේ කඩදාසි මුදල් නෝට්ටු පරිහණය කරති. ආහාරපාන සුලභ ය. කර්මාන්ත හා වාණිජ ව්‍යාපාර මගින් ජීවිකාව කර ගනිති. ගම් නගර හා බලකොටු පිහිටි ස්ථානයන්හි වෙළෙඳ පළ ද දක්නට හැකි ය. අයබදු අය කිරීමට ද කාර්යාල මේ ස්ථානවල පිහිටුවා තිබේ. මේ කාර්යාලයන්හි විශාල බදු මුදලක් එක් රැස් වේ. චන්ග්ලි නගරය මැදින් අති විශාල මහා ගංගාවක් ගලා බසී. සේද රෙදිපිළි ඖෂධ වර්ග වෙනත් වටිනා බඩු බාහිරාදිය නැව් මගින් මේ ගංගා ඔස්සේ ප්‍රවාහනය කැරෙයි. සරුසාර උයන්වතු ද රසවත් පලතුරු ද මෙහි බහුල ය.

අනතුරුව පිවිසෙනුයේ ටැන්ඩින් ෆු නමැති පෙදෙසට ය. එහි ළඟාවීමට දින හයක් ගත විය. ඉතා සුන්දර නගර පුරවර ගම් නියම්ගම් මේ පෙදෙසේ දක්නට ලැබිණ. බලකොටු රැසක් ද පිහිටියේ ය. පිළිම වන්දනා කරන්නා වූ මේ ප්‍රදේශ වාසීහු අධිරාජයාගේ කරදාසි මුදල් නෝට්ටු පරිහරණය කරති. වෙළඳම සහ කර්මාන්ත ජීවනෝපාය වශයෙන් යොදා ගැනේ. පුරාණයෙහි ටැන්ඩින් ෆු පුරවරය අති සුන්දර ඉසුරුමත් ලෙසින් පැවැති නමුදු කුබ්ලායි ඛාන් අධිරාජයා යුද්ධ බලයෙන් තමා නතු කැර ගත්තේ ය. මචිතය දනවන සේද රෙදිපිළි මෙහි නිෂ්පාදනය කැරෙයි. ටැන්ඩින් ෆු නගරයට සම්බන්ධ ශාඛා නගර එකොළසකි. එපමණක් නොව වෙළෙඳ ගම් රැසක් ද මේ පළාතෙහි පිහිටා තිබේ. මෙහි ඉතා දියුණු තත්ත්වයක පවත්නේ සේද රෙදි පිළි නිෂ්පාදනයයි. 1272 දී අධිරාජයා විසින් ලිටන් සැන්ගොන් නමැති සේනාපතියකු අසූ

Scanned by CamScanner

දහසක සේනාවක් සමග එහි පිටත් කර බලය අත්පත් කැර ගැනීමට උත්සාහ දැරී ය. විවිධාකාර ධන සම්පත් හා කර්මාන්ත අධික වශයෙන් පවත්නා වූ මේ රටේ අධිපතියා කුබ්ලායි ඛාන්ට යටත් වන්නේ කවර හේතුවක් නිසා දැයි සිතා ඔහුට එරෙහිව කැරලි ගැසීමට සැරසුණි. අධිරාජයා විසින් එවන ලද සේනාව සහ අධිපතියා ද තම වසඟයට ගත්තේ ය. අනතුරුව කැරැල්ලක් පටන් ගැනිණි.

අධිරාජයාට එරෙහිව කැරැල්ලක් හටගත් බව දැනගත් වහාම අජුල් සහ මොන්ගෙටායි යන අධිපතියන් දෙදෙන යටතේ ලක්ෂයක හමුදාවක් පිටත් කැර එවන ලදී. එහෙත් සැන්ගොන් මේ පුරවයෙහි අධිපතියන් ප්‍රභුවරුන් වංශාධිපතීන් හා බලවතුන් හමුවී තම යටි සිතෙහි පවත්නා ක්‍රියා මාර්ගයට අවනත කැර ගත්තේ ය. ඔවුනගේ ආධාරයෙන් පුරවරයේ හාත්පස ආරක්ෂක බලකොටු පිහිටුවා සෑම තැන ම අගරජුට එරහිව කැරැල්ල දියත් විය. මේ කැරැල්ලේ දී අධිරාජයා එවූ හට පිරිසත් ලිටන් සැන්ගොන්ගේ සේනාවත් අතර බිහිසුණු සටනක් ඇරැඹිණ. මේ සටනේ දී දෙපක්ෂයේම විශාල සෙනගක් මරුමුවට පත්විණ. ලිටන් සැන්ගොන් ද රණපිටියේ දී මරණයට පත්වූයේ ය. ඒ සමගම ඔහුගේ හට පිරිස හිස් ලූලූ අත දිව ගියහ. කුබ්ලායි ඛාන්ගේ සේනා සතුරන් ලුහුබැඳ යමින් මරා දැමූ අතර ඉතිරි පිරිස සිරකරුවන් වශයෙන් අල්ලා ගන්නා ලදී. මෙසේ අල්ලාගත් සතුරන් කුබ්ලායි ඛාන් වෙත ගෙන ගිය අතර ඒ පිරිස අතරින් ප්‍රධානීන් ලෙස පෙනුණු කිහිප දෙනකුන් මරා දමන ලද බව කිව යුතු ය. සෙසු පිරිස රජුගේ සේනාවට බඳවා ගති. ඉන්පසු අගරජුට පක්ෂපාතීව ඔව්හු කටයුතු කළහ.

ටැන්ඩින් - ෆු නගරයෙන් පිටත්ව දකුණු දෙසට තෙදිනක් ගමන් කළ විට අලංකාර නගර පුරවර, කර්මාන්ත පුරවර දක්නට ලැබේ. වෙළහෙළඳම් ඉතා සරුසාරව මේ ප්‍රදේශයන්හි සිදුවේ. මේ පෙදෙසේ වන සතුන් සුලභ ය. ඉතා සාර්ථක ලෙස දඩකෙළියෙහි යෙදමට පුළුවන. ආහාරපාන අඩුවක් නොමැත. මෙහි ජනයා බුද්ධාගම අදහති. තුන් දිනක ගමන කෙළවර පිවිසියේ සින්ජු මාතු 'නමැති පුරවරයටයි. මේ නගරය විශාල ය. වෙළඳම් සහ කර්මාන්ත බහුලව දක්නට ලැබේ. මෙහි වැසියෝ බුද්ධාගම අදහති. පිළිම වන්දනා කරන්නෝ ය. කුබ්ලායි ඛාන් අධිරාජයාගේ යටත්

Scanned by CamScanner

වැසියන් බැවින් කරදාසි මුදල් නෝට්ටු පරිහරණය කරති. මේ පුරවරයෙහි දකුණු දිගින් විශාල ගැඹුරු ගංගාවක් ගලා බසී. කොටස් දෙකකට බෙදෙන මේ ගංගාවෙහි එක් ශාඛාවක් බටහිර පිහිටි මන්සි පළාත ඔස්සේ ගලයි. අනෙක් ශාඛාව නැගෙනහිර කැතේ ප්‍රදේශය හරහා ගලා බසී. මේ ගංගාවන්හි අප්‍රමාණ යාත්‍රා සංඛ්‍යාවක් ඒ මේ අතට යාත්‍රා කරන්නේ ය. මෙකී සියලු යාත්‍රා මගින් වෙළෙඳ භාණ්ඩ ප්‍රවාහනය කැරේ. මන්සි සහ කැතේ පළාත්වල වාසය කරන ජනයාගේ භාණ්ඩ ප්‍රවාහනය කරමින් ගංගාවේ ඉහළට සහ පහළට යාත්‍රා ගමන් කරන ආකාරය ප්‍රියජනක දර්ශනයකි.

සින්ජු මාතු නගරයෙන් පිටත්ව දකුණු දෙසට දින අටක් මුළුල්ලේ ගමන් කරන විට අතරමග නගර හා පුරවර රාශියක් දැකිය හැකි ය. වෙළෙඳම ද කර්මාන්ත ද සරුසාර ය. මෙහි ජනයා බුද්ධාගම අදහති. මෘත ශරීර ආදාහන කරත්. කුබ්ලායි ඛාන් අධිරාජයාගේ යටත් වැසියන් වන මොවුහු කරදාසි නෝට්ටු පරිහරණය කරන්නාහ. අට දිනක ගමනාන්තයෙහි දී පිවිසියේ ලින්ජු නුවරට ය. ඉන් නික්ම දකුණු දිගට දින තුනක් ගමන් කළ පසු අතර මගදී නගර හා බලකොටු රාශියක් දක්නට ලැබිණ. මේ නගර හා බලකොටු සියල්ල පිහිටියේ අධිරාජයාට අයත් ප්‍රදේශයෙහි ය. මේ ප්‍රදේශයේ ආහාරපාන කිසිවක් අඩු නැත. මේ ප්‍රදේශයෙන් අධිරාජයාට විශාල වශයෙන් අයබදු එකතු වේ. මෙයින් නික්ම දින දෙකක් තිස්සේ දකුණු දිසාවට ගමන් කරන විට ලින්ජු නමැති පුරවරයට පිවිසීමට හැකි විය. මෙය බහුල වශයෙන් වෙළඳාම හා කර්මාන්ත පවත්නා දර්ශනීය විශාල පුරවරයකි. මෙහි වැසියෝ පිළිම වන්දනා කරන්නාහ. මෘත ශරීර ආදාහනය කරත්. අධිරාජයා යටතේ පාලනය වන බැවින් කරදාසි මුදල් නෝට්ටු පරිහරණය කරති. මෙකී ප්‍රදේශය ඔස්සේ ගමන් කරන විට වෙළඳහල් ලොකු කුඩා නගර බලකොටු ආදිය තැනින් තැන දැකිය හැකි ය. පමණට වඩා තිරිඟු හා අනෙක් ධාන්‍ය වර්ග මේ ප්‍රදේශයෙහි ඇත්තේ ය. දක්නට ප්‍රිය උපදවන සුනඛ වර්ගයක් ද මෙහි වෙසේ.

මේ ප්‍රදේශයෙන් නික්ම දෙදිනක් ගමන් කරන විට කර මොරන් ගංගාව නැවත හමුවෙයි. මේ ගංගාව ආරම්භ වනුයේ ප්‍රෙස්ටර් ජෝන්ට අයත් ප්‍රදේශයකිනි. ගංගාව ඉතා ගැඹුරු ය. පළල සැතපුමක් පමණ ය. භාණ්ඩ ප්‍රවාහණය කරන්නා වූ නෞකා කිසිදු

Scanned by CamScanner

අවහිරයකින් තොරව මේ ගංගාවේ ඔබ මොබ යාත්‍රා කරයි. මත්ස්‍ය සම්පත ද බහුල ය. මේ ගංගාව මුහුදට ගලා බස්නා මුවදොරට සැතපුමක් පමණ දුරින් විශාල නැව් තොටුපළක් ඇත්තේ ය. එහි යාත්‍රා පසළොස් දහසක් පමණ නවතා තැබීමට ඉඩකඩ ඇත. මෙහි තිබෙන එක් යාත්‍රාවක අශ්වයන් පහළොවක් සහ මිනිසුන් විස්සක් පමණ පටවාගෙන යා හැකි ය. මේ වරාය අධිරාජයා විසින් සැලසුම් කරන ලද්දේ ද දූරදර්ශී හැඟීමෙනි. නොයෙක් පළාත්වල ඇතිවන කැරැලි කෝලාහල අරගල සංසිඳුවීම සඳහා භටයන් ද යුද්ධ ආයුධ ද වෙනත් අත්‍යවශ්‍ය භාණ්ඩ ද ඉක්මනින් පිටත් කැර යැවීමට පහසුකම් සැලැසෙන පරිද්දෙනි. මේ යාත්‍රා නිරන්තරව ඒ සඳහා සූදානම් කැර තබා ඇත්තේ ය. ගංගාවේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයේ පිහිටියේ හ්වායින්ගන් ෂු පුරයයි. එහෙත් ඉහතින් සඳහන් කළ නගරය මෙයට වඩා විශාල ය. අනෙක් නගරය කුඩා ය.

ගංගාවෙන් එතෙර වීමෙන් පසු පිවිසෙනුයේ මන්සි නමැති ප්‍රදේශයටයි. කැතේ ප්‍රදේශය පිළිබඳ අංග සම්පූර්ණ විස්තරයක් ඉහතදී ඔබට ඉදිරිපත් කිරීමට ඉඩකඩ නොලැබිණි. මේ ප්‍රදේශයේ විස්තර විස්සෙන් එක් කොටසක් පමණවත් දැක්වූයේ නැත. සඳහන් කරන ලද්දේ ඒ ප්‍රදේශය ඔස්සේ ගමන් කරන විට දක්නට ලැබුණු දෑ පමණි. සෙසු පළාත් පිළිබඳ තොරතුරු විස්තර සටහන් කැරගෙන ද නැත. අතරමග විස්තර දිගින් දිගට කීමට ගියේ නම් මේ කෘතිය අතිවිශාල වනු ඇත. එමගින් පාඨකයා වෙහෙසට ද පත්වනු ඇත. එහෙයින් මෙතැන් සිට මන්සි ප්‍රදේශය ගැන කරුණු දක්වන්නෙමි.

මන්සි ප්‍රදේශය නැගෙනහිර ලෝකයේ අප දන්නා රටවල් අතුරෙන් අතිශය ධනවත් සරුසාර සෞභාග්‍ය සම්පන්නව පවතී. අලංකාර සුන්දර භූමි ප්‍රදේශයකි. ක්‍රි. ව. 1269 දී මෙහි පාලකයා වූයේ ෆැක්පූර් නමැති රජෙකි. ඔහු මහා ධනේශ්වරයෙකි. සිය වසක් රජකළ සියලු රජවරුන් ඉක්මවා ෆැක්පූර් ධනයෙන් ද සෞභාග්‍යයෙන් ද ආඪ්‍යව සිටියේ ය. හෙතෙම සාමකාමී කරුණාවන්ත දයාබර නරපතියෙකි. ඔහුගේ උතුම් ගතිගුණ හේතු කොට ගෙන රටවැසියෝ ඔහුට මහත් සේ ප්‍රේම කළහ. මහජන බලය ඔහුට නොඅඩුව ලැබිණ. මේ රාජ්‍යය විශාල ගංගාවන්ගෙන් වටවී තිබෙන බැවින් සතුරන්ට ආක්‍රමණය කිරීම අපහසු බවට විශ්වාසයක් ද තහවුරු වී තිබිණ. එහෙයින් යුද්ධ සේනා

Scanned by CamScanner

සංවිධානයක් පිළිබඳව වැඩි අවධානයක් යොමු වී නොතිබිණ. එහෙත් මෙහි නගර මනා ලෙස ආරක්ෂා කැර තිබිණි. ඊතලයක් වැටෙන දුර ප්‍රමාණයෙහි ගැඹුරු දිය අගල් තනා තිබුණේ ය. අශ්වාරෝහක හමුදාවක් පිහිටුවා නොතිබුණේ යුද්ධය පිළිබඳ භීතියක් නොවූ බැවිනි. අධික විනෝදකාමී කටයුතුවලට වැඩි පහසුකම් සැලසූ අතර රූබර කාන්තාවන් දහසක් පමණ රජුගේ මාලිගයෙහි වූහ. අධික කාමභෝගී ජීවිතයක් ගත කළ රජු මේ කාන්තාවන් සමග විනෝද සුවයෙන් විසී ය.

මේ රජතුමා නීතිගරුක ය. ධර්මිෂ්ට ය. නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පුද්ගලයාගේ තරාතිරම සලකා බැලුවේ නැත. හිංසා පීඩාවන්හි දී නීතිය අකුරටම ක්‍රියාත්මක කෙළේ ය. කොතරම් බඩු බාහිරාදිය පිරුණු වෙළෙඳ හලක් කිසියම් අතපසු වීමක් නිසා රාත්‍රියේ වසා තැබීමට නොහැකි වුවද කිසිවකු කිසිවක් සොරකම් කරන්නේ නැත. ඕනෑම සංචාරකයකුට ඕනෑම වෙලාවක කවර තැනක වුව ද නිදහසේ ගමන් කළ හැකිය. ඔවුනට කිසිදු අතවරයක් නොවේ.

දැඩි ආගම භක්තියෙන් යුතු රජතුමා දිළිඳු අසරණ අයට නිරන්තරයෙන් උදවු උපකාර කෙළේ ය. දිළිඳු කම නිසා මවුපියන් විසින් මඟ හැර දමා යන දරුවන් වාර්ෂිකව විසි දහසක් පමණ එකතු කර රජයේ වියදමින් පෝෂණය කිරීමට කටයුතු සැලැස්වූයේ ය. මේ දරුවනට වයසින් වැඩෙන විට විවිධ කර්මාන්තයන්හි පුහුණුව ලබා දුනි. ගැහැනු දරුවන් වයසින් වැඩුණු කල්හි සුදුසු පරිදි විවාහ ජීවිතයට ඇතුළත් කෙළේ ය. ඔවුන් හැම දෙනාගේම ජීවිත සුඛිත මුදිත කිරීමට අවශ්‍ය කටයුතු සැලැස්වීය. මේ රජතුමාත් කුබ්ලායි ඛාන් අධිරාජයාත් අතර දක්නට ලැබුණේ ප්‍රබල වෙනසකි. කුබ්ලායි ඛාන් රණකාමියෙකි. ඔහුට වුවමනා වූයේ යුද්ධ ජයග්‍රහණ මගින් විවිධ රාජ්‍යයන් තමන් සතතක කැර ගැන්මටයි. මේ අනුව මන්සි රාජ්‍යය ද යටත් කැර ගැන්මට කුබ්ලායි ඛාන් සැලසුම් කෙළේ ය. අතිවිශාල අශ්වාරෝහකන හමුදාවක් සහිත යුද බල ඇණියක් සංවිධානය කොට බයාන් චින්සාන් නමැති සේනාපතියා යටතේ මන්සි රාජ්‍යයට පිටත් කැර හැරියේ ය. බයාන් චින් සාන් යන්නෙහි අරුත 'ශත නේත්‍ර' හෙවත් 'ඇස් සියයක් ඇත්තා' යනුයි. 1273 දී මේ ආක්‍රමණය ආරම්භ විය. මෙකී ආක්‍රමණය සඳහා යාත්‍රා රාශියක් ද ලබා දුනි.

Scanned by CamScanner

හමුදා සේනාංක කහ ගඟ තරණය කොට හ්වාගන් - චෞ නගරයට පිවිස එහි ජනයාට යටත් වන සේ අණ කෙළේ ය. එහෙත් වැසියෝ ඔහුගේ බලයට යටත් නොවූහ. එවිට එහි දී සටන් නොකොට "බයාන්" සෙනෙවියා වෙනත් නගරයක් කරා සේනා යොමු කෙළේ ය. එහි දී ද ජනතාවට යටත් වන ලෙස අණ කළ ද ඔවුන් ද යටත් වීමට කැමති වූයේ නැත. ඉන්පසු තවත් නගරයකට ගොස් එයට පහර දුනි. තවත් යුද සේනාංක කුබ්ලායි ඛාන් අධිරාජයා තම සහායට සපයනු ඇතැයි බයාන් සෙනෙවියා බලාපොරොත්තු විය. මෙහිදී සිදුවූයේ බිහිසුණු මනුෂ්‍ය ඝාතනයකි. සියලු නගර වැසියන් කපා කොටා මරා දමන ලදී. මේ භයානක විපත පිළිබඳ ප්‍රවෘත්තිය සෙසු නගරවලර ද සැලවීමෙන් එහි වැසියෝ කැළඹුණහ. අනතුරුව ඔව්හු ආක්‍රමණිකයනට යටත් වන බව කියා සිටියෝ ය. බයාන් තම සේනාව ද ආධාරයට පැමිණ අතිරේක සේනාංක ද පිරිවරා ගෙන ෆැක්පුර් රජුගේ පුරවරය වූ "කින්සායි" බලා පිටත් විය. මේ බව ඇසූ ෆැක්පුර් රජු බියට පත් විණ. කිසිදා යුද්ධයක් දැක පළ පුරුද්දක් නොමැති බැවිනි. තමා ජීවිතක්ෂයට පත්වේ යයි ඉමහත් බියට පත් ෆැක්පුර් රජු සිය බිසොවට රාජ්‍යය භාර දී වටිනා භාණ්ඩ සහ ධනය යාත්‍රා සමූහයකට පටවා තවත් යාත්‍රාවක නැගී පළා ගියේ ය. සිය බිසොවට සතුරන්ගෙන් බියක් හානියක් නොවේ යයි රජු කල්පනා කළේ ය. පළාගිය රජතුමා මුහුදේ ඈත පිහිටි බලකොටු සහිත දිවයිනකට ගොඩ බැස්සේ ය. ජීවිතාන්තය දක්වා ම ෆැක්පුර් රජු එහි වාසය කළ බව පැවැසේ.

රජු පළාගිය පසු බිසොවට කලකට ඉහත පැවැසුණු ජ්‍යොතිෂ අනාවැකියක් අසන්නට ලැබිණ. "ඇස් සියයක් සහිත (ශත නේත්‍ර) නමක් ඇති සේනාපතියකුට විනා මේ රටේ රජු යටත් කළ නොහැකි ය" යනු ඒ අනාවැකියයි. ඒ අනාවැකිය ඇසීමෙන් බිසොවගේ සිතට සහනයක් ලැබිණ. ඇස් සියයක් ඇත්තේ දෙවියකුට පමණක් බැවින් රාජ්‍යය ආරක්ෂා වෙතැයි ඕ කල්පනා කළා ය. එහෙත් සටන් මෙහෙයවන බයාන් සෙනෙවියාගේ නම කුමක් දැයි සොයා බැලූ ඇයට දැනගන්නට ලැබුණේ බයාන් චීනෙ සාත් බවත් එහි අරුත ඇස් සියයක් ඇත්තා (ශත නේත්‍ර) බවත් ය. ඉක්බිති මේ සෙනෙවියාට එරෙහිව සටන් මෙහෙයැවීමේ අරමුණ අත්හළ බිසොව තමන් යටත් වන බව ප්‍රකාශ කළා ය. අනතුරුව බිසොව සිරභාරයට ගෙන කුබ්ලායි ඛාන් අධිරාජයා වෙත ගෙන ගොස් භාර දුනි. කුබ්ලායි

Scanned by CamScanner

ඛාන් ඇය මහත් ගෞරව සම්මාන සහිතව පිළිගෙන ජීවිකාව සඳහා වැටුපක් ද ගෙවීමට සැලැස්වීය.

දැන් මීළඟට ම විස්තර කරන්නේ හ්වායින්ග් - චෞ නගරයේ ස්වභාව යයි ගිනිකොණ නැගෙනහිර අතර මේ නගරය පිහිටා තිබේ. සියලු නගරාංගයන්ගෙන් සමන්විත ය. කරමොරන් හෙවත් කහ ගඟේ මුවදොර අසල මේ සුන්දර නගරය පිහිටා තිබේ. මේ ගංගාවේ විශාල යාත්‍රා නිරතුරු ඔබ මොබ යාත්‍රා කරනු දැකිය හැකි ය. වාණිජ භාණ්ඩ පටවාගත් බොහෝ නෞකා ද වෙනත් යාත්‍රා ද මේ නගරය අසල පිහිටි වරායට ළඟාවේ. එතැනින් විවිධ වෙළෙඳ භාණ්ඩ අලෙවිය සඳහා රට තුළට ගෙන යනු ලැබෙයි. මෙහි ලුණු නිෂ්පාදනය ඉතා සාර්ථක කර්මාන්තයක් ලෙස සිදුවේ. ජනතාවගේ පරිභෝජනය සඳහා පමණක් නොව වාණිජ භාණ්ඩයක් ලෙස ද ලුණු නිෂ්පාදනය කැරෙන අතර එමගින් විශාල ආදායමක් ලැබේ. රජයට ද සෑහෙන තරම් බද්දක් ලැබේ.

හ්වායින්ග් - චෞ නගරයෙන් පිටත්ව නැගෙනහිර දෙසට දවසක්. මුළුල්ලේ ගමන් කළ විට මනා ලෙස ඉදිකළ ශෛලමය පාලමක් හමුවෙයි. මාර්ගය දෙපස වගුරු බිම් ද ජලය පිරුණු ගැඹුරු සුවිශාල විල් ද දක්නට ලැබිණ. මේ පාලම හැරුණු විට මේ ප්‍රදේශයෙන් එතෙර වීමට අනෙක් මාර්ගයක් නැත්තේ ය. යාත්‍රාවලින් මේ ප්‍රදේශයට ළඟාවීම පහසු බැවිනි. රජුගේ සේනාපතියා ගංගාව ඔස්සේ ළඟාවූයේ! එක් දිනෙක පා ගමනේ කෙළවර පා ඕ යින්ග් නගරයට ළඟාවිට හැකි ය. මෙහි ජනයා බෞද්ධයෝ ය. මෘත දේහ ආදාහනය කරති. කර්මාන්ත සහ වාණිජ ව්‍යාපාර ආශ්‍රයෙන් ජනයා ජීවිකාව කරන්නාහ. අලංකාර පට සේද රෙදිපිළි නිෂ්පාදනය ද රන් කෙඳිවලින් කදිම රෙදිපිළි නිර්මාණය ද සිදුවේ. මෙහි මිනිසුන්ට ජීවත්වීමට අවශ්‍ය සියලු සම්පත් නො අඩුව පවතී.

එහි සිට ගිනිකොණ දෙසට පුරා දවසක් ගමන් කළ විට කායෝ - යු නමැති නගරය හමු විය. එය විශාල පුරවරයකි. දර්ශනීය ගොඩනැගිලි වලින් සමන්විත ය. වැසියෝ බුද්ධාගම අදහති. අධිරාජයාගේ මුදල් නෝට්ටු භාවිතා කරත්. කර්මාන්ත ද වාණිජ ව්‍යාපාර ද බහුලයි. මත්ස්‍ය සම්පත ද දඩයමට සුදුසු සතුන් ද පක්ෂීන් ද සුලභ ය. වගාවන් සහිත සරුසාර කෙත් බිම් පසුකරමින් එක් දිනක් ගමන් කළ විට තායි - චෞ නමැති පුරවරය හමුවෙයි.

Scanned by CamScanner

මෙය කුඩා නගරයකි. එහෙත් ආහාරපාන ඉතා සුලභයි. මෙහි වැසියෝ බුද්ධාගම අදහති. අධිරාජයාගේ මුදල් නෝට්ටු පරිහරණය කරති. ලුණු නිෂ්පාදනය මෙහි බහුලව සිදු කැරේ. කායෝ යූ නගරයේ සිට ගිනිකොණ දෙසට ගමන් කළ විට යැන්ග් චෞ නමැති නගරය හමුවේ. උපනගර විසිහතක් යැන්ග් චෞ පුරවරයේ පාලනය යටතේ පවතී. එබැවින් මෙය බලවත් නගරවරයක් ලෙස සැලැකේ. මෙය ද කුබ්ලායි ඛාන්ගේ පාලනයට යටත්ව පවතී. කෘෂිකර්මයෙන් ද වාණිජ ව්‍යාපාරවලින් ද ජීවිකාව කරන්නා වූ මෙහි ජනයා බෞද්ධයෝ ය. යුද උපකරණ හා යුද්ධායුධ නිෂ්පාදනය මෙහි සිදුවේ. ප්‍රබල යුද්ධ සේනාවක් ද මෙහි රඳවා ඇත. අධිරාජයාගේ ප්‍රධාන වංශාධිපතීන් දොළොස් දෙනාගෙන් එක් අයෙකු මෙහි පාලකයා ලෙස පත් කිරීම සම්ප්‍රදායයි. මාර්කෝ පෝලෝ ද තුන් වසරක් මෙහි ආණ්ඩුකාර පදවිය හෙබැවීය. නැන්කින් වූ කලී මන්සි ප්‍රදේශයෙන් බස්නාහිර පැත්තෙහි පිහිටි විශාල පළාතකි. මෙහි ජනයා ද පිළිම වන්දනා කරන්නෝ ය. කුබ්ලායි ඛාන්ට යටත් බැවින් මුදල් නෝට්ටු භාවිතා කරති. වාණිජ ව්‍යාපාර හා කර්මාන්ත සුලභ ය. රන්මුවා රෙදිපිළි නිෂ්පාදනය කැරේ. එසේ ම සේද රෙදි පිළි ද බහුල ය. ආහාර පාන ආදිය සුලභ ය. ධාන්‍ය ද දඩයමට සුදුසු සතුන් ද සෑහෙන තරම් ඇත්තේ ය. බොහෝ ධනවත් වෙළෙන්දෝ වාසය කරති.

මීළඟට සියැන්ග් - යැන්ග් - ෆු නගරය ගැන විස්තර සඳහන් කරමි. එය අති විශාල නගරවරයකි. එහි පාලනයට යටත් විවිධ ප්‍රමාණයේ නගර දොළසක් තිබේ. ඉතා දියුණු වෙළෙඳ ව්‍යාපාර දක්නට ලැබෙන මෙහි විවිධාකර භාණ්ඩ නිෂ්පාදනය කැරෙයි. මෙහි ජනයා බුද්ධාගම අදහති. මෘතදේහ ආදාහනය කරති. පටපිළි ද සේද පිළි ද රන් නූලින් වියන රෙදිපිළි ද මෙහි නිෂ්පාදනය කැරෙයි. දඩයමට සුදුසු සතුන් බොහෝ ය. නගරයකට අවශ්‍ය සකල අංගෝපාංගයන්ගෙන් සමන්විත මෙහි ධන සම්පත් අධික ය. මේ නගරයේ පවත්නා බලයත් ශ්‍රේෂ්ඨත්වයත් හේතු කොටගෙන තුන් වර්ෂයක් මුළුල්ලේ වටලනු ලැබ සිටිය ද යටත් කැර ගැන්මට හැකි වූයේ නැත. මේ නගරය තුන් පැත්තකින්ම ජලයෙන් වටවී තිබීම නිසා පරසතුරු ආක්‍රමණයකට පහසුවෙන් ගොදුරු නොවේ. මෙහි ජනතාව තව දුරටත් ස්වාධීනව සිටීමට අධිෂ්ඨාන කැර ගත්තේ මන්සි පළාත කුබ්ලායි ඛාන් හට යටත් වීමෙන් ඉක්බිතිවයි. එක්

Scanned by CamScanner

පාර්ශ්වයකින් හැර අන් හැම අතින් ම මේ ප්‍රදේශය ජලයෙන් වට වී තිබීම වාසි සහගත ආරක්ෂාවක් වූයේ ය. උතුරු පැත්තෙන් පමණක් එහි පිවිසීමට ඉඩකඩ තිබිණ.

අධිරාජයාගේ හමුදා තෙවසරක් මුළුල්ලේ මේ රාජ්‍යය යටත් කැරගැනීමේ අභිප්‍රායයෙන් වටලා සිටිය ද ජලයෙන් වට වූ තුන් පැත්තෙන් ආධාර ලැබුණු බැවින් යථෝක්ත උත්සාහය අසාර්ථක විය. මේ පිළිබඳව යුද හමුදාවේ පසුබෑම පිළිබඳව රජතුමා නිතර කනස්සල්ලෙන් පසුවිණ. ඒ පිළිබඳ වාර්තා ගෙන්වා ගෙන කරුණු අධ්‍යයනය කෙළේ ය. මෙකල රාජ සභාවේ කටයුතු කළ මපියෝට ද නිකොලෝට ද අධිරාජයාගේ කලකිරීම පිළිබඳව දැනගන්නට ලැබිණ. ඔව්හු ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට කඩිනමින් කුබ්ලායි ඛාන් අධිරාජයා බැහැදැකීමට ගියහ. යුරෝපයේ රටවල ගල් විදින යන්ත්‍ර ගැන අධිරාජයාට සියලු විස්තර ඉදිරිපත් කළ මේ සහෝදරයින් දෙදෙනා එබඳු යන්ත්‍ර නිෂ්පාදනය සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ල සිටියෝ ය. රාත්තල් තුන් සියයක පමණ බරින් යුතු ගල් කුට්ටි මේ යන්ත්‍ර මගින් බොහෝ ඈතට විදීමට හැකි බවත් එසේ යවන ප්‍රහාර මගින් නිවාස ගොඩනැගිලි සුණු විසුණු කළ හැකි බව ද කියා සිටියහ. එමගින් බිහිසුණු ජන ඝාතනයක් කළ හැකි බව ද පෙන්වා දුන්හ.

මේ ගැන අවධානය යොමු කළ අධිරාජයා රටේ සිටින දක්ෂ ගල් වඩුවන් ද ලෝහ කර්මාන්තකරුවන්ගේ සහයෝගය ලබා දෙන ලෙස නියෝග කෙළේ ය. නෙස්ටෝරියන් ක්‍රිස්තු ලබ්ධිකයන් කිහිප දෙනෙකු ද මේ සඳහා යොදවා ගන්නා ලදී. ඔවුන් දක්ෂ කර්මාන්ත කාරයින් ය. මපියෝ සහ නිකොලෝ යන දෙදෙනාගේ උපදෙස් හා සැලසුම් අනුව දින කිහිපයක් තුළ දී ගල් විදින යන්ත්‍ර කිහිපයක් තනා නිම කරන ලදී. ඉන්පසු මේ යන්ත්‍ර මගින් ගල් විදින ආකාරය ප්‍රදර්ශනය කැරිණ. අධිරාජයා සහ අමාත්‍ය මණ්ඩලය ප්‍රමුඛ ප්‍රභූවරු මේ යන්ත්‍ර මගින් ගල් විදින ආකාරය නැරඹූහ. රාත්තල් තුන් සියයක් පමණ බර ගල් යන්ත්‍රානුසාරයෙන් විදින ආකාරය බලා ඔවුන් සියලු දෙනා මවිත වූහ. ඉන්පසු මේ ගල් විදින යන්ත්‍ර නැව්වල පටවා යුද හමුදාව වෙත ප්‍රවාහනය කැරිණ. ඉක්බිති මේ එක් යන්ත්‍රයක් මගින් එක් ගලක් සියන් ෆු නගරය අබිමුවෙහි සිට ඇතුළත පිහිටි විශාල ගොඩනැගිල්ලක් ඉලක්ක කොට විද්දේ ය. ඒ ගල පතිත වීම නිසා විශාල හඬක් නඟමින් ගොඩනැගිල්ලෙන් කොටසක් කඩා වැටුණි.

Scanned by CamScanner

හදිසියේ සිදුවූ මේ විපත නිසා නගරවැසියෝ බියෙන් මුසපත් වූහ. කරකියා ගත හැකි කිසිවක් නොවූයෙන් නගරවැසියෝ එක්වී යුද්ධය නවතා යටත් වීමට කැමැති බව කියා සිටියහ. සෙසු නගරවලට ද දන්වා කුබ්ලායි ඛාන් අධිරාජයාට යටත් භාවය ප්‍රකාශ කළෝ ය. නිකොලෝ මපියෝ සහ මාර්කෝ පෝලෝ යන වැනිසියානු සහෝදරයන් තිදෙනාගේ බුද්ධිය සහ උපායශීලි දක්ෂතාව අගරජතුමා ද සෙසු සියලු දෙනා ද මහත් ගෞරවයෙන් ස්තුති ප්‍රශංසා මුඛයෙන් පිළිගන්නා ලදී. එමගින් මේ සහෝදරයින් තිදෙනාගේ කීර්ති ඝෝෂාව දසත පැතිරිණ.

අනතුරුව යැන්ග් - චෞ නගරයෙන් පිටත් වී ගිනිකොණ දෙසට සැතපුම් පහළොහක් ගමන් කළ පසු සින්ජු නමැති නගරයට ළඟා වීමට හැකි ය. මෙය ඉතා විශාල පුරවරයක් නොවේ. එහෙත් වෙළඳම ඉතා දියුණු තත්වයක පවතී. කියැං නමැති ගංගාව අසබඩ මේ නගරය පිහිටි බැවින් නෞකා මගින් වෙළඳ භාණ්ඩ මහා පරිමාණයෙන් ප්‍රවාහනය කැරේ. මේ ගංගාව සමහර තැනකදී සැතපුම් දහයක් පමණ ද සමහර තැනකදී සැතපුම් අටක් පමණ ද පළල ය. ඇතැම් තැනක පළල සැතපුම් හයක් පමණ වේ. මෙහි සිට ගඟෙහි මුවදොර දක්වා ගමන් කිරීමට දින සියයක් පමණ ගතවේ. වෙනත් ගංගා රාශියක් ද මේ ගංගාවට ගලා බසී. බොහෝ දුර බැහැර සිට මෙකී අතු ගංගා ගලා බස්නේ ය. මෙකී ගංගා සංඛ්‍යා වශයෙන් ගතහොත් දෙයියයක් පණ වේ. විශාල පළාත් දහයක් ඔස්සේ මේ ගංගා ගලයි. ඒ සියලු ප්‍රදේශයන්හි නගර උපනගර සියල්ලෙහි භාණ්ඩ ප්‍රවාහනය කැරෙනුයේ නෞකා මගින් මේ ගංගා ඔස්සේ ය. අතු ගංගා ඔස්සේ රට අභ්‍යන්තරයෙහි පිහිටි විවිධ ස්ථාන කරා භාණ්ඩ ගෙන යයි. යැන්ග් චෞ නගරයේ සිටියදී මාර්කෝ පෝලෝ හට එක් අවස්ථාවක දී මේ ගංගාවේ යාත්‍රා කරන්නා වූ නැව් පසළොස් දහසකට වඩා දක්නට ලැබිණි. ඒ හැරුණු විට වෙනත් අතු ගංගා ඔස්සේ ඔබ මොබ ගමන් කරන්නා වූ යාත්‍රාවන් ද රාශියකි. මේ යාත්‍රාවන්හි උඩ තට්ටුව නිර්මාණය කැර ඇත්තේ එක්තරා විශේෂ ආකාරයට ය. කුඹගසක් හා එක් රුවලක් මෙහි තනා ඇත. වැනිසියානු හොණ්ඩර හාර දහසේ සිට දොළොස් දහස දක්වා ප්‍රමාණයක බර මෙහි පටවා ගෙන යනු ලැබේ. රුවල බැඳීම සඳහා උපයෝගී කැරගෙන ඇත්තේ කිත්තන් කඹ ය. යාර පහළොහක් පමණ දිග වේවැල් සිහින්

Scanned by CamScanner

තීරුවලට ඉරා යාර තුන් සියයක් දිගින් යුතු කඹ අඹරා එයින් යාත්‍රා බැඳ තබති. මෙසේ බැඳ තබන්නේ සැඩ පහරට ගසාගෙන යෑම වළක්වනු සඳහා ය. වේවැල්වලින් අඹරන කඹ කිත්තත් කඹවලට වඩා අතිශයින් ශක්තිමත් ය. අශ්වයන් දහයක් දොළහක් පමණ දිග යාත්‍රා මේ කඹවලින් ඇදගෙන යනු ලැබේ. ගංගා දෙපස මිතිසුන් පදිංචි ගම් දනවු පිහිටියේ ය. උස් කඳු ගැට පිහිටි ස්ථානවල ද උස්බිම්වල ද ගංගාව අසල ද පූජ්‍යස්ථාන තනාගෙන වැසියෝ පුද පූජා පවත්වති.

ක්වා - චෞ වූ කලී මේ ගංගාවේ දකුණු ඉවුරේ පිහිටි කුඩා නුවරකි. මෙහි ජනයා පිළිම වන්දනා කරති. අධිරාජයාගේ මුදල් නෝට්ටු භාවිතා කරති. සහල් සහ ධාන්‍ය අති විශාල සම්භාරයක් මෙහි නිෂ්පාදනය කැරේ. එයින් සෑහෙන ප්‍රමාණයක් ඛාන් - බාලික් පුරයේ අධිරාජයාගේ මාලිගයට ද වෙනත් ප්‍රභුවරුන්ගේ වාසස්ථාන වෙත ද යැවේ. කැතේ ප්‍රදේශය කරා ගමන් ගන්නා මාර්ගය වැටී ඇත්තේ මේ පළාත ඔස්සේ ය. අධිරාජයා මේ පළාතේ සිට සියලු ගංගා විල් ජලාශ සම්බන්ධ කරමින් ඉතා ගැඹුරු වූ ද පළල් වූ ද ඇළ මාර්ගයක් ඉදිකැරවී ය. ජල යාත්‍රාවනට මන්සි පළාතේ සිට ඛාන් බාලික් නුවර දක්වා රට මැදින් මේ ඇළ මාර්ගය ඔස්සේ ගමන් කළ හැකි වේ. මුහුදෙන් නොගොස් ගංගා වැව් විල් ජලාශ එකිනෙකට සම්බන්ධ කොට තැනූ මේ ඇළ මාර්ගය මවිතය දනවන උසස් ඉදිකිරීමකි. මේ ඇළ මාර්ගය නිසා භාණ්ඩ ප්‍රවාහනය ඉතා ක්‍රමවත් ලෙස සිදුවේ. එසේම තැනින් තැන ඉදි කැර ඇති පාලම් නිසා මගීන්ගේ ගමනාගමනයට ද පහසුකම් සැලසේ. ගොඩබිම මාර්ග ඔස්සේ ගමන් කරන මගීන්ට ද එක් පළාතක සිට තවත් පළාතකට අවහිරයෙන් තොරව ගමන් කළ හැකි ය. ක්වා - චෞ පුරය ඉදිරිපස ගංගාවේ විශාල ගල් තලාවක් සහිත දූපතක් තිබේ. මෙහි බෞද්ධ විහාරයක් දැකිය හැකි ය. මෙහි භික්ෂූන් වහන්සේ දෙදහසක් පමණ වාසය කරති. ප්‍රතිමා විශාල සංඛ්‍යාවක් ද මෙහි ඇත. භික්ෂූන් වහන්සේ මේ අවට ආගමික කටයුතුවල නිරත වන්නාහ. අනෙකුත් පළාත්වල පිහිටි ආගමික සිද්ධස්ථානයන්හි මූලස්ථානය වශයෙන් සැලකෙනුයේ මේ බෞද්ධ විහාරයයි. චීන භාෂාවෙන් චින් සාන් (රන්ගිර) යනුවෙන් මේ සිද්ධස්ථානය හැඳින්වේ.

Scanned by CamScanner

මේ ගංගාවෙන් එතෙර වී චින් කියැන්ග් ෆූ වෙතට ගමන් කෙළෙමු. මෙය පිහිටියේ මන්සි පළාතෙහි ය. වැසියෝ බුද්ධාගම අදහති. අධිරාජයාට යටත් ප්‍රදේශයක් බැවින් කඩදාසි මුදල් නෝට්ටු පරිහරණය කරති. වෙළඳාම සහ කර්මාන්ත බහුලව පවත්නා ප්‍රදේශයකි. දඩකෙළි සඳහා සිවුපාවන් ද පක්ෂීන් ද බහුල ය. ධාන්‍ය සහ ආහාරපාන සුලභ ය. පටරෙදි සේද රෙදි සහ රන්කෙඳි සහිත රෙදිපිළි නිෂ්පානය කැරේ. මේ නගරයෙහි නෙස්ටෝරියන් ක්‍රිස්තියානි නිකායට අයත්.දේවස්ථාන දෙකක් පිහිටුවා ඇත. 1278 දී මේ දේවස්ථාන ගොඩනගන ලදී. මාර් සර්ගියස් නමැති ක්‍රිස්තියානි නිලධාරියකු මෙහි පාලනය සඳහා තුන් වසරකට කුබ්ලායි ඛාන් විසින් පත්කරන ලදී. මෙකී දේවස්ථාන ඉදිකරවන ලද්දේ මාර් සර්ගියස් විසිනි. එයට පෙර මෙහි දේවස්ථාන නොතිබුණි. තවමත් මේ දේවස්ථාන එහි දක්නට ඇත.

අනතුරුව අප පිවිසෙනුයේ චින් - කියැන්ග් - ෆු නගරයට ය. එහි සිට තුන් දිනක් ගිනිකොණ දෙසට ගමන් කෙළෙමු. අතරමගදී නගර රාශියක් දක්නට ලැබිණ. කර්මාන්ත හා වාණිජ ව්‍යාපාර එහි පවතී. ජනයා බුද්ධාගම අදහති. ඛාන් අධිරාජයාට යටත් ප්‍රදේශ බැවින් කඩදාසි මුදල් නෝට්ටු භාවිත කැරේ. මෙහි ගමන් කෙළවර වනුයේ චැංග් - චෞ නගරයෙනි. මෙය ඉතා සුන්දර නගරයකි. විශාල ප්‍රදේශයක් පුරා පැතිර පවතී. මෙහි පට හා සේද රෙදිපිළි නිෂ්පාදනය කැරේ. දඩයමට සුදුසු සතුන් බහුල ය. මෙහි ජනයා අශිෂ්ට අමානුෂික ගතිගුණ සහිත පිරිසකි.

බයාන් හෙවත් (ශත නේත්‍ර) සෙන්පතියා මේ රට යටත් කැරගත් අවදියෙහි අලනියන්වරුන් හා ක්‍රිස්තියානින් ද මන්සි ප්‍රදේශයට රැගෙන ආ බව පැවැසේ. යුද බලකායත් සමග ය. ඔවුන් මෙහි පැමිණි විට සටනක් කළ යුතු බවට පසුබිමක් සකස් වී ඇති බැව් පෙනිණ. මේ නගරය ප්‍රාකාර දෙකකින් ආවරණය කැර තිබිණ. ඇලනියන්වරු පළමුවන ප්‍රාකාරයෙන් ඇතුළතට පැන එහි බලය අත්පත් කැරගත්හ. ඒ කොටුව තුළ දී මත්පැන් තිබෙන බව ඔවුනට පෙනී ගියේ ය. මේ කොටුව තුළ ප්‍රමාණවත් ආහාර පාන නොමැති කමින් ද බලවත් පීඩාවට පත්වී සිටි බැවින් ද හටයෝ මත්පැන් බී වෙරිමතින් සිටියෝ ය. වෙරිමතින් සිටි හටයන් සියලු දෙනාම මරණයට පත්වූහ. මේ ප්‍රවෘත්තිය සැලවූ වහාම බයාන් සෙන්පතියා

Scanned by CamScanner

නගරවැසියන්ගේ මේ ඝාතනය පිළිබඳව කෝපයට පත්විණි. බයාන් සේනාපතියා මෙයට ප්‍රතික්‍රියා දක්වමින් ඒ නගරයේ බාල මහලු තරුණ ස්ත්‍රී පුරුෂ සියලු ජනයා මරා දැමීමට නියෝග කළේ ය. එහි දී බිහිසුණු මනුෂ්‍ය ඝාතනයක් සිදුවිය.

මේ නගරයෙන් නික්ම පිවිසුණේ සූ - චෞ පුරවරයට ය. එය විශාල සුන්දර පුරවරයකි. මේ නගරයට පිවිසීම සඳහා දින තුනක් ගත විය. අතරමගදී සරුසාර නගර ගම් නියම ගම් රාශියක් පසුවිය. මෙහි ජනයා බුද්ධාගම අදහති. අධිරාජයාට යටත් බැවින් කඩදාසි මුදල් නෝට්ටු භාවිතා කරති. පට හා සේද රෙදිපිළි විශාල වශයෙන් මේ ප්‍රදේශයේ නිෂ්පාදනය කැරෙයි. පට සේද රෙදිපිළි ඉතා සුලභ ය. නුවර වැසියන් සියලු දෙනා පට රෙදි සේද හඳිති. අතිරික්ත රෙදිපිළි වෙනත් ප්‍රදේශවලට ගෙන ගොස් අලෙවි කැරේ. ඉතා ධනවත් වෙළෙඳ ව්‍යාපාරිකයෝ මෙහි ජීවත් වෙති. අප්‍රමාණ ජන සංඛ්‍යාවක් එහි වාසය කරති. එහෙත් මෙහි ජනයා නිහඬව තම කටයුතු කරගෙන යති වෙළෙඳාම සහ කර්මාන්ත මහත් උද්‍යෝගයෙන් පවත්වාගෙන යන්නාහ. ඔවුන්ගේ උද්‍යෝගය අධිෂ්ඨානය හා රණකාමිත්වය උද්දීප්ත වූයේ නම් මන්සි ප්‍රදේශය යටත් කැර ගැන්මට හැකිවන බවට සැකයක් නැත. ඔවුන් බලය ව්‍යාප්ත කිරීමට සටන් වැදීමේ අරමුණක් මුදුන්පත් කැරගත්තේ නැත. මෙහි අති දක්ෂ වෛද්‍යවරු සිටිති. කිනම් රෝගයකට වුවද පිළියම් නිර්දේශ කිරීමේ ප්‍රඥාවක් ඔවුන් සතු ය. දාර්ශනිකයන් ලෙස හැඳින්වෙන විද්වතුන් ද, ඉන්ද්‍රජාලිකයන් ද, මන්ත්‍රකාරයන් ද මේ ප්‍රදේශයේ වාසය කරන බැව් කිව යුතු ය. මේ ප්‍රදේශයේ විරේචනය සඳහා යොදා ගැනෙන පැළෑටි වර්ගයක් වැවේ. මේ ඖෂධ වර්ගය සෑම ප්‍රදේශයකම බෙදා හැරේ. ඉතා සරුසාර ලෙස ඉඟුරු වගාව ද සිදුවේ. රාත්තල් හතළිහක පමණ ඉඟුරු ගොඩක් වැනිසියානු පැන්ස කාසියකට ලබා ගත හැකි ය.

මේ නගරයේ පාලනයට නතු වූ ලොකු කුඩා නගර රාශියකි. ගම් හා කුඩා ගම් දහසයක් ඇත. වෙළඳාම සහ හස්ත කර්මාන්ත ඉතා දියුණු ලෙස පවතී. සූ - චෞ යන්නෙහි අරුත භූමි පුරය යනුයි. කින්සායි යන්නෙහි අරුත දිව්‍ය පුරය යනුයි.

අනතුරුව පවසන්නේ වූ ගින් නමැති නගරයේ කථාවයි. එහි යෑමට එක් දිනක් ගතවේ. එහි ද පටපිළි සේද පිළි කර්මාන්තය

Scanned by CamScanner

සිදුවේ. මෙහි නිෂ්පාදනය කැරෙන රෙදිපිළි වෙනත් ප්‍රදේශවලට ගෙන ගොස් වෙළඳාම් කැරෙයි.

මෙතැන් සිට ඔබට පවසන්නේ කින් - සායි නමැති පුරවරයේ තොරතුරු ය. එහි පිවිසීමට දින තුනක් ගතවේ. අතරමගදී බොහෝ සමෘද්ධිමත් ගම් හා නගර දක්නට ලැබේ. මෙහි වාසය කරන්නා වූ ජනයා බෞද්ධයෝ ය. අධිරාජයා ගේ යටත්වැසියන් ය. කඩදාසි මුදල් නෝට්ටු භාවිතා කරති. මෙය ඉතා අලංකාර නගරයකි. කින්-සායි යනුවෙන් අදහස් කැරෙනුයේ දෙව්ලොවයි. මේ නගරය ද අත්‍යාලංකාර ය. එහි වැසියෝ සතුටින් කාලය ගත කරති. මාර්කෝ පෝලෝ මේ නුවරට බොහෝ වාර ගණනක් ගියේ ය. ඒ හැම වතාවකදීම දක්නට අසන්නට ලැබූ විස්තර සටහන් පොතක ලියා ගත්තේ ය. දීර්ඝ විස්තර රහිතව අවශ්‍ය කරුණ පමණක් මෙහි දී ඉදිරිපත් කැරේ.

මේ නගරයෙහි විෂ්කම්භය සැතපුම් සියයක් පමණ වේ. එහි තැනින් තැන වෙළෙඳ චතුරස්‍ර පිහිටුවා තිබේ. අතිවිශාල ජනගහනයකට ඉඩකඩ සැලසෙන සේ මේ වෙළඳපල සකස් කැර ඇත. වෙළෙන්දෝ ද විශාල සංඛ්‍යාවක් මෙහි හැසිරෙති. මෙහි එක් පසෙක විශාල වැවකි. අනෙක් පසින් විශාල ගංගාවක් ගලා බසී. විලෙහි ජලය ඉතා පිරිසිදු ය. පැහැදිලි ය. නගරය පිහිටියේ විලත් ගංගාවත් අතර ය. ගංගාවේ ජලය නොයෙක් දිසාවට බෙදී යන සේ ඇළ මාර්ග ඉදිකැර තිබේ. නගරයේ අපවිත්‍ර කැලි කසල මේ ඇළ මාර්ග ඔස්සේ මුහුදට ගසා ගෙන යයි. නගරයේ වාතාශ්‍රය පිරිසිදු ය. ඇළ මාර්ග යාත්‍රා ගමන් කරවීමට පහසුකම් සලසයි. නගරය පුරා ගමන් පහසුව සඳහා ගොඩබිම් මාර්ග රාශියක් තනා තිබේ. ජල මාර්ග සහ මහා මාර්ග පුළුල් ලෙස ඉදිකැර ඇත්තේ ය. ජල මාර්ග ඔස්සේ ජල යාත්‍රාවන් ද ගොඩබිම් මාර්ග ඔස්සේ කරත්ත ආදී යාන වාහන ද නිරතුරු ඔබ මොබ ගමන් කැරේ. මේ මගින් ප්‍රවාහනය කැරෙනුයේ පාරිභෝගික භාණ්ඩ ය. දොළොස් දහසකට අධික පාලම් සංඛ්‍යාවක් මේ නුවර හාත්පස ඉදිකැර ඇති බව මට අසන්නට ලැබිණ. ඇළ මාර්ග හරහා තනා ඇති මේ පාලම්වල ආරුක්කු ඉතා උස ය. දක්ෂ කර්මාන්ත කරුවන්ගේ විශිෂ්ට නිර්මාණ ලෙස මේ පාලම් සහ ආරුක්කු හැඳින්වීමට පුළුවන. ඇළ මාර්ග ඔස්සේ ගමන් කරන්නා වූ නැව්වල කුඹ ගස් ද පාලම් මතින් ගමන්

Scanned by CamScanner

කරන්නා වූ රථවාහන සහ අශ්වාරෝහකයන් ද නොගැටෙන පරිද්දෙනි ආරුක්කු ඉදිකැර ඇත්තේ! මේ ආකාරයෙන් මාර්ග පහසුකම් සහ පාලම් නොතිබුණේ නම් විශාල ජනකායකගේ ගමනා ගමනයට ප්‍රබල බාධා ඇති වන්නට ඉඩ තිබිණි.

මේ නගරයෙන් ඈත එක් පාර්ශ්වයක විශාල ගැඹුරු දිය අගලක් තනා තිබේ. මෙය පුරාණයේ විසූ රජවරුන්ගේ ඉදිකිරීමකි. ගංවතුරෙන් නගරය යට නොවීම සඳහා යෙදූ උපක්‍රමයක් ලෙස හැඳින්විය හැකි ය. එසේම මේ දිය අගල සතුරු ආක්‍රමණයක දී ආරක්ෂාව සඳහා ද ප්‍රයෝජනවත් වේ. මෙකී දිය අගලේ එක් කෙළවරක් සම්බන්ධ වී ඇත්තේ විලට ය. දිය අගල ඉදිකිරීමේ දී සාරා ගොඩ ගැසූ පස් කඳු පෙළක් ලෙසින් දක්නට ලැබේ.

නගරය ඇතුළත විශාල වාණිජ චතුරස්‍ර දහයක් පිහිටුවා තිබේ. ඒ හැර ප්‍රධාන වීථිය දිගටම වෙළඳ ශාලා දක්නට හැකි ය. වාණිජ චතුරස්‍රයන්හි එක් පැත්තක් දිගින් සැතපුම් භාගයක් පමණ වේ. වෙළෙඳ පළ ඉදිරිපිටින් ඉදිකැර ඇති ප්‍රධාන වීථිය පතුළින් බඹ හතළිහක් තරම් වේ. එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා මේ ප්‍රධාන වීථිය සරල රේඛාවක් ලෙස විහිදේ. ගමනාගමනයට මගීන්ගේ පහසුව සඳහා එහි තැනින් තන පාලම් ඉදිකැර ඇත. සැතපුම් දෙකක විෂ්කම්භය තුළ වෙළෙඳ චතුරස්‍රය පිහිටියේ ය. සැතපුම් හතරෙන් හතරට මෙබඳු එක් වෙළෙඳ චතුරස්‍රයක් බැගින් පිහිටුවා ඇත්තේ ය. මෙකී වෙළෙඳ චතුරස්‍රයට පසු පසින් විශාල ඇළක් ගලා බසී. ඇළ මාර්ගයට සමීපව බඩු ගබඩා තනා ඇත. ඇළ මාර්ග දිගේ විවිධාකාර යාත්‍රාවලින් රැගෙන එන බඩු බාහිරාදිය ගොඩ බා මෙකී ගබඩාවන්හි තැන්පත් කැරේ. වෙළෙඳ පොළ පැවැත්වෙන දිනයන්හි දී මේ ගබඩා සංකීර්ණය නිසා වෙළෙඳුන්ට ඉමහත් පහසුවක් සැලසේ. සතියකට දින තුනක් බැගින් මේ වෙළෙඳපළ පැවැත්වෙයි. හතළිස් දහසක පනස් දහසක පමණ පාරිභෝගික පිරිසක් මේ පොළට පැමිණේ. ඔවුනට අවශ්‍ය කිනම් භාණ්ඩයක් වුවද මෙහි දී මිලදී ගැනීමට හැකි වෙයි.

මහා වීථියේ පිහිටි වෙළෙඳ ශාලාවන්හි දී මස් පිණිස ගන්නා සතුන් ද ඕනෑම වර්ගයක මස් ද මෙහි දී මිලදී ගත හැකි ය. සෑම වර්ගයකම මුවන් ද, ගෝනුන්, හාවුන්, වලිකුකුළන්, දිය කුකුළන්, වටුවන්, ඔලෙයියන්, කුකුළන් කිකිළියන්, තාරාවුන්, පාත්තයන්,

Scanned by CamScanner

කළුකුම් හා ජලචර පක්ෂීන් ද, ඇති කරන පක්ෂීන් ද බහුල වශයෙන් මෙහි විකිණේ. සෑම වර්ගයකම පක්ෂීන් මෙහි අප්‍රමාණ ලෙස විකිණීමට ඇත. රිදී පැන්සයකට තාරා ජෝඩු දෙකක් මිලදී ගත හැකි ය.

මස් මඩුවල ගවයන්, ගව පැටවුන්, එළුවන්, එළු පැටවුන්, බැටලුවන් ආදී විවිධ ගණයේ සිවුපාවන් මස් පිණිස මරනු ලැබේ. ඉහළ පෙළේ පොහොසත්තු මේ මස් වර්ග මිලට ගනිති. දිළිඳු පහත් පෙළේ ජනයා රැගෙන යන්නේ අපිරිසිදු මස් වර්ග ය. ඒවායේ අපිරිසිදු ස්වභාවය ගැන ඔවුන්ගේ තැකීමක් නැත.

ඉහත සඳහන් කළ වෙළෙඳ චතුරස්‍ර නිරන්තරයෙන් විවිධ එළවුළු වර්ගවලින් ද පලතුරු වර්ගවලින් ද පිරී ඉතිරී පවතී. විශේෂයෙන් සඳහන් කළ යුතු පෙයාර්ස් වර්ගයක් මෙහි තිබේ. මෙහි ඇතුළත මදය සුදු ය. මුදු මොළොක් ය. සුමිහිරි සුවඳින් යුක්ත වේ. එක් ගෙඩියක බර රාත්තල් දහයක් පමණ වේ. කහ පාට සහ සුදු පාට පීච් ද මෙහි බහුල ය. නොයෙක් පළාත්වලින් විකිණීම සඳහා මිදි වර්ග මෙහි ගෙනෙනු ලැබේ. එහෙත් මිදිවලින් වයින් පෙරන්නේ නැත. බත් හා කුළුබඩු ආශ්‍රය කොටගෙන මත්පැන් වර්ගයක් නිෂ්පාදනය කොට බීමට ගනිති. එය ඔවුන්ගේ දේශීය නිෂ්පාදනයකි.

මේ නගරයෙහි සිට මුහුදට ඇති දුර ප්‍රමාණය සැතපුම් පහළොවකි. මුහුදු මාළු විශාල තොග වශයෙන් මුහුදේ සිට යාත්‍රා මගින් ඇල මාර්ග ඔස්සේ මේ නගරයට සැපයේ. වැව් මාළු ද විල් මාළු ද මෙහි සුලභ ය. විල්වල ද, වැව්වල ද ධීවර කර්මාන්තයෙහි යෙදෙන පිරිස බොහෝ ය. ඔව්හු රැකියාවක් වශයෙන් ධීවර කර්මාන්තයෙහි යෙදෙති. විල් සහ වැව්වලින් අල්ලන මාළු වර්ග කාලගුණය හා ඍතු ගුණය අනුව විවිධාකාර වේ. එහෙත් හැම කාලයකම මත්ස්‍ය සම්පත සුලභ ය. නගරයෙන් බැහැර කරන අපද්‍රව්‍ය විල් වැව් ආදියට ගලා යාම නිසා සුලභ හා පුෂ්ටිමත් ලෙස මසුන් බෝවේ. විල් හා වැව්වලින් ගෙනෙන මසුන් සංඛ්‍යාව මවිතය දනවයි. මෙතරම් මසුන් සම්භාරයක් විකුණන්නේ කෙසේදැයි සැක සිතේ. එහෙත් කොපමණ මසුන් තොගයක් තිබුණත් ඉක්මනින් විකිණී යයි. අප්‍රමාණ පාරිභෝගික සංඛ්‍යාවක් පැමිණෙන බැවිනි. මිල අධික මාළු වර්ග ඉහළ පෙළේ ධනවත්තු රැගෙන යති. මස් මාළු දෙවර්ගයම මෙහි ජනයා කෑම මේසයට ගනිති.

Scanned by CamScanner

ඉහත සඳහන් වෙළෙඳ චතුරස්‍ර අසල ධනවතුන්ගේ නිවාස පිහිටා තිබේ. මේ නිවාසයන්හි බිම් මහලේ වෙළෙඳ ශාලා දැකිය හැකි ය. වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය කැරෙන අතර ඒ සියලු භාණ්ඩ අලෙවිය සඳහා ද තබා ඇත. කුළුබඩු වර්ග ඖෂධ වර්ග ආභරණ හා මුතු වර්ග ද මෙහි අලෙවි කැරේ. දේශීය මත්පැන් වර්ග ද මෙහි විකිණීමට ඇත. මේ වෙළෙඳ ශාලාවන්හි මත්පැන් පෙරනු ලැබේ. විවිධාකාර අලුත් බීම වර්ග පහසු මිලට ඔවුන්ගේ පාරිභෝගිකයන්ට සැපයේ.

මෙකී වෙළෙඳ චතුරස්‍රයනට මං මාවත් රාශියක් සම්බන්ධ ය. ඇතැම් වීථි අසල ඇල් දිය නෑමට සුදුසු වන පරිදි පහසුකම් සහිත ළිං ඉදිකැර ඇත. මේ ළිංවල ජලස්නානය කරන ස්ත්‍රී පුරුෂයන්ගේ ද, දරුවන්ගේ ද ශරීරවල කුණු උලා සුවඳ විලවුන් ආලේප කර ස්නානය කිරීම සඳහා සේවක සේවිකා පිරිසක් සැදී පැහැදී සිටිති. නෑමට යන අය හා මෙම සේවක සේවිකාවන් අතර ඉතා සුහද මිත්‍රත්වයක් ගොඩ නැගී ඇත. දීර්ඝ කාලයක් මුළුල්ලේ නිතිපතා මුණගැසී දැන හැඳුනුම්කම් පවත්නා බැවිනි. දිනපතා ඇල්දිය නෑම නිසා මනා සෞඛ්‍යයෙන් යුක්ත යයි කියමින් මෙහි ජනයා උදම් වෙති. ඇල්දිය පමණක් නොව උණුවතුර නෑමට ද මෙහි වෙන වෙනම ස්නානාගාර තිබේ. ඇල්වතුර නෑමට නුපුරුදු ජනයා උණුදිය නාති. මෙහි චාරිත්‍රයක් වශයෙන් දිවා භෝජනයට පෙර ස්නානය කිරීම පවත්වා ගෙන එයි.

මේ නගරයේ ඇතැම් මංමාවත් අසල ගණිකා නිවාස ඇත. ඔවුන් සංඛ්‍යා වශයෙන් විශාල ප්‍රමාණයකි. ප්‍රධාන වෙළෙඳ පළ අසල ද වෙනත් මං මාවත් අසල ද ඔවුන්ගේ නිවාස පිහිටියේ ය. මොවුන්ගේ නිවාස අලංකාර ය. ගෘහභාණ්ඩ විසිතුරු ය. ඉතා සුන්දර ඇඳුමෙන් පැළැඳුමෙන් සැරසී සුවඳ විලවුන් අංගරාග තවරා පියකරු විලාසිතාවෙන් මේ ගණිකාවෝ පෙනී සිටිති. පිරිමින් කාම සේවනයට පොළඹවා ගැන්මට මේ ගණිකාවන් සූර ය. කාම කලාවෙහි කූටප්‍රාප්ත වී සිටිති. මේ ස්ත්‍රීන්ගේ ආදර සංග්‍රහ විඳීමෙන් පිරිමි මෝහනයට පත්වෙති මේ ස්ත්‍රීන්ට වසඟ වූවෝ නැවත නැවත ඔවුන් කරා යෑමට පෙළඹෙති. කින්සායි පුරයෙන් නික්ම ගිය පසු ඔවහු නැවත නැවත එහි යෑමට කැමැති බව කියමින් ඒ පිළිබඳ සිහින මවති. ඔවුන් තම නිවෙස් කරා පැමිණි පසු කියන්නේ සුරපුරයට ගොස් පැමිණි බව ය.

Scanned by CamScanner

වෛද්‍යවරු ද, ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ ද අනෙක් අනෙක් මංමාවත්හි පදිංචිව සිටිති. මොවිහු දරුවනට අකුරු ඉගැන්වීමෙහි ද යෙදෙති. ඒ හැරුණු විට වෙනත් කලාවන් ද උගන්වනු ලැබේ. වෙළෙඳ චතුරස්‍රයන් අසල නිවාසයන්හි ද මෙවැනි නැකැත්කරුවන් සහ වෛද්‍යවරුන් සිටිනු දැකිය හැකි ය. මොවුන් සඳහා වෙනම කුටි වෙන් කැර ඇත්තේ ය. වෙළෙඳ චතුරස්‍ර ඉදිරිපිට විශාල ගොඩනැගිලි දෙකක් බැගින් තනා ඇත. මේ ගොඩනැගිලිවල රැඳී සිටිනුයේ අධිරාජයාගේ නිලධාරීන් ය. විදේශයන්ගෙන් හා වෙනත් ප්‍රදේශයන්ගෙන් පැමිණි වෙළෙඳුන් අතර හා නගරවැසියන් අතර කලබල අරගල ඇතිවේදැයි විමසා බැලීමේ අටියෙනි. පාලම්වල ආරක්ෂාව සඳහා මුරභටයෝ රඳවා සිටිති. පාලම්වල ආරක්ෂාව සඳහා යොදවා සිටින මුරකරුවන් තම රාජකාරි නිසි පරිදි ඉටුකැර නැතහොත් රාජකාරිය පැහැර හැර සිටියේ නම් ඒ ගැන සොයා බලා දඬුවම් කරනු ලැබේ.

සුරපුර වශයෙන් හැඳින්වෙන කින්සායි පුරවරයෙහි එක් සීමාවක සිට අනෙක් සීමාව දක්වා හරි මැදින් මහා මාර්ගයක් තනා ඇති බව මෙයට ඉහත දී ද මෙහි සඳහන් විය. මේ මහා මාර්ගය දෙපස අලංකාර ගස් කොළන් සිටුවා තිබේ. මේ ගස් කොළන් මලින් පලින් සරුසාර ය. විශාල මන්දිරයන් ද, නිවාසයන් ද, සුන්දර ගෙළයන් ද මේ මහා මාර්ගය දෙපස පිහිටියේ ය. ඒ අතර විවිධ කලාකරුවන්ගේ නිවාස ද ඇත්තේ ය. ඔව්හු නානා මාදිලියේ කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය කරති. ඇතැම් වෙළෙඳ ශාලා ඇතුළත ද විවිධ කර්මාන්ත පවතී. ඉහත සඳහන් කළ මහා මාර්ගය ඔස්සේ තම කටයුතු සඳහා නිරන්තරයෙන් ඔබ මොබ ගමන් ගන්නා ජනී ජනයා අපමණ ය. මෙතරම් ජන සේනාවකට ආහාර පාන සැපයීම බරපතල ගැටලුවක් බව පෙනී යයි. සතියකට තුන් දිනක් ගොඩබිමින් හා ජල යාත්‍රා මගින් රැගෙන එන බඩු බාහිරාදිය සතියකට තුන් දිනක පැවැත්වෙන පොළවල ගොඩගසනු ලැබේ. ඒ සියලු බඩුමුට්ටු සම්භාරය ඉතා ඉක්මනින් විකිණේ. එතරම් විශාල ජනසේනාවක් මෙතැනට රැස්වෙති. මේසා විශාල ජනකායකට කොපමණ බඩු මුට්ටු ආහාරපාන අවශ්‍ය වේදැයි සිතා ගැනීමට එක් උදාහරණයක් පමණක් මෙහි දැක්වේ. මෙහි ගම්මිරිස් විකිණෙන ප්‍රමාණය අනුව සලකා බලන කල්හි මස්, මාළු, කුළුබඩු සහ වෙනත්

Scanned by CamScanner

ආහාර පාන වර්ග කොපමණ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය වේදැයි සිතාගත හැකි ය. මේ වෙළෙඳ චතුරස්‍රයේ අධිරාජයාගේ බදු අයකරන නිලධාරියකුගෙන් මාර්කෝ පෝලෝ හට දැනගන්නට ලැබුණේ එක් දිනකට ගම්මිරිස් කරත්ත හතළිස් තුනක් අලෙවි වන බව ය. එක් කරත්තයක පටවන්නේ ගම්මිරිස් රාත්තල් 243 කි. ඒ අනුව ගණනය කිරීමේ දී එක් දිනකදී ගම්මිරිස් රාත්තල් 10450 ක් පමණ මේ නගරයේ අලෙවි කැරෙන බව පැහැදිලි වේ.

බුද්ධාගම අදහන්නා වූ මේ නගරයේ වැසියෝ අධිරාජයාගේ කඩදාසි මුදල් නෝට්ටු භාවිතා කරති. මෙහි ස්ත්‍රීන් ද, පුරුෂයන් ද මනා ඡවි වර්ණයෙන් යුක්ත ය. කඩවසම් ය. බොහෝ දෙනා ඇඳුම් පිළියෙළ කැරගෙන ඇත්තේ පට හා සේද රෙදිවලිනි. වෙළෙන්දෝ පට රෙදි හා සේද රෙදි විශාල තොග වශයෙන් මෙහි අලෙවිය සඳහා ගෙන එති. පට හා සේද රෙදිපිළි නිෂ්පාදනය බහුලව පවත්නා බැවින් මෙහි හිඟයකින් තොරව ලබාගත හැකි ය. මෙහි නිපදවන හස්ත කර්මාන්ත භාණ්ඩ දොළොස් වර්ගයක් සෙසු භාණ්ඩ අතින් උසස් ලෙස සැලකේ. එසේ වර්ග කැර ඇත්තේ සෙසු භාණ්ඩවලට වඩා බහුල වශයෙන් ප්‍රයෝජනයට ගැනෙන බැවිනි. ඉහත සඳහන් කැරුණු භාණ්ඩ එක් එක් වර්ගය නිපදවීම සඳහා කම්හල් දහස බැගින් පිහිටුවා තිබේ. කම්හල් දොළොස් දහසෙහිම සේවකයන් යොදවා ඇත. කර්මාන්තකාරයන් දහයක්, පහළොහක්, විස්සක් යනාදී වශයෙන් මේ කම්හල්හි සේවයෙහි යෙදේ. සමහර කම්හලක සේවකයන් හතළිහක් පමණ කටයුතු කරන්නාහ. මේ කර්මාන්තශාලා හිමිකරුවෝ කිසිදු වැඩක නොයෙදෙති. ඔවුන් ධනවතුන් වශයෙන් ආඩම්බර පෙනුමෙන් යුතුව සිටිනු පෙනේ. ඔවුන්ගේ භාර්යාවන් ද විසිතුරු අගනා වස්ත්‍රාභරණයෙන් සැරසී ලාලිත ගමනින් ඔබ මොබ යමින් නිකරුණේ කල් ගත කරන බව කිව යුතු ය. ඔවුන්ගේ රෙදිපිළි හා වෙනත් ආභරණ පළඳනා ආදියෙහි අගය මෙතෙකැයි කිව නොහේ.

මේ රටේ පුරාණ රජවරුන් නියම කෙළේ සෑම නගරබද මනුෂ්‍යයකුම තම පියා නිරත වූ රැකියාවෙහි යෙදීමට ය. එසේ කරන අතරතුරේ යම් පුද්ගලයකු ධනවත් වූයේ නම් කර්මාන්ත ශාලාවක් පිහිටුවා ගෙන සේවකයින් යොදවා යථෝක්ත කර්මාන්තය

Scanned by CamScanner

පවත්වා ගෙන යා යුතු බවට ද නිර්දේශ කරන ලද්දේ ය. ඔවුන් කැත්තේ උදැල්ලේ වැඩවල නොයෙදී කර්මාන්තයේ දියුණුවට කටයුතු කළ යුතු බවට උපදෙස් දෙන ලදී. නගර වැසියන්ගේ නිවාස අලංකාර දැව කැටයම් සහිතව නිර්මාණය කැර තිබේ. විවිධාකාර චිත්‍ර මෝස්තර සැරසිලි සහිතව නිවාස අලංකරණය සඳහා බොහෝ වියදම් කරති.

කින්සායි නගරයේ ස්වදේශිකයන්ගේ ජීවන රටාව සන්සුන් ය. මෙහි පුරාණ රජවරු සටන්කාමී නොවූහ. එහෙයින් ම නුවරුන්ගේ ජීවන ශෛලිය ද සාමකාමී විය. සාමය ගරු කරන නිහඬ දිවි පෙවෙතක් ගත කරති. යුද්ධායුද පරිහරණයට අකැමැති ය. ඔවුන්ගේ නිවාසයන්හි අවි ආයුධ යුද උපකරණ නැත. මෙහි ජනයා අතර අරගල, කලබල, මතභේද, ගැටුම්, කලකෝලාහල දක්නට නොමැත. වෙළෙඳ ව්‍යාපාරයන් ද, කර්මාන්ත ද පවත්වා ගෙන යන්නේ ඉතා ධාර්මික අවංක පදනමකිනි. එකම මාවතක වීදියක ජීවත්වන පවුල්වල සියලු දෙන සමගියෙන් සහෝදරත්වයෙන් කටයුතු කරති. ඔවුන් අතර ඊර්ෂ්‍යාව කුහක ගතිගුණ නැත. සිය භාර්‍යාවන් ගැන සැක නොකරති. විවාහක ස්ත්‍රියකට නොසරුප් බසින් කථාකරන තැනැත්තා සමාජයේ අවඥාවට ලක්වේ. වෙළෙඳ ව්‍යාපාර සඳහා මෙහි පැමිණෙන ව්‍යාපාරිකයනට පවා මොවුන් දක්වන්නේ සුහද අවංක මිත්‍රශීලි භාවයකි. ඔවුන් නිවසට කැඳවා ආගන්තුක සත්කාර කරති. ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙන්නාහ. එහෙත් ඔවුහු අධිරාජයාගේ යුද සෙබළුන් මුර භටයන් ආරක්ෂක සේවාවන්හි යෙදෙන්නවුන්ගේ දර්ශනය පවා අප්‍රිය කරති. ස්වදේශික රජුන් බලයෙන් පහකර බලය අත්පත් කැර ගැනීම ගැන කුබ්ලායි ඛාන් හා ඔහුගේ යුද භටයන් ගැන අප්‍රසාදය ඔවුන්ගේ සිත්හි ගැඹුරින් පැලපදියම් වී ඇත.

කින්සායි නගරයේ දකුණු දෙසින් පිහිටි මහා වැව අසල විශාල මන්දිර සමූහයක් දක්නට ලැබේ. ප්‍රභූවරුනට ද වංශාධිපතීනට ද විනිශ්චයකාරවරුනට ද වෙනත් උසස් රාජ්‍ය නිලධාරීනට ද මේ මන්දිර හිමි ය. ඒ අතර පූජ්‍යස්ථාන ද ඉදිකැර තිබේ. මේ පූජ්‍යස්ථානයන්හි ආගමික කටයුතුවල නිරත භික්ෂූන් වහන්සේ වෙසෙති. මෙකී විශාල වැව මධ්‍යයේ දූපත් දෙකක් පිහිටා තිබේ. මේ දූපත් දෙක ඇතුළත විශාල ගොඩනැගිලි දෙකක් දක්නට ලැබේ.

Scanned by CamScanner

ඒ ගොඩනැගිලි ඇතුළත කාමර රාශියකි. කාමර සහිත මන්දිර උත්සව ශාලා වශයෙන් භාවිතා කැරේ. මෙහි වෙසෙන ජනයාගේ මංගල උත්සව හෝ වෙනත් උත්සවයක දී ඉහත කී කාමර සහිත මන්දිර ප්‍රයෝජනයට ගැනෙයි. මංගල උත්සවයකට අවශ්‍ය පුටු මේස පිඟන් කෝප්ප හැඳි අත් පිස්නා මේස රෙදි යනාදී සියල්ල නොඅඩුව එහි ඇත්තේ ය. නගරවැසියන්ගේ පොදු මුදලින් මෙකී භාණ්ඩ සියල්ල එහි සපයා දී ඇත. ගොඩනැගිලි උත්සව ශාලා යනාදී සියල්ල ඉදිකැරුණේ ද නගර වැසියන්ගේ පොදු මුදලිනි. කණ්ඩායම් සියයකට එකවර මේ එක් දූපතක රැස්වී උත්සව ප්‍රීතිය භුක්ති විඳීමට රිසි පරිදි පහසුකම් තිබේ. උත්සව කිහිපයක් වුව ද එහි වෙන වෙන ම පැවැත්වීමට පුළුවන. එයට අදාළ බඩු මුට්ටු කිසිවක් එහි අඩුපාඩු නැත.

ඒ හැරුණ විට මේ වැව පුරා විනෝද යාත්‍රා සඳහා කුලියට සපයන ජල යාත්‍රා ඇත. එබඳු යාත්‍රා රාශියකි. එකවර දස දෙනකුට, පසළොස් දෙනකුට හෝ විසිදෙනකුට ගමන් කළ හැකි යාත්‍රා රාශියක් කුලියට දීමට මෙහි තිබේ. ජනේල දොර පියන් සවිකළ යාත්‍රා ඇතුළත මේස පුටු තබා ඇත්තේ සුව පහසුවෙන් වැවේ සිරි නරඹන්නවුන් සඳහා ය. රිසි පරිදි ආහාර පාන රස විඳිමින් වැවේ සිරි නරඹා විනෝදවීමට සියලු පහසුකම් තිබේ. ස්වාමිවරුන් භාර්යාවන් දූ දරුවන් සමග ද, පෙම්වතුන් පෙම්වතියන් සමග ද, යහළු යෙහෙළියන් සමග ද මේ යාත්‍රාවන්හි නැගී ඔබ මොබ සැරි සරමින් විනෝද වෙති. ඒ යාත්‍රා ඇතුළත පිරිසිදු ය. පිළිවෙළකට ආසන පනවා තිබේ. ගමනේ දී කිසිදු ප්‍රමාද දෝෂයක් ඇති නොවේ. සියලු දැව භාණ්ඩ සුදුසු ලෙස තබා ඇත. මෙකී යාත්‍රාවන්හි පැතලි වහලයකි. එය ඉහළ තට්ටුවක් බඳු ය. බෝට්ටු පදවන්නෝ එහි නැගී රිටිවල වාරුවෙන් පැදගෙන යති. වැවේ ගැඹුර බඹ දෙකකට වැඩි නොවේ. කැමැති තැනක මේ බෝට්ටු නවතා තැබීමට පුළුවන. යාත්‍රා තුළ කාමර ඇතුළත විවිධ සතුන්ගේ රූප සටහන් සිත්තම් කැර තිබේ. යාත්‍රාව මුළුමනින්ම පින්තාරු කැර තිබේ. විවිධාකාර සිත්තමින් අලංකාර ය. මේ යාත්‍රාවන්හි දොර කවුළු තමන් රිසි පරිදි වසා තැබීමට හෝ විවෘත කිරීමට හැකි ය. අවට සිරි නැරඹීමට කැමැති සංචාරකයන්ට මේ ගමනේ දී මාලිගා, විශාල මන්දිර වෙහෙර විහාර පූජ්‍යස්ථාන වනාන්තර මලින් පලින් බර රුක් ලියගොමු

ආදී සියල්ල දැක ආස්වාදයක් ලද හැකි ය. මේ වැව එක් පාර්ශ්වයකින් නගරයේ එක් සීමාවක් දක්වා විහිදේ. එබැවින් වැවේ යාත්‍රා කරමින් බොහෝ සුන්දර දැකුම්කළු දෑ නැරඹීමට පුළුවන. එසේම වැවේ තවත් යාත්‍රාවලින් ගමන් ගන්නා විනෝදකාමීන්ගේ දර්ශනය ද ආස්වාද ජනක ය.

මෙහි වසන ජනයා දවස කෙළවර ව්‍යාපාරික කටයුතු රාජකරි කටයුතු නිම කර අඹු දරුවන්, හිතවතුන්, මිතුරු මිතුරියන් සමග කණ්ඩායම් වශයෙන් වැවේ යාත්‍රාවන්හි නැගී ඔබ මොබ සැරිසරමින් විනෝද වීම පුරුද්දකි. නැතහොත් රථවාන වල නැගී නගරය වටරවුම් ඔස්සේ සංචාරය කරමින් විනෝද වෙති. එසේම ඔවුන් විනෝද සංචාරයන්හි යෙදෙන මංමාවත් පිළිබඳව ද කරුණු සඳහන් කළ යුත්තේ ය. මෙහි සියලු මාර්ග ගල් හා ගඩොළු අතුරා මනා ලෙස සකස් කැර තිබේ. පදික වේදිකාවන් ද මනා ලෙස ද, අලංකාර ලෙස ද තනා ඇත. පාදවල මඩ තවරා නොගෙන මගී ජනයාට ඔබ මොබ ගමන් කළ හැකි ය. අධිරාජයාගේ පණිවුඩ රැගෙන අධි වේගයෙන් ගමන් ගන්නා අධිරාජයාගේ අශ්වාරෝහකයන් සඳහා මහා මාර්ගයන්හි එක් පැත්තක් ගල් අතුරා වෙන් කැර තනා තිබේ. වේදිකා මතින් අශ්වයන්ට අධි වේගයෙන් ගමන් කළ නොහැකි බැවිනි. කින්සායි සිට මන්සි දක්වා මේ මාර්ගය විහිදේ. ප්‍රධාන මාර්ගයේ එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා එක් පාර්ශ්වයක යාර දහයක පමණ කොටසක් ගල් හා ගඩොළු අතුරා විශේෂ ආකාරයකට තනා තිබේ. අනෙක් පාර්ශ්වය ද ඒ අයුරින් තනා ඇති අතර මද කොටස කුඩා ගල් බොරලු අතුරා තිබේ. වැසි වතුර ඒ ඔස්සේ ගලා බැස යන පරිදි බෝක්කු තනා තිබේ. වැහි වතුර මේ හේතුවෙන් ඉක්මනින් ගලා බැස මහා මාර්ගය වියළී යන්නේ ය. යාන වාහන ඒ මේ අතට ගමන් කරනුයේ මෙකී බොරලු මං තීරුව ඔස්සේ ය. මගී වාහන දිගටි ය. මුදුන වියනකින් ආවරණය කැර තිබේ. හාත්පස තිරවලින් ආවරණය කැර ඇත ආසන සේද රෙදිවලින් අලංකාර ලෙස ආවරණය කැර ඇත. මෙකී වාහන ඇතුළත එක් පේළියකට හය දෙනකුට අසුන් ගත හැකි ය. මෙහි ජනයා මෙවැනි වාහන කුලියට ගෙන ඇත. ප්‍රදේශයන්හි විනෝද සංචාරයන්හි යෙදති. ජනයාගෙන් පිරීගත් මෙබඳු කුලී රථ විශාල සංඛ්‍යාවක් දිනපතා නිරන්තරයෙන් ඔබ මොබ ගමන් කරන

Scanned by CamScanner

ආකාරය දැකිය හැකි ය. ඇතැම් විනෝදකාමීහු විනෝද උද්‍යාන කරා යති. මෙකී විනෝද උද්‍යාන උයන් වතු පිළියෙළ කැර ඇත්තේ විනෝදකාමීන් සඳහා ම ය. මේවායෙහි පාලනය උද්‍යාන හිමියන් සතු ය. විනෝදකාමීන් යා යුතු ස්ථානය රියැදුරන් හට කී විට ඔවුන් ඒ ඒ ස්ථාන කරා ලියගොමු වෙත ගෙනයනු ලැබේ. ලියගොමු හොඳින් ආවරණය වී තිබෙන බැවින් ස්ත්‍රීන් පුරුෂයන් එහි දවස මුළුල්ලේ ගත කරන්නේ විනෝදයෙහි. ඇඳිරි වැටෙන විට ඔව්හු ආපසු යති.

මේ නගරයේ කිසියම් පවුලක දරු උපතක් සිදුවූ වහා ම දරුවා උපන් දිනය වේලාව පැය විනාඩි වශයෙන් සටහන කැර ගැනේ. අනතුරුව මේ සටහන් රැගෙන ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයකු වෙත ගොස් 'හඳහන' හෙවත් ජන්මපත්‍රය සාදා ගනු ලැබේ. අනතුරුව මේ ජන්ම පත්‍රය පරීක්ෂා කරන ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයා දරුවාගේ අනාගතය අධ්‍යාපනය රැකියාව විවාහය අනාගත දියුණුව ආදී තොරතුරු විමසා දැනගනිති. ජ්‍යොතිර්විද්‍යාඥයාගේ අනාවැකි මෙහි ජනයා විශ්වාස කරති. කේන්ද්‍ර පලාඵල බොහෝ විට සත්‍ය බව ඔවුන්ගේ පිළිගැනීමයි. මෙහි වැසියෝ ජ්‍යොතිෂ්ශාස්ත්‍රය නැකැත් සහ අනාවැකි තදින් විශ්වාස කරති. වෙළෙඳ චතුරස්‍රයන්හි මෙකී ජ්‍යොතිෂවේදීහු රැඳී සිටිති. විවාහ මංගල උත්සව පවත්වන්නේ ජ්‍යොතිර්විද්‍යාඥයන්ගේ උපදෙස් හා නිර්දේශ අනුව ය.

මේ ප්‍රදේශයේ ධනවතකු හෝ ප්‍රභුවරයෙකු මියගිය කල්හි පවත්වන්නා වූ අවමංගල්‍ය චාරිත්‍රයන්හි විශේෂත්වයක් පවතී. ඥාතියකුගේ වියෝවෙහි දී ස්ත්‍රී පුරුෂ සියලු දෙනා දළ වස්ත්‍රයෙන් සැරසෙති. අනතුරුව සියලු දෙනා එක්ව මෘතදේහය රැගෙන සුසාන භූමියට යති. මෙසේ ගමන් ගන්නා අතර තුර තූර්යවාදන පවත්වති. යාඥා ගීතිකා ගායනා කරති. මෘතදේහය ආදාහනයට සූදානම් වන විට සියලු නෑදෑයෝ කඩදාසිවල අඳින ලද ස්ත්‍රී පුරුෂ මෙහෙකරුවන්ගේ රූ සටහන් ද, අශ්ව රූප, ඔටු රූප ආදී චිත්‍ර සඳහන් වස්ත්‍ර ද රන් රිදී කාසි හා වෙනත් දෑ දර සෑයට දමති. මියගිය තැනැත්තා මතු ආත්ම භාවයේ දී උපභෝග පරිභෝග වස්තු සම්පත් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මේ චාරිත්‍රය පවත්වන්නාහ. චිතකයට ගිනි දැල්වීමත් සමග සියලු තූර්ය භාණ්ඩ එකවර වාදනය කරමින් මහා ශබ්දයක් සෑහෙන වේලාවක් පවත්වති. මේ ශබ්දය

Scanned by CamScanner

පවත්වන්නේ අහසේ සිටින දෙවියන්ට ඇසෙන පරිද්දෙනි. ශරීරය දැවුණු පසු දෙවියන් පැමිණ මියගිය තැනැත්තාගේ ආත්මය සුඛිත මුදිත පරිපූර්ණ ජීවිතයක් බවට පත් කැරෙතියි ඔවුහු විශ්වාස කරති.

මේ නගරයේ සෑම මාවතක ම ගලෙන් තැනූ අට්ටාල හෙවත් ආරක්ෂක ගෙවල් රාශියකි. යම්කිසි තැනෙක කිසියම් හේතුවකින් හදිසි ගින්නක් ඇතිවුවහොත් වැසියන්ගේ වටිනා බඩු බාහිරාදිය මේ අට්ටාල වෙත ගෙන ගොස් ආරක්ෂිතව තැබිය හැකි ය. මේ නිවාස බොහොමයක් තනා ඇත්තේ දැවයෙනි. එබැවින් ගිනිගැනීම් සිදුවේ. ප්‍රධාන පාලම් සියල්ලෙහිම උඩ කොටසෙහි මුර කුටි තනා තිබේ. රාත්‍රියෙහි මුරකරුවන් පස් දෙනකු ද දහවලෙහි පස් දෙනකු ද බැගින් මෙහි සේවයෙහි යෙදේ. මෙය අධිරාජයාගේ ආඥාවකි. සෑම මුර කුටියකම විශාල ශබ්දයක් නිකුත් කළ දැවමුවා බෙරයක් තිබේ. එසේම ලෝහමය ගංඨාරයක් වැනි උපකරණයක් ද ඇත. වේලාව සටහන් කැරගත හැකි වේලාව දක්වන පැතැටියක් ද මුරකුටිවල ඇත. හිරුබැස ගොස් පළමු පැය ගත වූ වහා මුරහටයෝ කුටිය තුළ ඇති බෙරයට මුගුරකින් පහර දී සන්ධ්‍යාවේ පළමු පැය ගෙවුණු බව හඟවති. එසේම ගංඨාරයත් වරක් නාද කරති. එවිට එම වීදියේ සිටින සියලු ජනයා වේලාව දැනගනිති.

ඊළඟ පැය ගෙවුණු පසු පෙර සේම දැව බෙරයත් ලෝහ ගංඨාරයත් දෙවරක් නාද කරවති. එවිට දෙවැනි පැය ගෙවුණු බැව් පුරවැසියෝ දැනගනිති. මේ අයුරින් රාත්‍රිය මුළුල්ලේ පැයෙන් පැයට ගංඨාරයේ හඬ ද දැව බෙරයේ හඬ ද පැතිරේ. මේ මුර සේවයෙහි යෙදී සිටිනවුන්ට රාත්‍රියේ නිදාගැනීම තහනම් ය. අරුණෝදයත් සමග පෑ තැටියේ උදයේ පැය ආරම්භ වූ වහාම යළිත් සංඥා නාදය නිකුත් කරති. දහවල් කාලය මුළුල්ලේම යථෝක්ත සංඥා නාදය නිකුත් කරමින් ජනතාවට වේලාව හඟවති. ඒ වීදිය භාර මුරකරුවෝ නිවෙසක් පාසා රාත්‍රියේ ගමන් කරමින් නියමිත වේලාවට ගිනි නිවා පහන් නිවා ඇත්දැයි පරීක්ෂා කරති. කිසියම් නිවසක රාත්‍රියේ අවේලාවෙහි ගිනි දල්වා, පහන් දල්වා ඇත්නම් මුරකරුවෝ ඒ ගෙහි සලකුණක් තබා යති. පසුවදා ඒ ගෙහි ප්‍රධානියා අධිකරණයට ඉදිරිපත් කැරේ. එසේ අවේලාවෙහි පහන් දැල්වීමට සාධාරණ හේතුවක් ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් දඬුවම් කරනු ලැබේ. රාත්‍රියෙහි නිවසෙහි රැඳී සිටීමට නියමිත කාලයෙහි

Scanned by CamScanner

බැහැර ගොස් සිටින පුද්ගලයන් අල්ලා අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කැර දඬුවම් නියම කැරේ.

කිසියම් ආබාධයක් හේතුකොට ගෙන කිසියම් පුද්ගලයකු දුබලව සිටින බව පෙනී ගියහොත් රාජ්‍ය නිලධාරීහු ඔහු රෝහලකට රැගෙන යති. රටේ හැම තැනම රෝහල් පිහිටුවා තිබේ. මෙකී රෝහල් පිහිටුවන ලද්දේ පුරාණ රජදරුවන් විසිනි. අත්‍යවශ්‍ය සියලු පහසුකම් මේ රෝහල් හි ඇත. රෝගියා සුවපත් වූ පසු ඔහු කිසියම් රැකියාවක් වෙළෙඳ ව්‍යාපාරයක් කළ යුතු ය.

කිසියම් ස්ථානයක ගින්නක් හට ගත හොත් නගරාරක්ෂක නිලධාරීහු ලී බෙරයට ගසා සංඥා නිකුත් කරන්නාහ. එවිට අට්ටාල වල රැඳී සිටින මුර කාරයෝ කඩිනමින් එතැනට ගොස් ගින්න නිවා දමති. අසල්වැසි නිවසයන්හි ද වෙළෙඳ ශාලාවන්හි ද ඇති බඩුබාහිරාදිය වහා අට්ටාල වෙත ගෙන ගොස් ආරක්ෂාව සලසති. සමහර විට ඇතැම් වෙළෙඳ බඩුමුට්ටු වැව මැද ඇති බෝට්ටුවලට පටවති. ගින්න නිවා දැමීම සඳහා සෙසු ජනයා ද එක්රැස් වී සහයෝගය දෙති. උදව් කරති. මෙම අවස්ථාවට ජනීජනයා දෙදහසක් පමණ එක් රැස් වේ. ගින්නෙන් ආපදාවට පත් නිවාස කඩා දැමීමට ඔවුන් කැමැති නැත.

නගරවැසියන් අතර ආරවුලක් අරගලයක් කලකෝලාහලයක් ඇති වුවහොත් පොලිසිය වහා එතැනට පැමිණේ. එහෙත් කැරැළි කෝලාහල මැඩ පැවැත්වීම සඳහා අධිරාජයාගේ සන්නද්ධ හමුදා සීරුවෙන් තබා ඇත. විශාල පාබල සේනාවක් සහ අශ්වාරෝහක හමුදා මේ සඳහා යොදවා තිබේ. මේ හමුදාවන්හි ප්‍රධානත්වය උසුලනුයේ අතිදක්ෂ ශූර විශ්වාසවන්ත හමුදා භටයන් ය. අලංකාරයෙන් ද, ධනයෙන් ද ලෝකයේ සියලු නගර පරදවන බැවින් මෙහි ආරක්ෂාව කෙරෙහි අධිරාජයාගේ විශේෂ අවධානය යොමුවී පවතී. රාත්‍රී මුර සේවය සඳහා සැතපුමකට එකක් බැගින් ඒ ඒ ස්ථානයන්හි පස් කඳු ගසා ඊමත ශබ්ද විකාශන පුවරු තනා තිබේ. මේ ශබ්ද විකාශන පුවරු දැව මුවා රාමුවකි. මිටියක් වැනි උපකරණයකින් එයට පහර දෙන හඬ බොහෝ දුරට විහිදේ. මෙය ආරක්ෂක විධි විධානයක් ලෙස ක්‍රියාත්මක වෙයි. හදිසියේ ගින්නක් ඇති වුවහොත් මේ ශබ්ද විකාශන යන්ත්‍රයේ උපකාරයෙන් පුරවැසියන්ට ඒ බව දැන ගත හැකි වේ. එවිට අට්ටාලවල සිටින

Scanned by CamScanner

මුරභටයෝත් සෙසු නිලධාරීත් මහජනයාත් එතැනට රැස්වී ගින්න නිවා දැමීමට යුහුසුළු වෙති. එසේ නොවේ නම් සමස්ත පුරවරයෙන් අඩක් පමණ ගින්නෙන් විනාශ වීමට ඉඩ තිබේ. හදිසි අවස්ථාවන්හි දී අට්ටාල මත රැඳී සිටින මුරභටයෝ ද අවි ආයුධ රැගෙන අදාළ ස්ථාන කරා කඩිනමින් පැමිණෙති.

මන්සි ප්‍රදේශය අධිරාජයාගේ ග්‍රහණයට පත්වන තුරු පැවැතියේ එකම රාජ්‍යයක් වශයෙනි. පසුව එය පළාත් නවයකට බෙදා ප්‍රාදේශීය අධිපතියකු බැගින් පත් කරන ලද්දේ පාලනයේ පහසුව සලකමිනි. ආණ්ඩුකාරයකු හෝ ප්‍රතිරාජයකු හැටියට මේ පාලකයා කටයුතු කරන්නෝ ය. වාර්ෂිකව මේ පාලකයෝ ආදායම් සහ ප්‍රදේශයෙහි වෙනත් අත්‍යවශ්‍ය කටයුතු පිළිබඳ සවිස්තර වාර්තාවක් ලේඛනයක් අධිරාජයා වෙත ඉදිරිපත් කරති. වසර තුනෙන් තුනට මේ පාලකයන් වෙනත් ස්ථාවල රාජකාරි සඳහා මාරුකැර යැවේ. වෙනත් පහළ නිලධාරීන් ද එලෙසින් ම වසර තුනෙන් තුනට වෙනත් ස්ථානවල රාජකාරියට මාරු කිරීම නීතියකි.

ආණ්ඩුකාරයන් නව දෙනා අතරින් එක් අයෙක් කන්සායි නගරයේ මන්ත්‍රණ සභාවක් පිහිටුවී ය. ඔහු යටතේ මහනගර හා කුඩා නගර එකසිය හතළිහකට අධික සංඛ්‍යාවක් ඇත්තේ ය. මේ නගර බොහොමයක් ඉතා විශාල ය. යස ඉසුරින් පිරී පවතී. මහ නගර සහ සුලු නගර විශාල සංඛ්‍යාවක් ඇති බැවින් ජනගහනය ද අධික ය. හස්ත කර්මාන්ත වාණිජ ව්‍යාපාර බහුල වශයෙන් පවත්නා ප්‍රධාන නගර ද කුඩා නගර ද එක්දහස් දෙසියයකට අධික සංඛ්‍යාවක් මන්සි ප්‍රදේශයෙහි පමණක් ඇත්තේ ය.

නගරයන්හි විශාලත්වය ජනගහනය ධනය යනාදි සියල්ලට අනුරූප වන පරිද්දෙන් ආරක්ෂක හමුදා යොදවා තිබේ. හමුදා භටයන් දහසක්, දස දහසක්, විසි දහසක් තරම් සේනා මෙහි සංවිධානය කැර ඇත්තේ ය. ටාටර්වරුන් පමණක් නොව ස්වදේශික භටයන් ද මේ සේනාවනට ඇතුළත් ය. බහුතරය ස්වදේශික භටයෝ ය. ටාටර් අශ්වාරෝහකයන් සූරයන් බව ලෝක ප්‍රසිද්ධ ය. මේ පළාතේ පහත් බිම් වගුරු සහිත ය. මඩ ගොහොරු ය. මේ ස්ථාන අශ්වාරෝහක හමුදා රඳවා තැබීමට අයෝග්‍ය ය. වියළි පස සහිත කඳුකර ප්‍රදේශ අශ්වාරෝහක හමුදාවනට සුදුසු ය. අසරු හමුදාවන්ගේ සරඹ සඳහා මෙබඳු ප්‍රදේශ යෝග්‍ය සේ සැලැකේ.

Scanned by CamScanner

කන්සායි ප්‍රදේශයේ අධිපතියා වෙත කුබ්ලායි ඛාන් යැවූයේ කැතේ වැසියන්ගෙන් සමන්විත හමුදාවකි.

මන්සි පළාතේ ද යුද හමුදා සේවයට සුදුසු පුද්ගලයන් සිටින බැවින් අධිරාජයා වාර්ෂිකව ඒ පළාතේ පිරිමින් ද හමුදා සේවයට බඳවා ගැනීමට අවසර දුනි. සෙසු යටත් ප්‍රදේශවල සේවය කිරීමට මොවුන් පත්කැර යවනු ලැබේ. මන්සි ප්‍රදේශයෙන් බඳවා ගන්නා යුද හටයන් ඒ ප්‍රදේශයේම පමණක් සේවයේ යොදවන්නේ නැත. ඔවුන් සේවයෙහි යොදවන්නේ දින විස්සක් පමණ ගමන් කළ යුතු දුරබැහැර ප්‍රදේශයන්හි ය. වසර හතරක් හෝ පහක් ඔවුන් ඒ ඒ පළාතෙහි සේවය කළ යුතු වෙයි. මේ කාල සීමාවන් ඉක්මවූ පසු ඔවුනට සිය ගම් ප්‍රදේශ වෙත පැමිණීමට හැකි වේ. ඒ වෙනුවට වෙනත් හටයන් පිටත් කර යැවෙයි.

කැතේ ජාතිකයන්ට ද සමාන අන්දමින් හටයන්ගේ මාරුවීම් ක්‍රමය බල පැවැත්වෙයි. නොයෙක් ප්‍රදේශවලින් විවිධාකාරයෙන් අය කැර ගන්නා බදු මුදලින් වැඩි කොටසක් වැය වන්නේ අධිරාජයාගේ යුද හමුදා නඩත්තු කිරීම සඳහා ය. කිසියම් අයුරකින් යම්කිසි නගරයක අරගලයක් හෝ කැරැල්ලක් ඇති වුවහොත් හදිසි කෝපයෙන් හෝ බීමත්කමින් ආණ්ඩුකාරයා ඝාතනය කළ හොත් හෝ එබඳු කලබැගෑනියක් සිදුවූ ප්‍රදේශය විනාශ කැර දැමීමට නියම කැර තිබේ. මෙවැනි අරගල බොහෝ විට ඇතිවිය හැකි බවට විශ්වාසයක් පවතී. එක් නගරයක් එසේ විනාශ කළ පසු ඊළඟ නගරයට ද හමුදාවක් පිටත් කැර යවනු ලැබේ. මෙසේ යවන්නේ අසල පිහිටි හමුදා සේනාංකයකි. එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට හමුදාවක් යැවීමට සෑහෙන කාලයක් ගතවෙයි. ඇතැම් විට මාස දෙකක පමණ කාලයක් මේ සඳහා වැයවේ. මේ කරුණු හේතුකොට ගෙන කින්සායි පුරවරයේ නිරන්තරයෙන් ම තිස් දහසක පමණ හමුදාවක් රඳවා තිබේ. හටයන් දහසක සේනාව අවම වශයෙන් සැලැකිය හැකි ය.

අධිරාජයාගේ පාලනයට යටත් වීමට පෙර මේ දේශය පාලනය කෙළේ ෆැක්පර් නමැති රජෙකි. හෙතෙම වාසය කෙළේ අත්‍යාලංකාර මාලිගයක ය. අනතුරුව මා විස්තර කන්නේ ෆැක්පර් රජුගේ මාලිගය පිළිබඳව ය. ෆැක්පර් රජුගේ පරපුරෙහි ආදි කාලීන රජවරුන් මේ මාලිගය පිහිටි සැතපුම් දහයක පමණ භූමි ප්‍රදේශය

Scanned by CamScanner

වටා උස් ප්‍රාකාරයක් ඉදිකැර ඇත්තේ ය. අභ්‍යන්තර භූමිභාගය ප්‍රධාන කොටස් තුනකට බෙදා තිබේ. ඒ මධ්‍යයේ උස් වූ ද, විශාල වූ ද ආරුක්කු සහිතව වාහල් දොරටුව ඉදිකැරිණ. ඒ දෙපස අලංකාර ස්තම්භ දෙපේළියක් තනා තිබේ. ස්තම්භ දෙපේළිය මැදින් රාජසභා මණ්ඩපයට ගමන් ගන්නා අලංකාර වේදිකාවක් බඳු මාවතකි. මේ පටු මාර්ගයට ඉහළින් විසිතුරු වියනක් තනා තිබේ. මේ වියන රන්කම් රිදීකම් සැරසිලි මෝස්තර රූ රටා සහිත ය. මාලිගයට පිවිසෙන දොරටුවෙහි සිට, රාජ සභා මණ්ඩපය දක්වා අලංකාර ස්තම්භ පේළියකි. මේ ස්තම්භ පේළිය සෙසු ස්තම්භවලට වඩා අලංකාර ප්‍රතාපවත් පෙනුමෙන් යුක්ත ය. එහි තනා ඇති වියන අත්‍යලංකාර ය. රන්කම් රිදීකම් විසිතුරු සිතුවම් මල්ලියකම් රූ රටා සහිත ය. ස්තම්භ විසිතුරු මල්ලියකම් සහිත රන් තහඩු ඔබ්බා සරසා ඇත. අභ්‍යන්තර බිත්ති පුරාණ රජදරුවන් මූර්තිමත් කැරෙන සිතුවමින් ද විවිධ චිත්‍ර සැරසිලි ආදියෙන් ද සමලංකෘත ය. මෙහි වාර්ෂික ප්‍රතිමා අභිෂේක පූජා උත්සවයක් පැවැත්විණ. රජතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ සභාව පැවැත්වෙනුයේ මේ උත්සවයෙන් අනතුරුව ය. එසේම වංශාධිපතීන්ට රදලයනට විනිශ්චයකරුවනට හා ධනවත් ප්‍රභූවරුනට රාජකීය භෝජන සංග්‍රහයක් පැවැත්විණ. ඉහතදී මෙහි සඳහන් කැරුණු විචිත්‍ර තේජාන්විත පෙනුමෙන් යුතු ස්තම්භ සහිත මනා රජකීය මන්දිරයේ දස දහසකට එක්වර රැස්වී අවහිරයෙන් තොරව භෝජන සංග්‍රහය භුක්ති විඳීමට පහසුකම් සලසා තිබේ. ප්‍රතිමා අභිෂේක පූජා මංගල්‍යය ද රාජකීය භෝජන සංග්‍රහය සහිත උත්සවය ද දස දිනක් හෝ දොළොස් දිනක් මුළුල්ලේ පැවැත්වෙයි. මේ උත්සව කාලයෙහි අලංකාර පටපිළි සේද පිළි රන්කම් රිදීකම් කළ සළු පිළී මුතුමැණික් ස්වර්ණාභරණ ඇඳුම් ආයිත්තම් ආදි විවිධ භාණ්ඩ ප්‍රදර්ශනය කැරේ. මේ භාණ්ඩයන්හි වටිනාකම මෙතෙකැයි කියා නිම කළ නොහේ. උත්සවයට සහභාගිවන්නෝ ද තම වත් පොහොසත්කම් අනුව ඉස්තරම් ඇඳුම් පැළඳුමෙන් සැරසී පැමිණෙති.

ඉහත සඳහන් කැරුණ අලංකාර ස්තම්භ පේළියට පිටුපසින් ප්‍රධාන වාසල් දෙරටුව ඉදිරිපසින් පටු පිල්කඩක් ද ප්‍රාකාරයක් ද ඉදිකැර ඇත. රජමැදුරේ බාහිර රාජ සභා මණ්ඩපයත් අභ්‍යන්තර මාලිගාවත් වෙන් වන්නේ මේ ප්‍රාකාරයෙනි. අනතුරුව ඉතා පියකරු සක්මන් මලුවක් ද ඇත. ඒ වටා තවත් අලංකාර ස්තම්භ පේළියකි.

Scanned by CamScanner

අලංකාර වියනක් සහිත වේදිකාවක් වැනි පටුමං පෙතකි. මේ මංපෙත ඔස්සේ රජු ට ද බිසොවට ද මාලිගයේ විවිධ පාර්ශ්ව කරා ගමන් කළ හැකි වේ. මේ සියලු ස්තම්භ අතිශයින් අලංකාර ලෙස නිර්මාණය කැර තිබේ. රජමැදුරේ අභ්‍යන්තර බිත්ති සියල්ල ඉතා අලංකාර ලෙස විසිතුරු සිත්තමින් ලියකමින් රූ රටාවෙන් සරසා තිබේ. මෙහි සිට ඉදිරියට ගමන් කළ විට බිත්ති දෙකක් අතුරින් පිහිටි පටුමගක් හමුවේ. එය උමගක් බඳු ය.. යාර හයක් පමණ මේ පටුමග ඔස්සේ ඉදිරියට ගමන් කළ විට මගුල් පොකුණේ ඉවුරට ළඟාවිය හැකි වේ. ඉහත කී පටු මං පෙතෙහි දෙපස තැනින් තැන දොරටු ඇත. මේ දොරටු තුළින් අන්තඃපුරයට පිවිසීමට හැකි ය. ඇතොවුර දෙසට යොමුවන මං පෙත් සක්මන් මළු බඳු ය. ඒ දෙපස කැටයම් ස්තම්භ ද විසිතුරු වියන් ද තනා තිබේ. විශාල අලංකාර කුලුණු ද පියසි සහිත ද්වාර මණ්ඩප ද රජ මැදුරු වටා තනා තිබේ. එක් රාජ මන්දිරයක් තුළ කාමර පනහකි. සෑම මන්දිරයකම අලංකාර ගෘහාංගනයක් උද්‍යානයක් බැගින් තිබේ. මේ මන්දිර තුළ රජුගේ සේවය සඳහා රූබර කාන්තාවෝ දහසක් සිටිති.

රජතුමා ඇතැම් විට බිසොවක සමග ද නැතහොත් තරුණ කාන්තාවන් සමූහයක් සමග ද වැවේ සංචාරය කරන්නේ විසිතුරු සේද පට පිළියෙන් ආවරණය කැරුණු යාත්‍රා මගිනි. මේ විනෝද යාත්‍රා අතරතුර රජතුමා පරිවාර කාන්තාවන් ද සමග ආගමික සිද්ධස්ථාන වෙත ගොස් පුද පූජා වතාවත් පවත්වයි. එය එතුමාගේ සුපුරුදු චාරිත්‍රයකි. මල් උයන් දෙකක් ඇතුළත රජුගේ අන්තඃපුර දෙකක් පිහිටා තිබිණි. එහි විවිධාකාර මලින් පලින් පිරි රුක් ලියගොමු ද සත්වෝද්‍යාන ද ඇත්තේ ය. විවිධ වර්ගයේ මුවන්, ගෝනුන් අඳුන් දිවියන්, සාවුන් ආදි විවිධාකාර සිවුපාවෝ ද, පක්ෂීහු ද එහි වෙති. මෙකී විනෝද උද්‍යානයන්හි රජතුමා යාන වාහනවලින් ද අසුන් පිටින් ද අන්තඃපුර රූපිකාවන් සමග කෙළිදෙළෙන් විනෝදයෙන් සැරසරයි. පුරුෂ පක්ෂයට ඒ උද්‍යාන තුළට ඇතුළු වීම තහනම් ය. අන්තඃපුර ස්ත්‍රීහු දඩ බල්ලන් සමග ගොස් දඩකෙළියෙහි යෙදී විනෝද වෙති. දඩකෙළියෙහි යෙදීමෙන් විඩාවට පත්වන රූපිකාවෝ ලියගොමු තුළට වැදී සළුපිළි සියල්ල උනා නිරුවතින් වැවට පැන දිය කෙළියෙහි යෙදෙන්නාහ. ඔව්හු කණ්ඩායම්වලට බෙදී ඒ මේ අතට පිහිනන දියකෙළි කෙළින ආකාරය නරඹමින් රජතුමා ඉමහත් ආස්වාදයක් විඳී.

Scanned by CamScanner

සන්ධ්‍යා යාමයෙහි රජතුමා මේ රූපිකාවන් පිරිවරා ගෙන ආපසු මාලිගාව කරා පිවිසේ. ඇතැම් විටෙක රජතුමා ආහාරපාන විනෝද උද්‍යානයටම ගෙන්වා ගනී. අන්තඃපුර ස්ත්‍රීන් සමග කම්සුව විඳිමින් සතුටින්, සොම්නසින් රජතුමා කාලය ගත කෙළේ ය. රාජ්‍ය ආරක්ෂාව ගැන හෝ සේනා සංවිධානය පිළිබඳ කිසිදු අවධානයක් යොමු කෙළේ නැත. අධික සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීමත් රාජ්‍යය කෙරෙහි අවධානය යොමු නොකිරීමත් නිසා කුබ්ලායි ඛාන් හට මේ රාජ්‍යය අත්පත් කැර ගැනීමට හැකිවිණි. රජතුමා සිංහාසනයෙන් නෙරපා හරින ලදී.

මේ සියලු තොරතුරු මා අසා දැනගත්තේ කින්සායි පුරයේ ධනවත් වයෝවෘධ ව්‍යාපාරිකයෙකුගෙනි. හෙතෙම කලක් ෆැක්පර් රජුගේ ඉතා විශ්වාසවන්ත සේවකයකු වශයෙන් සේවය කළේ ය. රජුගේ ජීවිතය පිළිබඳ තොරතුරු සියල්ල ඔහු දන්නා බවත් ඒ රජු විසූ මාලිගා ආදිය පෙන්වා තොරතුරු විස්තර සඳහන් කැර පහදා දිය හැකි බවත් කීවේ ය. හෙතෙම මා කැටුව ගොස් ඒ සියල්ල පෙන්වා දුනි. ඛාන් අධිරාජයා විසින් පත්කැර එවන ලද අධිපතියා දැනට පදිංචි වී සිටිනුයේ මේ මාලිගයේ ය.

අලංකාර ශෛලමය ස්තම්භ පේළිය තවමත් පෙර ලෙසම පවතී. රජතුමාගේ අන්තඃපුර ස්ත්‍රීන් වාසය කළ මාලිගා ජරාවාස වී ගොසිනි. එහි අත්තිවාරම් පමණක් ශේෂව පවතී. උයන්වතු මල්වතු හා සත්වෝද්‍යාන විනාශ වේ. සතුන් ද පල මල් බර අලංකාර ගස් කොළන් දක්නට නැත. හාත්පස ආවරණය වන පරිදි ඉදිකැර තිබූ මහා ප්‍රාකාරය බිඳ වැටී ඇත.

මේ පුරවරයේ සිට ඉඳුරු දෙසින් සැතපුම් විසිපහක් දුරින් මහ මුහුද ය. ඊසානට හුරුව ය. එහි ගන්ෆු නමැති නගරයක් තිබේ. ඉන්දියාවේ සිට වෙළෙඳ භාණ්ඩ රැගෙන එන නෞකා නවතා තබන්නේ මෙහි ය. කින්සායි පුරය අසලින් ගලා බස්නා මහා ගංගාව මුහුදට වැටෙන්නේ මේ වරාය අසලිනි. නිරන්තරයෙන් ඉහළට සහ පහළට ගමන් ගන්නා වූ යාත්‍රාවන්ගෙන් මේ ගංගාව පිරී පවතී. ඉන්දියාවට ද කැතේ පළාතට ද අවශ්‍ය භාණ්ඩ නැව්ගත කරනුයේ මේ වරායේ දී ය. අධිරාජයා විසින් පත්කරන ලද ආදායම් බදු නිලධාරීන් වාර්ෂික වාර්තාව පිළියෙල කැරෙන කාලයේ මාර්කෝ පෝලෝ ද මේ නුවරට පැමිණ සිටියේ ය. එමගින් මෙහි එකතුවන

Scanned by CamScanner

බදු මුදල් ප්‍රමාණය ද ජන සංඛ්‍යාව ද ව්‍යාපාරයන්හි ස්වභාවය ද දැනගන්නට ලැබිණි. මේ නගරයේ උදුන් (ළිප්) සංඛ්‍යාව "තොමන්" එකසිය හැටකි. තොමන් එකක් දස දහසකට සමාන ය. මෙහි පවුල්වල ජනගහනය අති විශාල ය. මෙහි නෙස්ටෝරියන් කිතුනු දෙව් මැදුරක් ද ඉදිකැර තිබේ. සෑම පවුලකම පියා තම නිවසෙහි පදිංචි ස්ත්‍රී පුරුෂයන්ගේ නම් සහ අයත් අශ්වයන් සංඛ්‍යාව සහිත ලේඛනයක් ඉදිරිපස දොරෙහි අලවා තැබිය යුතු ය.

නිවසෙහි කිසිවකු මියගිය හොත් නැතහොත් බැහැර පදිංචියට ගියහොත් ඉහත කී නම් ලයිස්තුවෙන් නම කපා හරිනු ලැබේ. දරුවකු උපන් කල අලුත් නමක් නාම ලේඛනයට එකතු කැරෙයි. මේ පිළිවෙළ නිසා රාජ්‍ය නිලධාරීනට ද, ආණ්ඩුකාරයාට ද නගරයේ ජනගහනය පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කැර ගැනීම පහසු වෙයි. කැතේ ප්‍රදේශයෙහි ද මන්සි ප්‍රදේශයෙහි ද ජන සංඛ්‍යාව ලේඛන ක්‍රමය නීතිගත කැර තිබේ. එපමණක් නොව තානායම්වල ද භෝජනාගාරවල ද නවාතැන් ගෙන සිටින තාවකාලික පදිංචි කරුවන්ගේ නාම ලේඛන ද පවත්වාගෙන යයි. ඔවුන් පැමිණි වේලාව ද බැහැර ගිය වේලාව ද සටහන් කැර තැබිය යුතු ය. මේ ලේඛන පිටපත් දෛනිකව විනිශ්චයකරු වෙත සැපයිය යුතුව ඇත. මෙකී විනිශ්චයකරුවන් වෙළෙඳ චතුරස්‍රයන්හි පාලකයන් ලෙස පත් කැර ඇත. මන්සි පුරවරයේ දිළිඳු දෙමාපියන් හට පෝෂණය කළ නොහැකි වූ දරුවන් හදා වඩා ගැනීම සඳහා ධනවතුන්ට භාරදීමේ සිරිතක් පවතී. ඔවුන්ට ඉතා හොඳින් ආහාර පාන ද ඇඳුම් පැළඳුම් ද සැපයේ.

ක්ින්සායි පුරවරයේත් එහි අධිකරණ බලය බලපවත්වන මන්සි ඇතුළු සෙසු පළාත් නවයෙහිත් වාර්ෂික ආදායම ගැන මීළඟට සඳහන් කැරෙයි. ඉතා සරුසාර ලෙස මෙහි ලුණු කර්මාන්තයෙන් වාර්ෂිකව තොමන් අසූවක ආදායමක් ලැබේ. තෝමනයක වටිනාකම සග්ගි අසූ දහසකි. එක් සග්ගියක් රන් සිලිම් දෙකක් වටී. ඒ අනුව සලකා බලන කල "ඩුකට්ස්" (ඉංග්‍රීසි සිලිම් 9 ක කාසියකි) හයකෝටි හාර ලක්ෂයක ආදායමකි. මුහුදට ආසන්නව පිහිටීම නිසා මේ ප්‍රදේශයේ පහසුවෙන් ඉතා විශාල ප්‍රමාණයක් ලුණු නිෂ්පාදනය කළ හැකි වේ. ගිම්හානයේ දී ලේවායන්හි ලුණු මිදී කැට බවට පත්වෙයි. සෙසු පළාත් පහකට අවශ්‍ය ලුණු ද මෙහි නිෂ්පාදනය

Scanned by CamScanner

කැරෙයි. උක් වගා හා සීනි කාර්මාන්තය ද මෙහි බහුලව පවතී. එමගින් ද රජයට සියයට තුනයි තුනෙන් එකක් බදු මුදලක් ලැබේ. බත්වලින් පෙරන්නා වූ මත්පැන් වලින් ද එබඳුම ආදායමක් ලැබේ.

මෙහි ශ්‍රේණි දොළසකට අයත් කලාකරුවෝ සිටිත්. විදේශයන් ගෙන් බඩු බාහිරාදිය ආනයනය කරන වෙළෙන්දෝ ද මෙහි කටයුතු කරති. විදේශවලින් බඩු බාහිරාදිය මෙරටට ගෙන්වන වෙළෙඳුන් ද ඔවුන්ගෙන් බඩු වෙළෙඳ ද්‍රව්‍ය ලබාගෙන පිටිසර පළාත්වලට අලෙවි කරන වෙළෙඳුන් ද සියයට තුනක බද්දක් රජයට ගෙවිය යුතු වේ. ඉන්දියාව ආදි රටවලින් මුහුදු මගින් ගෙනෙන වෙළෙඳ ද්‍රව්‍ය සඳහා සියයට දහයක බද්දක් අය කැරේ. එපමණක් නොව සියලු ගවයන් හා පලතුරු, අල, බතල ධාන්‍ය ආදී ද්‍රව්‍යයන්ගෙන් ද පට හා සේද රෙදිපිළි කර්මාන්තයෙන් ද රජයට බදු ගෙවිය යුතු වේ. මෙබඳු භාණ්ඩ සඳහා ගෙවිය යුතු බදු මුදල් ගණනය කැරුණේ මාර්කෝ පෝලෝ එහි සිටියදී ඔහු ඉදිරිපිට දී ය. මේ සියල්ල සලකා බැලූ විට මේ ප්‍රදේශයෙන් අධිරාජයාට වර්ෂයකට අය වන බදු මුදල තොමන් දෙසිය හයකි. තොමනයක වටිනාකම රන් සග්ගි අසූ දහසකට සමාන ය. මේ වූ කලී ලුණු බද්ද හැරුණු විට අයවන බදු මුදලයි.

කින්සායි නුවරින් නික්ම ගිනිකොණ දෙසට වසරක් ගමන් කළ විට නිවාස ද, පියකරු මන්දිර ද, සුන්දර උයන්වතු ද, එළවුළු පලතුරු සරුවට වැඩෙන ගොවිබිම් ද අතරමගදී දක්නට ලැබුණි. ඉන්පසු තන්පිජු නුවරට ළං වීමට හැකි විය. එය කින්සායි නගරයේ පාලනයට යටත් නගරයකි. එය විශාල සුන්දර පුරවරයයකි. මෙහි ජනයා බෞද්ධයෝ ය. අධිරාජයාගේ කඩදාසි මුදල් පරිහරණය කරති. මෘත ශරීර ආදාහනය කරති. කෘෂිකර්මාන්තයෙන් ද, වෙළෙඳාමෙන් ද මෙහි ජනයා ජීවිතය ගෙන යති. මේ නගරයෙන් නික්ම පිවිසුණේ "වුජු"නමැති නගරයට ය. මේ ගමන ගිනිකොණ දෙසට සිදුවූ අතර ඒ සඳහා දින තුනක් ගත වූයේ ය. මෙහි ජනයා කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කොට ගෙන ජීවත් වෙති. එය මිනිසුන් බහුල ප්‍රදේශයකි. මන්සි රාජ්‍යයට අයත් මේ ප්‍රදේශයෙහි බැටලුවන් දක්නට නැත. ගවයන්, එළදෙනුන්, මී හරකුන්, එළුවන් සහ තාරාවන් ආදි සතා සතුන් බහුල ය. ඉහත කී දිසාවටම තවත් තුන් දවසක් ගමන් කළ කල්හි කුජු නමැති නගරය හමුවෙයි. යළිත්

Scanned by CamScanner

දින තුනක් ගිනිකොණ දෙසට ගමන් කළ විට ජනාකීර්ණ ප්‍රදේශයක් හමුවෙයි. අතරමග කුඩා නගර හා බලකොටු රාශියක් දක්නට ලැබේ. මේ සියල්ල එකිනෙකට ළංව පිහිටියේ ය. බැලූ බැල්මට පෙනී යන්නේ ජනාකීර්ණ නගරයක් ලෙසිනි. කින්සායා නුවර සමග මෙහි වාණිජ සම්බන්ධතා නිරන්තරයෙන් පවතී. බෞද්ධයන් වන මෙහි ජනයා ස්වයංපෝෂිත ය. අමුතු වර්ගයේ වේවැල් විශේෂයක් මෙහි දක්නට ලැබේ. වියත් හතරක් පමණ මහත බඹ පහළොවක් පමණ දිග වේවැල් මෙහි වැවේ.

අනතුරුව දෙදිනක් මුළුල්ලේ ගමන් කළ විට හමුවන්නේ" ගිවුජු" නමැති ප්‍රදේශයයි. එහි ජනයා කෘෂිකර්මාන්තයෙන් ජීවත් වන්නාහ. ඔවුහු බෞද්ධයෝ ය. අධිරාජයාට යටත් වැසියෝ වෙති. කින්සායි ප්‍රදේශයටම අයත් පළාතකි. මේ පළාතෙහි ද බැටලුවන් දක්නට නොලැබේ. එහෙත් ගවයන්, තාරාවන්, මීහරකුන්, එළදෙනුන් හා ගවයන් බහුල ය. මෙහි සිට දිනයක් මුළුලලේ ඉදිරියට ගමන් කරන විට ගංගාවක් අසල කඳු මුදුනක ඉදිකළ පුරවරයක් ඇත. ගංගාව මෙහි දී දෙපසට බෙදී ගලා යයි. මේ නගරය චැන්සාන් නමින් හැඳින්වේ. ගඟේ එක ශාඛාවක් වයඹ දිසාවට ද අනෙක් ශාඛාව ගිනිකොණ දෙසට ද ගලන්නේ ය. මෙය කින්සායි පුරවරයට යටත් නගරයකි. ඛාන් අධිරාජයාට යටත් ය. බෞද්ධයන් වන මෙහි ජනයා වෙළඳාමෙන් ජීවිකාව කරගෙන යති. දඩයමට සුදුසු සිවුපාවන් ද, පක්ෂීන් ද මෙහි බහුල ය. එහි සිට තවත් දින තුනක් ඉදිරියට ගමන් කළ විට ගීෂා නමැති විශාල නගරය හමුවෙයි. මේ වූ කලී ඉහත සඳහන් කළ පළාතේ අවසානයටම හමුවන නගරයයි. ඉන් නික්ම ගිය පසු හමුවන්නේ මන්සි රාජ්‍යයේ අධිපතියාගේ පාලනය යටතේ පවත්නා පූ - චෞ නගරයයි. මෙහි අගනුවර පු ගියු නම් වේ. මෙය ද අධිරාජයාට යටත් පළාත් නවයෙන් එකකි. එහි සිට ස දිනක් කඳු පර්වත මිටියාවත් ඔස්සේ ගමන් කරන විට ගම් නියම් ගම් රැසක් පසුවිය. එකී මාර්ගයෙහි ආහාර පාන කිසිවකින් අඩුවක් නොමැත. දඩකෙළි සඳහා සිවුපාවුන් ද පක්ෂීන් ද සුලභ ය. බෞද්ධයන් වන මෙහි ජනයා අධිරාජයාගේ යටත්වැසියෝ ය. ඔව්හු විවිධ කර්මාන්තයන්හි ද වෙළෙඳ ව්‍යාපාරයෙන්හි ද යෙදෙති. වනගත ප්‍රදේශයෙන්හි ශරීර ප්‍රමාණයෙන් විශාල ශක්තිමත් සිංහයෝ ගැවසෙති. ඉඟුරු ද සෙසු ඖෂධ පැළෑටි වර්ග ද බහුලව වැවෙයි. වැනිසියානු කුඩා කාසියකට අමු

Scanned by CamScanner

ඉඟුරු රාත්තල් අසූවක් පමණ මිලදී ගත හැකි ය. අමු ඉඟුරු එතරම් සුලභ වගාවකි. කහවලට සමාන සුවඳවත් අල වර්ගයක් මෙහි වැවෙයි. කුළුබඩු විශේෂයක් ලෙස මෙය භාවිතා කැරේ. එය අලෙවි කැරෙනුයේ අධික මිලට ය.

මේ පළාතේ වාසය කරන්නා වූ එක්තරා මනුෂ්‍ය කොට්ඨාසයක් සත්ත්ව මාංශ බහුලව ආහාරයට ගනිති. එපමණක් නොව ඔව්හු ඉතා රසවත් බව කියමින් මිනී මස් ද ආහාරයට ගනිති. රෝගාබාධ නොවැළඳී මැරෙන මිනිසුන්ගේ මස් කති. මුහුණුවල තිල් පැහැති සායමක් තවරාගෙන හිසකේ දෙපසට වැගිරෙන සේ සකසාගෙන කලකෝලාහල අරගල ආදියට පිවිසෙති. ඔවුන්ගේ නායකයා අශ්වයාගේ පිටින් ගමන් ගන්නා අතර සෙස්සෝ කඩු හෙල්ල ආදි ආයුධ ගෙන ඔහු සමග පා ගමනින් යති. මොවුන් පැවැත එන්නේ ආදිවාසී වනචාරී ගෝත්‍රයකිනි. ඔව්හු සටනේ දී මිය යන සතුරන්ගේ ලේ බොති. අනතුරුව මිනී මස් ද කති.

අනතුරුව චැන්සාන් පුරයෙන් නික්ම තුන් දිනක් ගමන් ගත්තේ සුන්දර පෙදෙසක් ඔස්සේ ය. කුවේ ලින් ෆු නගරයට පැමිණි මාර්ගයේ ඉතා අලංකාර පාලම් තුනකි. බඹ සියයක් පමණ දිග පාලම් බඹ අටක් පමණ පළලයි. මේ පළාතේ ස්ත්‍රීන් රූමත් ය. ඔවුන් නිදහසේ විවේකයෙන් කිසියම් කටයුත්තක නොයෙදී නිකරුණේ කාලය ගත කරන ආකාරය පෙනේ. නානාවිධ සේද පිළි කපු පිළි නිෂ්පාදනය කැරෙන අතර කපු පිළි නිෂ්පාදනය ද සිදුවේ. විවිධ වර්ණවත් කපු පිළි මන්සි ප්‍රදේශයේ සියලු තන්හි අලෙවි කැරේ. මෙය ඉතා සුලභ වෙළෙඳාමකි. ඉඟුරු සහ අල වර්ග ද මෙහි වගා කැර පිටරට යවනු ලැබේ. පිහාටු නොමැති කුකුළන් වර්ගයක් මේ පළාතේ නිවාසයන්හි ඇති කරනු ලැබේ. එහෙත් මේ පක්ෂීන් මට දක්නට ලැබුණේ නැත. බළලුන්ගේ මෙන් ලොම්වලින් සිරුර වැසී ඇති බවත් සෙසු කිකිළියන් මෙන් බිත්තර දමන බවත් ඒ බිත්තර රසවත් බවත් කියති. ශරීර ප්‍රමාණයෙන් විශාල නපුරු සිංහයන් මෙහි ගැවසෙන බැවින් තනිව ගමන් කිරීම අනතුරුදායක ය. එබැවින් මෙහි මිනිසුන් ගමන් කරනුයේ කණ්ඩායම් වශයෙනි.

මෙහි සිට දින තුනක් ගමන් කොට උන් කෙන් නගරයට පිවිසුණෙමු. එහි සිට තවත් සැතපුම් පහළොවක් ඉදිරියට ගමන් කළ යුතුව ඇත. මෙහි වාසය කරන්නාවූ ජනයා බෞද්ධයෝ ය.

Scanned by CamScanner

සේද රෙදි කර්මාන්තය බහුල වශයෙන් පවතී. සීනි කර්මාන්තයට ද මේ ප්‍රදේශය ප්‍රසිද්ධ ය. කාන් බාලික් හි පිහිටි අධිරාජයාගේ මාලිගයට සීනි සපයන්නේ මේ ප්‍රදේශයෙනි. මේ පළාත අධිරාජයාට යටත් වීමට පෙර පිරිසිදු ලෙස සීනි නිෂ්පාදනය කරන ආකාරය මෙහි වැසියන් දැන සිටියේ නැත. එහෙත් ඊජිප්තුවෙන් අධිරාජයා වෙත පැමිණි පිරිසක් පිරිසිදු සීනි සෑදීමේ විධික්‍රමය දැන සිටියහ. කිසියම් ගස් වර්ගයක අලු මිශ්‍රකර සීනි පිරිසිදු කරන ආකාරය ඔව්හු ඉගැන්වූහ. ඉහතදී ඔවුන් සීනි සෑදූවේ උක් පැණි උණුකර තිවෙන්ට තැබීමෙනි. එය අනතුරුව දුඹුරු පාට තලපයක් ලෙස මිදෙයි. පසුව නව ක්‍රමවේදය නිසා මෙහි වැසියෝ පිරිසිදු සීනි නිෂ්පාදනය, කිරීමට පටන් ගත්හ.

උන් කෙන් නගරයේ සිට සැතපුම් පහළොහක් ඉදිරියට ගමන් කළ විට ගූ - චෞ නමැති අලංකාර නගරය හමුවේ. එය මෙහි අගනුවරයි. මේ රාජධානිය කොන්චා නම් වේ. මන්සි රාජ්‍යයේ පළාත් නවයෙන් එකකි. එසේම ඉතා වැදගත් වෙළෙඳ මධ්‍යස්ථානයකි. කවර අවස්ථාවක වුව ද රාජ්‍ය විරෝධී කැරැල්ලක් ඇතිවේ යයි සැකය නිසා මෙහි හමුදා නිරතුරු සීරුවෙන් තබා ඇත. සැතපුමක පමණ පළලින් යුත් ගංගාවක් මෙම නගරය මැදින් ගලා බසී. ගඟබඩ විශාල පියකරු ගොඩනැගිලි රාශියකි. ගංගාවෙහි යාත්‍රා බොහෝ ගණනක් දැකිය හැකි ය. සීනි ප්‍රවාහනය කැරෙනුයේ මේ යාත්‍රා මගිනි. එපමණක් නොව වෙනත් වෙළෙඳ භාණ්ඩ ද මුතු මැණික් සහ ස්වර්ණාභරණ ද රැගෙන යන එන යාත්‍රා උදෙසා තොටුපලක් ද මෙහි තිබේ. මෙකී වෙළෙඳාම නිසා නගරයට විශාල ආදායමක් එකතු වේ. ගංගාව මුහුදට ගලා බසින්නේ ෂයි ටුන් වරායට ආසන්නයෙනි. ඉන්දියාවේ සිට යාත්‍රා කරන්නා වූ නෞකා ගංගාව ඔස්සේ රට අභ්‍යන්තරයට ගමන් කැරේ. ආහාරපාන සුලභ මේ ප්‍රදේශයේ රසවත් පලතුරු බහුල ය. ඉතා සරුසාර වෘක්ෂලතා සහිත රමණීය ප්‍රදේශයකි.

කන්ගියු නුවරින් නික්ම දින පහක් ගමන් කළ පසු ෂයි ටුන් නමැති සුන්දර පියකරු නගරයට ළඟාවීමට හැකි විය. අතරමගදී සරුසාර ගම් නියම්ගම් නගර රාශියක් හමුවේ. බළකොටු රැසක් ද දක්නට ලැබේ. මේ මාර්ගය වනාන්තර කඳු හෙල් සහිත ප්‍රදේශ අතරින් විහිදේ. වනසතුන් බහුල ය. අධිරාජයාට අයත් ප්‍රදේශයක් වන මෙහි වැසියෝ බුද්ධාගම අදහති. මෙය කන්ගියු නගරයේ

Scanned by CamScanner

පාලනයට යටත් ය. ෂයි ටුන් නගරාසන්නයේ විශාල වරායක් තිබේ. නානා ප්‍රදේශ වෙතින් පැමිණෙන නෞකා රඳවා තබන්නේ මේ වරායේ ය. මන්සි ප්‍රදේශය පුරා අලෙවි කරන්නේ මේ වරායෙන් ගොඩබාන බඩු බාහිරාදියයි. කපුරු සාදාගන්නා අමුද්‍රව්‍ය ලබාගන්නා ගස් වර්ගයක් මෙහි වනගත ප්‍රදේශයන්හි වැවෙයි.

ෂයි ටුන් වරායට ගොඩබාන ගම්මිරිස් ප්‍රමාණය අධික ය. යුරෝපා රටවල අලෙවිය සඳහා ඇලෙක්සැන්ඩ්‍රියා වරායට ගෙන යන ගම්මිරිස් ප්‍රමාණය මෙයින් සියයෙන් එකකටත් අඩු ය. එසේ ම මේ වරාය අතිවිශාල ය. මෙහි ගොඩගසන බඩුමුට්ටු සම්භාරය ද අති විශාල ය. මුළු ලෝකයෙන් ම මේ වරාය අතිවිශාල බවත් අප්‍රමාණ බඩු තොග ගොඩ ගසන බවත් කිව යුතු ය. නැව්වලට පටවන භාණ්ඩ සඳහා සියයට තිහක බදු මුදලක් අය කැරේ. මේ බද්ද වටිනා සියුම් භාණ්ඩ සඳහා ය. ගම්මිරිස්වලින් සියයට හතළිස් හතරක බද්දක් ද අගිල් සඳුන් දර හා වෙනත් ඖෂධ වර්ගවලින් ද සාමාන්‍ය වෙළෙඳ භාණ්ඩයන්ගෙන් සියයට හතළිහක බද්දක් ද අය කැරේ. මෙහි වෙළෙන්දෝ නැව් ගාස්තු ද තීරු ගාස්තු ද භාණ්ඩවල වටිනාකමට එකතු කැර විකුණති.

බෞද්ධයන් වන මෙරට ජනයා මිත්‍රශීලී ය. ආහාරපාන සුලභ මෙහි ජනයා සුඛෝපභෝගී ජීවිතයට ආසක්ත ය. සාමකාමී ය ශරීරයේ පච්ච කොටවා ගැනීම සඳහා බොහෝ දෙනා මේ ප්‍රදේශයට පැමිණෙති. මේ ප්‍රදේශයේ පච්ච කෙටීමේ යෙදෙන ශිල්පීන් ලෝක ප්‍රකට ය. ෂයි ටුන් වරාය අසලින් මුහුදට ගලා බස්නා විශාල නදියේ ජල ප්‍රවාහය වේගවත් ය. ප්‍රචණ්ඩ ය. කින්සායි නගරය පසු කරමින් මේ ගංගාවෙහි එක් ශාඛාවක් ගලා බසී. ගංගාව දෙකට බෙදෙනුයේ කින්ගියු ප්‍රදේශයෙහි දී ය. මේ ප්‍රදේශයේ අනගි නිමාවෙන් යුත් පිඟන් භාණ්ඩ නිෂ්පාදනය කැරේ. පිඟන් කර්මාන්තයෙහි යෙදෙන කම්කරුවෝ විශාල ගැඹුරු වළවල් සාරා පස් ගොඩ ගෙන කඳු ගසති. මෙසේ ගොඩ ගසන පස් කඳු වසර විස්සක් තිහක් පමණ කාලයක් අව්වේ වියැළෙමින් වැස්සේ තෙමෙමින් පදම් වන්නට ඉඩ හරිනු ලැබේ. ඉන්පසු මේ පස් කඳු පිඟන් භාණ්ඩ තැනීමට සුදුසු තත්ත්වයට පත් වේ. ඉන්පසු පිඟන් කෝප්ප ආදි විවිධ භාණ්ඩ තනා වර්ණාලේප කොට චිත්‍ර සැරසිලි යොදා පෝරණුවල බහා පුළුස්සා ගනු ලැබේ. තම පවුලට අවශ්‍ය පිඟන් භාණ්ඩ තනා

Scanned by CamScanner

ඉතිරිය අලෙවි කැරේ. වැනිසියානු රිදී කාසියක මිලට පිඟන් හො කෝප්ප අටක් ගැනීමට හැකි ය.

මන්සි රාජ්‍යයට අයත් පළාත් නවයෙන් කොන් ජා සහ කින්සායි පළාත් කෙරෙන් අතිවිශාල ආදායමක් අධිරාජයාට ලැබේ. සෙසු පළාත්වලට යෑමට මාර්කෝ පෝලෝට නොහැකි විය. එහෙයින් ඒ පළාත් පිළිබඳ විස්තර මෙහි සඳහන් නොකැරේ. කන්සායි (දිව්‍ය පුරය) සහ කොන් ජා පළාතේ සියලු විස්තර මෙහි සඳහන් කැරිණ.

මන්සි ප්‍රදේශයෙහි සමස්ත වශයෙන් භාවිතා වනුයේ එකම භාෂාවකි. ලේඛනයට උපයෝගී කැර ගනුයේ ද එකම අක්ෂර මාලාවකි. එහෙත් ප්‍රාදේශීය භාෂාවන් ද ව්‍යවහාරයේ පවතී. ජිනෝවා මිලන්, ෆෙලොරෙන්ටින් සහ අනෙක් ඉතාලි ප්‍රදේශයන්හි ද ඒ ඒ ප්‍රදේශයනට ආවේණික භාෂාවක් ඇත. ඔවුනොවුනට ඒ ඒ භාෂා වටහා ගැනීමට පුළුවන. මාර්කෝ පෝලෝ විසින් ඒ ඒ රටවල තොරතුරු සටහන් කැරගත් නමුදු මේ පොතෙහි දෙවන කොටස මෙතෙකින් සමාප්ත කොට වෙනත් රටවල තොරතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

අනතුරුව ඉදිරිපත් කැරෙනුයේ ඉන්දියාවේ විවිධ ප්‍රදේශයන් පිළිබඳ විස්තර තොරතුරු ය. ඉන්දියාව මහ ඉන්දියාව, සුළු ඉන්දියාව, මධ්‍ය ඉන්දියාව යනාදි වශයෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදේ. මාර්කෝ පෝලෝ අධිරාජයාගේ මෙහෙවරෙහි යෙදෙමින් සංචාරය කළ රටවල් මෙයට ඇතුළත් ය. ඇතැම් ප්‍රදේශවල ඔහු ගියේ රාජ දූතයකු වශයෙන් නිල සංචාරයන් ය. අනතුරුව ඔහු සිය පියා ද සුළු පියා ද සමග ආපසු සියරට බලා යද්දී අර්ගන් බිසොවක් ද කැටුව යන ගමනේ දී නැවත ඔහුට ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවලට යෑමට අවස්ථාව සැලසුණි. ඇතැම් විස්තර ඔහු මෙහි දක්වන්නේ විශ්වාස කටයුතු පුද්ගලයන්ගෙන් අසා දැනගන්නට ලැබුණු පරිද්දෙනි. එකී ප්‍රදේශවලට ඔහුට යෑමට ඉඩ ප්‍රස්තා නොසැලසුණු බැවිනි. මේ ගමනේ දී මග පෙන්වූ ජනයා පැවසූ තොරතුරු ද, මුහුදුබඩ පළාත්වල ගමන් කරද්දී දක්නට ලැබුණු ඉන්දියාවේ විසිතුරු තොරතුරු ද තුන්වන භාගයට ඇතුළත් වන බව කිව යුතු ය.

Scanned by CamScanner



# චීනයේ සිට ඉන්දියාවට

ඉහත දී මේ කෘතියෙන් ලෝකයේ රටවල් බොහෝ ගණනක විස්තර තොරතුරු රාශියක් ඉදිරිපත් කරන ලදී. අනතුරුව මෙතැන් සිට පාඨකයා වෙතට ගෙන එනුයේ මචීනය දනවන ඉන්දියාවේ විවිධ ප්‍රදේශයන්හි විස්තර තොරතුරු ය. ඉන්දියාවේ වාණිජ ව්‍යාපාර සඳහා සාගර තරණයට නෞකා නිෂ්පාදනය කරන ආකාරය පළමුවෙන් ඉදිරිපත් කැරේ. කෙඳි සහිත කිරි සහිත දැව වර්ගයකින් නෞකා තනනු ලැබේ.

මෙසේ සාදනු ලබන නැව්වල ඇත්තේ එකම තට්ටුවකි. තට්ටුවේ පහළ කොටස කුඩා කාමර හැටකට බෙදා ඇත. නැවේ ප්‍රමාණය අනුව මේ කොටස් අඩු වැඩි විය හැකි ය. එක් එක් කුටියෙහි එක් එක් වෙළෙන්දෙකුගේ බඩු බාහිරාදිය තබා ගැනීමට ඉඩකඩ ඇත. සුක්කානම ක්‍රියා කරවන ස්ථානය මනා ලෙස තනා තිබේ. කුඹගස් හතරක් මේ නෞකාවන්හි දක්නට ලැබේ. කුඹගස් වලට යා කර බැඳුණු රුවල් රාශියකි. මේ කුඹගස් එසවීමට හා පහත් කිරීමට හැකිවන ලෙස තනා ඇත්තේ ය. ඇතැම් නෞකාවන්හි ඇත්තේ කුඹගස් දෙකක් පමණි. විශාල නැව්වල බඩු බාහිරාදිය තබන කාමර හැරුණු විට ඝන ලෑලිවලින් තවත් කොටසක් ඉතා සීරුමාරු ලෙස තනා ඇත. යම් හෙයකින් නැවට වතුර කාන්දු වුවහොත් බඩු බාහිරාදිය ආරක්ෂා කැර ගැනීම සඳහා ය. යාත්‍රා කරන විට නැව ගල් පරයක හැපුණහොත් නැතහොත් තල්මසකුගේ පහරට ලක්වුවහොත් සිදුවන අනතුරක දී නැව තුළට ජලය කාන්දුවනු ඇත. එබඳු අනතුරු නිතර

Scanned by CamScanner

සිදුවේ. රාත්‍රියේ නැව යාත්‍රා කරන විට දී ද රළපතර කපාගෙන සුදු පෙන නංවා නැව ගමන් කරන විට ද තල්මස්සු ගොදුරු සොයා පැමිණ නැවට පහර දෙති. ගොදුරු ලොබින් තල්මසුන් නැවට පහර දීම නිසා ද, නැව පෙරළා දැමීමට තැත් කිරීම නිසා ද නැව් පතුළට අලාභහානි සිදුවේ. සමහර විට තල්මස්සු කිහිප දෙනෙක් නැවට පහර දෙති. මෙසේ පහර දීමෙන් නැව් පතුල සිදුරු වී නැව තුළට වතුර කාන්දු වෙයි. ඒ නිසා හැම විටම නැව් පතුල පිරිසිදුව තබා ගැනීම අත්‍යවශ්‍ය ය.

නැවට ජලය කාන්දු වුවහොත් සේවකයෝ එහි ඇති බඩු බාහිරාදිය නැවේ වෙනත් තැනකට ගෙන ගොස් ගොඩගසති. එහෙයින් අලාභයක් නොවේ. ඉක්මනින් වතුර කාන්දුවන තැන් පිළිසකර කිරීමට පටන් ගැනේ. සෑම නැවක්ම තනා ඇත්තේ ලෑලි දෙක බැගින් එකට මූට්ටු කිරීමෙනි. එක් ලෑල්ලක් තවත් ලෑල්ලකින් ආවරණය වන පරිද්දෙනි. ලෑලිවල පුලුප් බේරා එකිනෙක තදින් වද්දා තිබේ. ඒ නිසා නැව තුළට ජලය කාන්දු නොවේ. ඒ අතරට කිත්තම් කඹ කෑලි ඔබා පිළියම් කර යකඩ ඇණ ද අල්ලා තිබේ. තාර මැලියම් මේ රටේ නොමැති බැවින් වෙනත් මැලියම් වර්ගයක් ආලේප කැරේ. පිළිස්සූ හුණු ගල් සහ හණ එකට කොටා අඹරා තෙල් වර්ගයක් සමග මිශ්‍ර කැර මෙකී මැලියම් වර්ගය සාදා ගැනේ. මෙය ඝන තද මැලියමකි. නැව පතුලේ හැමතැනම මේ මැලියම් ආලේප කැරේ. යුරෝපයේ තාර මැලියමට වඩා මෙය අනර්ඝ ය.

විශාල නැව්වල සේවයෙහි සේවකයෝ තුන් සියයක් පමණ කටයුතු කරති. කුඩා නැව්වල සේවක සංඛ්‍යාව දෙසියයකි. සමහර නැව්වල එකසිය පනස් දෙනෙක් පමණ සේවයේ යෙදෙති. නැවේ විශාලත්වයට අනුරූප පරිද්දෙන් සේවකයන් යොදවා ගැනේ. ඇතැම් නැව්වලට ගම්මිරිස් ගෝනි පන් දහසක් හය දහසක් පමණ පටවනු ලැබේ. ඉහත දී මෙයටත් වඩා වැඩි බඩු තොග පටවන නැව් තොග තිබිණි. එහෙත් මෙවැනි නැව් දූපත් අසල දී අනතුරට භාජන වූ බැවින් කුඩා නැව් තැනීම වඩාත් ප්‍රයෝජනවත් බව පෙනිණ. වතුරේ නොගැඹුරු ස්වභාවය වටහා ගෙන කුඩා නැව් තැනීමේ අගය පෙනී ගියේ ය. නැව් යාත්‍රා කරවන්නේ හබල්වලිනි.

Scanned by CamScanner

එක් හබලකට මිනිසුන් සතර දෙනා බැගින් අවශ්‍ය ය. කුඹගස් තුනේ විශාල නැව්වල ගම්මිරිස් ගෝනි දාහක් පමණ පටවනු ලැබේ. ඒ නැව් සඳහා සේවකයන් අසූවක් හෝ සියයක් හෝ අවශ්‍ය ය. කුඩා යාත්‍රාවලින් මහ නැව් ඇදගෙන යෑමට සිදුවේ.. සුළං වේගය බාල වූ අවස්ථාවන්හි දී ය. නැවේ අවර පැත්තෙන් සුළං වේගය උදාසීන වූ විට ඇදගෙන යෑමට සිදුවෙයි. මහ නැව්වල කුඩා රුවල්වලට සුළං බැඳීම ද අඩු වේ. මහ නැවක කුඩා ඔරු දහයක් පමණ ද රැගෙන යයි. මසුල් ඇල්ලීමත් වෙනත් සුලු සුලු කටයුතු සඳහාත් මේ කුඩා ඔරු ප්‍රයෝජනවත් වේ. මේ කුඩා ඔරු නැවේ දෙපැත්තේ එල්ලාගෙන යනු ලැබේ. සුදුසු අවස්ථාවේ ඒවා ප්‍රයෝජනයට ගැනේ. කුඹගස් තුනකින් යුක්ත කුඩා නැව්වල ද ඔරු එල්ලාගෙන යයි.

එක් නැවක් වසරක් හෝ ඊට වැඩි කාලයක් සාගර යාත්‍රාවෙහි යෙදීමෙන් පසු අලුත් වැඩියා කිරීමට සිදුවේ. නැව් බඳ වටා අලුත් ආලේපයකින් ආවරණය කැරේ. සිදු වූ පලුදු මැකී යාම සඳහා අවශ්‍ය පිරියම් කටයුතු කරනු ලැබේ. වරින් වර මෙසේ අලුත් පිරියම් කිරීමෙන් පසු යාත්‍රාව සංචාර සඳහා යෙදවේ. නැවත නැවත මෙසේ අලුත් වැඩියා කිරීම ස්ථර හයක් දක්වා සිදුවේ. අනතුරුව සාගර යාත්‍රාවට අයෝග්‍ය බව වැටහුණු පසු අබලන් ලෙස සලකා බැහැර කැරේ.

මෙහි නැව් තැනීමේ කටයුතු සිදුවන ආකාරය විස්තර කිරීමෙන් පසු ඉන්දියාව පිළිබඳ තොරතුරු මෙතැන් සිට දැක්වේ. එහෙත් එයට පෙර සාගරයේ එක්තරා පාර්ශ්වයකින් පිහිටි එක්තරා දූපත් සංඛ්‍යාවක් පිළිබඳ කරුණු ප්‍රකාශ කිරීම යෝග්‍ය යයි හැඟේ. එහෙයින් ෂිපන්ගු නමැති දූපත් පිළිබඳ තොරතුරු බිඳක් සඳහන් කළ යුතු ය.

ෂිපන්ගු (ජපානය) සාගරයේ නැගෙනහිර දෙසින් පිහිටි දූපතකි. ප්‍රධාන ගොඩබිමෙහි සිට නැතහොත් මන්ජි වෙරළෙහි සිට මේ දූපතට ඇති දුර ප්‍රමාණය සැතපුම් එක්දහස් පන්සියයකි.

එය සෑහෙන පමණ විශාල දිවයිනකි. මේ දිවයිනෙහි ජනයා පැහැපත් ය. මනා ලෙස වැඩුණු ශරීර ඇත්තෝ ය. යහපත් ශීලාචාර ගති පැවතුම් සහිත ය. ඔව්හු ප්‍රතිමා වන්දනා කරන ආගම (බුද්ධාගම) අදහති. ස්වාධීන පාලනයක් පවතින මෙහි වැසියන් කිසිදු විදේශ

Scanned by CamScanner

බලයකට යටත් නැත. ඔවුන් ගේ ම රජවරුන් විසින් මේ රට පාලනය කරනු ලැබේ. මේ රටෙහි රත්රන් ආකර බහුලව ඇත. එහෙත් එහි රජතුමා ඒ රත්රන් පිටරට යැවීමට ඉඩ නොදේ. එහෙයින් එහි රත්රන් නිධි සුරක්ෂිතව පවතී. මෙරටට ව්‍යාපාරිකයන් පැමිණෙන්නේ ස්වල්ප වශයෙනි.

අධිරාජයාගේ මාලිගය අසාමාන්‍ය අලංකාරයෙන් ශෝභාවෙන් යුක්ත ය. දූපත මධ්‍යයේ උස් භූමි භාගයෙක මේ මාලිගය පිහිටා තිබේ. සතුරන් එක් මාර්ගයකින් මාලිගය දෙසට පැමිණෙන්නේ නම් අනෙක රවුම් පාරෙන් ගොස් අල්ලා ගත හැකි වන පරිදි කටයුතු සලස්වා ඇත. එසේ ම වෙරළෙහි නැංගුරම් ලන නෞකා මේ ස්ථානයට පැහැදිලිවම පෙනේ. මෙහි යාත්‍රා කරන නෞකාවන්හි ධජ වර්ණය අනුව හඳුනාගෙන සතුරන් පලවා හැරීමට සියලු කටයුතු සංවිධානය කැර තිබේ. අධිරාජයාගේ මාලිගය මවිතය දනවන නිර්මාණයකි. එහි පියැස්ස (වහල) සෙවිළි කැර ඇත්තේ රන් තහඩුවලිනි. අපගේ නිවාස හා දේවස්ථාන වහල තනා ඇති පරිදි මේ වහල තනා ඇතත් එය ස්වර්ණමය ඡදනයකින් යුක්ත ය. සියලු ශාලාවන්හි වියන නිර්මාණය කැර ඇත්තේ ද රත්රනිනි. කාමරවල දඹ රත්රන් තහඩු සවි කැර තිබේ. මේ රන් තහඩු සැහෙන තරම් ඝනකමකින් යුක්ත ය. කවුළු අලංකාර කැර තිබෙනුයේ ස්වර්ණමය සැරසිල්ලෙනි. මේ මාලිගයේ අලංකාරය ශ්‍රී විභූතිය ඓශ්වර්‍ය්‍ය වචනයෙන් විස්තර කළ හැකි නොවේ.

මේ දූපතෙහි මුතු බහුල ය. මේ මුතු කැට රෝස පැහැති ය. රවුම් ය. ප්‍රමාණයෙන් විශාල ය. සුදු මුතු ඇට වඩා අගයෙන් ඉහළ ය. මේ දිවයිනෙහි එක් පළාතක මෘත ශරීර ආදාහන කැරෙයි. අනෙක් පළාතක මෘත ශරීර මිහිදන් කරනු ලැබේ. මිහිදන් කරන මෘත ශරීරයන්හි මුවෙහි මුතු ඇට බහාලීම සිරිතකි. එසේ ම අගනා මැණික් වර්ග ද මෙහි ඇත්තේ ය.

මේ දූපතෙහි ධනේශ්වර භාවය අවබෝධ කැර ගත් කුබ්ලායි ඛාන්වරයා එය තම ආධිපත්‍යයට යටත් කැර ගැනීමට මාන බැලී ය. මේ දූපත තම රාජ්‍යයට ඈඳා ගැනීමට සැලසුම් කළ කුබ්ලායි ඛාන් නැව් සමූහයක් ද විශාල සේනාවක් ද සහිතව පිටත් කැර යැවීමට කටයුතු යෙදවිණ. අබකතාන් සහ වොන්සැන්සින් යන

Scanned by CamScanner

අධිපතින් දෙදෙනා යටතේ මේ සේනා ගමන් ගති. සයිටුන් සහ කන්සායි වෙතින් පිටත් වූ සේනා සාගරය තරණය කොට නිරුපද්‍රිතව දූපත කරා සේන්ද්‍ර වූහ.

මේ සේනා කැටුව පැමිණි අධිපතින් දෙදෙනා අතර විරුද්ධවාදී කමක් පැන නැගුණි. මේ නිසා දෙ සේනාවන් අතර ද ප්‍රතිවිරුද්ධ හැඟීම් ඇති වූ බැවින් ඔවුන් පැමිණි කාර්යය සාමූහිකව සපල කැරගැන්මට හැකි වූයේ නොවේ. ඔවුනොවුන්ගේ නියෝග එකිනෙකට පරස්පර විය. එහෙයින් ඔවුනට දිවයින හෝ බලකොටුවක් හෝ යටත් කැරගත හැකි නොවිණි. සේනා යටත් කැර ගැනීමට උත්සාහ කළ ද එයින් පලක් නොවී ය.

නොබෝ දිනකින් උතුරු සුළඟ වේගවත් ලෙස හමන්නට පටන් ගති. වෙරළබඩ නවතා තිබූ ටාටර්වරුන්ගේ නෞකා මහත් වේගයෙන් මේ සුළඟින් ඈතට ගසාගෙන ගියේ ය. නෞකාවන්හි රැඳී සිටි යුද්ධ නිලධාරීන්ට මේ හේතුවෙන් ගොඩබිම සමග සම්බන්ධතා ඇති කැර ගැනීමට නොහැකි විය. දරුණු ලෙස චණ්ඩමාරුතය හමන්නට පටන්ගත් බැවින් නෞකා කැඩී බිඳී යන්නට විය. කැඩී බිඳී ගිය නෞකාවල සුන්බුන්වලට නැගී එහි සිට සැතපුම් හතරක පමණ දුරින් පිහිටි දූපතකට ගොඩ බටහ.

දූපත ආසන්නයේ රඳවා තිබූ නෞකා චණ්ඩමාරුතයෙන් අනතුරට ලක් වූයේ නැත. හමුදාවනට නායකත්වය දෙමින් පැමිණි අධිපතියන් දෙදෙනා සිය දහසක් හෝ දස දහසක් තරම් වූ සේනාවනට ආපසු හැරී සිය රට බලා ගමන් ගන්නා ලෙසට නියෝග කළහ.

මේ අයුරින් ආපසු යෑමට නොහැකිව ෂිපන්ගු වෙරළේ සිට සැතපුම් හතරක් දුරින් පිහිටි දූපතට ගොඩ වූ පිරිසට යළිත් ආපසු යෑම සඳහා නෞකා නොවී ය. මේ පිරිස තිස් දහසක් පමණ විය. ඔවුනට අවි ආයුධ හෝ ආහාරපාන හෝ වෙනත් අත්‍යවශ්‍ය කිසිදු පහසු කමක් තිබුණේ නැත. ඔවුන් පත්ව සිටියේ මහත් ආපදාවකට ය.

චණ්ඩමාරුතය ක්‍රමයෙන් තුරන් වී ගියේ ය. ෂිපන්ගු ප්‍රධාන දිවයිනෙහි සිට විශාල සේනාවක් නෞකා මගින් ටාටර්වරුන් කොටුවී සිට දිවයින කරා බොහෝ වේගයෙන් සේන්ද්‍ර විය.

Scanned by CamScanner

වහා දිවයිනට ගොඩබට ඔව්හු සතුරන් අල්ලා ගැනීම සඳහා අක්‍රමවත් ලෙස ඒ මේ අතට දිවූහ. සිදුවීමට යන විපත වටහාගත් ටාටර්වරු ජපන් සේනාවනට නොපෙනෙන ලෙස උස් බිමකට වී සැඟවුණේ ය. සතුරන් සොයා ජපන් සේනා දෙපසකට ගමන් කළහ. ඔවුන් පැමිණි යාත්‍රා දූපත අසල නැංගුරම් ලා නවතා තිබිණි. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ටාටර්වරු සතුරන්ගෙන් බේරී වහා නැව්වලට පැන ගත්හ. ඒ නැව් වෙරළෙන් ඈතට ඇදගෙන ගොස් ෂිපන්ගු ප්‍රධාන නගරය කරා යෑමට කටයුතු යොදා ගත්හ. මේ නැව්වල නංවා තිබූ ධජයේ වර්ණය හේතු කොටගෙන කිසිදු විරුද්ධත්වයක් නොමැතිව ඔවුනට ප්‍රධාන දූපතට ගොඩ බැසීමට හැකි විණ. දූපතට ගොඩ බඩ ටාටර් වරුන්ට දක්නට ලැබුණේ ස්ත්‍රීන් පමණි. පිරිමින් සිටියේ ස්වල්ප දෙනකුන් පමණි. ටාටර්වරු ඒ පිරිමින් පලවා හැර ස්ත්‍රීන් ඔවුන්ගේ පාලනයට නතු කැර ගත්හ. මේ රටේ රජතුමාට ඒ පුවත සැලවීමෙන් මහත් කෝපයටත් සිත් වේදනාවටත් පත්විය. වහාම නගරයේ මං මාවත් අසුරා වටලන ලෙස නියෝග කෙළේ ය. මේ අයුරින් කිසිවකුටත් බැහැර යෑමට නොහැකි වන පරිද්දෙන් තුන් මාසයක් නගරය වටලා තිබිණි. මේ හේතුවෙන් ටාටර්වරු මහත් පීඩාවට පත් වූහ. ඔවුනට තම රටින් ආධාර ලැබුණේ ද නැත. එහෙයින් ආත්මාරක්ෂාව පතා ටාටර්වරු මෙරට රජුට යටත් වූවෝ ය.

1279 දී මෙය සිදුවිය. කුබ්ලායි ඛාන් අධිරාජයා සිය සේනාවන්ට අත් වූ ඉරණම සැලවීමෙන් මහත් කෝපයට පත් විය. සටන මෙහෙයවූ සේනාපතියන් දෙදෙනා අතර අසමගිය නිසා මේ විපත සිදුවූ බව වටහාගත් කුබ්ලායි ඛාන් එක් සේනාපතියකුගේ හිස ගසා දැමීමට නියෝග කෙළේ ය. අනෙක් සෙනෙවියා සෝර්සා නමැති වනචාරීන් වසන දූපතට පිටුවහල් කරන ලදී. එහි දී අපරාධකරුවන් මරණයට පත් කරනුයේ මීහරක් සමක ඔතා වධයට පැමිණවීමෙනි. මීහරකකු මරා උගේ සම අපරාධකරුගේ සිරුර දැත් දෙපා සිරවන සේ ගෙල දක්වා ඔතයි. ඉන්පසු ක්‍රම ක්‍රමයෙන් මීහරක් සම වියළෙන විට අපරාධකරු එයට සිරවී මරණයට පත්වේ.

ෂිපන්ගු දිවයිනේ ජනයා අදහන්නේ ප්‍රතිමා ය. ඒ ප්‍රතිමා පුදුම උපදවයි. සමහර ප්‍රතිමා හිස් ගොනුන්ගේ රූපාකාරයෙන් තනා ඇත. සුනඛයන්ගේ සහ එළුවන්ගේ සහ වෙනත් සතුන්ගේ හිස්වල

Scanned by CamScanner

ස්වරූපය ගනී. සමහර දේවරූපයක එක් හිසකි. තවත් දේවරූපයක හිස් දෙකක් ද, මුහුණු දෙකක් ද ඇත්තේ ය. තවත් දේව රූපයක හිස් තුනකි. එක් හිසක් මත එකක් එකක් සිටින සේ තනා තිබේ. ඇතැම් දේව රූපයක අත් සතරකි. තවත් ප්‍රතිමාවක අත් දහයකි. අත් සියයක ප්‍රතිමා ද තිබේ. අත් රාශියක් සහිත ප්‍රතිමාව මහත් ආනුභාව සම්පන්න ලෙස සැලකේ. මෙබඳු ප්‍රතිමාවලට පුද පූජා පවත්වන්නේ ද වත් පිළිවෙත් පවත්වන්නේ ද විශේෂ ආකාරයකිනි. මේ අයුරින් ප්‍රතිමා ඉදිකරන්නේ මුතුන් මිත්තන්ගේ කාලයේ පටන් බව ඔව්හු කියති. අනාගත පරපුරට ද මේ ප්‍රතිමා වන්දනාව පවත්වා ගෙන යෑමට ඉඩ සැලසීම ඔවුන්ගේ අභිප්‍රායයි. මෙකී දේව රූප අබිමුවෙහි ඔවුන් පවත්වන පුද පිළිවෙත් භයානක ය. පාපිෂ්ඨ ය. පිළිකුල උපදවන්නේ ය. ඒ පිළිබඳව තොරතුරු මේ කෘතියට ඇතුළත් කිරීම පවා අයෝග්‍ය සේ සලකමි. මෙසේ දේව රූපවල පුද පූජා පවත්වන ජනයා කිසියම් සතුරකු අල්ලා ගත් විට බේරී යෑම සඳහා මුදලක් දීමට නොහැකි වුව හොත් ඔහු මරා දමති. අසල්වැසියන් ද නෑසියන් ද සමග සාතනය සිදුකොට සිරුරේ මස් බුදිති. අන් සියලු මාංශවලට වඩා මිනී මස් රසවත් බව ඔවුන්ගේ හැඟීම ය.

ශිපන්ගු දිවයින හාත්පස පිහිටි සාගරය "චීන මුහුද" නමින් හැඳින්වේ. නැගෙනහිර පළාතේ සිට මේ මුහුද විශාල ප්‍රදේශයක පැතිර පවතී. මෙහි දූපත් හත්දහස් හාරසිය හතළිස් අටක් ඇති බව චීන මුහුදේ නිතර ඔබ මොබ යාත්‍රා කර පළපුරුදු නැවියෝ පවසති. මෙකී දූපත්වල ජනයා වාසය කරති. සුවඳක් නොමැති කිසිදු ගසක් වැලක් මේ දූපත්වල නොමැති බව ද ඔව්හු පවසති. කුළුබඩු ඖෂධ වර්ග අගිල් ගුගුල් සුදු ගම්මිරිස් කළු ගම්මිරිස් යනාදිය මේ අතර බහුල ය. වටිනාකම කියා නිම කළ නොහැකි රත්රන් මේ දූපත්වලින් ලැබේ. වෙනත් වෙළඳ ද්‍රව්‍යයන්ගේ අගය ද අපමණ ය. මහා චීන දේශයට මෙහි සිට විශාල දුර ප්‍රමාණයක් පවතී. යාත්‍රාවන්ගේ ගමනේ දී නොයෙක් බාධක හා දුෂ්කරතාවනට මුහුණ පෑමට සිදුවන නිසාත් ෂයිටුන් හා කින්සායි වරායවලින් වෙළෙඳ ද්‍රව්‍ය පටවාගෙන යෑමෙන් ප්‍රමාණවත් ලාභයක් නොලැබේ. ගමනට මෙන්ම නැවියන්ගේ ආහාරපාන සඳහාත් විශාල මුදලක වියදම් වේ. ශීත ඍතුවේ දී ගමනාරම්භ කරන්නා වූ නෞකා ආපසු

පැමිණෙනුයේ ග්‍රීෂ්ම ඍතුවේ දී ය. මේ කාල පරිච්ඡේද දෙකෙහි දී දෙආකාරයකින් සුළං හමයි. එබැවින් එක් සුළං කාලයක දී පිටත්ව යෑමටත් අනෙක් සුළං කාලයේ දී ආපසු ඊමටත් කාල වේලා යොදාගනිති. දූපත් පිහිටා තිබෙන්නේ ඉන්දියාවේ සිට බොහෝ දුර බැහැරිනි. චීන මුහුද යයි මෙය හැඳින්වුව ද මහා සාගරයේ ම කොටසකි. ඉංගිරිසි මුහුද හෙවත් ඊජියන් මුහුද යනුවෙන් අප ව්‍යවහාර කරන පරිද්දෙන් ම නැගෙනහිර ප්‍රදේශ වාසීහු චීන මුහුද ඉන්දියන් සාගරය යනාදි වශයෙන් ව්‍යවහාර කිරීමට පුරුදුව සිටිති. එහෙත් මේ වූ කලී එකම සාගරයකි. ඉහත සඳහන් කැරුණු දූපත් සහ රටවල් දැක ගැනීමට අවස්ථාවක් සැලසුණේ නැත. ඛාන් අධිරාජයාගේ පාලනයට අයත් රාජ්‍ය නොවන බැවිනි. එහෙයින් යථෝක්ත විස්තර මෙතෙකින් සමාප්ත වෙයි.

සයිටන් වරායෙන් නික්ම බටහිර දෙසට සැතපුම් එක්දහස් පන්සියයක දුර යාත්‍රා කළ කල්හි කීන් නමැති සමුද්‍ර බොක්ක හමුවේ. කිනන් සමුද්‍ර වංකය පසු කිරීමට ගතවන කාලය දෙමාසයකි. මන්සි ප්‍රදේශයේ දකුණ මායිම එහි උතුරු වෙරළ ඔස්සේ පිහිටියේ ය. එහි සිට වෙරළාසන්නයේ අනියා - ටොලමන් සහ තවත් ප්‍රදේශ පසුකැර යෑමට සිදුවිණ. මෙහි බොක්කේ දූපත් රාශියක් තිබේ. එහි බොහෝ දූපත් ජනාවාස ය. රත්රන් කුඩු එකතු කිරීම වෙරළබඩ ප්‍රසිද්ධ කර්මාන්තයි. ගංගා මුහුදට ගලා බස්නා ප්‍රදේශ අසල රන් කුඩු බහුල ය. තඹ සහ වෙනත් ඛනිජ ද්‍රව්‍ය ද මෙහි දී හමුවේ. යථෝක්ත ඛනිජ ද්‍රව්‍ය නොමැති දූපත්වලට ඒවා අලෙවි කැරේ. මහා චීනයේ වෙළෙඳුන් සමග ද මෙහි ජනයා ගනුදෙනු කරති. දූපත්වලින් ලැබෙන වෙළෙඳ භාණ්ඩ ද තඹ සහ රත්‍රන් ද ඔව්හු හුවමාරු කැර ගනිති. සමහර දූපත්වල ධාන්‍ය වර්ග සුලභ ය. මේ වරාය සහිත ප්‍රදේශය අති විශාල බැවින් ද ජනාකීර්ණ බැවින් ද පෙනී යන්නේ අමුතු ලෝකයක් ලෙසිනි.

සයිටුන් වරායෙන් නික්ම කීනන් බොක්ක හරහා සැතපුම් එක්දහස් පන්සියයක් ගෙවා පැමිණියේ චම්බා (සියම්බා) නමැති රටට ය. එය අති විශාල ධනවත් රාජ්‍යයකි. රජකු විසින් පාලනය කරනු ලබන මේ රාජ්‍යයේ වැසියන් කථා කරන භාෂාව ඔවුන්ටම විශේෂ වූවකි. මෙහි වැසියෝ බුද්ධාගම අදහති. වාර්ෂිකව චීන අධිරාජයාට ඇතුන් සහ අගිල් තොග වශයෙන් යවනු ලැබේ.

Scanned by CamScanner

කුබ්ලායි ඛාන් අධිරාජයාට මේ රාජ්‍යයේ ධනවත්කම පිළිබඳව 1268 දී පමණ දැනගන්නට ලැබිණ. ප්‍රබල අශ්වාරෝහක හමුදාවක් ද පාබල හමුදාවක් ද යවා මේ රාජ්‍යය අත්පත් කැර ගැන්මට අධිරාජයා කටයුතු කෙළේ ය. සොගතු නමැති අධිපතියාගේ නායකත්වයෙන් මේ ආක්‍රමණය සිදු කරන ලදී.

චම්බා රටෙහි රජු අක්කම්බල් නම් විය. හෙතෙම වයෝවෘධ ය. එහෙයින් කුබ්ලායි ඛාන් අධිරාජයාගේ සේනා සමග සටන් කොට ජය ගැනීමට නොහැකි බව වටහා ගති. අනතුරුව රජතුමා බලකොටුවක රැඳී සතුරන් සමග බිහිසුනු සටනක යෙදුණි. රජතුමා බලවත් ලෙස එකී බලකොටුව ආරක්ෂා කැර ගෙන සිටින අතර තුර කුබ්ලායි ඛාන්ගේ සේනාවෝ නගර ගම් නියම්ගම් ද කෙත්වතු ද වගාවන් ද විනාශ කරන්ට පටන් ගත්හ. ආක්‍රමණික හමුදා කරන ජන විනාශය සහ දේපළ විනාශය දරාගත නොහී කුබ්ලායි ඛාන් වෙත සාම දූතයන් වශයෙන් රජතුමා තානාපති පිරිසක් යැවී ය. තම රාජ්‍යය හා ජනයා විනාශ නොකරන ලෙසත් හමුදා ඉවත් කැරගන්නා ලෙසත් ඉල්ලා සිටියේ ය. එසේ කළහොත් වාර්ෂිකව අධිරාජයා වෙත ඇතුන් හා අගිල් කප්පම් වශයෙන් ගෙවීමට පොරොන්දු වන බව ද කීය. ඒ බව ඇසූ කුබ්ලායි ඛාන් අධිරාජයා මැදිහත් සිතින් සොගතු සේනාපතියා යටතේ යැවූ හමුදා ඉවත් කැර ගති. ඉන්පසු ඒ හමුදාව වෙනත් රටක් යටත් කැර ගැනීමට යවන ලදී. චම්බා රටේ රජු එතැන් පටන් අධිරාජයාට විශාල ඇතුන් විස්සක් ද අගිල් දර තොගයක් ද වාර්ෂිකව යවන්නේ ය. අනතුරුව චම්බා රටේ රජු කුබ්ලායි ඛාන් හට යටත්ව රාජ්‍යය පවත්වා ගෙන ගියේ ය. මේ රටේ සෑම තරුණියක් ම පළමුවෙන් රජුට පාවා දිය යුතු යයි නීතියක් තිබේ. මෙසේ පාවා ගන්නා තරුණියන් වඩාත් මනෝඥ යයි වැටහුණ හොත් කාලයක් රජමැදුරේ රඳවා ගැනේ. කාලයකට පසු මේ ස්ත්‍රියට වෙනත් පුරුෂයකු සමග සරණ යෑමට සුදුසු මුදලක් ද ගෙවා මුදා හරිනු ලැබේ.

මාර්කෝ පෝලෝ මේ දේශයට ගියේ 1280 දී ය. ඒ වන විට මේ රජුට ගැහැනු සහ පිරිමි දරුවෝ තුන්සිය විසිහය දෙනෙක් සිටියහ. වැඩුමල් තරුණ කුමාරවරු යුදහමුදාවේ බලවතුන් ලෙස කටයුතු කරති. මේ රටේ ඇතුන් සුලභ ය. අගිල් ගස් ද බහුල ය. කළුවර ගසින් යුතු වනාන්තර තිබේ. අලංකාර කළුවර දැව භාණ්ඩ

Scanned by CamScanner

නිෂ්පාදනය කැරේ. ඒ හැර වෙනත් විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු නොමැත.

මෙහි සිට සැතපුම් එක්දහස් පන්සියයක් දුර ගිනිකොණ දෙසට යාත්‍රා කළ කල්හි ජාවා නමැති විශාල දිවයිනට ළඟා වූයෙමු. මේ දූපතෙහි වට ප්‍රමාණය සැතපුම් තුන්දහසකට අධික බව පළපුරුදු නැවියෝ කීහ. ලෝකයේ විශාලම දිවයින මෙය බව ද කියති. මේ රටේ රජතුමා කිසිම රජෙකුට කප්පම් ගෙවන්නේ නැත. ප්‍රතිමා වන්දනා කරන්නා වූ ජන කොට්ඨාසයක් මෙහි වාසය කරති. ඉතා අගනා වෙළෙඳ ද්‍රව්‍ය බහුල ය. ගම්මිරිස්, සාදික්ක, ජටාමාංස, ඉඟුරු, සියඹලා, කරාබුනැටි ආදි ආහාරයට සහ ඖෂධ වශයෙන් ගත හැකි බොහෝ ද්‍රව්‍ය මෙහි සුලභ ය. අප්‍රමාණ රතරන් ප්‍රමාණයක් මෙහි තිබේ. මෙහි සිට මන්සි වෙළෙඳුන්ට විකුණන රත්රන් සම්භාරයත් කුළුබඩු සම්භාරයත් මෙපමණ යයි කියා නිම කළ නොහේ. ලෝකයේ නොයෙක් රටවලට ඉහත කී භාණ්ඩ මෙහි සිට නැව්ගත කැරේ. කුබ්ලායි ඛාන් අධිරාජයා මේ දූපත ආක්‍රමණය නොකෙළේ දුරබැහැර නිසාත් නැව් ගමනාගමනය අනතුරුදායක නිසාත් යයි හැඟේ.

ජාවා දූපතේ සිට දකුණටත් නිරිතටත් අතර මාර්ගයකින් සැතපුම් හත්සියයක් දුර යාත්‍රා කල පසු දූපත් දෙකක් දක්නට ලැබිණ. විශාල දිවයින සොන්දුර් නමින් ද කුඩා දිවයින කොන්දුර් නමින් ද හැඳින්වෙයි. එහි මිනිසුන් පදිංචි වී නැත. එහෙයින් ඒ ගැන විස්තර කිරීම අනවශ්‍ය ය. එහි සිට සැතපුම් පනහක් පමණ ගිනිකොණ දෙසට යාත්‍රා කළ කල්හි මහාද්වීපයේ කොටසක් ලෙස සැලකෙන ලෝචක් නමැති දේශය හමු විය. මෙහි ජනයා පිළිම වන්දනා කරන්නා වූ බෞද්ධයෝ ය. ඔවුනටම ආවේණික භාෂාවක් කථා කරති. ඔවුන්ගේ ම රජෙක් මේ දේශය පාලනය කරයි. මේ රටේ පිහිටීම අනුව සතුරනට ආක්‍රමණය කිරීම දුෂ්කර ය. කුබ්ලායි ඛාන් අධිරාජයා මේ රට යටත් කැර ගැනීමට උත්සාහ නොකෙළේ ඒ නිසා විය හැකි ය. සායම් ලබාගන්නා පතඟි වර්ගයේ ශාක විශේෂයක් මෙහි වැවේ. අලි ඇතුන් ද බහුල ය. දඩයම් කළ හැකි සතුන් ද සුලභ ය. පිඟන් භාණ්ඩ සෑදීමට ගන්නා බෙලි කටු විශේෂයක් මෙහි සිට වෙනත් රටවලට අපනයනය කැරේ. මුදල් වෙනුවට ද මේ බෙලිකටු හුවමාරු කරනු ලැබේ. මෙහි බර්ච් නමැති මත්පැන්

පෙරන පලතුරු වර්ගයක් ඇත. ලෙමන් ගෙඩියක් තරම් මේ පලතුරු වර්ගය විශාල ය. රසවත් පලතුරු වර්ගයකි. වනාන්තරයෙන් ගැවසීගත් මේ රටට විදේශිකයන් පිවිසෙනුයේ කලාතුරකිනි. එහි පාලකයා විදේශිකයන්ගේ පැමිණීමට බාධා පමුණුවන්නේ රට අභ්‍යන්තරයෙහි තොරතුරු සහ ඓශ්වර්‍යය බාහිර ලෝකයට අනාවරණය වීම වැලැක්වීමට ය. ලෝවන් යනු කාම්බෝජයේ පළාතක් විය හැකි ය.

ලෝවක් හි සිට සැතපුම් පන්සියක් පමණ දුරක් දකුණු දෙසට යාත්‍රා කළ පසු පෙන්තාන් නමැති දිවයිනට ළඟා වීමට හැකි විය. බින්තාන් (පෙන්තාන්) දූපතෙහි වෙරළබඩ ප්‍රදේශය වනාන්තරයෙන් වැසී ගොසිනි. ඒ වනාන්තරයේ තුරුලිය ගොමු තුළින් ඉම්හිරි මල් සුවඳ විහිදේ. ලෝවක් දූපත හා බින්තාන් දූපත් අතර මුහුද ගැඹුරු නැත. මුහුදේ පළල සැතපුම් හැටකට වඩා නැත. ගැඹුර බඹ හතරකට වඩා නොවේ. ජලය ගැඹුරු නොවීම නිසා නැව්වල සුක්කානම එසවීමට සිදුවේ. එසේ නොකළහොත් සුක්කානම මුහුදු පත්ලේ හැපෙයි. නැවත සැතපුම් හැටක් ඉදිරියට යාත්‍රා කළ පසු තවත් දූපතක් හමුවේ. එය මලයුර රාජ්‍යය නමින් හැඳින්වේ. අගනුවර ද එනමින් හැඳින්වේ. ඔවුන්ගේම රජකු යටතේ පාලනය වන මෙරට වැසියන් කථා කරන්නේ ඔවුනටම ආවේණික වූ භාෂාවකි. මනා ලෙස ගොඩනැගූ මේ නගරය විශාල ය. ඖෂධ වර්ග ද කුළුබඩු ද මෙහි බහුල ය. වෙළෙඳාම ඉතා දියුණු ය. අනතුරුව අප යාත්‍රා කෙළේ සුළු ජාවා රටට ය.

බින්තාන් (පෙන්තන්) දූපතෙන් නික්ම ගිනිකොණ දෙසට සැතපුම් සියයක් පමණ දුර යාත්‍රා කළ පසු සුලු ජාවා දූපත හමුවේ. මෙය සුලු ජාවා දූපත නමින් හැඳින්වුව ද එහි වට ප්‍රමාණය සැතපුම් දෙදහසකට නො අඩු ය. මෙහි රාජ්‍ය අටකි. වෙන වෙනම රජවරු ඒ ඒ ප්‍රදේශ පාලනය කරති. ඒ ඒ රාජ්‍යවල ජනයා ඔවුනොවුනට විශේෂ වූ භාෂා කථා කරති. බෞද්ධයන් වන මොවුහු පිළිම වන්දනා කරති. ධනෝපායන මාර්ග හා භාණ්ඩ මෙහි බහුල ය. මුහුදු මාර්ගය දුර බැහැර බැවින් මෙහි වාණිජ භාණ්ඩ අපගේ රටවලට නොලැබේ. එහෙත් මන්සි ප්‍රදේශයටත් කැතේ පළාතටත් මෙහි වෙළඳ භාණ්ඩ ප්‍රවාහනය කැරේ. මෙහි පවත්නා රාජ්‍ය අටෙහි ජනතාව පිළිබඳ වෙන වෙන ම තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

Scanned by CamScanner

උතුරු තාරකාව නොපෙනන තරමට මේ දූපත දකුණට හුරුව පිහිටා තිබේ. මාර්කෝ පෝලෝ මේ දූපතේ රාජ්‍ය හයකම සංචාරය කෙළේ ය. අනෙක් රාජ්‍ය දෙකට පිවිසීමට ඔහුට අවස්ථාවක් ලැබුණේ නැත.

මේ දූපතේ රාජ්‍ය අටෙන් එකක් පෙර්ලෙක් නමින් හැඳින්වේ. එහි වැසියෝ බෞද්ධයෝ ය. මුහුදුබඩ වරාය ආශ්‍රිතව පදංචි වී සිටින ජනයා මුස්ලිම් වෙළෙඳුන්ගේ ආශ්‍රය නිසා මහමත් ආගමට යොමු වී සටිති. කඳුකර ප්‍රදේශවල ජනයා ශිෂ්ට සම්පන්න නොවේ. පිරිසිදු අපිරිසිදු සතුන්ගේ මස් අනුභව කරන සේම මිනීමස් ද බුදිති. ඔවුන් වැඳුම් පිදුම් කරන්නේ නානාප්‍රකාරව ය. හිමිදිරි පාන්දර තින්දෙන් අවදි වූ වහාම දක්නට ලැබෙන දෙය කෙරෙහි දවස මුළුල්ලේ ම ගරු සැලකිලි කරති. ඉන්පසු පිවිසියේ බසමන් රාජ්‍යයට ය. මෙහි ජනයා කථාකරනුයේ ඔවුනටම ආවේණික භාෂාවකි. ඔවුන් කුබ්ලායි ඛාන් අධිරාජයාට යටත් බව පැවසුව ද කප්පම් ගෙවන්නේ නැත. චීනයෙන් බොහෝ දුර බැහැර පිහිටි බැවින් අධිරාජයාගේ හමුදා මෙහි එවීම දුෂ්කර ය. එහෙත් මුළු දිවයිනම අධිරාජයාට යටත් සේ සැලකේ. මේ අසලින් යාත්‍රා කරන නැව් මගින් අධිරාජයාට වටිනා භාණ්ඩ ද කෞතුක භාණ්ඩ ද තුටුපඬුරු වශයෙන් යවනු ලැබේ. උකුස්සන් හා කුරුලු ගොයි වර්ගයක් මෙසේ යවන තුටු පඬුරුවලට ඇතුළත් ය. අලි ඇතුන් ද කඟවේණුන් ද මෙරට බහුල ය. කඟවේණා අලියාට වඩා ශරීර ප්‍රමාණයෙන් කුඩා ය. පාද සමාන ආකාරයක් ගනී. සම මීහරකුන්ගේ වැනි ය. මේ සතුන්ගේ නළල මැද එක් අඟක් තිබේ. එහෙත් කඟවේණා පහර දෙන්නේ මේ අඟෙන් නොවේ. දිව ඉතා ශක්තිමත් ය. එහි කියතක දැති මෙන් දිග උල් කටු තිබේ. කිසියම් සතකු පහර දී දිවෙන් ලෙව කා දමති. දත දෙක ද, දෙපා ද පහර දීමට යොදා ගැනේ. කඟවේණාගේ හිස ඌරාගේ හිසට සමාන ය. ඌ ගමන් කරනුයේ හිස බිමට පහත් කැර ගෙන ය. මේ සත්තු වගුරු බිම්වලත් මඩ ගොහොරුවලත් ලගිති. මේ සතුන් පෙනුමෙන් පිළිකුල උපදවයි. බඹසර සුරකින පිරිසිදු කන්‍යාවක සමග ගියහොත් මේ සතුන් අල්ලා ගත හැකි බව කියති. ඒ මතය පිළිගැනීමට අපහසු ය. මෙහි විවිධාකාර වඳුරන් ද තද කළු පැහැති ගිජුලිහිණි ද සිටිති. දඩයම් සඳහා මේ ගිජුලිහිණින් පියාඹන්නේ අමුතු ලීලාවකිනි.

Scanned by CamScanner

වාමන හෙවත් කුරු මිනිස් වර්ගයක ශරීර වියළා ඉන්දියාවෙන් වෙනත් රටවලට වෙළෙඳාම පිණිස යවන බවට කථාවක් පවතී. මෙය සත්‍යයක් නොවේ. ඉහත සඳහන් භාණ්ඩය සකස් කරන්නේ පහත දක්වන ආකාරයෙනි.

මිනිසුන්ගේ මුහුණුවලට සමාන මුහුණ ඇති වඳුරු විශේෂයක් මෙරට ඇත. මිනිස්සු මේ වඳුරන් අල්ලා හිස බූ ගා දමති. මිනිස් සිරුරේ සෙසු තැන්වල වැඩෙන රෝම ද නිකටේ රැවුල ද ඉතිරි කර සෙසු සෑම තැනම ලොම් බූ ගා දමති. ඉන්පසු මේ වඳුරු මළ සිරුරු කපුරු හා වෙනත් ඖෂධ වර්ග යොදා කල් පවත්නා ආකාරයෙන් සකස් කරනු ලැබේ. වියළා ගත් මේ වඳුරු මළ සිරුරු බැලූ බැල්මට පෙනෙන්නේ කුරු මිනිසුන්ගේ මළ සිරුරු මෙනි. මෙසේ වියළා සකස් කරගන්නා වඳුරු මළ සිරුරු ලී පෙට්ටිවල අසුරා වෙනත් රටවල විකිණීමට ගෙන යනු ලැබේ. වෙළෙඳුන් මේ සිරුරු රැගෙන ගොස් කුරු මිනිස් සිරුරු බව කියා විකුණති. මෙය වංචාකාර වෙළඳාමකි. මෙවැනි කුරු මිනිසුන් වර්ගයක් ඉන්දියාවේ හෝ වෙනත් රටක වනචාරීන් අතර හෝ නැත.

අනතුරුව විස්තර කැරෙනුයේ 'සුමාත්‍රා' රාජ්‍යය පිළිබඳ තොරතුරු ය. මෙය ද දූපතේ එක් රාජ්‍යයකි. මාස පහක් මේ රාජ්‍යයෙහි නවාතන් ගැනීමට මාර්කෝ පෝලෝට සිදුවිණ. විරුද්ධ පැත්තෙන් හමන සුළඟ සැඩ වූ බැවින් මෙසේ මාස පහක කාලය අකමැත්තෙන් වුව ද ගත කිරීමට සිදුවිණ. උතුරු ධ්‍රැව තාරකාව මේ රටට නොපෙනේ. එසේම මහ වලසා නමැති තාරකා සමූහය ද නොපෙනේ. මෙහි පදිංචිකරුවෝ බුද්ධාගම අදහති. බලවත් කුමාරයෙක් මෙහි පාලනය පවත්වා ගෙන යයි. මේ රටේ සිටින වනචාරී ගෝත්‍රික ජනයාගෙන් ආරක්ෂා වීම සඳහා මාර්කෝ පෝලෝ දෙදහසක පමණ පිරිසක් රැස්කැර ගති. ඔවුන් ලවා ආරක්ෂක බලකොටුවක් තනාගති. මේ බලකොටුව තනන ලද්දේ වෙරළබඩ ය. කණ්ඩායමෙන් වෙන් වී තනිව ගමන් කරන මිනිසුන් අල්ලා කන වනචාරී මිනිසුන් පිරිසක් මෙහි සිටිති. ඔවුන්ගෙන් ආරක්ෂා වීම සඳහා ගොඩබිම දෙසින් ගැඹුරු අගලක් ද කනවන ලදී. මේ ආරක්ෂක විධිවිධාන නිසා කණ්ඩායමේ කිසිවකුටත් අනතුරක් නොවන පරිදි ආරක්ෂා කැර ගන්මට හැකි විය. ඒ අගලේ දෙකෙළවර ද වරාය දෙසට යොමුවන සේ ඉදිකැර තිබිණි. නැව ද

නවතා තිබුණේ ඒ අසල ය. ලී දඬුවලින් ආරක්ෂිත ලෙස බලකොටු වැනි නිවාස ද තනාගන්නට ලැබිනි. එබඳු කටයුතු සඳහා මෙරට ලී දඬු ඉතා සුලභ ය. මේ රටේ පාලකයා ඛාන් අධිරාජයාට යටත් බව පවසයි. වැසියන් සමග ඇති කැරගත් සම්මුතියක් අනුව එහි රැඳී සිටි තක් කල් අවශ්‍ය ආහාරපාන ඔව්හු සැපයූහ.

මෙහි දී අපට කෑමට ලැබුණේ ලෝකයේ කවර රටක දී හෝ නොලැබුණු තරම් ඉස්තරම් මාලු වර්ග ය. බත් ආහාරය පිණිස ගන්නා මේ රටේ ඉරිඟු වගාවක් නැත. මේ රටේ මත්පැන් පෙරන්නේ නැත. ඒ වෙනුවට තාල වර්ගය ගසකින් සුරා වර්ගයක් ලබා ගැනේ. ඒ ගසේ අත්තක් කපා දැමූ කල්හි වැගිරෙන යුෂ එකතු කරන්නේ භාජනයක් එල්ලා තැබීමෙනි. රාත්‍රී කාලය හා දිවා කාලය මුලුල්ලේ වැගිරෙන යුෂයෙන් භාජනය පිරේ. මෙය සුරාවක් ලෙස පානය කළ විට මත්වේ. උදර රෝගීන්ට, මල බද්ධයට, අක්මා රෝගයට හා පාචනයට මෙය අගනා ඖෂධයක් වශයෙන් සැලකේ. මේ ගස්වලින් වෑහෙන සුරා අඩු වී යන විට ඔව්හු ගඟේ ජලය ගෙන අවුත් ගස මුලට වත්කරති. කානු කපා හෝ පීලි මගින් හෝ ජලය සපයති. එවිට නැවත ගසෙන් රා වැගිරෙන්නට පටන් ගනී. ඒ හැරුණු විට රතු වයින් වර්ගයක් ද සුදු වයින් වර්ගයක් ද මෙහි ඇත. පොල් වගාව ද මෙරට දක්නට ලැබේ. පොල් ගෙඩියක් මිනිස් හිසක් තරම් විශාල ය. පොල් ගෙඩියේ මදය ඉතා සුදු පැහැති ය. ඒ තුළ පිරිසිදු වතුර පිරී තිබේ. ඒ වතුර සීතල ය. මිහිරි රසයෙන් යුක්ත ය. වයින් හෝ අනෙක් බීම වර්ගයකට වඩා ප්‍රිය උපදවයි. පිරිසිදු අපිරිසිදු කම නොතකා මෙහි ජනයා නොයෙක් මස් වර්ග බුදිති.

අනතුරුව පිවිසියේ ඩ්‍රැගොයියන් නමැති රාජ්‍යයටයි. කුමාරයකු මෙරට පාලනය පවත්වා ගෙන යයි. මෙරට ජනයා කථා කරනුයේ ඔවුනටම ආවේණික වූ භාෂාවකි. එසේම කුබ්ලායි ඛාන් අධිරාජයාට යටත් බව ද ඔව්හු පවසති. මෙරට ජනයා අතර අරුම පුදුම පිළිකුල් සහගත සිරිතක් පවතී. පවුලක කිසියම් කෙනෙකු අසනීප වූ කල මන්ත්‍ර ගුරුකම් ඇදුරකු ගෙන්වා රෝගය පරීක්ෂා කොට සුවකළ හැකි බව හෝ නොහැකි බව දැනගනිති. මන්ත්‍රකරු විසින් භූතයන් මාර්ගයෙන් රෝගයේ ස්වභාවය දැනගනු ලැබේ. රෝගියා සුවකළ නොහැකි බව භූතාවේශයෙන් රෝගියා

පැවසුව හොත් නෑදෑයන් සහ තවත් පිරිසක් රෝගියා වසන නිවසට ගෙන්වා ගනිති. ඉන්පසු රෝගියා මැරෙන තුරු හුස්ම හිරවන සේ අල්ලා තදකරගෙන සිටිති. රෝගියා මියගිය පසු මෘත ශරීරය කුඩා කැබලිවලට කපනු ලැබේ. ඉන්පසු සියලු නෑදෑයන් හිතවතුන් සියලු දෙනා එක් රැස් වී මස් කැබැලි කා දැමීම ඔවුන්ගේ සිරිත ය. ඉතා සුලු කැබැල්ලක් පවා ඉතිරි නොවන ලෙස ඇට මිදුලු ද කා දමති. ඉතා සුලු කොටසක් පවා ඉතිරි වී තිබුණේ නම් එය කුණු වී පණුවන් ගසයි. ඒ පණුවෝ ද ටික දවසකින් වියළී යති. මෙසේ සිදුවන්නේ මියගිය තැනැත්තා දෛවයේ දරුණු දඬුවමක් විඳ සමාප්ත වූ බවකි. ඉන් ඉක්බිති ඉතිරිවන මිනිස් ඇට කටු අලංකාර කුඩා මංජුසාවක බහා කඳුකරයට ගෙන ගොස් ගල්ලෙනක් තුළ සඟවා තබන්නේ වනසතුනට අසුනොවන අයුරිනි. එපමණක් නොව ආගන්තුකයකු ඔවුනගේ පළාතට පැමිණුන හොත් වන්දියක් ගෙවීමට අසමත් වුව හොත් ඔහු මරා මස් කති. ඔවුන් එය අනුභව කරන්නේ මහත් සතුටිනි.

අනතුරුව අප පිවිසුණේ ලැම්බ්‍රි රාජ්‍යයට ය. එය ද පාලනය කරනු ලබනුයේ ඔවුන්ගේම රජකු විසිනි. ඔවුනටම ආවේණික වූ භාෂාවක් කථා කරති. ප්‍රතිමා අදහන්නෝ ය. චීන අධිරාජයාට යටත් බව ද කියති. බ්‍රැසිල් හෙවත් සප්පන් නමැති එක්තරා පැලෑටි වර්ගයක් මෙහි වැවෙයි. කපුරු ද සුලභ ය. මේ පැළෑටියෙන් ඔවුහු රතු පැහැති සායම් වර්ගයක් ලබා ගනිති. එසේ ඒ පැළෑටි වර්ගයට සමාන පැලෑටි වර්ගයක ඇට වර්ගයක් වපුරති. පැලවූ පසු මේවා උදුරා තවත් තැන්වල රෝපණය කරති. තුන් අවුරුද්දකින් මුල් සමගම ගස උදුරා රතු පැහැති සායම් වර්ගයක් ලබා ගැනේ. මාර්කෝ පෝලෝ මේ ඇට වර්ගය වැනිසියට ගෙන ගොස් රෝපණය කළ ද පැළ හටගත්තේ නැත. දේශගුණ විපර්යාසය නිසා විය හැකි ය. මෙහි වියතක් පමණ දිග වලිගයක් සහිත මනුෂ්‍ය වර්ගයක් සිටිති. වල්ගයේ ලෝම නැත. ඔවුන් ජීවත්වන්නේ කඳුකර ප්‍රදේශයන්හි ය. නගරබද නොවේ. කඟවේණුන් ද දඩයමට සුදුසු සිවුපාවෝ ද පක්ෂීහු ද මෙහි බහුලව වෙසෙති.

මේ රටේ හවන රාජ්‍ය ෆන්පූර් හෙවත් ෆන්සූර් නම් වේ. මේ රටේ පාලකයා ස්වදේශිකයෙකි. ජනතාව අදහන්නේ බුද්ධාගම ය. චීන අධිරාජයාට යටත් බව ඔව්හු කියති. මෙකී දිවයිනේ කපුරු

සෙසු රටවල කපුරුවලට වඩා තත්ත්වයෙන් උසස් ය. ෆන්පුර් කපුරු නමින් මේවා අලෙවි කැරේ. කපුරු විකුණනු ලබන්නේ රත්රන් බරට ය. තිරිඟු වර්ගයක් හෝ වෙනත් ධාන්‍ය වර්ගයක් මෙහි වගා නොකැරේ. කිරි සහ බත් ඔවුනගේ ප්‍රධාන ආහාරයයි. 'සමාරා' දේශයේ මෙන් මෙහි එක්තරා ගසකින් ලබාගන්නා යුෂ මද්‍යසාර ලෙස පානය කරති. මෙහි වැවෙන එක්තරා ගසකින් ලබාගන්නා මදයෙන් පිටි වර්ගයක් සාදා එය ආහාරයට ගනිති. මේ ගසේ කඳ ඉතා මහත් ය. මිනිසුන් දෙදෙනෙකුට බැඳීමට බැරි තරම් ය. පිට පොත්ත ගැලවූ පසු අඟල් තුනක් පමණ තද ඝන ලීයක් ඇත. සුදු පැහැති මදය ඇත්තේ ඒ තුළ ය. ඕක් ගෙඩියේ මදයට සමාන ය. මේ මදය ගෙන බඳුනක දමා ජලය පුරවා ලී කැබැල්ලකින් හැන්දකින් හැඳි ගාන විට හීන් කෙඳි සහ වෙනත් අපද්‍රව්‍ය බැහැර කළ හැකි වෙයි. ඉන්පසු සුදු පැහැයට හුරු පිටි භාජනය පතුළේ මිදේ. එසේ මිදුණු පිටි තලප ආහාරයට ගැනේ. පිටිවලින් සාදන කිනම් ආහාර වර්ගයක් වුවද මේ පිටිවලින් ද සාදාගත හැකි ය. රසයෙන් ද පෙනුමෙන් ද බාර්ලි පිටිවලින් සාදන පාන්වලට සමාන බැවින් මාර්කෝ පෝලෝ මේ ආහාරයට ඉතා ප්‍රිය කෙළේ ය. සියරට යද්දී මාර්කෝ පෝලෝ මේ පිටි ස්වල්පයක් ද ගෙන ගියේ ය.

මේ ගසේ ලීය තද ය. බර ය. ජලයට දැමූ කල කිඳා බසී. යකඩ වැනි ය. උණලීය මෙන් මේ ලී වර්ගය දික් අතට පැලීමට පුළුවන. කෙටි හෙල්ලක් වැනි ආයුධයක් මෙහි වැසියෝ මේ ලී පතුරු උල් කොට සාදාගනිති. බර වැඩි බැවින් වැඩි දිගට සාදන්නේ නැත. එක් කොනක් උල් කොට යන්තම් ගින්නට අල්ලා පදම් කරගත් විට ඉතා තියුණු ය. ශක්තිමත් ය. ඕනෑම ඝන වස්තුවක් සිදුරු කළ හැකි ය. යකඩ වෙනුවට ද මේ ලී වර්ගය ප්‍රයෝජනයට ගැනේ. (මේ කිතුල් ගස විය හැකි ය.) ඉතිරි රාජ්‍යයන් දෙකෙහි සංචාරය කළ නොහැකි විය.

ලැම්බ්‍රි දිවයිනෙන් නික්ම සැතපුම් එකසිය පනහක් දුරට යාත්‍රා කළ විට දූපත් දෙකක් හමුවේ. ඉන් එක් දූපතක් හඳුන්වනුයේ නිකොබාර් නමිනි. මෙහි ආණ්ඩුවක් හෝ රජකු නොමැත. මෙහි ජනයා ශිෂ්ටාචාර නොවේ. ඔවුන් ඇඳුම් පැළඳුම් නොමැතිව නිරුවතින් සිටින ආකාරය පෙනේ. බුද්ධාගම අදහති. මෙහි

Scanned by CamScanner

වනාන්තරවල සුදු හඳුන් ගස් ද, රත් හඳුන් ගස් ද බහුල ය. පොල් ගස් ද කරාබු ගස් ද සුප්පත් පැලෑටි ද වැවේ. ඖෂධ ශාක වර්ග ද බහුල ය.

එතැනින් නික්ම ගමන් ගත්තේ අන්දමන් දූපත වෙතට ය. රජකුගේ පාලනයක් එහි නොමැති අතර වැසියෝ බුද්ධාගම අදහති. ඔවුන්ගේ මුහුණු ඇස් අත් පා ආදිය කෲර ස්වභාවයක් උසුලයි. කෲර ගති පැවැතුම් සහිත ය. ආගන්තුක පුද්ගලයකු ඔහුගේ සිරුරට අත තැබුව හොත් ඒ තැනැත්තා මරා ගෙන කති. බොහෝ වෘක්ෂලතා මේ දිවයිනෙහි ඇත්තේ ය. බත් සහ කිරි මෙහි වැසියන්ගේ ප්‍රධාන ආහාරයයි සියලු මස් වර්ග ද අනුභව කරති. පොල් සහ කෙසෙල් සරුවට වැවේ. පලතුරු සහ තවත් බොහෝ වෘක්ෂලතා මෙහි දැකිය හැකි ය.

අන්දමන් දූපතේ සිට බටහිර දිසාවට දකුණට හුරුව සැතපුම් දහසක් යාත්‍රා කළ පසු ලංකාව නමැති දිවයිනට ළඟාවීමට හැකි විය. මේ දිවයිනෙහි ස්වභාවය අනෙක් සෑම දූපතකටම වඩා හොඳින් අපට දැනගන්නට ලැබිණි. මෙහි වටප්‍රමාණය සැතපුම් දෙදහස් හාරසියයකි. අතීතයෙහි මේ දිවයින මෙයට වඩා විශාල වූ බවත් වට ප්‍රමාණය සැතපුම් තුන්දහස් හයසියයක් වූ බවත් "මුප්පමණ්ඩ" යෙහි කියා තිබේ. උතුරු සුළඟ බිහිසුණු ලෙස මේ දිවයිනට හමන බැවින් කඳුහෙල් ඉවුරු බිඳී මුහුදට ගරා වැටේ. එහෙයින් මේ දූපතෙහි හැඩය සැමදා එකම අයුරකින් නොපවතී. ලංකා දිවයිනෙහි රජු "සෙන්ඩර් නම්" යනුවෙන් හැඳින්වේ. (චන්ද්‍රභානු) පිළිම වන්දනා කරන බුද්ධාගම මෙහි වැසියෝ අදහති. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම විළි වැසෙන තරමට පමණක් කුඩා රෙදි පටක් පමණක් හැඳ සිටිති. ඔවුනට ධාන්‍ය වර්ග වශයෙන් ඇත්තේ වී සහ තල පමණි. තල වලින් තෙල් සිඳිනු ලැබේ. ආහාරය බත්, කිරි සහ මස් වර්ග ය. ඔවුන් මද්‍යසාර ලබාගන්නේ ගස්වලින් වෑහෙන යුෂයකිනි. මේ පිළිබඳ විස්තරයක් ඉහත සඳහන් විය. අනෙක් සියලු රටවලට වඩා වටිනා පතඟි ගස් මෙරට වැවේ.

ලෝකයේ අන් කිසිදු රටක දක්නට නොලැබෙන රතු මැණික් මේ දිවයිනේ උපදී. නිල් මැණික්, පද්මරාග, අඹතේස්ත, මරකත, ලා රතු, තද රතු, දම්පාට සහ තවත් විවිධ වර්ණයෙන් බබළන මැණික් මෙරට පොළොවෙන් ලැබේ. මෙරට රජතුමා සතුව පුදුම

Scanned by CamScanner

සහගත කිසිවකුටත් කිසිම රටකදී දක්නට නොලැබුණු මාණික්‍යයක් ඇති බව අසන්නට ලැබුණි. එය වියතක් තරම දිග ය. මිනිස් අතක් තරම මහත ය. එයින් ඉතා දීප්තිමත් ආලෝකයක් විහිදේ. එය විස්තර කළ නොහැකි තරමේ ආලෝකයකි. කිසිදු පලුද්දක් මේ මාණික්‍යයෙහි නැත. ගිනිදැල් විහිදෙන ලෙසින් මේ මාණික්‍යය බබළන්නේ ය. මේ මැණික පිළිබඳ ආරංචිය ලැබුණු කුබ්ලායි ඛාන් අධිරාජයා එය මිලදී ගැනීමට තානාපතියන් මෙරටට එවී ය. මැණික දෙන්නේ නම් නගරයක වටිනාකමට සමාන වස්තු සම්භාරයක් ද දෙන බව කී ය. එහෙත් මෙයට මෙරට අධිපතියා කැමැති වූයේ නොවේ. මේ අගනා මැණික පිය පරපුරෙන් තමන් සතු වූ බවත් මුළු ලෝකයේ ම වස්තුව ලැබුණත් මේ මැණික කිසිවකුට නොදෙන බව කීය. එහෙයින් චීන අධිරාජයාට මේ මාණික්‍යය ලබා ගැන්මට හැකි වූයේ නැත. මෙරට මිනිසුන් රණකාමීහු නොවෙති. බියගුලු මිනිස් කොට්ඨාසයකි. යුද භටයන් අවශ්‍ය වූ කල්හි පිටරටවලින් ද අසල්වැසි මහමත්වරුන් ද ගෙන්වා ගතිති. මේ හැරුණු විට කිව යුතු වෙනත් විශේෂයක් නොමැති බැවින් මාආබරය (මලබාර්) වෙතට යාත්‍රා කෙළෙමු.

සෙයිලාන් (සිංහල) දූපතෙන් නික්ම සැතපුම් හැටක් පමණ බටහිර දෙසට යාත්‍රා කළ කල්හි මාආබාර් (මලබාර්) දේශය හමුවේ. එය විශාල භූමි ප්‍රදේශයකි. දූපතක් නොව ඉන්දියාවේ කොටසකි.

Scanned by CamScanner




# ඉන්දියාව

ඉන්දියාව ලෝකයේ ඉතා උතුම් ධනවත් රාජ්‍යය ලෙස සැලැකේ. එහි රජවරු හතර දෙනෙක් සිටිති. ඔවුන්ගේ ප්‍රධානියා සෙන්ඩර් බන්දි (සුන්දර පාණ්ඩ්‍ය) නම් වේ. (සෙන්දර බන්දි දේවාර්) මේ රාජ්‍යයට අයත් මාබාරයත් ලංකාවත් අතර මුහුදු බොක්කේ මුතු උපදින මුතු පරයක් තිබේ. එහි මුහුද නොගැඹුරු ය. බඹ දහයකට දොළහකට වඩා ගැඹුරු නොවේ. එහි මුතු කිමිදීමේ කර්මාන්තය පවතී. එහි මුතු කිමිදෙන්නේ පහත දැක්වෙන ආකාරයෙනි. වෙළෙඳ කණ්ඩායම් ගණනාවක් එකතු වී කණ්ඩායම් කිහිපයකට බෙදී විවිධ ප්‍රමාණයේ නැව්, ඔරු, බෝට්ටු ආදිය යොදවා ගෙන ඒවා නිසි තැන නිසි පරිදි නැංගුරම් ලා ගනිති. අනතුරුව මුහුදේ ගැඹුරට කිමිදී මුතු බෙල්ලන් කැඩීමේ දක්ෂ පළපුරුදු කිමිදුම්කරුවන් ලවා මුතු කර්මාන්තය කරනු ලැබේ. මුතු පර දක්වා මුහුදේ කිමිදෙන මිනිසුන් මුතු පරයෙන් බෙල්ලන් කඩා සිය සිරුරේ දවටාගෙන ඇති දැල්වලට දමා ගනිති. අනතුරුව උඩට පැමිණ තමන් කඩාගත් මුතු බෙල්ලන් බෝට්ටුවලට දමති. මේ අයුරින් කිමිදුම්කරුවෝ බොහෝ පිරිසක් මුහුදු පත්ලේ කිමිදී මුතුපර කඩා ගෙන අවුත් නැව් ඔරු බෝට්ටු ආදියට දමත්. වරින් වර විවේක ගෙන ඔව්හු යළි යළිත් කිමිදෙති. මුතු බෙල්ලන් රැගෙන උඩට එති. එක් නැවක විසි තුන් දෙනෙක් සේවය කරති. එයින් දස දෙනෙක් කිමිදුම් කරුවෝ ය. එක් බෝට්ටුවක කිමිදුම් ගල් පහක් එල්ලා තිබේ. කුඩා දැල් පහක් ද කණුවල ගැටගසා ඇත. දහවල් දවස මුළුල්ලේ ම මේ කිමිදුම්කරුවෝ මුතු කිමිදීමෙහි යෙදෙති. එක් වාරයක දී ලැබෙන මුතු බොහෝ රටවලට බෙදී යයි.

Scanned by CamScanner

කුඩා කාලයේ සිටම මුතු කිමිදීමේ පළපුරුද්දක් මේ කිමිදුම් කරුවනට ඇත. ඔව්හු බඹ පහේ සිට හය දක්වා ගැඹුරට කිමිදීමට තරම් නිර්භීත වෙති. කිමිදුම් කරු මුහුදට බැස්සවීම සඳහා යොදාගන්නා කඹයේ එල්ලන දැල් සහ ගල් කුඩා ය. මේ කඹ ගැට ගසා ඇත්තේ ඔරුවල හෝ නැව්වල ය. ලනුවේ කෙළවර ගැටගසා ඇති ගලට පාදයක මහපට ඇඟිලිකරුව තබා එක් අතකින් කඹයත් දැල් කුඩයත් අල්ලාගෙන අනෙක් අතින් නැහැය වසාගෙන මුහුදේ ගිලෙති. අනතුරුව හැකිතාක් මුතු බෙල්ලන් කඩා කුඩයට පුරවා ගනිති. නැවැතත් හුස්ම ගැනීමට හැකිතාක් ඉක්මනින් ගොඩට එති. මේ ආකාරයෙන් බොහෝ දෙනා බොහෝ වාර ගණනක් කිමිදී යළි ගොඩට එමින් මුතු රැස් කරති. ගල බැඳි ලනුවට සංඥා කළ වහාම ඔරුවේ සිටින පිරිස කිමිදුම්කරු වහා ගොඩට ඇද ගනිති. පස් දෙනකු ගෙන් යුත් එක් කණ්ඩායමක් මුතු කැඩීමෙන් පසු තවත් පස් දෙනෙක් ඒ සඳහා කිමිදෙති. මේ අයුරින් මේ ක්‍රියාවලිය දිනය මුළුල්ලේ සිදුවෙයි. දැල් කුඩයෙන් එක්ව එකට මුතු බෙල්ලන් සියයක් පමණ ගොඩට ගෙන එනු ලැබේ. එක් වරුවකට පනස් වරක් පමණ මෙසේ කිමිදීමට හැකි ය. මෙසේ කිමිදී ලබාගන්නා බෙල්ලන්ගේ මුතු වටකුරු ය. දීප්තිමත් ය. කාගේ වුවද සිත පිනවයි. මලබාර් වෙරළේ මුතුපර සහිත ස්ථානය හඳුන්වනුයේ "බෙතා" නමිනි. මෙහි සිට සැතපුම් හැටක් පමණ දුරට මේ මුතුපරය විහිදී තිබේ. මෙකී සාගර බොක්කේ ගැවසෙන විශාල මත්ස්‍ය වර්ගයක් හේතු කොට ගෙන ඇතැම් විට කිමිදුම් කරුවෝ අනතුරට ලක්වෙති. එබැවින් මුතු කර්මාන්තය සඳහා යන වෙළෙන්දෝ මන්ත්‍ර ගුරුකම් දන්නා බ්‍රාහ්මණයන් ලවා ඒ ස්ථානයෙහි ආරක්ෂා යොදති. මන්ත්‍ර බලයෙන් විශාල මසුන්ගෙන් වන අනතුරු වළකාලීමට හැකි යයි විශ්වාසයක් පවතී. මුතු කිමිදීම දිවා කාලයට පමණක් සීමා වේ. රාත්‍රී කාලයේ දී මන්ත්‍ර ගුරුකම්වලින් කරන ආරක්ෂාව ඉවත් කරති. රාත්‍රියේ දී හොරෙන් මුතු කිමිදීම වළක්වාලනු පිණිස ය. මෙය මුතු කිමිදීමේ නියුක්ත වෙළෙඳුන්ගේ ව්‍යාජ ප්‍රචාරයක් බව ද කියති. මේ මන්ත්‍රකාරයන්ට පක්ෂීන් ද සිවුපා සතුන් ද වසඟ කළ හැකි යයි ද පැවසේ. මුතු වාරය එළැඹෙන්නේ අප්‍රේල් මාසයේ ය. මැයි මාසය අග දී අවසන් වේ. මුතු කිමිදීමේ සම්පූර්ණ අයිතිය රජු සතු ය. එහෙයින් ලාභයෙන් දහයෙන් එකක් රජයට ගෙවනු ලැබේ.

Scanned by CamScanner

ආරක්ෂා මන්ත්‍රකාර බමුණන්ට ලාභයෙන් විස්සෙන් එකක් ගෙවිය යුතු ය. මෙසේ සලකා බලන කල මුතු කිමිදීම අතිශයින් ලාභදායක කර්මාන්තයකි. මෙහි මුතු කැඩීමේ වාරය අවසන් වූ විට සැතපුම් තුන් සියයක් ඈත පිහිටි තවත් මුතු පරයකට යති. සැප්තැම්බර් මාසයේ පටන් ඔක්තෝබර් මාසය දක්වා එහි මුතු කිමිදීම කරති. ඉතා හොඳ වටිනා මුතු රජුට භාරදෙති. රජු දහයෙන් කොටස තෝරාගන්නේ තම සිතැඟි පරිදි ය. වටිනා විශාල මුතු රජු ලබාගෙන ඒ සඳහා මුදල් ගෙවයි. මේ නිසා මුතු වෙළෙන්දෝ සියලු මුතු කපටිකමින් තොරව රජ දැක්මට තබති.

මෙහි ස්වදේශික ජනයා යන්තම් විලි වැසෙන පමණට ඇඳුමක් අඳිති. යන්තම් රෙදි තීරුවකින් අමුඩයකින් සැරසී සිටින්නෝ ය. රජුගේ ඇඳුම ද එයට සමාන ය. එහෙත් රජතුමා හැඳ සිටින රෙදි කඩ සාමාන්‍ය වැසියන්ගේ රෙදි කඩට වඩා අගනේ ය. එසේ ම රජතුමා පැළඳ සිටින ස්වර්ණාභරණ හේතුකොට ගෙන ශ්‍රේෂ්ඨත්වය ප්‍රකට වෙයි. අගනා මැණික් සහිත මාලයක් ගෙල පැළඳ සිටී. අගනා නිල්මිණි, මරකත, පද්මරාග ආදි විවිධ මැණික් සහිත ආභරණවලින් ද සැරැසී සිටී. ගෙලෙහි සිට උදරය දක්වා එල්ලෙන මාලයක් ද පැළඳ සිටී. මෙහි මුතු මැණික් එකසිය හතරකි. එය දේවාශිර්වාද පතා පළඳින්නකි. කපුවෝ දෙවාලයේ පුද පූජා තේවා පවත්වා එක්සිය හතර වරක් රජුට ආයුරාරෝග්‍ය සම්පත් පතා ආශිර්වාද කරති. දිනපතා පවත්වන මේ ආශිර්වාද පූජාව පාරම්පරික චිරාගත සම්ප්‍රදායකි. චාරිත්‍රයකි. මෙහිදී බමුණෝ මේ පූජාව පවත්වන විට කපුවෝ පචච්චා - පචච්චා (භගවතා - භගවතා - භගවතා) යන පදය එකසිය හතර වතාවක් ජප කරති. ඒ හැර අන් කිසිවක් කියන්නේ නැත.

රජුගේ අතක මිණිමුතු සහිත රන් වළලු තුන් බැගින් ඇත. දෑතම එලෙසින්ම ආභරණවලින් සැරසී තිබේ. දෑතේ ඇඟිලිවලත් දෙපයේ ඇඟිලිවලත් මිණිමුතු සහිත අලංකාර මුදු පළඳගෙන සිටී. මෙතරම් මිණිමුතු සහිත ආභරණ රජු පැළඳ සිටින්නේ ඔහුගේ රාජ්‍යයෙහි අගනා වස්තු සුලභ නිසා විය හැකි ය.

මේ රජතුමාට බිසෝවරුන් දහසක් පමණ සිටින බව කියති. කිසියම් රූමත් ස්ත්‍රියක් ගැන දැනගන්නට ලැබුණහොත් ඇය රජ මැදුරට ගෙන්වා ගනී. තම සහෝදරයාගේ භාර්යාව වුවද මේ

Scanned by CamScanner

ආකාරයෙන් ගෙන්වා ගැනීමට රජු කටයුතු කරයි. මේ අයුරින් ක්‍රියා කිරීම නිසා දෙදෙනා අතර සටනක් ද ඇති වේ. මේ සටන සංසිඳුවීමට මව් බිසොව ඉදිරිපත් වේ. ඇය ඔවුනට තම දෙපියොවුරු පෙන්වා "මගේ දරුවන් වන නුඹලා ඇති දැඩි කෙළේ කිරිපොවා මගේ තුරුලේ රඳවමිනි. නුඹලා මෙසේ කෝලාහල කැර ගැනීම අවමානයකි. නුඹලා සහෝදර ප්‍රේමයෙන් කටයුතු කළ යුතු ය. එසේ නොකළහොත් නුඹලාට කිරිදුන් දෙතන කපා දමමි" යනුවෙන් තර්ජනය කරන්නී ය. එවිට ඒ බසට අවනත වී බොහෝ දුරට සමගි වෙති.

රජුගේ සේවය සඳහා අතිශයින් විශ්වාසවන්ත අධිපතියන් කිහිප දෙනෙකුන් පත්කැර ගෙන සිටී. ඔවුන් මෙලොවදීත් පරලොවදීත් රජුට සේවය කිරීමට ඇප කැප වී සිටින බව හඟවා කටයුතු කරන බව පෙනේ. දුක්ගන්නාරාළ යන අදහසට සමාන තනතුරු නාමයක් ඔවුනට ඇත. රජතුමා ගමන් කරන සියලු තන්හි ඔව්හු අරකෂාව සඳහා යති. රජුගේ දෙපසින් සිටිති. රාජ්‍යයේ කටයුතු සඳහා ද මැදිහත් වන්නෝ ය.

රජු මළ කල්හි මේ සේවකයෝ ද රාජකීය චිතකයට පැන දිවි පුදති. රජු ආදාහනය කරන්නේ චිතකයක් බැඳ මළසිරුර එහි බහා ගිනි දැල්වීමෙනි. රජුට හිතවත් සේවකයෝ ද නිලධාරීහු ද චිතකයට පැන දැවී අළු වෙති. මතු ආත්මයේ ද රජු සමග ජනිත වීමේ ප්‍රාර්ථනාවෙනි. එහි පවතින තවත් චාරිත්‍රයක් නම් රජතුමා මියගිය පසු සිහසුනට පත්වන පුත් කුමරු රජුගේ ධනය පරිහරණය කරන්නේ නැත. පියාගේ ධනය වියදම් කිරීමට පෙළඹුන හොත් අලුත් රජු පාලනයෙහි දක්ෂයකු නොවෙතැයි හැඟීමක් පොදු ජනතාව අතර ඇතිවෙතැයි යන අදහස නිසා ය. සමස්ත රාජ්‍යය පාලනය නොකොට කොටසක් අත්හළ හොත් පියරජුට මෙන් භාණ්ඩාගාරය පොහොසත් කළ නොහැකි දුර්වලයෙකැයි යන හැඟීම ද ජනතාව කෙරෙහි පැතිර යා හැකි ය. එහෙයින් ඒ ඒ රජු වෙත වෙනම භාණ්ඩාගාරයට ධනය රැස් කැර තැබීමට උත්සාහවත් වෙයි.

මේ රටෙහි අශ්වයන් බෝ කරන්නේ නැත. එහෙයින් හෝර්මුස්, කායිස්, ඩොපුර්, ෂීර් සහ ඒඩ්න් යන රටවල සිට වෙළෙඳුන් රැගෙන එන අශ්වයන් මිලදී ගනු ලැබේ. රජුත් සහෝදර කුමාරවරුන්.

තිදෙනාත් විශාල මුදලක් ගෙවා වාර්ෂිකව අශ්වයන් මිලදී ගනිති. අශ්ව වෙළෙන්දෝ වරකට අශ්වයන් පන්දහසක් පමණ වෙළෙඳාමට ගෙන එති. ඉතාලි මුදලින් සග්ගි පන්සියයක් පමණ එක් සතකු වටී. එය රිදී මාර්ක් සියයකට සමාන ය. මේ රටේ අශ්වයන් නිසි පරිදි රැක බලා ගැනීමට දන්නා එඬේරුන් ද අශ්වයන්ට ප්‍රතිකාර කිරීමට දන්නා අයත් හිඟ ය. එහෙයින් වාර්ෂිකව මිලදී ගන්නා අශ්වයන්ගෙන් තුන්සියයකට වඩා නොමැරී ඉතිරි වන්නේ නැත. එහෙත් මා කල්පනා කරන්නේ මේ රටේ දේශගුණය අශ්වයන්ට අයෝග්‍ය බව ය. අසුන් බෝ කිරීමට ද උන් රැකබලා ගැනීමට ද අවශ්‍ය පහසුකම් මෙහි නොමැත. අශ්වයන්ට ආහාර වශයෙන් බත් සහ මස් තම්බා දෙති. වෙනත් ආකාරයකට පිළියෙළ කළ මස් ද අශ්වයන්ගේ ආහාරය සඳහා දෙති. ධාන්‍ය වර්ග මෙරට නැත. මනා සේ වැඩුණු අශ්වයෙකුත් වෙළඹකුත් එක්වීමෙන් බිහිවන පැටවා ශරීර ප්‍රමාණයෙන් කුඩා ය. අවයව පිරිපුන් නොවේ. ඔවුන් පිට නැගී යාමට තරම් ශක්ති සම්පන්න නොවේ. මෙහි අපරාධකරුවන්ට දඬුවම් කිරීමේ පුදුම ක්‍රමවේදයක් පවතී. කිසියම් වරදක් කළ තැනැත්තකු අධිකරණය මගින් මරණ දඬුවමට යටත් කළ විට ඔහු දෙවියන් උදෙසා දිවි පිදීමට කැමැති බව ප්‍රකාශ කළහොත් ඔහුට ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කැර දෙති. ඔහුගේ නෑදෑයෝ ද හිතමිතුරෝ ද එක්වී ඔහු අමුතු ආකාරයේ අසුනක හිඳුවති. අනතුරුව තියුණු මුවාත සහිත උල් පිහියා දොළහක් ඔහුට දෙති. ඉන්පසු නෑදෑයෝ ද හිතමිතුරෝ ද ඔහු රැගෙන නගරය පුරා සැරිසරති. මේ පුද්ගලයා සිය කැමැත්තෙන් දෙවියන්ට දිවි පුදන්නේ යයි උස් හඬින් කෑ ගසමින් යති. වධක භූමිය කරා ගමන් ගත කල්හි දඬුවමට නියම වූ පුද්ගලයා පිහියා දෙකක් ගෙන තම දෑතට ඇනගනී. කලවටත් බඩටත් අවසානයේ පපුවටත් ඇනගෙන ඔහු මිය යන්නේ දෙවියන්ට ජීවිතය පූජා කළ බව කියමිනි. මරණයෙන් පසු නෑසියන් එක්වී ඔහුගේ මළසිරුර පුළුස්සා දමන්නේ මහත් ප්‍රීතියෙනි. භාර්‍යාව ද ඔහුගේ චිතකයට පැන දිවි පුදන්නේ ගෞරවාන්විත ලෙසිනි. එසේ දිවි පුදන කාන්තාවන්ට සමාජය ගෞරව දක්වයි. එසේ දිවි නොපුදන ස්ත්‍රීන්ට අවමාන කරති.

හින්දු දේව රූප වන්දනාවෙහි යෙදෙන මෙරට ජනයා ගවයාට මහත් ගරු සැලකිලි දක්වති. හරක් මස් කන්නේ නැත. එහෙත්

Scanned by CamScanner

"ගාවි" නමැති කුලයට අයත් වූවෝ ගව මස් කෑවත් හරකුන් මැරීමට බියවෙති. එහෙත් ගව මළකුණක් හමුවූ කල එහි මස් අනුභව කරත්. ඌ මළ ආකාරය නොවිමසති. මෙහි ජනයා තම නිවාසයන්හි ගොම පිරිබඩ ගාති. ඔවුන් මහත් සතුටින් බිම පැදුරු එලා හිඳ ගන්නේ එය ගෞරවයක් ලෙස සලකමිනි. මහ පොළොවෙන් ඉපිද යළි පොළොවටම පස් වන බැවින් පොළොවට ගෞරව පුද පූජාකිරීමට තරම් ශක්තියක් අපට නැත. එහෙයින් පොළොවේ හිඳ ගැනීම භූමියට දක්වන ගෞරවයක් බව ඔව්හු කියති. ගාවි කුලයේ සියලු දෙනා පැවැත එනුයේ සාන්ත තෝමස් අපෝස්තුළු වරයා මරා දැමූ පරපුරෙනි. එහෙයින් ඔවුන්ගේ කුලයේ කිසිවකුටත් සාන්ත තෝමස් අපොස්තුළු වරයාගේ දේහය තැන්පත් කැර තිබෙන ගොඩනැගිල්ලට යා නොහේ. ඔවුන් බලහත්කාරයන් හෝ ඇදගෙනවත් යා නොහැකි ය. එයට හේතුව එකී ශුද්ධ දේහයේ පවත්නා අදෘශ්‍යමාන බල මහිමය නිසා ඒ තැනැත්තා බැහැරට ඇද දැමීම ය.

වී සහ තල හැරුණු විට වෙනත් ධාන්‍ය වර්ග මේ රටේ නොමැත. හෙල්ල සහ පලිහ දරා මේ රටේ මිනිසුන් සටනට යන්නේ නිරුවතිනි. රණශූරත්වයක් ඔවුන් සතු නොවේ. ගවයන් හෝ වෙනත් සතුන් ඝාතනය කරන්නේ නැත. සතකුගේ හෝ පක්ෂියකු ගේ මස්කෑම අවශ්‍ය වුවහොත් මුස්ලිම් ජාතිකයන් ලවා එය කරවා ගනිති. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම දවසකට දෙවරක් ශරීරය සෝදා පිරිසිදු කැර ගනිති. දෙවරක් ස්නානයෙන් පිරිසිදු නොවන අය පාෂාණ්ඩ තවුසන් සේ සැලකේ. මෙහි මනුෂ්‍යයන් සියලු කටයුතු කරන්නේ දකුණු අතිනි. වම් අත පාවිච්චි කරනුයේ කසල සේදීමට පමණි. කිසිදු ආහාර පාන වර්ගයකට දකුණු අත හැර වම් අත නොතබති. ඔවුන් දියර වර්ග පානය කරනුයේ කෙණ්ඩියක් වැනි භාජනයකිනි. එක් එක් පුද්ගලයා සඳහා වෙන වෙනම භාජන තබා ගැනේ. අනෙකකුගේ භාජනයක් වෙනත් කෙනකු බීමට ගන්නේ නැත. එයට ද කට තබා බොන්නේ නැත. උඩ බලා කටට වත්කැර ගනිති. වැරදීමකින් හෝ භාජනයට කට නොතබති. ආගන්තුකයකුට භාජනයක් අතට දෙන්නේ නැත. ඔහු සතුව බීමට භාජනයක් නැත්නම් දෝතින් බීමට සිදුවේ. සුරා ආදිය වුව ද මෙලෙසින් දෝතින් බීමට සිදුවේ.

Scanned by CamScanner

අපරාධ සහ වැරදිවලට තදබල දඬුවම් පමුණුවනු ලැබේ. කිසියම් පුද්ගලයකු ණයක් ලබා ගෙන නොගෙවා සිටිය හොත් බොරු පොරොන්දු දෙමින් කල්පසු කළ හොත් ඔහු සිටින ස්ථානය වටා ඉරක් ඇඳ එයින් බැහැර යෑම තහනම් කැරේ. ඉන්පසු ණය ඉල්ලා සිටී. එවිට ද ඔහු ණය නොගෙවා පැන යෑමට සැරසුණු හොත් මරණ දඬුවම නියම කැරේ. ඒ වූකලී ණය ගනුදෙනු පිළිබඳ නීතිය පැහැර හැරීමේ වරදට නියමිත දඬුවමයි.

මාර්කෝ පෝලෝ සිය දේශයට යද්දී මේ රටට ගොඩ බැස්සේ ය. ඒ අවස්ථාවෙහි දී වැදගත් නඩුවක සාක්කිකරුවකු වශයෙන් පෙනී සිටීමට ඔහුට සිදුවිය. එය ඇසින් දුටු සාක්කියකි. මේ රටේ රජු එක්තරා වෙළෙන්දෙකුට ණය වී සිටියේ ය. රජු මේ විදේශික වෙළෙන්දාට ණය නොගෙවා බොහෝ කල් බොරු පොරොන්දු දෙමින් සිටියේ ය. දිනක් රජතුමා අසු පිටින් යද්දී අර වෙළෙන්දා රජු හා අශ්වයා වට කැර ඉරක් ඇඳ ණය ඉල්ලා සිටියේ ය. එකෙණෙහි රජතුමා මුළු ණය මුදල ගෙවා දමන තුරු එතැනින් බැහැර ගියේ නැත. මේ සිද්ධිය දුටු මහජනයා රජතුමා ඉතාමත් යුක්ති ගරුක නීතිගරුක පුද්ගලයකු බව පිළිගත්හ.

මෙරට ජනයා මිදිවලින් පෙරා ගන්නා යුෂ පානය නොකරති. මත්පැන් නොබොති. මත්පැන් බොන තැනැත්තාගේ සාක්කියක් පවා උසාවිය භාර ගන්නේ නැත. එසේ ම මුහුදු යාත්‍රාවන්හි නැගී නිතර වෙළෙඳ කටයුතුවල යෙදෙන පුද්ගලයන් ද ධනලෝභී ලෙස සැලැකේ. ධනය ගැන මිස ජීවිතය ගැන පවා ඇල්මක් නැතියවුන් සේ සලකා ඔවුන්ගේ සාක්කි ද උසාවි භාර ගැනීමට කැමැති නැත. අවිවාහක ස්ත්‍රී පුරුෂයන්ගේ හැසිරීම් සාවද්‍ය සේ ඔව්හු නොසලකති. අපරාධ ගණයට ඇතුළත් නොවේ. මෙ රට ග්‍රීෂ්ම බැවින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම නිතර නිරුවතින් සිටිති. ජූනි - ජූලි - අගෝස්තු තුන් මාසයේ පමණක් වැසි ඇද හැළේ. ඒ වර්ෂාව නොලැබුණ හොත් මෙහි ජීවත්වීම පවා දුෂ්කර ය. දේහ ලක්ෂණ විද්‍යාව කෙරෙරහි මෙරට ප්‍රබල විශ්වාසයක් පවතී. ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ දේහලක්ෂණ විමසා බලා ඔහුගේ ගතිගුණ යහපත් අයහපත් බව ඇතුළු සියලු විස්තර තොරතුරු පැවසිය හැකි ය. එසේ ම සමහර පක්ෂීන් හා සිවුපාවන් ඉදිරියට හමුවීමෙන් සිදුවන සුබ අසුබ පලාපල ද කීමෙ ශාස්ත්‍රයක් මෙරට පවතී. පක්ෂීන්ගේ

Scanned by CamScanner

ගමන් බිමන් අනුව ද ඔවුහු පලාපල නිමිති කියති. මේ පිළිබඳව ලෝකයේ අන් සියලු රටවලට වඩා මෙරට වැසියෝ සුපරීක්ෂාකාරී වෙති.

සතියේ සෑම දිනයකම අශුභ ඵල උදාකරන පැයක් ඇතැයි ඔව්හු විශ්වාස කරති. මේ පැය "චොකෙයියක්"නම් වේ. එය අසුභ ය. සඳුදා ඉර උදාවෙන් පසු ලබන පැය "මීටියර්ස්"නමින් ද අඟහරුවාදා ඉර උදාවෙන් ලබන පැය "ටියර්ස්" කියා ද බදාදා ඉර උදාවෙන් ලබන පැය "නෙනේ" කියා ද හඳුන්වති. මෙය අශුභ හෝරාවකි. එබැවින් ඒ පැය තුළ ඔව්හු ශුභ කටයුතුවල නොයෙදෙති. ඒ පැය තුළ ආරම්භ කරන වෙළඳම් කටයුතුවලින් සාර්ථක ප්‍රතිඵල නොලැබෙන බව ද කියති.

මේ පිළිබඳ ශුභාශුභ ලියා ඇති පංචාංග ලිත නමැති පොතක් ඔවුහු භාවිතා කරති. දවසේ පැය ගණන් ගන්නේ මිනිස් සෙවණැල්ල මැන බැලීමෙනි. පියවර මැන වේලාව බලා කේන්ද්‍ර සාදති. බිළිඳකු උපන් කල්හි දරුවා උපන් වේලාව, දිනය, තිථිය, මාසය, හෝරාව, පැය, විනාඩි ගණන් ගෙන කේන්ද්‍ර සටහන පිළියෙල කැර පලාපල කියති. ඔහුගේ අනාගතය පිළිබඳ සියලු තොරතුරු ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෝ ප්‍රකාශ කරති. පිරිමි දරුවන් වයස දහතුන ඉක්මවූ පසු පවුලෙන් නිදහස් කැර හරිනු ලැබේ. පියාගෙන් රැකවරණ නොලබා රැකියාවක යෙදී ජීවත්වීම සඳහා රිදී කාසි විස්සක් හෝ විසිහතරක් දෙති. ඉන්පසු ඔහු ඒ මුදලින් කිසියම් සුලු වෙළෙඳාමක් හේ කිරීමෙන් ජීවිතය ගෙන යෑමට උත්සාහ කරයි. මුතු වාරයට මුතු වෙළෙන්දන්ගෙන් මුතු ඇට කිහිපයක් ගෙන එය කාට හෝ ලාබ තබාගෙන විකිණීමට මේ තරුණයෝ උත්සාහ කරති. තද සූර්ය රශ්මිය නිසා නිවාස තුළට වී සිටින වෙළෙඳුනට මේ මුතු ඇට විකිණීමට උත්සාහ කරති. එලෙසින්ම වෙනත් බඩු මුට්ටු ද මේ තරුණයෝ තැනින් තැනට ගෙන ගොස් අලෙවි කරන්නේ ලාබයක් ලබා ජීවිතය ගැටගසා ගැනීමේ අදහසිනි. කල් යෑමේ දී මොවුහු දක්ෂ ව්‍යාපාරිකයෝ වෙති.

මෙහි පමණක් නොව සමස්ත ඉන්දියාවේම දක්නට ලැබෙන පක්ෂීන්ගේ හා සිවුපාවන්ගේ ස්වභාවය අමුතු ය. එහෙත් වටුවන් අපේ රටේ වටුවන්ට සමාන ය. අනෙක් පක්ෂීන් බොහෝ දුරට වෙනස් ය. වවුලන් ගිජුලිහිණින් තරම් විශාල ය. ගිජුලිහිණින් කපුටන්

Scanned by CamScanner

මෙන් තද කළු පාට ය. බොහෝ විශාල ය. උන්ගේ පියැඹීම වේගවත් ය. දක්ෂ ලෙස දඩයම් කරති.

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම අයත් ඉතා අලංකාර ප්‍රතිමා මොවුන්ගේ දේවාලයන්හි දක්නට ලැබේ. හින්දු දෙමාපියෝ තම තරුණ දූවරුන් දේවාලයනට කැප කරති. පූජකයන්ගේ අනුදැනුම අනුව ඔවුහු දේවදාසියන් ලෙස සේවය කරති. ඔව්හු දෙවියන්ගේ ප්‍රසාදය පිණිස නටති. ගී ගයති. භාණ්ඩ වාදනය කරති. පූජා උත්සවයන්හි දී ඔවුහු මෙකී මෙහෙවරෙහි යෙදෙන්නෝ ය. මේ දේවදාසීහු කණ්ඩායම් වශයෙන් සැදී තේවාවන්හි යෙදෙති. ඔවුහු ආහාර පාන පුද පූජා භාණ්ඩ මෙකී දේවරූප ඉදිරියෙහි තබා ස්තුති ගීතිකා පූජෝපහාර ගීතිකා ආදිය ගයති. සියලු දේව ප්‍රතිමා වලට වෙන් වෙන් වශයෙන් විවිධාකාර ආහාර පාන කැවිලි පෙවිලි පූජා කරති. දෙවියන් මේ ආහාර පාන කැප ගන්නා බව ඔවුන්ගේ විශ්වාසයයි. මේ සියලු ආහාරපාන පැයක් පමණ පූජාසනයන්හි තබති. ඒ කාලය තුළ දේවදාසීහු තූර්‍ය භාණ්ඩ වාදනය කරමින් ගී ගයමින් සරාගී විචිත්‍ර රැඟුම් දක්වන්නාහ. ධනවතුන්ගේ භෝජන කාලයෙන් පසු ද මෙවැනි රැඟුම් දක්වන්නාහ. මේ හේතුවෙන් දෙවියන් ප්‍රීති ප්‍රමෝදයට පත්වන බව ඔව්හු කියති. අනතුරුව දේවදාසීහු දෙවියන්ට පූජා කළ ආහාර පාන රස විඳිති. අනතුරුව ඔවුන් සියලු දෙනා නිවෙස් කරා යති. දෙවඟන කෙරෙහි ආසක්ත නොවී කෝපයෙන් සිටින දෙවියන් ප්‍රීති ප්‍රමෝදයට පත් කිරීම මේ රැඟුම් ගැයුම් වැයුම් පැවැත්වීමේ හේතුවයි. දෙවඟන හා දෙවියා ප්‍රීතිමත් නොවුවහොත් කෝවිලේ කටයුතු පරිහානියට පත්වන්නේ යයි ඔව්හු කියති. දෙවියන් ප්‍රීති ප්‍රමෝදයට පත්වීමෙන් ආශිර්වාද ලැබෙතැයි අදහති. බැතිමතුන් දේවාලයට පැමිණෙනුයේ ඉඟවටා රෙදිකඩක් පමණක් හැඳගෙන ය. මේ ආකාරයෙන් පැමිණ දෙවියන්ට ස්තුති බැති ගී ගැයුමෙන් ආශිර්වාද ලැබෙන බැවින් දෙවියන් හා දෙවඟන නිරතුරු සතුටු කිරීමට ඔව්හු ඇප කැප වෙති.

මෙරට වේවැල්වලින් සැහැල්ලු ඇඳන් විශේෂයක් සාදති. ඇඳ මත හාන්සි වී තූලක් ඇදීමෙන් වටතිර සකසන අයුරින් මේ ඇඳන් ක්‍රමානුකූලව නිර්මාණය කැර තිබේ. දිවි මකුළුවන්ගෙන් බේරීම සඳහා මෙබඳු වටතිරයක් අවශ්‍ය ය. දිවි මකුළුවන් විෂ සහිත සත්ත්ව විශේෂයකි. මැස්සන් ආදි සතුන්ගෙන් වන අතවරය ද මේ

වටතිරය නිසා වැළැකේ. අධික උෂ්ණය ද වටතිරය නිසා දුරුවේ. ධනවත් අයට හැරුණු විට අනෙක් සියලු දෙනා නිදාගන්නේ ආවරණ රහිත ස්ථානයන්හි ය.

මලබාරයේ මේ ප්‍රදේශයේ කීර්තිමත් ආගමික ජීවිතයක් ගත කළ සාන්ත තෝමස් අපෝස්තුළු වරයාගේ දේහය තැන්පත් කැර තිබේ. ජනාකීර්ණ නොවන කුඩා නගරයක එය තැන්පත් කැර ඇත්තේ ය. මෙහි වාණිජ ව්‍යාපාර බහුලව නැත. එහෙත් ක්‍රිස්තියානි සහ මුස්ලිම් භක්තිකයෝ එහි නිතර සැරිසරති. මුස්ලිම්වරු ද මෙතුමා උතුම් අනාගත වක්තෘවරයකු ලෙස සලකති. ශුද්ධවන්තයකු සේ සලකමින් අන්නියාස් නමින් ද හඳුන්වති. අවාරියම් යනුවෙන් ද හැඳින්වෙන අතර එහි අරුත සාන්තුවරයා යනුයි. මෙහි යන බැතිමත්හු එතුමා මරණයට පත් කළ ස්ථානයෙන් පස් මිටක් හෝ රැගෙන එති. ඒ පස රතුපාට ය. ඒ පස් රැගෙන ගොස් විවිධ භාස්කම් කිරීමට භාවිතා කරනු ලැබේ. එයින් පස් ස්වල්පයක් දියකර පෙවූ විට රෝගීන් සුවපත් වන බව කියති. ක්‍රි. ව. 1288 දී මෙරට බලවත් අධිපතියෙක් සිටියේ ය. ගොයම් කපා අස්වනු රැස්කරන එක්තරා වකවානුවක දී මේ කුමාරයා තමාගේ උරුමය සඳහා ධාන්‍ය සම්භාරයක් රැස්කැර ගති. මේ ධාන්‍ය සම්භාරය තැන්පත් කිරීමට සුදුසු ගබඩාවක් නොවූ බැවින් ඒ සඳහා සාන්ත තෝමස්තුමාගේ ආගමික නිවාසය යොදාගති. මෙයට විරුද්ධ වූ බැතිමත්තු රජු වෙත ගොස් ආගමික සිද්ධස්ථානය ධාන්‍ය ගබඩාවක් බවට පත් නොකරන ලෙස ඉල්ලා සිටියෝ ය. එහෙත් රජතුමා ඔවුන්ගේ බසට අවනත වූයේ නොවේ. රජුගේ දුෂ්ට ක්‍රියාව එලෙසින්ම සිදුවිය. පසුදින රාත්‍රියේ ශුද්ධ අපෝස්තුලු තුමා රජුට සිහිනයෙන් පෙනී සිට කුඩා ලන්සයක් පෙන්වා "මගේ නිවාසය මුරණ්ඩු ලෙස අත්පත් කැරගත් තා වහා ඉවත් නොවුවහොත් අවාසනාවන්ත ලෙස මරා දමමි" පවසා බියපත් කෙළේ ය. රජ වහා ඒ බව ජනතාවට ද දන්වා දේවස්ථානයෙන් ධාන්‍ය ඉවත් කැරගත්තේ ය. සාන්තුවරයාගේ බලය හේතුකොට ගෙන මේ ස්ථානයේ විවිධාකාර ප්‍රාතිහාර්‍ය නිරතුරු පවතී.

මේ දේවස්ථානයෙහි කටයුතු කරන කිතුනු බැතිමත්හු එයට අදාළ පොල්වතුවලින් ලැබෙන ආදායමෙන් ජීවිකාව කැර ගනිති. එක් පොල් ගසකින් පනමක පමණ බද්දක් රජයට ගෙවනු ලැබේ.

Scanned by CamScanner

මෙහි වුසූ අපෝස්තුලුවරයාගේ මරණය සිදුවූයේ යාඥාවක යෙදී සිටියදී ය. අපොස්තුලුවරයා යාඥාවෙහි යෙදී සිටියදී මොනරු රංචුවක් වටකැරගෙන සිටියහ. ඒ අසලින් ගමන් කළ ගාවි ගෝත්‍රයට අයත් මිනිසෙක් අපොස්තුලුවරයා එහි සිටින බව නොදැන ඊතලයක් මොනරකුට විද්දේ ය. ඒ හී පහර අපෝස්තුලුවරයාගේ ඇලයට වැදුණි. එකෙණෙහිම උන්වහන්සේ ජීවිතක්ෂයට පත්ව තම ආත්මය දෙවි පියාණන්ට භාර කළහ.

මෙහි ජනයාගේ ඡවි වර්ණය කළු වුව ද තලඑළලු ය. එහෙත් ඔවුහු ශරීරය තද කළු පැහැ ගන්වා ගැනීම සඳහා කෘත්‍රිම ආලේප භාවිතා කරති. කාළ වර්ණය සුන්දර යයි ඔවුන්ගේ පිළිගැනීම ය. දිනකට තුන් වරක් දරුවන්ගේ සිරුරේ තල තෙල් ගා පිරිමදිනු ලැබේ. ඔවුන්ගේ දේවරූප වැඩි කොටසක් තනා ඇත්තේ කාළ වර්ණයෙනි. එසේ වුව ද යක්ෂ රූප සුදු පැහැති ය. සියලු යක් රකුසන් සුදුපාට බව ඔවුන්ගේ විශ්වාසයයි. වෘෂභ වන්දනාවෙහි යෙදෙන්නෝ යුද්ධයට යන කල්හි වෘෂභයකු ද ගෙන යති. වල් ගොනෙකුගේ ලොම් ස්වල්පයක ද අශ්වයන්ගේ ගෙලෙහි බඳිති. ඒ ආරක්ෂාව හා ජයග්‍රහණය පතමිනි. ගවයන්ගේ ලොම් ආරක්ෂාව සලසන බැවින් මෙරට ගව ලොම් ඉහළ මිලකට විකිණේ.

මලබාරයෙන් තික්ම උතුරු දෙසට සැතපුම් පන්සියයක් දුර ගමන් කළ කල්හි මර්විලි (මොන්සුල්) හෙවත් මසුලි පට්ටනමට පිවිසීමට හැකි විය. එහි ජනයා ප්‍රතිමා වන්දනා කරන්නෝ ය. නිදහස් රාජ්‍යයකි. බත්, මස්, මාලු සහ පලතුරු මෙහි ජනයා ආහාරය පිණිස ගනිති. මෙරට කඳුකර පළාත්වලින් දියමන්ති ලැබේ. කඳුකරයෙන් පටන් ගන්නා දිය පහරවල් මහත් වේගයෙන් වස්සානයේ දී ගල් ගුහා ගිරිශිඛර අස්සෙන් ගලා බසී. මෙසේ වස්සානය කෙළවර ජලය බැස ගිය පසු මිනිස්සු ඇළ දොළ ඉවුරු අසල දියමන්ති සොයා ගනිති. බහුල වශයෙන් දියමන්ති මෙවැනි ප්‍රදේශවලින් ලැබේ. ඔවුන්ට දියමන්ති ලැබෙන ආකාරය මාර්කෝ පෝලෝට දැන ගන්නට ලැබුණේ මෙලෙසිනි.

ග්‍රීෂ්ම ඍතුවේ දී මේ පළාත උෂ්ණාධික ය. වැසි පොදක් වත් ඇද නොහැලේ. පායන කාලයේ දියමන්ති සොයන මිනිස්සු මහත් වැර වෑයමින් කඳු හෙල් නගිති. ඒ කඳුවල විවිධ වර්ගයේ සර්පයන් බහුල ය. මේ සර්පයන්ගෙන් අනතුරු ද සිදුවේ. වස්සානයේ වේගවත්

Scanned by CamScanner

ජලධාරා ගලා යෑමෙන් සෑදුනු ගැඹුරු අගාධ ඇත. මේ ස්ථානවලින් දියමන්ති අහුළා ගැනීමට පුළුවන. මෙහි සිටින විවිධ වර්ගයේ සර්පයන් ආහාර කොට ගැනීම සඳහා ගිජුලිහිණින් ද, රාජාලින් ද, විවිධ උකුසු වර්ග ද, විශාල සුදු රෑන කොකුන් ද නිතර මෙහි ගැවසේ. දියමන්ති සොයන මිනිස්සු වේගවත් ජලධාරා ගලා බැස ගිය ගැඹුරු බිම් ගෙවල්වලට ද වක්කලම්වලට ද ප්‍රපාතවලට ද මස් කැබැලි විසි කරති. ගිජුලිහිණි උකුස්සන් ආදි පක්ෂීහු ඒ මස් කැබැලි අහුලා ගනිති. ඒ මස් වැදලිවල දියමන්ති කැට ඇලී තිබෙන බැවින් මිනිස්සු උන් හඹා ගොස් මස් කැබැලි උදුරාගෙන දියමන්ති වෙන් කැර ගනිති. යම් හෙයකින් එසේ දියමන්ති ගලවා ගැනීමට පෙර ගිජුලිහිණින් මස් කැබැලි ගිල දැමුවහොත් රාත්‍රී කාලයේ උන් ලැග සිටින ගස් යටට ගොස් උන්ගේ වසුරු මිරිකා දියමන්ති සොයා ගනිති. මේ දියමන්තිවලින් වටිනා කොටස ක්‍රිස්තු ලබ්ධිකයන්ට නොලැබේ. වටිනා දියමන්ති සියල්ල ලැබෙන්නේ චීන අධිරාජයාට සහ වෙනත් රජුන්ට ය. මෙහි ගවසම්පත බහුල ය. ඉතා විශාල බැටලුවෝ ද මෙහි බෝ වෙති. ආහාර පාන සියල්ල මෙහි සුලභ ය.

සාන්ත තෝමස් අපොස්තුලුවරයාණන් ගේ දේහය තැන්පත් කැර තිබෙන ප්‍රදේශයෙන පිටත්ව බටහිර දිසාවට ගමන් කළ විට ලාර් නමැති ප්‍රදේශය (ගුජරාට්?) යි. බ්‍රාහ්මණ වංශිකයන්ගේ ජාත භූමිය ලෙස මේ ප්‍රදේශය හැඳින්වෙයි. ඉතා යහපත් සත්ගුණවත් වෙළෙඳුන් දක්නට ලබෙනුයේ මේ ප්‍රදේශයෙහිදී ය. කවර හේතුවක් නිසා හෝ ඔව්හු බොරු නොකියති. කොල්ලකෑම් වංචාකිරීම් ආදියෙහි නොයෙදෙති. පර ස්ත්‍රී සේවනෙයහි නොයෙදෙති. එක අඹුවක් පමණක් තබා ගනිති. ඔවුන් සතු යහ ගුණ ධර්ම බොහෝ ය.

මෙරට වාණිජ සංස්කෘතිය පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති විදේශික වෙළෙන්දකු පැමිණ මෙහි බමුණකු වෙත ගොස් ඔහුගේ වෙළෙඳ භාණ්ඩ විකිණීමට අවශ්‍ය බව කිවහොත් ඒ වගකීම භාර ගනී. අනතුරුව විකිණීමෙන් පසු ඉතා පැහැදිලිව ඒ පිළිබඳ ගණන් පිළිබඳ නිවැරදි සත්‍ය ලේඛනයක් සමග ලබාගත් ආදායම විදේශික වෙළෙන්දාට භාර දෙයි. ඒ සඳහා තමන්ට මුදලක් ඉල්ලා සිටින්නේ නැත. විදේශික වෙළෙන්දාගේ අභිමතය පරිදි දෙන මුදලක් සතුටින්

Scanned by CamScanner

භාරගනී. මස් වර්ග අනුභව කරන මොව්හු මත්පැන් ද බොති. එහෙත් සතුන් ඝාතනය කරන්නේ නැත. මුස්ලිම්වරුන් ලවා සතුන් මරවා ගනිති. ඔව්හු එක් උරයක් හරහා ළය මත විහිදෙන ලෙස පූන නූලක් පැළඳ සිටිති.

මේ රටේ රජු ඉතා බලවත් ය. ධනවත් ය. මුතු හා මැණික් කෙරෙහි මහත් ඇල්මක් දක්වයි. මලබාර වෙළෙඳුන් මුතු මැණික් ආදි වටින භාණ්ඩ රජු වෙත ගෙන ගොස් පෙන්වූ කල්හි එහි වටිනාකම මෙන් දෙගුණයක් දී මිලදී ගනී. එක් ආභරණයක් සෑදීමට ගිය මුදල මෙන් දෙගුණයක් දෙයි. ගනුදෙනුවලින් ඔවුන් රජුට පිරිනමනුයේ අගනා ස්වර්ණාභරණ ය. මෙහි ජනයා ප්‍රතිමා වන්දනා කරති. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ගැන ද නිමිති ශාස්ත්‍රය ශකුණ ශාස්තරය හා ජ්‍යොතිෂය පිළිබඳවද මහත් ගෞරවයක් හා විශ්වාසයක් පවතී. හිරු එළියේ සෙවණැල්ලෙන් පියවර මැන බලා සුබ අසුබ හෝරා නිශ්චය කැර ගනිති. භාණ්ඩ මිලදී ගන්නේ වෙළඳාම් කරන්නේ ශුභ අශුභ හෝරා නිශ්චය කිරීමෙන් අනතුරුව ය.

වෙළෙඳ ශාලාවකට භාණ්ඩයක් මිලදී ගැනීමට ගිය විට දිවි මකුළුවකු දක්නට ලැබුණහොත් ඒ මකුළුවා පැමිණි දිසාව අනුව සුබ අසුබ නිශ්චය කැරේ. භාණ්ඩ මිලදී ගන්නේ ඒ තීරණය අනුව ය. ගමනාරම්භයක දී යම් කිසිවකුගේ කිවිසුම් හඬක් ඇසුණ හොත් ගමන නොගොස් ආපසු නිවසට පැමිණ හිඳගනී. පමණ දැන ආහාර ගැනීම ඔවුන්ගේ පුරුද්දකි. මඳ අහරින් යැපෙන දීර්ඝායුෂ වළඳන ජන කොටසක් මෙහි වෙසෙති. කිසියම් ශාක විශේෂයක් සැපීම නිසා ඔවුන්ගේ දන්ත සෞඛ්‍යය සුරැකී පවතී. මේ හේතුවෙන් ආහාර ජීර්ණය ද ශරීර සෞඛ්‍යය ද නිසි ලෙස සුරැකේ.

මෙහි වෙසෙන එක්තරා ජන කොට්ඨාසයක් උග්‍ර තපස් රකිති. ඔවුන් යෝගීන් වශයෙන් හැඳින්වෙයි. සිරුරට දැඩි පීඩන දෙමින් අත්ථකිලමථානු යෝගීව කල්ගත කරති. ඇඳුම් පැළඳුම්වලින් ශරීරයේ කිසිදු කොටයසක් වසා නොගනිති. නිරුවතින් උපන් බැවින් නිරුවතින් ජීවත්වීමේ වරද කුමක්දැයි අසති. ඔවුන්ට වසාගත යුතු අඟ පසඟ කිසිවක් නොමැති බව හඟවති. නිරුවතින් සිටීම ගැන ඔවුන් ලජ්ජා වන්නේ හෝ බියවන්නේ නැත.

වෘෂභයාට මහත් ගෞරව දක්වන අතර ලෝහයෙන් තැනූ කුඩා වෘෂභ රූපයක් නළලේ පැළඳ සිටිති. ගොනුන්ගේ ඇට කටු දවා

Scanned by CamScanner

ලබා ගන්නා අලු සිරුරේ තවරා ගැනීම ආගමික චාරිත්‍රයකි. හිතවතකු මිත්‍රයකු බැතිමතකු හමු වූ විට ද ඔවුන් අළු තිලකයක් තබන්නේ ආශිර්වාදයක් ලෙසිනි. ඉතා කුඩා ප්‍රාණියකු හෝ නොමරන මේ යෝගීහු පැලැටි එළවුළු ශාක ආදි කිසිවක් අනුභව නොකරති. ශාකවලට ද ප්‍රාණය ඇතැයි විශ්වාසයක් පවත්නා බැවිනි. පිඟන් ආදි භාජනවල ආහාර ගන්නේ නැත. ආදම්ගේ ඇපල් ගසේ කොළ හෙවත් දෙව් ලොව ඇපල් ගස වශයෙන් හඳුන්වනු ලබන කෙසෙල් ගසේ වියළී ගිය කොළයක් මත තබාගෙන ආහාර ගනිති. ශරීර කෘත්‍යය කරන්නේ මුහුදු වැල්ලේ ය. නැතහොත් ගංගාවන්හි වැලි තලාවන්හි ය. අසූචිවල පණුවන් සෑදීම වැළැක්වීම සඳහා ඔවුහු ඒවා ඒ මේ අතට විසුරුවා දමති. පණුවන් සෑදී වියළී මැරී යෑම පාපයක් සේ සලකන බැවිනි.

මුහුදු වෙරළෙන් ඈත ප්‍රදේශවල වාසය කරන යෝගීන් ශරීර කෘත්‍යය සඳහා ගංගා ඇළ දොළ වැලිතලාවන් වෙත පැමිණ සිටින ආකාරය දැකිය හැකි ය.

එසේ වුවද මොවුහු වර්ෂ එකසිය පනහක් දෙසියයක් පමණ දීර්ඝායුෂ වළඳ මනා ශරීර සෞඛ්‍යයෙන් ද කාය ශක්තියෙන් ද යුතුව ජීවත් වෙති. ඔවුන් නිදන්නේ ආවරණ රහිත ඇතිරිලි රහිත පොළොවෙහි ය. මත්පැන් නොබීම හා සදාචාර යහ පැවතුම් නිසා දීර්ඝායුෂ වළඳන බව කිව යුතු ය. මළ සිරුරු පුළුස්සන්නේ පණුවන් බෝවීම වැළැක්වීම සඳහා ය.

සෙයිලන් නමින් හැඳින්වෙන (ලංකාව) සිංහල දිවයින පිළිබඳව මෙයට ඉහත දී ද මේ කෘතියෙහි සඳහන් විය. එහෙත් ඇතැම් කරුණු එහි දී සඳහන් කරන්නට අමතක වූ බැවින් මා ආපසු යුරෝපය බලා යන ගමනේ දී නැවත එරටට ගොඩ බට අවස්ථාවේ අසා දැන ගන්නට ලැබුණු කරුණු කිහිපයක් මෙහිලා සඳහන් කිරීමට අවස්ථාවෝචිත යයි හඟිමි. මේ රටේ හාත් පස උස් ගිරි ශිඛරවලින් ගැවසීගත් ඉතා උස් පර්වතයක් තිබේ. ගැඹුරු ප්‍රපාත ද හාත් පස ඇති බැවින් මේ පර්වත මස්තකයට නැගීම දුෂ්කර ක්‍රියාවකි. බැතිමතුනට කඳු මුදුනට නැගීමේ ආධාරක වශයෙන් යකඩ දම්වැල් සවිකැර තිබේ. ඒ දම්වැලෙහි එල්ලී වන්දනාකාරයෝ කඳු මුදුනට නැගෙති. අපගේ ආදි පීතෘවරයා වන ආදම්ගේ සොහොන මේ කඳු මුදුනේ ඇතැයි මුස්ලිම් භක්තිකයෝ කියති.

Scanned by CamScanner

එසේ වුවද මෙරට බෞද්ධයන් කියන්නේ ඔවුන්ගේ ආගමික නායකයාණන් වන සොගොර්මන් හාර්වන් (ශාක්‍යමුනි භගවාන්) ගේ දේහය එහි ඇති බවකි. එතුමාට මෙරට වැසියෝ ශුද්ධවන්තයකුට මෙන් මහත් ගෞරවයෙන් පුද පූජා පවත්වති. එතුමා මෙරට වුසූ රජකුගේ පුත්‍රයෙකි. මේ කුමාරයා රාජ්‍යය ද ලෞකික සැප සම්පත් ද ප්‍රතික්ෂේප කොට තවුස් ජීවිතයක් ගත කෙළේ ය. එහෙත් පිය රජතුමා ස්ත්‍රීන්ගේ මාර්ගයෙන් ද ලෞකික සැප සම්පත්වලින් කුමරා පොළඹවා ගැනීමට උත්සාහ කළ ද එයින් ප්‍රතිඵල නොලැබිණ. අනතුරුව කුමරා තනිවම මේ කඳු මුදුනට නැග සියලු පාපයෙන් තොරව තවුස් දිවියක් රකිමින් බ්‍රහ්මචාරීව ජීවිතය ගත කොට එහිම ජීවිතක්ෂයට පත්විණ. බෞද්ධයෝ මේ තවුසාට ශුද්ධවන්තයකු සේ සලකා වැඳුම් පිදුම් කරත්. කුමාරයාගේ වියෝගය නිසා පිය රජු මහත් සිත් වේදනාවට පත්ව කුමරාගේ ප්‍රතිමාව රනින් හා රිදියෙන් තනා දෙවියකු සේ සලකා වැඳුම් පිදුම් කරන සේ වැසියනට නියෝග කෙළේ ය. ප්‍රතිමා වන්දනාව මෙරට ආරම්භ වූයේ එලෙසිනි. එබැවින් සොහොමන් බර්වාන් (ශාක්‍යමුනි භගවාන්) ඉතා ශ්‍රේෂ්ඨ උත්තමයකු සේ මෙරට ජනයා මේ වනතුරු අදහති. වඳිති. පුදති. යථෝක්ත විශ්වාසය හේතු කොට ගෙන බොහෝ දුර බැහැර ප්‍රදේශයන්හි සිට බැතිමත්හු වන්දනා සඳහා මේ ගිරිකඳු තරණය කරති. ඒ උත්තම පුරුෂයාගේ හිසකේ ස්වල්පයක් ද, දත් කිහිපයක් ද, ආහාර ගත් භාජනය ද තවමත් සුරක්ෂිතව පවතී. උත්සවශ්‍රීයෙන් මේ පූජනීය වස්තු ප්‍රදර්ශනය කිරීම ද මෙරට චාරිත්‍රයකි.

මුස්ලිම්වරුන් මේ පූජනීය වස්තු අනාගත වක්තෘ ආදම්ගේ යයි විශ්වාස කරන හෙයින් ඒ කඳු මුදුනට වන්දනාවට යන බව කිව යුතු ය. ක්‍රි. ව. 1284 දී චීන අධිරාජයා වෙත ගිය මුස්ලිම් පිරිසක් මෙකී පූජනීය වස්තු පිළිබඳව කුබ්ලායි ඛාන් හට කීහ. මේ වස්තු ලබා දෙන ලෙස ඔව්හු කුබ්ලායි ඛාන් අධිරාජයාගෙන් ඉල්ලීමක් කොට තානාපති පිරිසක් ලංකාවට එවීමට ද සැලසුම් කැරගත්හ. ඉන්පසු ඉතා දුෂ්කර දුරුකතර ගෙවා ලංකාවට පැමිණි දූත පිරිස සිංහලේ රජුගෙන් විශාල හකු දත් දෙකක් ද, කේශධාතු ස්වල්පයක් ද, අලංකාර කිරිගරුඬ භාජනයක් ද ලබාගත්හ. ඒ හැරුණු විට තවත් වටිනා කෞතුක භාණ්ඩ රැසක් ද ලංකාවේ රජුගෙන් ඔවුනට

ලබාගත හැකිවිණි. දූත පිරිස මෙකී පූජනීය වස්තු රැගෙන ඛාන් - බාලික් නගරයට පැමිණෙන බව දැනගත් චීන අධිරාජයා මහ පෙරහරින් ගොස් මහත් උත්කර්ෂවත් උත්සව පවත්වා ඔවුන් පිළිගන්නා ලෙසට නියෝග කෙළේ ය.

ලංකාවෙන් නික්ම මලබාර් රාජ්‍යයට පැමිණ ඉන්පසු කයාල් (කේල) නගරයට පිවිසීමට හැකි විය. මේ රට පාලනය කරන්නේ මලබාරයේ සහෝදරයන් සතර දෙනාගෙන් එකකු වන අස්තියර් රජු විසිනි. මේ රජු ධනවත් ය. රන් රිදී, මුතු, මැණික් ආදි බොහෝ සම්පත් ඇත. සාමකාමී රටක් බැවින් විදේශික වෙළඳුනට සාමකාමීව වාණිජ කටයුතු කැරගෙන යා හැකි ය. මෙරට රජු විදේශික වෙළෙඳුන්ට ඉතා හොඳින් ආගන්තුක සත්කාර සංග්‍රහ කරයි. ගෞරවයෙන් පිළිගනී. එබැවින් බටහිර දෙස ධරමුස් හා ඒඩින් හි සිට පැමිණෙන නැව් ද ආරාබියේ සිට පැමිණෙන යාත්‍රා ද මෙහි වරායට පැමිණේ. වරාය ද වාණිජ නෞකා සඳහා ඉතා කදිම ය. පන්සියයකට අධි රූබර ස්ත්‍රීන් සංඛ්‍යාවක් රජුගේ අන්තඃපුරයේ සිටිති. මෙරට සියලු ජනයා තෙම්බුල් (තාම්බුල) (බුලත්) නමැති කොළ වර්ගයක් සපති. මේ කොළ වර්ගය නිතරම කටේ රුවාගෙන වරින් වර කෙළ ගසති. බුලත් කෑම නිසා ශාරීරික උත්තේජනයක් ලැබෙන බැවින් ජනයා මේ පුරුද්දට ඇබ්බැහි වී සිටිති. සෞඛ්‍යයට හිතකර බව ද කියති. කිසියම් මිනිසකුට ප්‍රසිද්ධියේ නින්දා අපහාස කිරීමට අවශ්‍ය වුවහොත් මුහුණට බුලත් කෙළ ගසති. නින්දාවට ලක්වූ තැනැත්තා රජු වෙත ගොස් තමන්ට කළ අපහාසය ගැන කියා සතුරා සමග සටන් කිරීමට අවසර ඉල්ලා සිටී. එවිට රජු ඔවුන් දෙදෙනාටම කුඩා පලිහක් ද කුඩා කඩුවක් ද බැගින් දෙයි. අනතුරුව දෙදෙනා සටන් වදිති. මේ ද්වන්ධ සටන බැලීමට මහා ජනයා ද රැස්වෙති. සටන කෙළවර වනුයේ දෙදෙනාගෙන් එකකු මැරී වැටුණාට පසුව ය. කඩුවේ තුඩින් ඇන මැරීම මේ සටනේ දී තහනම් වේ.

මෙහි සිට සැතපුම් පන්සියක් නිරිත දෙසට ගමන් කළ විට කොවුලම් (කේරල) රාජ්‍යය හමුවෙයි. මෙහි ක්‍රිස්තු ලබ්ධිකයෝ ද මුස්ලිම්වරු ද බහුලව ජීවත් වෙති. ඔවුන් කතා කරනුයේ තමනට ආවේණික භාෂාවකි. මේ රටේ රජතුමා ස්වාධීන පාලකයෙකි. අගනා පතාගි ශාක මෙරට බහුලව වැවේ. ගම්මිරිස් වගාව ද සරුසාර ය.

Scanned by CamScanner

වනාන්තරවල ද එළිමහනේ ද ගම්මිරිස් වැවේ. මැයි ජූනි ජූලි මාසවල දී ගම්මිරිස් අස්වැන්න එකතු කැරේ. එක්තරා පැලැටි වර්ගයකින් තද නිල් පැහැගත් සායම් වර්ගයක් මෙහි නිෂ්පාදනය කැරේ. මේ පැල වර්ගය විශාල ජල බඳුනක බහා පල් වූවාට පසුව නිල් පැහැති යුෂය ලබා ගැනේ. මේ යුෂ අව්වේ තබා වියළති. හොඳින් වියලුණු පසු කැබැලිවලට කපා විකුණනු ලැබ්. ඇතැම් මාසවල දී මෙහි ග්‍රීෂ්මය දැරිය නොහෙන තරම් අධික ය. එහෙත් චීනයේ මන්සි ප්‍රදේශයෙන් ද අරාබිකරයෙන් ද වෙළෙන්දෝ නිතර මෙහි පැමිණෙති. ඔවුන් රැගෙන එන වෙළෙඳ භාණ්ඩ ඉතා උසස් මිලකට මෙහි දී විකුණාගත හැකි ය. එසේ ම විශාල භාණ්ඩ තොග මෙරටින් රැගෙන යෑමට ද පුළුවන.

ලෝකයේ වෙනත් රටවලට වඩා මෙහි සතා සතුන්ගේ ස්වභාවය වෙනස් ය. තද කළු පාට ව්‍යාඝ්‍රයෝ සිටිති. ගිරවුන් කිරි සුදු පාට ය. පාද සහ හොට තද රතු ය. තද නිල්පැහැති හා රතු පැහැති ගිරවුන් ද දැකි හැකි ය. බටු ගිරවුන් ද දක්නට ලැබේ. මොනරුන් ද ශරීර ප්‍රමාණයෙන් විශාල වේ. මනා ලක්ෂණයෙන් යුක්ත ය. පලතුරු වර්ග ද අමුතු ය. මෙයට හේතුව දැඩි උෂ්ණාධික කාලගුණය විය හැකි ය. කිසියම් තාල වර්ගයක ගසකින් ලබා ගන්නා යුෂයෙන් සීනි සාදනු ලැබේ. මේ සීනිවලින් පෙරා ගන්නා මත්පැන් සැර ය. මිදි යුෂයට වඩා ඉක්මනින් මත් ගතිය දැනේ. ආහාරපාන සුලභ ය. වී හැරුණු විට සෙසු ධාන්‍ය වර්ග වගා නොකැරේ. වී වගා අතිශයින් සරුසාර ය. මෙහි ජනතාව අතර වෛද්‍යවරු ද ජ්‍යොතිෂ් ශාස්ත්‍රඥයෝ ද සිටිති. ඔවුහු තම ශාස්ත්‍රයන්හි හසල බුද්ධියෙන් යුක්තයහ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම කාල වර්ණ ය. ශරීරයේ විලි වසා ගැනීමට පමණක් රෙදි කඩක් හැඳීම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම පුරුද්ද ය. කාමුක ස්වරූපයක් ඔවුන් කෙරෙන් පිළිබිඹු වේ. ලේ නෑයන් සමග විවාහ වීම ඔවුන්ගේ සම්ප්‍රදායයි. මිය ගිය සහෝදරයන්ගේ බිරියන් පාවා ගැනීම ද ඔවුන් අතර පවතින සිරිතකි. ඥාති විවාහ ඉන්දියාවේ හැම ප්‍රදේශයකම පවතී.

කොමරින් පිහිටා ඇත්තේ දකුණු ඉන්දියාවේ තුඩුවේ ය. උත්තර ධ්‍රැව තාරකා මෙහි සිට සැතපුම් තිහක් ඔබ්බෙන් දෘශ්‍යමාන වේ. ක්ෂිතිජයේ සිට රියනක් පමණ උසින් එය දක්නා ලැබේ. සමස්ත ප්‍රදේශයෙහිම ඝණ කැලෑ බැවින් ආර්ථික වැවිලි නොමැත. එහෙත්

වනසතුන් බහුල ය. මිනිසුන්ගේ හැඩරුවින් යුත් විශාල වානර විශේෂයක් දමෙහි දක්නට ලැබේ. දිග වලග සහිත වඳුරන් ද බොහෝ ය. වග වලසුන් කොටි දිවි ආදී රුදුරු වනසතුන් ද බහුල ය.

කුමාරි තුඩුවේ සිට සැතපුම් තුනසියයක් බටහිරට ගමන් කළ විට හමුවනුයේ ඒලි (ඩේලි) රාජ්‍යයයි. එය ස්වාධීන රාජ්‍යයකි. වැසියෝ ඔවුනටම ආවේණික වූ භාෂාවක් කථා කරති. මේ රාජ්‍යයට අයත් වරායන් නොමැත. එහෙත් විශාල ගංගාවක් ඇත්තේ ය. මේ රට ආක්‍රමණය කිරීමට සතුරනට දුෂ්කර වී ඇත්තේ ගමනාගමන බාධක හේතුවෙනි. ගම්මිරිස් ඉඟුරු හා වෙනත් කුළුබඩු වර්ග ද බහුලව ඇත. යම් හෙයකින් වැරදීමකින් හෝ කිසියම් භාණ්ඩ පටවාගත් නෞකාවක් ඉහත කී ගංගාව දිගේ රට තුළට යාත්‍රා කළ හොත් එය රාජසන්තක කරනු ලැබේ. දෙවියන්ගේ ආශිර්වාදයෙන් එබඳු නෞකාවක් තම රට තුළට පැමිණි බවට විශ්වාස කරන නිසා එහි භාණ්ඩ තමන් සතු බව මෙහි වැසියෝ කියති.

කාලගුණය යහපත්ව පවතින වාරයේ මන්සි නුවර සිට වෙළෙඳ නෞකා මෙහි පැමිණේ. සතියකට වඩා අඩු කාලයක් තුළ දී ඔව්හු නැව් බඩු පටවා ගෙන ආපසු යෑමට කඩිසර වෙති. මේ මුහුදු බොක්කේ වැලි කඳු බහුල ය. නැව් නවතාලීම සඳහා මේ මුහුදු බොක්ක සුදුසු ස්ථානයක් නොවේ. කොපමණ හොඳින් නැංගුරම් ලූවත් අනතුරු සිදුවේ. එහෙයින් චණ්ඩ මාරුතයන්හි දී නැව ඉවතට ගෙන යෑමට සූදානමෙන් සිටිය යුතු ය. කොටි ද වෙනත් නපුරු වනසතුන් ද මෙහි බහුලව ගැවසේ.

මලබාරය වූ කලී ඉන්දියාවේ බටහිර දිසාවෙන් පිහිටි විශාල රාජ්‍යයකි. මේ රට ඔවුන්ගේම රජකු විසින් පාලනය කරනු ලැබේ. අනෙකුත් කිසිම රජකුට යටත් නැති ස්වාධීන පාලකයෙකි. තමන්ට ම ආවේණික භාෂාවක් මෙරට ජනයා කතා කරති. ක්ෂිතිජයෙන් ඔබ්බෙහි බඹ දෙකක් පමණ ඉහළින් උත්තර ධ්‍රැව තාරකාව මේ රටට පෙනෙන්නේ ය. අසල පිහිට ගුජරාටයේ සේ ම මෙහි ද මුහුදු කොල්ලකාරයන් බහුල ය. අසලින් යාත්‍රා කරන නැව් සිය ගණනක් පමණ වසරක දී ඔවුන්ගේ ග්‍රහණයට ගැනේ. අඹු දරුවන් ද කුඩා දරුවන් ද සමග මොව්හු නිරතුරු මුහුදුබඩ සැරිසරන්නාහ. ග්‍රීෂ්ම ඍතුව මුළුල්ලේ ම ඔව්හු මේ ප්‍රදේශයේ සැරිසරති. එකකට එකක් සම්බන්ධ වන ආකාරයෙන් මේ කොල්ලකරුවන් නැව් යාත්‍රා විස්සක්

Scanned by CamScanner

පමණ වෙරෙළාසන්න මුහුදේ රඳවා තබනු ලැබේ. බොහෝ දුර ප්‍රමාණයක් ආවරණය වන පරිදි සැතපුම් විස්සක් පමණ ප්‍රදේශයක ඔවුනගේ බලය පතුරුවාගෙන සිටිත්. ඈත වෙනත් රටක වෙළෙඳ නෞකාවක් එනු දුටු සැණෙන් ඔව්හු වෙරළේ ගිනිමැලයක් දල්වති. එවිට ඒ සංඥාවෙන් කොල්ලකරුවෝ සියලු දෙනා මංකොල්ලයට සූදානම් වන්නාහ. ඒ.ආසන්නයට නැව ළඟා වූ වහාම සියලු දෙනා එක්වී වටකැර ගනිති. ඉන්පසු එහි ඇති සියලු බඩුතොග පැහැර ගනිති. නැවියෝ පිරිස ගොඩබිමට පලවා හරිනු හැර අනතුරක් කරන්නේ නැත. අනතුරුව නැව හිස් කොට භාර දී වෙනත් බඩු තොග පටවා ගෙන එන ලෙස නියම කැරේ. යළි පැමිනුණහොත් ඒ බඩු තොගය ද පෙරකී පරිද්දෙන්ම පැහැර ගැනේ. මේ හේතුවෙන් මුහුදු කොල්ලකාරයෝ පොහොසත් වන්නාහ.

මෙහි ඉඟුරු, ගම්මිරිස්, පොල් ආදි වගාවන් බහුල ය. ඉතා සුන්දර නිමාවෙන් යුතු ගෙතා කපු පිළි නිෂ්පාදනය කැර ලෝකයේ වෙනත් රටවලට බෙදා හරී. චීනයේ මන්සි ප්‍රදේශයේ සිට මෙරටට තඹ ගෙන එනු ලැබේ. රන් නූලෙන් වැඩ දැමූ අගනා රෙදිපිළි ද සිනිඳු තුනී රෙදිපිළි ද රන් හා රිදී ද මෙහි නොමැත. බෙහෙත් වර්ගයන් චීනයේ ගෙනවුත් ගොඩබායි. මේවා මෙහි වෙළෙඳ භාණ්ඩ සමග හුවමාරු කැරේ. මේ භාණ්ඩ මෙහි වෙළෙන්දෝ ඇලෙක්සැන්ඩ්‍රියාවට ගෙන යන්නාහ.

ගුජරාටය දෙසට මීළඟට හැරෙමු. මලබාරයේ සීමාවේ ගුජරාටය පිහිටියේ ය. එය ඉන්දියන් සාගරයේ බටහිර වෙරළ දක්වා විහිද පවතී. ඔවුන්ටම ආවේණික භාෂාවක් මෙහි වැසියෝ කතා කරත්. ක්ෂිතිජයෙන් බඹ හයක් ඉහළින් මේ රටට උත්තර ධ්‍රැව තාරකාව පෙනේ. මෙහි වසන මුහුදු කොල්ලකරුවෝ විශාල ආදායමක් ලබා ගනිති. මුහුදු කොල්ලකරුවන් නැවක් අල්ලා ගත් විට එහි සිටින වෙළෙන්දාට මුහුදු වතුර පෙවීම සිරිතකි. ඔහු ස්වර්ණාභරණ මුතු මැණික් ආදිය ගිලදමා ඇද්දැයි විරේක කරවා සොයා ගැනීම සඳහා ය. මුහුදු කොල්ලකරුවන් නැව අල්ලා ගැනීමට සූදානම් වන විට රන්, මුතු, මැණික් ආදි වටිනා භාණ්ඩ ගිල දැමීම වෙළෙඳුන්ගේ සිරිතකි. ලුණු වතුර පොවන්නේ බඩ විරේක කරවා එකී භාණ්ඩ ඇත්දැයි දැනගැන්මේ අටියෙනි. ඉඟුරු ගම්මිරිස් සහ නිල් සායම් මෙහි බහුලව නිපදවනු ලැබේ. මෙහි වැවෙන පුළුන්

Scanned by CamScanner

ගස් වලින් පුළුන් නෙළා ගනිති. එක් ගසකින් පුළුන් විශාල ප්‍රමාණයක් ලබා ගැනේ. පැරණි ගස්වල පුළුන්වලින් නූල් කටිනු නොලැබේ. ඒවායින් කොට්ට සාදති. අවුරුදු දොළසක් පමණ මේරූ ගස්වලින් ලබාගන්නා පුළුන්වලින් නූල් කැට මස්ලින් ආදි සියුම් රෙදිපිළි ද ඉස්තරම් කපු පිළි ද නිෂ්පාදනය කැරේ. සම් පදම් කිරීම ද මෙහි පවත්නා කර්මාන්තයකි. එළුවන්, ගවයන්, කුළු හරකුන්, කඟවේණුන් ආදි සතුන්ගේ සම් වියළා පදම් කොට යාත්‍රා මගින් අරාබියේ නොයෙක් රටවලට විකිණීමට ගෙන යති. ඇඳන්වල ඇතිරිලි කවර තැනීමට රතු පාට සහ නිල් පාට සම් භාවිතා කැරේ. මෙසේ තනවන මෘදු සම් කවර සුවදායක ය. අලංකාර ය. රන් රිදී කෙදිවලින් අලංකාර සැරසිලි කළ මේ කවරවලට මහත් සේ ඇලුම් කරන මහමත්වරු එහි සයනය කිරීමට කැමැත්තාහ. සතුන්ගේ හා පක්ෂීන්ගේ රූ සටහන් රන් රිදී නූලෙන් මසා නිම කළ කොට්ට මෙට්ට ඇතිරිලි කවර විකිණීමට ද තිබේ. රිදී මාර්ක් හයක් තරම් ඉහළ මිලකට මේවා අලෙවි කැරේ. ඉතා සියුම් මැහුම් ගෙත්තම් කිරීමට මෙහි සන්නාලියෝ අතිදක්ෂ වෙති.

අනතුරුව මා විස්තර කරනුයේ තානා රාජ්‍යය (තනරා) පිළිබඳව ය. මාර්කෝ පෝලෝ නැගෙනහිර සිට ගමන් ඇරඹූ බැවින් මේ රාජ්‍යය බටහිරින් පිහිටා ඇතැයි කියයි. රටවල් හමුවූ ආකාරය අනුව දිශාව සඳහන් කැර ඇත. තානා රාජ්‍යය පාලනය කරනුයේ ස්වදේශික කුමාරයෙකි. ඔවුන් කතා කරන්නේ එරටට ආවේණික භාෂාවකි. රූප වන්දනාවේ යෙදෙති. ගම්මිරිස් හෝ ඉඟුරු මෙහි නොවැවේ. එහෙත් කළු පාටට හුරු සාම්බ්‍රානි වර්ගයක් මෙහි සිට පිටරට වෙළෙඳාමට පටවනු ලැබේ. වෙනත් වෙළෙඳ භාණ්ඩ සමග මේ සුවඳ ද්‍රව්‍යය ද පිටරට යැවේ. මෙහි පැමිණෙන බොහෝ නැව්වල අශ්වයන් ද විකිණීමට ගෙන එති.

අනතුරුව පිවිසෙන්නේ කැම්බේ (පයාන්) රාජ්‍යයට ය. ස්වදේශික රජකු මෙහි පාලනය ගෙන යයි. ස්වාධීන රාජ්‍යයකි. උත්තර ධ්‍රැව තාරකාව මේ රටට පෙනෙනුයේ කලින් පෙනුණාට වඩා ඉහළිනි. වයඹ දිශාවට හුරුව මෙරට පිහිටා ඇති නිසා ය. බහුල වශයෙන් කපු නූල් ද කපු රෙදිපිළි වර්ග ද මෙහි නිෂ්පාදනය කැරේ. සතුන්ගේ සම් පදම් කැර විදේශීය වෙළෙඳුනට විකුණනු ලැබේ. ඒ වෙනුවට රන්, රිදී, තඹ, තුත්තනාගම් ආදි ලෝහ වර්ග හුවමාරු කැර ගනිති.

Scanned by CamScanner

අනතුරුව පවසනුයේ සොම්නාත් රාජ්‍ය පිළිබඳ තොරතුරු ය. මේ රාජ්‍යය බටහිර දිසාවෙන් පිහිටා තිබේ. ස්වාධීන පාලකයකු මෙහි අධිපතියා ලෙස කටයුතු කරයි. මෙහි ජනයා ප්‍රතිමා වන්දනා කරන්නෝ ය. ක්‍රමානුකූල ලෙස වැදගත් ජීවිතයක් ගත කරති. විවධාකාර වාණිජ නිෂ්පාදන මෙරට ඇත. විදේශීය වෙළෙන්දෝ මේ භාණ්ඩ හුවමාරු කැර.ගනිති. මෙහි පූජකවරු අතිශයින් කෲර පිරිසක් බව මට දැන ගන්නට ලැබුණේ ය.

කෙච්මැක්රන් (මක්‍රන්) රාජ්‍යය ගැන මීළඟට කතා කරමු.

මෙය ද විශාල රාජ්‍යයකි. ඔවුන්ගේම රජෙක් මේ රට පාලනය කරයි. ඔවුනගේම භාෂාවක් කථා කරති. බහුලව සිටිනුයේ මුස්ලිම් ආගමිකයන් ය. කර්මාන්ත සහ වෙළෙඳ ව්‍යාපාර මගින් ඔවුහු ජීවිකාව ගෙන යති. බත් තිරිඟු සහ මස් වර්ග ද කිරි ද මෙරට සුලභ ය. මුහුදු මාර්ගයෙන් ද ගොඩබිමින් ද වෙළෙන්දෝ මෙරටට පැමිණෙති. මහා ඉන්දියාවේ වයඹ දෙස මායිමේ කෙළවර පිහිටි නගරය මෙයයි. ඉන්දියාවේ මලබාරයෙන් ආරම්භ කොට වයඹ දිග වෙරළාසන්නයෙන් මෙහි සංචාරය හමාර වේ. වෙරළබඩ ප්‍රදේශයන්හි ගමන් ගන්නා විට දී හමු වූ නගර හා රාජ්‍යයන් පිළිබඳ පමණක් මෙහි දී සඳහන් කැරිණ. සෙසු රටවල් හා රාජ්‍යයන් නගර ගැන තොරතුරු පැවැසුයේ නම් මේ කෘතිය ඉතා විශාල වනු ඇත. එහෙයින් තවත් දූපතක් දෙකක් ගැන තොරතුරු පමණක් කීමට අදහස් කරමි. ඒ ස්ත්‍රී දූපත හා පිරිමි දූපත ය.

Scanned by CamScanner




# අරාබි මුහුද

කෙච්-මැක්රන් දූපතෙහි සිට සැතපුම් පන්සියයක් දකුණු දෙසට ගමන් කළ විට සාගරයේ පිහිටි දූපත් දෙකක් හමුවේ. මේ දූපත් දෙක හඳුන්වනුයේ ස්ත්‍රී දිවයින හා පුරුෂ දිවයින යනුවෙනි. පිරිමි දූපත එනමින් හඳුන්වන්නේ එහි වාසය කරනුයේ පිරිමි පමණක් බැවිනි. අනෙක් දූපතේ වාසය කරනුයේ ස්ත්‍රීන් පමණි. එකම ජාතියකට අයත් ස්ත්‍රී පුරුෂයන් වෙන වෙනම මේ දූපත් දෙකෙහි වාසය කරත්. ක්‍රිස්තු ලබ්ධිකයන් වන මොවුන් අනුගමනය කරනුයේ පරණ තෙස්තමේන්තුවට අයත් සිරිත් විරිත් ය. වසරකට වරක් පුරුෂයෝ ස්ත්‍රී දූපතට පැමිණ මාර්තු - අප්‍රේල් - මැයි යන තුන් මාසය එහි ගත කරති. එක් එක් පුරුෂයා ඒ ඒ ස්ත්‍රීය සමග වෙන වෙනම ඔවුන්ගේ නිවාසයන්හි කාලය ගත කරන්නේ ය. ඉන්පසු පිරිමි නැවත තමන්ගේ දූපතට ගොස් තම වැඩකටයුතුවල යෙදෙති. භාර්‍යාවන් තම පිරිමි දරුවන් වයස දොළහ දක්වා ඇති දැඩි කොට ඉන්පසු පිරිමි දූපතට යැවීම සිරිත ය. දූවරුන් තිසි වයස එළඹෙන තුරු තමන් රැකවරණයෙහි තබාගනිමින් අනතුරුව පිරිමි දූපතෙහි සිටින තරුණයන්ට විවාහ කැර දෙනු ලැබේ. එහි පවතින ඍතු ගුණය කාලගුණය නිසා මෙසේ ඔවුනොවුන් වෙන් වී වාසය කරන්නේ යැයි සිතිය හැකි ය. එසේ නොවන්නේ යයි ඔවුන්ට පාඩුහානි සිදුවෙතැයි විශ්වාස කරති. මේ දිවයිනේ බිෂොප්වරයෙක් සිටී. හෙතෙම සොකොත්‍රා දිවයිනේ බිෂොප්ට යටත් ය. පිරිමි ධාන්‍ය වගා කැර එයින් ලැබෙන ආදායමෙන් භාර්‍යාවන් ද දූ දරුවෝ ද පෝෂණය කරති. එහෙත් භාර්‍යාවෝ ද ගොවිතැන් කරති. පලතුරු එකතු කරත්. විශේෂ පලතුරු ශාක විශේෂයක් ද මේ දිවයිනේ වැවේ. මෙහි ජනයා අති දක්ෂ ධීවරයෝ ය. අතිවිශාල

Scanned by CamScanner

මාලු තොග ගොඩබිමට ගෙන එති. ඔවුන් සියලු දෙනා මාළු ආහාරය පිණිස ගනිති. ලුණු දැමූ මාළු කරවල වාණිජ භාණ්ඩයක් ලෙස අලෙවි කැරේ. තල්මසුන්ගෙන් ලබාගන්නා ඇම්බර (කස්තුරි වැනි ඖෂධයක්) පිරිමි දිවයින අසලින් ලැබේ. වාණිජයන් අතර මේ සඳහා හොඳ ඉල්ලුමක් ඇත.

ඒ පිළිබඳ විස්ර නිමා කොට මීළඟට පිවිසෙන්නේ සෙකොත්‍රා දිවයිනට ය. මේ වූ කලී විශාල දිවයිනකි. ස්වයංපෝෂිත දේශයකි. මහ ජනයා තල්මසුනගේ වසුරු හෙවත් ඇම්බර මුහුදු වෙරළෙන් එකතු කැර ගනිති. මෙය අගනා ඖෂධයකි. අධික මිලට විකිණේ. කස්තුරි වැනි සුවඳ මුසු ඖෂධයකි. මේවා ලබා ගැන්මට මෙහි ජනයා තල්මසුන් මරා දමති. මෙය වාණිජ ව්‍යාපාරයකි. ඔව්හු කටු ඇන සහිත ආයුධයකින් තල්මසාට අනිති. මේ ආයුධයට යොතක් ද සවිකැර තිබේ. පහර කෑ තල්මසා යකඩ උලත් සිරුරේ තිබියදී ඈතට පීනයි. යොතෙහි කොනකට බෝයාවක් ද සවිකැර තිබේ. තල්මසා බොහෝ දුරට පීනා ගිය පසු යකඩ උල් පහර කෑම නිසා මැරේ. බෝයාවේ සලකුණෙන් තල්මසා මැරී සිටින තැන ධීවරයෝ දැනගනිති. ඉන්පසු තල්මස් මළකුණ වෙරළට ඇදගෙන අවුත් බඩ පළා අම්බර ගනිති. තල්මස් හිසෙන් තෙල් පීප්ප කීපයක් ද පෙරා ගත හැකි ය.

මෙරට ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම විලි වසාගන්නේ අමුඩයක් වැනි කුඩා රෙදි පටියකිනි. රූප වන්දනා කරන බොහෝ වැසියන් වෙසෙන රටවල මෙන් මෙහි ජනයා ද අඬනිරුවත් ය. මස්, බත්, කිරි ආදිය ආහාරයට ගනිති. තිසි අයුරු බෞතීස්ම ලද ඔවුහු කිතු දහම අදහති. ආණ්ඩුවට යටත්ව කටයුතු කරන අතරම බිෂොප්වරයාගේ අණට ද කීකරු ය. මෙකී බිෂොප්වරයා රෝමයේ පාප්තුමා යටතේ නොසිටී. බිෂොප්වරයා මෙහි ජනයා විසින් තෝරා ගනු ලබන අතර බැග්ඩෑඩ් හි නායක පූජකතුමා ඒ පත්වීම අනුමත කරන්නේ ය. බොහෝ මුහුදු කොල්ලකරුවෝ තමන් අල්ලාගත් භාණ්ඩ ද සමග මේ රටට එකතු වෙති. ඒ බඩු බාහිරාදිය එහි වැසියෝ මුදලට ගනිත්. මුස්ලිම්වරුන්ගේ හා ප්‍රතිමා අදහන ජනයාගේ භාණ්ඩ ඔවුන් පැහැර ගන්නේ ඒ ගැන තැකීමක් නැතිවයි. මෙසේ මංකොල්ලකෑම යුක්ති සහගත ලෙසින් ඔවුන් සලකන බව පෙනේ. ඒඩන් වරායට යන හැම නැවක් ම මේ රටට ද ළඟා වේ. මාලු සහ අම්බර බහුල වශයෙන් මෙහි දී මිලට ගැනේ. එසේ ම විවිධ වර්ගයේ රෙදිපිළි ද ගනිති.

Scanned by CamScanner

අනවින කොඩිවින හදි හූණියම් කිරීම මේ රටේ මිනිසුන්ට හොඳින් පුරුදු ය. බිෂොප්තුමා මෙවැනි කටයුතුවලට තහංචි පනවා ඇත ද ඔවුන් එය ගණන් ගන්නේ නැත. මුහුදු කොල්ලකරුවකු ඔවුන්ගෙන් යමෙකුට කෙණෙහිල්ලක් කළහොත් එයට පළිගැනීම සඳහා කොඩිවින කරයි. ඔහුට යාත්‍රාව ගෙන යෑමට නොහැකි වන පරිදි බන්ධන කරයි. එවිට ඒ සඳහා මුදලක් ගෙවා හූනියම කොඩිවිනය බන්ධනය ඉවත් කරවාගත යුතු සුළඟ පවා වෙනත් අතකට හැරවීමට මන්ත්‍ර බලයෙන් ඔවුනට හැකි ය. එසේම ඔව්හු මන්ත්‍ර බලයෙන් මුහුදේ කුණාටු මවති. ඇතැම් අවස්ථාවන්හි නැව් සුන්බුන් කරවන හූනියම් කොඩිවින කරති. ඔවුන් මන්ත්‍ර බලයෙන් කරන කටයුතු මවිතය දනවයි.

සොකොත්‍රා දිවයිනෙන් නික්ම දකුණටත් නිරිතටත් අතරමැදි මාර්ගයකට සුක්කානම හරවා ගමන් ආරම්භ කෙළෙමු. සැතපුම් දහසක් දුර යාත්‍රා කළ කල්හි මැඩගස්කර නමැති විශාල දිවයින හමුවේ. අතිවිශාල ප්‍රදේශයකි. සමස්ත ලෝකයේම ඉතා සරුසාර භූමියකි. සැතපුම් තුන් දහසක වට ප්‍රමාණයෙන් යුක්ත මෙහි වැසියෝ මුස්ලිම්වරු ය. මහමත්තුමන් අදහති. ෂික් නමින් හැඳින්වෙන පාලකයන් සතර දෙනෙක් මෙරට කොටස් හතරකට බෙදාගෙන පාලනය ගෙන යති. වාණිජ ව්‍යාපාරයන්හි සහ කර්මාන්තයන්හි යෙදෙමින් මෙහි වැසියෝ ජීවිකාව් කැර ගන්නාහ. අලි ඇතුන් බහුල මෙරට ඇත්දත් වෙළෙඳාමෙන් බොහෝ ලාබ උපයයි. ඇත්දළ වෙළෙඳම සැන්සිබාරයේ මෙන් මෙරට ද පවතී. බොහෝ ජනයා අනුභව කරනුයේ ඔටු මස් ය. ගවයන් ආදි සිවුපාවන්ගේ මස් ද ආහාරයට ගන්නේ නමුදු වඩාත් රසවත් ලෙස අගය කරනුයේ ඔටු මස් ය. මෙහි ජීවත්වන ඔටුවන්ගේ මස් වෙනත් රටවල ඔටු මස්වලට වඩා රසවත් සේ ප්‍රකට ය.

රත්සඳුන් ශාක මෙරට වනාන්තරයන්හි බහුලව වැඩෙයි. එහෙයින් පහසු මිලට රත් සඳුන් ලබා ගත හැකි ය. මෙහි තල්මස් කස්තුරි නමින් හැඳින්වෙන 'ඇම්බර' බහුලව මුහුදු වෙරළට ගොඩ ගසයි. වාරකන් කාලයේ ද මිනිස්සු ඇම්බර එකතු කොට විකුණති. දිවියන්, ව්‍යාඝ්‍රයන්, කොටි, වලසුන්, ගෝනුන්, මුවන්, වල් බළලුන්, තිත් මුවන් ආදි සතුන් ද මෙහි දඩයම් කැරේ. යුරෝපා රටවලට වඩා වෙනස් ලක්ෂණ සහිත පක්ෂි වර්ග මෙහි බෝවෙයි. සතරදිග් භාගයෙන්ම නෞකා හා වෙනත් යාත්‍රා මේ දිවයිනට ළඟාවෙයි. විවිධ වාණිජ භාණ්ඩ සමග රන්කම් රිදීකම් කළ කපු හා සේද රෙදි

පටරෙදි මෙරටට ගොඩබානු ලැබෙයි. මෙරටින් ඒ සඳහා විවිධ වාණිජ භාණ්ඩ හුවමාරු කැර ගැනේ. ඉතා ලාභ සහිත වෙළඳාමක් පවතී. සෙසු දූපත්වල මෙහි ළඟාවන නැව් නොනවත්වන බැවින් සැන්සිබාරයටත් මේ දූපතටත් නිතර නැව් සේන්දු වේ. මේ ප්‍රදේශයට අයත් මුහුද ඉතා චණ්ඩ ය. බිහිසුණු වේගවත් ලෙස දකුණු දෙසට රැල්ල ගසයි. රැල්ල ගසන්නේ ප්‍රතිවිරුද්ධ දිසාවටයි. එහෙයින් ආපසු ගමන දුෂ්කර ය. භයානක ය. මලබාරයේ සිට මෙහි ළඟාවීමට නැවකට විසි දවසක්, විසි පස් දවසක් පමණ කාලයක් ගත කළ යුතු ය. එහෙත් ආපසු යෑමට මාස තුනකට අධික කාලයක් වැයවේ. ප්‍රචණ්ඩ මුහුදු රළ දකුණු දෙසට ඇදී යන නිසා ය. දියවැල් අතිශය වේගවත් ය.

වසරේ එක්තරා කාලසීමාවක දී මෙරට වෙරළබඩ අමුතු පක්ෂි විශේෂයක් දක්නට ලැබේ. මෙරට වැසියන් මෙම පක්ෂීන් හඳුන්වනුයේ 'රුක්' නමිනි. රාජාලියකුට සමාන මේ පක්ෂියා ශරීර ප්‍රමාණයෙන් බොහෝ විශාල ය. මේ පක්ෂියාගේ ශරීර ප්‍රමාණයත් ශක්තියත් අනුව අලියකු වුව ද නිය පඳුරෙන් ඩැහැගෙන යා හැකි බව කියති. මෙසේ අලියකු ඩැහැගෙන යන අතර ගොදුර බිම වැටුණහොත් එය ඉරා කැබලිකර ගිල දමන බව ද ප්‍රසිද්ධ කාරණයකි. පියාපත් දෙපසට විදා හළ විට දස රියනක් පමණ දිගින් යුක්ත ය. මහත ද එබඳු ය. එක් පියාපතක් අට රියනක් පමණ දිගින් යුක්ත යයි ද කියති. අඩක් සිංහයකු මෙන් ද අඩක් පක්ෂියකු ලෙස ද පෙනුමෙන් යුත් පුදුම සතකුගේ චිත්‍ර මාර්කෝ පෝලෝ දැක තිබේ. ඒ ගැන සිහිපත් කරමින් මේ පක්ෂියාගේ මුහුණ සිංහයකුගේ වගේ දැයි මෙහි වැසියන්ගෙන් විමසූ විට ඔවුන් කිවේ බොහෝ දුරට රාජාලියකු බඳු පක්ෂියකු වැනි බව ය.

කුබ්ලායි ඛාන් හට මේ අරුම පුදුම පක්ෂියා ගැන තොරතුරු අසන්නට ලැබුණි. මේ පිළිබඳ තොරතුරු දැන ගැනීමටත් වැඩි දුරටත් එරට තොරතුරු දැනගන්නා අටියෙන් කුබ්ලායි ඛාන් දූතයන් එවූයේ එහි සිරකරුවකු වශයෙන් සිටින තම සේවකයා ද නිදහස් කැර හරින ලෙස දන්වමිනි. මේ ගමනේ යෙදුණ දූතයෝ මෙරටට පැමිණ ඒ පක්ෂියාගේ පියාපතක් ද රැගෙන ගොස් ඛාන් අධිරාජයාට පෙන්වූහ. රුක් නමැති මේ යෝධ පක්ෂියාගේ පියාපතක දිග අඟල් අනූවකි. පිහාටුවේ මුල දැතින් ඇල්ලීමට හැකි පමණට වඩා මහත ය. මේ තොරතුරු මට අසන්නට ලැබිණි. අධිරාජයා එය රැගෙන ආ දූතයන්ට අගනා තුටු පඬුරු පිරිනැමී ය. මේ රටේ වල් ඌරකුගේ

Scanned by CamScanner

දතක් ද ඔව්හු ඛාන් අධිරාජයා වෙත ගෙන ගියහ. මේ වල් ඌරකු වල් මී හරකකු තරම් විශාල ය. කුබ්ලායි ඛාන් වෙත ගෙනා වල් ඌරු දත බරින් රාත්තල් දාහතරකි. ජිරාෆ් සහ බූරුවන් ද වෙනත් වල් සතුන් ද මෙහි බහුල ය. මේ සතුන් සිව්පාවුන් අප රටේ දක්නට ලැබෙන සතුනට වඩා බොහෝ සෙයින් වෙනස් ය.

මීළඟට මා ප්‍රකාශ කරනුයේ සැන්සිබාරයේ තොරතුරු ය.

මැඩගස්කර දූපතෙන් ඔබ්බෙහි සැන්සිබාරය පිහිටියේ ය. මේ දිවයිනෙහි වට ප්‍රමාණය සැතපුම් දෙදහසක් පමණ යයි කියති. ප්‍රතිමා වන්දනා කරන මෙහි ජනයා ඔවුනටම ආවේණික භාෂාවක් කථා කරති. ස්වාධීන රාජ්‍යයකි. මෙහි ජනයාගේ ශරීර ස්ථූල ය. එහෙත් මිටි ය. උස ද මහතට සරිලන සේ පැවතියේ නම් ඔවුන් යෝධයන් ලෙස පෙනෙනු ඇත. මෙහි මිනිසුන් ඉතා ශක්තිමත් ය. හතර දෙනෙකු ඔසවන බරක් තනිව ඔසවති. සාමාන්‍ය මිනිසුන් පස් දෙනකුගේ කෑම මෙහි එක් තැනැත්තකු ගිල දමයි. ඉතා කළු පැහැති ඡවි වර්ණයෙන් යුක්ත ය. අමුඩයක් පමණක් විලි වසා ගැන්මට භාවිතා කරති. ඔවුනගේ හිසකේ තදින් හැඩ පලු ගෙතී තිබේ. කොපමණ වෙලා වතුරේ ගිලී සිටිය ද හැඩපලු මුදා හළ හැකි නොවේ. මෙහි ජනයාගේ මුඛය විශාල ය. නාසය උඩු අතට හැරී ඇත. දෙකන් දිග ය. දෙනෙත් අසාමාන්‍ය ලෙස මහත් ය. දෙනෙත් බිය උපදවන ස්වභාවයක් ගනී. රකුසන්ගේ මෙනි. ස්ත්‍රීන් ද පුරුෂයන් මෙන් විරූපී ය. මුඛය විශාල ය. නාසය ඉතා මහත ය. මනෝඥ පෙනුමෙන් යුක්ත නොවේ. මෙහි ස්ත්‍රීන්ගේ පියොවුරු වෙනත් රටවල ස්ත්‍රීන්ගේ පියොවුරු මෙන් සතර ගුණයකටත් වඩා විශාල ය. ලෝකයේ අතිශයින් අශෝභන ස්ත්‍රීන් වෙසෙනුයේ මෙරටෙහි බව කිව යුතු ය. බත්, මස්, කිරි, රට ඉඳි ඔව්හු ආහාර වශයෙන් ගනිති. මුද්දරප්පලම්වලින් පෙරාගත්තා මත් බීම මෙහි නැත ද බත් සහ සීනි ද කුළුබඩු ද මිශ්‍රකැර සුරා නිෂ්පාදනය කැරෙයි. එය රසවත් පානයකි. අලි ඇතුන් බහුල මෙරට ඇත් දළ ආදායම් උපදවන වාණිජ භාණ්ඩයකි. මෙහි සතුන්ගේ ජනනේන්ද්‍රිය පිහිටා ඇත්තේ වෙනත් සතුනට වඩා වෙනස් විශේෂ ආකාරයකි. මනුෂ්‍ය ස්ත්‍රී පුරුෂ සම්භෝගයට සමාන අයුරින් මේ සත්තු රමණය කරති.

ජිරාෆ් නමින් හැඳින්වෙන සත්ත්ව විශේෂය මෙහි බහුල ය. හොඳින් වැඩුණු මෙම සිව්පාවන්ගේ ඉදිරි පාද දිග ය. පසු දෙපා

Scanned by CamScanner

කෙටි ය. බෙල්ල ඉතා දිගටි ය. හිස කුඩා ය. තපුරු සිවුපාවකු නොවේ. ගෙළ සමග හිස හතර රියනක් පමණ දිග ය. රවුම් ළා රතු පාට පුල්ලි සිරුරේ විහිද තිබේ. මෙරට බැටලුවෝ වෙනත් රටවල බැටලුවන්ට වඩා වෙනස් රූපකාරයක් ගනිති. හිස කලු ය. ශරීරයේ අනෙක් කොටස් තනි සුදු ය. සුනඛයන්ගේ ස්වරූපය ද එබඳු ය. මෙහි සියලු සිවුපා සතුන් ද පක්ෂීන් ද අමුතු ය. වෙළෙඳ නෞකා බහුල වශයෙන් මෙරටට පැමිණේ. වෙළඳුන් තල්මස් ඇම්බර් සහ ඇත්දත් ලබාගෙන ඒ වෙනුවට වෙනත් වෙළෙඳ භාණ්ඩ හුවමාරු කැර ගනිති. මෙහි ගෝත්‍රික නායකයෝ බොහෝ විට ඔවුනොවුන් සමග සටන් කරති. මෙරට අශ්වයන් නොමැති බැවින් ඔටුවන් හා අලි ඇතුන් අරා සටන් වැදෙති. ඇතුන්ගේ පිට උඩ පසළොස් දෙනකුට හෝ විසි දෙනකුට පමණ රැඳී සිටීමට ඉඩකඩ ඇත. මණ්ඩප තනාගෙන කඩු - ලන්ස - ගල් ආදිය රැගෙන ගොස් සටන් කරති. සටනට යවන ඇතුනට මත්පැන් පෙවීම ද ඔවුන්ගේ සිරිතකි. ඇතුන් ප්‍රකෝප කර දරුණු ලෙස සටනට පෙළඹවීමේ අටියෙනි.

ඉන්දියාව පිළිබඳ තොරතුරු සඳහන් කෙළේ වැදගත් ස්ථාන පිළිබඳව පමණක් සලකා බලමිනි. දූපත් පිළිබඳව කරුණු සඳහන් කැරුණේ ද යථෝක්ත පදනමෙහි පිහිටමිනි. ලොකු කුඩා දූපත් දොළොස් දහස් හත්සියයකට අධික සංඛ්‍යාවක් මෙහි ඇතැයි පළපුරුදු නාවිකයෝ පවසති. ඉන්දියාවේ නොයෙක් වරායන් වෙත නිතර ගමන් කළ නාවිකයන්ගේ හා පළපුරුදු සංචාරකයන් මගින් එබඳු තොරතුරු පැහැදිලිව මට දැන ගැනීමට ලැබිණ. මිනිසුන් වාසය කරන දූපත් ද මිනිස් වාසයෙන් තොර දූපත් ද මේ අතර වේ. මලබාරයේ සිට කොස්මරන් දක්වා මහ ඉන්දියාව පිළිබඳව ද රාජ්‍යයන් දහයක් පිළිබඳ කරුණු ඉහත දී සඳහන් විය. එහෙත් රාජ්‍ය දහතුනක් එහි තිබෙන බව කිව යුතුය. චම්පා රාජ්‍යයේ පටන් මර්පිලි රාජ්‍ය දක්වා සුලු ඉන්දියාවේ තොරතුරු සඳහන් කැරිණ. එහි දූපත් අපමණ තිබේ. අනතුරුව මා සඳහන් කරන්නේ මධ්‍ය ඉන්දියාවේ ඇබිසීනියාව පිළිබඳවයි.

ඇබිසීනියාව විශාල රාජ්‍යයකි. මධ්‍ය ඉන්දියාව නමින් හඳුන්වනුයේ මේ ප්‍රදේශයයි. ක්‍රිස්තු ලබ්ධික රජෙක් එහි ප්‍රධානත්වය උසුලයි. උපරජවරු හය දෙනෙක් මහ රජු යටතේ කප්පම් ගෙවමින් පාලනය ගෙන යති. ඔවුන් ක්‍රිස්තු භක්තිකයන් ය. සෙසු තුන් දෙනා මුස්ලිම් භක්තිකයන් ය. ක්‍රිස්තු භක්තිකයන් හඳුනා ගැන්ම සඳහා

Scanned by CamScanner

ඔවුන්ගේ නළල මැද ද දෙකම්මුලෙහි ද යනාදි වශයෙන් සලකුණු තුනක් තබා ඇත. රත්කළ යකඩයකින් තබන මේ සලකුණු සඳහා භාවිතා කරනුයේ රත් වූ යකඩයකි. එය ඔවුන්ගේ පළමු බෞතීස්මය වශයෙන් සලකනු ලැබේ. මුස්ලිම්වරුන්ගේ දක්නට ලැබෙනුයේ එක් සලකුණකි. නළළ මැද සිට නැහැය මැද දක්වා ය. යුදෙව්වෝ ද මෙරට වාසය කරත්. ඔවුන් ද දෙකපොළෙහි තිලක දෙකක් තබා ගෙන සිටිනු පෙනේ. ක්‍රිස්තු ධර්මය අදහන අගරජුගේ රාජධානිය අගනුවර රට මැද පිහිටියේ ය. ඒඩින් පළාත දෙසට හුරුව මුස්ලිම් කුමාරවරුන්ගේ රාජ්‍යයන් පිහිටා තිබේ. සාන්ත තෝමස් අපෝස්තුලු වරයාණෝ මෙහි වැසියනට ක්‍රිස්තු ධර්මය දේශනා කළහ. ඇබිසීනියාවට පැමිණ ධර්මය දේශනා කිරීම ද ප්‍රාතිහාර්‍ය්‍ය පෑම ද නිසා මෙහි බොහෝ වැසියෝ කිතු සමය වැළඳ ගත්හ. අනතුරුව එතුමා මෙහි දී ස්වර්ගස්ථ වූයෙන් ඇබිසීනියාවේම මිහිදන් කැරිණ.

ඇබිසීනියාවේ ජනයා රණකාමී ය. ඔව්හු ඒඩනයේ සල්ටන් සමග ද නුබියාවේ ජනයා සමග ද දේශ සීමාවෙහි පිහිටි රටවල ජනයා සමග ද නිතර සටන් වැදුණහ. මේ කරුණු හේතුකොට ගෙන ඔව්හු අතිදක්ෂ රණශූරයන් බවට පත්වූහ. ක්‍රි. ව. 1288 දී ඇබිසීනියන් කුමරා ක්‍රිස්තුන් වහන්සේගේ සොහොන් කොත බැලීමට යෑම සඳහා වන්දනා ගමනක යෙදීමට තීරණය කෙළේ ය. වන්දනාකරුවන් රැසක් මෙලෙස ජෙරුසලමට වන්දනාවේ යෑම වාර්ෂික චාරිත්‍රයක් ලෙස පැවතිණ. එහෙත් මුස්ලිම් පාලකයන් වසන ප්‍රදේශ මැදින් මේ ගමන යෑම අනතුරුදායක බව කුමරාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ඔහුට දැන්වූහ. අනතුරුව නියෝජිතයකු වශයෙන් බිෂොප්වරයකු එහි යැවීමට තීරණය කැරිණ. එතුමා ශුද්ධවන්තයකු ලෙස ජනතාවගේ ගෞරව බහුමානයට පාත්‍ර වූවෙකි. කීර්තිමත් ය. රජතුමා වෙනුවෙන් ජෙරුසලමට ගොස් යාඥා පවත්වා සුදුසු පරිදි පුද පූජා පවත්වා ආපසු පැමිණෙන අවස්ථාවේ ඒඩනයේ සල්ටන් විසින් අල්ලා ගන්නා ලදී. මහමත් ආගම වැළඳ ගැන්මට බල කිරීම මෙසේ අල්ලා ගැනීමට හේතුව ය. එහෙත් බිෂොප්වරයා එයට කැමති වූයේ නැත. එහෙත් බලහත්කාරයෙන් අල්ලා ගෙන 'සුන්නත්' කැර මුදාහරින ලදී. බිෂොප්තුමා තමනට කරන ලද බලපෑමත්, බලහත්කාරයෙන් සුන්නත් කිරීමත් පිළිබඳ තම රජුට සැල කෙළේ ය. මෙකී සාහසික ක්‍රියාව පිළිබඳව ප්‍රකෝප වූ ඇබිසීනියා රජු වහා යුද්ධ සේනාවක් රැස්කොට සල්ටන් රජුට

එරෙහිව තෙමේ ම සටන් පෙරමුණ මෙහෙයවා ඉදිරිපසින් ගමන් කෙළේ ය. සල්ටන් රජු මේ බව දැන සෙසු මුස්ලිම් කුමාරවරුන් දෙදෙනෙකුගෙන් ද ආධාර පැතූ අතර ඔවුහු ද ආධාර සේනාංක එවූහ. අවසානයේ දී ඇබිසීනියන් රජු යුද්ධය ජයග්‍රහණය කෙළේ ය. ඒඩ්න් නගරය අල්ලාගත් රජු බිෂොප්තුමාට කළ හිංසා අවමානයට පළිගැනීමක් වශයෙන් නගරය ද විනාශ කෙළේ ය.

මෙරට ජනයා බත්, කිරි, මස්, තිරිඟු අදිය ආහාරයට ගනිති. තල තෙල් නිෂ්පාදනය ද මෙහි සිදුකැරේ. ඒ හැරුණු විට ආහාරයට ගන්නා වෙනත් කුළුබඩු වර්ග ද සුලභ ය. ඇතුන් සිංහයන්, වඳුරෝ, පක්ෂීන්, ගෘහාශ්‍රිත පක්ෂීන් මෙහි සිටිති. රත්‍රන් ද සුලභ ය. වෙළෙඳාම සඳහා බොහෝ වෙළෙන්දෝ පැමිණෙති. අධික ලාභ උපදවන වෙළෙඳාමක් මෙහි තිබේ. මීළඟට විස්තර කරනුයේ ඒඩ්න් දේශය පිළිබඳව ය.

මෙරට පාලනය කරනුයේ සල්ටන් නමැති සුල්තාන්වරයකු විසිනි. කිතු දහම පිළිකුල් කරන මොවුන් අදහන්නේ මහමත් ධර්මයයි. කුඩා නගර රැසක් ද බලකොටු රැසක් ද මෙහි ඇත. මෙරටට අයත් අගනා වරායක් තිබේ. ඉන්දියාවේ සිට ඖෂධ වර්ග ද වෙනත් වාණිජ භාණ්ඩ ද රැගත් නෞකා ද මේ වරායට සේන්දු වේ. ඇලෙක්සැන්ඩ්‍රියාවට ගෙන යෑම සඳහා කුළුබඩු ඖෂධ වර්ග ඇතුළු වෙනත් වාණිජ භාණ්ඩ මෙහි වෙළෙන්දෝ මිලදී ගනිති. අනතුරුව කුඩා යාත්‍රා මුහුදු බොක්ක හරහා විසි දවසකට ආසන්න කාලයක් ගමන් කොට ඔවුන්ගේ වරායට සේන්දු වේ. පටවා ගෙන ආ භාණ්ඩ යළිත් ගොඩ බා ඔටුවන්ගේ පිට පටවා මාසයක පමණ කාලයක් ගමන් කර නයිල් ගං තෙරට ළඟා වේ. යළිත් එහි දී භාණ්ඩ යාත්‍රාවනට පටවා නයිල් ගඟ ඔස්සේ කයිරෝවට ළඟා වෙයි. දුෂ්කරතා අවම වූ මේ මාර්ගයෙන් ඉන්දියානු වෙළෙඳ භාණ්ඩ ඇලෙක්සැන්ඩ්‍රියාවට ගෙන යනු ලැබේ. ඒඩ්න් වරායේ දී වෙනත් වෙළෙඳ භාණ්ඩ සමග අශ්වයන් ද අරාබියේ සිට නැව් මගින් ඉන්දියාවට ගෙන යති. ඉන්දියාවට සහ වෙනත් දූපත් වලට ද මේ වාණිජ භාණ්ඩ බෙදා හැරේ. අධික මිලට මෙකී භාණ්ඩ විකිණීම නිසා ලබන ලාභය විශාල ය.

ඒඩනයේ සල්ටන් හට අප්‍රමාණ ධනයක් ඇත. ඉන්දියාවත් ඒඩන් වරායත් අතර සිදු කැරෙන වාණිජ ගනුදෙනු මගින් ද තීරු බදුවලින් ද මෙසේ ධනය හිමි වේ. සියලු වෙළෙඳ නෞකා මේ

Scanned by CamScanner

වරායට සේන්ද්‍ර වීමත් ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වීමත් නිසා මෙතරම් විශාල ධනස්කන්ධයක් එකතු වේ. බැබිලෝනියාවේ කයිරෝවේ සල්තාන් මුල් වරට අක්‍රා නගරය ආක්‍රමණය කළ අවස්ථාවේ අශ්වයන් තිස් දහසක් ද ඔටුවන් හතළිස් දහසක් ද පරිත්‍යාග කළ බව පැවසේ. මෙසේ කරන ලද්දේ ක්‍රිස්තු ලබ්ධිකයන් කෙරෙහි වෛරයෙනි. මීළඟට මා විස්තර කරනුයේ එශියර් නගරයේ තොරතුරු ය. මහමත් ආගම අදහන රජෙක් මේ රට පාලනය කරයි. ඒඩනයේ සිට ගිනිකොණ දිසාවෙන් මේ නගරයට ඇති දුර ප්‍රමාණය සැතපුම් හතළිහක් පමණ වේ. නගර රාශියක් මෙහි ඇත්තේ ය. ලොකු නගර ද බලකොටු රැසක් ද මෙහි පිහිටා ඇත. වෙළෙඳ නැව් බහුල වශයෙන් පැමිණෙන මෙහි වරාය කදිම ය. නොයෙක් වෙළෙඳ භාණ්ඩ ද අශ්වයන් ද මෙරටින් ගෙන ගොස් විකුණා අධික ලාභ උපයා ගැනේ. අනර්ඝ සුදු කට්ටකුමංජල් ද මෙහි පවත්නා වෙළෙඳ භාණ්ඩයකි. එක්තරා කුඩා ගස් වර්ගයකින් වැගිරෙන යුෂ එකතු කොට මිදෙන්ට තබා මේ කට්ටකුමංජල් වෙළඳාම සඳහා පිළියෙග කැර ගැනේ. ගස සිදුරු කෙළේ නැත ද එහි පිටපොත්ත පුපුරා මේ යුෂ වැගිරෙන්නට පටන් ගනී.

ඉඳිගස් ද මෙහි සරුසාර ලෙස වැවේ. තණ හාල් වී හැරුණු විට වෙනත් ධාන්‍ය වර්ග වගා නොකැරේ. සෙසු ආහාර ද්‍රව්‍ය ලබාගන්නේ වෙනත් රටවලිනි. මුද්දරප්පලම්වලින් පෙරන මත්පැන් නැතත් ධාන්‍ය, රට ඉඳි සීනි මිශ්‍රකැර කදිම මත්පැන් වර්ගයක් පෙරා ගැනේ. බැටලුවන් සුලභ නොවන බව මෙහි දක්නට ලැබෙන බැටලුවන්ගේ කන් අමුතු ය. වෙනත් බැටලුවන්ගේ කන් පිහිටා ඇති තැන ඇත්තේ අං දෙකකි. කන් වෙනුවට නැහැයට ආසන්නයේ කුඩා සිදුරු දෙකක් පිහිටා තිබේ.

අතිදක්ෂ ධීවරයෝ මෙහි වෙසෙති. තලපත් මාළු බහුල ය. තලපත් මාළු කුරියන් දෙදෙනෙකු ග්‍රෝට් එකකට මිලදී ගත හැකි ය. බහුල ලෙස කරවල සඳහා මාළු වේලති. මෙහි පවත්නා අධික උෂ්ණත්වය ගිනි රස්නය වැනි ය. එළවුළු හෝ පලා වර්ග මෙරට නොවැවේ. ගොනුන්ට, ඔටුවන්ට, අශ්වයන්ට, බැටලුවන්ට, දෙනුනට ආදී වශයෙන් සියලු සිවුපාවුන්ට කෑමට දෙන්නේ කරවල ය. මේ සත්තු කැමැත්තෙන් කරවල ගිල දමති. සත්ත්ව ආහාර වශයෙන් පිළියෙළ කරනු ලබන්නේ කුඩා මසුන් ය. මාර්තු, අප්‍රේල්, මැයි මාස තුනෙහි දී කුඩා මසුන් අප්‍රමාණ සංඛ්‍යාවක් ගොඩ දමන ලැබේ. ඒවා වියළා සත්ත්ව ආහාරයට පිළියෙළ කැරේ. මෙහි

Scanned by CamScanner

ගෘහාශ්‍රිත සත්තු අමු මාළු ද අනුභව කරති. ධාන්‍ය වර්ග නොමැති බැවින් ලොකු මාළු කුරියන් පෙති කපා සුරා වර්ගයක බහා පොඩිකර තලපයක් මෙන් සාද වියළා විස්කෝතු මෙන් ආහාරයට පිළියෙළ කැර ගනිති. වර්ෂය මුළුල්ලේ ම මේ විස්කෝතු ආහාරයට ගත හැකි පරිදි මනා සේ සකස් කරති.

කට්ටකුමංජල් නමැති සුවඳ වර්ගය මෙහි ඉතා සුලභ ය. මේ හොණ්ඩරයක් බෙසන්ට් හෙවත් රත්‍රන් ඩ්‍රැකට්ස් දහයකට ගෙන හොණ්ඩරයක් බෙසන්ට් හතළිහ ගණනේ විකුණනු ලැබේ. මේ වෙළෙඳාම කැරෙනුයේ සල්ටන් ගේ නියමය අනුව ය. සියලු වෙළෙඳ ද්‍රව්‍යයන්හි ඒකාධිකාරය ඔහු සතු ය. හෙතෙම රට වැසියන්ගෙන් භාණ්ඩ අඩු මිලට ගෙන අධික මිලට විකුණා ලාභ උපයයි. අනතුරුව මා විස්තර කරනුයේ ඩුල්පාර් නගරය පිළිබඳ තොරතුරු ය.

දෝපාර් (ඩුල්පාර්) විශාල නගරයකි. ශියර් නගරයේ සිට සැතපුම් විස්සක් ඔබ්බෙන් ගිනිකොණ දිශාවෙන් පිහිටා තිබේ. මහමත් ආගම අදහන මෙහි ජනයාගේ අධිපතියා සල්ටන් රජුට යටත් ය. මේ නගරයට යාබද කදිම වරායක් තිබේ. නෞකා රාශියක් මේ නගරයට සේන්දු වෙයි. මේ නගරයට අරාබි අශ්වයන් රාශියක් එකතු කරනුයේ වරායෙන් නැවට පටවා විදේශ රටවල විකිණීමට ගෙන යති. කට්ටකුමංජල් ද මෙහි ප්‍රධාන වෙළෙඳ භාණ්ඩයකි. කුඩා උපනගර රැසක් ද බලකොටු ද මෙහි දැකිය හැකි ය.

කල්හාත් සමුද්‍ර බොක්ක ආශ්‍රිතව පිහිටි නගරයකි. දෝපාර් නගරයේ සිට සැතපුම් පනහකට දුරින් නැගෙනහිරින් පිහිටි කල්හාත් හි වැසියෝ මහමත් ආගම අදහති. ඕමුස් දූපතේ රජුට මෙහි වැසියන් යටත් ය. එහි සිටි මලික් රජුට වෙනත් රටකින් තර්ජන එල්ල වූ විට මෙරටට පැමිණේ. එයට හේතුව මේ දිවයින සුරක්ෂිත වීමයි. සතුරකුට ආක්‍රමණය කළ නොහැකි පරිදි ස්වභාවික පිහිටීමෙන් ආරක්ෂා වී ඇත. එහෙයින් මේ දක්වා කිසිදු සතුරු ආක්‍රමණයක් මෙරටට එල්ල වී නොමැත. ධාන්‍ය වර්ග මෙහි නොවැවෙන බැවින් විදේශයන්ගෙන් ආනයනය කැරේ. පහසුකම් සහිත වරායක් බැවින් ඉන්දියානු නෞකා නිතර පැමිණේ. රෙදිපිළි කුළුබඩු හා වෙනත් වෙළෙඳ ද්‍රව්‍ය මෙහි ගොඩ බායි. වෙරළේ සිට ඈත පිහිටි නගරවලට ද බලකොටුවලට මේ වෙළෙඳ භාණ්ඩ සැපයේ. කල්හාත් මුහුදු බොක්කේ පිහිටි බලකොටුවෙන් අවසර නොමැතිව මෙරටට ඇතුළුවීමට හෝ පිටමං වීමට නොහේ. මෙහි අධිපති මලික් රජු

Scanned by CamScanner

කෙර්මන් රජු සමග සම්බන්ධකම් පවත්වයි. ඒ රජුට කප්පම් ද ගෙවන්නේ ය. එහෙත් පමණට වඩා ඉල්ලීම් කරන නිසා ඇතැම් අවස්ථාවන්හි දෙදෙනා අතර හොඳ හිත පලුදු වේ. ඇතැම් අවස්ථාවන්හි බලපෑම් කිරීම සඳහා යුද හමුදාවන් ද එවයි. එවිට ඔහු ඕමුස් දිවයිනෙන් නික්ම කල්හාත් වෙත පැමිණේ. පිටතින් පැමිණෙන නැව් ගමනාගමනයට එමගින් බාධා පැමිණේ. මේ නිසා කෙරමනයේ රජුට අයබදු නොලැබී යන්නේ ය. එහෙයින් ඔහුගේ ආදායම හීන වේ. එවිට මලික් රජු සමග ඇතිකැර ගත් ආරාවුල සමථයකට පත් කැර ගනී. මෙහි මුහුද අසල තනා ඇති බලකොටුව නිසා ආරක්ෂක විධිවිධාන සැලැසේ. ඇතුළුවීම පිටවීම පිළිබඳ පාලනය මෙන්ම අසලින් ගමන් ගන්නා නෞකා නිරීක්ෂණයට ද අවස්ථා සැලසේ. මෙහි ජනතාව රටඉඳි, අලුත් මාළු, ජාඩි ආදිය ආහාරයට ගනිති. එහි මෙකී ආහාරපාන සුලභ ය. එසේ වුවද පොහොසත්තු විදේශයෙන් ආනයනය කැරෙන ධාන්‍ය වර්ග අධික මිලට ගනිති. කල්හාත් නුරින් නික්ම ඊසාන දෙසට සැතපුම් තුන්සියයක් පමණ දුර ගමන් කළ විට ඕමුස් නමැති දිවයින හමුවේ.

ඕමුස් දූපතේ වෙරළබඩ අතිශයින් අලංකාර නගරයක් ඉදිකැර තිබේ. මෙහි පාලකයා මලික් නමින් හැඳින්වේ. සේනාධිපතියකු මෙන් ම පාගකයකු ද මෙනමින් හඳුන්වනු ලැබේ. ඕමුස් හි නගර හා බලකොටු රැසකි. අරාබි ජන කොට්ඨාසයක් වන මෙහි වැසියෝ මහමත් ආගම අදහති. මෙහි පවත්නා උෂ්ණය අධික ය. එබැවින් සෑම නිවසකම වා කවුළු රාශියක් සිටින සේ ඉදිකැර ඇත. එසේ නොවේ නම් මෙහි නිවෙස් තුළ වාසය අති දුෂ්කර ය. කිසි හා කෙර්මන් නගර ගැන කලින් විස්තර කළ බැවින් මේ නගරය පිළිබඳ පමණට වඩා විස්තර කිරීම අනවශ්‍ය ය. මහ ඉන්දියාව ගැන ද ඉතියෝපියාව අසල පිහිටි රටවල් කිහිපයක් ගැන ද තොරතුරු කීවෙමු. එහෙයින් මෙතැන් සිට උතුරු දෙස පිහිටි රටවල් ගැන තොරතුරු ඉදිරිපත් කැරේ.

Scanned by CamScanner




# උත්තර දේශය සහ ටාටර් යුද්ධ

තුර්කිස්ථානය පාලනය කරනයේ කායිදු නමැති රජෙකි. හෙතෙම ඛාන් අධිරාජයාගේ බෑණනුවන් ය. චසතායිගේ පුත්‍රයාගේ පුත්‍රයා ය. එසේම කුබ්ලායි ඛාන් ගේ ඇවෑස්ස සහෝදරයෙකි. ඔහුගේ පාලනය යටතේ බොහෝ නගර හා පුරවර ඇත. හෙතෙම බලවත් පාලකයෙකි.

ස්වාධීන පාලනයක් පවත්නා මෙහි වැසියෝ පාරම්පරික චාරිත්‍ර අනුගමනය කරන්නාහ. නොඉඳුල් ටාටර් ගෝත්‍රය වශයෙන් කටයුතු කරන මොවුන් අදහන්නේ "නාදගයි" නමැති දෙවියෙකි. පෘථිවියට අධිපති සකල වස්තු සම්භාරය පහළ කෙළේ මේ දෙවියන් යයි ඔව්හු විශවාස කරති. ටාටර්වරු ප්‍රතිමා වන්දනාවෙහි ද යෙදෙති. ලොම් රෙදිවලින් මේ දෙවියන්ගේ පිළිම සාදා වන්දනාවෙහි යෙදෙනු පෙනේ. ටාටර්වරුන්ගේ රජු හෝ යුද හමුදාව බලකොටු තුළ රැඳී නොසිටී. එසේ ම නගරවල ද වාඩි ලා නොගනී. එළිමහනේ ද මිටියාවත්හි ද වනගත ප්‍රදේශයන් හි ද වාසය කරත්. ධාන්‍ය වර්ග මෙහි වගා නොකැරේ. කිරි හා මස් ඔවුන්ගේ ආහාර ය. කලකෝලාහල අරගල රහිතව සාමකාමීව ජීවත් වන්නාහ. රජතුමාට පක්ෂපාතී ය. තම ජනතාවගේ සාමයට හා හමුදාවේ එකමුතු කමට වඩා වෙනත් සතුටක් රජුට නැත්තේ ය. හමුදා විනය මෙහි උසස් ලෙස පවතී. අශ්වයන් ගවයන්, බැටලුවන් හා වෙනත් සතුන් මෙහි ඇතිකරනු ලැබේ. ගෘහාශ්‍රිත සත්තු බොහෝ ය.

මෙහි උතුරු ප්‍රදේශයේ සුදුපාට වලසුන් වර්ගයක් දක්නට ලැබේ. ශරීර ප්‍රමාණයෙන් විශාල මේ සතුන් ඇතැම් විට වියත් විස්සක්

Scanned by CamScanner

පමණ දිග ය. මෙහි සිගාලයන්ගේ සිරුරේ ලොම් කාල වර්ණ ය. වනාන්තරවල බූරුවෝ ද වෙසෙති. සියුම් ලොම් සහිත "රොන්ඩස්" නමින් හැඳින්වෙන මුගටියන් වැනි සත්ත්ව විශේෂයක් ද මෙහි දක්නට ලැබේ. උණහපුළුවන් ද, උගුඩුවන් ද, පාරාවෝ මීයන් ද සුලභ ය. මේ මී රංචුවක සතුන් විශාල ප්‍රමාණයක් සිටිති. සේබල්ස් නමින් හැඳින්වෙන සත්ත්ව විශේෂයක් ද මෙහි බෝ වේ. උගුල් අටවා මේ සතුන් අල්ලනු ලැබේ.

මිනිස් වාසයක් දැක ගැනීම සඳහා කාන්තරයක් ඔස්සේ දින දාහතරක් ගමන් කිරීමට සිදුවේ. ජලයෙන් යටවන ප්‍රදේශයක් ද බැවින් විල්ලුවක් ලෙස ද පෙනේ. සීත ඍතුවෙහිදී මෙහි ජලය මිදේ.

අවුරුද්දේ වැඩි කාලයක් හිමෙන් වැසී පවතී. සූර්ය රශ්මිය වැටෙන කාලයෙහි දියවී මඩ ගොහොරු වෙයි. ශීත කාලයට වඩා හිම දියවෙන කාලයෙහි එහි ගමන් කිරීම උගහට ය. එහෙත් බොහෝ ආයාසයෙන් වෙළෙඳුන් එහි ළගාවන්නේ ලොම් මිලදී ගැනීමටයි. මෙහි පවත්නා එකම වාණිජ භාණ්ඩය ලොම් පමණෙකි. කොතරම් දුෂ්කර මාර්ගයක් වුව ද වෙළෙඳුන්ගේ ගමනාගමනය සඳහා පහසුකම් සලසා තිබේ. අතරමගදී වෙළෙඳුන්ට නවාතැන් ගැනීම සඳහා දැව කොට මත කුඩාරම් තනා තිබේ. වෙළෙන්දෝ මේ අම්බලම්වල දිනයෙන් දිනයට නතර වී ගමනාන්තය දක්වා ගමන් කරත්. ප්‍රදේශවාසීහු ඔවුනට අවශ්‍ය ආහාර පාන හා සෙසු පහසුකම් සලසා දෙති. නවාතැන් පොළෙන් තවත් නවාතැන් පොළකට යන විට ප්‍රදේශවාසීහු ඔවුන් කැඳවා ගෙන යන්නාහ. මේ සඳහා රෝද නොමැති කරත්ත විශේෂයක් ඇත. මෙහි පතුල පැතලි ය. ඉදිරිපසින් මඳක් ඉහළට නැමී ඇත. මේ කරත්ත ඇදගෙන යන්නේ සුනඛයින් වැනි සිවුපා වර්ගයකි. මිදුණු හිම තලා මත මේ කරත්ත වේගයෙන් ඇදගෙන යයි. බූරුවන් තරම් විශාල මේ බල්ලන් ශක්ති සම්පන්න ය. ග්‍රීෂ්මයට ඔරොත්තු දෙන සිවුපා විශේෂයකි. එක් වරකට මේ සතුන් ජෝඩු තුන බැගින් එක් කරත්තයක බඳිනු ලැබේ. එක් එක් වෙළෙන්දා එක් එක් කරත්තයෙහි තම බඩු පටවා ගෙන ගමන් කරයි. දවස අවසානයේ මේ බලු ජෝඩු තුන මුදාහැර ඊළඟ දවසේ තවත් බලු ජෝඩු තුන බැගින් බඳිති. මේ ආකාරයෙන් ගොස් වෙළෙඳුන් බඩුමුට්ටු පටවා ගෙන අවුත් අපගේ රටවලට විකිණීම සිරිත ය. ඔවුන් රැගෙන ගිය බඩුමුට්ටු එහි වැසියනට විකුණනු ලැබේ.

Scanned by CamScanner

ටාටර්වරුන් වාසය කරන පළාතක් ඇත උතුරු පෙදෙසේ පිහිටා ඇත. අඳුරු දේශය නමින් එය හැඳින්වේ. ශීත ඍතුවේ මාස කිහිපයක් ඒ පළාතට හිරු නොනැගේ. අහස පවා පැහැදිලිව නොපෙනේ. අලුයම් කාලය මෙන් පෙනුණත් හිරු උදාවන ආකාරයක් අපට දක්නට ලැබුණේ නැත. පිරිපුන් දේහ සම්පත්තියෙන් යුක්ත වුවද මෙහි වැසියන්ගේ සිරුරු සුදුමැලි ය. අධිපතියකුගේ පාලනය යටතේ ඔවුන් ජීවත්වන බවක් නොහැඟේ. එකමුතු බවක් හෝ සදාචාර සම්පන්න ස්වරූපයක් නොදිසේ. බුද්ධිමත් නොවේ. ටාටර්වරු වරින්වර මොවුන්ගේ ප්‍රදේශවලට කඩාවැදී කොල්ල කති. බඩු බාහිරාදිය පැහැර ගනිත්. අන්ධකාර කාල සීමාවේ දී මේ කොල්ලකෑම් අතවර බහුලව සිදුවේ. එයට හේතුව කොල්ලකරුවන් පැමිණෙන බව මෙහි වැසිනට නෙපෙනීමයි. එහෙත් කොල්කරුවන්ට ද ආපසු යෑමේ දී මහත් අවහිරවලට මුහුණ පෑමට සිදුවේ. එයට හේතුව වල්මත් වීමයි. මංමුලා වීමයි. මේ සඳහා ද ඔවුහු සුදුසු උපක්‍රමයක් යොදා ගනිති. පැටවුන් සහිත වෙළඹුන් තෝරාගෙන පැටවුන් මග දමා උන්ගේ පිට නැඟී සොරකමට යති. ආපසු එන විටදී පැටවුන් සොයා යෑමට වෙළඹුන් පෙළඹෙන බැවින් මංකොල්ලකරුවෝ ද පහසුවෙන් මග සොයාගෙන එති. කොල්ලකෑමට යන්නේ ද ආපසු එන්නේ ද පැටවුන් මග දමා ගිය වෙළඹුන්ගේ පිට නැගෙමිනි.

උෂ්ණ කාලය උදාවීමත් සමග ප්‍රීති ප්‍රමෝදයට පත්වන මෙහි ජනයා මේ කාලසීමාව තුළ දී හැකිතාක් සිවලුන්, මුගටින්, හෝතඹුවන්, මීමින්නන්, උනහපුළුවන් වැනි සතුන් අල්ලා මරා හම ගසා සම් වේලා පදම් කැර ගනිති. මේ සතුන්ගේ ලොම් සිනිඳු ය. අධික මිලකට විකිණේ. ටාටර්වරුන්ගේ ප්‍රදේශවලට වඩා මෙහි වෙසෙන සතුන්ගේ වටිනාකම අධික ය. ටාටර්වරුන් අන්ධකාර කාල සීමාවේ දී උතුරු ප්‍රදේශ වැසියන්ගේ දේපළ කොල්ලකන්නේ මේ නිසා ය. මේ භාණ්ඩ කොල්ලකාගෙන අවුත් විශාල මිලකට විකිණිය හැකි බැවිනි. ඔව්හු මේ ලෝම වර්ග නොයෙක් රටවලට ද ගෙන ගොස් විකුණති. රුසියාවට ද මේ ලොම් වර්ග ගෙනයනු ලැබේ. රුසියාව පිළිබඳ තොරතුරු ස්වල්පයක් දී මෙහි දී සඳහන් කළ යුතු ය.

රුසියාවට අයත් ප්‍රදේශය විශාල ය. කොටස් කිහිපයකට බෙදුණු රාජ්‍යයකි. එහි උතුරු කෙළවරෙහි පිහිටි ප්‍රදේශය අඳුරු ප්‍රදේශය

Scanned by CamScanner

නම් වෙයි. ඒ ගැන විස්තර ඉහත සඳහන් විය. මෙහි ජනයා ක්‍රිස්තු ලබ්ධිකයෝ ය. ග්‍රීක් ක්‍රිස්තියානු සම්ප්‍රදායානුකූලව මෙහි දේවස්ථානයනහි කටයුතු සිදුවේ. ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයම ආරෝහ පරිණාහ දේහ සම්පත්තියෙන් යුක්ත ය. කඩවසම් ය. දිගු නොවන වරලස පිට දිගට විහිදා සිටින ස්ත්‍රීන් රූමත් ය. බටහිර දිසාවේ ටාටර් රජුට කප්පම් ගෙවන රටකි. බටහිර ටාටර් රාජ්‍යය මේ දේශයේ නැගෙනහිර සීමාවේ පිහිටියේ ය. හෝතඹු, මීමිනි, මුගටි, උගුඩු, උණහපුළු, සිවල් සම් පදම් කොට වේලා සකස් කරන මෙහි බහුල වශයෙන් ලෝම වර්ග රැස් කැරේ. ඉටි වර්ග ද ආකරවලින් රිදී ද ලැබේ. රුසියාව අධික ශීතල ප්‍රදේශයකි. උතුරු මුහුද දක්වා මෙරට පැතිර පවත්නා බව කියති. උකුස්සන් කුරුලුගොයන් ආදී දඩයම් පක්ෂීන් බහුල ය. මේ පක්ෂීන් ලෝකයේ වෙනත් රටවලට විකිණීමට ගෙන යනු ලැබේ.

කායිදු නමැති රණශූරයෙක් තුර්කිය මේ වන විට පාලනය කරයි. හෙතෙම කුබ්ලායි ඛාන්ගේ මුණුබුරෙකි. අධිරාජයාගේ පුතාගේ පුතෙකි. නගර හා බලකොටු රාශියක් ඔහු යටතේ පවතී. ටාටර් වරයකු වන ඔහුගේ සේනාව ද ටාටර්වරුන් ය. අතිදක්ෂ පුහුණු යුද්ධ සේනාවකි. කායිදු අධිරාජයාට යටත් වූයේ ප්‍රබල සටනකින් පසුව ය. මහා තුර්කිය පිහිටියේ ඕමුස් හි සිට අප පැමිණි මාර්ගයේ උතුරටත් බටහිරටත් අතරමැදිව ය. අයොන් නදියට දුරින් පිහිටි උතුරුදිගින් අධිරාජයාගේ දේශය දක්වා තුර්කිය විහිද තිබේ. මෙයට පෙර ද මෙහි වැසියෝ අධිරාජයා සමග සටනට වන්හ. කැතේ හා මන්සි ප්‍රදේශවලින් කොටසක් තමාට ද ලබා දෙන ලෙස දන්වමින් කායිදු වරක් කුබ්ලායි ඛාන් අධිරාජයාට සංදේශයක් යැවී ය. මෙයට පිළිතුරු වශයෙන් අධිරාජයා දන්වා යැවූයේ සෙසු කුමාරවරුන් මෙන් කායිදු ද අධිරාජයාගේ අණට ද සෙසු රදළවරුන්ගේ අණට ද කීකරුව තිසි අවස්ථාවේ රාජ සභාවට පැමිණ හමුවී අවනතව සිටිය යුතු බවත් ය. ඒ කොන්දේසිය අනුව අධිරාජයා යටතේ පවත්නා චීනයේ කොටසක් ද දීමට කැමැති බව ද වැඩිදුරටත් දැන්වීය.

එහෙත් කායිදු තම ඥාතියකු වූ ඛාන් අධිරාජයාගේ බසට අවනත වූයේ නොවේ. තම රටේ දී පමණක් අධිරාජයාට යටත් වන බව කියා සිටියේ ය. අධිරාජයාගේ රාජ සභාවට නොපැමිණෙන්නේ මරණ භය නිසා බව ද දැන්වී ය. මේ ආකාරයෙන් කායිදු හා

Scanned by CamScanner

අධිරාජයා අතර අමනාපකම් උග්‍ර විය. ඉන්පසු දෙපක්ෂය අතර වරින් වර සටන් ඇවිළුණි. කිහිප වරක් සටන් හට ගැනීම නිසා ඛාන් අධිරාජයා ඔහුගේ දේශය ආවරණය කරමින් යුද බලඇණි පිහිටුවීය. තම වැසියන්ට එල්ල විය හැකි අනතුරු වළක්වාලීමේ අටියෙනි. එසේ ආරක්ෂා සංවිධාන තර කළ ද කිහිප වරක් කායිදු අධිරාජයාගේ දේශ සීමා ඉක්මවා පැමිණ සටන් වැදුණි. කයිදු රජු ඕනෑම සටනකට මුහුණ දීමට සමත් දක්ෂ රණශූර ලක්ෂයක අසරු හමුදාවක් සංවිධානය කර ගෙන සිටියේ ය. චින්ගිස් ඛාන්ගේ පරපුරෙන් පැවැත එන රදල අධිපතියන් පිරිසක් ද ඔහුට පක්ෂපාතීව සිටියහ. ඔවුන් සටන් කරන ආකාරය ගැන ද මෙහි දී යමක් සඳහන් කළ යුතු ය.

එක් එක් හටයෙක් ඊතල හැටක් ගෙන යා යුතු ය. එයින් තිහක් විශාල ය. තිහක් කුඩා ය. පුළුල් තලය සහිත විශාල ඊතලවලින් විදින්නේ ළඟින් සිටින සතුරන්ට ය. මූණට ද අත්වලට ද විද තුවාල කරති. සතුරාගේ දුන්නේ දුනුදියට විද වරපට සිඳලති. මෙලෙසින් දරුණු හානි සිදුකැරේ. ඊතල අවසන් වූ පසු කඩු හා යකඩ පොලු ගෙන පහර දෙති. ක්‍රි. ව. 1266 දී කයිදු රජු සෙයුදර් නමැති ඥාති සහෝදරයා ද සමග සේනා සංවිධානය කොට ගෙන අධිරාජයාගේ රදලවරුන් දෙදෙනෙකුට පහර දුන්හ. ඔවුන් කයිදු ගේ සහෝදරයන් ය. ඒ රදලයන් භුක්ති වින්දේ අධිරාජයාට අයත් දේපල ය. තබයි හෙවත් සිබන් නමැති මේ දෙදෙනා සයාගතයි ගේ දරුවන් ය. ක්‍රිස්තුලබ්ධිකයන් ය. ඔවුනට ද යුද්ධ හමුදාවන් වූ බැවින් දෙපක්ෂයම මුහුණට මුහුණ ලා සටන් කළහ. දරුණු සටනකින් පසු විශාල ජනඝාතනයක් සිදුවිය. ජය අත්වූයේ කයිදු රජුට ය. එහෙත් කයිදුගේ ඥාති සහෝදරයන් දෙදෙනා මරණයට පත් වූයේ නැත. ඉතා හොඳ අශ්වයන් මත රැඳී සිටි බැවින් පළා යෑමට හැකිවිණ. මේ ජයග්‍රහණය නිසා කයිදු රජු උද්දාමයට පත්විය. ඉන්පසු කයිදු රජු ජයග්‍රහණයේ සතුටින් පිනා යමින් වසර දෙකක් පමණ කුබ්ලායි ඛාන්ට එරෙහිව සටන් නොවැදී සාමකාමීව සිටියේ ය. කාලයාගේ ඇවෑමෙන් කයිදු නැවත සේනා සංවිධානය කෙළේ සටනක් ඇරැඹීමේ අභිප්‍රායෙනි. කුබ්ලායි ඛාන් අධිරාජයාගේ පුත්‍රයකු වූ නොමොගන් කුමරා කාරුකෝරම් ප්‍රදේශයේ වාසය කරන බව කායිදුට දැන ගන්නට ලැබිණ. ඒ හැරුණු විට ප්‍රෙස්ටර් ජෝන් රජුගේ මුනුබුරු ජෝර්ජ් කුමරු ද ඔහු සමග වෙසෙන බව

Scanned by CamScanner

ද ඔවුන්ගේ අශ්වාරෝහක හමුදාව බලසම්පන්න බව ද කායිදු හට සැලවිය. කායිදු බලසම්පන්න ලෙස සේනා රැස් කොට ගමනාරම්භ කෙළේ කුබ්ලායි ඛාන් අධිරාජයාගේ පුත්‍රයාත් ප්‍රෙස්ටර් ජෝන් ගේ මුනුබුරාත් සමග සටන් කොට පරදවා ලීමේ අභිප්‍රායෙනි. කායිදු ගේ සේනා ඔවුන් දෙදෙනා වෙසෙන ප්‍රදේශයට ළඟා විය.

කයිදුගේ සේනා සටන් පිණිස ළඟා වූ බව දැනගත් කුමාරවරුන් දෙදෙන එඩිතර ලෙස සටනට සූදානම් වූහ. ඔවුන්ගේ අශ්වාරෝහක හමුදාව පමණක් හැට දහසකි. කයිදුගේ සේනා වාඩි ලා ගත් තැනිතලාවට සැතපුමක් දුරින් කුමාරවරුන්ගේ සේනා ද කඳවුරු ගසා නතර විය. මහා ගංගා දෙකක් ගම්බිම් යටකර ගලන්නා සේ පැමිණ කඳවුරු ගසා ගත් දෙ සේනාවෝ දින තුනක් තිස්සේ සටනට අවශ්‍ය කටයුතු සංවිධානය කළහ. දුනු, හී, කඩු, යකඩ මුගුරු, පලිහ ආදි විවිධ අවි ආයුධ රැගත් දෙසේනා එක ලෙස ම යුද්ධය සඳහා උද්‍යෝගීමත්ව සූදානම් විණ. දෙ සේනාවන් හමුදා සේනාංක හයකට බෙදා එක් සේනාංකයකට අශ්වාරෝහකයන් දස දහසක් ද එක් හමුදාපතියකු ද වශයෙන් යොදන ලදී. තෙවන දිනයෙහි "නකාර්" නමැති යුදබෙර හඬ නැගෙන තුරු ඔවුන් නොඉවසිල්ලෙන් බලා සිටියේ සටන් ඇරඹීමේ අටියෙනි. දෙපසෙහිම යුද්ධ තූර්‍ය නාද භේරි නාද සමගම යුද්ධ ඝෝෂාව හාත්පස පැතිරිණ. මේ ඝෝෂාවෙන් අහස පොළොව හාත්පස ගිගුම් දුනි. ටාටර්වරුන්ගේ යුද්ධ භේරි නාදය හා තූර්යවාදන ශබ්ද මවිතය දනවයි. "නකාර්" නමැති නළාවෙන් යුද්ධාරම්භය සඳහා සංඥා කැරේ. එතෙක් යුද්ධාරම්භ කරන්නේ නැත. එය ටාටර්වරුන්ගේ යුද්ධ නීතියකි. නකාර් නළා හඬ ඇසුණු වහාම යුද්ධය පටන් ගැනුණි. එතෙක් තත් දෙකකින් සමන්විත ඔවුන්ගේ වීණාවෙහි ශබ්දය එතෙක් නිරන්තරව නැගුණි. "නකාර්" නළා නාදයත් සමග දුනුදිය ඇද අනතුරුව මහා වර්ෂාවක් ලෙසින් ඊතල මුදා හැරේ. ඒ හා සමග යථෝක්ත ශර ප්‍රහාර වැදීමෙන් තුවාල වූවන්ගේ මර ළතෝනිය හාත්පස දෝංකාර දෙන්නට වන. මේ බිහිසුණු ශෝක ජනක ශබ්දයෙන් සමස්ත ප්‍රදේශයම ගිගුම් දුනි. දෙපිරිසම දරුණු ලෙස සතුරත් ලෙස ඇණකොටා ගත්තේ ශර ප්‍රහාර අවසන් වීමත් සමග ය. දෙපිරිස ම මැරී වැටෙනතුරු සටන් කළහ. ඊතල අවසන් වූ පසු යකඩ පොලු කඩු ආදියෙන් එකිනෙකා කපා කොට තලා මරාගත්හ. කයිදු හැම අතින්ම තම බලසේනා දිරිගන්වමින් සටන සාර්ථක කැර ගැන්මට කටයුතු කෙළේ ය. එසේ ම අධිරාජයාගේ පුත්‍රයාත්

ප්‍රෙස්ටර් ජෝන් ගේ මුනුබුරාත් අභීතව සටන් පෙරමුණු දිරි ගන්වමින් මෙහෙයවූහ. මේ සටන මෙතෙක් පැවැති අන් සියලු යුද්ධවලට වඩා බිහිසුණු විය. තීරණාත්මක විය. රාත්‍රිය ළඟා වනතුරුම මේ සටන දිගින් දිගටම පැවතිණ. දෙපක්ෂයම බිහිසුණු ලෙස සටන් කළ බැවින් එක් පක්ෂයකට හෝ ජයක් අත්වන බවක් නොපෙනෙනුණි. සමස්ත සංග්‍රාම භූමියම මෘත දේහයන්ගෙන් සහ බිහිසුනු තුවාල ලද භටයන්ගේ සිරුරුවලින් වැසී ගියේ ය. මේ සටන නිසා කොපමණ භාර්‍යාවන් පිරිසක් වැන්දඹු භාවයට පත්වීද? කොපමණ දූ දරු පිරිසක් අනාථ වී ද? සන්ධ්‍යා යාමයෙහි දෙසේනාවෝ ම සටන් නවත්වා කඳවුරු වෙත ගියහ. මේ අතර කුබ්ලායි ඛාන් අධිරාජයා තමන්ට විරුද්ධව ආධාරක සේනා පිටත් කැර එවූ බව සැලවූයෙන් කයිදූ අශ්වයකු පිට නැගී ගොස් සටනට සැරසෙන තම සේනාංක වෙත ගොස් ආපසු හැරී යන ලෙස දන්වා සිටියේ ය. හමුදා පසුබැස යද්දී ප්‍රෙස්ටර් ජෝන් ගේ මුණුබුරුගේ සේනාවන් ඔවුන් පසු පස හඹා ගොස් පහර දීමට පෙළඹුණේ නැත. කයිදූගේ හමුදා ආපසු හැරී ගොස් නතර වූයේ මහා තුර්කියේ සමර්කාන්ඩ් නගරයෙහි ය.

කයිදූ කුබ්ලායි ඛාන්ගේ ප්‍රදේශයන්හි ජනතාවට හිංසා පීඩා පාඩු හානි කරන බැවින් ඔහු කෙරෙහි මහත් ප්‍රකෝපකාරී හැඟීම් උත්සන්න වී තිබිණ. ස්වකීය ඥාතියකු නොවී නම් කයිදූ කාලකණ්ණියකු සේ මරා දමන බවට වරක් කුබ්ලායි ඛාන් අධිරාජයා ප්‍රකාශ කෙළේ ය. ඥාතිත්වය නිසා කයිදූ හෝ ඔහුගේ ප්‍රදේශය හෝ විනාශ නොකරන බවට අධිරාජයා තීන්දු කළ බැවින් කයිදූ ගේ ජීවිතය සුරක්ෂිත විය. මීළඟට මා ප්‍රකාශ කරනුයේ කයිදූගේ දූ කුමරියක පිළිබඳ මවිතය දනවන කතා පුවතකි.

අයියාරුක් නමැති දූ කුමරියට යථෝක්ත නාමය තබා ඇත්තේ ටාටර් භාෂාවෙන් "බබළන සඳමඬල" යන අර්ථාන්විතව ය. කයිදූගේ මේ දූ කුමරිය අසමාන රූප සම්පත්තියෙන් බැබළුණා ය. එසේම ඇයගේ කාය ශක්තිය ද පුදුම සහගත විය. ඇය සමග පොර බැදීමට තරම් ශරීර ශක්තියෙන් යුත් තරුණයකු සමස්ත රාජ්‍යයෙහි ම නොවී ය. ඇයට විවාහ යෝජනා කළ විට ඇය තම පියා වූ කායිදූට කියා සිටියේ තමන් සමග පොරබදා ජයගත හැකි තරුණයකු හමුවුවහොත් ඔහු සමග විවාහ වන බව ය. අනතුරුව ඇයට කැමැති තරුණයකු විවාහ කැර ගැනීමට හැකි වන පරිදි කයිදූ රජතුමා

Scanned by CamScanner

ස්වයංවරයක් පැවැත්වීමට අවසර පත්‍රයක් ලියා දුනි. කයිදූ රජතුමාගේ දියණිය පිළිබඳ කථා ප්‍රවෘත්තිය ලෝකයේ නොයෙක් රටවල පැතිරිණ. බොහෝ රටවල කුමාරවරු ඇය සමග මල්ලවපොර තරගයට එළඹ පැරැදී ගියහ. මේ සඳහා විශේෂ ශාලාවක් පිළියෙළ කොට බොහෝ ජනයා මධ්‍යයෙහි මල්ලව පොර තරග පැවැත්වූ අතර කයිදූ රජ එහි මුලසුන ගෙන දියණිය සමග විදේශයෙන් පැමිණෙන කුමාරවරු සටන් කරන ආකාරය බලා සිටියේ ය. තරුණිය විශේෂ ඇඳුමකින් සැරැසී පොර පිටියට එළඹෙන අතර තරුණයා ද එබඳුම විශේෂ ඇඳුමකින් සැරැසී පැමිණ පොර බදයි. තරුණිය පරාජය වුවහොත් ඇය ඒ තරුණයා සමග සරණ යයි. තරුණයා පරාජය වුවහොත් ඇයට අශ්වයන් සියයක් වන්දියක් වශයෙන් ලබා දිය යුතු වේ. මේ ආකාරයෙන් රජුගේ දියණිය අසුන් දහසකට වඩා දිනා ගත්තා ය. කිසිම තරුණයකු ඇය පැරැදවීමට සමත් වූයේ නොවේ. ඇය ඉතා ශක්තිමත් ය. අත් පා සහ ශරීරය පිරිපුන්ව වැඩී තිබිණ. ඇයගේ පෙනුම යෝධයකු වැනි ය. ක්‍රි. ව. 1280 දී එක්තරා ධනවත් රජකුගේ පුත් කුමරකු සමග සටන් වැදීමට ද ඇයට අවස්ථාවක් ලැබිණ. මේ කුමරා පැමිණියේ අශ්වයන් දහසක් ද සමග විශාල සේනාවක් පිරිවරාගෙන ය. කුමරිය සමග මල්ලවපොර සටනට සූදානමෙන් තමන් පැමිණි බව රජුට කී ඔහු කායිදූ රජු විසින් පිළිගන්නා ලද්දේ ඉමහත් හරසරිනි. කායිදූ රජු ඒ කුමරුව තම දියණියට පාවාදීමට කැමැති විය. සටනේ දී වුවමනාවෙන් පරාජය වන ලෙස කයිදූ රජු තම දියණියට කීවේ කුමරාගේ ධනේශ්වර භාවයට සලකා බලමිනි. එහෙත් දියණිය එයට කැමැත්තක් දැක්වූයේ නොවේ. කිසිම යස ඉසුරක් උදෙසා පරාජය නොවන බව ඇය සිය පියරජතුමාට කියා සිටියා ය.

අනතුරුව මල්ලව පොර පිටිය සූදානම් කැරිණි. ප්‍රභූවරු ඔවුන්ගේ මල්ලව පොර තරගය නැරැඹීම සඳහා සූදානම් ව අසුන් ගෙන සිටියහ. රූපශ්‍රීයෙන් ද කාය ශක්තියෙන් ද අනූන වූ කුමරා පොර පිටියට පැමිණ තරගයෙන් තමන් පරාජය වුවහොත් අසුන් දහසක් වන්දිය වශයෙන් ගෙවන බවට පොරොන්දු විය. සියලු දෙනා බලාපොරොත්තුව සිටියේ කුමරිය පරාජය කොට තරුණ කුමරා ජයගන්නා බවත් කුමරිය ඔහුගේ අතගන්නා අවස්ථාව එළඹෙන තුරු ය. එහෙත් දෙදෙනා අතර තරගය කෙළවර වූයේ කුමරා ඔසවා බිම හෙළීමෙනි. කුමරාගේ පරාජය පිළිබඳව එහි රැස්ව සිට සියලු දෙනා ශෝක වූහ. පසු කාලයේ දී කයිදූ රජු මේ දූ

Scanned by CamScanner

කුමරිය ද ගෙන සටන් රාශියකට ම ගොස් ජයග්‍රහණය කෙළේ ය. වරක් ඇය සතුරන්ගේ අසරුවකු ඩැහැගෙන අවුත් තම කඳවුර තුළට හෙලුවා ය.

මීළඟට ප්‍රකාශ කරන්නේ කයිදු හා අර්ගන් අතර සිදුවූ සටනක් පිළිබඳවයි. "අබකා" නමැති අධිපතියෙක් කයිදු ගේ රාජ්‍යයට නැගෙනහිරින් පිහිටි පළාත් රාශියක් පාලනය කරමින් සිටියේ ය. මේ ප්‍රදේශය ඇලෙක්සැන්ඩර් ගේ පොතේ කියා ඇත්තේ "වියළි ගස" පිහිටි දේශය යනුවෙනි. මේ ප්‍රදේශයට නිතර නිතර කයිදු රජුගෙන් අලාභ හානි සිදුවිණ. මේ අතවර දරා ගැනීමට නොහැකි වූ අබකා 'අර්ගන්' නමැති තම පුත් කුමරා යටතේ විශේෂ සේනාවක් සංවිධානය කොට කයිදුගේ අතවර වැළැක්වීමට එහි යවා රැඳවීය. කයිදු තම සහෝදරයා වූ බරක් යටතේ සේනාවක් ඔවුනට මුහුණ දීම සඳහා පිටත් කැර හැරියේ ය. අර්ගන්ගේ සේනා අයෝන් ගඟ බඩට පැමිණ එහි කඳවුරු බැඳ සිටියහ. බරක් නමැති බලවතා කයිදුගේ නියෝගය පරිදි අරගන්ගේ සේනාවන්ට එරෙහිව සටන් ආරම්භ කෙළේ ය. ඔවුන් ද අයෝන් ගඟබඩට පැමිණ කඳවුරු බැඳ සටන් බිමට එළැඹුණු අතර බිහිසුණු සටනක් සිදුවිණ. තෙදිනකට පමණ ඇරැඹුණු සටනින් බරක් ගේ සේනා පරාජයට පත්විණි. අයොන් ගඟ බඩ දී පළා යන බරක් සේනාවන්ට අර්ගන්ගේ භටයෝ එළව එළවා පහර දුන්හ.

අර්ගන් මේ සටනින් ජයගත් නොබෝ දිනෙකින්ම පියරජු මිය ගිය බව දැනගන්නට ලැබිණ. අර්ගන් පියාගේ මරණය ඇසීමෙන් බලවත් ශෝකයට පත් විය මාලිගය වෙත ගමන් කිරීමට යා යුතු දුර ප්‍රමාණය සැතපුම් හතළිහකි. අබකා රජුට අකොමත් සොල්ඩන් නමැති සහෝදරයෙක් සිටියේ ය. හෙතෙම මහමත් ආගමිකයෙකි. හෙතෙම මියගිය අබකා ගේ රාජ්‍යය අල්ලා ගැනීමට සේනා මෙහෙයවා තම අභිප්‍රාය ඉටුකැර ගති. මාලිගයේ අති විශාල ධනස්කන්ධයක් රැස් කැර තිබිණි. අකොමත් මේ ධනස්කන්ධය අධිපතියන් හා ප්‍රභු රදලවරුන් වෙත බෙදා දී ඔවුන්ගේ පක්ෂපාතිත්ව දිනාගති. ඔව්හු අකොමත් තම අධිපතියා ලෙස පිළිගත්හ. අකොමත් සොල්ඩන්ගේ ගුණ යහපත් කමත් රජකු ලෙස ඔහුගේ වටිනාකම ප්‍රකාශ කළෝ ය. පොදු ජනයා අතර ඔහුගේ කීර්තිය පතළවීමට පසුබිම සකස් කළහ. එහෙත් මෙලෙසින් ඔහුට වැඩි කළක් රජය ගෙනයෑමට ඉඩකඩ සැලසුණේ නොවේ. අර්ගන් කුමරු බලවත් ලෙස සේනා සංවිධානය කොටගෙන පැමිණෙන බව ඔහුට ආරංචි

Scanned by CamScanner

විය. එහෙත් අකොමත් එයට මුහුණ දීම සඳහා කිසිදු චකිතයක් නොමැතිව ප්‍රභුවරුන් ද රදලවරුන් ද සමග සේනා සංවිධානය කොට සැරසුණි. සටන් කොට අර්ගන් අල්ලා මරා දැමීම සඳහා කටයුතු සැලසුම් කෙළේ ය.

අකොමත් හැට දහසක අශ්වාරෝහක හමුදාවක් පිරිවරා සටන් බිමට පිටත් වී ගියේ ය. දවස් දහයක ගමන් දුර ප්‍රමාණයෙන් දින පහක් දුරක සතුරු සේනාංක ගමන් කෙට රැඳී සිටින බව ද සැට දහසක අශ්වාරෝහක සේනාංකයක් එයට අයත් බව ද දැනගන්ට ලැබිණ. අකොමත් තැනිතලා භූමි ප්‍රදේශයක සිය සේනාංක සමග නතර වූයේ ය. යුද්ධය සඳහා එය ඉතා සුදුසු ප්‍රදේශයක් බව ද හැඟුණු බැවිනි. යුද්ධයට ප්‍රථම අකොමත් සියලු දෙනා අමතා ප්‍රකාශයක් කෙළේ ය.

"රදළවරුනි, ප්‍රභුවරුනි, සේනාපතිවරුනි, යුද භටයෙනි, මගේ සහෝදර මියගිය අබකාට අයත් රාජ්‍යයට සහ ඔහුගේ දේපළට හිමිකරුවන්නේ මා බව ඔබ දන්නෙහි ය. මා ද ඔහුගේ පියාගේ පුත්‍රයකු වන බැවින් මට රාජ්‍ය උරුමය ඇත. ඉහත දී විවිධ ප්‍රදේශ අල්ලා ගැනීමේ සටන්වලට මම ද සහභාගි වූයෙමි. අරගන් මගේ සහෝදරයාගේ පුත්‍රයා වුව ද පියාගේ උරුමය පුතාට ලැබිය යුතුය යන කීම මා පිළිගන්නේ නැත. විශාල ප්‍රදේශයක හිමිකරු වුව ද ඒ සියල්ලම උරුම කරු මා බව සත්‍යයකි. ඔහු ජීවත්ව සිටිය දීත් මා ඒජනයට හිමිකරුව සිටි බව ද කිව යුතු වේ. එහෙත් සටන් නොකොට ඒ කාලයේ මා නිහඬව සිටියේ මගේ පරිත්‍යාගශීලී හැඟීම නිසා ය. එහෙත් දැන් අර්ගන්ට විරුද්ධව සටන් කළ යුතු අවස්ථාව එළඹ තිබේ. මගේ එකම අපේක්ෂාව වන්නේ ජයග්‍රහණය සහ ගෞරවයයි. අප සතු ප්‍රදේශවලින් ලැබන ධනයත් ලාභ ප්‍රයෝජනවත් වස්තු සම්පත් ආදියත් තමුන්නාන්සේලාට අයත් ය. ඥානවන්ත සාධාරණ යුක්තිගරුක රටවැසියන් වන ඔබගේ උරුමය රැක ගැනීමට ද සියල්ලන්ගේ ම යහපත උදෙසා ද කටයුතු කිරීමට ඔබගේ සහයෝගය අපේක්ෂා කරමි."

අකොමත් ගේ මේ ප්‍රකාශය ඇසූ සියලු දෙනා එයට සහයෝගය දීමට එකඟ වූහ. ප්‍රාණය පවත්නා තුරු අකොමත් හැර නොයන බවට ද රජු ආරක්ෂා කිරීමට ද අකොමත් පණ පිටින් අල්ලාගෙන භාරදෙන තුරු සටන් කරන බවට ද ඔව්හු ප්‍රතිඥා දුන්හ.

Scanned by CamScanner

චරපුරුෂයන් මාර්ගයෙන් අකොමත්ගේ කටයුතු පිළිබඳව අර්ගන්ට දැනගන්නට ලැබිණි. අකොමත්ගේ යුද්ධ ශක්තිය පිළිබඳව දැනගත් අර්ගන් ගේ සිත සසල වුව ද ඔහු බිය සැක බැහැර කොට රදලයන් අධිපතියන් ප්‍රභුවරුන් ඇතුළු බුද්ධිමතුන් සුදුසු ස්ථානයකට කැඳවා ඔවුන් ධෛර්‍යමත් කරනු සඳහා දේශනයක් පැවැත් විය.

"මගේ දයාබර මිත්‍රවරුනි, සහෝදරවරුනි, මගේ පියා රට වැසියාට කොපමණ කරුණාවන්ත ලෙස කටයුතු කෙළේ දැයි ඔබ දන්නෙහි ය. එතුමා සිටියදී ඔබට සැලකුවේ සහෝදරයන්ට මෙනි. තම දරුවන්ට මෙනි. එතුමා ඔබහ සමග කොපමණ සටන්වලට සහභාගි වී ද? වෙනත් රටවල් යටත් කැර ගැනීමට එතුමාට ඔබ හැම සහභාගි වූයෙහි ය. ඒ රජතුමාගේ ආදරණීය අතිජාත පුත්‍රයා මා බව ඔබ හැම දෙනාට ම රහසක් නොවේ. මම ද ඔබගේ ශරීරයට බැඳී සිටින අතර ආදරය භක්තිය දක්වමි. හෙයින් නීතිගරුක නොව අධර්මයෙන් අයුක්තියෙන් දේපළ කොල්ල කාගැනීමට පැමිණි අකොමත්ට විරුද්ධ කරන සටනේ දී මම ඔබගේ ආධාර උපකාර අපේක්ෂා කරමි. ඔහු අපගේ ආගමට අයත් කෙනෙකු නොවේ. හෙතෙම මහමත් ආගම වැළඳගෙන කටයුතු කරන බැවින් ටාටර්ව රුන්ගේ අධිපතියා වීමට සුදුසු නොවේ. මේ සියලු කරුණු සලකා බලා ධෛර්‍ය සම්පන්න ලෙස මේ අසාධාරණය වැළැක්වීමට කටයුතු කළ යුතු ය. වීර වික්‍රමාන්විත ලෙස සටන් කර ජයගෙන මුස්ලිම් භක්තිකයකුගේ ආධිපත්‍යයෙන් මේ රාජ්‍යය මුදාගත යුතු බව තමුන්නාන්සේලා තරයේ සිතට ගත යුතු ය. යුක්තිය අප සතු බැවින් අයුක්තිය පිටුදැකීමට වග බලා ගැනිමට කටයුතු කරනු මැනව. සියලු දෙනා තම යුතු කම ඉටුකිරීමට වගබලා ගන්නා ලෙස ඉල්ලා සිටිමි. අපගේ පාර්ශ්වයෙහි යුක්තිය පවතී. අයුක්තිය වෙනුවෙන් සටන් කරන සතුරන් පරාජය කිරීම සඳහා අධිෂ්ඨානයෙන් යුතුව සටන් කළ යුතු වේ. වැඩිදුර කථා කළ යුතු නැත. සියලු දෙනා ස්වකීය යුතුකම නිසි අයුරින් ඉටු කළ යුතු ය."

අර්ගන් ගේ ප්‍රකාශය අසා සිටි රදලවරු මරණය තෙක් සටන් කරන බවට ප්‍රතිඥා දුන්හ. සියලු දෙනා නිශ්ශබ්දව මොහොතක් සිටියදී එක්තරා රදල අධිපතියෙක් නැගී සිට

"....කරුණාබර අර්ගන් තුමනි, ඔබ අපට පැවැසූ සියලු කරුණු සත්‍ය බව පිළිගනිමු. මෙහි රැස්වී සිටින සියලු දෙනා ඔබ වෙනුවෙන්

Scanned by CamScanner

සටන් කිරීමට සැදී පැහැදී සිටිති. අප ජීවතුන් අතර සිටින තුරු ඔබට පරාජයක් අත්වීමට ඉඩ තබන්නේ නැත. යම් හෙයකින් සතුරාට ජය අත්වන ලකණු පහළ වුවහොත් අපි මේ රණ පිටියේම මැරෙන්නෙමු. සතුරාට ජය අත්වීමට ඉඩක් තබන්නේ නැත. අපගේ විශ්වාසය සතුරා පැරදවීට හැකි බව ය. සතුරාගේ ක්‍රියා කලාපය අයුක්ති සහගත ය. වහා යුද්ධය ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිමු. නිර්භීත ලෙස සටන් කරන ලෙසත් අපගේ වගකීම නොපිරිහෙළා ඉටුකරන ලෙසත් අපි සියලු හමුදාවන් ගෙන් ඉල්ලා සිටිමු. මා බැගෑපත් ලෙස ඉල්ලා සිටිනුයේ සතුරාට එරෙහිව නිර්භීත ලෙස සටන් කරන හැටියටයි. එසේ වුවහොත් අපගේ නිර්භීත කමත් සටන්කාමිත්වයත් පිළිබඳව ලෝකයා ප්‍රශංසා මුඛයෙන් කතා කරනු ඇත."

මේ ප්‍රකාශය අවසානයෙහි සියලු දෙනා සටන් කිරීම හා ජයග්‍රහණය පිළිබඳව එකහඬින් අනුමැතිය ප්‍රකාශ කළෝ ය.

අනතුරුව පසු දින උදෑසන සටන් ආරම්භ කිරීමේ අභිප්‍රායෙන් පෙරමුණ බලා ගමන් ඇරැඹූහ. අකොමත් ගේ සේනා කඳවුරු බැඳ සිටින ස්ථානයට සැතපුම් දහයක් පමණ දුරින් ඉතා යෝග්‍ය තැනිතලා භූමි ප්‍රදේශයක වාඩි ලා ගත්තෝ ය. අනතුරුව අර්ගන් තමනට සමීප විශ්වාසයන්ත දූතයන් දෙදෙනෙකු අකොමත් -බාප්පා- වෙත යැවී ය.

වයෝවෘද්ධ වූ ද, ගෞරවණීය වු ද මේ දූතයන් දෙදෙන අකොමත්ගේ කඳවුරට ගොස් ඔහු රදල අධිපතියන් සමග සාකච්ඡා කරන ස්ථානයට ගියහ. අකොමත් මේ දූතයන් දෙදෙනා හොඳින් දැන හඳුනන්නේ ය. එබැවින් ඔවුන් පිළිගත්තේ ගෞරවනීය සුහද මිත්‍රශීලී උණුසම් හැඟීමෙනි. තමන් ඉදිරිපිට අකොමත් ඔවුනට අසුන් පැනවිය. මදක් විවේක ගැනීමෙන් පසු දූතයන් දෙදෙනාගෙන් එකෙක් නැගී සිට තම ප්‍රකාශය ඉදිරිපත් කෙළේ ය.

"අකොමත් උතුමාණෙනි, ඔබගේ සහෝදරයාගේ පුත්‍රයා වූ අර්ගන්ගේ රාජ්‍යය අත්පත් කැර ගැනීමෙන් පසු ඔබට එරෙහිව සේනා සංවිධානය කොට ගෙන සටනට පැමිණීම ගැන මවිත වී සිටී. මෙය අකටයුත්තකි. ඔබගේ සහෝදරයාගේ පුත්‍රයාගේ උරුමය ලෙස පවත්නා රාජ්‍යය නැවත ඔහුට පවරා දෙන ලෙස ඉල්ලා සිටිමු. ඒ සඳහා ආයාචනා කිරීම සඳහා අර්ගන් කුමරා දූතයන් ලෙස අප ඔබ වෙතට පිටත් කැර එවී ය. යුක්තිගරුක හා සාධාරණ

Scanned by CamScanner

ලෙස ඒ රාජ්‍යය නැවත ඔහුට පවරා දෙන්නේ නම් ඔබ දෙදෙනා අතර යුද්ධයක් සිදු නොවේ. ඔහුගේ රාජ්‍යය නැවත ඔහුට පවරා දෙන ලෙස දන්වන හැටියට අප ඔබ වෙත එවී ය. ඔහු ඒ සඳහා ආයාචනා කැර සිටී. එවිට සටනක් කිරීමට සිදු නොවේ. එසේ කළහොත් ඔබට හිමි ගෞරවය නිසි ලෙස පිරිනැමීමට ද අර්ගන් සූදානමෙන් සිටී. ඔහුගේ රාජ්‍යයෙහි අරගන්ට යටත් එකම අධිපතියා සහ එකම ස්වාමියා ඔබ වන්නෙහි ය. ඔබගේ ඥාති පුත්‍රයා වූ අර්ගන් මේ පණිවිඩය ඔබට භාර දෙන්නට කීවේ ය."

එයට පිළිතුරු වශයෙන් අකොමත් මෙසේ පැවැසීය.

දූත මෙහෙවර සඳහා පැමිණි මහත්වරුනි. ඔබගේ ඥාති පුත්‍රයාගේ කියමන මා පිළිගන්නේ නැත. ඔහුට අයත් රාජ්‍යයක් මෙහි නොමැත. මේ රාජ්‍යය මා ලබාගත්තේ ඔහුගේ පියා මෙන්ම යුද්ධ කිරීමෙනි. ඔහු කැමැති වන්නේ නම් විශාල ප්‍රදේශයක් ද අධිපති තනතුරක් ද පවරා දීමට කැමැත්තෙමි. මගේ පුත්‍රයකු සේ මට යටත්ව අර්ගන් සිටිය යුතු ය. එවැනි නිගමනයකට කැමැති නොවෙන්නේ නම් මගේ මුළු ශක්තිය බලය යොදා සටන් කැර මරා දමන්නෙමි. ඒ හැර වෙනත් පිළිතුරක් මගෙන් බලාපොරෙත්තු නොවිය යුතු ය."

මේ ප්‍රකාශය ඇසූ දූතයෝ "ඔබගෙන් අපට ලැබෙන පිළිතුර මෙයදැයි" විමසූහ.

ඔව්! මෙයට වැඩි පිළිතුරක් නොමැත. අකොමත් ගේ ප්‍රකාශය ඇසූ දූතයෝ වේගයෙන් ආපසු ගමන් ඇරඹූහ. අනතුරුව ඔවුන් අර්ගන් රැඳී සිටි කඳවුර තුළට ගොස් සියලු තොරතුරු සැල කෙළේ බලාපොරොත්තු කඩවූ ස්වරයෙනි. සිය බාප්පාගේ පිළිතුරෙන් කම්පාවට පත් වූ අර්ගන් සිය පිරිවර අමතා කියා සිටියේ වහා සටන් ඇරැඹීමට සූදානම් විය යුතු බව ය.

මගේ බාප්පා කළ අපරාධයේ ස්වභාවය අනුව ඔහු සමග සටන් නොකර ජීවත්වීමේ තේරුමක් නැත. මා මිය ගිය ද සටන් කළ යුතු ය. එහෙයින් ආගම භක්තියක් නොමැති මේ ද්‍රෝහියා මරා දැමීම අත්‍යවශ්‍ය ය. හෙට උදෑසනම සටන් කළ යුතු බවත් ද්‍රෝහියා මරා දැමිය යුතු බවත් ස්ථිර අධිෂ්ඨානයෙන් කියා සිටියේ ය. සිය ප්‍රභුවරුන්ට හා රදල වරුන්ට මේ කරුණු දන්වා සිටි අර්ගන් රාත්‍රිය මුළුල්ලේ සටන් සංවිධානය කෙළේ පසුවදා උදෑසනින් ම යුද්ධ ආරම්භ කිරීමේ චේතනාවෙනි. නිර්භීත ලෙස සටන් කැර සතුරා

Scanned by CamScanner

පරාජය කරන ලෙස අර්ගන් සිය සේනාවන්ගෙන් ඉල්ලා සිටියේ ය.

අර්ගන් පසු දින උදෑසන සිය සේනා අමතා ඔවුන් දිරි ගැන්වීම සඳහා වේගවත් ප්‍රකාශයක් කොට අනතුරුව සටනට අණ දුන්නේ ය. එලෙසින්ම අකොමත් ද සිය සේනා දිරිගන්වා සටනට සේනා පෙළඹවී ය. ඔවුනොවුන් මුණ ගැසුණු සේනා සටන් ඇරැඹූහ. ඊතල වර්ෂාවක් අහසින් ඇද හැලෙන ආකාරයක් ඈතට පෙනුණි. තුවාල ලද හටයෝ රණබිම ඇද වැටී මර ළතෝනි දුන්හ. අශ්වයෝ ද මරහඬ තළමින් ඇද වැටෙති. ඇද වැටෙන සෙබලුන් මත අශ්වයෝ ද ඇද වැටුණහ. අශ්වයන්ගේ සිරුරු මත සෙබළු ද ඇද වැටුණහ. මරහඬ විලාප හඬ මරහඬ රණබෙර කාහල හඬ එකිනෙකට මුසුවී හාත්පස බිහිසුණු ඝෝෂාවක් පැතිර ගියේ ය. මරවු! කොටවු!!! තලවු!!! යනාදී වහසිබස් කියමින් නැගූ හඬ රණ දෙරණ දසත පැතිරිණි. අකුණු සෙනහඬ පරදන හඬින් හාත්පස ගිගුම් ගත් අතර ශර වර්ෂාව අවසන් වූ පසු දෙපිරිස කඩු පොලු යමුගුරු ආදිය ගෙන සටන් කළෝ ය. අවසානයේ දී අරගන් ද සටන් බිමෙහි නිර්භීත හා දක්ෂ ලෙස සටන් කළ ද ජයග්‍රහණය හිමිවූයේ නැත. අර්ගන්ගේ සේනා පසු බැස යද්දී අකොමත් ගේ සේනා ඔවුන් ලුහුබැඳ පහර දුන්හ. අවසානයේ දී අර්ගන් ජීවග්‍රාහයෙන් අල්ලා ගති. අනතුරුව ජයඝෝෂා නැගූ අකොමත්ගේ සේනා අර්ගන් සිරකැර තැබූයේ ආරක්ෂා සහිතව ය. අනතුරුව අකොමත් සිය සුන්දරියන් පිරිවරා ජයපානෝත්සවය සඳහා පිටත් විණ. ඒ අතර අර්ගන් හට පළා යෑමට ඉඩක් නොසැලසෙන පරිදි ඉතා හොඳින් රැකබලා ගන්නා ලෙස උසස් හමුදා නිලධාරියකුට වගකීම පවරා දුනි. විඩාපත් හමුදා සේනාංක සමග සේනාධිපතිනට රජවාසල කරා පැමිණෙන ලෙසට ද අණ දුන්නේ ය.

මේ අතර එක්තරා ටාටර් රදල අධිපතියෙක් අර්ගන්ට සිදු වූ ඉරණම පිළිබඳව කල්පනා කෙට කෙසේ නමුදු සිරභාරයෙන් නිදහස් කැර ගත යුතු යයි සිතී ය. හේ වයෝවෘධ ප්‍රභූවරයෙකි තවත් කිහිප දෙනෙකුන් සමග සාකච්ඡා කොට "බොගා" නමැති බලවතකුට මේ කාර්යය පැවැරීය. එල්සිදයි, තෙගන්, තෙගනා, තගා, තියර්, ඔලතායි හා සමගාර් නමැති පිරිස සමග "බොගා" අරගන් ගේ සිරමැදිරිය වෙතට ගියේ ය. යුද්ධයේ දී සිදුවූ අසාධාරණය ගැන සිය බලවත් කණගාටුව ප්‍රකාශ කළ බොගා පළමුවෙන්ම අර්ගන්ට එරෙහිව කටයුතු කිරීම ගැන සමාව අයැද සිටියේ ය.

තමන් විසින් කරන ලද්දේ වරදක් බවත් ඒ වරද නිවරද කිරීම සඳහා අර්ගත් නිදහස් කැර ගැන්මට පැමිණි බවත් කියා සිටියේ ය.

එහෙත් අර්ගත් ඒ කථාවට ඇහුම්කන් දුන්නේ නැත. අර්ගත් සිතුවේ බොගා චාටු බස් දොඩා තමන් රවටා මරණයට පත් කිරීමට උපායක් යොදන බවයි.

'උතුමාණෙනි, ඔබ අකොමත්ට පක්ෂව කටයුතු කොට මා සිරකරුවෙකු කළෙහි ය. එපමණක් නොව මා සරදමට සමච්චලයට ලක්කිරීම පාපයකි. ඔබගේ නීත්‍යානුකූල රජතුමා වූ මා සිරකාරයකු කිරීමේ අපරාධය නිසා සතුටට පත්ව මෙතැනින් ඉවත් වී යනු මැනව'යි අර්ගත් බොගාට කියා සිටියේ ය.

එහෙත් බොගා කියා සිටියේ සමච්චල් කිරීමට හෝ සරදම් කිරීමට නොව විශ්වාසවත් හැඟීමෙන් යුතුව මෙහි පැමිණි බවයි. කෙසේ හෝ අර්ගත් සිරභාරයෙන් මුදා රාජ්‍යය ලබා දෙන බව බොගා දෙවියන් නාමයෙන් දිවුරා කියා සිටියේ ය. අනතුරුව සියලු රදල අධිපතියෝ කුමරා ඉදිරියෙහි දිවුරුම් දී ඔහුට පක්ෂපාත වන බව කියා සිටියහ. අනතුරුව බොගා ඇතුළු පිරිසගේ වදන් විශ්වාස කළ අර්ගත් තමාට කළ අතවරය ගැන සමාව දුන්නේ ය. යම් හෙයකින් තමන්ට නිදහස ලබා දී රජකමට පත් කළහොත් තමාගේ පියා වූ අබකා රදල අධිපතියනට සැලකූ ආකාරයෙන්ම උසස් ගරු සැලකිලි දක්වන බව කියා සිටියේ ය. මේ අයුරින් ප්‍රතිඥා දීමෙන් පසු දෙපිරිස අතර ගිවිසුමක් ඇති කැර ගන්නා ලදී. අනතුරුව අර්ගත් සිර මැදිරියෙන් නිදහස් කැර ගැනිණ. ස්වකීය රජු ලෙස ගෞරවාචාර පවත්වා අර්ගත් පිළිගත්හ. තමන් සිරභාරයේ තබාගත් යුද්ධ සේනාපතියා දුනු හී පහර දී මරා දමන ලෙස අර්ගත් ඔවුනට විධාන කෙළේ ය. සල්ටන් නමැති සේනාපතියා මරා දැමීමෙන් පසු අර්ගත් යළිත් රජකමට පත්වූයේ ය.

අර්ගත් රජකමට පත්වීමෙන් ඉක්බිති රදලයන් හා සේනා පිරිවරා අකොමත් වසන රජ මාලිගය බලා පිටත් විය. අකොමත් රාජශ්‍රී වළඳමින් මාලිගයේ සතුටින් සිටින අවස්ථාවේ එක්තරා පණිවිඩකාරයෙක් ගොස් අර්ගත් රජකමට පත්වී සේනා පිරිවරා පැමිණෙන බව දැන්වීය. "රදළවරුන් අර්ගත් රජකමට පත්කැර ගෙන ඇත. ඔබගේ මිත්‍ර සල්ටන් සේනාපතියා ද මරා දමා හමාර ය. ඊළඟට ඔවුන් පැමිණෙනුයේ ඔබ මරා දැමීමට ය. එහෙයින් ඉදිරි

Scanned by CamScanner

කටයුතු පිළිබඳව වහා සාකච්ඡා කොට තීරණයක් ගැනීම මැනව" යි සේවකයා වැඩි දුරටත් අකොමත්ට කියා සිටියේ ය. මේ ආරංචිය ඇසූ අකොමත් භීතියට පත්ව කළ යුතු දැ කුමක් දැයි වටහා ගත නොහී ස්වකීය පක්ෂපාත අනුගාමිකයන් සමග අවි ආයුධ ආදියෙන් සන්නද්ධව පළා යන්නට තීරණය කෙළේ ය. කිසිවකුටත් නොදන්වා රජවාසලින් නික්මුණු අකොමත් කල්පනා කෙළේ බැබිලෝනියාවේ සල්ටන් වෙත ගොස් ආරක්ෂාව සලසා ගැනීමට ය. අකොමත් දින හයක් මුළුල්ලේ ගමන් කොට ඉතා දුෂ්කර ගිරි දුර්ගයක අතරමං විය. ඒ ඔබ්බෙහි සිටි අර්ගන්ගේ සෙබළු මේ පළායන්නේ අකොමත් බව දැනගත්හ. ඔව්හු අකොමත් අල්ලාගත්හ. අල්ලස් වශයෙන් විශාල මුදලක් දී අකොමත් නිදහස සඳහා ආයාචනා කළ ද එයින් පලක් නොවිණ. එහෙත් මුරපලෙහි සිටි ප්‍රධානියා කොපමණ වස්තුව ලබා දුන්නත් අකොමත් මුදා නොහරින බව කියා සිටියේ ය. අනතුරුව අකොමත් මුරකාවල් යොදා අර්ගන් වෙතට ගෙනවුත් ඉදිරිපත් කරන ලදී.

අර්ගන් සිහසුනට පත්වී අකොමත් අල්ලා රාජ සභාවට කැඳවා ගෙන ඒම ගැන මහත් සතුටට පත්විණි. අකොමත් රහසිගතව පැන යෑම නිසා ඇති වූ කෝපය සංසිඳී ගියේ ය. වහාම යුධ හමුදාව රැස් කළ අර්ගන් එක්තරා සෙබළකු අමතා අකොමත් මරා දමන ලෙස නියෝග කෙළේ කිසිවකුගේ කැමැත්තක් හෝ උපදේශයක් නොවිමසමිනි. එසේම අකොමත්ගේ මෘත දේහය කිසිවකුට නොපෙනෙන ස්ථානයකට විසිකැර දමන ලෙසට ද විධාන කෙළේ ය. ඒ සියල්ල එලෙසින්ම සිදුකැරිණ. අර්ගන්ගේ හා ඔහුගේ සුළු පියා වන අකොමත්ගේ සටන හා වෛරය මෙතැනින් සදහටම නිමා විය.

අනතුරුව අර්ගන් රජ මාලිගය ද පාලන බලය ද අත්පත් කැර ගති. අනතුරුව සියලු රදලවරු ද ප්‍රභූවරු ද අධිපතිවරු ද ඔහු වෙත පැමිණ ස්වකීය පක්ෂපාතිත්වය ප්‍රකාශ කොට රාජ සේවයෙහි යෙදෙන බවට ප්‍රතිඥා දුන්හ. අනතුරුව අර්ගන් සිය පුත්‍රයා වූ කසන් කුමරා තිස් දහසක බල ඇණියක අශ්වාරෝහකයන් සමග ආබර් සෙක්කෝ ප්‍රදේශයට පිටත් කැර යැවූයේ එහි පාලන බලය පවරා දෙමිනි. ක්‍රි. ව. 1286 දි අර්ගන් රාජ්‍ය පද ප්‍රාප්ත වූයේ ය. අකොමත් රාජ්‍යය පාලනය කෙළේ වසර දෙකක් පමණි. පසුව අර්ගන් වසර හයක් රට පාලනය කෙළේ ය. අනතුරුව අර්ගන් මෙලොව හැර ගියේ ය. වස දීමෙන් ඔහුගේ මරණය සිදුවී යයි පැවසේ.

Scanned by CamScanner

අර්ගන්ගේ මරණයෙන් පසු කුය්යාතකු රාජ්‍යය අල්ලා ගති. ඔහු අර්ගන්ගේ සුලු පියෙකි. ආබෝ සැක්කො ප්‍රදේශයෙහි අර්ගන්ගේ පුත් කසන් රැඳී සිටි බැවින් කුය්යාතකු හට පහසුවෙන් රාජ්‍යය අල්ලා ගත හැකි විය. එහෙත් කසන් මේ ක්‍රියාව නිසා මහත් කෝපයට පත්විණ. ආබො සැක්කෝ ප්‍රදේශය හැර දමා ඔහුට පැමිණිමට හැකි වී නොතිබිණ. එහෙත් අවස්ථාව ලැබුණු වහාම පැමිණ කුය්යාතකුගෙන් පලිගන්නා බව කසන් කියා සිටියේ ය. කුය්යාතකු සියලු දෙනා තම වසඟයට ගත් අතර අර්ගන්ගේ භාර්යාව ද පාවා ගති. කාන්තාවන් රාශියක් පිරිවරාගෙන කම් සැප රජ සැප විඳිමින් සිටි කුය්යාතකු වසඳීමක් නිසා හදිසියේම මිය ගියේ ය.

කුය්යාතකු ගේ මරණින් අරාජක වූ රාජ්‍යය ඔහුගේ සුළු පියකු වූ බයිදූ විසින් අත්පත් කැරගන්නා ලදී. කසන්ගේ සේනාවන් හැර අන් සියලු දෙනා බයිදූ ස්වකීය රජතුමා ලෙස පිළිගත්හ. මේ බව සැලවූ වහාම කසන් වහා සේනා රැස්කොට බයිදූගෙන් පලිගන්නා බව දක්වා යැවී ය. බයිදූ කසන් තමාට එරෙහිව යුද්ධ කිරීමට පැමිණෙන බව දැන සටන සඳහා සේනා සංවිධානය කෙළේ ය. බයිදූ රාජ්‍යය අත්පත් කැරගත්තේ ක්‍රි. ව. 1294 දී ය. කසන් සේනාවන් සමග පැමිණෙන බව දැනගත් බයිදූ සේනා පිරිවරා දින දහයක් මුළුල්ලේ පෙරමුණට ගමන් ගති. අනතුර කසන් පෙරමග පැමිණෙනු දුටු බයිදූ සටන් ඇරැඹී ය. බිහිසුණු ලෙස සිදු වූ මේ සටනේ දී බයිදූගේ සේනා පරාජය විය. බයිදූ ජීවිතක්ෂයට පත්විය. කසන් රජය අත්පත් කැර ගත්තේ ය. ඒ 1294 දී ය. නැගෙනහිර ටාටර් රාජ්‍යය අබගාගේ පටන් කසන් දක්වා පැවැත ආයේ මේ අයුරිනි.

සයින් බටහිර පිහිටි ටාටර් රජ්‍යයෙහි අධිපතියා විය. හෙතෙම බලසම්පන්න ශ්‍රේෂ්ඨ පාලකයෙකි. රුසියාව, කොමානියාව, අලනියාව, ලක්දේශය, මෙන්ගියර්, ෂික්, ගුඩියා, ගෂාරියා යන මේ සියලු දේශයන් සයින් රජු විසින් යටත් කරන ලදී. සයින් රජු මේ ප්‍රදේශයේ පාලනය සියතට ගැනීමට පෙර පාලනයේ භාරකරුවන් වූයේ කෙමානියන් ය. එහෙත් ඔවුන් කටයුතු කළේ එක් රජයක් යටතේ නොවේ. බෙදී වෙන් වී සිටි බැවින් මේ රටවල් ඔවුනට අහිමි වී ගියේ ය. සයින්ගේ ආක්‍රමණයෙන් පසු මෙහි ජනයා සී සී කඩ පළා ගියහ. එසේ පළා නොගොස් රැඳුණු ජනයා සයින්ගේ දාසයන් ලෙස ගම්බිම් වල කටයුතු කිරීමට පටන් ගත්හ. සයින්ගේ

Scanned by CamScanner

මරණයෙන් පසු ඔහුගේ පුත්‍ර 'පතු' රජකමට පත් වූයේ ය. ඔහුගේ ඇවෑමෙන් බර්කා ද ඔහුගෙන් පසුව මුංගල් කෙමුර් ද රජකම ලබාගති. වර්තමාන පාලකයා වනා කොග්තායි අධිපතියා වූයේ ඔහුගෙන් පසුව ය. බටහිර රාජ්‍යයේ අධිපතීන්ගෙ නාම ලේඛනය මෙසේ සඳහන් කිරීමෙන් පසු නැගෙනහිර ටාටර්වරුන්ගේ බෙර්කා අතර ඇති වූ යුද්ධයක් තොරතුරු දක්වමි.

ක්‍රි. ව. 1261 දී නැගෙනහිර ටාටර් අධිපති අලවු රජතුමා සහ බටහිර ටාටර් අධිපති බෙර්කා අතර දේශසීමා පිළිබඳ ආරාවුලක් හට ගති. දෙදෙනාම මේ දේශ සීමාව තමන්ට අයත් බව කියා සිටියහ. අවසානයේ මේ ආරාවුල සමථයකට පත්වූයේ සටන් වැදීමෙනි. මොවුන් දෙදනාම මේ සටන කැමැති පිරිසට එක්වන ලෙස දන්වා සිටියහ. එක් අයකු තුන් ලක්ෂයක් වන අශ්වාරෝහක හමුදාවක් ද, ආයුධ සන්නද්ධ හටයන් ද වශයෙන් සේනා සංවිධානය කැර ගන්නා ලදී. අනතුරුව අලවු රජ සේනා පිරිවරාගෙන සතුරා හමුවන තුරු ඉදිරියට ගමන් ගත්තේ ය. දින කිහිපයක් ම ඔව්හු බාධක විරහිතව ඉදිරියට ගමන් කළහ. අනතුරුව ඔව්හු තැනිතලා භූමි ප්‍රදේශයක වාඩිලා ගත්හ. යකඩ දොරටුව නමින් හැඳින්වෙන ස්ථානය සහ සරේන් මුහුද අතර ස්ථානයෙහි ය. මෙහි විසිතුරු මණ්ඩප හා කුඩාරම් මඩු ආදිය ද ඉදි කරන ලදී. සතුරා පැමිණෙන තුරු අලවු රජු රැඳී සිටියේ ආරාවුලට හේතුවන දේශ සීමාවෙහි ය.

මේ ප්‍රවෘත්තිය අසා බෙර්කා ද තුන් ලක්ෂ පනස් දහසක අශ්වාරෝහක සේනාවක් පිරිවරා සටන සඳහා පැමිණියේ ය. ඔවුන් ඉදිරියට ගමන් කොට නතර වූයේ අලවු රජුගේ සේනාව රැඳී සිටි ස්ථානයට සැතපුම් දහයක් ඈතිනි. ඔහු ද සුන්දර කුඩාරම් මණ්ඩප මඩු ආදිය ද එහි ඉදි කෙළේ ය. තුන්ලක්ෂ පනස් දහසකින් යුක්ත සන්නද්ධ අශ්වාරෝහක හමුදාව විවේක ගැනීමෙන් පසු බෙර්කා සිය සේනා අමතා වේගවත් කතාවක් පැවැත්වී ය.

"දයාබර හිතවතුනි, මහත්වරුනි, මේ රජ පදවිය ලැබුණු දා සිට මම ඔබට මගේ සහෝදරයින්ට හා දරුවන්ට මෙන් සත්කාර සංග්‍රහ කෙළෙමි. එහෙයින් මේ අවස්ථාවේ දී මගේ ගෞරවය ආරක්ෂා කැර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ යුතු ය. මා සමග බරපතල යුද්ධ කිහිපයකටම සහභාගි වූ ඔබට ඒ ගැන අවබෝධයක් ඇත. ඒ රටවල් මා අල්ලා ගත්තේ ඔබ හැම ගේ උපකාරයෙනි.

Scanned by CamScanner

මට අයත් හැම දෙයක්ම ඔබ සමග බෙදාගත් බව අමුතුවෙන් කිව මනා නොවේ. එහෙයින් සියල්ල ආරක්ෂා කැර ගැන්ම සඳහා ඔබ සහාය විය යුතු ය. අලවු ගේ බලය ගැන මෙහි දී අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. ඔහුගේ වරද නිසා මේ අරගලය කිරීමට සිදුවිය. කෙසේ හෝ අලවු පරදවා ලීමට ඔබ අදිටන් කර ගත යුතු ය. අපගේ සේනාව ඔහුට වඩා අධික ය. ඔහුගේ අශ්වාරෝහක හමුදාව තුන් ලක්ෂයකි. අපේ අශ්වාරෝහක සේනාව තුන්ලක්ෂ පනස් දහසකි. අපේ භටයන් ඔවුන්ගේ භටයන්ට වඩා අති දක්ෂ ය. එහෙයින් ජයග්‍රහණය අප සතු ය. මේ තරම් දුරක් ගෙවා අප පැමිණියේ සටන් කිරීමටයි. සැලසුම් සහගතව බුද්ධිමත්ව සටන් කළ හොත් ජයග්‍රහණය නියත ය. එහෙයින් ධෛර්‍ය්‍ය සම්පන්නව සටන් කළ යුතු ය. ඔබගේ ධෛර්‍ය්‍යය හා කැපවීම දෙස මුළු ලෝකයම බලා සිටී. නියමිත දිනයෙහි නිසි පරිදි සූදානම් වී සටන් කරන ලෙස ඉල්ලා සිටිමි."

අලවු රජතුමා ද බෙර්කාගේ සූදානම ගැන හොඳින් අවබෝධ කොට ගෙන තම සේනාව ධෛර්‍ය්‍යමත් කරන අටියෙන් කථාවක් පැවැත්වී ය.

"පසුගිය කාලයේ දී මම ඔබ හැම දෙනම ආදරයෙන් පිළිගෙන සත්කාර සංග්‍රහ කෙළෙමි. පසුගිය කාලයේ දී හැම සටනකදී ම ඔබ හැම දෙනා ම මට අතිශයින් ආධාර උපකාර කළ අයුරු මතක ය. දැන් අප පැමිණ සිටිනුයේ බලවත් බෙර්කා සමග සටන් කිරීමට ය. අපට වඩා විශාල සේනාවක් සිටිය ද ඔවුන් යුද්ධ දක්ෂයන් නොවේ. එහෙයින් අපට ඔවුන් පරාජය කළ හැකි ය. තවත් දින තුනකින් සටන් ඇරඹෙන බව චරපුරුෂයන් මාර්ගයෙන් දැනගන්ට ලැබී ඇත. එහෙයින් එදින සිට සටන් කිරීමට තමුන්නාන්සේලා සූදානම් විය යුතු ය. සටනේ දී මරණය පරාජයට වඩා උතුම් බව ඔබ හැම තරයේ සිහිතබා ගත යුතු ය. නිර්භීත ලෙස සටන් කොට සතුරා පරාජය කොට අපගේ ගෞරවය ආරක්ෂා කරන ලෙස ඉල්ලා සිටිමි."

මේ අයුරින් බෙර්කා සහ අලවු තම සේනා දිරිමත් කොට සටනට සූදානම් වූහ.

සටන ආරම්භ වන දිනයේ අලවු රජු උදෑසනම තම සේනා සන්නාහ සන්නද්ධ කොට එක් බලඇණියකට අශ්වරෝහක භටයන් දස දහස බැගින් යෙදවී ය. බලඇණි තිහක් සංවිධානය කොට එක්

Scanned by CamScanner

එක් බලඇණියකට සේනාපතියකු හා උප සේනාපතියකු බැගින් පත් කෙළේ ය. මෙසේ විධිමත් ලෙස සංවිධානය කළ අලවු රජු අනතුරුව සටනට අණ දුන්නේ ය.

බෙර්කා රජු ද තම සේනා බලඇණි තිස් පහකට බෙදා සංවිධානය කොට සටනට අණ දුන්නේ ය. ඔවුන් සතුරු සේනාවට සැතපුම් බාගයක් පමණ දුර තබා නැවතුණි. අනතුරුව මඳ වේලාවක් රැඳී සිට අලවු ගේ සේනාවට පළමුවන හී පහර එල්ල කෙළේ ය. මොවුන්ගේ සංග්‍රාම භූමිය විශාල තැනිතලාවකි. එය සටන් ඇරැඹීම සඳහා අතිශයින් යෝග්‍ය ස්ථානයක් විය. මේ සංග්‍රාමයට අවතීර්ණ වූ ප්‍රධාන සේනාපතියන් දෙදෙනා ලේ නෑයන් ය. රණශූර චිංගීස් ඛාන් පෙළපතින් පැවැත එන්නෝ ය.

නියමිත වේලාවට තාලම පිඹින තුරු දෙපිරිස මුහුණට මුහුණලා මොහොතක් බලා සිටඑක්වරටම ඊතල වර්ෂා පතිත කළහ. අහස වැසී යන තරමට දෙපක්ෂයෙන් ම ශර වර්ෂා පැතිර ගියේ ය. අශ්වයෝ ද, සෙබලු ද එකා පිට එකා තුවාල ලබා හෝ මරණයට පත්වී හෝ ඇද වැටුණහ. ඊතල අවසන් වූ පසු කඩු, පොලු, යමුගුරු ආදිය රැගෙන ඔවුනොවුන් කපා කොටා තළා මරාගන්ට වූහ. හටයෝ ද, අශ්වයෝ ද බිහිසුණු ලෙස විපතට පත්වූවෝ ය. මරලතෝනි දසත පැතිරිණි. අශ්වයන්ට පෑගී බොහෝ දෙනා තුවාල ලදහ. අකුණු හඬ පරදන තරමට රණඝෝෂාව පැතිරිණ. එය අතිශයින් බියජනක දර්ශනයකි. සංග්‍රාම භූමිය පුරා උණු ලේ ගංගා ගලා ගියේ ය.

අලවු රජු ද බෙර්කා රජු ද රණශූරයෝ ය. වීර වික්‍රමාන්විත ක්‍රියා පිළිබඳව ලෝ පතල කීර්තියක් ඇත්තේ ය. ඔවුන්ගේ හටයන් ද සෙන්පතියන් ද එසේ ම රණශූරයෝ වූහ. කිසිවිටකත් පසු බසින්නේ නැත. මේ හේතුවෙන් රෑ බෝ වෙන තුරුම සටන සිදුවිණ. අවසානයේ දී බෙර්කාගේ හමුදා පසු බසින බවට ලකුණු පහළ විය. අලවු රජුගේ සේනා මෙසේ පසුබැස යන සේනාවන් හඹා ගොස් හැකි පමණින් පහර දුන්හ. ඔවුන් බෙර්කාගේ සේනාවන්ට පහර දුන්නේ අනුකම්පා විරහිත රුදුරු බිහිසුණු ආකාරයෙනි. පසුව අලවු රජු සිය සේනා ඇපසු කැඳවා ගති. තුවාල වූ අලවුගේ හටයෝ කඳවුරු තුළට වී පිළියම් ලබා ගනිමින් දින කිහිපයක් විවේක ගත්හ. මළ මිනී සියල්ල කිසිඳු සතුරු මිතුරු භේදයකින් තොරව භූමදාන කරන ලෙසට අලවු රජ අණ දුන්නේ ය. ඉතිරි සේනා සමග අලවු රජු සිය දේශය බලා ගමන් ඇරැඹී ය.

Scanned by CamScanner

මොගුටිමමුර් නමැති රජෙක් බටහිර ටාටර්හි විසී ය. අනතුරුව ඒ රාජ්‍යය හිමි කැර ගත්තේ තොලබුගා නමැත්තෙකි. තොගමංගු නමැති බලවතකු නොගායි නමැති ටාටර් අධිපතියකු සමග එක්වී තොලබුගා මරා රජය පැහැර ගැන්මට කටයුතු යෙදිණ. ටික කලකින් ඔහු මරණයට පත්වූ පසු කොග්තායි නමැති බුද්ධිමත් ශූරවීර කුමාරයකු වැසියෝ තම රජු ලෙස පත් කැර ගත්හ. මියගිය තොලබුගා රජුගේ කුමාරවරුන් දෙදෙනෙක් ද මේ අවස්ථාව වන විට ගුණ නුවණින් බලයෙන් පිරිපුන්ව සිටියෝ ය. මේ කුමාරවරුන් දෙදෙනා තමනට හිතවත් බලවතුන් පිරිසක් සමග කොග්තායි රජු මුණ ගැසීමට රාජ සභාවට ගියහ. රජු හමුවීමට ගිය කුමාරවරුන් දෙදෙනා රජු ඉදිරියේ දණ ගසා ගෞරවාදර දක්වා ඔවුන්ගේ අදහස ඉදිරිපත් කළහ. රජු ඔවුන් අසුන් ගන්වා කරුණු විමසූ කල්හි පැවැසූයේ

"රජතුමනි, අප දෙදෙනා තොලබුගේ පුත්‍රයන් බව ඔබ දන්නෙහි ය. තොතමංගු හා නොගායි යන දෙදෙනා එක්ව අපගේ පිය රජු මරා දමන ලදී. දැන් තොතමංගු මිය ගොසිනි. එහෙත් නොගායි ජීවතුන් අතර සිටී. එහෙයින් නොගායි පිළිබඳව අධිකරණ තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටිමු. ඒ සඳහා යහපත් තීන්දුවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු" යි ඔවුහු කීහ.

තරුණ කුමරවරුන් දෙදෙනාගේ කතාව ඇසූ කොග්තායි එය සත්‍යයක් බව අනුමාන කෙළේ ය. එසේ ම නොගායි කැඳවා යුක්තිය පසිඳලන බවට ප්‍රතිඥා දුනි.

නොගායි රාජ සභාවට කැඳවීමට කොත්ගායි රජු පණිවිඩකාරයන් දෙදෙනෙකු අත පනිවිඩයක් යැවී ය. රාජ සභාවට පැමිණ තොලබුගා මැරීම සම්බන්ධයෙන් පිළිතුරු දෙන ලෙස ද දැන්වීය. ඒ කතාව ඇසූ නොගායි සිනාසුණි. කොග්තායි ගේ රාජ සභාවට කිසි විටෙකත් නොයන බවත් අවශ්‍ය නම් කොග්තායි තමා වෙතට ආ යුතු බවත් කී ය. දෙවියන්ගේ නාමයෙන් ඔහු මෙහි නොපැමිණිය හොත් මම එහි ගොස් මගේ සේනා බලය පෙන්වා ඔහු මරා දමන්නෙමි'යි කී ය. දූතයෝ නොගායි ගේ අදහස කොග්තායි රජු වෙත ගොස් දැන්වූහ. එබස් ඇසූ කොග්තායි තවත් දූතයන් දෙදෙනකු නොගායි රජු වෙත යැවී ය.

නොගායි රජු ඒ දූතයන් දෙදෙනා ද සාදරයෙන් පිළිගත්තේ ය. ඔවුන් කරුණු විමසූ කල්හි දූතයන් පැවැසූයේ,

Scanned by CamScanner

"තොලබුගා රජුගේ මරණය සම්බන්ධයෙන් ඔහුගේ පුතුන් විසින් කරන ලද පැමිණිල්ල විභාග කිරීමට ඔබතුමා රාජ සභාවට ඉදිරිපත් නොවුවහොත් ඔබට විරුද්ධව සටන් කරන බවත් සියලු දේපළත් ජීවිතත් විනාශ කරන බවත් දන්වන්නට කීවේ ය" යනුවෙනි.

නොගායි රජු මේ ප්‍රකාශය අසා මහත් සේ කෝපාවිෂ්ඨ විය.

"මිත්‍රවරුනි ඔබගේ රජු ඉදිරියට මා කිසි දිනෙක එන්නේ නැත. මා ඔබේ රජුට බිය නැත. ඔහු සටනට එන්නේ නම් මම ද මගේ සේනා රැගෙන දේශ සීමාව දක්වා එන්නෙමි. දේශ සීමාවේ දී මා ඔහු හමුවීමට සූදානමෙන් සිටින බව දන්වනු මැනවි" යනුවෙන් පිළිතුරු දුන් නොගායි දූතයන් ආපසු පිටත්කැර යැවී ය.

දූතයන් කොග්තායි රජු වෙත ගොස් සියලු කරුණු සැල කළ කල්හි වහාම නොගායි ට එරෙහිව සටන් වැදීමට තීන්දු කෙළේ ය. සේනා සංවිධානය කරන ලෙස සියලු පෙදෙස්වලට දූතයන් යවා හැකි පමණ සේනා රැස්කැර ගති. එහෙත් කොග්තායි හට විශාල සේනාවක් සිටියේ නැත. ඔහු මහා බලවතකු ද වූයේ නොවේ.

කොග්තායි රජු දෙලක්ෂ පනස් දහසක සේනාවක් රැස්කැර ගති. ඔහු සේනා පිරිවරා නේර්සි තැනිතලාවට පැමිණ කඳවුරු බැඳ ගත්තේ ය. තෙලොබුගා ගේ පුත්‍රයන් දෙදෙනා ද හැකි පමණ සේනා පිරිවරා සටනට සහාය දීමට පැමිණියේ ය. නොගායි ද පැමිණියේ එක් ලක්ෂ පනස් දහසක සේනාවක් පිරිවරා ගනිමිනි. ඔහුගේ හමුදාවේ සිටියේ හැම අතින් ම දක්ෂ ක්‍රියාශූර නිර්භීත තරුණ භටයන් ය. ඔවුන් දින දෙකක් තිස්සේ ගමන් කොට කොග්තායි කඳවුරු බැඳ සිටි ස්ථානයට සැතපුම් දහයක් දුරින් වාඩිලා ගත්හ. අනතුරුව කොග්තායි රජු තම සේනා අමතා මෙසේ ප්‍රකාශ කෙළේ ය.

"ප්‍රිය මහත්වරුනි! අද අප මෙහි පැමිණ සිටිනුයේ නොගායිට හා ඔහුගේ සේනාවට පහර දීමටයි. අප එසේ කරනුයේ යුක්ති සහගතව ය. තොලබුගාගේ පුත්‍රයන් දෙදෙනා වෙනුවෙන් යුක්තිගරුක විනිශ්චයක් සඳහා නොගායි අපගේ රාජ සභාවට පැමිණියේ නැත. එහෙයින් මෙසේ සටන් කිරීමට පැමිණීමට සිදුවිය. එහෙයින් මේ සටන ජයග්‍රහණය කිරීමට ඔබ අදිටන් කැර ගත යුතු ය. ඉතා දක්ෂ ශූර වීර සෙබළුන් වන ඔබ අපේ සතුරන් විනාශ කැර දමා ජයගත යුතු ය."

Scanned by CamScanner

නොගායි ද මේ අයුරින් තම සේනාවෙහි ධෛර්‍යය උත්තේජනය කිරීමේ අටියෙන් වේගවත් කතාවක් පැවැත්වීය.

"අප ඉහත දී බිහිසුණු සටන් කොට අති දක්ෂ ලෙස සතුරන් පරාජය කළ බව ඔබ හැමට මතක ඇති. එහෙයින් අධිෂ්ඨානයෙන් ප්‍රීතියෙන් පෙරමුණට යා යුතු ය. කොග්තායිට විරුද්ධව අප සටන් කරන්නේ යුක්ති සහගත ලෙසට ය. මා කිසි විටෙකත් කොග්තායි හට යටත් වන්නේ නෑ. ඔහු පරාජය කර විනාශ කළ යුතු ය. ඔහුගේ කැඳවීමට අවනත වෙමින් කිසි විටෙකත් මා රාජ සභාවට යන්නේ නැත. මා ඔහුට යටත් කෙනෙකු නොවේ. ඔවුන් පරාජය කළ විට අපගේ රණශූරත්වය ගැන ද වීරත්වය ගැන ද සමස්ත ලෝකය කතා කරනු ඇත. මතු මතු ද අපගේ පරම්පරාව මේ ජයග්‍රහණය පිළිබඳව උදම් අනනු නියත ය. මෙසේ කී නොගායි පසුවදා සටනට සූදානම් වූයේ නිසි පරිදි සේනා සංවිධානය කරමිනි.

කොග්තායිගේ සේනාවෙහි අශ්වාරෝහක හමුදාව බලඇණි විස්සකට බෙදා එක් බලඇණියකට දක්ෂ සේනාපතියකු ද අණ දෙන නිලධාරියකු ද බැගින් පත් කෙළේ ය.

නොගායි අශ්වාරෝහක හමුදාව බලඇණි පහළොවකට බෙදා සටනට එළැඹිණි. දෙපිරිස අතර සටන බොහෝ වේලා පැවතිණි. රජවරුන් මේ සටනේ දී වීර වික්‍රමාන්විත ලෙස සටන් කළහ. මොවුන් සියලු දෙනා ම රණ ශූරයන් ලෙස කීර්තිමත් ය. අවසානයේ දී කොග්තායිගේ සේනා පරාජය වීමෙන් සටන කෙළවර විණ. පරාජය වූ කොග්තායිගේ හටයන් ලුහුබැඳ නොගායිගේ හමුදා පහර එල්ල කළහ. මෙහි දී බොහෝ හට පිරිසක් මරණයට පත්වූහ. නොගායිගේ සේනා ශක්තිය උසස් තත්ත්වයෙන් පැවැතිණ. කොග්තායිගේ හටයන් සැට දහසක් මේ සටනේ දී මළහ. එසේ වුව ද කොග්තායි රජු සහ තොලබුගා රජුගේ පුතුන් දෙදෙනාත් ජීවිතක්ෂයට පත්වූයේ නැත.

Scanned by CamScanner

## හමාර දෙසුම

මා මෙතෙක් ප්‍රකාශ කළ සියල්ල ඔබ ඉතා හොඳින් ශ්‍රවණය කෙළෙහි ය! ටාටර්වරුන් හා සැරසින්වරුන් ගැන ද ඔවුන්ගේ චාරිත්‍ර වාරිත්‍ර ආචාර විචාර පිළිබඳව ද හැකිතාක් කරුණු ප්‍රකාශ කෙළෙමි. එයට අනුරූප වන පරිදි ලෝකයේ ඈත පෙරදිග පිහිටි රාජ්‍යයන් දේශයන් හා දූපත් පිළිබඳව ද මගේ අවබෝධ ඥානයට සරිලන පරිදි තොරතුරු ප්‍රකාශ විය. ඉහත සඳහන් කැරුණු දේශ දේශාන්තර හාත්පස පිහිටි මහා සමුද්‍රය පිළිබඳව විස්තර මෙහි ඇතුළත් වූයේ නොවේ. එයට හේතුව ඒ සියලු තොරතුරු විස්තර අප හොඳින් දන්නා බැවිනි. එසේම නිරන්තරයෙන් බොහෝ දෙනා එහි සංචාරය කරන බැවින් සාගරය ගැන විස්තර කිරීම අනවශ්‍ය කාර්යයකැයි මට හැඟුණි. මේ සාගරය පිළිබඳ කරුණු ඉතා හොඳින් යාත්‍රිකයෝ දැන සිටිති.

අප අධිරාජයාගේ මාලිගයෙන් සමුගත් ආකාරය මෙහි ඉහත සඳහන් විය. එය මේ කෘතිය ආරම්භයේ දී ඔබට ප්‍රකාශ කළෙමි. මපියෝ, නිකලෝ සහ මාර්කෝ යන තිදෙනාට මහා අධිරාජයාගෙන් සමුගැනීම බලවත් දුෂ්කර ක්‍රියාවක් විය. එහෙත් දෛවෝපගත අයුරින් අධිරාජයාගෙන් සමුගැන්මට අහඹු වාසනාවන්ත අවස්ථාවක් උදාපත් විණි. එසේ නොවී නම් සියලු බාධක අවහිර ගැහැට මැඩගෙන ජයග්‍රාහී ලෙස අපගේ ජන්ම භූමියට ළඟාවීමේ භාග්‍යය උදාවන්නේ නොවේ. අපට ඒ වරම හිමි වූ ආකාරය ඉහත පරිච්ඡේදයක සඳහන් විය.

අප තිදෙනාට යළිත් ජන්ම භූමියට සැපත් වීමේ භාග්‍යය උදාවූයේ දේව වරප්‍රසාදය හේතුකොට ගෙන ය. එහෙයින් ලෝකයේ බොහෝ රටවල අපගේ සංචාරය පිළිබඳ විස්තර වර්ණනා ජනී ජනයාට දැන ගැනීමට අවස්ථාව සැලසුණේ ය.

දෙවියන් වහන්සේට ස්තුති වේවා!

ආමෙන්! ආමෙන්!!

සමාප්තයි.

Scanned by CamScanner



**MARCO POLO**

# මාර්කෝ පෝලෝ

සරත්චන්ද්‍ර ජයකොඩි

අධිරාජයෙනි, රජවරුනි, වංශාධිපතියෙනි, රදලවරුනි, මහත්වරුනි, ලෝකයෙහි නානා ප්‍රදේශයන්හි ද එහි වසන්නා වූ මනුෂ්‍යයන්ගේ චාරිත්‍ර වාරිත්‍ර, ඇඳුම් පැළැඳුම් හා ජීවනචර්යාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට බොහෝ දෙනා කැමැති වෙති. මෙයට පෙර යුරෝපයේ කිසිදු මනුෂ්‍යයකු පියවරක් තබා නොමැති මොංගෝලියාව, ඉන්දියාව ආදී බොහෝ දේශ දේශාන්තරයන්හි මාර්කෝ පෝලෝ සිය පියාණන් වූ නිකොලෝ ද, සුළු පියා වූ මපියෝ ද සමඟ සංචාරය කළෝය. මෙය නිර්මාණාත්මක ප්‍රබන්ධයක් නොව දැසින් දුටු දෙකනින් ඇසූ දෑ පිළිබඳ සත්‍ය කථාන්තරයකි. සියලු ආගම් අදහන්නා වූ ද විවිධ ජාති ගෝත්‍ර වංශ පරම්පරාවනට අයත් වන්නා වූ මනුෂ්‍යයෙනි! ඔබගේ විනෝදාස්වාදය [illegible] ඳහා ද මේ පොත කියැවිය යුතුය!

00110382-4
SP. 09/09
~~Rs. 350.00~~

ISBN 978 - 955 - 551 - 610 - 5

දයාවංශ ජයකොඩි සහ සමාගම

Scanned by CamScanner